දුම්රිය ප්‍රසම්පාදන තනතුරු සඳහා තරඟ විභාග, ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලා සඳහා බඳවා ගැනීම් ඇතුළත් ගැසට් පත්‍රය මෙවර සිළුමිණ සමඟ


# සිළුමිණ

சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 91 වැනි කාණ්ඩය 42 වැනි පත්‍රය ★

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ කන්‍යා රවි 02 භාග වප් පුර දියවක ඉරිදා ■ වර්ෂ 2020ක් වූ ඔක්තෝබර් මස 18 වැනි ඉරිදා මිල රු 80.00
















නිරෝධායන නීති කැඩූ 202ක් අසුවෙති පිටුව 04

අනුර විනිවිඳි රතු තරුවක යටගියාව



පිටුව 17

# විස්ස 20 වැනිදා මැති සබයට එයි

(තාරක වික්‍රමසේකර)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධන කෙටුම්පත පිළිබඳ විවාදය ලබන 21 සහ 22 දෙදින පාර්ලිමේන්තුවේදී පැවැත්වීමට පක්ෂ නායකයෝ ඉකුත් සිකුරාදා තීරණය කළහ. 20 වන සංශෝධනයට එරෙහිව ගොනු කළ පෙත්සම්වල ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මේ වන ජනාධිපතිවරයාට හා කතානායකවරයාට මේ වන විටත් ලබාදී අතර එය 20 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙනු ඇත.

20 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ 2/3කින් සම්මත විය යුතුය.

පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 145ක් වන අතර ආණ්ඩු පක්ෂයට සහාය ලබා දෙන මන්ත්‍රීවරුන් සමඟ කතානායකවරයාට හැරුණුවිට මේ වන විට ආණ්ඩු පක්ෂයේ මැති ඇමැති සංඛ්‍යාව 150කි. එයට අමතරව විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක්ද පනත් කෙටුම්පත සංශෝධනය පිළිබඳ ඡන්ද විමසීමේදී පක්ෂව ඡන්දය ලබා දෙනු ඇතැයි කියති.

## කොරෝනා දෙවෙනි රැල්ලේ මූලාරම්භය විදෙස් රටකින්

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

ශ්‍රී ලංකාවේ දෙවන කොරෝනා රැල්ල සහ තෙවන කොරෝනා පොකුර මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවකයින්ට නිර්මාණය වීමට මූලාශ්‍රය ඇති වූයේ විදේශ රටක සිට මෙහි පැමිණි ආශ්‍රිතයකු ගෙන් බව බුද්ධි අංශ තොරතුරුවලින් අනාවරණය වේ.

යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා ප්‍රකාශ කරනුයේ බ්‍රැන්ඩික්ස් කොරෝනා පොකුර ආරම්භ වූ මූලාශ්‍රය සම්බන්ධයෙන් දැනට සිදු කරගෙන යන පරීක්ෂණ මේ අනුව නව ප්‍රවේශයකට යොමුව ඇති බවයි. මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවකයින් හා ආශ්‍රිතයන් ගෙන් කොරෝනා වැළඳුණු 1,857ක් සොයාගෙන ඇති අතර ඔවුන්ගෙන් 90%ක් ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ය.

## මිහිඳු පරිනිර්වාණ පූජෝත්සවය 23 වැනිදා

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදු වී වසර 2280ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් 'මිහිඳු පරිනිර්වාණ ජාතික පූජෝත්සවය' ඔක්තෝබර් 23 වැනිදා රාජ්‍ය අනුග්‍රහයෙන් ලේක්හවුස් ආයතනයේ සහාය ඇතිව උත්කර්ෂවත් ලෙස මිහින්තලා පුදබිමේදී පැවැත්වේ. මිහින්තලා රජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණුවැවේ ධම්මරතන නායක මාහිමිපාණන් වහන්සේගේ අනුශාසනා පරිදි මෙම පූජෝත්සවය සංවිධානය කර ඇත. එදින සවස 4ට ගුවන් හමුදාව විසින් මිහිඳු මහා සෑයට සහ මිහින්තලා පූජා භූමියට ගුවනින් පිච්ච මල් පුෂ්පෝහාර දක්වන අතර ත්‍රිවිධ හමුදාවේ අනුග්‍රහය යටතේ හේවිසි හොරණෑ පූජා මධ්‍යයේ

4 වැනි පිටුවට

## උසස් පෙළ විභාගය නිරෝධායන ඇඳිරි නීතිය මත සාර්ථකව



නිරෝධායන නීති මැද අපොස උසස් පෙළ විභාගය මෙම දිනවල දිවයිනේ විභාග මධ්‍යස්ථාන 2,648කදී පැවැත්වේ. ඉකුත් 12 වනදා ආරම්භ වූ උසස් පෙළ විභාගයට අපේක්ෂකයෝ 3,62,824ක් පෙනී සිටිති. විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිත සිළුමිණට පැවසුවේ සියයට 100ක් අපේක්ෂකයින් විභාගය සඳහා මෙතෙක් පැමිණ ඇති බවය. නිරෝධායන ඇඳිරි නීතිය පවතින ගම්පහ පොලිස් බල ප්‍රදේශයේ රත්නාවලී බාලිකා විදුහලේ සිසුවියන් විභාගයට පෙර ආගමික වතාවත්වල නිරතවන මෙම සේයාරුව ඉකුත් සිකුරාදා ලබාගනු ලැබුවේ සිළුමිණ ඡායාරූප ශිල්පී නිශංක ද සිල්වාය. උසස් පෙළ විභාගය නොවැම්බර් 06 දක්වා නිසි අයුරින් පැවැත්වෙන බව අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා පසුගිය සිකුරාදා පවසන ලදී.

## පරිසර හානි වළකන්න ආරක්ෂක ඒකකයක්

නීති විරෝධී පරිසර විනාශයන් වැටලීම සඳහා වෙනම ඒකකයක් ස්ථාපිත කිරීමට පරිසර අමාත්‍යාංශය තීරණය කර ඇති බව පරිසර අමාත්‍ය මහින්ද අමරවීර පවසයි. යුද හමුදාවේ හා පොලීසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනකුගේ ප්‍රධානත්වයෙන් මෙම ඒකකය පිහිටුවීමට නියමිත බවද ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

ඒ අනුව පරිසර විනාශයන් ක්ෂණිකව වැටලීම සඳහා එම ඒකකයට හැකිවනු ඇතැයි ඇමැතිවරයා පවසයි.

පරිසර හානි සම්බන්ධයෙන් දැනුවත් කිරීමට අලුතින් හඳුන්වා දුන් අංක අනුව වැටලීම් සඳහා කාර්යක්ෂමව කටයුතු කළ හැකි බව පෙන්වා දුන් ඇමැතිවරයා ඕනෑම පරිසර හානියක් 1991 හා 1981 අංකයවලට දැනුම් දිය හැකි බවද බවද ඇමැතිවරයා කීය.

## 'ලොක්ඩවුන්'පළාත්වලට සියලු පහසුකම්

(තාරක වික්‍රමසේකර)

නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති සියලු ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය සියලු පහසුකම් ලබා දීමට පියවර ගෙන ඇතැයි ගම්පහ දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත් මහතා සිළුමිණට කීය.

සමුපකාර සමිති, සතොස මෙන්ම අනෙකුත් සැපයුම් ජාල කිසිදු ගැටලුවකින් තොරව ක්‍රියාත්මක වන බවද හෙතෙම පෙන්වා දුන්නේය. දිස්ත්‍රික්කයේ පොලිස් බල ප්‍රදේශ 33න් 18ක පනවා ඇති නිරෝධායන ඇඳිරි නීතිය නිසා දිස්ත්‍රික්කයේ ගම්මාන 6ක් මේ වන විට පූර්ණ වශයෙන් අක්‍රිය කර (ලොක්ඩවුන්) ඇත.


දිස්ත්‍රික් ලේකම්වරයා පෙන්වා දෙන්නේ දිස්ත්‍රික්කයේ නිවාස 2,857ක්ම පවුල් සියල්ල නිවාස නිරෝධායනයට ලක් කර ඇති බවත් එම පවුල්වලට අවශ්‍ය සියලු අතවශ්‍ය පහසුකම් සපයා දීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දී ඇති බවයි.

4 වැනි පිටුවට


## '20 වන ව්‍යවස්ථා සංශෝධනය ගැන නැවත සිතා බලන්න'

දැනට ඉදිරිපත් කර ඇති 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කර ඇති ආකාරයෙන් සම්මත කර ගැනීම ගැන නැවත සිතා බලන ලෙස සමාජ ක්‍රියාකාරී ජ්‍යෙෂ්ඨ හිමිවරුන් තුන්නමක් ජනාධිපතිවරයා ගෙන්

4 වැනි පිටුවට



මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි



ඇල්ලේ ගුණවංශ හිමි



බෙංගමුවේ නාලක හිමි


## හාල් හිඟයට මුහුණ දෙන්න වී අලෙවි මණ්ඩලය සූදානම්

(නිහාල් පී. අබේසිංහ)

හාල් හිඟයක් ඉදිරියේදී ඇතිවීම වැළැක්වීමට සහ හාල් මිල පාලනයට වී මෙට්‍රික් ටොන් 150,000 ක ආරක්ෂිත වී තොගයක් ඇති කිරීමට වී අලෙවි මණ්ඩලය සූදානම් බව මණ්ඩලයේ උප සභාපති හා ජ්‍යෙෂ්ඨ කෘෂි ආර්ථික පර්යේෂක දුමින්ද ප්‍රියදර්ශන සිළුමිණට ප්‍රකාශ කෙළේය.

4 වැනි පිටුවට

## සිම්පල් මෑන්



"වී නිෂ්පාදනය වැඩි වුණොත් ගොවියට පාඩු වෙනවා ඒ නිසා කුඹුරු ගොඩ කරමු, හාල් පිටරටින් ගේමු, කියලා රනිල්ගේ උපදේශකයෝ කිව්වා; "

"දැන් ඒ කුඹුරු ටික ගොඩ කරලා දාල. හාල් පිටරටින් ගේමු කියලද දන්නෑ උන්නැහෙලා උපදෙස් දෙන්න හදන්නෙ"








හීය



● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

# ජනතාවට එලොව පොල් පෙනෙන පොල් මිල

**ශ්‍රී ලාංකිකයන් වන අප ආහාරයට ගන්නා හැම ව්‍යංජනයකටම පාහේ පොල්කිරි මිශ්‍ර කරන්නේ අනාදිමත් කාලයක සිටය. විශේෂයෙන්ම මුහුදුබඩ පළාත්වල වෙසෙන ජනතාවට පොල් නැතුවම බැරිය. එම තත්ත්වය කොපමණදැයි කිවහොත් අපේ වාර්ෂික පොල් පරිභෝජනය පොල්ගෙඩි බිලියන 1.8 ත් ඉක්මවා ගොස් ඇත. එය සුළුපටු සංඛ්‍යාවක් නොවේ.**

අපේ ආහාරවලට පමණට වඩා පොල් කිරි සහ තෙල් මිශ්‍ර කිරීම නිසා හෘද රෝග වැළඳීමේ ප්‍රවණතාවක් ඇතැයි වෛද්‍යවරුන් කොතෙකුත් කීව ද අපේ අය ඒ ගැන කනකටවත් ගෙන ඇති බවක් නොපෙනේ. ඇතැම් විට එසේ වන්නේ ඔවුන්ගේ සිත ඒ බව පිළිගනු ලැබුවද දිව ඇතුළුකට ඊට අවනත නොවන නිසා විය හැකිය.

කෙසේ වෙතත් මේ දිනවල නම් අපේ ඇත්තන්ගේ පොල් පරිභෝජනය තරමක් පහත වැටී ඇතුවාට සැක නැත. එසේ වී ඇත්තේ අපේ උදවිය ගේ දිව මෙන්ම කට ද වෛද්‍ය උපදෙස් පිළිගැනීම නිසා නොව මේ දිනවල පොල් ගෙඩියක මිල අහස උසට නැග තිබෙන බැවිනි.

අප කුඩා කාලයේ ලොකු ප්‍රමාණයේ පොල් ගෙඩියක මිල ශත දහයකි. නැත්නම් ශත පහළොවකි. එදා පොල් ගෙඩි සීයක් අල්ලපු ගමේ කොප්පරා මුදලාලි විකිණීමෙන් අපේ අම්මලාට ලබාගත හැකිවූ උපරිම මුදල රුපියල් හතක් හෝ ඊටත් අඩුවෙනි. එකල පොල්ගෙඩි පන්සීයක් විකුණා ගැනීමෙන් හතර පස්දෙනෙකුගෙන් යුත් පවුලකට මාසයකටත් වැඩි කාලයක් පහසුවෙන් ජීවත්වීමට හැකි විය.

එහෙත් මීට මාසයකට පෙර ලොකු ප්‍රමාණයේ පොල් ගෙඩියක් විවෘත වෙළෙඳපොළේ අළෙවි කෙරුණේ රුපියල් 120 කට හෝ ඊටත් වැඩියෙනි. මෙලෙස පොල් මිල ඉහළ යෑම ගැන ජනතාව අතරින් මතුවූ විරෝධය හමුවේ සැලුණු ආණ්ඩුව පොල් ගෙඩියක් සඳහා රුපියල් 70 ක උපරිම මිලක් නියම කළේය. එලෙස පොල් ගෙඩියක උපරිම සිල්ලර මිල තීරණය කෙරුණේ එහි වට ප්‍රමාණය මැන බැලීමෙන් පසුවය.

එය අපේ අත්තලාගේ, මුත්තලාගේ කාලයේ දී වත් නෑසූ විරූ මිල නියම කිරීමක් විය. එසේ වුවද අද මෙරට පොදු ජනතාව අතරින් නැගෙන බරපතළ මැසිවිල්ලක් වන්නේ ආණ්ඩුවේ උපරිම මිලට කොතැනකවත් පොල් විකිණීමට නැති බවයි.

මීට වසර 43 කට පමණ පෙර එනම් 1977 මහ මැතිවරණය සමයේ එවකට එ.ජා.ප.යේ. නියෝජ්‍ය නායකයා වූ රණසිංහ ප්‍රේමදාස පොල් බෑයක් පෙන්න පෙන්නා රට වටේ ගියේය. එකල ලොකු ප්‍රමාණයේ පොල් ගෙඩියක මිල රුපියලකට වැඩි නොවීය. එහෙත් ඒ කාලයේ හැටියට එය ද ලොකු මුදලක් විය. කෙසේ වෙතත් ප්‍රේමදාස මහතාගේ එම උත්සාහය සාර්ථක විය. එහි ඊළඟ ප්‍රතිඵලය වූයේ එවර මහමැතිවරණයෙන් එ.ජා.ප.ය.ට 5/6 ක ජයග්‍රහණයක් හිමිවීමයි.

කෙසේ වෙතත් පොල් මිල අඩු නොවීය. එහිදී එ.ජා.ප.ය ආණ්ඩුව කියා සිටියේ පොල් ගෙඩියක මිල අඩු නොවුණ ද එම මිලට පොල් ගැනීමට හැකිවන අයුරින් ජනතාවගේ අතමිට සරුවී ඇති බවයි. ජේ. ආර්. ආණ්ඩුවේ නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ඒ කතාවේ ද යම් සත්‍යයක් තිබුණේය. ඒ බල්ලන් මරා හෝ අතමිට සරුකර ගැනීමට ජනතාව පෙලඹී ගිය බැවිනි.

කෙසේ වෙතත් පොල් මිල අඩු නොවීය. ඒ සඳහා මුල්වූ එක් හේතුවක් වූයේ වයඹ පොල් ත්‍රිකෝණය ඇතුළු රටේ හැම පෙදෙසකම තිබූ පොල් ඉඩම් කට්ටිකර යහමින් අතමිට සරුකර ගැනීමට ඉඩම් හිමියන් පෙලඹී යාමය. එ. ජා. ප ආණ්ඩුව ඒ සඳහා අවශ්‍ය බලපත්‍ර ඉල්ලන සුනංගුවෙන් ලබා දුන්නේය. චන්ද්‍රිකා ආණ්ඩුව ද එම පිළිවෙතම අනුගමනය කළ අතර 2005 දී බලයට පත්වූ මහින්ද මහත්තයාට ද ඒ හැර වෙනත් විකල්පයක් නොතිබිණි. පසුව එහි ආදීනව අවබෝධ කරගත් එතුමා ඉඩම් කට්ටිකර විකිණීම වැළැක්වීම සඳහා යම් යම් නීති රීති ගෙන ආවද කෙරාටික ඉඩම් හිමියන්ට මහින්ද මහත්තයාගේ කනෙන් රිංගා යාමට හැකිවිය.

පසුගිය යහපාලන ආණ්ඩු කාලයේ දී ද සිදුවූයේ ඊට සමාන ක්‍රියාපිළිවෙතකි. අන්තිමේ දී සිදුවූයේ මීට වසර පණහකට හෝ හැටකට පමණ පෙර අක්කර සිය ගණනින් තිබූ පොල් ත්‍රිකෝණයේ පොල් ඉඩම් වල වපසරිය පර්චස් ගණනට කේඩෑරී වීමයි.

මෙහිදී දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ද එම චෝදනාවෙන් මිදීමට නීතිගත කළ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ද විශාල පොල් ඉඩම් අක්කර පණහේ කැබලිවලට කැඩී ගිය බැවිනි.

එලෙස කුඩා කැබලිවලට කැඩී ගිය පොල් ඉඩම් වල පොල්ගස් කැපී ගොස් නිවාස යෝජනා ක්‍රම ඉදිවූ බව සත්‍යයකි. ඒ නිසා ජනතාවගේ නිවාස ප්‍රශ්නය යම් තරමකට හෝ විසඳී ගිය බව ද පිළිගත යුතුය. එහෙත් ඒ සමගම පිළිගැනීමට සිදුවන තවත් කරුණක් වන්නේ පොල්ගස් කැපීම නිසා එහි ඵලදාව අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොල් මිල ජනතාවට දරාගත නොහැකි තරමට ඉහළ ගොස් තිබෙන බවයි. ඒ අතර පොල් කුරුමිණියා ද තවත් පොල් ගස් ලක්ෂ ගණනක් කා දැම්මේය.

මෙරට පොල් වගාවට සිදුවූ ව්‍යසනයට 1970 සිට මේ දක්වා බලයට පත්වූ හැම ආණ්ඩුවක්ම වගකිව යුතුය. එසේ වන්නේ පොල් ඉඩම් කට්ටිකර විකුණා දැමීමට සහ නොයෙකුත් නිවාස යෝජනා ක්‍රම ඇරඹීමටත් ඒ හැම ආණ්ඩුවක්ම මුල්වී තිබෙන බැවිනි. 1970 වසරේ සිටම මෙරට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ, පොල් සංවර්ධන මණ්ඩල ආදී විවිධ නම් වලින් හැඳින්වෙන නොයෙකුත් ආයතන තිබුණේය. එමගින් නොයෙකුත් සංවර්ධන ව්‍යාපෘති ද ක්‍රියාත්මක කෙරුණේය. ඒ සඳහා මහජන මුදල් වැයවී ඇත්තේ රුපියල් බිලියන ගණනිනි. එහෙත් දේශීය පොල් වගාව දිනෙන් දිනම ගමන් කරමින් සිටින්නේ ප්‍රපාතය දෙසටය.

ඒ අනුව සිදුවෙමින් පවතින්නේ දිනෙන් දිනම පොල් මිල ඉහළ යාමයි. රජයට ද ඉහළ යන පොල් මිල පාලනය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පෙනෙන්නට තිබේ. ඒ ගැන 1970 සිට මෙරට බලයට පත්වූ හැම ආණ්ඩුවක්ම අඩුවැඩි වශයෙන් වගකිව යුතුය. එසේම එම වගකීමෙන් මිදෙන්නට කිසිම ආණ්ඩුවකට නොහැකිය.

විශේෂයෙන්ම මෙරට නැති බැරි ජනතාවට එලොව පොල් පෙනෙන පොල් මිල අඩු කරලීමට නම් තිරසාර වැඩ පිළිවෙලක් අවශ්‍ය වේ. එහෙත් එය මෙතෙක් පැවැති අන්දමේ පැලැස්තර විසඳුමක් නොවිය යුතුය.

මෙරට පොල් වගාව සම්බන්ධයෙන් හටගෙන ඇති පසුගාමී තත්ත්වයට විසඳුමක් වශයෙන් දැනට වගා නොකර තිබෙන ඉඩම් හෙක්ටයාර් ලක්ෂයක පොල් වගා කිරීමට වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බලාපොරොත්තු වන බවක් ඉකුත් දා අසන්නට ලැබුණේය. එම සැලසුම අපූරුය. එසේම එම සැලසුම තවත් අපූරුවන්නේ හීය නිවැරදි ඉලක්කය වෙතට යාම සිදුවුවහොත් පමණි. ඒ සමගම සිදුකළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ පොල් වගාවට අරක් ගෙන සිටින සියලුම මාදිලියේ නිදිමතයන් පොල් වගා කටයුතු වලින් ඉවත් කිරීමය.

# දෙයියන්ගෙ හාල් කාලා හාල් මාෆියාවක් හදලා



● නිහාල් පී. අබේසිංහ

**"මේ දවස්වල මිනුවන්ගොඩ සම්බා කිලෝවක් රුපියල් 120 - 130යි. කැකුළු හාලුත් කිලෝව 110 ට වැඩියි." "රටේම හාල් කඩවල හාල් හිඟයක් තිබෙනවා. ෆුඩ් සිටිවලත් හාල් ඉවරයි. හාල් තිබෙන තැන් කීපයේත් ඒවා ගිනි ගණන්."**

මේ අපේ රටේ විවිධ ප්‍රදේශවලින් ඇසෙන හාල් පිළිබඳ කථාබහ වල සාරාංශයකි.

කලක් වී අස්වැන්න වැඩි බව කියා මත්තල ගුවන් තොටුපළෙත් වී ගබඩා කළ අපේ රටේ තිබුණු වීවලට මොකද වුණේ කියා අපි ගවේෂණයක යෙදුනෙමු.

ප්‍රධාන ලෙසම මේ දවස්වල ෆුඩ් සිටිවල, සිල්ලර අලෙවි සල්වල හාල් නැති වීමට ප්‍රධාන හේතුව සල්ලි ඇති අය ඉදිරි දින පිළිබඳ සිතා බලා වැඩිපුර හාල් මිල දී ගෙන ගබඩා කර ගැනීම බව එම ගවේෂණයේදි අපට පැහැදිලි විය.

**හංගාගෙන ඉන්න හාල් එළියට නොදැම්මොත් හාල් රටින් ගෙනෙනවා**
**- වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන**

පාරිභෝගික ආරක්ෂක අධිකාරිය පවසන්නේ මේ අයුරින් වැඩි ප්‍රමාණයක් ජනතාව හාල් මිලදී ගැනීම වැළැක්වීමට ක්‍රමයක් නැති බවයි. කෙසේ වුවත් සතොස අලෙවි සල්වලින් එකම පුද්ගලයා හාල් කිලෝ 20 - 30 මිලදී ගැනීම වැළැක්වීමට ඒ ආයතනවල කළමනාකරුවන්ට මානුෂීය අයිතිවාසිකම් තිබේ. නමුත් එය සිදු නොවීම නිසා ඇඳිරි නීතිය ඇති ප්‍රදේශවල හාල් පමණක් නොව ප්‍රධාන ආහාර වර්ගවල හිඟයක් ඇති බවත් මේ නිසා ජනතාවට ජීවන වියදම් ප්‍රශ්න රැසක් ඇතිවී තිබේ.



වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන




වී අලෙවි මණ්ඩලයේ උප සභාපති දුමින්ද ප්‍රියදර්ශන



අරලිය හාල් අධිපති ඩඩ්ලි සිරිසේන



සමස්ත ලංකා හාල් නිෂ්පාදක සංගමයේ අනුශාසක අරුණ කාන්ත බණ්ඩාර



ගොවි නායක කවුඩුල්ලේ එම්.කේ. ජයතිස්ස

මෙයට පිළියම් ලෙස සීනි, ලොකු ලූනු ඇතුළු ආහාර වර්ග රැසක මිල අඩු කිරීමට හා ඒ ආහාර සඳහා දමා තිබූ අධි භාර ඉවත් කිරීමට ජනාධිපතිතුමා කටයුතු කිරීම ප්‍රශංසනීයයි.

ඊට අමතරව පොදුවේ අපේ රටේ පසුගිය දිනවල හාල් හිඟයක් තිබුණි. ඒ පිළිබඳව කරුණු දැක්වූ වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන පවසන්නේ ඉදිරියේදිත් කවුරු හෝ සඟවා ගෙන තිබෙන හාල් තොග වෙළෙඳපොළට නොදා හාල් මිල තවත් වැඩිවීමට හා හාල් හිඟයක් මවාපෑමට කටයුතු කළොත් හාල් මෙට්‍රික් ටොන් ලක්ෂයක් පිටරටින් ගෙන්වන බවයි.

"රට තුළ කෘත්‍රිම හාල් හිඟයක් මවා පෑමට වෙළෙඳ අධිකාරිය කටයුතු කරන බව පේනවා. රට තුළ දැනට මෝල් හිමියන් සතුව ඇති හාල් තොග වෙළෙඳ පෙළට නිකුත් නොකරන්නේ නම් පිටරටින් සහල් ගෙන්වා පාලන මිලටම පාරිභෝගිකයා වෙත සහල් ලබා දීමට කටයුතු කරනවා. ඒ සමගම අතිමහත් බහුතර ජනතාවගේ ප්‍රධානම ආහාරය වන සහල්වලට නියම කර ඇති උපරිම මිල 2021 වර්ෂයේදි සතයකින්වත් වැඩි කරන්නට ඉඩ දෙන්නේ නැහැ."

පසුගිය යහපාලන කාලයේ සතොස හරහා වී අලෙවි කිරීමට යැයි පවසමින් වී ලබාගෙන නමුත් ඒවා සහල් බවට පත්කර සතොසට හාල් නොදුන් හාල් මෝල් හිමියන්ගෙන් දෙදෙනෙක් දැනටම අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඔවුන් යහපාලන රජයේ බලධාරින්ගේ සහාය ඇතිව කෝටි ගණන් රජයේ මුදල් අවභාවිත කර තිබෙනවා යැයිද ඇමැති බන්දුල ගුණවර්ධන පවසයි.

**වී තොග අපි ළඟ නැහැ තිබෙනවා නම් පෙන්වන්න**
**- අරලිය හාල් අධිපති ඩඩ්ලි සිරිසේන**

මේ පිළිබඳව අදහස් දක්වන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ හා වී අලෙවි මණ්ඩලයේ උප සභාපති ජ්‍යෙෂ්ඨ කෘෂි ආර්ථික වෙළෙඳ පොළ පර්යේෂක දුමින්ද ප්‍රියදර්ශන මහතා පවසන්නේ මෙරට දැනට වී හෝ හාල් හිඟයක් නැති බවයි. අපේ රටේ ගොවි ජනතාව හා මහ මෝල් හිමියන් ළඟ විශාල වී තොගයක් තිබෙන බවත් පවසන දුමින්ද මහතා පවසන්නේ බැරි වෙලාවත් වී පිටරටින් ගෙන්වුවොත් ඔය හාල් ටික එළියට දමනු ඇති බවයි.

"පසුගිය වසරවල වී කිලෝ එක ගොවීන් වික්කේ රුපියල් 25 - 30 ට. හැබැයි මේ වසරේ ගොවියාට වී කිලෝ 1 ට රුපියල් 50ක් විතර ලැබුණා. ඒ නිසා සල්ලි වැඩියෙන් ලැබුණ නිසා ගොවි ජනතාව වී වික්කේ අඩුවෙන්. ඒ නිසා ගොවි ජනතාවගේ ගෙවල්වල වී ටිකක් ඉතුරු වෙලා තිබෙනවා. සහල් මිලට දැමූ පාලන මිල අනුව සම්බාවලටත් රුපියල් 98ක පාලන මිලක් තිබෙනවා. නමුත් ඔය මිල ඉවත් කළොත් ඕන තරම් වී තොග වෙළෙඳ පොළට එයි. මහ මෝල් හිමියන් ළඟ වී ටිකක් ගබඩා කරගෙන තිබෙනවා. කෙසේ වෙතත් මෙවර මහ කන්නයේ කුඹුරු කිරීමට වතුර දෙන විට ඔය හංගපු වී තොග එළියට ඒවි. කෙසේ වුවත් සෑම වසරකම ඔක්තෝබර්, නොවැම්බර් මාසවල හාල් මිල අධිකයි. පාලන මිල ඉවත් නොකර ඔය වී ටිකත් වෙළෙඳ පොළට ආවොත් මේ රටේ කිසිම හාල් හිඟයක් ඇති වෙන්නේ නැහැ. දැන් කළ යුත්තේ රජය සතු වී තිබේ නම් සහල් කර වෙළෙඳ පොළට දැමීමයි." ප්‍රියදර්ශන මහතා පවසයි.

පසුගිය බදාදා පැවැති ජීවන වියදම් කමිටුවේදි පසුගිය මහ කන්නයේ වී මිලදී ගෙන මනාව ගබඩා කර ගොවියාට හා පාරිභෝගිකයාට සහන සලසන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිලධාරින්ට උපදෙස් දී තිබේ.

මේ අතර මෙවර වී අලෙවි මණ්ඩලයෙන් වී මෙට්‍රික් ටොන් 30,000 ක් මිලට ගෙන තිබෙන බවත් ඒ වී වලින් වී මෙට්‍රික් ටොන් 20,000 ක් අද හෙටම සහල් බවට පත්කර වෙළෙඳ පොළට දමන බවත් වී අලෙවි මණ්ඩලයේ උප සභාපති දුමින්ද ප්‍රියදර්ශන මහතා පවසයි. ඊට අමතරව මෙරට දිසාපතිවරුන් විසින් මිලදී ගත් වී මෙට්‍රික් ටොන් 30,000 ක්ද අද හෙටම හාල් කර මෙරට වෙළෙඳ පොළට දැමීමට නියමිතය.

පසුගිය යල කන්නයේ මෙරට වී මිල රුපියල් 50 මට්ටමේ පැවතීමට වී අලෙවි මණ්ඩලය මගින් වී මෙට්‍රික් ටොන් 30,000 ක් මිලදී ගැනීම හේතුවූ බවද උප සභාපතිවරයා පවසයි.

ඒ සමගම ලබන වසරේ සිට මෙරට සහල් මාෆියාවක් ඇති නොවීමට වී අලෙවි මණ්ඩලය විසින් වී මෙට්‍රික් ටොන් 150,000 ක ආරක්ෂිත තොගයක් ඇති කිරීමට ද පියවර ගෙන ඇතැයි උප සභාපතිවරයා පවසයි.

මේ වසරේ කොරෝනා රෝගය නිසා රට වසා දැමූ සමයේ වෙනදාට වඩා සහල් පරිභෝජනය වැඩි වුවත් අපේ රටේ ජනතාවට කෑමටත් වඩා සහල් මේ වසරේ මහ හා යල කන්න මගින් ලැබුණු බවත් දුමින්ද මහතා පවසයි.

අපේ රටේ සහල් ගැටලුව පිළිබඳව අදහස් දක්වන සමස්ත ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සංගමයේ අනුශාසක අරුණ කාන්ත බණ්ඩාර මහතා පවසන්නේ සමස්ත ලෙස මෙරට උග්‍ර හාල් හිඟයක් නොමැති බවයි.

2019 - 2020 මහ කන්නයේදි ටොන් මිලියන 3.2 ක්ද 2020 යල කන්නයේදි ටොන් මිලියන 1.8ක්ද ලැබුණා. ඒ අනුව 2020 දි වී අස්වැන්නේ එකතුව ටොන් මිලියන 5කි. වී මෙට්‍රික් ටොන් මිලියන 5 කින් සහල් ටොන් මිලියන 3.2 කුත් ලබාගත හැකිය.

අපේ රටේ එක් පුද්ගලයකුට වසරකට කිලෝ 107ක් පරිභෝජනය කරයි.

පසුගිය කොරෝනා සමයේදි පාන්පිටි පරිභෝජනය අඩුවී හාල් පරිභෝජනය වැඩිවී තිබේ. ඒ අනුව ඒක පුද්ගල හාල් පරිභෝජනය වසරකට කිලෝ ග්‍රෑම් 120ක් දක්වා වැඩිවූ බවද අරුණ කාන්ත මහතා පවසයි.

මේ අනුව 2020 වසරේ උපරිම හාල් පරිභෝජනය වන්නේ හාල් ටොන් මිලියන 2.5කි. ඒ අනුව මුල් අස්වැන්නෙන් පරිභෝජනයට නොගෙන ඉතිරි වන හාල් ප්‍රමාණය සහල් ටොන් ලක්ෂ 7කි. ඉන් සියයට 30ක්ම නීති විරෝධී අයුරින් සත්ව ආහාර සඳහා සහල් භාවිත කරන්නේ නම් ඒ සඳහා ටොන් ලක්ෂ 2ක් පමණ වැයවේ. ඒ අනුව සියලු පරිභෝජන කටයුතු වලින් පසුව තවත් සහල් ටොන් ලක්ෂ 5ක් ඉතිරි විය යුතුය. ඒ අනුව රටේ සහල් හිඟයක් නැත.

සමහර මහ මෝල් හිමියන් හා මහා පරිමාණ කුඹුරු ඇති ගොවි ජනතාව අතර මේ සහල් ප්‍රමාණය ගත හැකි වී තොග තවම ඇතැයි සිතිය හැකි බවත් අරුණ කාන්ත බණ්ඩාර මහතා පවසයි.

**හාල් රටින් ගෙන්න අවශ්‍ය නැහැ. අපිට අවශ්‍ය හාල් අපේ රටේ තිබෙනවා**
**- සමස්ත ලංකා හාල් නිෂ්පාදක සංගමයේ අනුශාසක අරුණ කාන්ත බණ්ඩාර**

කෙසේ වුවත් අපේ රටේ දැනට ඇසට පෙනෙන කනට ඇහෙන ආකාරයට හාල් හිඟයක් තිබේ. එයට ප්‍රධාන හේතු තුනක් ඇත. ඉන් පළමුවැන්න සම්බා වීවලට නියමිත උපරිම මිලක් ඇති නොකිරීමයි. අනෙක් එක මහවැලි හා වාරි බලධාරින් අපේ කුඹුරුවලට දෙන ජලය අඩු කර අමතර අතිරේක බෝග වගාවට ගොවි ජනතාව යොමු කරවීමයි. ඊට අමතරව පාන්පිටි සහනාධාර ඇතිව ලබාදීම හා 'චූන්පාන්' වසංගතය රට පුරා පැතිරී යාම නිසාද පාන්පිටි පරිභෝජනය ජනප්‍රිය වී සහල් පරිභෝජනය අඩු වී ඇත.

එමෙන්ම දැන් තිබෙන උපරිම සිල්ලර මිලට හාල් නිපදවීම කිසිම ලාභයක් නැති බවද මෝල් හිමියෝ රජයට පෙන්වා දෙති. අද කැකුළු හාල් කිලෝවක් විකිණීමට හැකි උපරිම මිල රුපියල් 90 කි. හාල් මෝල් හිමියන් පවසන්නේ කැකුළු හාල් කිලෝ 1ක් නිපදවීමට යන වියදම රුපියල් 90 ට වැඩි බවයි.

කෙසේ වුවත් අද රජය කළ යුත්තේ සම්බා වී සඳහා මීට වඩා මිලක් ලබාදීමයි. ඒ සමගම කුඩා හා මධ්‍යම පරිමාණ මෝල් හිමියන් වසරකට හාල් ටොන් 27,000කට වඩා නිපදවනවා. ඔවුන්ට සුදුසු වෙළෙඳ පොළක් සකස් කළ යුතුයි. එවිට ඒ අයට හැමදාම ණය දීලා ඒවා කපා දමන්න රජයට සිදු නොවේ.

**වී මිලට අරන් ගොවියාටත් පාරිභෝගිකයාටත් සහන සලසන්න ජනපති නියෝග**

ඒ සමගම අපේ වී අස්වැන්න තව වැඩි කිරීමට නම් කිසිම කුඹුරක අතිරේක බෝග වගාව තහනම් කළ යුතුයි. ඒ සමගම කුඹුරු පුරන් වීමට නොදිය යුතුය. ඊට අමතරව අපේ රටේ පාන්පිටිවල ජනප්‍රිය බව අඩු කිරීමට පාන්පිටි සහනාධාර ඉවත් කළ යුතුයි.

එවිට කිසිම ගුණක් නැති පාන්පිටි වෙනුවට හාල් වඩා ජනප්‍රිය වූ විට හාල් තව ජනතාව අතර ජනප්‍රිය වී පාන්පිටිවලට පිටරටට යන මුදල අපේ ගොවි ජනතාවට ලැබෙන බවද අරුණ කාන්ත බණ්ඩාර මහතා පවසයි.

මේ අනුව අපේ රටට සහල් විදේශවලින් ගේන්නේ නැතිව මේ හාල් ගැටලුව විසඳීමට අපේ සහල් නිෂ්පාදක සංගම්, මෝල් හිමියන්, ගොවි සංවිධාන හා දේශපාලනඥයන් එකට එක්ව සාකච්ඡා කළ යුතු බවද කෘෂි හා අලෙවි පර්යේෂකයෝ පවසති.

මේ පිළිබඳව අදහස් දක්වන අරලිය සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ ඩඩ්ලි සිරිසේන මහතා පවසන්නේ ඔය සමහර විද්වතුන් කියන අයුරින් වී හෝ හාල් හෝ තොග අපගේ ගබඩාවල සඟවා නොමැති බවයි.

"අපිට ඔය කියන තරම් තොග සඟවාගෙන ඉන්න ඉඩකඩ නැහැ. සමහර වී ගොවියන් ළඟ තවමත් වී කිලෝ 1000 - 2000 තිබෙනවා.

පසුගිය දිනවල රජය සහල්වලට උපරිම සිල්ලර මිලක් ලබා දුන්නා. ඒ ගැන අපි සතුටුයි. අපිට ඊට වඩා අඩු මිලට හාල් දෙන්න බැහැ. ව්‍යාපාර වහන්න වෙනවා එහෙම වුණොත්." ඩඩ්ලි සිරිසේන මහතා පවසයි.

මේ පිළිබඳව කරුණු දක්වන ප්‍රගතිශීලී ගොවිජන සම්මේලනයේ සභාපති කවුඩුල්ලේ එච්.කේ. ජයතිස්ස ගොවි නායකවරයා පවසන්නේ හාල් මිල ඉහළ යාමටත් හාල් හිඟයක් තිබීමටත් ප්‍රධාන හේතුව අපේ රටේ මහා හාල් මෝල් හිමියෝත් බලධාරිනුත් නිලධාරිනුත් ඇතැම් දේශපාලනඥයෝත් එක්ව ක්‍රියාත්මක හාල් මාෆියාව බවයි.

"අපේ රටේ ගොවි ජනතාව දුක් විඳලා මේ වසරේ අපේ රටේ සියලු දෙනාට අවශ්‍ය තරම් වී හාල් අස්වැන්න අරන් දීලා තිබෙනවා. නමුත් ඒ හාල් මහා මෝල් හිමියන් ගබඩා කරගෙන තියෙන්නේ. ගොවියන් ළඟ වී හාල් ගබඩා කරලා නැහැ.

දැන් ඔය හාල් මෝල් හිමියෝ හාල් කරලා වෙළෙඳ පොළට දමන්නේ ගිය අවුරුද්දේ යල කන්නයේ ගත්ත වී ටික. මහා මෝල් හිමියෝ ගාව හාල් නැහැ කිව්වට හාල් තොග ගණන් තිබෙනවා. ඒ අයගේ ගබඩා තියෙන්නේ මෝල අසල පමණක් නොවේ. ඒ අය වී නැහැ කිව්වහම රජයේ බලධාරින් නිලධාරින් එකතුවෙලා කරන්නේ රටින් හාල් ගෙන්වන එකයි. එතකොට ඒ අයට ලොකු කොමිස් එකක් ලැබෙනවා.

ඒ අනුව අපි දුක් විඳලා වකුගඩු රෝගය මධ්‍යයේ කුඹුරු කරලා රටටම කන්න හාල් දීලා අපි දැන් හිහිනුත් ගතිනුත් දුක් විඳිනවා. අර මහ මෝල් හිමියන් ටිකයි රටේ සමහර දේශපාලනඥයොයි නිලධාරින් මේ වී හාල් මාෆියාවක් හදාගෙන කෝටි ගණන් හම්බ කරනවා." යැයි ජයතිස්ස මහතා පවසයි.

මේක මේ අය දෙයියන්ගෙ හාල් කාලා

**වී අලෙවිය හා දිසාපතිවරු සතු වී සහල් කර වෙළෙඳපොළට දමනවා**
**- වී අලෙවි මණ්ඩලයේ උප සභාපති දුමින්ද ප්‍රියදර්ශන**

වගේ මිනිස්සු බඩගින්නේ තියන්න කරපු වැඩක් වගේ. මේක නවත්වන්න නම් ගොවි සංවිධාන එක්වෙලා තම තමන්ගේ වී ටික හාල් කරල වෙළෙඳ පොළට දමන ක්‍රමයක් සමූපකාර ක්‍රමයක් වැනි දෙයක් ඇති කළ යුතුයි. මේකට අපි පොළොන්නරුවෙන් මූලික අඩිතාලම දමලා තිබෙනවා. මේවට සහාය දීම අලුත් රජයේ දේශපාලනඥයන්ගේ බලධාරින්ගේ නිලධාරින්ගේ යුතුකමක් යැයිද ජයතිස්ස මහතා අවධාරණය කරයි.

කොයි රජය යටතේ වුවත් ක්‍රියාත්මක වන මේ හාල් මාෆියාව නැති කරන තාක් කල් මේ රටේ වරින් වර හාල් මිල වැඩිවීම හාල් හිඟය ඇතිවීම වැළැක්විය නොහැකි බවත් ගොවි නායක ජයතිස්ස පෙන්වා දෙයි.

**මහා මෝල් හිමියොයි දේශපාලනඥයොයි නිලධාරියි හාල් මාෆියාවක් ඇති කරලා**
**- ගොවි නායක කවුඩුල්ලේ එම්.කේ. ජයතිස්ස**





● තාරක වික්‍රමසේකර



# හොරෙන් වෙස් බැන්දට එළියෙ නටන්න වුණු බදුර්දීන්



පසුගිය ජනාධිපතිවරණයේදී පුත්තලමේ අවතැන්වූවන් නීති විරෝධීව මන්නාරමට ප්‍රවාහනය කළැයි සිදුවූ කලහය

**රිෂාඩ් බදුර්දීන් යන නම අපේ රටේ කාලයෙන් කාලයට විවිධ කරුණු නිසා ඉස්මතු වන්නකි. වරෙක විල්පත්තු වනය විනාශ කිරීම සම්බන්ධයෙන්ද තවත් විටෙක මන්නාරමේ හා විල්පත්තුවේ විදේශීය ආධාර සහිත නිවාස සංකීර්ණයක් රජයේ අවසරයක් නොමැතිව ඉදි කිරීම සම්බන්ධයෙන්ද තවත් අවස්ථාවක මන්නාරම මහේස්ත්‍රාත්වරයාගේ නිවෙසට ගල් ගැසීම සම්බන්ධයෙන්ද ඔහුගේ නම කරළියේ රැව් දුන්නේය.**

පාස්කු ප්‍රහාරයට ඔහුගේ හෝ ඔහුගේ ඥාතීන්ගේ සම්බන්ධයක් ඇතැයි රාවයක් ආවේය.

මීට අමතරව පසුගිය 2019 වසරේ ජනාධිපතිවරණයේදී මන්නාරමේ අවතැන්ව පුත්තලමේ තාවකාලිකව පදිංචිව සිටිතැයි කියන ජනතාව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථවලින් ප්‍රවාහන කළැයි කියන සිදුවීමක්ද මේ අතර කතාබහට ලක්විය.

රිෂාඩ් බදුර්දීන් ගැන විශේෂ කතාවක් සාක්ෂි සහිතව පළමුවරට කරළියට ආවේ 'සිළුමිණ' පුවත්පතෙනි. ඒ පාස්කු ප්‍රහාර සමයේ යුද හමුදාපතිවරයාව සිටි ජනරාල් මහේෂ් සේනානායක සමඟ ලියුම්කරු විසින් කළ සාකච්ඡාවකදීය. හමුදාපතිවරයාට අත්අඩංගුවේ සිටින සැකකරුවෙක් සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදී විමසා අදාළ සැකකරුට කළ හැක්කේ කුමක්දැයි විමසමින් කළ බලපෑමක් ගැන සිළුමිණ වාර්තා කෙළේය. රිෂාඩ්ට විරුද්ධව පාර්ලිමේන්තුවට ගෙන ආ විශ්වාසභංගයේ පළමු චෝදනාව වූයේද එය වන අතර ඒ සම්බන්ධව සාක්ෂ්‍ය ලෙස යොදාගෙන තිබුණේද සිළුමිණ විශේෂාංග ලිපියයි.

බදුර්දීන්ගේ කතාවන්ගේ කෙළවරක් නැත. අනෙක් කරුණු කොමිසම්හි මෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විභාග වන අතර ඇදි ඇදී තිබුණු ජනාධිපතිවරණයේදී බස් රථවලින් ජනතාව ප්‍රවාහනය කිරීමේ කතාව එළියට ආවේය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඒ සම්බන්ධයෙන් දීර්ඝ විමර්ශනයක් කරන ලද්දේ ඒ වන විට පොදුජන පෙරමුණට සම්බන්ධ දේශපාලනඥයන් විසින් සිදු කරන ලද පැමිණිලි අනුවය.

## මන්නාරමෙන් සිලාවතුරට

පසුගිය සතිය වන විට නීතිමය කරුණු එකින් එක පෙළගැසෙමින් තිබුණි. ඒ අනුව රිෂාඩ් බදුර්දීන් 2019 වසරේ නොවැම්බර් 15 වැනිදා පුත්තලමේ අවතැන් වූ ජනතාව මන්නාරම සිලාවතුර ප්‍රදේශයට රැගෙන ගොස් ඡන්දය ලබා දීමට අවශ්‍ය පහසුකම් සපයන ලෙස එවකට මුදල් අමාත්‍ය මංගල සමරවීරගෙන් ඉල්ලීමක් කර තිබේ. නිවැරැදි ක්‍රමවේදයට අනුව එය සිදු කරන ලෙස එහිදී මංගල සමරවීර උපදෙස් ලබා දී ඇත. ඉන් පසුව බදුර්දීන් සිදු කර ඇත්තේ ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රියගෙන් ඒ සම්බන්ධව පිහිට පැතීමයි. ඔහු ලිඛිතව දන්වා ඇත්තේ ඡන්දදායකයන්ට මුදල් ගෙවා ප්‍රවාහන පහසුකම් ලබා ගත හැකි බවයි.

එහෙත් වාර්තා වන තොරතුරු අනුව බදුර්දීන් හිටපු ඇමැතිවරයා සිදු කර ඇත්තේ මුදල් ඇමැතිවරයා හෝ මැතිවරණ කොමිසමේ සභාපතිවරයා විසින් හෝ දන්වන ලද පරිදි කටයුතු කිරීම නොව තමන් විෂය බාරව සිටි කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ගිණුමෙන් මුදල් ලබා ගෙන බස් රථ 221ක් (222ක් බවටද වාර්තා වේ) යොදා ගෙන මුස්ලිම් ජනතාව 11,286ක් ප්‍රවාහනය කිරීමය. මේ පිළිබඳව එදින සිටම දේශපාලඥයන් මෙන්ම විවිධ සංවිධාන විසින් චෝදනා එල්ල කරන ලදී. එසේම එම ඡන්ද දායකයන් පුත්තලමේත් මන්නාරමේත් යන ස්ථාන දෙකේදීම ඡන්දය භාවිත කර ඇති බවට ද චෝදනා එල්ල විණි.

බස් රථ යොදා ගැනීම සම්බන්ධයෙන් අදාළ මුදල වූ රුපියල් 95,02,960.00ක මුදලක් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත ගෙවා තිබේ. ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ දීර්ඝකාලීන අවතැන්වූවන් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ සම්සුදින් මොහොමඩ් යාසින් විසින් වන අතර අදාළ චෙක්පතට ප්‍රධාන අත්සන යොදා ඇත්තේ එකී ව්‍යාපෘතියේ ගණකාධිකාරි අලගරත්නම් මනෝරංජන් යන අය විසිනි. ඒ අනුව රජයේ මුදල් සාපරාධී ලෙස වෙනත් කටයුත්තක් වෙනුවෙන් යොදා ගැනීමේ චෝදනාව ඔවුන්ට ඍජුවම එල්ල වී ඇත. අවතැන්වූවන් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් වෙන් කළ මුදල් වෙනත් කටයුත්තක් සඳහා යොදා ගැනීම බරපතළ වරදක් වන බවත් එය කිසිසේත්ම අනුමත කළ නොහැකි බවත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දන්වන ලදුව එයට තමන් කිසිසේත්ම අනුමත නොකරන බව මෙහිදී ලේකම්වරයා විසින් දන්වා ඇත.

## අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය නැහැ

කුමන ක්‍රමයකින් හෝ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගන්නට නොහැකි වූ තැන රිෂාඩ් බදුර්දීන් ඇමැතිවරයාගේ ඍජු මැදිහත්වීම මැද නොවැම්බර් 21 වනිදා 'සදර්න් ඩිස්ල්ලේස් ෆෝර්ට්' නැමැති රාජ්‍ය නොවන සංවිධානයක් විසින් අදාළ මුදල අමාත්‍යාංශයට ගෙවා ඇත. ඒ අනුව රජයේ මුදල් සාපරාධී ලෙසින් පරිහරණය කිරීමේ චෝදනාව වඩාත් ඉස්මතු වී ඇත. අදාළ මුදල නීත්‍යානුකූලව යොදා ගත්තා නම් එය නැවත අමාත්‍යාංශ ගිණුමට යොමු කළ යුතු නැත.

මේ එදා කළ වික්‍රමයේ සාක්ෂි සහිත කතාවයි. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ සිදු කරන ලදී. ඒ අනුව හිටපු ඇමැති රිෂාඩ් බදුර්දීන් ඇතුළු මේ සිද්ධියට සම්බන්ධ පුද්ගලයන් අත්අඩංගුවට ගෙන නීතිය හමුවට පැනවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. නීතිපතිවරයාගේ උපදෙස් අනුව මේ කටයුතු මෙහෙයවන ලද අතර ඒ අනුව මේ කටයුත්ත මෙහෙයවන ලද හිටපු අමාත්‍ය රිෂාඩ් බදුර්දීන්, දීර්ඝකාලීන අවතැන්වූවන් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ සම්සුදින් මොහොමඩ් යාසින් සහ එකී ව්‍යාපෘතියේ ගණකාධිකාරි අලගරත්නම් මනෝරංජන් යන සැකකරුවන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට නීතිපතිවරයා උපදෙස් ලබාදී තිබේ.

ඒ සඳහා වරෙන්තුවක් ලබා ගන්නට කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් වරෙන්තුවක් ලබා ගන්නට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළ අවස්ථාවේදී කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ එම වරෙන්තු ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් පැවසුවේ රජයේ මුදල් සාපරාධී ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි ඇත්නම් අධිකරණයේ වරෙන්තු අවශ්‍ය නොවන බවයි.

## පොලිස් කණ්ඩායම් 6ක්

ඒ අනුව අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට කටයුතු යොදන ලද අතර පොලිසියේ විශේෂ කණ්ඩායම් 6ක් බදුර්දීන්ගේ මන්නාරමේ නිවෙසට හා කොළඹ 8 බෞද්ධාලෝක මාවතේ පිහිටි නිවෙසට ගියද ඔහු නිවෙසේ නොසිටියේය. කෙසේ වෙතත් මේ වන විට වාර්තා වන කරුණු අනුව දැන ගන්නට ඇත්තේ පසුගිය 13 වැනිදා පුත්තලමේ සිට කොළඹ එමින් සිටි පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදුර්දීන් සිය වාහනය තුළ ගුවන්විදුලියට කන්දී ගෙන එමින් සිටියදී තමා අත්අඩංගුවට ගැනීමට නීතිපතිවරයා උපදෙස් දී ඇතැයි යන පුවත ඇසීමත් සමග වාහනය නැවැත්වීමට රියැදුරාට වාහනයෙන් බැස පලාගොස් තිබේ.

බදුර්දීන්ගේ වාහනය කොළඹ පැමිණි පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන ඇති නමුත් එම අවස්ථාවේදී එහි සිට ඇත්තේ ඔහුගේ රියදුරු සහ මන්ත්‍රීවරයාගේ ඉඩමක් බලා ගන්නා පුද්ගලයෙක් පමණි.

## අනවසර අවි රැසක්

වාහනය සමඟ එම දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් සතුව එම අවස්ථාවේ පිස්තෝල දෙකක් ද තිබී අත්අඩංගුවට ගෙන ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැල්ලවත්ත ප්‍රදේශයේදී සොයා ගැනුණු සුඛෝපභෝගී මෝටර් රථ දෙක හිටපු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් විසින් භාවිත කර ඇති බවට අනාවරණ වී තිබේ. එම මෝටර් රථ 2 තුළ තිබී පිස්තෝල 2ක්, මැගසින් 4 ක් සහ පතරොම් 48ක් ද සොයා ගෙන ඇත. මේ අතර රිෂාඩ් බදුර්දීන්ට පලාගොස් සැඟවීමට උදව් කළ බව කියන ඔහුගේ ආරක්ෂාවට යොදවා සිටි මුස්ලිම් ජාතික පොලිස් කොස්තාපල්වරයෙකු ද අත්අඩංගුවට ගෙන තිබේ.

එමන්ම රිෂාඩ් බදුර්දීන් සමඟ අත්අඩංගුවට ගැනීමට සොයමින් සිටි අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචිකිරීමේ ව්‍යාපෘතියේ ගණකාධිකාරී අලගරත්නම් මනෝරාජන් කිරුලපනදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 14 වැනිදා දහවල් අත්අඩංගුවට ගෙන ඇත.



රිෂාඩ් බදුර්දීන්ගේ රියැදුරන් දෙදෙනකු හා අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියේ ගණකාධිකාරී අලගරත්නම් මනෝරාජන් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කිරීමට බන්ධනාගාර රියට රැගෙන ගිය අයුරු

මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියෙන් තොරව මුදල් වැය කළ නොහැකි විෂයක් වෙනුවෙන් මුදල් වැය කිරීමට කටයුතු කිරීම රජයේ මුදල් බරපතළ ලෙසින් අවභාවිත කිරීමකි. එය 1981 අංක 15 දරන ජනාධිපති පනතේ අංක 82(1) වගන්තිය යටතේ ජනාධිපතිවරණ මුවාවෙන් සිදු කළ අවභාවිතය වෙනුවෙන් දඬුවම් නියම කළ හැකි බරපතළ වරදකි.

## අතුරු තහනමක් ඉල්ලයි

මේ අතර තමන් අත්අඩංගුවට ගැනීම වළකාලමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙස හිටපු අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් විසින් අධිකරණය හමුවේ පෙත්සමක් ගොනු කර තිබේ. තම නීතිඥයන් මගින් අභියාචනාධිකරණය හමුවේ ඔහු මෙම පෙත්සම ගොනු කර ඇත.

වාර්තා වන අන්දමට බදුර්දීන්ට එරෙහිව තවත් චෝදනාවක් මේ සමඟ එල්ල වී තිබේ. ඒ ඔහු මන්නාරමේ සිලාවතුර දක්වා ප්‍රවාහනය කළ පිරිස පුත්තලමේද ඡන්දය භාවිත කර ඇති බවට තොරතුරු හෙළි වීමයි. එසේ වුවහොත් එය බරපතළ වරදක් වනු ඇත. රජයේ දේපළ සාවද්‍ය පරිහරණයට අමතරව මැතිවරණ නීතිය අමු අමුවේම උල්ලංඝණය කිරීමක් වනු ඇත. කෙසේ හෝ ඒ ගැන අනාවැකි කීම හෝ පුරෝකතන ඉදිරිපත් කිරීම අපට කළ හැක්කක් නොවේ. එය අධිකරණයට බාර කටයුත්තකි. අදාළ නඩුව මේ මස 27 වැනිදා අගහරුවාදා විභාගයට ගැනෙනු ඇත. අප බලා සිටිය යුත්තේ අධිකරණ තීන්දුව කෙරෙහිය.


විශ්වාසයෙන් ඉදිරියට

දශක හයකට අධික කාලයක් මුළුල්ලේ ඔබේ වර්ධනය වෙනුවෙන් කැපවෙමින්, රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දැවැන්ත ශක්තියක් සපයන මූල්‍ය ආයතනයක් ලෙස DFCC බැංකුව ප්‍රමුඛස්ථානය ගෙන ඇත.

ඔබේ ශක්තිය, අධිෂ්ඨානය, උත්සාහය සැමදා අගයන අපි, විශ්වාසය රැඳි නාමයක් ලෙසින්, වර්තමානයේදී කාටත් ගැළපෙන බැංකුව ලෙස සේවාවන් රැසක් සපයමින් සිටින්නෙමු. මෙලෙස දේශීය ජන ජීවිත ගොඩනගමින්, ඔවුන් සමඟ ඉදිරියට පියනගන අප, නිහතමානී සතුට පෙරදැරිව මේ සමරන්නේ සාර්ථකත්වයේ හැටපස් වන සංවත්සරයයි.



24 පැය ඇමතුම් මධ්‍යස්ථානය: 0112 350000
www.dfcc.lk
ෆිච් රේටිං A+ (lka) ස්ථාවර ශ්‍රේණිගත, මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.

DFCC බැංකුව
ඔබේ වර්ධනයට

● හර්ෂා සුගතදාස

# ‘බ්‍රැන්ඩික්ස් ප්‍රදීපිකා’ දැන් මොනවද කරන්නේ...

● ප්‍රදීපිකාගේ උපන් ගම මොනරාගල මාළිගාවිල

● දුවට පාඩම් කරන්න පොත් දුන්නේ රෝහලේ කාර්ය මණ්ඩලය

● ප්‍රදීපිකාගේ එක් නැගණියක් බුත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක්

● සැප්තැම්බර් 17 - 18 සාම්පල බලන්න කවුද ආවා; ඒ අය ඉන්දියානුවන්ද කියා දන්නේ නැහැ

● අයි.ඩී.එච්. කාර්ය මණ්ඩලය දෙවිවරුන් වැනි පිරිසක්

**රටම කැළඹූ දිවුලපිටිය හොරගස්මුල්ලේ ප්‍රදීපිකා සුදර්ශනි රත්නායක ගැන දැන් නොදන්නා කෙනෙක් නැත. එදා ප්‍රදීපිකා ගම්පහ රෝහලේදී පී. සී. ආර්. පරීක්ෂණයට හසු නොවුණා නම් අද රටට වෙන දෙය හිතා ගන්නට නොහැකිය.**

“අපේ ෆැක්ටරියේ ගොඩාක් ළමයින්ට උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව තිබුණා. මට මතක විදිහට සැප්: 20 වැනිදා ඉඳලා සමහර ළමයින් උණ වැඩිවෙලා කලන්තය දැම්මා. අපේ ෆැක්ටරියේ වෛද්‍ය මධ්‍යස්ථානයෙන් වේදනා නාශක දීලා වැඩ ගත්තා. මට සැප්: 27 වැනිදා ඇඟපත රිදෙන්න ගත්තා. ඔළුව කැක්කුමත් තිබුණා. මම 28 වැනිදා වැඩට ගිය ගමන් ෆැක්ටරියේ දොස්තරගෙන් බෙහෙත් ගත්තා. වයිරස් උණක් කියලා කිව්වෙ. එදා මම වේලාසනින් ගෙදර එන්න ඇහුවාම අපේ අංශය බාරව හිටපු කෙනා කිව්වා ඔක්: 14 වැනිදා බාර දෙන්න ඕඩරයක් තියෙනවා. ඒ නිසා ෆැක්ටරියේ දොස්තරගෙන් බෙහෙත් බීලා වැඩ කරන්න කියලා.

ඊට පස්සෙ තමයි මම බේත් අරන් දිගටම වැඩ කළේ. සැප්: 30 වැනිදා උදෙත් මට අමාරුව තිබුණා. මගේ මහත්තයා කිව්වා ඔය වැඩේ හරියන්නෙ නැහැ, බේත් ටිකක් ගන්න යමු කියලා. මම අමාරු බව පෙන්වන්නේ නැතිව වැඩට ආවා. 30 වැනිදා උදේ ෆැක්ටරියේදි පපුව හිර වෙනවා වගේ දැනුණා. හුස්ම ගන්න අමාරු වුණා. මම අමාරුවෙන් අමාරුවෙන් විවේකාගාරය පැත්තට එනකොට මාව ක්ලාන්ත වෙලා වැටෙන්න ගිහින්. ගෑනු ළමයි දෙන්නෙක් මාව අල්ලාගෙන එක්කන් ගියා. ඒ වෙලාවේ තව ගෑනු ළමයි හත්දෙනෙකු විතර අමාරුවට විවේකාගාරයේ හාන්සි වෙලා හිටියා. නර්ස් ඇවිත් මගේ උණ බැලුවා, 101 ලෙස උණ සටහන් වී තිබුණා. ආයෙත් උණ බැලුවා. එතකොට තිබුණේ 99 යි.

එයාලා මට කිව්වා වයිරස් උණක්නෙ තියන්නේ, ඒ නිසා වැඩ කරන්න කියලා. මම කිව්වා මගේ පපුව රිදෙනවා කියලා. එතකොට ගැස්ට්‍රික්වලට කියලා පෙති දුන්නා. මම කිව්වා මට ගැස්ට්‍රික් අමාරුවක් නැහැ, පපුව රිදෙනවා හුස්ම ගන්න බැහැ, ඒ නිසා මාව දිවුලපිටිය රෝහලට ගෙනියන්න කියලා. නැතිනම් මගේ මහත්තයාට කියන්න කිව්වා. ඊටපස්සෙ තමයි මාව ගම්පහ රෝහලට එක්කන් ආවේ.” යනුවෙන් පවසමින් අංගොඩ අයි. ඩී. එච්. රෝහලේ 6 වැනි වාට්ටුවේ ප්‍රතිකාර ලබන ප්‍රදීපිකා සුදර්ශනි රත්නායක අප සමඟ සංවාදයට එක්වූවාය.

සැප්: 30 වැනිදා ගම්පහ රෝහලට ඇතුළත් කළ ඇය ආපසු නිවසට පැමිණියේ ඔක්තෝබර් 02 වැනිදාය. ඇගේ උණ වැඩි වී නිව්මෝනියාව තත්ත්වයට පැමිණ සිටි බව පැවසූ වාට්ටු බාර වෛද්‍යවරයා, ඇගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් බැවින් එදින ඇයව නිවසට යවන බව සඳහන් කළේය.

ඇයට පී. සී. ආර්. පරීක්ෂණය කර තිබුණේ ඔක්තෝබර් 01 වැනිදාය. ඇයව ටිකට් කපා රෝහලෙන් පිටත් කරන විට පී.සී.ආර්. පරීක්ෂණ වාර්තාව පැමිණ තිබුණේ නැත. ප්‍රදීපිකා ඒ ගැන වෛද්‍යවරයාගෙන් විමසූ විට ඔහු කියා තිබුණේ ඇයට කිසිම ප්‍රශ්නයක් නැති බවය. ප්‍රශ්නය මතු වූයේ ඈ නිවසට ගිය පසු ඔක්තෝබර් 02 වැනිදා සවස් භාගයේදීය. ප්‍රදීපිකාගේ සැමියාගේ දුරකතනයට ඇමතූ ගම්පහ රෝහල, ප්‍රදීපිකාට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු වී ඇති බැවින් ඉක්මනින් රෝහල්ගත වීමට සූදානම් වන ලෙස දැනුම් දීමත් සමග ප්‍රදීපිකා ඇතුළු පවුලේ අය වික්ෂිප්ත වූහ.

“ඇත්තටම අපිට මුකුත් හිතාගන්න බැරි වුණා. මගේ මහත්තයා කිව්වා වැරදීමක් වෙන්න ඇති කියලා. මගේ දුව භයවෙලා හොඳටම ඇඬුවා. මම හිතුවා මම මැරෙයි කියලා.” යනුවෙන් පවසන විට ඇගේ මුවින් දිගු සුසුමක් පිට වූයේ නිරායාසයෙනි. දිවුලපිටිය පොලිසියෙන් ඔවුන්ගේ නිවස සොයා පැමිණ ප්‍රදීපිකාට අයි. ඩී.එච්. රෝහලට යෑමටත් නිවසේ සිටින සෙසු සාමාජිකයන්ට නිරෝධායනය සඳහා යෑමටත් සූදානම් වන ලෙස දැනුම් දෙනු ලැබිණි. අංගොඩ අයි. ඩී. එච්. රෝහලේ වාහනයක් ඔවුන්ගේ නිවසට පැමිණියේ මේ අතරවාරයේදීය.


ප්‍රදීපිකා සිය දියණිය දිව්‍යාංජලී සමඟ අයි.ඩී.එච් රෝහලේදී

එදා පටන් අද දක්වාම ප්‍රදීපිකා සිටින්නේ අයි. ඩී. එච්. රෝහලේ 6 වැනි වාට්ටුවේය. ඇගේ සැමියාත් දියණියත් පුතුන් තිදෙනා සහ ඇගේ පියාත් 04 වැනි සෙනසුරාදාට එළිවන ජාමයේ ගාල්ල හබරාදූව නිරෝධායන මධ්‍යස්ථානයට රැගෙන එනු ලැබූහ. ඔවුන්ට පී. සී. ආර්. පරීක්ෂණ සිදු කිරීමෙන් අනතුරුව දියණියට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු විය. දැන් ස්වප්නා දිව්‍යාංජලි දියණිය සිටින්නේ අයි. ඩී. එච්. රෝහලේ 6 වැනි වාට්ටුවේ ඇගේ මව සමගය.

ප්‍රදීපිකා සුදර්ශනි රත්නායකට නම් 6 වැනි වාට්ටුව හරි අපූරු වාට්ටුවකි. එක් පසෙකින් ඇගේ දියණිය සිටියි. අනෙක් පසින් බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කම්හලේ ඈ සමග එකට සේවය කළ මිතුරියෝ 16 දෙනෙක් සිටිති.

“හැමදාම උදෑසන 5.00ට උණ පරීක්ෂා කරන්න, ලේ ගන්න, රුධිර පීඩනය බලන්න වාට්ටුවට හෙදියන් එනවා. අපිට බෙහෙත් දෙනවා. උදේ 6.00ට උදෑසන ආහාර දෙනවා. උදේ 9.45ට විතර සුප් එකක් හෝ තැම්බූ කොත්තමල්ලි වතුර දෙනවා. ඒ අතරවාරයේ අපිට අව්වෙ ඇවිදින්න කියලා වාට්ටුවෙන් පිටතට යවනවා. දොස්තර මහත්තුරු ඇවිත් අපිව බලනවා.”

“දොස්තරලා නර්ස්ලා වාට්ටුව ඇතුළට එනකොට විශේෂිත ඇඳුම් කට්ටල ඇඳලා එන නිසා අපිට හඳුනාගන්න වෙන්නේ කටහඬින්. හැබැයි සාමාන්‍ය වෙලාවට වාට්ටුවේ වීදුරු ගහපු තැනකට අපිට එන්න කියලා වීදුරුව දෙපැත්තේ ඉඳගෙන අපේ සුවදුක් අහනවා. ඒ වෙලාවට මාස්ක් විතරක් දාලා ඉන්න නිසා හඳුනාගන්න පුළුවනි. මේ හැමෝම අපිට උපරිම හොඳින් සලකනවා. සවස 3.15 ට බිස්කට් සමග කිරි තේ දෙනවා. සවස 5.45ට රෑ කෑම දෙනවා. හැමදේම ඉතාමත් හොඳින් පිළිවෙළට සිද්ධ වෙනවා.


ප්‍රදීපිකාගේ සැමියා ගයාන්, පුතුන් තිදෙනා සහ ප්‍රදීපිකාගේ පියා හබරාදූව නිරෝධායන මධ්‍යස්ථානයේදී

දවස් තුනකට සැරයක් ඇඳ ඇතිරිලි කොට්ට උර මාරු කරනවා. මම මෙහේ ආවේ ඇඳුම් 2ක් අරගෙන. තුවා, සබන්, දත් බෙහෙත්, දත් බුරුසු හැමදේම දුන්නේ රෝහලෙන්. අපිට අඳින්න ඇඳුම් කීපයක් ලැබෙනවා නම් ලොකු උදව්වක්.” යනුවෙන් ඇඳුම් ඉල්ලා සිටියේ ප්‍රකට ඇඟලුම් කම්හලක වැඩ පරීක්ෂකවරියක ලෙස සේවය කරන ප්‍රදීපිකා සුදර්ශනි රත්නායකය.

එහෙත් ප්‍රදීපිකාගේ සැමියා වන ගයාන් අමරසිංහ ඇතුළු පිරිස රඳවා සිටින හබරාදූව නිරෝධායන මධ්‍යස්ථානයට නම් බ්‍රැන්ඩික්ස් ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය ඇඳුම් කීපයක් පරිත්‍යාග කර ඇත.

“හබරාදූව නිරෝධායන මධ්‍යස්ථානය පොලිසියට අයිති තැනක්. ඇනෙක්ස් වගේ තියෙන්නේ. මමත් ප්‍රදීපිකාගේ තාත්තාත් ඉන්නේ එක් ඇනෙක්ස් එකක. පුතාලා තුන්දෙනා ඉන්නේ අපට ඉස්සරහ ඇනෙක්ස් එකේ. හැමදාම උදේ උණ බලනවා. විෂබීජහරණය කරනවා. අපි ආපු දවසේ පී. සී. ආර්. පරීක්ෂණ කළා. නැවත 13 වැනි දවසේ කරන බව කිව්වා.” යනුවෙන් සඳහන් කළේ ප්‍රදීපිකාගේ සැමියා, ගයාන් අමරසිංහය.

දිවුලපිටිය හොරගස්මුල්ල ප්‍රදේශයේ පදිංචි ගයාන්ට ප්‍රදීපිකා මුණගැසී තිබෙන්නේ ඔහු බස්රථයක රියැදුරු ලෙස සේවය කරන කාලයේදීය. ඒ කාලයේ ප්‍රදීපිකා මුද්දරගම ප්‍රදේශයේ ඥාති නිවසක නැවතී නයිවල ඇඟලුම් කම්හලක සේවයට ගියාය. යන එන අතරවාරයේදී ඇති වූ දැනහැඳුනුම්කම ආදර කතාවක් බවට පත් විය. මොනරාගල මාළිගාවිල උපත් ප්‍රදීපිකා පවුලේ වැඩිමහල් දියණිය වන අතර ඇයට බාල සොයුරියෝ සිවුදෙනෙක් සිටිති. ඇගේ පියා ගොවි මහතෙකි. ප්‍රදීපිකාගේ එක් නැගණියක් බුත්තල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරියකි.

1999 වසරේ නොවැම්බර් 16 වැනිදා ප්‍රදීපිකා - ගයාන් යුවළ එක් වහලක් යට ජීවත් වන්නට පැමිණියේ මවුපියන්ගේ ආශීර්වාදය ලබමිනි. දැන් 20 හැවිරිදි වැඩිමහල් පුතු පසිඳු ලක්මාල් අමරසිංහ යුද හමුදා සේවයට එක්වීමේ අපේක්ෂාවෙන් පසුවන අතර 18 හැවිරිදි අවිශ්ක ලක්ෂාන් මෝටර් රථ ආනයන සමාගමක සේවය කරයි. 16 හැවිරිදි ස්වප්නා දිව්‍යාංජලි දියණිය මෙවර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වන දිවුලපිටිය ඥානාවාස විද්‍යාලයේ සිසුවියකි. 14 හැවිරිදි බාලපුතු නිමේෂ් ලක්ෂිත ගල්කන්ද සීලවිමල විදුහලේ 7 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. වසර 21කට පෙර ගයාන් - ප්‍රදීපිකා තැනූ කැදැල්ලේ ඔවුහු දරුවන් සිවුදෙනා සමග කුලී නිවසක සතුටින් දිවි ගෙවති.

කුලී නිවසක විසූවද අඟහිඟකම් තිබුණද, ඔවුන්ගේ ආදරය, සතුට පැළදොරින් පලා ගොස් නැත. එහෙත් ප්‍රදීපිකා කොරෝනා ආසාදිතයකු ලෙස හඳුනා ගැනීමත් සමග ඇයට එල්ල වූ නින්දා ගැරහුම් කෙළවරක් නැත.

“මාව ගම්පහ රෝහලට එක්කං ගිය දා ඉඳලා මා ගැන කිසිම හොයා බැලීමක් නොකරපු ආයතනය මට කොරෝනා හැදුණ කියපු ගමන් මට කතා කරලා ඇහුවා මම කාවද ආශ්‍රය කළේ, ඉන්දියාවේ අය එක්ක හිටියා නේද කියලා.”

“ඇත්තටම එයාලාට ඕනේ වුණේ මාව පටලවලා එයාලා ඒකෙන් බේරෙන්න. ඒත් දැන් ඔප්පු වෙලා ඉවරයි කොරෝනා මගෙන් පෙන්නුවාට මට හැදෙන්න ඉස්සෙල්ලා ෆැක්ටරිය ඇතුළෙ තිබුණා කියලා. මම පළමු රෝගියා නොවෙයි කියලා හැමෝම දන්නවා. ඒ ගැන මට සතුටුයි. ඒත් මා ගැන යන කටකතා අහලා මුලින් නම් මම ඇඬුවා. කම්පා වුණා. මාව සැනසුවේ අයි. ඩී.එච්. රෝහලේ වෛද්‍යවරුන් හෙදියන් ඇතුළු කාර්යය මණ්ඩලය. ඇත්තටම එයාලා නම් දෙවිවරුන්.” යනුවෙන් ප්‍රදීපිකා සඳහන් කළාය.

බ්‍රැන්ඩික්ස් ආයතනයට ඉන්දියානු පිරිසක් පැමිණියාද යනුවෙන් අප ඇගෙන් විමසුවේ ඇය ඉන්දියානුවන් සමඟ සම්බන්ධතා පැවැත්වූවාද යනුවෙන් බ්‍රැන්ඩික්ස් ආයතනයේ කළමනාකාරිත්වය විමසා සිටි බැවිනි. ප්‍රදීපිකා පවසා සිටියේ යකහටුව බ්‍රැන්ඩික්ස් ආයතනයට එවැනි පිරිසක් නොපැමිණි බවය.

ඉන්දියාවේ ඇණවුමක් බාර දීමට සූදානම්ව තිබූ බැවින් ඔවුන් නිවාඩු නොලබා සේවය කළ බව සඳහන් කරන ඈ, ඔවුන්ට මැසීමට දුන් රෙදිවල මුත්‍රා ගඳක් වැනි ඉවසා ගත නොහැකි දුර්ගන්ධයක් තිබූ බව දන්වා සිටියාය. නමුත් සැප්: 17, සැප්: 18 වැනි දිනක මහන සාම්පල් පරීක්ෂා කිරීමට ඉහළ පෙළේ නිලධාරින් තිදෙනකු පැමිණි බවත් ඔවුන් ඉන්දියානුවන් ද කියා නොදන්නා බවත් සඳහන් කළේ ඇගේ මතකය අවදි කරමිනි.

බ්‍රැන්ඩික්ස් සමූහය මෙරට ඇරඹුණේ 1969 වර්ෂයේදීය. ඇඟලුම් ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වී තිබෙන්නේ 1972 වසරේදීය. සීදුවේ ලියනගේමුල්ල ප්‍රදේශයෙන් ඇරඹුණු බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කම්හල් මීනුවන්ගොඩ, වතුපිටිවල ඇතුළු ස්ථාන 23ක ස්ථාපිත කර ඇත. ඊට අමතරව ඉන්දියාවේ කර්මාන්ත ශාලා 4ක්ද බංග්ලාදේශයේ එක් කර්මාන්තශාලාවකුත් ඉදි කර තිබේ. මේ වන විට බ්‍රැන්ඩික්ස් ඇඟලුම් ක්ෂේත්‍රය සතු මුළු කම්හල් ගණන 28කි.

ඇමෙරිකාව සහ යුරෝපය ඉලක්ක කරගෙන නිපැයුම් නිෂ්පාදනය කළත් පසුගිය කොරෝනා රැල්ල සමග ඔවුන්ගේ ඇඟලුම් අපනයනයට ලැබුවේ නරක කලදසාවකි. කොරෝනා රැල්ලට රට වසා දැමීමට පෙර 53,000 ක පමණ සේවක පිරිසක් සේවයෙහි නිරත වුවත් දැන් සේවයේ යෙදී සිටින්නේ 35,000 ක සේවක සංඛ්‍යාවකි.

“බ්‍රැන්ඩික්ස් එකේ ඉස්සර හිටපු කළමනාකාරිත්වය නම් හරි හොඳයි. අපේ දුව ලොකු ළමයෙක් වුණාමත් අපේ ගෙදර ආවා. අවුරුදු දෙක තුනකට ඉස්සෙල්ලා මාව ඇක්සිඩන්ට් වුණ වෙලාවේ ඇවිල්ලා මාව බැලුවා. ඉස්සර කට්ටිය සේවක සේවිකාවන්ගේ ප්‍රශ්නවලට මැදිහත් වුණා. උදව් කළා; දුක සැප බෙදා ගත්තා. ඒත් දැන් අවුරුදු දෙකක විතර ඉඳලා වෙන කට්ටියක් ඉන්නේ.

ඒ අය කරන්නේ සේවකයන්ව මරව මරවා වැඩ ගන්න එක විතරයි.” යනුවෙන් සඳහන් කළේ ප්‍රදීපිකාගේ සැමියා වන ගයාන් අමරසිංහය.

## විජයානන්දට සහ අනුරාධාට අධ්‍යක්ෂ ජනරාල් තනතුරු


විජයානන්ද හේරත්


අනුරාධා හේරත්

අගමැති මහින්ද රාජපක්ෂයන්ගේ මාධ්‍ය හා සන්නිවේදන අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස විජයානන්ද හේරත් හා විදේශ සම්බන්ධතා අධ්‍යක්ෂ ජනරාල් ලෙස අනුරාධා හේරත් පත්කර ඇත. විජයානන්ද හේරත් මහතා මහින්ද රාජපක්‍ෂයන් ජනාධිපති ධුරයේ කටයුතු කළ සමයේදී මාධ්‍ය සම්බන්ධීකරණ ලේකම්වරයා(2006 - 2014) ලෙසද කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයාව සිටි(1995 - 1997) කාලයේදී ඔහුගේ මාධ්‍ය ලේකම් ලෙසද කටයුතු කළේය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සන්නිවේදන අංශයේ ප්‍රධානියා ලෙස ද කටයුතු කළ විජයානන්ද හේරත් කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන ආයතනයේ (IHRA) පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි.

අනුරාධා හේරත් 2013 වසරේ පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය සම්මේලනයේ මාධ්‍ය ප්‍රකාශවරයා ලෙස කටයුතු කළ අතර ඇය ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂවරිය ලෙසද මහින්ද රාජපක්ෂයන්ගේ විදේශ හා මාධ්‍ය සම්බන්ධතා අධ්‍යක්ෂවරිය ලෙසද කලක් කටයුතු කළාය.


නව මහා භාරකාරතුමා ලෙස පත්වීම් ලද අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් (නීති) ගනේෂ් ධර්මවර්ධන පසුගියදා කොළඹ 07, බුලර්ස් පටුමගේ පිහිටි මහා භාරකාර දෙපාර්තමේන්තුවේදී සිය ධුරයේ වැඩ ආරම්භ කළ අවස්ථාව. මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත, අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්වරුන් වන නීතිඥ චමින්ද කුලරත්න හා හර්ෂ විජේවර්ධන යන මහත්වරු ඇතුළු පිරිසක් මෙන්ම ගනේෂ් ධර්මවර්ධනගේ මෑණියන්ද එක්ව සිටියහ.

## අනුලා බුලත්සිංහල දිවි සැරියෙන් සමුගනී



(නිෂානි හේරත්)

සිංහල වේදිකාවට අනුපමේය සේවයක් කළ අනුලා බුලත්සිංහල මහත්මිය (අවුරුදු 73) පසුගියදා ශ්‍රී ජයවර්ධනපුර රෝහලේදී දිවි රඟ මඬලෙන් බැස ගියාය. මෙවර රාජ්‍ය නාට්‍ය උලෙළේදී ජීවිතේ එක්වරක් පමණක් පිදෙන නාට්‍ය කීර්ති සම්මානයෙන් ද පිදුම් ලැබූ ඇය, ලූෂන් බුලත්සිංහලගේ ආදරණීය බිරිය වන අතර හර්ෂ බුලත්සිංහල ඇයගේ එකම පුතුණුවන්ය. ඇයගේ දේහය පිළිබඳ අවසන් කටයුතු 17 දා බොරැල්ල කනත්තේදී සිදු කෙරේ.

1 වැනි පිටුවෙන්

## නිරෝධායන නීති කැඩූ 202ක් අසුවෙති

අමිල මලවිසූරිය

නිරෝධායන සහ රෝග වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදනවලට අදාළව නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයේ සහ සෞඛ්‍ය නීතිරීතිවලට පටහැනිව කටයුතු කළ පුද්ගලයින් 202ක් සහ වාහන 46ක් මේ වන විට පොලිස් භාරයට ගෙන තිබේ. පවතින නීතිය අනුව ඔක්තෝබර් 16 සිට නිරෝධායන නීති කඩකරන පුද්ගලයින්ට රුපියල් 10,000කට නොවැඩි දඩයක් හෝ මාස 6ක සිරදඬුවමක් ලබා දීම හෝ මෙම දඬුවම් දෙකම ලබා දීම හෝ සිදු කළ හැකිය.

පුද්ගල දුරස්ථභාවය, මුඛ ආවරණ පැලඳීම, පොදු ස්ථාන හා රාජකාරි ස්ථානවලට ඇතුළුවීමේදී දෑත් සේදීමේ පහසුකම් නව නීතිය යටතේ අනිවාර්යය වේ. ගැසට් පත්‍රයට අදාළ සෞඛ්‍ය නීති ක්‍රියාත්මක කිරීමේ බලතල හිමිව ඇත්තේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාටය.

### හාල් හිඟයට...

ඒ අනුව මෙවර මහ කන්නයේ වී මිලදී ගන්නා විට පොහොර සහනාධාරය ලබාදුන් සියලු ගොවි මහත්වරුන්ගෙන් වී කිලෝ 1000ක් පාලන මිල යටතේ මිලදී ගැනීමට වී අලෙවි මණ්ඩලය වැඩපිළිවෙළක් සකස් කර ඇතැයි හෙතෙම වැඩි දුරටත් පැවසීය. මේ දිනවල මෙරට වෙළෙඳ පොළේ හාල් මිල වැඩිවීම හා හාල් හිඟය වැළැක්වීමට මණ්ඩලය හා දිසාපතිවරු සතුව ඇති වී මෙට්‍රික් ටොන් 50,000 ක් සහල් කර අද හෙටම වෙළෙඳ පොළට යොමු කරන බව ද හෙතෙම පෙන්වා දුන්නේය. දැනට මණ්ඩලය සතුව වී මෙට්‍රික් ටොන් 30,000ක් ඇති අතර දිසාපතිවරු සතු ගබඩාවල වී මෙට්‍රික් ටොන් 30,000 ක් ඇත.

### 20 වන ව්‍යවස්ථා...

ඉකුත් 15 වැනිදා ලිඛිතව ඉල්ලා සිටියහ. වත්මන් රජය බලයට පත් කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කළ භික්ෂූන් වහන්සේ, ජාතික සංවිධාන ඇතුළු දේශප්‍රේමී ජනතාව නියෝජනය කරමින් තමන් මෙම ඉල්ලීම කරන බව මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි, ඇල්ලේ ගුණවංශ හිමි සහ බෙංගමුවේ නාලක හිමි එමගින් අවධාරණය කර තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී යාන්ත්‍රණයක් තුළ ක්‍රියාත්මක වන ශක්තිමත් රාජ්‍යයක් ස්ථාපිත කිරීමේ ව්‍යවස්ථාවක් ජනතාවගේ සැබෑ බලාපොරොත්තුව වුවද 20වන සංශෝධනයෙන් බිහි කරනුයේ එයට හාත්පසින්ම වෙනස් ක්‍රියාවලියක් බවද එමගින් පෙන්වා දී තිබේ. එබැවින් ජනතාවගේ අපේක්ෂාවන් මුදුන්පත් කරගන්නා අයුරින් සංශෝධන කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන ආකාරයෙන් නොව ජනතාවට සුබදායී ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසද එම හිමිවරු සිය ලිපිය මගින් ඉල්ලා සිටිති.

### ‘ලොක්ඩවුන්’පළාත්වලට..

ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවල ජනතාවට ලබා දිය යුතු විශ්‍රාම වැටුප්, සමෘද්ධි දීමනා, වැඩිහිටි දීමනා සියල්ල මේ වන විට ගෙවා ඇතැයි පැවසූ දිස්ත්‍රික් ලේකම්වරයා ස්වයං රැකියා අහිමි වූ ත්‍රිරෝද රථ රියැදුරන්, කරණවැමියන් වැනි පුද්ගලයන්ට සහනාධාරයක් ලබා දීම පිණිස කටයුතු ආරම්භ කර ඇතැයිද මේ වන විටත් වේයන්ගොඩ, මිණුවන්ගොඩ හා දිවුලපිටියේ එවන් ස්වයංරැකියාවන්හි නිරත අයගේ නාම ලේඛන සකස් කර ඇතැයිද ඔහු පෙන්වා දුන්නේය.

### මිහිඳු පරිනිර්වාණ...

මිහිඳු සෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සුරතින් මුල්ගල තබා ආරම්භ කෙරේ. එහිදී මහමෙවුනා අසපුවේ නිර්මාතෘ පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමිපාණන්ගේ අනුශාසනා පරිදි භික්ෂූන්වහන්සේ දහස් නමකගේ සහභාගීත්වයෙන් ආරම්භ කෙරෙන පින්කම් මාලාව එදින රාත්‍රී 10.00 තෙක් සිදු කෙරේ.

නීරෝගා
LAGNA JAYA ලග්න ජය
කෝටි ගණනින් දසලක්ෂ ගණනින්
මුදලින් තෑගි දිනා ගන්න
ඔබත් වැඩි වැඩියෙන් නීරෝගා ලග්න ජය මිලදී ගන්න
*ජාතික වකුගඩු අරමුදල වෙනුවෙනි.
NLB NATIONAL LOTTERIES
ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
32, දේශමාන්‍ය එන්. එච්. එම්. ඒ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 2324324, 011 4607000
වෙබ් අඩවිය: www.nlb.lk




# රට පුරා පැතිරුණු "කොවිඩ් ගිනි පුපුරු"

## මනාලියට කොරෝනා; මනාලයා නිරෝධායනයට; මධුසමය කල් දමයි...

## කොරෝනා ආසාදිතයන් දුම්රියෙන් හා බස්රියෙන් ගිහින්...

● **හර්ෂා සුගතදාස**

**කොරෝනා රැල්ලත් සමඟ ආරම්භ වූ පසුගිය සතිය විශේෂිත සතියක් වූයේ මෙතෙක් පමා වෙමින් පැවැති 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස උසස් පෙළ විභාගය එම සතියේ ඇරඹුණු නිසාය. 11 වැනි ඉරිදා 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, විභාග මධ්‍යස්ථාන 2936 කදී සිසු සිසුවියන් 3,31,694ක් සඳහා පැවැත්විණි. මෙවර 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්වයේ විභාග අපේක්ෂකයන්ට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කළේ ප්‍රථම වතාවටය. මහරගම අපේක්ෂා රෝහලේ දරුවන් දෙදෙනකුටත් අංගොඩ අයි.ඩී.එච්. රෝහලේ දරුවන් පස් දෙනකුටත් විශේෂිත විභාග මධ්‍යස්ථාන 2ක් පැවැත්වූ අතර නිරෝධායන මධ්‍යස්ථාන කීපයකදීත් විභාග මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සිදු වූයේ කොරෝනා වසංගතය හේතුවෙන් නිරෝධායනය වන දරුවන් වෙනුවෙනි. මීට අමතරව නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති පොලිස් බල ප්‍රදේශ 18ක විශේෂිත විභාග මධ්‍යස්ථාන යොදා තිබුණේ කොළඹ පාසල්වල ඉගෙනුම ලබන එකී ප්‍රදේශ තුළ සිටින දරුවන් සඳහාය.**

ගම්පහ දිස්ත්‍රික්කයේ පොලිස් බල ප්‍රදේශ 18ක නිරෝධායන ඇඳිරි නීතිය පනවා තිබියදී පසුගිය ඉරු දින සවස් භාගයේ සිට ග්‍රාම නිලධාරි වසම් 7ක් අධි ආරක්ෂිත කලාප ලෙස නම් කර හුදකලා කරනු ලැබුවේ මේ වසම් හත තුළ පුද්ගලයන් 37 දෙනකු කොරෝනා ආසාදිතයන් ලෙස හඳුනා ගැනීමත් සමඟ ය. මේ කලාපයේ පවුල් 3688 ක පුද්ගලයන් 12,600 ක් වාසය කරති. මාලිගාතැන්න, කුරිකොටුව හා එළුවාපිටිය මේ හුදකලා ගම්මානවලට අයත් වූ අතර එයින් අවදානම වැඩි ගම්මානය ලෙස හඳුනාගෙන තිබුණේ එළුවාපිටිය ග්‍රාමයයි. එළුවාපිටිය පන්සලේ හිමිවරුන් සිවුනමකට සහ පන්සලේ ආවතේවකරුවකුට ද කොරෝනා වැලඳී තිබිණි. එහෙත් ඊට පසුදින, එනම් 12 වැනිදා මේ හුදකලා ගම්මාන යළි විවෘත කෙරිණි.

ලංකා විදුලිබල පෞද්ගලික සමාගමේ (ලෙකෝ) කඳාන ශාඛාවේ සේවකයන් 12 දෙනකුට කොරෝනා ආසාදනය වී ඇති බව තහවුරු වූයේ ඔක්තෝබර් 12 වැනිදාය. 12 වැනි සඳුදා සිට මීගමුව අධිකරණ සංකීර්ණයේ පිහිටි අධිකරණ 7කුත් මීගමුව දේශීය ආදායම් කාර්යාලයත් වසා දැමුණි. ගම්පහ මාකොළ පෞද්ගලික ආයතනයක සේවය කරන කඩුවෙල පදිංචි කාන්තාවකට කොරෝනා ආසාදනය වී ඇති බව තහවුරු වූයේ ද 12 වැනිදාය. ඇගේ පවුලේ සාමාජිකයන් අටදෙනකු නිරෝධායනය කිරීමට පියවර ගැනිණි.

පානදුර හිරණ ප්‍රදේශයේ කාන්තාවක් කොරෝනා ආසාදිතයකු ලෙස හඳුනා ගැනීමත් සමඟ පානදුර ප්‍රදේශයේ ජනතාවට අවධානයෙන් සිටින ලෙස දැනුම් දුන්නේ ඇ පානදුර රෝහල, නගරය සහ ඒ අවට කඩසාප්පුවල ද ගැවසී ඇති බැවිනි. මීගමුව දළුපොත බදුවත්තේ පැවැත්වූ සංගීත සංදර්ශනයකට ගිය මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කම්හලේ සේවකයකුට කොරෝනා ආසාදනය වීමත් සමඟ ඊට සහභාගි වූ අයට ස්වයං නිරෝධායනය වන ලෙස උපදෙස් දී තිබේ. පූගොඩ කම්හලක තත්ත්ව පාලන අංශයේ සේවය කරන පැපිලියවල පල්ලේගම පදිංචි 37 හැවිරිදි දෙදරු මවකට කොරෝනා ආසාදනය වීමත් සමඟ 150 දෙනකුට පමණ නිරෝධායනය වීමට සිදු වූයේ ඇ රාජකාරි කටයුතු සඳහා කටුනායකටත් කොළඹටත් ගොස් තිබූ නිසාය.

වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචි මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ තරුණියක් බියගම ප්‍රදේශයේ තරුණයකු සමඟ විවාහය ලියාපදිංචි කර තිබුණේ ඔක්තෝබර් 02 වැනිදාය. එහෙත් ඇය කොරෝනා රෝගයට ගොදුරු වීමත් සමඟ මනමාල තරුණයාවත් විවාහය ලියාපදිංචි කළ රෙජිස්ට්‍රාර් සහ සාක්ෂිකරුවන් දෙදෙනාවත් නිරෝධායනයට ලක් කෙරිණි. මධුසමය ද කල් දැමීමට නියම විය. මේ අතරවාරයේදී මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවිකාවක් බැලීමට ඔක්තෝබර් 02 වැනිදා බියගම සියඹලාපේ තරුණයකු ඇතුළු පිරිසක් මංගල ගමනක් පැමිණ තිබුණි. එම තරුණියට ද කොරෝනා ආසාදනය වී ඇති බව දැන ගත් වහාම පැමිණි මනමාලයා ඇතුළු 14 දෙනකු ස්වයං නිරෝධායනයට යොමු කිරීමේ පුවතක් ද අසන්නට ලැබිණි.

පසුගිය 13 වැනිදා සිට බොරැල්ල නගරයේ ආපනශාලා 3ක් පාවහන් අලෙවිසැලක්, විසිතුරු භාණ්ඩ අලෙවිසැලක් හා කම්‍යුනිකේෂන් ආයතනයක් සහ බොරැල්ලේ ලෙස්ලි රණගල මාවතේ අතුරු මාර්ගයක් වසා දැමීමට සිදු වූයේ බොරැල්ල රිජ්වේ ආර්යා ළමා රෝහලේ සහ කොළඹ ජාතික රෝහලේ සුළු සේවකයන් සිවුදෙනකු කොරෝනා ආසාදිතයන් ලෙස හඳුනා ගැනීමත් සමගිනි. ඔවුන් සිවුදෙනා ඉහත කී ස්ථානවල සහ මාර්ගවල සංචාරය කර තිබුණු බැවින් වසා දැමීමට සිදු විය. ඊට අමතරව කොළඹ ජාතික රෝහලේ සේවිකාවකට කොරෝනා ආසාදනය වූ බව තහවුරු වීමෙන් ජාතික රෝහලේ ශල්‍යාගාරයක් සහ වාට්ටු 2ක් වසා දමනු ලැබීය.



| තහවුරු කළ රෝගීන් | දැනට රෝහල්ගත කර සිටින රෝගීන් | කරන ලද PCR පරීක්ෂණ සංඛ්‍යාව | පසුගිය පැය 24 තුළ තහවුරු වූ රෝගීන් | සුවපත් වූ කොරෝනා රෝගීන් | මරණ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 5,244 | 1,846 | 3,57,698 | 74 | 3,385 | 13 |

කොල්ලුපිටියේ පිහිටි බ්‍රැන්ඩික්ස් ඇඟලුම් ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ සේවකයන් 7 දෙනකුට කොරෝනා වැලඳීමත් සමග රත්මලානේ පිහිටි රාජ්‍ය බැංකු ශාඛාවක් වසා දැමීමට සිදු වූයේ ඔවුන්ගෙන් එක් අයකුගේ බිරිඳ එහි සේවය කරන නිසාය. කොල්ලුපිටියේ සේවය කළ කළමනාකරුවකු පසුගිය දිනෙක කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට යැමත් ඔහුගේ බිරිඳගේ මවුපියන් පොත් අලෙවි කුටියක් පවත්වා තිබීමත් නිසා කොරෝනා ව්‍යාප්තියේ අවදානම තවතවත් වැඩි විය. ඔහුගේ පියා, බිරිඳ, දරු දෙදෙනා, බිරිඳගේ මවුපියන් සහ ගෘහසේවිකාව නිරෝධායනයට යොමු කළේ එබැවිනි.

මැදවච්චියේ 70 හැවිරිදි කාන්තාවකටත් ඇගේ මිනිපිරියටත් කොරෝනා වයිරසය ආසාදනය වී තිබුණේ මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කම්හලේ සේවය කරන දියණිය බැලීමට මිනුවන්ගොඩට පැමිණ දියණියගේ නවාතැනේ රැයක් ගත කර ගොස් ගිය ගමනෙන් පසුවය. මන්නාරම රදගුරු නිවසේ ඉදිකිරීමකට ගිය තිදෙනකු කොරෝනා ආසාදිතයන් බවට තහවුරු වූයේ මෙම සතියේය. ඔවුහු කටුනේරිය, මුන්දලම හා ආරච්චිකටුව ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවකයකු ඔක්: 04 වැනි ඉරු දින බාරයක් ඔප්පු කිරීමට අනුරාධපුර ශ්‍රී මහා බෝධියට ගොස් ඇති අතර උඩමළුවේ සැදැහැවතුන්ගෙන් පිරී තිබූ බැවින් බෝමළුවේ පැදුරු එළාගෙන දිගු වේලාවක් රැඳී සිට තිබේ. මෙම තරුණයා කොරෝනා ආසාදිතයකු වශයෙන් හඳුනා ගැනීමත් සමගම ශ්‍රී මහා බෝධියේ කපු මහතුන් දෙදෙනකු නිරෝධායනයට යොමු කර තිබේ. සීදුවේ නවාතැන්පොළක සිටි 42 දෙනකු කොරෝනා ආසාදිතයන් බව තහවුරු වූයේ ද 15 වැනි බදාදාය. එදින සවස රජය විසින් නිවේදනය කරනු ලැබුවේ 16 වැනි බ්‍රහස්පතින්දා පාන්දර 5.00 සිට බලපැවැත්වෙන පරිදි කටුනායක පොලිස් බල ප්‍රදේශයට ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන බවයි.

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කරන මිතුරකුගේ ප්‍රිය සාදයකට සහභාගි වූ රත්මලාන බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවකයකුට කොරෝනා ආසාදනය වීමත් සමග ඔහු නතර වී සිටින මොරටුව කටුබැද්ද ප්‍රදේශයට කොරෝනා අවදානම ඇති විය. ඊට අමතරව දිවුලපිටිය ප්‍රදේශයේ මංගල උත්සවයකට සහභාගි වූ මොරටුව ප්‍රදේශයේ අයකු කොරෝනා ආසාදිතයකු ලෙස හඳුනා ගැනීමත් සමග මොරටුමුල්ල, විල්ලෝරාවත්ත, රාවතාවත්ත, එගොඩඋඩයන සහ කොරළවැල්ල පිරිසක් ස්වයං නිරෝධායනයට යොමු කර තිබේ. මාතර හිත්තැටිය ප්‍රදේශයේ 63 හැවිරිදි කාන්තාවක් කොරෝනා රෝගියකු ලෙස හඳුනා ගැනුණේ 15වැනි බදාදාය. ඇය ද දිවුලපිටියේ විවාහ මංගල්‍යයකට සහභාගි වී ඔක්තෝබර් 6 වැනි දින රුහුණු කුමාරි දුම්රියෙන් මාතරට පැමිණ මාතර - වැලිපිටිය බසයේ නිවසට පැමිණ තිබේ.

කඳාන ලෙකෝ සමාගමේ කොරෝනා ආසාදිතයකු කඩවත සිට අධිවේගී මාර්ගයේ ගාල්ලට විත් එතැන් සිට බද්දේගම පිහිටි ඔහුගේ නිවසට සෙනඟ පිරුණු බසයකින් පැමිණි අතර ඔහු පෝද්දල, බද්දේගම, ගාල්ල යන ප්‍රදේශවල සංචාරය කර තිබීමෙන් එකී ප්‍රදේශවල කොරෝනා ව්‍යාප්ත වීමේ අවදානමක් ඇති වී තිබෙන බව අමුතුවෙන් කිව යුතු නැත.

කොළඹ ජාතික රෝහලේ හෙදියකට කොරෝනා වැලඳී ඇති බවට වාර්තා වීමත් සමග ඇ කොළඹ සිට මතුගම දක්වා ගමන් ගන්නා අධිවේගී සුඛෝපභෝගී බස්රියේ රියදුරු, කොන්දොස්තර සහ බස් රථයේ හිමිකරු ස්ව කැමැත්තෙන්ම පී.සී.ආර්. පරීක්ෂණයකට ඉදිරිපත් වූහ. එයින් අනාවරණය වූයේ ඔවුන් තිදෙනාම කොරෝනා ආසාදිතයන් බවයි. ඔවුන් ආගිය මතුගම පෞද්ගලික බස් නැවතුම්පොළ, කඩසාප්පු වසා දැමුණු අතර කොන්දොස්තරගේ බිරිඳ සේවය කරන පෞද්ගලික බැංකුව ද කැමැත්තෙන්ම ගනුදෙනුවලින් ඉවත් විය.



මේ අතරවාරයේදී කොරෝනා ආසාදිතයන් ගමන් කළ බස් රථ 6ක් හඳුනා ගත් බව 16 වැනි දින අනාවරණය කෙරිණි. එම බස්රථ වන්නේ කොළඹ - මැදගම ගමන් ගන්නා ND 4890 අංකය දරන බස්රිය, මාකුඹුර - ගාල්ල ගමන් ගන්නා ND 2350 අංකය දරන බස්රිය, කඩවත - අම්බලන්ගොඩ ගමන් ගන්නා ND 0549 දරන බස්රිය, කොළඹ - යාපනය ගමන් ගන්නා ND 6503 අංකය දරන බස්රිය, ගාල්ල - කඩවත ගමන් ගන්නා NF 7515 අංකය දරන බස්රිය සහ කොළඹ - ඇල්පිටිය ගමන් ගන්නා NP 9787 අංකය දරන බස් රථයයි.

මේ අතරවාරයේදී කොරෝනා රෝගීන් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යැමෙන් රෝහල් ධාරිතාව උපරිම මට්ටමට ළඟා වී ඇති බව ඔක්තෝබර් 15 වැනිදා උදෑසන වාර්තා විය. එදින උදෑසන 5.00 වන විට කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර කරන රෝහල් 13කින් ඉතිරි වී ඇත්තේ ඇඳන් 170ක් පමණක් බවත් රෝගීන් 1542කට ඇඳන් වෙන් වී ඇති බවත් එයින් කියැවිණි. රෝහල් තුළ කොරෝනා රෝගීන්ට වෙන් කර තිබූ මුළු ඇඳන් ප්‍රමාණය 1712 කි. 15 වැනිදා උදෑසන වින විට වාර්තා වී ඇති රෝගීන් 1542 දෙනාගෙන් 127 දෙනකු පිටරට සිට පැමිණි අය වෙති. බ්‍රැන්ඩික්ස් පොකුරට අයත් රෝගීන් ගණන 1415 කි. ඇඳන් 100 කින් සමන්විත රෝහලක් උතුර ප්‍රදේශයේ ඉදිකිරීමට තීරණය වී තිබෙන්නේ එබැවිනි. මේ වන විට දංකොටුව රෝහලත් මොරටුව ලුණාව රෝහලත් කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර කිරීමට වෙන් කර ඇත. දීප ව්‍යාප්ත සිනමාශාලා ඔක්තෝබර් 31 වැනිදා තෙක් වසා දැමුවේ කොරෝනා නිසාය.

ගම්පහ පොලිස් බල ප්‍රදේශ 19 ක ඇඳිරි නීතිය පනවා තිබියදී විවෘත කර තිබූ කඩ, ෆාමසි ඔක්තෝබර් 13 වැනිදා සිට දින 3ක් වසා දමා ඔක්තෝබර් 16 වැනි සිකුරාදා සිට යළි විවෘත විය. ඒ උදෑසන 8.00 සිට රාත්‍රි 10.00 දක්වා පමණි. කොළඹ පුරපතිනිය රෝසි සේනානායක ඇතුළු කොළඹ මහ නගර සභාවේ සියලුම නාගරික මන්ත්‍රීවරුන්ට 16 වැනි දින පී.සී.ආර්. පරීක්ෂණ කිරීමටත් ඔවුන්ට ස්වයං නිරෝධායනය වීමටත් සිදු වූයේ කොළඹ නගර සභාවේ පුණ්‍ය කොමසාරිස් කාර්යාලයේ සේවිකාවකට කොරෝනා වැලඳීමත් සමගය. ඇ නගරාධිපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවති මුදල් පිළිබඳ කාරක සභාවට සහභාගි වී තිබීම හේතුවෙන් නගරාධිපතිනිය ඇතුළු පිරිසට පී.සී.ආර්. පරීක්ෂණ සිදු කරනු ලැබීය. ඊට අමතරව ඇගේ සමීපතමයන් හා කාර්යාලයේ සේවක සේවිකාවන්ට ද පී.සී.ආර්. පරීක්ෂණ සිදු කළ අතර ඇ සේවය කරන කාර්යාලය පිහිටි මරදාන ඩීන්ස් පාරේ ගොඩනැඟිල්ලේ පිහිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය හා ළමා මාතෘ සායන හැර සෙසු අංශ සති 2 කට වසා දැමිණි. මෙම ආසාදිත කාන්තාව කඩුවෙල පදිංචිකාරියකි. ඇගේ සැමියා කොළඹ ජාතික රෝහලේ සේවය කරයි.

වත්තල නගරයේ බත් පැකට් අලෙවි කරන පුද්ගලයකුට කොරෝනා ආසාදනය වී ඇති බව 15 වැනිදා අනාවරණය විය. ඔහුගේ බිරිඳ මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවිකාවකි. කිරිඳිවැල ප්‍රදේශයේ මාළු අලෙවි කරන අයෙකුට කොරෝනා ආසාදනය වීම නිසා ඔහු ඇසුරු කළ මාළු වෙළෙන්දන් 12 දෙනකුත් ඉන්ධන ලබා ගත් ඉන්ධන පිරවුම්හලේ සේවකයන් 16 දෙනකුත් පවුලේ සාමාජිකයනුත් ඇතුළු පිරිසක් ස්වයං නිරෝධායනයට ලක් කර ඇත. මෙම මාළු අලෙවිකරුවා කිරිඳිවැල, කුට්ටිගල, රදාවාන, පැපිලියවල, මැද්දේගම, නඩුවත්ත, බෝගහකුඹුර යන ප්‍රදේශ රැසක සංචාරය කර තිබේ.

මරදානේ පිහිටි පුද්ගලික බැංකු ශාඛාවක සේවිකාවකට කොරෝනා ආසාදනය වීම හේතුවෙන් එම බැංකුව තාවකාලිකව වසා දමා කාර්යය මණ්ඩලය ස්වයං නිරෝධායනයට යොමු කර ඇත. ඇ මාකොළ ප්‍රදේශයේ පදිංචිකාරියක් බවට වාර්තා වෙයි. මාකොළ ප්‍රදේශයේ 49 හැවිරිදි ව්‍යාපාරිකයකුටත් කොරෝනා ආසාදනය වී ඇති බව තහවුරු වී තිබේ. ඔහු නඩු කටයුත්තක් සඳහා මිනුවන්ගොඩ ප්‍රදේශයේ නීතිඥවරයකු හමුවීමට ගොස් ඇත.

යාල වනෝද්‍යානය අසල හෝටලයක සංචාරක මග පෙන්වන්නකුට කොරෝනා ආසාදනය වීමෙන් ඔහු සේවය කළ හෝටලයේ 61 දෙනකු ද පිටස්තර පුද්ගලයන් 60 දෙනකු ඇතුළු ඔහු ප්‍රතිකාර ලැබූ රෝහල් තුනක කාර්යය මණ්ඩල පිරිස් ද හම්බන්තොට නිරෝධායනයට යොමු කර තිබේ.

මිනුවන්ගොඩින් ඇරඹුණු කොරෝනා වයිරසය උතුර දකුණ, නැගෙනහිර, බටහිර ඇතුළු දස දිසාවේම පැතිරෙද්දී මිනුවන්ගොඩ ප්‍රදේශයේ ගනිහිමුල්ල, පේරලන්දවත්ත සහ හැලකන්දන යන ගම්මාන තුන හුදකලා කළේ බ්‍රැන්ඩික්ස් පොකුරේ ආශ්‍රිතයන් විශාල වශයෙන් වාර්තා වන නිසාය.

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් පොකුර 1789 දක්වා ඉහළ යන විට ඔක්තෝබර් 15 වැනිදා රාත්‍රියේ නව නිරෝධායන නීති ඇතුළත් ගැසට් පත්‍රය නිකුත් විය. සෞඛ්‍ය මාර්ගෝපදේශන දැන් නීතිගත වී තිබේ. දැන් සෙල්ලම් නැත. මුඛ ආවරණ නොපළඳා සිටියහොත් සමාජ දුරස්ථභාවය රඳවා නොගත්තොත් රු. 10,000/- කට නොවැඩි දඩයක් හෝ මාස 6ක සිර දඬුවමක් හෝ මේ දඬුවම් දෙකම ලබා දීමට අධිකරණයට බලය හිමි වේ.

**ඡායාරූප - නිශ්ශංක ද සිල්වා**

# කොරෝනා නීති කඩමින් නුවරඑළියේදී සැප ගත් මන්ත්‍රීවරු

● **ලලිත් චාමින්ද** - ගාල්ල

**කොරෝනා ජරමරය අස්සේ ගාල්ල මහනගර සභාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ හා එජාපයේ මන්ත්‍රීවරු පිරිසක් නුවරඑළිය මහ නගරසභාව බලා පිටත්ව ගියේ අධ්‍යයන චාරිකාවකට සහභාගිවීම සඳහාය. ඝන මළ අපද්‍රව්‍ය කළමණාකරණය සහ කාර්යාල කළමණාකරණ අධ්‍යයන වැඩසටහන ලෙස මෙය නමකර තිබුණි. මෙකී අධ්‍යයන වැඩසටන 09 හා 10 යන දෙදින තුළ නුවරඑළිය මහ නගර සභා පරිශ්‍රයේ දි පැවැත්විණි. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගාල්ල මහ නගරාධිපති ප්‍රියන්ත සහබන්දු, සහ උප නගරාධිපති පවුසල් නියාස් ( එජාප) යන මහත්වරු ඇතුළු නාගරික මන්ත්‍රීවරු හා මන්ත්‍රීවරියන් පිරිසක් මෙකි අධ්‍යයන වැඩසටහනට සහභාගී වීම සඳහා ඉකුත් 08 වැනි දින පිටත්ව ගියහ.**



නුවරඑළිය මහා නගර සභාව මඟින් පාලනය වන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය, මල අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය, අන්තර්ජාලය මගින් ඔන්ලයින් ගෙවීමේ අධ්‍යයනය, මොබිටෙල් අධ්‍යයන සමඟ එක්ව සිදුකරන රථ නැවතුම් ගාස්තු පිළිබඳ අධ්‍යයන කිරීම මෙම චාරිකාවේ අරමුණ විය.

කොරෝනා නීතිරීති උල්ලංඝණය කරමින් ගාල්ල මහනගර සභාවේ පොහොට්ටුවේ හා එජාපයේ මන්ත්‍රීවරු පිරිසක් නගරසභා මුදලින් අධ්‍යයන චාරිකාවක් මුවාවෙන් සැපගන්න නුවරඑළියට ගිහින් යැයි නගර සභාවේ ජ. වි.පෙ මන්ත්‍රීවරු කියන්නට වූහ. ඉන් නොනැවතුණු ජ.වි.පෙ මන්ත්‍රීවරු මේ සම්බන්ධයෙන් විරෝධය පළ කරමින් ගාල්ල නගරය පුරා පොස්ටර් ඇලවූහ. මෙකී අධ්‍යයන චාරිකාව ගැන හා එල්ල වෙන චෝදනා ගැන අපි අදාළ පාර්ශ්ව සමඟ කතාබහ කළෙමු. දකුණු පළාත් සභාවේ හිටපු ජ.වි.පෙ මන්ත්‍රී නලින් හේවගේ මෙසේ කීවේය.

"පෙහොට්ටුවේ හා එජාපයේ මන්ත්‍රීවරු පිරිසක් අධ්‍යයන චාරිකාවක් කියලා ගිහින් තියෙන්නේ නිරෝධායන නීති කඩලා. මේ ගැන අපි පොලිස්පතිතුමාත් දැනුම්වත් කිරීමට කටයුතු කරලා තියෙනවා. නිරෝධායන නීතිය අනුව මෙමමස 30 වැනි දින දක්වා රජය මගින් සම්මන්ත්‍රණ සාකච්ඡා වැඩමුළු තහනම් කරලා තියෙන්නේ. මේ ගැන ආණ්ඩුකාරතුමාත් දැනුම්වත් කළා" යැයි නලින් හේවගේ කියන්නේය.

එල්ල වන චෝදනා සම්බන්ධව ගාල්ල මහ නගරාධිපති ප්‍රියන්ත සහබන්දු කියන්නේ මෙවැනි කතාවකි.

නුවරඑළිය නගර සභාව මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ හොඳ ව්‍යාපෘතියක් කරගෙන යනවා. ඒ අය එම ව්‍යාපෘතිය සඳහා ජනාධිපති සම්මාන පවා අරගෙන තියෙනවා. ඒ ගැන සහ නගර සභාව මගින් පාලනය වන තවත් ව්‍යාපෘති කිහිපයක් අධ්‍යයනය කිරීමට තමයි නුවරඑළිය නගර සභාවට ආවේ. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ගැන නුවරඑළිය නගර සභාවෙන් අපි ගොඩක් දේවල් ඉගෙන ගත්තා. මේක අත්දැකීම් හුවමාරු කරගැනීමක්. නුවරඑළියේ නගර සභාවේ අය ගාල්ලටත් එනවා. මෙම අධ්‍යයන චාරිකාවට ජ.වි.පෙ මන්ත්‍රීවරු කියන මුදලක් ගිහින් නැහැ; සුළු මුදලක් තමයි වියදම් වුණේ. නීත්‍යානුකූලව තමයි සියලු කටයුතු කළේ. අනික රට වහලා නැහැ. කලින් යොදාගත් වැඩසටහනක් තමයි අපි ක්‍රියාත්මක කළේ. විනෝද චාරිකාවක් ගියේ නැහැ. නගරසභාවේ ජ.වි.පේ මන්ත්‍රීවරුත් මේ අධ්‍යයන චාරිකාවට සහභාගි වෙනවා කියලා කලින් අත්සන් කරලා තිබුණා" යැයි ගාල්ල මහ නගරාධිපතිවරයා සඳහන් කළේය. ගාල්ල මහ නගර සභාවේ උපනගරාධිපති පවුසල් නියාස් (එජාප) මෙසේ කීවේය.

"මේ වගේ වැඩසටහන් විටින් විට ක්‍රියාත්මක කරලා තියෙනවා. ජ.වි.පෙ මන්ත්‍රීවරුනුත් එනවා කියලා තිබුණා. මන්ත්‍රීවරු 21 දෙනෙකු හා නිලධාරීන් කිහිපදෙනකු මෙම අධ්‍යයන චාරිකාවට සම්බන්ධ වුණා. බස්රථයේ එක අසුනක එක් අයකු තමයි ගමන් කළේ. ඒ අයට මුඛ ආවරණ හා විෂබීජහරණ බෝතල් ලබා දුන්නා. සෞඛ්‍ය නීතිරීතිවලට අනුව තමයි අපි කටයුතු කළේ. මේ වගේ වැඩසටහන් රාශියකට මම මීට පෙර සම්බන්ධ වෙලා තියෙනවා." ගාල්ල මහ නගර සභාවේ විපක්ෂ නායක ජිලිත් නිශාන්ත මේ ගැන පැවසුවේ මෙවැන්නකි.

"මට නම් පුද්ගලික හේතුවක් නිසා මෙම අධ්‍යයන චාරිකාවට සම්බන්ධ වෙන්න බැරි වුණා. මේ වගේ වැඩසටහන් මීට පෙරත් ක්‍රියාත්මක වෙලා තියෙනවා. ගාල්ල මහ නගරසභාවේ නාගරික කොමසාරිස්තුමාත් මේ වැඩසටහනට සම්බන්ධ වුණා. අනවශ්‍ය ලෙස මුදල් වියදම් කරාවි කියලා මා නම් හිතන්නේ නැහැ. පුද්ගලික හේතුන් මත සමහරක් මන්ත්‍රීවරු ගියේ නැහැ. තම තමන්ගේ ආරක්ෂාව තමන් සලසා ගත යුතුයි. මා වසර 22ක් නගර සභාව නියෝජනය කරනවා මේ වගේ චාරිකාවක් නොගිය මන්ත්‍රීවරයකු නැහැ.

ගාල්ල මහ නගර සභාවේ ජ.වි.පෙ මන්ත්‍රී කණ්ඩායමේ නායක නාගරික මන්ත්‍රී සුනිල් මෙසේ කිවේය.

මෙම වැඩමුළුව සඳහා මුදල් වෙන්කර නොගෙන පූර්ව අනුමැතිය යටතේ තමයි ගිහින් තියෙන්නේ. වැඩමුළුව කියලා කිව්වාට විනෝද චාරිකාවක් තමයි ගියේ. ගිය කොරෝනා කාලයේ මුදල් වෙන්කරගෙන ජංගම දුරකතන ගත්තා මේ කොරෝනා කාලයේ විනෝද චාරිකාවක් ගියා. නගරසභාවේ සේවකයන්ට අතිකාල දීමනා ගෙවන්න මුදල් නැහැ. නගරසභාවේ බොහෝ කටයුතු අඩපණ වෙලා. මේ අය අධ්‍යයන චාරිකාවලට ගියාට ඇවිල්ලා කරන කරපු දෙයක් නැහැ.

ගාල්ල මහ නගර සභාවේ හිටපු නගරාධිපතිවරයකු වන වත්මන් නාගරික මන්ත්‍රී කැළුම් සෙනෙවිරත්න පැවසුවේ මෙවැන්නකි. ගාල්ල මහ නගර සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු 35 දෙනොගෙන් බහුතරයක් නවක මන්ත්‍රීවරු ඒ නිසා යම්කිසි දෙයක් ඉගෙන ගන්න මේ වගේ ගමනක් ගියාට කමක් නැහැ. ඒ ගැන වරදක් මම දකින්නේ නැහැ. තීන්දු තීරණ ගන්න අය ඒ අයගේ ආකල්ප වෙනස් කරගන්න විදේශීය රටවලට යැව්වත් කමක් නැහැ. නමුත් එවා හොඳින් අධ්‍යයනය කරලා ඇවිත් ගාල්ල නගරය තුළ ක්‍රියාත්මක කළ යුතුයි. මන්ත්‍රීවරු යමක් ඉගෙන ගන්න. මේ වගේ අධ්‍යයන චාරිකාවල නිරත විය යුතුයි.

මේ ගැන දකුණු පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය විලී ගමගේගෙන් අප කළ විමසුමකදී මෙසේ කීවේය.

අපද්‍රව්‍ය කළමණාකරණය ප්‍රධාන ගැටලුවක්. මේ කටයුතු දිරිමත් කරන්න කියලා මා උපදෙස් දීලා තියෙනවා. අවශ්‍ය පහසුකම් ලබාගන්න මුදල් පවා වෙන්කරලා දීලා තියෙනවා. මේ ගැන පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් අතර විශාල උනන්දුවක් තියෙනවා. මේ ගැන අධ්‍යයනය කරන්න. ලංකාව ඇතුළත මේ වගේ ව්‍යාපෘති හොඳින් කරන පළාත් පාලන ආයතනවලට ගොස් ඒ ගැන අධ්‍යයනය කළාට වරදක් නැහැ. බනින මිනිහා බනිනවා. අපිට එවා නවත්වන්න බැහැ. අත්දැකීම් හුවමාරු කරගැනීම ඉතා වැදගත්. නිරෝධායනය කියලා කැළිකසල අදින්නේ නැතිව ඉන්නද? මන්ත්‍රීවරයාටත් මේ ගැන අධ්‍යයනය කිරීමෙන් විශාල උනන්දුවක් ඇතිවෙනවා. මෙහි කිසි අඩුවක් මා දකින්නේ නැහැ. මේ ගැන විවිධ පුද්ගලයන් විවිධ දෘෂ්ටිකෝණවලින් දකිනවා. හොඳ දේ අරගෙන නරක දේ ඉවතට දැමිය යුතු බවද ආණ්ඩුකාරවරයා සඳහන් කළේය.

# ජවිපෙ '20'ට පොතක් දාන හැඩ

## මෙරට ප්‍රථම වරට රාජ්‍ය අමාත්‍යාංශවලට මුදල්

**කැබිනට් මණ්ඩලය සුපුරුදු ලෙස ඉකුත් සඳුදා පස්වරු පහට ජනාධිපති ලේකම් කාර්යාලයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වූහ. ඒ වන විටත් ශ්‍රී ලංකාව තුළ 'කොවිඩ්' රෝගය පිළිබඳව ජනතාව තිගැස්මකට ලක්වී බියක් ද පැතිරයමින් තිබුණි. කැබිනට් මණ්ඩලය රැස්වීමට පෙර එහි සිටි මැති ඇමතිවරු තම තමන්ගේ ප්‍රදේශවල මෙන්ම නොයෙක් ප්‍රවෘත්ති මගින් ලැබෙන තොරතුරු පිළිබඳව කතාබහ කරමින් සිටියහ.**

කැබිනට් රැස්වීම ආරම්භවීමත් සමග තමන් වෙත ලැබී තිබූ තොරතුරු සමගින් සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි සිය හඬ අවදි කළාය.

"කොරෝනා මෙවර පැතිර ගිය විදිය පිළිබඳව අපි සොයමින් සිටින්නේ. ඒ පිළිබඳව ගැටලුවක් තිබෙනවා. නමුත් මේ වසංගතය පාලනය කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග සෞඛ්‍ය අංශ උපරිම සිදු කරගෙන යනවා.

යුද හමුදාව ඇතුළු අනෙකුත් ආරක්ෂක අංශ මේ සඳහා උපරිම දායකත්වය ලබා දෙනවා. අදාළ සියලු පාර්ශවයන් දිනපතා මේ පිළිබඳව තොරතුරු රැස් කරමින් සාකච්ඡා සිදු කරනවා.

මෙය අපි දෙවැනි රැල්ල ලෙස හඳුනාගෙන තිබෙනවා. අදාළ අංශ දිවා රෑ නොබලා මේ සඳහා ක්‍රියා කරනවා" යැයි මෙහිදී ඇමතිවරිය අවධාරණය කළාය.

"ඔව් අපි ඒ සියලුම දෙනා ගැන බලන්න ඕන." ජනාධිපතිවරයා සිය හඬ අවදි කරමින් කීවේය.

### ජනපතිගේ විශ්වාසය

"මේ වන විට කොරෝනා තුන්වන රැල්ල පාලනය කිරීම සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂක අංශ කළ හැකි සියලුම දේ සිදු කරමින් සිටිනවා. මට විශ්වාසයි පළමු රැල්ල පාලනය කළ අපිට මේ රැල්ලත් පාලනය කළ හැකි බව. ඒ සඳහා ජනතාවගේ සහයෝගය අවශ්‍යයි" ජනාධිපතිවරයා කීවේය.

"සර් ඇඳිරි නීතිය දාපු ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල හුඟ දෙනකුට ආර්ථික දුෂ්කරතා තියෙනවා. ඒ අය වෙනුවෙන් රුපියල් 5000 දීමනාව ලබා දෙන්න පුළුවන් නම් ගොඩක් හොඳයි." යැයි ඇමැති ප්‍රසන්න රණතුංග ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියේය.

"හරි ප්‍රසන්න අපි ඒ පිළිබඳව මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කරමු. ඉතා ඉක්මණින් තීරණයක් ගමු" ජනාධිපති පිළිතුරු දුන්නේය.

මේ අතර ප්‍රසන්න ඇමතිවරයාට ඉකුත් සතියේ විශේෂ වගකීමක් පැවරුණි. ඒ අධ්‍යාපනයට සම්බන්ධවය. 5 වසර ශිෂ්‍යත්වය සහ උසස් පෙළ විභාගය පැවැත්වීමට තීරණය කිරීමත් සමගය.

ඒ වගකීම ගම්පහ දිස්ත්‍රික්කයේ ඇඳිරි නීතිය පැනවූ ප්‍රදේශවල විභාගය පැවැත්වීම හා නිරෝධායනය වන පවුල්වල දරුවන් විභාගය සඳහා යොමු කිරීමේ වගකීමයි.

පළාත් පාලන ආයතන ප්‍රධානීන් සමග වහාම සාකච්ඡාවක් පැවැත්වූ ප්‍රසන්න රණතුංග ඇමතිවරයා ඔවුනට උපදෙස් දෙමින් ප්‍රකාශ කර සිටියේ විභාග මධ්‍යස්ථාන වහාම විෂබීජහරණය කර සෞඛ්‍ය අංශ සමග එක්ව දරු දැරියන්ට විභාගය සඳහා අවශ්‍ය ආරක්ෂාව සහ පරිසරය නිර්මාණය කර දෙන ලෙසයි. මේ අතර කැබිනට් රැස්වීමේදී තවත් වැදගත් තීරණ කිහිපයකට එළඹී තිබුණි.

විද්‍යාලංකාර අන්තර්ජාතික බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව සේවා සැපයුම් තත්ත්වයට පත්කිරීම, ඌව වෙල්ලස්ස සරසවියට තවත් ඉඩමක් ලබාදීම, 2003 අංක දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය, බාස්මතී සහල් ආනයනය කිරීම ඇතුළු තවත් කරුණු කිහිපයකට කැබිනට් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි.

> රනිල්ගෙන් බෝම්බකරුවකු ගැන රහසක්

කොරෝනා ශ්‍රී ලංකාව තුළ පැතිර යාමේ අවදානමක් යළි ඇතිවීමත් සමග බොහෝ සීමාවන් පැනවීමට රජය පියවර ගනු ලැබීය. විශේෂයෙන්ම උත්සව අවස්ථා සීමා කිරීම මෙන්ම ඒවාට සහභාගි වන පිරිස් අඩු කිරීම, මගී බස්රථ වල ආසන ගණනට පමණක් මගීන් ගෙන යාම, මීටරයක දුරස්ථභාවය වැනි සෞඛ්‍ය කරුණු පිළිබඳව රජය ජනතාවට නොයෙක් අයුරින් දැනුම්වත් කිරීම් සිදු කරනු ලැබීය.

### නිරෝධායන ගැසට් එක එයි

මේ අතර නිරෝධායනය සම්බන්ධයෙන් පනවා ඇති නීති සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අති විශේෂ ගැසට් නිවේදනයක් ඉකුත් 15 වැනිදා නිකුත් කළේය.

එය නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත නමින් මුද්‍රණය කර තිබිණි.

ඉතිහාසයේ සිට ශ්‍රී ලංකාව සහ චීනය අතර දැඩි හිතවත්කම් පවතී. එය තවදුරටත් ඉහළ නංවමින් චීන දූත පිරිසක් ඉකුත් සතියේ ශ්‍රී ලංකාවට පැමිණියහ. චීන කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩල සභික යැංජිංයචි ඇතුළු පිරිසක් ඊට එක්වූහ.

මේ පිරිස ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර කොවිඩ් වැළැක්වීම සඳහා චීනය නිපදවා ඇති එන්නතක් ලබාගෙන තිබුණි. මෙම දූත පිරිස චීනයේදී පී.සී.ආර්. පරීක්ෂණයකට ලක්කර තිබූ බව චීන තානාපති කාර්යාල තොරතුරු අනාවරණය කළේය.

දූත පිරිසට නවාතැන් ලබාදී තිබුණේ කොළඹ නගරයේ පිහිටි අධි සුඛෝපභෝගි හෝටලයකි. එම හෝටලයට මෙන්ම චීන දූත පිරිස නැවතී සිටි විශේෂ කලාපයට දැඩි ආරක්ෂාවක් ලබාදීමට රජය කටයුතු කර තිබුණි.

මෙම දූත පිරිස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ සමග සාකච්ඡා පැවැත්වූ අතර "එක මාවතක් එක තීරයක්" යන වෙළෙඳ ප්‍රතිපත්තිය පිළිබඳව එහිදී කතා බහකර තිබේ.

ලබන නොවැම්බර් මස 17 වැනිදා අයවැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජය තීරණය කර තිබේ. මේ වන විට ලබන 2021 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකර ඇති අතර එය ලබන සතියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරේ.



අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මුදල් ඇමතිවරයා ලෙස අයවැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පසුව මාසයක පමණ කාලයක් එය විවාදයට ගනු ඇත.

මෙවර අය වැයෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන්කර ඇත්තේ ග්‍රාමීය කර්මාන්ත, කෘෂිකර්මය නගා සිටුවීමට බව දේශපාලන ආරංචි මාර්ග වලින් පැවසේ.

ඉතිහාසයේ ප්‍රථම වතාවට රාජ්‍ය අමාත්‍යාංශ වෙත අයවැයෙන් මුදල් වෙන් කිරීම මෙවර සුවිශේෂී අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. මීට පෙර සාමාන්‍ය ක්‍රමය වූයේ කැබිනට් අමාත්‍යාංශවලට මුදල් වෙන් කිරීමයි. එලෙස මුදල් වෙන් කර එමගින් පසුව රාජ්‍ය හෝ නියෝජ්‍ය ඇමතිවරුන්ගේ කටයුතු සඳහා මුදල් වෙන් කිරීම මෙතෙක් කල් සිදුවිය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ප්‍රථම වතාවට රාජ්‍ය අමාත්‍යවරුන්ට සිය බලය ගැසට් පත්‍රයක් මගින් ලබා දුන්නේය.

> ඉස්සර රැලි වගේම මේ කොරෝනා රැල්ලත් අපිට පාලනය කරන්න පුළුවන්
> - ජනපති

### අලුත් පක්ෂ 154 ක් ලියාපදිංචියට ඇවිත්

අලුත් දේශපාලන පක්ෂ 154 ක් ලියාපදිංචිය සඳහා මැතිවරණ කොමිසමෙන් ඉල්ලීම් කර තිබේ. කොමිසම මුල් වටයේ පරීක්ෂා කිරීම් වලින් පසුව ඉල්ලුම්පත් ඒවා තිබූ දේශපාලන පක්ෂ එකසිය විසි එකක් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ පැවැත්විය.

ජනතා සේවක පක්ෂය, අරුණලු ජනතා පක්ෂය, නව ප්‍රජාතන්ත්‍රවාදී මාක්ස් ලෙනින්වාදී පක්ෂය, පිවිතුරු හෙළ උරුමය, සමන්තුව කච්චි සහ සිංහල රාවය යන පක්ෂ ලියාපදිංචි කර තිබේ.

ජනතා විමුක්ති පෙරමුණ නායකයෝ විස්ස සම්බන්ධව දැඩි විවේචන ඉදිරිපත් කරමින් සිටිති. මේ සම්බන්ධව පක්ෂය විශේෂ සාකච්ඡා කිහිපයක්ම ඉකුත් සතියේ පැවැත්විය. ඔවුහු රටේ වර්තමාන තත්ත්වය පිළිබඳව තමන්ට කළ හැකි දේ පිළිබඳව ද කතාබහ කළහ.

"අපට ගම්පහ තත්ත්වය ගැන සලකන්න වෙනවා. අපේ පාක්ෂිකයන් දිගින් දිගටම කතා කරලා ඔවුන් මුහුණ දී තිබෙන තත්ත්වය පිළිබඳව දුරකතන ඇමතුම් ලබා දෙමින් පවසා සිටිනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් මෙන්ම අපේ ක්‍රියාකාරීන් නිතර නිතර කරුණු රාශියක් ගැන අහනවා." යැයි නායක අනුර කුමාර දිසානායක සඳහන් කළේය.

"අපි පුළුවන් උපරිම අයුරින් පාක්ෂිකයන්ට පමණක් නොවෙයි ජනතාවට ආධාර ලබා දුන්නා. සෞඛ්‍ය රක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් අප ඔවුන් ළඟට ගියේ."

නලින් ජයතිස්ස හඬ අවදි කරමින් කීවේය.

"ආණ්ඩුව මොනවා කීවත් මේ සැරේ නම් ඔවුන් ජනතාව අසරණ කර තිබෙනවා. රජය ජනතාවට සහන ලබා දෙන පාටක් නැහැ. කලින් වතාවේ වගේ නොවෙයි මේ වතාවේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මැදිහත් වීමක් නැහැ. සුපර් මාකට්, වෙළෙඳ සැල්, ෆාමසි ඇරලා තිබුණට ජනතාවට බඩු ගන්න සල්ලි නැහැ." ටිල්වින් සිල්වා කීවේය.

"අපි 20 ගැන අලුත් කතාවක් ජනතාව අතරට පත් කරන්න ඕන. කොරෝනා නිසා සම්මන්ත්‍රණ වැඩේ හරියට කරන්නත් බැහැනේ. මේ නිසා 20 ගැන පොතක ලියලා මේ පොත ජනතාව අතට පත් කරන්න ඕන." නලින්ද ජයතිස්ස කීවේය.

### රිෂාඩ් බදියුද්දීන් කෝ?

මේ අතර අධිකරණ නියෝග සහ නීතිපතිවරයාගේ උපදෙස් හැල්ලුවට ලක් නොකර හිටපු කර්මාන්ත, වාණිජ හා අවතැන් වූවන් නැවත පදිංචිකිරීමේ අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් අප්‍රමාදව අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු කරන ලෙස නීතිපති දප්පුල ද ලිවේරා මහතා ඉකුත් (15) වැනිදා රහස් පොලිසිය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට දැනුම් දුන්නේය.



රහස් පොලිසිය භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ මහතා නීතිපති දෙපාර්තමේන්තුවට කැඳවා රිෂාඩ් බදුර්දීන් අත්අඩංගුවට ගැනීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් කරුණු විමසීමෙන් අනතුරුව මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධව දැනුම් දී තිබේ.

සමගි ජන බලවේගයේ දේශපාලන රැස්වීම් පසුගිය සතියේදී නතර කර තිබුණේ කොරෝනා වයිරසය සමාජයේ වේගයෙන් ව්‍යාප්ත වෙමින් තිබෙන නිසාය. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස විපක්ෂ නායක කාර්යාලයේ නිලධාරීන්ට මෙන්ම සමගි ජන බලවේගය පක්ෂ කාර්යාලයේ කටයුතු කරන සියලු දෙනාටම දැනුම්දී තිබුණේ හැකි සෑම සනීපාරක්ෂක උපක්‍රමයක්ම අනුගමනය කරන ලෙසටය.

පාර්ලිමේන්තුවේ සිය කාර්යාලයේ වැඩ කරන ඇතැම් අයට නිවසේ සිට රාජකාරි කිරීමට ඔහු අවස්ථාව ලබාදී තිබුණේය.

## රාවකීය හැල්ල

ශාක්ති මෙන්ඩිස් කියයි... ejournalists@gmail.com

"මේ වගේ අවස්ථාවලදී මම මගේ කාර්ය මණ්ඩලය දිහා නම්‍යශීලීව බලන්නේ. මම කාර්යාලයේ මහ රෑ වෙනකම් වැඩ කරන හැම දවසකම ඔය අයත් මාත් එක්ක හිටියා. මේ අවස්ථාවේදී අවදානමක් තිබෙන අය ගෙදර ඉඳගෙන වැඩ කරන්න" සජිත් විපක්ෂ නායක කාර්යාලයේ නිලධාරින්ට උපදෙස් දුන්නේය.

ඒ අනුව ඇතැම් අය නිවසේ සිට රාජකාරි කළ අතර වට්ස් ඇප් හා දුරකතන මාර්ගයෙන් නිරන්තරයෙන් ඔවුන් හා සම්බන්ධ වෙමින් රාජකාරි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට විපක්ෂ නායකවරයා වැඩපිළිවෙළක් යොදා තිබුණේය. එසේ නිවසේ සිට රාජකාරි කරන අයද දිවා රෑ නොමැතිව තමන්ගේ රාජකාරි කටයුතු කිරීමට ද අතපසු කර තිබුණේ නැත.

> සජිත්ට ඇඟලුම් සේවිකාවන්ගෙන් දිගටම දුර ඇමතුම්

මහජන හමුවීම් නොපැවැත්වුවද මේ සතියේ සමගි ජන බලවේගයේ අභ්‍යන්තර සාකච්ඡා කිහිපයක්ම පැවැත්වූවේය. කොරෝනා අවදානමට මුහුණදීමට ආණ්ඩුව අසමත්වීම පිළිබඳව මෙන්ම පක්ෂයේ ඉදිරි වැඩපිළිවෙළ ගැනත් මෙහිදී දීර්ඝ ලෙස අදහස් හුවමාරු විය.

"ඔබතුමා කිව්ව කතා දැන් කාටත් තේරෙන්න පටන් අරගෙන තියෙන්නේ. වයිරසය ආසාදනය වී ඇති පිරිස් සඳහා ප්‍රතිකාර කිරීමට රෝහල්වල තියෙන ඇඳන් ප්‍රමාණය ප්‍රමාණවත් නෑ" රංජිත් මද්දුමබණ්ඩාර පැවසුවේය.

මේ අතර කටුනායක වෙළෙඳ කලාපයේ සේවිකාවන් කිහිපදෙනෙක් විපක්ෂ නායකවරයාට දුරකතන ඇමතුම් ලබාදුන්හ. තමන්ගේ දුක ඔවුහු විපක්ෂ නායකවරයාට පැවසූහ. ඒ ඔහු ඇඟලුම් කර්මාන්තයේ යෙදෙන අයගේ දුක් ගැන වැඩි අවධානයක් යොමු කරන බව දන්නා නිසාය.

> ගම්පහ සිසු දරුවන් රකින්න ප්‍රසන්නට රජයෙන් උපදෙස්

### හරීන් යෝගී ව්‍යායාම්වල

"සර්, අපිට පී.සී.ආර්. පරීක්ෂණ තියන්න කියලා එක දවසක් ගෙන්වා ගත්තා. එදා අපිට පරීක්ෂණ කරන්නේ නැතිව යැව්වා. පස්සේ දවසක නැවත ගෙන්වා ගත්තා. අපිට පැයක් ඇතුළත එන්න කියලා කැඳවා ගත්තේ. අඩුම තරමේ අපට අරගෙන යන්න ඕන අත්‍යවශ්‍ය දේවල් අරගෙන යන්නවත් මේ අය වෙලාව දුන්නේ නෑ" වෙළෙඳ කලාප සේවිකාවෝ සජිත්ට කීහ.

"ගිය වතාවේ හමුදාවේ රණවිරුවෝ කොරෝනා මෙහෙයුමට දාලා එයාලාට කොරෝනා ආසාදනය වුණාම සමහරු එයාලට ගල් ගහන තත්ත්වයට පත්වුණා. එහෙම කළගුණ නොදන්න අය ඉන්නවා. ඔයාලා වෙනුවෙන් අපි පුළුවන් උපරිමය කරනවා."

සජිත් වහාම විවිධ පාර්ශව දැනුම්වත් කරමින් මේ පිළිබඳව සිය අවධානය යොමු කළේය.

### අභයාරාමයේ බෝධි පූජාවට පැමිණි අමුත්තා කවුද?

ලංකාව පුරාම දිනමු කමිටු පිහිටුවීමේ වැඩසටහන කරට ගෙන සිටියේ හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයාය. කොරෝනා අවදානමත් සමග දිනුම් කමිටු පිහිටුවීමේ වැඩසටහනට තාවකාලික විරාමයක් ලබා දුන්නේය. මේ නිසා තරමක දේශපාලන විවේකයක් ලැබී සිටින හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා අලුත් වැඩකට අත ගසා තිබේ. ඒ යෝගී ව්‍යායාම් කිරීමටය.

යෝගී ව්‍යායාම්වල යෙදෙන හරීන්ගේ ඡායාරූප කිහිපයක් පක්ෂයේ නායකයින් සිටින වට්ස් ඇප් ගෲප් එකකට ඇතුළත් කර තිබුණේය.

"මොකද මේ හරීන් යෝගා කරන්න පටන් අරගෙන තියෙන්නේ" ඒවා දුටු සජිත් විමසුවේය.

"කොරෝනා අවදානම පහුවුණාට පස්සේ මීට වඩා වැඩි ජවයකින් 'දිනමු' කමිටු පිහිටුවීමේ වැඩ කරන්න ඕන. මම ඒකට සූදානම් වෙනවා" හරීන් උත්තර දුන්නේය.

සජිත් කීවේද කොරෝනා අවදානම පහව ගිය පසුව පක්ෂයේ යාන්ත්‍රණය වේගවත්ව බිම් මට්ටමේ සිට ගොඩ නැගිය යුතු බවය.

රටේ වර්තමාන තත්වයත් එක්ක දහවලක් රෑයක් නැතිව කැපවෙලා ඉන්න සියලුම සුව විරුවන්ටත් රටේ මහජනතාවටත් සෙත් පතන බෝධිපූජාවක් නාරාහේන්පිට අභයාරාමයේදී පසුගියදා පැවැත්විණි. වෙළෙඳ අමාත්‍යාංශය මගින් තමයි මේ බෝධිපූජාව සංවිධානය කර තිබුණේ. ආචාර්ය බන්දුල ගුණවර්ධන, ගාමිණී ලොකුගේ යන අමාත්‍යවරුන් වගේම පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග ද වෙළෙඳ අමාත්‍යාංශ නිලධාරීහු මෙයට එක්ව සිටියහ.

මේ ආශිර්වාදාත්මක බෝධි පූජාව පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමිපාණන් වහන්සේ තමයි මෙහෙයවූයේ. බෝධි පූජාව පටන් ගන්න ඔන්න මෙන්න තියෙද්දි එකපාරටම කවුරුත් බලාපොරොත්තු නොවුණ අමුත්තෙක් පැමිණියේය. කිසිම දැනුම්දීමක් වත් ඉඟියක් වත් නැතිව මෙතනට ආවෙ වෙන කවුරුත් නෙවෙයි. ඇමති බන්දුල හැමදාමත් ගරු කොට සලකන අපේ මහින්ද රාජපක්ෂ අගමැතිතුමාණන්ය. බෝධි පූජා පිංකම පටන් ගන්න පූජාවටත් ඉඳලා අගමැතිතුමා සුහද කතා බහක යෙදෙන ගමන් රටේ වත්මන් දේශපාලන තත්වයත් 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැනත් එතැන හිටපු ඇමති මන්ත්‍රීවරුන් එක්ක අදහස් හුවමාරුවක යෙදිණි. අතිශය කාර්යබහුලත්වය හින්දා අගමැතිතුමා එතැනින් ගියාට පස්සෙ ඇමති බන්දුල මාධ්‍යට අදහස් දැක්වුවේ නිකුත් කිරීමට තීරණය කරපු අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වල ආනයන බදු අඩු කිරීමේ ගැසට් නිවේදනය ගැනයි.

එ.ජා.ප. නායකයා බ්‍රහස්පතින්දා පෙරවරුවේ සිරිකොත රාජකාරි නිම කොට අනතුරුව දේශපාලන පළිගැනීම්වලට අදාළ ජනාධිපති කොමිසමේ සාක්කි ලබාදීමට ගියේය. ඊට පෙර සිරිකොතට පැමිණි විශාල පිරිසක් සහ නිලධාරින් සමග විශේෂ කතාබහක ද ඔහු නිරත විය.

"අඟහරුවාදා පාස්කු කොමිසමේ දී මොකද වුණේ" එ.ජා.ප. නීති නිලධාරියෙක් විමසීය.

"අහපු ප්‍රශ්නවලට උත්තර දුන්නා. එච්චරයි" නායකයා කීවේ මද සිනහවක් ද සමගිනි. "ජනමාධ්‍ය අයින් කරලා පාස්කු එකේ බෝම්බකරුවෙකු නිදහස් කිරීමට ගිය ආණ්ඩුවේ යම් පාර්ශවයක් සම්බන්ධ බවට වැදගත් තොරතුරක් හෙළි කළා කියලා ජනමාධ්‍යවල එහෙන් මෙහෙන් ගියා. ඒ සිද්ධිය මොකක්ද?" නායකයාට යොමු වූ තවත් පැනයකි.

"රහසක් කියන්නේ රහසක්. ඒවා තැන තැන කියන්න බැහැ." නායකයා කීවේ එවැන්නකි.

"20 ගැන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පාර්ලිමේන්තුවට දාන්න කලින් ලීක් වෙලා. ජනමාධ්‍යවල යනවා." වජිර අබේවර්ධන කීවේ නායකයා දෙස බලාය.

"ලීක් වෙච්ච කරුණුයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන කරුණුයි ගැළපෙනවාද මුලින්ම බලන්න ඕනේ. ගැළපුනොත් ලීක් වෙච්ච එක ලොකු ප්‍රශ්නයක් තමයි. මොකද අදාළ තීන්දුව යවන්නේ ජනාධිපති හා කථානායකට විතරයි. ලීක් කළේ දෙන්නගෙන් කවුද කියලා එතකොට ලොකු ප්‍රශ්නයක් එනවා." නායකයා පැහැදිලි කළේය.

එ.ජ.ප. ය යළි නගා සිටුවීමට අදාළව රුවන්, සාගල, කොඩිතුවක්කු ඇතුළු කණ්ඩායමේ වාර්තාව පිළිබඳවද මෙහිදී අවධානය යොමු විය.

"ඒ වාර්තාව මට ලැබුණා. කීප දෙනෙක් එක්ක සාකච්ඡා කළා. කොරෝනා නිසා අදාළ තීන්දු තීරණ ගන්න ටිකක් කල් යාවි. ඒත් ඉක්මණින් නායකත්වය, අලුත් නිලධාරීන් හා පක්ෂය නගා සිටුවීමේ උපාය මාර්ග ගැන තීන්දුවකට එනවා. කවුරුත් එක්කත් කතා කරලායි තීන්දු ගන්නේ. ආපහු ගහගන්න බෑ. අග්‍රවිනිශ්චයකාරයා වගේ මට තනියම තීන්දු ගන්නත් බෑ." එ.ජා.ප. නායකයාගේ ස්ථාවරය එය වේ.

### අකිල පාර්ලිමේන්තුවට?

එ.ජා.ප. ජාතික ලැයිස්තුව සඳහා මහලේකම් අකිලගේ නම ඔහු විසින්ම මැතිවරණ කොමිසමට යැවීමට උත්සාහ කළ බවට පසුගිය දා සමාජ මාධ්‍යවල පළවිය. ඒ ගැන ද කතාබහක් ඇති විය.

"අකිලටත් යන්න ඕන වෙලා වගේ පේනවා. අකිල වගේම සුදුසුකම් තිබෙන තවත් අය මේක ඉල්ලනවා. පක්ෂයේ එකගත්වය නැතුව පාර්ලිමේන්තුවට නම් කරන්න අමාරුයි. අනික ඡන්දයෙන් නොතේරුණු කෙනෙකුට ජාතික ලැයිස්තුවෙන් යන්න බෑ කියලා එ.ජා.ප. තීන්දුවකුත් තියෙනවා. අකිල ද වෙන කවුරු හරිද පාර්ලිමේන්තු යන්නේ කියලා ඉක්මනින් තීන්දු කරන්න ඕනෑ." නායකයා කීවේය.

කෝවිඩ් රැල්ල යළි ගම්පහෙන් ඇරඹී රට පුරා සමාජගත වන අනතුර තිබියදී ආණ්ඩුව එය මර්දනයට වඩා 20 ට මුල්තැන දීම පිළිබඳද එ.ජා.ප යේ අභ්‍යන්තර නොසතුට පල විය.

"ඒ වහපු සමහර ප්‍රදේශවල මිනිස්සුන්ට කන්නවත් නෑ. ඡන්දය ඉවර නිසාද කොහෙද දැන් 5000 ත් නෑ. මේ පාර ජාතිය අමතන්නේ නැතිව අඩු කළාය කියන සැමන්, පරිප්පු, ලූනු වෙළෙඳ පොලේ ඇත්තෙත් නෑ" එහිදී කියවුණේ එවැනි මතවාදයකි.



‘ 2015 අපට ලැබුණ ජනවරම පෞද්ගලික ගැටුමක් බවට පත්වුණා ’

# ‘විස්ස ආවොත් රටම යන්නේ තනි මතයට’

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක**











● **භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

● **විසිවැනි සංශෝධනයට ඔබ විරුද්ධ වන්නෙ ඇයි?**

විසිවැනි සංශෝධනය මඟින් ඇත්තටම ජනාධිපතිවරයාට විධායකයේ සම්පූර්ණ බලයත් ඒ වගේම ව්‍යවස්ථාදායකයේ සම්පූර්ණ බලයත්, අධිකරණයේ සම්පූර්ණ බලයත් ලැබෙනවා. ඒ වගේම ප්‍රජාතන්ත්‍රවාදීව තිබිය යුතු මැතිවරණය සහ මැතිවරණ ක්‍රියාවලිය ප්‍රසම්පාදන ක්‍රියාවලිය, විගණන ක්‍රියාවලිය වැනි ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් මූලධර්ම සියල්ලම නොතකා තනි මතයට තනි අතට හිතුමතයට ගැනීමේ උත්සාහයක් තමයි 20 වැනි සංශෝධනයේ තිබෙන්නෙ.

1960 ගණන්වල ලතින් ඇමෙරිකානු රටවල තිබුණු මිලිටරි ක්‍රියාවලිය වගේම ආසියානු කලාපයේ සිටි ඒකාධිපතියන් ඒ කාලයට ගැළපුණාට අද නූතන ලෝකයේ කිසිම ආකාරයට මෙය ගැළපෙන්නෙ නැහැ. රටේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සියල්ල ඇහැරිලා ප්‍රජාතන්ත්‍ර විරෝධී බලයන් ශක්තිමත් වෙයි. තවත් වැදගත්ම කරුණක් තමයි රට ජාත්‍යන්තරව කොන් වෙන්න මේක තව හේතුවක් වෙයි.

දැනටමත් සමාජයේ මේ රජයට ඡන්දය ලබාදුන් පිරිස් අතරම බලගතු විරෝධයක් මතුවෙලා තිබෙනවා. මහා සංඝරත්නය අන්‍ය ආගමික පූජකතුමන්ලා අතර දැඩි විරෝධයක් ඇතිවෙලා තිබෙනවා. අන්න ඒ නිසා මේකට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

● **19න් රටට සිදුවුණු සේවයක් නොමැති බව වර්තමාන රජය ප්‍රකාශ කරනවා. ඔබලාගේ යහපාලන රජය බිඳ වැටුණේ මේ හේතුව මතයි කියලා තවත් කතිකාවක් තිබෙනවා. මේ කියන කතා ඇත්තක් ද?**

19 ගෙන එන්න ආණ්ඩුව පැත්තෙන් ඡන්දය දුන්නෙ 56 දෙනයි. අනෙක් අය ඔක්කොම මහින්ද රාජපක්ෂ මහතා ප්‍රමුඛ පිරිසයි. 19 සම්මත කරන්න උදව් කරලා තියෙන්නෙ එක්සත් ජාතික සන්ධානයේ පිරිස. ඒ නිසා දැන් මේවා විවේචනය කරන්න එයාලට බැහැ. 19 වැරදි කතා කරන්න පුළුවන් සරත් වීරසේකරට විතරයි. ඒ, ඔහු මේකට විරුද්ධ වූ එකම කෙනා නිසායි. අනෙක් සියලු දෙනා මෙය නිර්මාණය කරන්න, මෙය ඇති කරන්න මෙයට පක්ෂව හිටපු අය. ඒ පිළිබඳව ඔවුන් කතා කිරීම දේශපාලන විහිලුවක් හැටියටයි මා දකින්නෙ.

● **විසිවන සංශෝධනය මඟින් ජනාධිපති ගෝඨාභයට මොකද වෙන්නෙ?**

ජනාධිපතිවරයා වටේ සිටින අය තර්ක කිහිපයක් ගෙන එනු ලබනවා. ඉන් එකක් තමයි විදේශ රටවලින් එන බලපෑම මෙන්ම ආක්‍රමණයන්ට එරෙහි වීමට විධායක ජනාධිපතිකම අවශ්‍ය වූ බව. නමුත් අපි දන්නවා ජේ. ආර්. ජයවර්ධන ඉන්දු ලංකා ගිවිසුම අස්සන් කළේ. ඒ වගේම ගෝඨාභය රාජපක්ෂයන් ආරක්ෂක ලේකම්ව සිටියදී මහින්ද රාජපක්ෂයන් ජනාධිපතිව සිටියදී ඇමෙරිකාව සමඟ 'ඇක්සා' ගිවිසුම අස්සන් කළේත්, චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිවරිය නෝර්වේ ඇතුළු රටවල් සාම සාධක ක්‍රියාවලියට කැඳවා ගත්තේත් මේ ජනාධිපති ධුරයේ බලය පාවිච්චි කරලා. රටේ ස්වෛරීභාවය උල්ලංඝණය කරපු තීරණ සියල්ල අරගෙන බැලුවාම ඒ සියල්ලම ජනාධිපති ධුරයේ බලයෙන් කරා මිසක් පාර්ලිමේන්තු බලයකින් සිදු කරපුවා නොවෙයි.

රටේ ඒකීයභාවය ආරක්ෂා කිරීමට ජනාධිපති ධුරය වැදගත් කියන අදහස තවත් එකක්. නමුත් රටේ ඒකීයභාවය රැඳිලා තිබෙන්නෙ පාර්ලිමේන්තුව තුළ; 76 වගන්තිය අනුව නීති තනන්න පාර්ලිමේන්තුවට තිබෙන අයිතිය මතයි. 20 වැනි සංශෝධනය මඟින් පාර්ලිමේන්තුවට තිබෙන ස්වෛරී අයිතිය උල්ලංඝණය කිරීම සඳහා විධායක ජනාධිපතිවරු ක්‍රියා කරලා තිබෙනවා.

ඒ වගේම මේ රටේ ඒකීය භාවයට මරු පහරක් වෙච්ච පළාත් සභා ක්‍රමය ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන ගෙන ආවේ ඔහුගේ ජනාධිපති ධුරයේ තිබූ බලතලවලින්. ඒ වගේම කොටි සංවිධානය සමඟ විටින් විට මහින්ද රාජපක්ෂයන් හා හිටපු ජනපතිනි චන්ද්‍රිකා කුමාරතුංග සාකච්ඡාවලට ගියේ මේ ජනාධිපති ධුරයේ බලතලවලින්. ඒ නිසා මේවා පාර්ලිමේන්තුවේ අනුමත කරගෙන සිදු කරපුවා නොවෙයි.

‘ 19ට එරෙහිව කතා කරන්න පුළුවන් සරත් වීරසේකරට විතරයි ’

බෞද්ධකම ආරක්ෂා කරගන්න ශාසනයේ ආරක්ෂාව සඳහා විධායක බලතල අවශ්‍ය බව ප්‍රකාශ කරනවා. ඒක එහෙම මතයක් නොවෙයි. එදා ජාතික හෙළ උරුමයට ජනමතයක් ලැබුණා. ඒ ජන මතය හරහා අන්‍ය ආගම් පනත අපි පාර්ලිමේන්තුවට ගෙනාවා.

මෙන්න මේ නිසා මම පැහැදිලිව කියන්නෙ විධායක ජනාධිපති ක්‍රමය අවශ්‍ය බවට මේ කරුණු පෙන්වන්නෙ බොරුවට. මේ කතා සියල්ලම මේ විදිහටම 1978 දී ජයවර්ධන ජනාධිපතිවරයා කිව්වා. ඔහු එදා කිව්වා රට සංවර්ධනය කරන්න බලය ඕන බව. ඔහු එදා ඒ බලය ගත්තා. නමුත් අවසානයේ රට කෙළවර වුණේ ලේ ගංගාවකින්. ආර්ථික වර්ධනයක් වුණේ නැහැ. අන්තිමට ආර්ථිකයට සියයට 01ට වැටුණා 87 වෙනකොට. මේ කියන කතා වර්තමාන ලෝකයට ගැළපෙන කතා නොවෙයි.

ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ජනසන්තක ආර්ථික ක්‍රම මඟින් ලබාගන්නා ජයග්‍රහණයන් තමයි තිරසර ජයග්‍රහණ කියන්නෙ. වර්තමාන ලෝකයේ තිබෙන ආර්ථික ගැටලු එක්ක ආර්ථික සංවර්ධන ජයග්‍රහණ ලබාගන්න බැහැ. එවැනි දේවල් වර්තමානයට ගැළපෙන්නෙ නැහැ. 20 වැනි සංශෝධනයට එල්ල වෙලා තිබෙන විරෝධය සමඟ අපිට පෙනී යන්නෙ මහජනතාව මේ පිළිබඳව අවබෝධයකින් ඉන්නා බවයි.

‘ සමඟි ජනබලවේගයේ කිසිම ගැටුමක් නැහැ ’

● **මෛත්‍රීපාල ජනාධිපතිවරයා සහ රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා අතර ගැටුමට හේතුව 19 වැනි සංශෝධනය නොවෙයිද?**

මම කියන්නෙ ඕකට වෙනම කතාවක්. මොකද ඔවුන් දෙදෙනාම තමන්ට ජනතාව ලබා දුන් ජනවරම අවබෝධ කරගත්තෙ නැහැ. මෛත්‍රීපාල සිරිසේන තමන්ට ඡන්දය ලබා දුන්නු ජනතාවට පටහැනිව ක්‍රියා කළා. රනිල් වික්‍රමසිංහව අමතක වුණා. තමන්ගේ කණ්ඩායමට ඡන්දය ලබා දුන්නෙ ලක්ෂ 24. එය ලක්ෂ 62 දක්වා ආවේ මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ශක්තියෙන් බව.

2015 තමන්ට ලැබුණු ජනවරම පෞද්ගලික එකක් ලෙස සලකා උදම් වෙලා කටයුතු කළා. ඒ දෙදෙනාගේ පෞද්ගලික ගැටුමක් බවට මේක පත්කරගෙන තිබුණා. අද එහෙම ගැටුමක් කිසිසේත්ම ඇති හේතුවක් නැහැනේ.

අද ජනාධිපතිවරයාගේ අයියා තමයි අගමැති මහින්ද රාජපක්ෂයන්. ආර්ථිකය මෙහෙයවන්නෙ බැසිල් රාජපක්ෂයන්. සිවිල් ආරක්ෂාව භාරව ඉන්නෙ මේ හැමදෙනාගේම ලොකු අයියා චමල් රාජපක්ෂයන්. එතකොට මේ එක පවුලක සාමාජිකයන් මේ අය අතර කිසිම ගැටුමක් හටගන්න විදිහයක් නැහැ නේද?

● **ආණ්ඩුව නියෝජනය කරන ඇමැතිවරු කිහිප දෙනෙකුම 20 වැනි සංශෝධනය යම් යම් කාරණා විවේචනය කරනවා. විශේෂයෙන්ම උදය ගම්මන්පිල සහ විමල් වීරවංශ යන ඇමැතිවරු. ඔබ මේ පිළිබඳව මොකද හිතන්නෙ?**

ඇත්ත වශයෙන්ම ඔය සිදු කරන්න බොරු රඟපෑමක් කියන එක මම පැහැදිලිව කියනවා. ඒ වගේම ඔය සිදු කරන්නෙ කලින් කතාබහ කරපු දේවල්. මොකද ඡන්දය විමසන අවස්ථාවේ ඔය සියලු දෙනාම විස්සට පක්ෂව ඡන්දය ලබා දෙනවා.

20 සම්බන්ධව මේ රටේ අද විරෝධතාවන් ඇතිවෙලා තිබෙනවා. අපේ මහා සංඝරත්නය ප්‍රමුඛ බෞද්ධ ජනතාව අතරේ සෙසු ජන කණ්ඩායම් අතරේ මේ ඒකාධිපති ගමනක් යන්න යනවා. මේක මහා විනාශයක්. මේ පිළිබඳව ඔවුන්ට තිබෙන්නෙ කම්පනයක්.

සජිත් ප්‍රේමදාසට ඡන්දය ලබාදුන් අය නොවෙයි. කෙලින්ම ගෝඨාභය රාජපක්ෂට ඡන්දය ලබා දුන් අයගෙන්ම මේ විරෝධතාව පැමිණිලා තිබෙනවා. එතකොට ඒ ජන පදනමේ විරෝධතාව තමයි නියම විරෝධතාව.

රජය තුළ ඉඳන් විරෝධතාව කරනවා කියන්නෙ රඟපෑමක්. මොකද ඔය කිසිම කෙනෙකුට කොන්ද පණ නැහැ. 20 වැනි සංශෝධනයට විරුද්ධව ඡන්දය දෙන්න. මොකද සංශෝධන තිබුණත් නැතත් ඔය අය ඡන්දය ලබා දෙනවා.

● **20 වැනි සංශෝධනය නිසා ආණ්ඩුවේ අර්බුදයක් තිබෙන බව සමඟි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරනවා. ඇත්තක් ද?**

ආණ්ඩුවේ අර්බුදයක් පිළිබඳව මට හරියටම කියන්න බැහැ. මතුපිටින් පේනවා එහෙම අර්බුදයක් තිබෙන බව.

මොකද බැසිල් රාජපක්ෂයන් හිතවත් කණ්ඩායම් විමල් වීරවංශ, විජේදාස රාජපක්ෂ වැනි අයට සමාජ මාධ්‍ය මඟින් නොයෙක් ප්‍රහාරයන් එල්ල කරනවා අපිට දකිනට පුළුවන්. හැබැයි අපි දන්නෙ නෑ මේවාවල සත්‍යතාව. මේ මොන දේ සිදු වුණත් සමාජ අර්බුදයක් තිබෙනවා. අපිට ඒක පැහැදිලිව කියන්න පුළුවන්.

දේශානුරාගය, සිංහල බෞද්ධ පදනම මහ ඡන්දය ලබා දුන් උගත් වැදගත් ඡන්දදායකයින්. ඒ වගේම බෞද්ධ භික්ෂූන් වහන්සේ අද මේ ආණ්ඩුව පිළිබඳව දැඩි කලකිරීමකින් අප්‍රසාදයකින් තමයි සිටින්නෙ. ඒ බව පැහැදිලිව පෙනෙන්නනම් තිබෙන්නෙ මුරුත්තෙට්ටුවේ ආනන්ද හාමුදුරුවන්, ඇල්ලෙ ගුණවංශ ස්වාමින් වහන්සේ. මේ ආණ්ඩුව ගැන කරන විවේචන තුළින් පෙනී යනවා.

මේ ආණ්ඩුවට ඡන්දය ලබාදුන් ඒ වෙනුවෙන් පෙනී සිටි අය අතරේ සිදු කෙරෙන කතාබහ අනුව එතැනින් පෙන්නුම් කරනවා මේ ආණ්ඩුවේ බරපතළ කඩා වැටීමක්.

● **ඔබ, ඔය මොන චෝදනා නැඟුවත් පාර්ලිමේන්තුවේදී ආණ්ඩු පක්ෂයේ ඇමැතිවරයකු ප්‍රකාශ කළා සමඟි ජන බලවේගය ප්‍රමුඛ විපක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසක් 20ට සහාය දක්වන බව. මෙය සත්‍ය කරුණක් නොවෙයි ද?**

මෙය අපිට බලාගන්න පුළුවන් ඡන්දය පැවැත්වෙන අවස්ථාවේදී. එවැනි දේවල් වෙනවා. ඒකෙ අනික් පැත්තක් තිබෙනවා. මේ රජය පිළිබඳව කලකිරුණු ආණ්ඩුවේ මැති ඇමැතිවරු අප සමඟ එකතු වීමට සාකච්ඡා කරමින් බලාගෙන ඉන්නවා.

● **සමඟි ජන බලවේගයේ නායකයන් අතර ගැටුමක් ඇති බවට ආණ්ඩුවේ ඇමැතිවරුන් අවස්ථා කිහිපයකදීම ප්‍රකාශ කර තිබෙනවා. කුමක්ද ඔය කියන ගැටුම?**

කිසිම ගැටුමක් අර්බුදයක් නැහැ කියන එක මම පැහැදිලිවම කියනවා. අපි ඉතා කෙටි කාලයකදී ජයග්‍රහණ රැසක් ලබාගන්න පක්ෂයක්. අපිට හොඳ නායකයෙක් සිටිනවා. ඔහුට හොඳ දැක්මක් තිබෙනවා.

‘ හිටපු ජනපතියි අගමැතියි පාස්කු ප්‍රහාර වගකීම පැහැර හැරියා ’

අපේ නායකයා සජිත් ප්‍රේමදාස. ඔහු ඉතා මිත්‍රශීලිව අනෙත් සාමාජිකයන් සමඟ වැඩ කරනවා. අනෙක අපි පක්ෂ සම්මේලනයක් පවත්වලා එය නිල වශයෙන් ප්‍රකාශයට පත් කළා.

● **20 සංශෝධනයට ආණ්ඩුවට තුනෙන් දෙක ලබාගන්න හැකි වේ ද?**

අපි එය ඡන්දය පැවැත්වෙන වේලාවට බලමු. හැබැයි මෙතැනදී එකක් පැහැදිලියි. ආණ්ඩුවට තිබුණු ජනවරම, ආණ්ඩුවට තිබූ විශ්වාසය ජනාධිපති ගෝඨාභය මහත්තයා පිළිබඳව රටේ ජනතාවට තිබූ විශ්වාසය මෙතැනින් අවසන් වෙනවා. එය තවදුරටත් ගැටලුවක් බවට පත්වෙනවා. ඒක මේ ආර්ථික අර්බුදය සහ කොවිඩ් ව්‍යාප්තියත් බලපානවා. මේ නිසා ජනතාවට අවශ්‍යයි අලුත් ගමනක් අලුත් නායකත්වයක් සහ අලුත් වැඩපිළිවෙළක්. ඒකට මේකම ලොකු පිම්මක් වෙයි. 20 සම්මත වුණත් නැතත්.

● **ඔබට ආණ්ඩුව සමඟ එක්වීමට ආරාධනා කළහොත් ඔබ ආණ්ඩුවට එකතු වෙනවා ද?**

කිසිසේත්ම නැහැ. මට ජනවරමක් දීලා තිබෙන්නෙ. මේ ආණ්ඩුවට එරෙහිව අලුතෙන් හිතලා අලුත් ප්‍රතිපත්තියක් ඉදිරියට ගෙන යන්න. ඒ වෙනුවෙන් මම කැපවෙලා ක්‍රියා කරන්නෙ.

මාව කොමිෂන් සභා විශාල ප්‍රමාණයකට කැඳෙව්වා. උසාවියේ නඩු ගණනාවක් මට විරුද්ධව පනවා තිබෙන්නෙ. මාව සිර කරනවා කියලා පාරම් බාන්නෙ. ඒ වගේ දේවල් කරන තත්ත්වයක් තුළ මම ආණ්ඩුවට එක්වන්නෙ නැහැ. මම ඔය කිසිම දේකට බය නැහැ. අපි යන ගමන ඔය බාධකවලින් නවත්වන්නටත් බැහැ. අපි අනිවාර්යයෙන්ම ජනතාවගේ ආණ්ඩුවක් බොහොම ඉක්මනට බිහි කරනවා. අපි මේ රට ආර්ථික අර්බුදයෙන් ගලවාගන්න පුළුවන් ආණ්ඩුවක්. දේශයට ආදරය කරන ආණ්ඩුවක් පිහිටුවනවා.

● **මේ රජය බලයට පැමිණෙන්නෙ බැඳුම්කර කොල්ලය සහ වංචනිකයන්ට දඬුවම් ලබාදෙන පොරොන්දුව මත. හොරු අල්ලන්නෙ නෑ කියන චෝදනාව ආණ්ඩුවට තිබෙනවා නේද?**

ආණ්ඩුව සහ ආණ්ඩුවට සහාය දෙන මාධ්‍ය බළඇණි ජනතාව බියට පත් කරමින් ප්‍රධාන කරුණු තුනක් පිළිබඳව කතාබහ කළා. බැඳුම්කර මගඩිය, බැඳුම්කර හොරු සහ අර්ජුන් මහේන්ද්‍රන් කනෙන් අල්ලාගෙන එන බව. කුමාර් නාදනන් කොටි නායකයා ගෙන ආපු අපිට මේවා කජ්ජක් නේද කියලා ජනතාවට කිව්වා. දැන් මාස එකොළහක් අර්ජුන් මහේන්ද්‍රන්ගේ එක මයිලකටවත් මුකුත් වෙලා නැහැ.

ඒ විතරක් නොවෙයි, අපරාධකරුවන් උසාවියට එනකම් අපරාධකාරයන්ව අල්ලගන්න මේ ආණ්ඩුවට බැරි වුණා. තත්පර පහක් හිරේ දාන්න බැරි වුණා ඇලෝසියස්ව. අපි අට මාසයක් ඔහුව හිරේ දැම්මා. ඒ වගේම බැඳුම්කරේ පාඩුව අය කරගත්තා. දැන් මහජනතාව දන්නවා ඒක නාටකයක් කියලා.

සහරාන් සිද්ධිය බලන්න. එහෙත් එහෙමයි. සහරාන් පිටුපස්සෙ ඉන්නවා කීවා. විවිධ ගොඩ් ෆාදර්ලා, ව්‍යාපාරිකයන්, ඒ වගේම දේශපාලකයන් ඔය වගේ සමාජයේ නොයෙක් බලගතු පිරිසක් ඉන්නවා කියලා කිව්වා. කවුද අද අත්අඩංගුවට අරගෙන තිබෙන්නෙ. කොහේද මේ පරීක්ෂණ විසඳලා තිබෙන්නෙ. අඩු ගානේ එදා කීවා තොරතුරක් ලැබිලත් සහරාන් අල්ලගන්න බැරි වුණා කියලා. අද මෙයට අදාළයි කියන අය ප්‍රසිද්ධියේ ඉන්නවා. ඔවුන්ව අල්ලගන්න බැහැ කියනාව.

ඒ විතරක් නොවෙයි එම්.සී.සී. ගිවිසුම ගැන කිව්වා. ඇමෙරිකානු අධිරාජ්‍යවාදය ගැන කිව්වා. නමුත් ඇමෙරිකාව ඒ ගැන කතාබහ කරන්නට ලබන සතියේ ලංකාවට එනවා. මෙහිදී සෝෆා එක ගැන කතා කරනවා. මේවාට විරුද්ධව උපවාස කරපු අය උද්ඝෝෂණ කරපු අයට අද ඇමැතිකම් ලැබිලා. ආණ්ඩුකාරකම් ලැබිලා. නොයෙක් නිලතල ලැබිලා. හැබැයි මේ රටේ ජනතාවට තේරෙනවා තමන්ව අන්ත අසරණ කරලා. තමන්ව ඉතා නින්දිත රැවටීමකට ලක්කරලා. තමන්ව අසරණ කරපු බව මේ බලවේග සියල්ලම.

● **සහරාන් ප්‍රහාර එල්ල කළේ යහපාලන රජය පැවැති සමයේ. ඔබ එහි ඇමැතිවරයෙක්. මේ ප්‍රහාරයේ වගකීම කවුද භාර ගන්නෙ?**

පොලිසියට මේ පිළිබඳව තොරතුරු ලැබුණා නම් පොලිසිය ඊට අදාළ අංශ සමඟ සම්බන්ධ වී මෙයට පිළියම් යොදන්නට ඕනෑ. මොකද ජනාධිපතිගෙන් සහ අගමැතිගෙන් අහ අහ ඉන්න ඕන නැහැ. නමුත් ජනාධිපතිට වගකීමක් තිබෙනවා. සේනාධිනායකයා වශයෙන් සහ අදාළ ඇමැතිවරයා වශයෙන් මේ පිළිබඳව දැනුම් දුන්නා නම් ඊට අදාළ ක්‍රියාමාර්ග ගන්න.

අගමැතිවරයාත් මෙහිදී ඔහුගේ වගකීම පැහැර හැර තිබෙනවා. අපි බොහොම නිහතමානීව කියනවා. අපිටත් මෙහි වගකීම මඟහරින්න බැහැ. අපිත් වගකිව යුතුයි.

● **සමඟි ජන බලවේගයේ ඉදිරි ගමන්මඟ කෙසේ ද?**

පක්ෂයක් හැටියට අපි සියලුම දෙනා එකා මෙන් ක්‍රියා කරමින්. ගම්බිම් මට්ටමින් සමිති ශාඛා පිහිටුවමින් පක්ෂය පුළුල් ව්‍යාප්තියක් සිදු කරනවා. නව සාමාජිකයින් දිනෙන් දින අප වටා රොක්වෙමින් සිටිනවා. ඉදිරියේදී අපි සමඟ ජන බලවේගය හැටියට සෙසු පක්ෂ සමඟ සමඟ ජන සන්ධානය වශයෙන් කටයුතු කරනවා. ඉදිරියේදී පැවැත්වෙන ඕනෑම මැතිවරණයක් සඳහා ජයග්‍රාහී කණ්ඩායමක් හැටියට ඉදිරිපත් වීමට අවශ්‍ය සියලු දේශපාලනික ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා.

# ‘පොහොට්ටුවට ජනතාව බලය දුන්නේ විස්ස ගේන්නයි’

**අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස්**

● **භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**



‘බැසිල් ගැන මෙතනදි කතා කරන්නේ දේශපාලන අවස්ථාවාදය නිසා’

● **විසිවන ආණ්ඩුක්‍රම සංශෝධනය අවශ්‍ය වන්නේ ඇයි?**

මෙහි මේ රටේ අනාගතයට අවශ්‍ය බොහෝ තීරණාත්මක කරුණු රැසක් ඇති නිසා මෙම සංශෝධනය අපි ගෙන ඒමට තීරණය කර තිබෙනවා. මේ පිළිබඳව සරලව කියනවා නම් රට අරාජික වන එක වැළැක්වීම සඳහායි 20 අවශ්‍ය වන්නේ. ඒක මුළු රටම ඇස් පනාපිට දැක්කා. කොතරම් ප්‍රමාණයක් ද කියනවා නම් 19 වැනි සංශෝධනයට අනුව යහපාලන ආණ්ඩුව කරන්න බැරි තත්වයකට මෙය රට රැගෙන ගියා. මේ රටේ ජනතාව පැහැදිලිව එය දැක්කා.

රටේ ආරක්ෂාව, ආර්ථික සංවර්ධනය පිළිබඳ කිසිම දෙයක් කරන්න බැරි තත්වයක් උදාවුණා 19 වන සංශෝධනය නිසා. ඒ කියන්නේ එකිනෙක සමග අඛණ්ඩව ගැටෙන බල කේන්ද්‍ර දෙකක් නිර්මාණය වුණා. ජනාධිපතිවරයා සහ අගමැතිවරයා වටා.

මෙයට හොඳම සාක්ෂිය තමයි පාස්කු ප්‍රහාරය විමර්ශනය කිරීම සඳහා පත් කළ ජනාධිපති කොමිසන් සභාව ඉදිරියේ දිනෙන් දින අනාවරණය වූ කරුණු. ඇත්තටම ඒවා අහන් සිටීමේදී පවා බියක් දැනෙනවා. මේ රටේ ඒ කාලයේ ආණ්ඩුවක් තිබුණාද නැද්ද කියන එක.

මේ ප්‍රහාරය සම්බන්ධව සියලුම විස්තර රජයට ලැබිලා තිබෙනවා. මහා විශාල ව්‍යසනයකට සූදානම් වීම. ප්‍රහාරය එල්ල කරන පුද්ගලයන්, ප්‍රහාරයේ සැලසුම්, ස්ථාන සියල්ලක් පිළිබඳව කරපු දෙස් විදෙස් ඔත්තු මාර්ග මගින් රජයට ලැබිලා තිබුණා. නමුත් මේ ප්‍රහාරය සම්බන්ධව රජය කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. ගන්න සමත් වෙලත් නැහැ. මේ රටේ ආණ්ඩුවක් තිබුණා කියලා කාටවත් කියන්න බැහැ.

● **ඔබ කියන්නේ පාස්කු ප්‍රහාරයටත් මේ ‘19’ වග කියන්න ඕනෑ කියලද?**

ඔව්. ජනාධිපතිවරයා ගන්නා තීන්දු තීරණ මෙන්ම ජනාධිපතිවරයාගේ ක්‍රියාමාර්ග රැසක් කඩා කප්පල් කරන්නට අගමැතිවරයා පියවර ගනු ලැබුවා. එලෙසම අගමැතිවරයා ගන්න තීන්දු තීරණ ක්‍රියාමාර්ග කඩාකප්පල් කිරීමට ජනාධිපතිවරයා ක්‍රියා කළා. ප්‍රතිපත්ති පිළිබඳව ගැටුම්. පුද්ගලයන් දෙදෙනෙකු අතර විරසකය. මේ සියල්ල නිසා රාජ්‍ය තන්ත්‍රය සම්පූර්ණයෙන්ම කඩා වැටුණා. මෙකට වන්දි ගෙව්වේ මේ රටේ අහිංසක ජනතාව. ජීවිත 265 ක් වන්දි ගෙව්වා. අද කීදෙනෙක් ආබාධිත වෙලා ඉන්නවාද.

මේ තත්වයන් දිගටම ගෙනයනවා නම් අපිට පුළුවන් 19 වැනි සංශෝධනය තියාගන්න ක්‍රියාත්මක කරන්න. එහෙම කරන්න බෑ. මේ රටේ ජනතාව මේවා වෙනස් කරන්න තමයි අපිට බලය ලබා දුන්නේ. 20 අවශ්‍යයැයි කියලා අපි කියන්නේ අන්න ඒ නිසයි.

එක රටකට එක ආණ්ඩුවක් තියෙන්න ඕන. ආණ්ඩු දෙකක් තියෙන්න බැහැ. ඒක කඹ ඇදිල්ලක් බවට පත් වෙනවා. අන්න ඒ තත්වය තුළ කිසිම දෙයක් කරන්න බැහැ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විස්තර සහිතව ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ විස්ස පිළිබඳ සඳහන් කර තිබෙනවා. මේ සඳහා ජනතාව අති විශාල බලයක් එතුමාට ලබා දුන්නා. වගකීම් රැසක් ඉෂ්ඨ කිරීම සඳහා ජනතාව බලය ලබා දුන්නා. අද එම වගකීම් ජනාධිපතිවරයා විසින් ඉටු කරමින් සිටිනවා. 69 ලක්ෂයක් ඡන්දය දීලත් ජනාධිපතිවරයාට ආරක්ෂක ඇමති ධුරය දරන්න බැහැ. 19 ට අනුව. ඒ තත්ත්වය අපි තවදුරටත් පිළිගත යුතු නැහැ. අපි ඒ සඳහා තමයි 20 වන සංශෝධනය ගෙන එනු ලබන්නේ.

● **19 වැනි සංශෝධනය තුළ ඔබ දුටු ප්‍රබලම දුර්වලකම් මොනවාද?**

මෙම සංශෝධනයේදී එක් තැනක රාජ්‍ය බලය රැඳී නොපැවතෙනවා. එය ඉතා දුර්වල තත්වයක්. ජනතාවට අවශ්‍යම දේවල් සිදු කිරීමේදී ජනතාව පත් කරගන්නා නායකයන්ට විවිධ බාධක තහංචි පැනවීම. හැම අතින්ම තිරිංග දැමීමම. බලයට සීමා දැමිය යුතු තමයි. හැබැයි මෙහිදී බලයට සීමා පැනවීම වෙන තැනකට ගෙන යනවා. එතකොට කිසිම දෙයක් කරන්න බැරි තත්වයක් ඇති වෙන්නේ.

අත්තනෝමතික, අසීමිත බලය හොඳ දෙයක් නොවෙයි. හැබැයි ජනතාවට පොරොන්දු වූ දේවල් සිදු කිරීමට බලයක් තිබිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය බලය තිබිය යුතුයි. එය නොදෙනවා නම් ජනතාවට සේවය කරන්නේ කොහොමද?

ජනාධිපතිවරයාට බලය දෙන්න එපා කියන අය සිවිල් සමාජය නියෝජනය කරන කොමිසන් වලට බලය දෙන්න කියනවා. ඒක හරිද? එය තර්කානුකූලද? ප්‍රජාතන්ත්‍රවාදයට ගැළපෙනවාද? ජනතා ඡන්දයෙන් පත්වුණු ජනාධිපතිට බලය ලබාදිය යුතු බව පැහැදිලි කරුණක්.

● **20 වැනි සංශෝධනයෙන් ජනාධිපතිවරයාට අසීමිත බලයක් ලැබෙනවා නේද?**

අසීමිත බලයක් ලබා දෙනවා කියන එක හරිද. ඒ කියන්නේ මොන බලය තිබුණත් ආණ්ඩුව ගෙන යා යුතුයි. ආණ්ඩුව ගෙනයාම සඳහා මුදල් අවශ්‍යයි. මුදල් පාලනය කරන්නේ කවුද? ජනාධිපතිවරයා නොවෙයි. මුදල් පාලනය කරන්නේ පාර්ලිමේන්තුව.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි වගන්තියේ පැහැදිලිව ප්‍රකාශ කරනවා මුදල් පාලනය කිරීම හුදෙක් භාර වන්නේ පාර්ලිමේන්තුවට බව. වෙන කිසිම කෙනෙකුට නොවෙයි. එතකොට ඒ කාරණය ආරෝපණය වෙලා නැහැ.

ඒ අනුව කොහොමද කියන්නේ ජනාධිපතිවරයා අත්තනෝමතික පාලකයෙක් බව 20 වැනි සංශෝධනයෙන් ජනිත වෙනවා කියලා. නොවැම්බර් 17 වැනිදා අපි බලාපොරොත්තු වෙනවා 2020 අයවැය ලේඛනය ඉදිරිපත් කරන්න. එය සිදු කරන්නේ 20 වන සංශෝධනය සිදු කිරීමෙන් පස්සේ.

දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය යවලා තිබෙනවා. ජනාධිපතිවරයාට සහ කථානායකයාට ඔහු ලබන අඟහරුවාදා පාර්ලිමේන්තුවට එය දැනුම් දෙනවා. ඔක්තෝබර් 20 ඒ කියන්නේ ඊට පස්සේ ඕනෑම වෙලාවක දෙවන වර කියවන්න පුළුවන්. ඒ කියන්නේ 20 වැනි සංශෝධනය විවාදයට ගන්න පුළුවන් පාර්ලිමේන්තුව තුළ. කොහොමටත් එය සිදු කළ යුතුයි. නොවැම්බර් 17ට පෙර අපි එය ඉක්මනින් විවාදයට අරගන්නවා. නොවැම්බර් 17 ඉදිරිපත් කරන්නේ 2021 සඳහා අයවැය ලේඛනය.

‘රටක සංවර්ධනය ඇති කිරීමේදී ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම ප්‍රමුඛ කාර්යයක්’

මේ ඉදිරිපත් කරන අයවැය ලේඛනයෙන් තමයි ජනාධිපතිවරයාට මුදල් ලැබෙන්නේ. එතකොට එය තියෙන්නේ පාර්ලිමේන්තුව අතේ. පාර්ලිමේන්තුව ජනාධිපතිතුමාගේ හා රජයේ ක්‍රියාපටිපාටිය අනුමත නොකරනවා නම් මුදල් ලැබෙන්නේ නැහැ. මෙයින් පැහැදිලි වන්නේ ජනාධිපතිවරයාගේ ක්‍රියාපටිපාටිය සිදුවන්නේ පාර්ලිමේන්තුවේ අධීක්ෂණය යටතේ කියන එකයි.

● **මෙයින් ඔබ කියන්නේ පාර්ලිමේන්තුවට ඇති බලය 20 වැනි සංශෝධනයෙන් ඉවත් නොවන බවද?**

ඔව්. එය ඉතා පැහැදිලිව කිව හැකියි. පාර්ලිමේන්තුවට පුළුවන් අයවැය ලේඛනය ප්‍රතික්ෂේප කරන්න. අමාත්‍යාංශයක වැය ශීර්ෂය ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. අතීතයේ එවැනි දේ සිදු වෙලා තිබෙනවා. ඒ අනුව අපි කොහොමද කියන්නේ නාම මාත්‍රයෙන් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තුවක් වන බව. නැහැ එය කිසිසේත්ම සිදුවන්නේ නැහැ.

‘ජනාධිපතිතුමා ප්‍රායෝගිකව බිම් මට්ටමේ වැඩ කරලා ප්‍රතිඵල පෙන්වූ චරිතයක්’

මුදල් බලතල ක්‍රියාත්මක වෙන්නේ පාර්ලිමේන්තුවෙන්. ඒ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවේ. මුදල් නැතිව රජය පවත්වාගෙන යන්න බැහැ. ඒ නිසා පාර්ලිමේන්තුවේ බලය අපිට මෙහිදී පැහැදිලිව පෙනී යනවා.

● **20 වැනි සංශෝධනය සම්මත කර ගැනීමට ආණ්ඩුවට තුනෙන් දෙකක් නොමැති බවට විපක්ෂය ප්‍රකාශ කරනවා. එය එසේ වේවිද?**

මෙය සම්මත කර ගැනීමට කිසිම ගැටලුවක් නැහැ. ජනතාව මේ වන විට ඒ සඳහා අපට බලය ලබා දී තිබෙනවා. සමගි ජන බලවේගය ප්‍රමුඛ විපක්ෂය මොන කතා කීවත් ස්ථිරවම අපට මෙය සම්මත කර ගත හැකියි. අනෙක් කාරණය තමයි විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් මෙහිදී අප සමග එක්වීමට කැමතිවෙලා තිබෙනවා.

අපි සන්ධානයක් නිසා සන්ධානයක් තුළ විවිධ මත තිබෙන්න පුළුවන්. මොකද අපි සමග තවත් විපක්ෂ කිහිපයක්ම එක්වෙලා ඉන්නවා. වෙන වෙනම පක්ෂවල මතවාද තිබෙන්නට පුළුවන්.

එහිදී අදහස් අතර වෙනස්කම් තිබෙනවා. එය තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. අපි ඒ සියලු දෙනාට සවන් දිය යුතුයි. නීතියක් පිළියෙළ කරන අවස්ථාවේදී විවිධ ආකල්ප විවිධ මත ප්‍රකාශ වීම ස්වභාවිකයි. එය අලුත් දෙයක් හෝ අමුතු දෙයක් නොවෙයි.

ප්‍රජාතන්ත්‍රවාදයේ හොඳ ලක්ෂණයක්. නමුත් මෙය අවසානයට සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදි අපි දැඩි ලෙස විශ්වාස කරනවා ආණ්ඩුව එකක් ලෙස කටයුතු කරමින් සාමූහික වගකීමට යටත්ව ක්‍රියා කරාවි. මේ පිළිබඳව අපට කිසිම සැකයක් නැහැ.

● **මත ගැටුම් තිබුණාට අවසානයේ ඔබලා තුනෙන් දෙක සඳහා එකතු වෙනවා කියන එක පැහැදිලියිද?**

ඔව් අනිවාර්යයෙන්ම අපි එය විශ්වාස කරනවා. එය එසේම සිදු වේවි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩිතාලම තමයි සාමූහික වගකීම කියන එක. ඕනෑම කෙනෙකුට තමන්ගේ මතය ප්‍රකාශ කරන්න පුළුවන්. සමස්ත රජය ගන්නා තීරණයට රජයේ සියලු දෙනා සාමූහිකව සහයෝගය ලබා දෙනවා කියන එක අපට විශ්වාසයි.

● **අමාත්‍යවරුන් වන උදය ගම්මන්පිල, විමල් වීරවංශ යන මහත්වරු 20 සම්බන්ධව විවේචන ඉදිරිපත් කරනවා නේද?**

සමහර කරුණු ගැන ඒ අයට යම් මත තිබෙනවා. ඔවුන් දෙදෙනා පමණක් නොවෙයි. තවත් කිහිපදෙනෙකුට 20 යම් යම් කරුණු සම්බන්ධව විවේචන මෙන්ම සංශෝධනය විය යුතු කරුණු ගැන කතාබහ කරනවා. ඒවා පිළිබඳව අපි සාකච්ඡා මාර්ගවලින් විසඳුම් ඉදිරිපත් කරනවා. මේ කාරණා කොහොම වුණත් ඔවුන් ප්‍රකාශ කර සිටින්නේ විපක්ෂයට කිසිසේත් අවියක් ලබා දීමට හෝ රජය අපහසුතාවයට පත් කිරීමට තමන් කටයුතු නොකරන බවයි.

විමල් වීරවංශ, උදය ගම්මන්පිල යන ඇමතිවරු පැහැදිලිව කියනවා තමන්ගේ මත ගැටුම් රජය දුර්වල කිරීමට ඉඩ නොතබන බවට. විපක්ෂය ශක්තිමත් කිරීමට ඔවුන් කිසිවිටක කටයුතු කරන්නේ නැහැ.

● **අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර තිබෙනවා 20 වැනි සංශෝධනයේ වෙනස්කම් කිරීම සම්බන්ධව. එම කමිටුව පත්කිරීම සාර්ථකද?**

ඇත්තටම එම කමිටුව පත් කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවක්. එම කමිටුව අවස්ථා කිහිපයකදීම රැස්වී සාකච්ඡා පැවැත්වුවා. එහිදී සමහර කරුණු පිළිබඳව පූර්ණ එකඟත්වයකට පැමිණීමට අසීරු වුණා. නමුත් ඒ කමිටුව මගින් ප්‍රායෝගික කාර්යභාරයක් ඉටුවුණා.

● **මෙම සංශෝධන ඉදිරිපත් කිරීමේදී ද්විත්ව පුරවැසිභාවය පිළිබඳ සමාජ කතිකාවක් ඇතිවී තිබෙනවා. ද්විත්ව පුරවැසිභාවය ඉවත් කිරීම සිදු කරන්නේ බැසිල් රාජපක්ෂ මහතාට පාර්ලිමේන්තුවට පැමිණීමේ අවස්ථාව ලබාදීම සඳහා යැයි කියා. ඇත්තක්ද මේ කියන්නේ?**

පුද්ගල කේන්ද්‍රීය, පුද්ගල පාදක සාධකයන් මුල්කර ගෙන නොවෙයි 20 වැනි සංශෝධනය සකස් කළේ. මොකද ඔය කතාව බැසිල් රාජපක්ෂ මහතා සම්බන්ධව සිදුකරන විරුද්ධවාදී අදහසක් පමණයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් වෙනවා ලංකාවේ පුරවැසිභාවය පිළිබඳව. එහිදී සඳහන් වන්නේ සියලුම පුරවැසියන් එක ලෙස සලකන බවයි.

ද්විත්ව පුරවැසියෙක් කියලා කියන්නේ මේ රටේ පුරවැසියෙක් වෙන රටක පුරවැසියෙක් වන අතර ශ්‍රී ලංකාවෙත් පුරවැසියෙක්. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නිසා එවැනි පුද්ගලයෙකුට පූර්ණ අයිතිය තිබෙනවා ඡන්දය භාවිතා කිරීම සඳහා. අන්න ඒ නිසා ඡන්දය දෙන පුද්ගලයෙකුට ඡන්දය ඉල්ලන්නත් අයිතිය තිබෙනවා. එකම කාසියේ පැති දෙකක්. ඡන්දය දෙන්න පුළුවන් නම් ඡන්දය ඉල්ලන්නත් පුළුවන්. අනෙක් කාරණය තමයි මේක හැමදාම මේ රටේ තිබුණා. 2015 දී 19 වන සංශෝධනය ඉදිරිපත් වනතුරුම මේ අයිතිය තිබුණා. අන්න ඒ නිසා ඒ සම්බන්ධව අපි අලුත් දෙයක් කරනවා නොවෙයි. 2015 ට පෙර තිබුණු තත්වය ඇති කිරීමක් පමණයි. මෙය අලුත් තත්වයක් නොවෙයි කියන එක ඕනෑම අයෙකුට පැහැදිලිව පෙනෙන්නට තිබෙන කරුණක්.

2015 ට පෙර කිසිම කෙනෙකුට මේක ගැටලුවක් වුණේ නැත්නම් ඇයි මේක දැන් ගැටලුවක් හැටියට දකිමින් ඒ ගැන දැඩි විවේචනයක් ඉදිරිපත් කරන්නේ. ආරම්භයේදී ගැටලුවක් වුණේ නැහැනේ. එහෙනම් ඇයි දැන් මෙය ගැටලුවක් ලෙස දකින්නේ.

බැසිල් රාජපක්ෂ මහතා ගම්පහ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තරග කරලා මනාප ඡන්ද භාරලක්ෂ පනස්දහකට වැඩි ප්‍රමාණයක් ලබාගෙන පාර්ලිමේන්තුවට පැමිණිලා. ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා හැටියට ලොකු සේවයක් කළා. මේ රටට ඔහු අවශ්‍යම පුද්ගලයෙක්. එතකොට ඒ කාලය තුළ කවුරුත් කීවේ නැහැනේ ද්විත්ව පුරවැසිභාවය ගැන. ඇයි මේ හදිසියේ මෙම චෝදනාවක් ගෙන එන්නේ කියන එක ජනතාව තේරුම් ගන්නවා ඇති. මේක තුළ තිබෙන්නේ දේශපාලන අවස්ථාවාදය.

● **20 වැනි සංශෝධනයට අනුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට මොකද වෙන්නේ?**

ඔය කියන්නේ ජනපතිට මහබලයක් ලැබෙනවා කියන එකද. එය සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. 20 වැනි සංශෝධනය මගින් 2015 ට පෙර සිටි ජනාධිපතිවරයාට තිබූ බලතල වලට එහා ගිය විශේෂ හෝ වෙනත් බලතල කිසිවක් නොලැබෙන බව අප පැහැදිලිව ජනතාවට වගකීමෙන් යුතුව ප්‍රකාශ කරනවා. 1978 සිට 2015 දක්වා මේ රටේ විධායක ජනාධිපති ධුරය තිබුණා. ඒ තිබුණු කාලය තුළ ජනාධිපතිවරයා සතු බලතල වලට එහා ගිය අලුත් බලයක් 20 වැනි සංශෝධනය මගින් වර්තමාන ජනාධිපතිවරයාට ලැබෙන්නේ නැහැ. 1978 සිට 2015 දක්වා තිබූ දේවල් ප්‍රශ්නයක් නොවුණා නම් ඇයි මේ හදිසියේ 20 ප්‍රශ්නයක් වෙන්නේ.

● **20 වැනි සංශෝධනයෙන් අගමැතිවරයාට මොකද වෙන්නේ?**

අග්‍රාමාත්‍ය ධුරයත් එලෙසමයි. මීට පෙර තිබූ බලයම එම ක්‍රියාවලියම අගමැතිවරයා සතු වෙනවා. ඒ කියන්නේ 2015 ට පෙර තිබූ අගමැතිගේ බලතල එසේම තිබෙනවා. අලුත් දෙයක් සිදු වන්නේ නැහැ. මෙය ජනතාව තේරුම් ගත යුතුයි. නැති බියක් ඇති කරන ආකාරයක් තමයි දේශපාලන රාමුව තුළින් පෙන්නුම් කරන්නේ.

ජනාධිපතිවරයාට අලුත් බලයක් නොලැබෙනවා සේම 2015 ට පෙර අගමැතිවරයාට තිබූ බලය ඔහුගෙන් ගිලිහී යන්නෙත් නැහැ. 2015 ට පෙර පැවතුණු තත්වය ඒ විදියටම ක්‍රියාත්මක වනවා.

● **වසරකට ආසන්න වන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ක්‍රියාකලාපය ඔබ දකින්නේ කෙසේද?**

අපි එය බැලිය යුත්තේ ඔහු මෙතෙක් කල් ගත් තීරණ සහ ක්‍රියා කරපු ආකාරය පිළිබඳව. එය තමයි මිනුම් දණ්ඩ විය යුත්තේ.

ගෝඨාභය රාජපක්ෂ මහතා පිළිබඳව ජනතාවට මේ තරම් විශ්වාසය තබන්නේ ඔහු මීට පෙර ක්‍රියා කරපු ආකාරයත් සමගයි. ඔහුට තිබෙන්නේ විනය ගරුකව වැඩ කිරීමේ හැකියාව. ඔහු නිතරම ක්‍රියාවෙන් යමක් ඔප්පු කර පෙන්වන්නෙක්. කතා කිරීම, දර්ශන වැනි දේ නොවෙයි වැඩ කිරීම ඔහුගේ වටිනා ගුණාංගය ලෙස මා දකිනවා. න්‍යායාත්මකව නොවෙයි ප්‍රායෝගිකව, බිම් මට්ටමේ සිට වැඩ කරලා ප්‍රතිඵල පෙන්වූ චරිතයක්.

පැහැදිලිවම ඔහු යුද්ධය සම්බන්ධව ඒක කළා. එදා තිබුණු මතය තමයි මේ තිස් අවුරුදු යුද්ධ ජය ගන්න බෑ කියන කාරණය. 2010 - 2015 කාලයේදි ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ මඟ පෙන්වීම යටතේ ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම්වරයා වශයෙන් හරි පුද්ගලයන් හරි තැන්වලට පත් කළා. හරි වෙලාවට හොඳම තීරණය පරක්කු නොකර ගනු ලැබුවා. හොඳ අධීක්ෂණයක් තිබුණා. ලෝකයම පුදුම කරවමින් සාකච්ඡාවෙන් ඔබ්බට ගිය ප්‍රායෝගික යුද්ධය මගින් එම ජයග්‍රහණය ලබාගනු ලැබුවා. පසුව ඔහු නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට මේ රටේ නගර සම්පූර්ණයෙන්ම වෙනස් කරමින් අලංකාර නගර බවට පත් කරමින් මහජනතාවට අලුත් අත්දැකීමක් එක්කළා. කොළඹ නගරය ආසියාවේ ආකර්ශනීය නගරයක් බවට පත් කළා.

හරිත නගරයක්, ජලය, මංතීරු, ඇවිදින මංතීරු, ශාරීරික සෞඛ්‍ය සඳහා ව්‍යායාම සිදු කරන ස්ථාන ඇති කරමින් අපිට අදටත් ප්‍රයෝජනවත් ඉදිකිරීම් සිදු කළා. නිවාස, මහාමාර්ග අලුතෙන් නිර්මාණය කරමින් මාර්ග සංකල්ප වශයෙන් නොව භෞතික වශයෙන් කරලා පෙන්නුවා. මෙන්න මේ කාරණා නිසා ජනතාවට ලොකු විශ්වාසයක් ඔහු පිළිබඳව ඇති වුණා. එහි ප්‍රතිඵලයක් තමයි ඔහු ඡන්ද ලක්ෂ 69 ලබා ගනිමින් ජනාධිපති ධුරයට පත් වෙන්නේ.

ඉකුත් වසරක කාලය තුළ ඔහු ගත්ත ඉකුත් තීන්දු තීරණ පිළිබඳව අපි අමුතුවෙන් කිව යුතු නැහැ. රටේ ජනතාව එය හොඳින් දන්නවා. කොරෝනා වසංගතය හමුවේ ලෝකය ඉදිරියේ අපි රටක් හැටියට පැමිණි තැන පිළිබඳව ශ්‍රී ලාංකිකයන් පමණක් නොව මුළු මහත් ලෝකයම දැන ගත්තා. ඒ ජනාධිපතිවරයාගේ තීරණ නිසා.











ඡායාරූප - දුෂ්මන්ත මායාදුන්න

● අමිල මලවිසූරිය



දස දෙනෙකුගෙන් යුත් පවුලේ තෙවැන්නා

කොළඹ සරසවියේ ශාස්ත්‍රපති උපාධිධාරිනියක්

පොලිසියට එක්වුයේ 1997 දී

අභියෝග මැද ආ ගමනක්

# පොලිස් ඉතිහාසය වෙනස් කළ පළමු නියෝජ්‍ය පොලිස්පතිනිය බිම්ෂානි ජාසිංආරච්චි

**අභිමානවත්වූත්, ප්‍රෞඪ වූත් වසර එකසිය පනස් හතරක ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ නව පිටුවක් පෙරළුණු සතියක් ලෙස ගෙවීගිය සතිය හැඳින්විය හැකිය. ඒ, 85000ක් පමණ පිරිසකගෙන් සමන්විත පොලිස් දෙපාර්තමේන්තුවේ 8900ක් පමණ වන කාන්තා පොලිස් නිලධාරිනියන් අතුරින් එක් නිලධාරිනියක එදාමෙදා තුර කාන්තා නිලධාරිනියක ලද ඉහළම තනතුරට උසස්වීම් ලබමිනි.**

දින කීපයක සිටම කතාබහට ලක්වෙමින් තිබූ ශ්‍රී ලංකා පොලිසියට ප්‍රථමවරට කාන්තා නියෝජ්‍ය පොලිස්පතිනියක පත්වීමේ කතාන්දරය අනුව පසුගිය 08 වැනිදා එකී උසස්වීම වැඩබලන පොලිස්පති සී. ඩී. වික්‍රමරත්නගේ නිර්දේශ මත ජාතික පොලිස් කොමිෂන් සභාව සිදු කෙරිණි.

ඒ අනුව ප්‍රථම නියෝජ්‍ය පොලිස්පතිනිය ලෙස උසස්වීම් ලබා පොලිස් දෙපාර්තමේන්තු ඉතිහාසයේ රන් අකුරින් සිය නාමය සනිටුහන් කරගැනීමට වාසනාව ලද නිලධාරිනිය වූයේ පොලිස් ළමා හා කාන්තා අපයෝජන කාර්යාංශයේ අධ්‍යක්ෂ ලෙසින් රාජකාරි කළ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිනි බිම්ෂානි ජාසිං ආරච්චියි.

එලෙස ප්‍රථම නියෝජ්‍ය පොලිස්පතිනිය ලෙස උසස්වීම් ලද බිම්ෂානි පසුගිය 13 වැනිදා පෙරවරුවේ පොලිස් සුබසාධන දිසාව බාර නියෝජ්‍ය පොලිස්පතිනිය ලෙස රාජකාරි ඇරැඹුවේ පොලිස් දෙපාර්තමේන්තු ඉතිහාසයේ කාන්තා නිලධාරිනියන්ගේ නාමය සදා නොමැකෙන ලෙස සනිටුහන් කරමිනි.

වසර 23ක පමණ සේවා කාලයකට හිමිකම් කියන ප්‍රථම නියෝජ්‍ය පොලිස්පතිනිය දැඩි අභියෝග මධ්‍යයේ නියෝජ්‍ය පොලිස්පතිනියක දක්වා උසස්වීම් ලද දිරිය නිලධාරිනියක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රචලිතය.

1997 වසරේ පෙබරවාරි 04 වැනිදා පොලිස් සේවයට එක්ව ඇති නියෝජ්‍ය පොලිස්පතිනි බිම්ෂානි දකුණේ හම්බන්තොට, වීරකැටිය ප්‍රදේශයේ ඈත ගම් පියසක් වන ගල්පොත්තයාය ග්‍රාමයේ උපන් කාන්තාවකි. ජිනසේන ජාසිං ආරච්චි සහ විමලා කුරුගම මාතාවට දාව උපන් දරුවන් දසදෙනාගෙන් තුන්වැන්නා ලෙස මෙලොව එළිය ලැබ ඇත්තෙ අපේ කතා නායිකාවයි.

අනතුරුව මූලික අධ්‍යාපනය මීගස්ආර මහා විද්‍යාලයෙන්ද වැඩිදුර අධ්‍යාපන කටයුතු තංගල්ල බාලිකා මහා විද්‍යාලයෙන්ද සම්පූර්ණ කර ඇති ඇය පාසල් සමයේදී ඉගෙනීමට මෙන්ම ක්‍රීඩාවටද එකසේ හපන්කම් පෑ තැනැත්තියකි. තංගල්ල බාලිකාවෙන් අපොස උසස් පෙළ විභාගය විශිෂ්ට ලෙස සමත්ව 1992 වසරේ රුහුණු විශ්වවිද්‍යාලයට පිවිසීමට තරම් ඇය වාසනාවන්ත වී තිබුණාය.

විශ්වවිද්‍යාලයේ අවසන් වසර ශිෂ්‍යාවක ලෙස කටයුතු කරමින් සිටියදී දිනක් ඇයගේ නෙත ගැටුණු පුවත්පත් දැන්වීමක් සිය ජීවිතය මෙතරම් දිගු ගමනක් රැගෙන යාවියැයි ඇයද නොසිතන්නට ඇත. එහෙත් කුඩා කාලයේ සිටම සිත් කොනක කැකෑරුණු කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයට හෝ පොලිස් දෙපාර්තමේන්තුවට එක්ව රටට සේවයක් කිරීමේ අභිලාෂය එම දැන්වීම හරහා මුදුන් පමුණුවා ගත් ඇය පොලිස් දෙපාර්තමේන්තුවට එක්වීමේ වරම් දිනා ගත්තාය.

පවුල් පසුබිමෙහි කිසිවෙක් හෝ පොලිස් දෙපාර්තමේන්තුවට කිසිදු ලෙසකින් සම්බන්ධ නොවූවත් බිම්ෂානි 1997 වසරේ පෙබරවාරි 04 වැනිදා කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයට එක්ව මූලික පුහුණුව ලබා ආධුනික උපපොලිස් පරීක්ෂකවරියක ලෙස සිය රාජකාරි ආරම්භය සනිටුහන් කර තිබුණාය.

ඇයගේ මුල්ම රාජකාරි ස්ථානය එවකට රට දෙකඩ කිරීමට වලි කමින් සිටි රුදුරු කොටි ත්‍රස්තවාදීන්ගේ දැඩි තර්ජනයට, බලපෑමට ලක්වූ වවුනියාව පොලිස් ස්ථානයයි. ත්‍රස්තවාදීන්ට එරෙහිව මාස කීපයක රාජකාරි දිවියකින් පසු ඇය අපරාධ විමර්ශන ක්ෂේත්‍රයට පිවිස වසර 14ක පමණ කාලයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (සීඅයිඩී) විශිෂ්ට සේවාවක නිරත වූ පොලිස් නිලධාරිනියකි. ඊට අමතරව ඇය මෙතෙක් පොලිස් රාජකාරි දිවිය තුළදී වසර 10ක් ළමා සහ කාන්තා අපයෝජන නිවාරණ ක්ෂේත්‍රයේද, පොලිස් පුහුණු කිරීම් ක්ෂේත්‍රයේ වසර 4ක්ද ප්‍රභූ ආරක්ෂක හා පරිපාලන රාජකාරින්හි වසර පහක් සහ මෙහෙයුම් රාජකාරියන්හිද වසරක කාලයක් සේවය කොට පොලිස් දෙපාර්තමේන්තුවේ හසළ අත්දැකීම් ලත් ජ්‍යෙෂ්ඨතම නිලධාරිනියයි.

> ඇත්තටම මේ මොහොතේ මම තරම් සතුටු වන වෙනත් කිසිම කෙනෙක් නැතුව ඇති. එතුමියට මං සුබ පැතුවා. ඒත් මට දුක එතුමිය වැඩ බාරගත් මොහොතට සහභාගිවීමට නොහැකි වීම ගැනයි. මම දැනගෙන හිටියෙ නැහැ වැඩ බාරගත් බව. මට තියෙන විශාලම සතුට මගේ වාර්තාව අබිබවා යෑම ගැනයි.
>
> මෙරට පළමු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිනිය වූ ප්‍රමිලා දිවාකර

තවද එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි සඳහා එක්ව වසර දෙකක කාලයක්ද නැගෙනහිර ටිමෝරයේ ළමා හා කාන්තා අපරාධ විමර්ශන කාර්යාංශ කණ්ඩායම් නායිකාව හා දකුණු සුඩානයේ පොලිස් මෙහෙයුම් මූලස්ථානයේ පිරිස් පාලන නිලධාරිනිය ලෙසද ඉමහත් සේවාවක නිරතව තිබුණාය.

2006 වසරේදී කාන්තා පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලද බිම්ෂානි 2007 වසරේදී සහකාර පොලිස් අධිකාරි තනතුරටද උසස්වීම් ලැබුවාය. එහෙත් 2000 වසරේදී පොලිස් දෙපාර්තමේන්තුවට එක්ව රාජකාරි අතරතුරදීම උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු සහකාර පොලිස් අධිකාරි බඳවා ගැනීම් විවෘත විභාගයට පෙනී සිට සමත් වුවත් නොයෙක් කම්කටොලු බාධක නිසාවෙන් ඇයට 2007 වසර වන තෙක් සහකාර පොලිස් අධිකාරි තනතුරට උසස්වීමට 'විශාල' සටනක් කරන්නට සිදුව තිබුණේ අධිකරණයේ පිහිටද පතමිනි.

එහිදී සිය අයිතිවාසිකම් දිනා ගැනීම උදෙසා නීතිය ඉදිරියට ගිය ඇයට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නිවැරැදි හා සාධාරණ තීන්දුවක් ලැබීමත් ජාතික පොලිස් කොමිෂන් සභාවෙන් කාන්තා නිලධාරිනියන්ගේ උසස්වීම් වෙනුවෙන් පෙනී සිටීමත් නිසා 2007 වසරේදී සහකාර පොලිස් අධිකාරි තනතුරට උසස්වීමට වරම් හිමිවී තිබුණාය.

අනතුරුව 2013 වසරේදී ඕ පොලිස් අධිකාරි තනතුරටත්, 2017 වසරේදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුර දක්වා ඉහළට පැමිණියාය. එලෙස වත්මන් නියෝජ්‍ය පොලිස්පතිනි බිම්ෂානි, 2017 ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරට උසස්වීම් ලැබීම මෙරට ප්‍රථම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිනිය වූ ප්‍රමිලා දිවාකරගෙන් පසුව වීමද විශේෂත්වයකි. 2019 වසරේදී තවත් නිලධාරිනියන් අටදෙනෙකු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිනියන් ලෙස උසස්වීම් ලබන්නටද සමත් වූයේ කාන්තා නිලධාරිනියන්ගේ උසස්වීම් වෙනුවෙන් නියෝජ්‍ය පොලිස්පතිනි බිම්ෂානි ගෙන ගිය අරගලය සමගිනි.

වත්මන් පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරුන් 47 දෙනා අතරට එක්වූ එකම නියෝජ්‍ය පොලිස්පතිනිය වන බිම්ෂානි ප්‍රථම නියෝජ්‍ය පොලිස්පතිනිය ලෙස අසමසම වාර්තාවකට උරුමකම් කීම පිළිබඳව අප ප්‍රථම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිනිය ලෙස 1999 වසරේදී උසස්වීම් ලැබීමෙන් පසු 2002 වසරේ පොලිස් සේවයෙන් ඉසිඹු ලැබූ ප්‍රමිලා දිවාකර ගෙන් විමසීමක් කළාය.



ශාස්ත්‍රපති උපාධිය ලබා ගත් දා

"ඇත්තටම මේ මොහොතේ මම තරම් සතුටු වන වෙනත් කිසිම කෙනෙක් නැතුව ඇති. එතුමියට මං සුබ පැතුවා. ඒත් මට දුක එතුමිය වැඩ බාරගත් මොහොතට සහභාගිවීමට නොහැකි වීම ගැනයි. මම දැනගෙන හිටියෙ නැහැ වැඩ බාරගත් බව. මට තියෙන විශාලම සතුට මගේ වාර්තාව අබිබවා යෑම ගැනයි. මොකද මගේ රෙකොඩ් එක හැමදාම තියෙන්න බැහැනේ. කවුරුහරි ඒක අබිබවා යා යුතුමයි. කාන්තාවන්ට පොලිස් දෙපාර්තමේන්තුවේ ඉහළම තනතුර දක්වා යා හැකි විය යුතුයි. මමත් උසස්වීම් ලබාගත්තෙ උසස් නිලධාරින් සමඟ ගැටිලා උසාවි ගිහින්... මම කරපු අරගලය සෑම පොලිස් නිලධාරිනියකටම ලොකු ශක්තියක් වුණා...මම නැවතත් ඇයට සුබ පතනවා."

ඒ, 1958 කොස්තාපල්වරියක් ලෙස එක්වී 1971 සාජන් තනතුරටත් 1977 උපපොලිස් පරීක්ෂිකා, 1984 පොලිස් පරීක්ෂිකා, 1986 ප්‍රධාන පොලිස් පරීක්ෂිකා, 1988 සහකාර පොලිස් අධිකාරිනියක, 1994 පොලිස් අධිකාරිනියක සහ 1999 ප්‍රථම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිනිය ලෙස උසස්වීම් ලබා 2002 වසරේ පොලිස් දෙපාර්තමේන්තුවෙන් නික්ම ගිය ප්‍රමිලා දිවාකරයි.

ප්‍රථම නියෝජ්‍ය පොලිස්පතිනිය රුහුණු විශ්වවිද්‍යාලයේ උපාධිධාරිනියක් මෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධියටද හිමිකම් කියයි. ඊට අමතරව බැංගලෝර් විශ්වවිද්‍යාලයේ මානව හිමිකම් පීඨයේ සහ ඇමෙරිකාවේ ලුසියානා පොලිස් විද්‍යායතනයේද පොලිස් සේවයට අවැසිම රාජකාරි පිළිබඳ වැඩිදුර හැදෑරීම් කරමින් හසළ දැනුමකින් යුත් නිලධාරිනියකි. ගුවන් විදුලි සංස්ථාවේ සහකාර අධ්‍යක්ෂවරයකු සමඟ විවාහ වී සිටින නියෝජ්‍ය පොලිස්පතිනි බිම්ෂානිට පොලිස් සේවය හරහා රට වෙනුවෙන් තවත් වසර ගණනාවක් ජනතාවට සේවය කිරීමට අවස්ථාව උදාවී තිබේ.

---

● සුභාෂිණී ජයරත්න

කොවිඩ් තිබුණත් දරුවන්ගේ පැමිණීම 100% යි

බැරෑරුම්කම දැනුණත් විභාග රාජකාරි අතහැර යන්නේ නැහැ

විභාග රාජකාරි වෙනුවෙන් වෙහෙසෙන අයට කොවිඩ් දීමනාවක් හෝ ලැබිය යුතුයි

# කොවිඩ්වලට අභියෝග කරමින් විභාග ලියන අපේ දරුවෝ

**කොවිඩ් වසංගතය හේතුවෙන් දෙවරක්ම කල්ගිය උසස් පෙළ විභාගය මේ වන විට පැවැත්වෙන්නේ දැඩි අභියෝග රැසක් මධ්‍යයේය. පුංචි දරුවන්ගේ ශිෂ්‍යත්ව විභාගය පසුගියදා අවසන් වූයේ දරුවන්ගේ පමණක් නොව දෙමවුපියන්ගේ සිත් පවා නිදහස් කරමිනි. දැඩි ලෙස දෙවැනි වරටත් ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය හමුවේ බොහෝ දෙනෙකුගේ එකම අපේක්ෂාව වූයේ දෙවරක් කල්ගිය උසස් පෙළ හා ශිෂ්‍යත්ව විභාගය නැවතත් කල් නොදමා කෙසේ හෝ පැවැත්විය යුතු බවය. නමුත් පැවැති තත්ත්වය හමුවේ මේ විභාග නැවතත් කල් දැමීම ඉතා පහසුවෙන් කළ හැකි වුවද රජය දරුවන්ට එවන් කඩවුණු පොරොන්දු ලබා දුන්නේ නැත. මේ විභාග ද්විත්වය එසේ කල් නොදැමිය යුතු බවත්, කෙසේ හෝ කුමන අභියෝග මැද වුවද මෙය පවත්වන බවට රජය හා අධ්‍යාපන බලධාරීන් දරුවන්ට පොරොන්දුවක් දුන්නේ විභාග ඉතිහාසයේ පැන නැඟි අසීරුතම විභාග කඩඉමට මුහුණ දෙමිණි.**

මෙම අපදා අවස්ථාවේ අධ්‍යාපන ඇමැති, අධ්‍යාපන ලේකම්, විභාග කොමසාරිස් ජනරාල්වරයා ඇතුළු අධ්‍යාපන බලධාරීන් හා රජය ගත් මේ ක්‍රියාදාමයට රටක් වශයෙන් සැවොම අගය කළහ. ශිෂ්‍යත්වය මේ වන විට අහවර වී ඇත්තේය. එය සියයට 99.99ක සිසු සහභාගිත්වයෙන් සාර්ථකව අවසන් කර ඇති බව විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිත පසුගියදා මාධ්‍ය හමුවේ පැවැසූයේ ශිෂ්‍යත්වය මෙන්ම කුමන අභියෝග පැමිණියද සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය, රජය හා එක්ව කෙසේ හෝ උසස් පෙළ විභාගයද අවසන් කරන බව පවසමිනි. එය රටේ දරුවන්ට පමණක් නොව ගුරු දෙමවුපියන්ටද සැනසුම් සතුටුදායක පුවතක්ම විය.

කෙසේ වෙතත් මේ වන විටත් දැඩි අභියෝග රැසක් මධ්‍යයේ උසස් පෙළ විභාග පැවැත්වෙන අතර දැඩි අවධානයක් ගම්පහ පළාතට යොදා ඇත්තේ මේ වන විටත් එම දරුවන්ට පහසු ක්‍රමවේදයන් ඔස්සේ විභාගයට ලිවීමට අවස්ථාව ලබා දෙමිනි. කෙසේ හෝ විභාග පැවැත්විය යුතුයැයි තීරණය කළද විභාග දෙපාර්තමේන්තුව විභාගය පැවැත්වීමෙහිලා ගත් ක්‍රමවේද පැයෙන් පැයට යාවත්කාලීන වන්නේ කොවිඩ් අලුත් තත්ත්වයන්ට අභියෝග කරමිණි. විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන බලධාරින් වසර ගණනක ඉතිහාසයේදී අභියෝගාත්මක විභාග වසරක් වූයේ මෙවරය. එය වඩාත් අභියෝගයක් ගෙන දුන්නේ මෙවර උසස් පෙළ විභාගයටය. පසුගිය 12 වැනිදායින් ආරම්භ වූ උසස් පෙළ විභාගය මේ වන විට පවත්වා ඇත්තේ සතියක කාලයක් පමණි. එය ලබන මස මුල දක්වා පැවැත්වෙයි. නමුත් ආරම්භක දින මෙන් නොව දෙවැනි තෙවැනි දිනය වන විට කොවිඩ් අභියෝග ඉතා තදින් දැනෙන්නට විය. අධ්‍යාපන ඇමැති, ලේකම්, විභාග කොමසාරිස් මින් කිසිදු දිනක නොවිදි අත්දැකීම් විඳිමින් කෙසේ හෝ උත්සාහ කරන්නේ අවසන් දින දක්වා විභාගය පැවැත්වීමටය.

"අපි විභාග රාජකාරී කරන්නේ කොවිඩ් එක්ක. අපිට කොවිඩ් වැළදෙයි කියා මේ රාජකාරී අත් හරින්න බැහැ. අධ්‍යාපන බලධාරීන් විදියට අපි මේ දේවල් අත් හැරියහොත් මේ රාජකාරි කරන කාර්ය මණ්ඩල පහසුවෙන් එයින් බැහැර වෙයි. මගේ පළාතේ පාසල් 52ක කොවිඩ් ආශ්‍රිත දෙමවුපියන්ගේ දරුවන් ඉන්නවා. ඒ නිසා අපි මේ සෑම පාසලකම විභාග මධ්‍යස්ථාන වලට ගිහින් ළමයින් ඇසුරේ ඉන්නේ. ඒ දරුවන්ව විභාග මධ්‍යස්ථාන වලට ගේන්න සමහරු කැමැති නැහැ. සමහර විට පොලිසියේ අයට සිදු වෙනවා මේ දරුවන්ව විභාග මධ්‍යස්ථාන වලට ගේන්න. නිරෝධායනය වන සමහර දරුවෝ පයින් සෑහෙන දුරක් එනවා. ඒ ඔවුන්ට ප්‍රවාහන පසහුකම් දෙන්න කවුරුත් කැමැති නැති නිසා. ඒත් දරුවෝ කිසිම කෙනෙක් විභාගයට නොපැමිණ සිටින්නේ නැහැ....." ඒ මිනුවන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වජිර පෙරේරාය. මෙම කොවිඩ් අවදානම තදින්ම ඇති මිනුවන්ගොඩ, මිගමුව, ගම්පහ අධ්‍යාපන කලාප වල ඇති කොවිඩ් තත්ත්වය දිනෙන් දිනම උග්‍ර වන්නේය. විශේෂිත විභාග මධ්‍යස්ථාව කොවිඩ් නිරෝධායන දරුවන්ට ලබා දි තිබුණද, මේ දරුවෝ සමඟ කිසිදු වෙනසක් නැතිව ඔවුනගේ මනසට කිසිදු ආතතියක් නොදෙන්නට කාර්ය මණ්ඩල විභාග රාජකාරි වල නියැළෙන්නේ දරුණු වසංගත රෝගයක් සමඟ ඔට්ටු වෙමිනි.

මේවන විට මිනුවන්ගොඩ නිරෝධායන විභාග මධ්‍යස්ථාන 19 ක මෙම ලිපිය ලියන මොහොත වන විටත් සිසුන් 60 ට ආසන්න ප්‍රමාණයක් විභාගය ලියයි. කොවිඩ් වැළඳුණු දරුවන්ට සිදු වූයේ විභාග දෙපාර්තමේන්තුව විසින් අයි. ඩී. එච් උණ රෝහලේ ස්ථාපිත කර ඇති විභාග මධ්‍යස්ථානය තුළදි ඉතුරු ප්‍රශ්න පත්‍රවලට මුහුණ දෙන්නටය. මෙවර කොවිඩ් වසංගතයේ ආරම්භක ස්ථානය වූ බ්‍රැන්ඩික්ස් ආයතනයේද කොවිඩ් නිරෝධායනය වන දරුවන් සඳහා විභාග මධ්‍යස්ථානයක් පැවැති අතර අධ්‍යාපන බලධාරීන්ට එහි ගොස් රාජකාරී කරන්නට සිදුවූයේ සිය සෞඛ්‍ය පවා අමතක කරමිනි. මේ නිසා විභාග කාර්ය මණ්ඩල නිලධාරීන්ට සිය දරු මල්ලන්, පවුලේ සෞඛ්‍ය පවා මොහොතකට අමතක කරන්නට සිදු වෙයි.



අධ්‍යාපන ඇමැති, විභාග කොමසාරිස් ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙන ඩී එස් සේනානායක විදුහලේ විභාග මධ්‍යස්ථානය ඉදිරිපිටදී



උසස් පෙළ විභාගයට ගම්පහ රත්නාවලී විදුහලේ දරුවන් මෙවර පැමිණෙමින් සිටි අවස්ථාවක්

"මේ විභාගය පැවැත්වෙන්නේ දැඩි අවිනිශ්චිත තත්ත්වයක් යටතේ; විභාග වාතාවරණයෙන් සියයට සියයක් බැහැරයි. අපේ මාධ්‍යස්ථානවල විභාගයට පෙනී සිටින දරුවන් බොහෝමයකගේ ගෙවල්වල අයට කොවිඩ් පොසිටිව්. එහෙම කියල මේ දරුවෝ අපිට බැහැර කරන්න බැහැ. ඇඳිරි නීති පළාත්වල විභාග රාජකාරි වලට යන කාර්ය මණ්ඩල වලට ප්‍රවාහන පහසුකම් නැහැ. තමන්ගේ වාහනයක් නැතිනම් අඩුම තරමින් යන්න ත්‍රී විලරයක් හෝ ඕනෑ. ගම්පහ, මිනුවන්ගොඩ, කැළණිය, මිගමුව අධ්‍යාපන කලාපවල මේ ප්‍රශ්නය දැඩිව දැනෙනවා. විභාග රාජකාරී වල නියැළෙන හැමෝම දරු පවුල් තියෙන අය. මේ අය විභාග රාජකාරි වලට යනවට නිවෙස්වලින් කැමැති නැහැ. ඒත් මෙය ජාතික කර්තව්‍යයක්. ඔවුන්ට කොවිඩ් වැළඳීමේ හැකියාව ඉහළයි. මෙවන් ගැටලු රැසක් මැද මේ කර්තව්‍ය කරන සියලු දෙනාට යම් දිරි දීමනාවක් හෝ ලැබිය යුතුයි. මේ අය විෂබීජහරණ ද්‍රව්‍ය වලට මෙන්ම ප්‍රවාහනයේදීත් අතින් වියදම් කර ගෙනයි පැමිණෙන්නේ. මේ අය යම් හෙයිකින් විභාග රාජකාරි ප්‍රතික්ෂේප කළ හොත් මේ සියලු වෑයම් අසාර්ථක වෙනවා.

විභාග රාජකාරි මෙවන් දැඩි අවිනිශ්චිත තත්ත්වයක් යටතේ හෝ කර ගෙන යන්නේ මේ අයගේ දැඩි කැපවීම නිසා. ඒ නිසා මේ අය වෙනුවෙන් යම් දීමනාවක් හෝ ලැබිය යුතුයි. ඒත් අපිට එක විස්වාසයක් තියෙනවා. කොතරම් අවිනිශ්චිත තත්ත්වයක් මතු වුණත් මේ කිසිදු අයෙකු මේ රාජකාරී අතහැර නොයන බව......" ඒ ගම්පහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ එස්. කේ. මල්ලවාරච්චිය.

මේ වන විට සියලු විභාග රාජකාරී දිනෙන් දින විෂබීජහරණයට නතු කළ යුතු වුවද මේ කාර්ය කිරීම එතරම් ලෙහෙසි පහසු නැත. පළාත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා ඉටුවන මේ කර්තව්‍යයේදි හමුදා පොලිස් අංශවලින් ලැබෙන්නේ නොමසුරු සහයෝගයකි.

"අපි දිනෙන් දින විභාග රැසවීම් පැවැත්වෙනවා. මෙය සුළුපටු කටයුත්තක් නොවෙයි. ඇතිවන අලුත් තත්ත්වයන්ට අපි මුහුණ දිය යුතුයි. දරුවන් වෙනුවෙන් ආරක්ෂක ක්‍රමවේද රැසක් ගැනීමට අපිට සිදු වුණා. දරුවන්ට ආරක්ෂිතය යන විශ්වාසය අපි ලබා දුන්නා. අපි දරුවන්ට ලබාදුන් විශ්වාසය දරුවෝ පිළිගෙන තියෙනවා. මේ දරුවෝ කිසිදු පැකිළීමකින් තොරව විභාගයට මුහුණ දුන්නා. දරුවන්ගේ පැමිණීම සියයට සියයක්. මුලින් විෂබීජහරණ ගැටලු මතුවුණා. අපි කොවිඩ් කලාපවල කිසිදු දරුවකු කොළඹට ගෙනාවේ නැහැ. මේ දරුවන්ට විශේෂිත විභාග මධ්‍යස්ථාන ඇති කළා. ගම්පහ විශේෂිත මධ්‍යස්ථාන 12 ක් මෙන්ම නිරෝධායනය වූවන් සඳහා රටපුරා තවත් මධ්‍යස්ථාන 11 ක් ඇති කළා. සෑම විභාග මධ්‍යස්ථානයකට නිරෝධායනය වු දරුවන්ට පන්ති කාමර දෙකක් ඇති කළා. උසස් පෙළ විෂයයන් 63ක් සංවිධානය කිරීම ඉතා අපහසු දෙයක්. ඒත් කොවිඩ් එක්ක මේ අභියෝගය ඉතිහාසගත අභියෝගයක් වුණා. අපි කොවිඩ් වසංගතය පැවැති කාලයේ සාමාන්‍ය පෙළ ප්‍රතිඵල අඩු කාර්ය මණ්ඩලයක් යොදා ගනිමින් ලබා දුන්නා" ඒ විභාග කොමසාරිස් (පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල) කේ. එම්. එච් බණ්ඩාර ය.



මිනුවන්ගොඩ නාලන්දා බාලිකාවේ ශිෂ්‍යත්වයට දරුවන් මෙවර පැමිණෙමින් සිටි අවස්ථාවක්

මේ බැරෑරුම් කාර්යයට රජය සෘජුව නැඟී සිටි අතර අධ්‍යාපන ඇමැති ජී. එල් පීරිස්, අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල සී. පෙරේරා මෙන්ම විභාග කොමසාරිස් ජනරාල් සනත් පූජිත, සෞඛ්‍ය වෛද්‍ය කාර්ය, ත්‍රිවිධ හමුදා හා පොලිස් කාර්ය මෙන්ම සමස්ත අධ්‍යාපන බලධාරින් දරුවන්ගේ අපේක්ෂා යළිත් සිඳින්නට බිඳින්නට ඉඩ දුන්නේ නැත. මේ ගෙවෙන්නේ කිසිදා උද්ගත නොවූ ලෝක සෞඛ්‍ය තර්ජනාත්මක අවදියකි. විභාගයක් පැවැත්වීමට කිසිසේත් නුසුදුසු අවදියකි. එහෙත් දරුවන්ගේ අපේක්ෂා සිඳ බිඳලන්නට රජය හා අධ්‍යාපන බලධාරීන් ඉඩ දුන්නේ නැත. මේ වන විටත් එක් දරු පිරිසකගේ ජීවිතයේ අවසන් පාසල් කඩඉම තීරණය වන්නේ ලෝක තර්ජනයක් වු කොවිඩ් අභියෝග මධ්‍යයේය. එවන් තත්ත්වයකදි මේ දරුවන් කිසිදු පැකිළීමකින් තොරව විභාගයට මුහුණ දෙන්නේ බලධාරීන් ලබා දුන් විශ්වාසය නිසාමය.

කොවිඩ්වලට අපට දිය හැකි ලොකුම අභියෝගය මෙන්ම ලෝකයාට දිය හැකි ලොකුම ආදර්ශයද මෙවර ලබා දෙන්නේ අපේ දරුවන්ය. ඒ ඉදිරියේදි අපි කොවිඩ් වසංගතයත් සමඟ ජීවත්විය යුතුය යන පණිවුඩය ලොවට හඬ ගා පවසමිනි.

සේයාරූ - නිශ්ශංක ද සිල්වා
සමන්ත වීරසිරි

● භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්



'ආර්ථිකය ගොඩනගන්න 20 ඕනමයි...'

'ඒකීය රටක් ෆෙඩරල් රටක් බවට පත් කළ යුතු නැහැ...'

'පළාත් සභා මෙරටට අවශ්‍යම නෑ...'

'19න් රට වැනසුණා...'

පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය, රියර් අද්මිරාල් (විශ්‍රාමික) සරත් වීරසේකර

# 19ට එරෙහිව ඡන්දය දුන් එකම මන්ත්‍රී 20 ගැන කියන කතාව මෙන්න

● **20 වැනි සංශෝධනය අවශ්‍ය වන්නේ ඇයි?**

20 වැනි සංශෝධනය ගෙන එනු ලබන්නේ 19 වැනි සංශෝධනය ඉවත් කිරීම සඳහායි. 20 මගින් ව්‍යවස්ථාදායක සභාව වෙනුවට පාර්ලිමේන්තු සභාවක් පත් කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කර තිබෙනවා. 19 ට අනුව ව්‍යවස්ථාදායක සභාවෙන් තමයි කොමිෂන් සභා, අගවිනිසුරු, නීතිපතිවරයාගේ සිට පොලිස්පතිවරයා දක්වා පත්කරන්නේ. ජනාධිපතිට බලයක් නැහැ. ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් 09 න් 07ක්ම ඉන්නේ අගමැති සහ විපක්ෂ නායක අතේ. ජනාධිපතිවරයා පත්වෙන්නේ ලංකාවේම සමස්ත ජනතාවගේ බහුතරයෙන්. අගමැති සහ විපක්ෂ නායක කියන්නේ දිස්ත්‍රික්ක දෙකක් නියෝජනය කරන දෙන්නෙක්. ඒක මොනතරම් අසාධාරණද?

ගෝඨාභය රාජපක්ෂ මහතා ඡන්ද 69 ලක්ෂයක් අරන් ජනාධිපති වෙලා මාස 11ක් ගතවී ඇතත් ඔහුට තාම පොලිස්පතිවරයෙක් පත් කරගන්න බැරිවෙලා තියෙන්නේ මේ 19 නිසයි. 20 වැනි සංශෝධනය ඔහුට අවශ්‍ය බලය ලබාදී තිබෙනවා.

පාර්ලිමේන්තු සභාවේ නිර්දේශ පමණයි ඔහු ගත යුත්තේ. පාර්ලිමේන්තු සභාව පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයෙන් සම්මත වන තෙක් වැදගත් තනතුරු වලට පත්කළ අය තවම ඉන්නවා. ඔවුන් පත්කරලා තිබෙන්නේ එවකට අගමැතිව සිටි රනිල් වික්‍රමසිංහ මහතායි. ඔහු පත් කළ මැතිවරණ කොමිසමේ සාමාජිකයෙක් වූ හූල් මහතා මොනවද කළේ කියන එක මුළු රටම දන්නවා. අපේ වගේ බෙදුම්වාදය පවතින සහ තවමත් තම උත්සහය අතහැර නැති බෙදුම්වාදීන් ඉන්නා රටක, මුස්ලිම් අන්තවාදය පවා තිබෙන තත්ත්වයක් මත විධායක ජනාධිපතිවරයෙක් පූර්ණ විධායක බලය සහිතව සිටිය යුතුයි.

වසර 30ක යුද්ධය අපිට පරාජය කළ හැකි වූයේ ජනාධිපතිවරයාට විධායක බලයක් තිබූ නිසා බව අපි කවුරුත් දන්නා කරුණකි. එම බලය නිසාවෙන් අද මේ රටේ ජනතාව නිදහසේ හුස්ම ගන්නේ. හිටපු ජනාධිපති, වර්තමාන අගමැති මහින්ද රාජපක්ෂයන්ට අදටත් ජනතාව ගරු කරන්නේ ඔහු එදා ගත්ත තීන්දු තීරණ නිසාවෙන්. මෙවැනි කරුණු රැසක් 20 වැනි සංශෝධනය තුළින් රටට හිමිවනවා.

● **ඔබ 19 වැනි සංශෝධනයට එරෙහි වූයේ කලකට ඉහතදී. මෙහි ඇති ප්‍රධානතම දුර්වලකම් මොනවාද?**

19 වැනි සංශෝධනය මගින් ජනාධිපතිවරයාට අවුරුදු හතරහමාරක් යනකල් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට බලය නැති කළා. ඒ බලය චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට තිබූ නිසා එදා මේ රට පාවා දෙන්න ගිය එකෙන් බේරා ගත්තා.

2002 වසරේදී අගමැති රනිල් වික්‍රමසිංහ කොටි ත්‍රස්තවාදීන් සමග ඊනියා ගිවිසුමක් අත්සන් කළා. රටේ ජාතික ආරක්ෂාව බිංදුවට බස්සලා දැම්මා. අන්න ඒ අවස්ථාවේ ජනාධිපතිනිය විසින් ආණ්ඩුව විසුරුවා හැරියා. ඊට පසුව පැවැත්වූ මහ මැතිවරණයෙන් රනිල් අන්ත පරාජයක් ලැබුවා. ඇත්තටම එතනදී සිදු වූයේ ජනතාව රනිල් වික්‍රමසිංහගේ තීන්දුවට එරෙහිව ඔහු පරාජය කිරීමයි.

යහපාලන රජය විසින් රණවිරුවන් යුද අපරාධකරුවන් කියලා ජාත්‍යාන්තරයේ හංවඩු ගසන විට, බුද්ධ පුත්‍රයන් වහන්සේලා නිකරුණේ හිරේ දානකොට, ජාතික සම්පත් කුණුකොල්ලෙට විකුණනකොට, ජාතික ආරක්ෂාව අවදානමට ලක් කරලා බුද්ධි අංශය නැති කරලා දානකොට, සමස්ත වශයෙන් ආර්ථික, සමාජීය, දේශපාලනික වශයෙන් රට අස්ථාවර වෙද්දී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට නිකම්ම නිකං උඩබලාගෙන ඉන්න සිද්ධ වුණා. මොකද 19 වැනි සංශෝධනයට අනුව අවුරුදු හතරහමාරක් යනතුරු ආණ්ඩුව විසිර වීමට අවශ්‍ය බලය නැති නිසා.

● **ඔබ කියන්නේ 19 එපා කියලා ජනතාව පිළිගන්න බවද?**

ඔව් ඇත්තටම. ජනතාව 19 එපා කියලා ලොකු පණිවුඩයක් දීලා තිබෙනවා. යහපාලන රජය පරාජය වූයේ ජනතාව 19ට විරුද්ධ වූ නිසා. ඒක ඉතාම පැහැදිලියි.

19 ගෙන ආ මොහොතේ රනිල් වික්‍රමසිංහට ඉතිහාසයේ ප්‍රථම වතාවට පාර්ලිමේන්තු ආසනයක් දිනාගන්න නොහැකි වුණා. අවුරුදු හතළිස් හතරක්ම කොළඹින් පිට හිටිය මට කොළඹ ඇවිල්ලා මාස හයක් වැනි කෙටි කාලයකදී ඡන්ද තුන්ලක්ෂ විසිඅටදහසක් ලබා ගනිමින් කොළඹ දිස්ත්‍රික්කයේ මනාප ලැයිස්තුවේ ප්‍රථමයා බවට පත් වන්නට පුළුවන් වුණා. ඒ දිගින් දිගටම මා 19 ට විරුද්ධව සිටිය නිසායි.

20 න් 19 අහෝසි කිරීම මා දකින්නේ ජනතාවගේ කැමැත්ත මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය කියන එකයි. 1978 සිට 2015 දක්වා මෙරට සිටි සියලුම ජනාධිපතිවරුන්ට විධායක බලතල හිමිවෙලා තිබුණා. ඒ නිසා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට එම බලය ලබා දිය යුතුයි. ජනතාව ඔහුව ජනාධිපතිවරයා වශයෙන් තෝරාපත් කර ගනු ලබන්නේ ලක්ෂ 69 ක ඡන්දයක් ලබාදී. එලෙසම ඉකුත් මහ මැතිවරණයේදී තුනෙන් දෙකක බලයක් අපිට ලැබෙනවා. ජනතාව මේ බලය ලබා දුන්නේ රට හදන්න, සංවර්ධනය කරන්න, ජනතාව ආරක්ෂා කරන්න.

● **ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරුන් වන විමල් වීරවංශ සහ උදය ගම්මන්පිල යන දෙදෙනා 20 වැනි සංශෝධනය සම්බන්ධව විවේචන ඉදිරිපත් කර තිබෙනවා. මෙය අර්බුදයක් නොවෙයිද?**

එය කිසිම ලෙසකින් අර්බුදයක් නොවෙයි. අපගේ රජය තුළ ඕනෑම අයකුට අදහස් දැක්විය හැකියි. එය තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. ජනතාව බලාපොරොත්තු වූ දේ තමයි මේ සිද්ධ වෙමින් පවතින්නේ. විමල් වීරවංශ අමාත්‍යවරයා කියන්නේ හැමදාම අපි සමඟ ජාතික බලවේගයක් වශයෙන් කටයුතු කළ දක්ෂ දේශපාලනඥයෙක්.

දේශයට ආදරය කරන ජනතාවට ළෙන්ගතු නායකයෙක්. ඒ වගේමයි උදය ගම්මන්පිල අමාත්‍යවරයා. ඔහුත් මේ රටට ආදරය කරන සැබෑ දේශපාලනඥයෙක්. ඔවුන් දෙදෙනා වර්තමාන රජය සහ ජනාධිපතිවරයා බිහිකිරීමට විශාල වැඩ කොටසක් සිදු කළා. ඔවුන් දෙදෙනාගේ මතය වෙන්නේ මෙහි කරුණු වෙනස් කරලා ඉදිරිපත් කරන්න ඕන කියන කාරණය.

නමුත් මම කියන්නේ 19 සම්පූර්ණයෙන්ම අහෝසි කරලා අලුත් ව්‍යවස්ථාවක් ගේන්න ඕන කියන එක. අන්න ඒ අවස්ථාවේදී ඔවුනට පුළුවන් තමන්ගේ අදහස් මේ සඳහා එක් කරන්නට.

● **20 වැනි සංශෝධනය නිසා රජය තුළ අර්බුදයක් නිර්මාණය වී ඇති බවට දේශපාලන වේදිකාවල මත පළ වෙනවා. එහෙම තත්ත්වයක් තිබෙනවාද?**

කිසිසේත්ම නැහැ එහෙම ගැටලුවක්. ගැටලුවක් නොමැති තැන ගැටලුවක් මවන එක විපක්ෂයේ හැටි. අනික් කාරණය තමයි අපිට මතවාද තිබෙනවා. ඒවා ගැටලු ලෙස නම් කිරීම වැරදියි. මතවාද ඇති වෙලා තමයි අවසානයේ හොඳ තීරණ ගත හැක්කේ. ඒ තුළින් සෑම අයෙකුගේම අදහස් එළියට එනවා.

● **20 වැනි සංශෝධනය සම්මත කර ගැනීමේදී ආණ්ඩුවට තුනෙන් දෙකක් නැති බවට සමාජය තුළ කියැවෙනවා. එහෙම වෙයිද?**

අපිට ජනතාව ස්ථිර වශයෙන්ම තුනෙන් දෙක ලබාදී අවසන්. එය ජනතාවගේ කැමැත්ත. පාර්ලිමේන්තුව තුළ අපිට තුනෙන් දෙක නොමැති බවට ප්‍රකාශනයක් සිදු කරන්නේ සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන්. අදාළ දිනයේදී මේ පිළිබඳව සියලු දෙනාටම දැන ගැනීමට හැකිවේවි. 20 වන සංශෝධනය සම්බන්ධව අප අතර තිබෙන යම් යම් දේශපාලන මත, ගැටුමක් හැටියටවත් අර්බුදයක් හැටියටවත් දකින එක තේරුමක් නැති සිතිවිල්ලක්. අවශ්‍ය දිනයේදී අපගේ සාමූහික තීරණය රටේ සියලු දෙනා වෙනුවෙන් ගන්නා බව මට ස්ථිරවම කිව හැකියි. පාර්ලිමේන්තුවේ සිටින සියලුම මන්ත්‍රීවරුන්ට මම ආරාධනා කරනවා රට හදන ව්‍යවස්ථාව තමයි 20 කියලා කියන්නේ. ඒ නිසා පක්ෂ භේදයකින් තොරව සියලු දෙනා අප සමග එක්වන්න කියලා.

● **පළාත් සභා මේ රටට අවශ්‍යද?**

පළාත් සභා මෙරටට අවශ්‍ය නෑ කියන එක මම දීර්ඝ කාලයක සිට පවසන කතාවක්. පළාත් සභා කියන්නේ 13 වැනි සංශෝධනය. මධ්‍යම ආණ්ඩුවක් තිබියදී ඇයි අපි පළාත් සභාවලට ඉඩම් පොලිස් බලතල ලබා දෙන්නේ. එය කිසිසේත් අවශ්‍ය කරුණක් නොවෙයි. මේක ඉන්දියාවෙන් අපිට බලහත්කාරයෙන් පටවපු දෙයක්. විශේෂයෙන් ඉන්දු - ලංකා ගිවිසුමෙන් තමයි මෙය අපිට පටවනු ලැබුවේ. පළාත් සභා රාජ්‍ය ඇමතිවරයා වශයෙන් මම කටයුතු කළාට මම මගේ ස්ථාවරය වෙනස් කරන්නේ නැහැ. මම කියන්නේ පළාත් සභා අවශ්‍ය නොවන බවයි. මම දැන් රාජ්‍ය ඇමතිවරයා වශයෙන් මෙය නිකන් ප්‍රකාශ කරන්නේ නැහැ.

මම එය අධ්‍යයනය කරනවා දීර්ඝ වශයෙන්. පළාත් සභා අවශ්‍ය වන්නේ ඇයි. එය ගැළපෙනවාද? සිදු කරන කටයුතු අපට මධ්‍යම රජය මගින් සිදු කර ගත නොහැකිද? මේ වගේ කාරණා සම්බන්ධව දීර්ඝ වශයෙන් හදාරමින් සිටින්නේ.

පළාත් සභා තුළින් ශ්‍රී ලංකාවට සේවයක් සිදුවෙලා තිබෙනවාද? දැන් වසර දෙකහමාරක් පළාත් සභා නැහැ. මේ තුළින් රට ආපස්සට ගියාද? මේ කාරණා සියල්ල පිළිබඳව අධ්‍යයනය කළ යුතුයි. ඒකීය රටක් ෆෙඩරල් රටක් බවට පත් කළ යුතු නැහැ කියන මගේ මතයේ මා ඉදිරියටත් සිටිනවා.

● චන්දිමා එදිරිමාන්න



# පරිප්පු, සීනි, ටින් මාළු, බී ලූනු ලාබයි... ලාබයි...



**මේ වන විට ජනතාව මුහුණ දෙමින් සිටින ජීවන වියදම් ගැටලු සහ කොවිඩ්-19 නව කොරෝනා වයිරස් ව්‍යාප්තිය ආශ්‍රිතව උද්ගත වූ ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් පරිප්පු, ටින්මාළු, බී ලූනු සහ සීනි යන අත්‍යාවශ්‍ය භාණ්ඩ වල ආනයනික බදු ඉවත් කිරීමට රජය තීරණය කරන ලදී.**

පසුගිය ඔක්තෝබර් 13 වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට ඉහත සදහන් කරන ලද මෙම අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ආනයනික බදු ඉවත් කිරීම සිදු කෙරුණු අතර ඒ සමගම නිසා ටින් මාළු (ලොකු) රුපියල් 200කට, බි ලූනු කිලෝවක් රු. 100කට සහ සීනි කිලෝවක් රුපියල් 85කට මිලට ගැනීමට පාරිභෝගික ජනතාවට අවස්ථාව උදාවන බව ජනාධිපති මාධ්‍ය අංශය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශයට පත් කළේය..

මෙසේ ජනතාවගේ එදිනෙදා ආහාර අවශ්‍යතා සඳහා නිරන්තරයෙන් පරිභෝජනය කරනු ලබන මෙම අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල අඩු කිරීම සම්බන්ධව "සිළුමිණ" කළ විමසීමකදී අදහස් දැක්වූ මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයකු සදහන් කර සිටියේ රටේ පවතින වර්තමාන තත්ත්වය පිළිබදව කරුණු සමාලෝචනය කිරීමෙන් පසු මෙම ආනයනික බදු මුදල් ඉවත් කර ජනතාවට වහාම සහන සළසන ලෙස ජනාධිපතිතුමා හා අගමැතිතුමා විසින් ලබා දෙන ලද උපදෙස් වලට අනුව මෙම සුවිශේෂ සහනය ජනතාවට ලබා දීමට මුදල් අමාත්‍යාංශය පියවර ගත් බවයි.

මෙසේ ආනයනික බදු ඉවත් කිරීමෙන් පසු මිල අඩුවන ටින් මාළු,බී ලූනු හා සීනි ඇතුළුව රුපියල් 500 කට වැඩි වටිනාකමක් සහිත භාණ්ඩ සතොසෙන් මිලදී ගන්නා විට පරිප්පු කිලෝව රුපියල් 150 කට මිලට ගැනීමට අවස්ථාව සළසා දී ඇති බවද සදහන් කළ එම ප්‍රකාශකයා ටින් මාළු, බී ලූනු හා සීනි යන අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සදහා ආනයනික බදු මුදල් දැනටමත් ඉවත් කර ඇති බැවින් එම ද්‍රව්‍ය හී මිල අඩු වීමේ සහනය සතොසෙන් පමණක් නොව අනෙකුත් වෙළෙඳ සැල් මගින් ලබා දෙන බවද වෙළෙඳුන් එම සහන ලබා දෙන ආකාර පිළිබදව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් සොයා බලා එලෙස සහන ලබා නොදෙන වෙළෙඳුන්ට එරෙහිව අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු යෙදෙනු ඇති බවද සදහන් කළේය.

මේ පිළිබදව අප ලංකා සතොස සභාපති ආචාර්ය නුෂාඩ් පෙරේරාගෙන්ද අදහස් විමසුවෙමු.එහිදී "සිළුමිණ" සමග අදහස් දැක්වූ ඔහු ප්‍රකාශ කර සිටියේ රජය මගින් ගනු ලැබූ තීරණයට අනුගතව මේ වන විටත් ඉහත සියළු පාරිභෝගික භාණ්ඩ වල මිල ලංකා සතොස ආයතනය මගින් දැනටත් අඩු කර ඇති බවයි.



ලංකා සතොස සභාපති ආචාර්ය නුෂාඩ් පෙරේරා



හලාවත වැවිලි සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී ජූඩ් රූකාන්ත පෙරේරා



කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී එස්.එම්.එම්.සමරකෝන්



පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ සංවර්ධන හා සැළසුම් පී.එදිරිමාන්න

**කොරෝනා කාලෙත් බදු ඉවත් කිරීමෙන් ජනතාවට සහන**

මෙම මිල අඩු කිරීම පාරිභෝගික ජනතාවට විශාල සහනයක් වී ඇති බවත්, සුපුරුදු පරිදි ගුණාත්මක තත්ත්වයෙන් ඉහළම ප්‍රමිතියේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා භාණ්ඩ ඉතාම සාධාරණ මිලකට මිලදී ගැනීම සඳහා ඔවුන් වැඩි වශයෙන් ලංකා සතොස අලෙවි සැල් වෙත පැමිණෙමින් සිටින බවත් ඔහු අවධාරණය කළේය. රාජ්‍ය අංශයට වගකියන ජාතික ආයතනයක් වන ලංකා සතොස සෑම අවස්ථාවකදීම විනිවිද භාවයෙන් කටයුතු කරන බවද පැවසූ ආචාර්ය නුෂාඩ් පෙරේරා තම අලෙවි ජාලය මගින් සෑම පාරිභෝගිකයකුටම විධිමත් ලෙස මෙම සහන ලබා දීමට කටයුතු යොදන බවද සදහන් කළේය.

මේ අතර පසුගිය සමයේ වෙළෙඳපොළ තුළ පොල් මිල වැඩි වීම හමුවේ පීඩාවට පත්ව සිටි පාරිභෝගික ජනතාවටද අඩු මිලට පොල් අලෙවි කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක්ද ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ හා රජයේ උපදෙස් පරිදි ලංකා සතොස මගින් මේ වන විටත් ආරම්භ කර ඇත. ඒ අනුව පොල් සංවර්ධන මණ්ඩලය, කුරුණෑගල වැවිලි සමාගම සහ හලාවත වැවිලි සමාගම එක්ව අත්වැල් බැද ගනිමින් කොළඹ නගරයට දැනට ලබා දුන් පොල් සැපයුම වැඩි කිරීමට කටයුතු යෙදූ බව මේ සම්බන්ධව "සිළුමිණ" සමග අදහස් දැක්වීමට එක්වූ පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ සංවර්ධන හා සැළසුම් පී.එදිරිමාන්න මහතා සදහන් කළේය.

එම ක්‍රියාමාර්ගයත් සමගම දැනට වෙළඳපොළ තුළ දක්නට ඇති පොල් හිගය පහව යන බවත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් නියම කර ඇති මිල ගණන් වලට අනුව සිය පරිභෝජනය සදහා අවශ්‍ය කරන පොල්. ලංකා සතොස අලෙවිසැල් ජාලය හරහා කිසිදු ගැටළුවකින් තොරව ඉතාම සාධාරණ මිලකට මිලදී ගැනීමට දැන් සිටම අවස්ථාව සැළසී ඇති බවත් ඔහු වැඩිදුරටත් සදහන් කළේය. පොල් සංවර්ධන අධිකාරිය හා වැවිලි සමාගම් එකමුතුව පාරිභෝගික ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සදහා අවශ්‍ය කරන පොල් සහනදායී මිලකට සැපයීමේ මෙම නව වැඩපිළිවෙළ පිළිබදව එහි ප්‍රධානතම පාර්ශවකරුවෙකු වන කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී එස්. එම්. එම්. සමරකෝන් අදහස් දැක්වූ අතර එහිදී ඔහු ප්‍රකාශ කළේ හිගයකින් තොරව අවශ්‍ය තරම් පොල් තොග තම වැවිලි සමාගම මගින් මේ වන විටත් වෙළෙඳපොළට මුදා හරිමින් සිටින බවයි.

පොල් සංවර්ධන අධිකාරියේ වැඩපිළිවල සමග එකතු වීම හැරුණු විට කීල්ස් වෙළෙඳ ජාලයේ අලෙවි සැල් සඳහාද තත්ත්වයෙන් උසස් පොල් තොග තම සමාගම මගින් සපයනු ලබන බවද ඔහු අනාවරණය කළේය.

පොල් මිල පාලනය කර හිගයකින් තොරව එම පොල් පාරිභෝගිකයන් අතට පත් කිරීමේදී හලාවත වැවිලි සමාගමද ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන අතර ඒ පිළිබදව අදහස් දක්වන එහි සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී ජූඩ් රූකාන්ත පෙරේරා ප්‍රකාශ කර සිටියේ පසුගිය කාලයේදී ඇතැම් පාර්ශව රට තුළ කෘතිම පොල් හිගයක් මවා පෑම සදහා උත්සාහයක් ගත් බවයි.

කෙසේ වුවත් කොළඹ ප්‍රදේශයේ සතොස ආයතන මගින් පාරිභෝගික ජනතාවගේ පරිභෝජනය සදහා තම සමාගම විසින් දිනකට පොල් ගෙඩි 15,000 ක් සැපයීම සිදු කරන බවද පැවසූ ඔහු තම සමාගම මගින් සමාගම සතු වාහන යොදා ගනිමින් කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පොල් ගෙඩියක් රුපියල් 60/-ක් වැනි උපරිම සිල්ලර මිලකට අලෙවි කිරීමේ වැඩසටහනක් මේ වන විටත් ක්‍රියාත්මක කරමින් සිටින බවද සදහන් කළේය.



# ගම්දනව්වලට භීතිකාවක් වූ ජලභීතිකාව

### මසක් ඇතුළත ගාල්ලේ ජලභීතිකා මරණ 2ක්

### ජලභීතිකාව මර්දනය කරන්න නම් සුනඛ එන්නත් වැඩි කරන්න

### සුනඛ එන්නත් ගණන 70%ක් වුණොත් මිනිස් මරණ නැති කළ හැකියි

### “ඒකීය සෞඛ්‍ය” සංකල්පය යටතේ වැඩපිළිවෙළක් අවශ්‍යයි

● හර්ෂා සුගතදාස

**මාපලගම හොරගස්තුඩුව පදිංචි වී සිටි 12 හැවිරිදි ගවේෂ් නෙත්සර පුතු සැප්තැම්බර් 26 වැනිදා මෙලොව හැර ගියේ ජලභීතිකාව රෝගයට ගොදුරු වීමෙනි. ඊට දින 3 කට පෙර යටලමත්ත ප්‍රදේශයේ පදිංචි වී සිටි 54 හැවිරිදි නියාගම ලොකුගමගේ සරත් මරණයට පත් වූයේද ජලභීතිකාව හේතුවෙනි.**

පසුගිය මාසයේ මහත් ආන්දෝලනයට ලක් වූ හොරණ නිව්චැටල්වත්තේ කවිනි නෙත්සරාගේ මරණයට හේතු වූයේ ද ජලභීතිකාවයි. හොරණ මුවපට්ටිය ග්‍රාමයේ ආරියරත්න නරියකු සපා කෑමෙන් ජලභීතිකාව වැලඳී මිය ගියේ පසුගිය අගෝස්තු 17 වැනිදාය. මාස දෙකක් ඇතුළත සිදු වූ මෙම මරණ හතරට ම හේතු වූයේ ජලභීතිකාවයි. මේ වන විට ජලභීතිකාව රෝගයේ වැඩිවීමක් සිදු වී තිබේදැයි විමසා බැලීමට යොමු වූයේ එබැවිනි.

ජලභීතිකාව වැලඳෙන්නේ වෛරසයක් මඟිනි. මෙම වෛරසය රුධිරයට හෝ ශ්ලේෂ්මල පටලවල තැවරීමෙන් ශරීරගත වන අතර එය වාතයෙන් හෝ සුළඟින් ශරීරගත නොවේ මෙම වෛරසය ශරීරගත වී බීජෞෂණ කාලයේදී පමණක් ප්‍රතිකාර කළහොත් එහි සාර්ථකත්වයක් ලබා ගත හැකිය. බීජෞෂණ කාලය, සපා කෑ හෝ සීරිමක් හෝ තුවාලයක කෙළ තැවරීමක් සිදු වූ ස්ථානය අනුව වෙනස් වේ. නිදසුනක් ලෙස මොළයට ආසන්න මුහුණ හෝ ගෙල ප්‍රදේශයේ සපා කෑමක් සිදු වූවේ නම් මොළයට හානි වීම ඉක්මනින් සිදුවේ. ඇතැම්විට දීර්ඝ කාලයකින් පසුව රෝග ලක්ෂණ පහළ වන විට රෝගියාට තමා සතකුගේ හපාකෑමට හෝ සීරිමකට ලක් වූවාද යන්න පවා අමතක වී තිබිය හැකිය. බීජෞෂණ කාලයෙන් පසුව තියුණු තුඩකින් අනින ආකාරයේ වේදනාව, උණ, වමනය, හිසරදය, වෙහෙස, ආහාර අරුචිය, උගුරේ වේදනාව යන රෝග ලක්ෂණ මතු වේ.

මෙහි උච්ච අවස්ථාවේදී උගුරේ වේදනාව වැඩි වී ගිලීමේ අපහසුව ජලයට ඇති බිය, මොළයේ ඉදිමීම, කම්පනය, ශ්වසන අපහසුතා පේශිවල ක්‍රියාකාරිත්වය අඩු වීම, කලහකාරි ලෙස හැසිරීම, උමතු බව වැනි රෝග ලක්ෂණ දැක ගත හැකිය. මෙවැනි තත්ත්වයක් ඇති වෙන්නේ මෙම වෛරසය ශරීරගත වූ පසුව මධ්‍ය ස්නායු පද්ධතියට හා මොළයට හානි වීමෙන් අනතුරුව ශරීරයේ අනෙකුත් අවයවවලට ද හානි වීමෙනි. ජලභීතිකා එන්නත් ලබා නොදුන් සුනඛයකු හෝ පූසකු හෝ නරියන්, මුගටියන් වැනි සතකුගේ සපා කෑමකට හෝ සීරීමකට ලක් වූ විට එම ස්ථානය සබන් ගා හොඳින් සෝදා හැකි ඉක්මනින් රජයේ රෝහලකට යෑමට උපදෙස් දෙනු ලබන්නේ ජලභීතිකාව බීජෞෂණ කාලයේදී පමණක් ප්‍රතිකාර කිරීමෙන් මැඩ පවත්වා ගත හැකි නිසාය.

ජලභීතිකාව මර්දනය කිරීම සඳහා එන්නත් කිරීමේදී සිදු වෙන්නේ එකී වෛරස් යොදාගෙන ඊට එරෙහි ප්‍රතිරෝධයක් ශරීරයේ ඇති වන පරිදි එන්නත් ලබා දීමයි. මෙම එන්නත 1885 දී ප්‍රංශ ජාතික ලුවී පාශ්චර් සහ එමිල් රූක්ස් විසින් නිපදවනු ලැබීය. මෙය 1908 දී වැඩි දියුණු වූ අතර 20 වන සියවසේ මුල් භාගයේ ජලභීතිකා එන්නත ජනප්‍රිය වූයේ ජලභීතිකා මාරයාගෙන් ගැලවීමට ඇති එකම ඖෂධය එය වන නිසාය. ජලභීතිකා රෝගයට එරෙහිව එන්නත් කිරීම අවස්ථා 2 කදී සිදුවේ. ඒ ජලභීතිකා රෝගයට නිරාවරණය වීමේ වැඩි අවදානමක් ඇති අය ආරක්ෂා කිරීම සඳහා සහ නිරාවරණය වීමෙන් පසු සායනික ජලභීතිකා රෝගය වර්ධනය වීම වැළැක්වීම සඳහා සිදු කෙරෙන එන්නත් කිරීමයි.

“ජලභීතිකාව මිනිසුන්ට හැදෙන්නේ ක්ෂීරපායි සතුන්ගෙන්. ක්ෂීරපායි සතුන් කිව්වාම බල්ලන්, පූසන්, මුගටියන්, හෝතඹුවන්, වවුලන්, ගවයන්, එළුවන් වැනි සතුන් අයිති වෙනවා. ඒත් මිනිසුන්ට වැලඳුන ජලභීතිකාව ගැන විශ්ලේෂණය කළාම 99%ක් වාර්තා වෙලා තියෙන්නේ බල්ලන්ගෙන්. ඒ නිසා අපි බල්ලන්ට ජලභීතිකා එන්නත් ලබා දීමේ වැඩසටහන් අඛණ්ඩවම සිදු කරනවා. ඉස්සර නම් අයාලේ යන බල්ලන් මරා දැම්මා. ඒත් දැන් මරන්නේ නැහැ. ඒ වෙනුවට බල්ලන්ගේ ගහනය අඩු කර ගැනීමට වඳ සැත්කම් කරනවා. ලෝකයේ පිළිගත් ක්‍රමවේදයකට අනුව 2018 දී සුනඛ සංගණනයක් කළා. ඒ අනුව ලංකාවේ බල්ලන් ලක්ෂ 30ක් විතර ඉන්නවා. එයින් ලක්ෂ 09ක් අයාලේ යන සුනඛයන්. හැබැයි අපි එන්නත් දෙන්න ගම්වලට ගියාම අයාලේ යන බල්ලන්ව ලණුවලින් ගැට ගහගෙන ගේනවා.

එයින් පෙනෙන්නේ අයාලේ ඇරියාට ඒ බල්ලන්ට අයිතිකාරයෝ ඉන්න බව. අපේ මිනිස්සු වගකීමක් ඇතිව බල්ලන් ඇතිදැඩි කරනවා නම් ජලභීතිකාව වළක්වා ගන්න පුළුවනි.” යනුවෙන් පැවසුවේ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා අධ්‍යක්ෂ, පශු වෛද්‍ය එල්.ඩී. කිත්සිරි ය. සුනඛයන්ට නොමිලේ ජලභීතිකා එන්නත් ලබා දීම ආරම්භ වූයේ 1959 වර්ෂයේදීය. එය සිදු කළේ 1953 වසරේ පිහිටුවනු ලැබූ පශු මහජන සෞඛය ඒකකය මඟිනි. එය 1959 - 1963, 1976 - 1980 සහ 1981 - 1985 යනුවෙන් පස් අවුරුදු වැඩපිළිවෙළ තුනකින් ක්‍රියාත්මක විය. එහෙත් 2016/09/07 පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මඟින් අයාලේ යන සුනඛයන් මඟින් මහජනතාවට සිදු වන අවහිරතා වැළැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර ඒ අනුව 16/1858/744/014 - 1 අංක දරන කැබිනට් පත්‍රිකාව යටතේ සුනඛයන්ට ජලභීතිකා එන්නත් විදීම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පැවරිණි. ඒ අනුව 2018 සිට මානව ජලභීතිකාව සෞඛ්‍ය අමාත්‍යාංශයටත් සත්ව ජලභීතිකාව සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශයටත් පැවරිණි. පශු වෛද්‍යවරුන් විසින් එන්නත්කරුවන්, යානවාහන ඇතුළු සම්පත් පිළියෙල කරගෙන සුනඛයන්ට එන්නත් කිරීමත් වඳ සැත්කම් කිරීමත් සිදු කරගෙන යන අතරවාරයේදී නැවතත් සුනඛයන්ට ජලභීතිකා එන්නත් දීම සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරා ගනු ලැබුවේ 2019 වසරේ මුල් භාගයේදීය. එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ බලධාරින් පෙන්වා දුන්නේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මේ වෙනුවෙන් අධික පිරිවැයක් දැරීම, ක්ෂේත්‍ර වැඩසටහන්වලදී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ ඇති නිපුණත්වය වැනි කාරණාය.

කෙසේ හෝ මේ පිල් මාරුව නිසා සුනඛයන්ට ජලභීතිකා එන්නත් කිරීමේ වැඩසටහනේ යම් පසුගාමී ස්වාභාවයක් ඇති වූ බව නම් සඳහන් කළ යුතුය. “දෙපාර්තමේන්තු මාරුව එක්ක සම්පත් මාරුවීමක් සිද්ධ වුණා තමයි. එය නැවතත් යථා තත්ත්වය පත් කරන්න කාලයක් ගත වෙනවානේ. සාමාන්‍යයෙන් අපි වසරකට සුනඛයන්ට ජලභීතිකා එන්නත් ලක්ෂ 10ක් පමණ ලබා දෙනවා. ගිය අවුරුද්දේ දීලා තියෙන්නේ ලක්ෂ 8ක් විතර. මේ අවුරුද්දේ කොරෝනා වසංගතය නිසා ඒ වැඩකටයුතු අඩපණ වුණා. මේ අවුරුද්දේ දෙන්න පුළුවන් වුණේ ලක්ෂ 5ක් විතර. ඒත් මේ හේතුන් නිසා ජලභීතිකාව වැඩි වුණා කියලා කියන්න බැහැ.

සාමාන්‍යයෙන් ජලභීතිකාව නිසා මිය යන මිනිසුන් ගණන 20 - 30 ත් අතර අගයක් තියෙනවා. ජලභීතිකාවෙන් වැඩි ගණනක් මිය ගියේ 1973 දී. ගණන 377ක්. මේ අවුරුද්දේ මේ වන විට 24 දෙනකු මිය ගිහින් තිබෙනවා. ඇත්තටම දැන් අපිට ලොකුම ගැටලුව වෙලා තිබෙන්නේ සුනඛයන්ගෙන් ජලභීතිකාව වැලඳීම නොවෙයි. නරියන්ගෙන් ජලභීතිකාව වැලඳීම. හොරණ, මිල්ලනිය, ඉංගිරිය, මදුරාවල වැනි ප්‍රදේශවලින් මේ වන විට නරි සපා කෑ මිනිසුන් 11කුත් බල්ලන් 30 කුත් හරකුන් 5 කුත් වාර්තා වී තිබෙනවා. වන සතුන් නිසා මිනිසුන් ජලභීතිකාවට ගොදුරු වීමට ඉක්මනින් පියවර ගැනීමට අවශ්‍යයි.” යනුවෙන් සඳහන් කළේ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා අධ්‍යක්ෂ, පශු වෛද්‍ය එල්. ඩී. කිත්සිරි ය.

වන සතුන්ගේ ජලභීතිකාව මැඩ පැවැත්වීම සම්බන්ධයෙන් වන ජීවී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පශු වෛද්‍ය තාරක ප්‍රසාද්ගෙන් විමසූ විට ඔහු පළ කළේ මෙවැනි අදහසකි.

“කැලෑ සතුන්ටත් ජලභීතිකා එන්නත් දිය හැකි ක්‍රම තිබෙනවා. කැනඩාවෙ වෘකයන්ටත් ස්විස්ටර්ලන්තයේ හිවලුන්ටත් ජලභීතිකා එන්නත් දී තිබෙනවා. මෙහිදී මස්, මාළු වැනි ආහාර සුවඳක් වහනය වෙන විදිහට ඇමක් සකස් කර වනයේ තැනින් තැන තබනවා. ඒ ආහාර සමග එන්නත අඩංගු වී තිබෙන නිසා එය ශරීරගත වෙනවා. එහෙත් මෙහි ප්‍රායෝගික ගැටලු වගේම අහිතකර ප්‍රතිඵලත් තිබෙනවා. මේ මුඛ එන්නත් ක්‍රමය තවමත් ලංකාවේ ක්‍රියාත්මක කළේ නැහැ. ගෘහාශ්‍රිත සතුන්ට නිසි වේලාවට එන්නත් දීලා අයාලේ යෑමට ඉඩ නොදී මීට වඩා වගකීමකින් සතුන් ඇති කරනවා නම් ජලභීතිකාව පාලනය කරගන්න පුළුවන්. මිනිසුන්ගේ දැනුම්වත් වීම ගොඩාක් වැදගත්. ගමට ඇවිත් නොමිලේ එන්නත් දුන්නත් වැඩට යන්න තියෙනවා, මඟුල් ගෙදර යන්න තියෙනවා කියලා එය අතපසු කරන අය කොයි තරම් ඉන්නවාද? මීට වඩා වගකීමකින් ගෘහාශ්‍රිත සතුන් එන්නත් කරනවා නම් කැලෑ සතෙකු උන්ට හැපුවත් බය වෙන්න දෙයක් නැහැ. අනික කැලෑ සතුන්ගේ ජලභීතිකා ව්‍යාප්තිය සිද්ධ වෙන්නේ බොහෝම හෙමින්. නරි 200ක් හිටියා කියලා සිය ගණනින් ව්‍යාප්ත වෙන්නේ නැහැ. ඕනෑ නම් නරි 5කට 6කට හැදෙයි. මොකද ජලභීතිකාව හැදුණු සතා රංචුව මග හැරලා ස්වභාවයෙන්ම වෙන් වෙනවා.


එවැනි සතකු ගම් වැදුණොත්, අසාමාන්‍ය චර්යා රටාවක් පෙන්වනවා නම් ජනතාව මඟ හැරලා යන්න දැනගන්න ඕනෑ. වනජීවී ආඥා පනත යටතේ උමතු සතුන් ඉවත් කිරීමට බලයක් මිනිසුන්ට තිබෙනවා. හැබැයි පොලුවලින් ගහලා කෲර විදිහට නෙමෙයි. අනික මිනිස්සු දකින දකින නරියා මරන්න ගියොත් විලෝපිතයන්ගේ ගහනය වැඩි වෙලා වෙනත් ගැටලු රාශියකට මුහුණපාන්න වෙනවා. සත්ව ලෝකයේ සමතුලිත බව ගිලිහෙනවා. වන සතුන්ගේ ජලභීතිකාව ප්‍රශ්නයක් වුණත් මිනිසුන් බුද්ධිමත්ව කටයුතු කරනවා නම්, ගෘහාශ්‍රිත සතුන් වගකීමකින් හදනවා නම් ජලභීතිකාව පාලනය කර ගන්න පුළුවන්.”


ශ්‍රී ලංකා පශු වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති (තේරී පත්වූ) පශු වෛද්‍ය එරන්දික ගුණවර්ධන සඳහන් කළ් 2030 වන විට ශ්‍රී ලංකාවෙන් ජලභීතිකාව තුරන් කිරීමේ වැඩපිළිවෙළක් තම සංගමයෙන් සැලසුම් කර ඇති බවය.

“ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන්නේ රටක සුනඛයන්ගෙන් 70%ක් එන්නත් කළොත් මානව මරණ 0 කරගන්න පුළුවන් කියලා. 2016 දී සුනඛයන්ට ජලභීතිකා එන්නත් කිරීම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පැවරුවාම අපි ලොකු වැඩසටහනක් සකස් කළා. අපේ රට දූපතක් නිසා ජලභීතිකාව තුරන් කරන්න ලේසියි. මෙහිදි තැනින් තැන පොඩි පොඩි කඳවුරු තියලා හරි යන්නේ නැහැ. ලංකාව පුරා දැවැන්ත වැඩපිළිවෙළක් මාස 4ක් වැනි කෙටි කාලයකින් ක්‍රියාත්මක කරන්නයි අපි සැලසුම් කළේ. ඒත් දෙපාර්තමේන්තු වෙනස්වීමත් එක්ක එය අතරමග නැවතුණා. ඒකීය සෞඛ්‍ය කියන සංකල්පය යටතේ පශු වෛද්‍යවරුන්, වෛද්‍යවරුන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු අමාත්‍යාංශ නිලධාරීන් එක මේසයකට ඇවිත් තමයි මෙම වැඩපිළිවෙළ සකස් කළේ.

අයාලේ යන සුනඛයන් මිනිසුන් හපා කෑවොත් පසු විපරම් කිරීම, සුනඛ ගහනය අඩු කිරීම ඇතුළු කරුණු ගණනාවක් එහි ඇතුළත් වෙනවා. රජයට භාරදීමට තමයි තිබෙන්නේ. රජය ඊට එකඟත්වය පළ කරනවා නම්, හැමෝම එකතු වෙලා කටයුතු කරනවා නම් ජලභීතිකාව තුරන් කරන දවස වැඩි ඈතක නෙමෙයි.” යනුවෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති (තේරී පත්වූ) පශු වෛද්‍ය එරන්දික ගුණවර්ධන සඳහන් කළේය.

ජලභීතිකාවට උස්මිටිකම් නැත. ලොකු පොඩි භේදයක් නැත. ලංකාවේ ප්‍රභූ පැළැන්තියට අයත් මහා දානපති චාල්ස් සොයිසා 53 වැනි වියේදී මරු වැළඳ ගත්තේ ජලභීතිකාවට ගොදුරු වීමෙනි. ජලභීතිකාව මෙරටින් තුරන් කළ හැකි නම් එය සැමට සැනසිලිදායක පුවතක් වනු ඇත.





වනජීවී අධ්‍යක්ෂ
පශු වෛද්‍ය තාරක ප්‍රසාද්


ශ්‍රී ලංකා පශු වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති
පශු වෛද්‍ය එරන්දික ගුණවර්ධන


මහජන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
පශු වෛද්‍ය එල්.ඩී. කිත්සිරි

---



# විදෙස් වෛද්‍ය උපාධිය ගැන තිත්ත ඇත්ත

● සුරේකා නිල්මිණී ඉලංගකෝන්

**උසස් ප්‍රමිතියෙන් යුතු වෛද්‍යවරුන් සහ සත්කාර මෙන්ම උසස් සෞඛ්‍ය සේවයකින් සමන්විත රටක් ලෙස ශ්‍රී ලංකාව ලොව පුරා ප්‍රචලිතව ඇත. දකුණු ආසියාවේ සෙසු රටවල් හා සලකා බලන විට ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය දර්ශකද ඉන්දියාව ඇතුළු සියලුම රටවල් අභිබවා පෙරට පැමිණ ඇත. නමුත් දැන් දැන් වාර්තා වන කරුණු අනුව මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ඇතිවී ඇති අර්බුද අතර සුදුසුකම් රහිත, ප්‍රමිතියෙන් තොර වෛද්‍යවරුන් බිහිවීම ප්‍රමුඛ හේතුවක් වී තිබේ. ඒ මතය කරළියට පැමිණියේ රුසියාවේ ප්‍රකට විදෙස් විශ්ව විද්‍යාල තුනක් මෙරට අනුමත විශ්වවිද්‍යාල ලේඛනයෙන් ඉවත් කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කිරීම සහ විදෙස් රටවල වෛද්‍ය උපාධිය සම්පූර්ණ කර පැමිණෙන සිසු සිසුවියන්ට මෙරට රජයේ රෝහල්වල සීමාවාසික පත්වීම් ලබාගැනීම සඳහා සමත් විය යුතු ERPM විභාගය දින නියමයක් නොමැතිව කල් යෑම ආදී කරුණු කාරණා නිසාය.**

කෙසේ වෙතත් ERPM විභාගය සම්බන්ධයෙන් පැවති ගැටලුකාරී තත්ත්වය සමනය වූයේ මෙම මස 30 වැනිදාට පෙර එම විභාගය සඳහා ලියා පදිංචි වන ලෙස පසුගිය සතියේදී වෛද්‍ය සභාව විසින් නිවේදනය කිරීමත් සමඟය. එම විභාගය සඳහා ආසන්න වශයෙන් සිසුන් 1250 ක් 1500 අතර සංඛ්‍යාවක් පෙනී සිටීමට නියමිත බවද වාර්තා වේ.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත්තේ ERPM විභාගය වසරකට තුන්වරක් පැවැත්විය යුතු බවය. එහෙත් පසුගිය වසරවලදී මෙම විභාගය පවත්වා ඇත්තේ 2019 වසරේ එක් වතාවක්, 2018 වසරේ දෙවතාවක් හා 2017 වසරේ එක් වතාවක් බැගිනි. අවසන් වරට විභාගය පැවැත්වූ 2019 ජුලි මාසයේ සිට මේ දක්වා විභාගය නොපැවැත්වීම පිළිබඳ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට බොහෝ දෙනකු චෝදනා කරන්නට වූහ. විශේෂයෙන් විදෙස් රටවල වෛද්‍ය උපාධිය ලබා පැමිණි සිසු සිසුවියන් පිරිසක් ජනාධිපති කාර්යාලය ඉදිරියේ උද්ඝෝෂණ ව්‍යාපාරයකටද එක්වෙමින් කියා සිටියේ එම විභාගය කඩිනමින් පවත්වන ලෙසටය. එවැනි තත්ත්වයක් තුළ පසුගිය 25වැනිදා රැස්වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ERPM විභාගය සඳහා අයැදුම්පත් කැඳවීමට දින නියම කරනු ලැබිණ. එම පුවත එතෙක් ERPM විභාගයට පෙනී සිටීම සඳහා බලා සිටි 1500ක් පමණ වන වෛද්‍ය සිසු සිසුවියන්ට සුබ පුවතක්ම විය.

ERPM විභාගය පැවැත්වූ පමණින්ම මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රයට එක්වන වෛද්‍යවරුන්ගේ ගුණාත්මක භාවය පිළිබඳ සහතික විය හැකිද යන්න සම්බන්ධයෙන්ද විවිධ පාර්ශ්ව විවිධ මත පළ කරති. ඒ සම්බන්ධයෙන් මහජන යුක්ති කේන්ද්‍රයේ කැඳවුම්කරු වසන්ත අල්විස් ගෙන් අප විමසීමක් කළෙමු.

"මේ වන විට වෛද්‍ය පත්වීම් ලබා ගැනීමට හා සීමාවාසික පත්වීම් ලබා ගැනීමට සීමාවාසික පත්වීම් අවසන් කළ 2018, 2019 කණ්ඩායම් දෙකක් සහ සීමාවාසික පත්වීම් අපේක්ෂාවෙන් 2019 නොවැම්බර් මස අවසන් විභාගය සම්පූර්ණ කළ තවත් කණ්ඩායමක් සිටිනවා. ඒ අනුව අද වන විට සෞඛ්‍ය සේවාවේ වෛද්‍යවරුන් 30000 කට වැඩි ප්‍රමාණයක් සිටිනවා. නමුත් හෙදියන් සිටින්නේ පනස් දහසකට ආසන්න ප්‍රමාණයක් බව වාර්තා වී තිබෙනවා. සම්මතය අනුව නම් එක් වෛද්‍යවරයකුට හෙදියන් හය දෙනෙක් සිටිය යුතුයි.

දැනටමත් හෙද සේවයට නිලධාරීන් එක් ලක්ෂ තිස් දහසක් සහ අමතර කාර්ය මණ්ඩල අවශ්‍ය වී තිබෙනවා. තව වසර පහකින් මේ රටේ වෛද්‍ය වරු ප්‍රමාණය 50,000 ඉක්මවන අතර එම වසර පහට අමතර හෙදියන් දෙලක්ෂ පනස් දහසක් අප රට තුළින් බිහි කර ගත හැකිද යන්න මෙරට සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ තිබෙන විශාල ගැටලුවක්. එම නිසා අපගේ අදහස නම් මෙරටට දැන් විදේශ වෛද්‍යවරුන් අවශ්‍ය නොවන බවයි."

ඔහු වැඩිදුරටත් සඳහන් කළේ වෛද්‍ය අධ්‍යාපනය සඳහා වූ මූලික සුදුසුකම් පවා සපුරා නැති පිරිසක් විදේශ රටවල වෛද්‍ය උපාධි ලබා මෙරටට පැමිණීමෙන් පසු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර ඇති බවයි. ඒ අනුව මේ වන විට දහසකට ආසන්න විදේශීය සිසුන් ප්‍රමාණයක් ERPM විභාගය සඳහා ඉල්ලුම් කර ඇති අතර එයින් අසූ තුන් දෙනකුගේ නාමලේඛනයක් ඔහු අප වෙත යොමු කර තිබේ. එම අසූ තුන් දෙනාගෙන් උසස් පෙළ විභාගෙන් C සාමාර්ථ දෙකකට සහ S සාමාර්ථ එකකට ඉහළින් සුදුසුකම් ලබා ඇත්තේ සිසුන් 12 දෙනකු පමණි.

මේ වන විට විදේශ රටවල වෛද්‍ය උපාධිය ලබා පැමිණි 750 පමණ පිරිසක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමට අවශ්‍ය මූලික සුදුසුකම වන ERPM විභාගයට ඉල්ලුම් කර ඇති අතර ඒ අනුව මූලික සුදුසුකම් සම්පූර්ණ කර නැති සංඛ්‍යාව තවත් වැඩි විය හැකි බව වාර්තා වේ. මෙවැනි තත්ත්වයක් ඇතිවීමට ප්‍රධාන හේතුව ලෙස ඔහු පවසන්නේ වෛද්‍ය උපාධි සඳහා ශ්‍රී ලාංකික සිසුන් යැවීම ජාවාරමක් බවට පත්ව තිබීමයි. එම ජාවාරම් කරුවන්, තැරැව්කරුවන් මාර්ගයෙන් ඉතා විශාල ලෙස කොමිස් මුදල් ලබා ගනිමින් ලක්ෂ 60 සිට ලක්ෂ 400 දක්වා මුදල් අය කර වෛද්‍ය උපාධිවලට ලාංකික සිසුන් පිටරට යැවීම සිදු කරයි.

රජයේ වෛද්‍ය පීඨ 10 සඳහා උසස් පෙළ ඉහළම ප්‍රතිඵල ලබා ගන්නා පාසල් සිසුන් අතරින් වෛද්‍ය අධ්‍යාපනයට වසරකට ඇතුළු කර ගන්නේ 1500ක් පමණි.

එහෙත් වසරකට 1000 කට වැඩි ප්‍රමාණයක් වෛද්‍ය උපාධි සඳහා විදේශ ගත වන බව වාර්තා වේ. නොබෝ කලකින් මේ සංඛ්‍යාව තවත් වැඩි විය හැකිය. ඒ තුළින් සිදු වන භයානක ප්‍රතිඵලය වන්නේ ප්‍රමිතියෙන් තොර වෛද්‍යවරුන් බිහි වීම තුළින් රටේ සමස්ත සෞඛ්‍යය ක්ෂේත්‍රය ම බිඳ වැටී රෝගී ජීවිත බරපතල ලෙස අවදානමට ලක් වීම බවද ඔහු පෙන්වා දෙයි.

විදෙස් විශ්වවිද්‍යාලවල වෛද්‍ය උපාධිය හදාරා මෙරටට පැමිණ ERPM විභාගයට පෙනී සිටීම වෙනුවෙන් වසර එකහමාරක පමණ කාලයක් බලා සිටි වෛද්‍ය සිසු සිසුවියන් සහ ඔවුන්ගේ මවුපියන් පවසන කතාවද ශෝචනීයය.

"අපි අපේ දරුවන් වෛද්‍ය උපාධිය ගන්න පිටරට යැව්වෙ බොහාම දුක් මහන්සියෙන්. අපි බහුතරය මහ ලොකු සල්ලිකාරයො නෙවෙයි. ඉඩකඩම්, යානවාහන විකුණලා හොයාගත්ත සල්ලිවලින් තමයි දරුවො පිටරට යවලා තියෙන්නේ. ඒ නිසයි මේ විභාගය ඉක්මනින් පවත්වන්න කියලා අපි ඉල්ලීම් කළේ." මහජන යුතුකම් කේන්ද්‍රයේ කැඳවුම්කරු වසන්ත අල්විස් මෙම ප්‍රශ්නයට ප්‍රධාන හේතුව බව පවසන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් අනුමත කළ වෛද්‍ය අධ්‍යාපනයේ මූලික ප්‍රමිතීන් (Minimum Standards of Medical Education) පාර්ලිමේන්තුවේ සම්මත නොවීම නිසා ඇති වී තිබෙන ව්‍යාකූල තත්ත්වයයි.

පසුගිය රජයේ හිටපු සෞඛ්‍ය ඇමතිවරයා විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග ඊට හේතුවයි. ඒ නිසා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීම සහ රෝගී ජීවිත සුරක්ෂිත කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ගවලට නීතිමය රැකවරණය නොලැබුණි. ඒ තුළින් ජාවාරම්කාර සමාගම්වලට වෛද්‍ය සභාවේ ප්‍රමිතීන්ට පටහැනිව තම ව්‍යාපාරය කරගෙන යෑමට ඉඩ ප්‍රස්ථා හිමිවී ඇති බවද ඔහු පැවසීය.

මෙවැනි තත්ත්වයක් තුළ තව වසර කිහිපයකින් අපොස උසස් පෙළ විභාගයෙන් ඉහළම ප්‍රතිඵල ලබා රජයේ විශ්ව විද්‍යාලවල වෛද්‍ය පීඨවලට ඇතුළත් වී වෛද්‍ය උපාධි ලබන වෛද්‍යවරුන්ටද රැකියා නොලැබෙන තත්වයක් ඇති වනු ඇත.

"වෛද්‍ය අධ්‍යාපනය සඳහා වූ මූලික සුදුසුකම් සපුරා විදේශ රටවල වෛද්‍ය උපාධි ලබා මෙරටට පැමිණෙන වෛද්‍ය සිසුන්ට ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම සඳහා ERPM විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබාදිය යුතුයි. නමුත් වෛද්‍ය උපාධිය හැදෑරීම සඳහා සපුරාලිය යුතු මූලික සුදුසුකම් හෝ නැතිව ERPM විභාගයට පෙනී සිට වෛද්‍ය ක්ෂේත්‍රයේම එක්වීම රටේ සමස්ත සෞඛ්‍ය ක්ෂේත්‍රයේම පරිහානියට හේතුවක්. මෙම ව්‍යසනයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය බේරා ගැනීමට වහාම පියවර ගත යුතුව තිබෙනවා."

ඒ සඳහා කඩිනමින් ගත යුතු පියවර ලෙස ඔහු පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් අනුමත කළ වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් වහාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීම, වෛද්‍ය අධ්‍යාපනයේ මූලික සුදුසුකම් සහ ප්‍රමිතිය සම්පූර්ණ නොකළ වෛද්‍යවරුන් බිහිවීම වැළැක්වීමට පියවර ගැනීම, වෛද්‍ය අධ්‍යාපනය මුදලට විකිණීමට ජාවාරම්කාර සමාගම් විසින් කරගෙන යන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම, රටේ අවශ්‍යතාවන්ට අනුකූලව වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් තීරණ ගැනීමට සහ දීර්ඝකාලීන සැලැස්මක් සකස් කිරීම සඳහා අදාළ සියලුම ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි ජනාධිපති කාර්යසාධක බලකායක් පත් කිරීම ආදී කරුණුය.


තරුණ සේවා සභාවේ සභාපතිවරයා ඇතුළු පිරිස...

# උලපනේ 'තරුණ කැරැල්ලක්'


2018 වසරේදී වගා කළ භූමියේ පල දරන අයුරු

● අසේල කුරුළුවංශ

**විජේවීර ඝාතනය වූ උලපනේ ශාන්ත මේරි වත්ත හා දොළුව අරලිය උයන වත්ත තරුණ සේවා සභාවෙන් අස්වද්දයි වැඩි කතාබහට ලක් නොවූ උලපනේ මෙරට පමණක් නොව ජාත්‍යන්තරය තුළ පවා ප්‍රචලිත වූයේ එක් රැයකිනි. ඒ ජවිපෙ නිර්මාතෘ රෝහණ විජේවීර උලපනේ ශාන්ත මේරි වත්තේදී හමුදා නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගැනීමත් සමඟය. ඒ 1989 නොවැම්බර් මස 12 දිනය. සිය පක්ෂයේ අවසන් දේශපාලන මණ්ඩල රැස්වීම ගලහ අරලිය උයන නිවසේදී එදින අලුයම තෙක් පවත්වා එහි සිට කිලෝ මීටර 20 ක පමණ දුරක පිහිටි ශාන්ත මේරි වත්තට පැමිණ සිටි විජේවීර මහතා එදින පස්වරු 2.00 ට පමණ අත්අඩංගුවට පත්විය. සිය බිරිඳ හා දරුවන් පස්දෙනා සමඟ උලපනේ ශාන්ත මේරි වත්තේ පිහිටි නිවසේ ගතකළ ජවිපෙ නායකයා එහිදී පෙනී සිට ඇත්තේ නිමලසිරි අත්තනායක යන නමිනි.**

බාහිර සමාජය හා වැඩිපුර නොගැටුණු අත්තනායකව එම ප්‍රදේශයේ ජනතාව හඳුනාගෙන තිබුණේ වෘත්තිය වැවිලිකරුවකු ලෙසිනි. බණ්ඩාරවෙල සිට උලපනේට පැමිණ වසරක පමණ කාලයක් තුළ අත්තනායක යනු වෙන කිසිවකු නොව රෝහණ විජේවීරම බව හඳුනාගත් රජයේ ආරක්ෂක අංශ ඔහු අත්අඩංගුවට ගෙන පසු දිනම මරා දමනු ලැබීය. විජේවීර අත්අඩංගුවට පත්වන විට විසූ උලපනේ ශාන්ත මේරි වත්ත හා නිවසත් අවසන් දේශපාලන මණ්ඩල රැස්වීම පවත්වන ලද දොළුව අරලිය උයන වත්ත සහ නිවසත් රාජසන්තක කරනු ලැබීය. පසුව 1997 පෙබරවාරි මස 07 දින ජාතික තරුණ සේවා සුබ සාධක අරමුදල වෙත එම නිවාස හා ඉඩම් පවරා දෙනු ලැබුවේ හිටපු ජනපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගයන් විසිනි.

උලපනේ ශාන්ත මේරි වත්ත පිහිටි නිවස හා ඉඩම කේන්ද්‍රකර ගනිමින් ජාතික තරුණ සේවා සභාව මගින් පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කළත් දොළුව අරලිය උයන වත්ත ලෙසින් හැඳින්වූ අක්කර 10 ක පමණ භූමියේ විධිමත් වැඩසටහනක් මෙතෙක් ක්‍රියාත්මක වී නොතිබිණි. මෙයට දෙවසරකට පමණ ඉහතදී මෙම භූමියේ අක්කර දෙකක පමණ කොටසක් එළිපෙහෙළි කර වගා කටයුතු කර තිබුණු අතර ඉඩමේ ඉතිරි අක්කර අටක පමණ ප්‍රමාණය කිසිදු ප්‍රයෝජනයකට නොගැනීම නිසා පැවතියේ වල් බිහිව ඝන කැලෑවක තත්ත්වයෙනි. මෙම භූමිය එළිපෙහෙළි කොට ගොවිපොළක් බවට පත් කිරීමට තරුණ සේවා සභාපති අධ්‍යක්ෂ ජනරාල් තේසාර ජයසිංහගේ උපදෙස් මත දොළුව තරුණ සේවා සභා ස්ථානභාර නලධාරිනි රම්‍යා කුමාරි පියවර ගත්තේ මේ අතරතුරය. ඒ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සෞභාග්‍යය දැක්ම වැඩසටහනට අනුව අමාත්‍ය නාමල් රාජපක්ෂයන්ගේ මඟ පෙන්වීමෙන් තරුණ සේවා සභාවට අයත් සෑම භූමියක්ම ආර්ථික කෘෂි බෝග වගාවන් සහිත ගොවිපොළක් බවට පත් කිරීමේ වැඩසටහන අනුව යමිනි.

## උලපනේ ශාන්ත මේරි වත්ත තරුණ සේවා සභාවෙන් අස්වද්දයි

මෙයට තිස් එක් වසරකට පෙර උපතිස්ස ගමනායක, සෝමවංශ අමරසිංහ ඇතුළු දේශපාලන මණ්ඩල සාමාජිකයින් රෝහණ විජේවීරයන් සමඟ අවසන් දේශපාලන මණ්ඩල රැස්වීම පැවැත්වූ භූමිය අපනයන කෘෂි බෝග වලින් හා අන්තර්කාලීන බෝග වගාවන් ගෙන් පොහොසත් කර එම මුඩු බිම රටේ ආර්ථිකයට ධනාත්මක බලපෑමක් එක්කරන තෝතැන්නක් කිරීමේ වගකීම කරට ගනු ලැබුවේ රම්‍යා කුමාරි ය. වගා වැඩපිළිවෙළ සම්බන්ධව ඇය මෙසේ අදහස් දැක්වීය.

'මේ ඉඩම ඝන කැලෑවක් විදිහට තිබ්බේ. දොළුව තරුණ සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය හා තරුණ තරුණයන් එක්ව මේ කැලෑව ශුද්ධ කළා. කිසිම යන්ත්‍ර උපකරණයක් නැතුව මේක කළේ. අක්කර දෙකක පමණ ප්‍රදේශයක අපි ගම්මිරිස් පැළ 650 ක් හිටෙව්වා. අපනයන කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවෙන් මේ පැළ සියල්ල අපට නොමිලේ ලබා දුන්නා. ඉදිරියේදී තවත් ගම්මිරිස් පැළ 350 ක් සිටුවීමට සැළසුම්කර තිබෙනවා. අපේ මධ්‍යසථානයේ කාර්ය මණ්ඩලයේත් පුහුණුව සියලුම දරුවන්ගේ ශ්‍රමය මේ පිටුපස තිබෙනවා. ගොවිපොළ බාරව කටයුතු කරන චාමර හා රුවන් දෙදෙනාත් ආරක්ෂක අංශයේ නිලධාරීනුත් කළ සේවය අති විශාලයි. ඒ වගේම දොළුව ප්‍රාදේශීය ලේකම් යමුනා දයාරත්න, තරුණ සේවා සභාවේ මධ්‍යම පළාත් අධ්‍යක්ෂක අජන්ත විජේතිලික, අපනයන කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ කලමණාකාර විජිත සම්පත්, දොළුව තරුණ සේවා නිලධාරී චාමර රුවන් යන මහත්ම මහත්මීන් මේ වැඩසටහන සාර්ථක කර ගැනීමට විශාල දායකත්වයක් ලබා දුන්නා'

ගම්මිරිස් වගා භූමිය කෘෂි පාඨමාලා හදාරන්නන්ට ආදර්ශකයක් ලෙස ගොඩනැගීමට නියමිත අතර ඊට අවශ්‍ය පූර්ණ තාක්ෂණ උපදෙස් ලබා දෙන්නේ අපනයන කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව මගිනි. භූමියේ ඉතිරි කොටසද ගොවි බිමක් ලෙස කඩිනමින් සංවර්ධනය කිරීමට තරුණ සේවා සභාව සැළසුම්කර තිබේ. රජයේ අපේක්ෂාව වී තිබෙන්නේ මුඩුබිම් බවට පත්ව ඇති භූමි ප්‍රදේශ මෙන්ම තරුණ සේවා සභාවට අයත් සියලු භූමි ප්‍රදේශවල තරුණ කොටස් සහභාගීත්වයෙන් ආර්ථික බෝග වගා කොට ඒ හරහා තරුණ කොටස් කෘෂිකර්මාන්තය වෙත නැවතත් ආසක්ත කරගැනීම මෙන්ම කෘෂිකර්ම ව්‍යාපාරික හා කෘෂිකර්ම ව්‍යවසායක තරුණ පරපුරක් බිහිකොට ඔවුනට නවීන හා වාණිජ කෘෂිකර්මය සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීමත් එම ආර්ථික බෝග සඳහා නිසි වෙළෙඳපොළක් ලබා දීමත්ය.

ඒ සඳහා ශක්තියක් වෙමින් තරුණ සේවා සභාව ආරම්භ කර තිබෙන මෙම වගා වැඩසටහන සම්බන්ධයෙන් අදහස් දැක්වූ එහි සභාපති, අධ්‍යක්ෂ ජනරාල් තෙසාර ජයසිංහ මෙසේ පැවසුවේය.

'මව්බිම පුරා ඇති සෑම බිම් අඟලක්ම රටේ උන්නතිය උදෙසා යොදවන්න ඕන. වගා කළ හැකි ඒත් වගා නොකළ තැන් බොහොමයක් අපේ රටේ තිබෙනවා. මේත් ඒ වගේ තැනක්. අපේ බලාපොරොත්තුව මේ කැලෑ වැදී තිබෙන භූමිය ගොවි බිමක් බවට පත්කරන්නයි. කෘෂි සංචාරක කලාපයක් බවට මේ ප්‍රදේශය පත් කිරීම අපේ බලාපොරොත්තුවයි. නව තාක්ෂණය ඔස්සේ හරිතාගාර ක්‍රමෝපායන් මේ බිමට හඳුන්වා දෙනවා. අපනයන කෘෂිබෝග වන කුරුඳු, ගම්මිරිස්, කරාබු, සාදික්කා, පුවක්, බුලත්, ඉඟුරු, කහ, වැනිලා, සේර, බෙල් පෙපර් වැනි බෝග වගාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනවා. මෙමඟින් උපයන මුදල් තරුණ සේවා සභාවට නොව කෘෂිකර්මාන්ත කටයුතු සඳහා සහභාගීවන තරුණ පිරිසට හා තරුණ සේවා කොට්ඨාස කාර්යාල වෙතම ලැබීමට සලස්වා මෙම කටයුතු තව තවත් ප්‍රවර්ධනය කිරීම ජනාධිපතිතුමන්ගේ මෙන්ම තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂයන්ගේ ද බලාපොරොත්තුවයි. මෙම ආර්ථික කෘෂි වැඩසටහන් සඳහා ජපානයේ සහ කොරියාවේ තාක්ෂණික දැනුම හා ආධාර ලබා ගැනීමට අප සැලසුම්කර තිබෙනවා'

මෙයට තිස් වසරකට පෙර දොළුව අරලිය උයන වත්ත තුළ රෝහණ විජේවීර ඇතුළු ජවිපෙ ඉදිරි පෙළ නායකයන් සැලසුම් කළේ රටේ පාලන බලය අල්ලා ගැනීම සඳහා තරුණයින් පෙළ ගස්වන්නටය. එවකට බලයේ සිට එජාප ආණ්ඩුව එම තරුණ කැරැල්ල මර්දනය කරනු ලැබුවේ දහස් ගණනයක් තරුණ ජීවිත ටයර් සෑ වල පුළුස්සා දමමිනි. රෝහණ විජේවීර ඝාතනය වීමත් සමඟ උලපනේ ශාන්ත මේරි වත්ත හා දොළුව අරලිය උයන වත්ත තරුණ සේවා සභාව යටතට පවරා දෙනු ලැබීය. දැන් එහි යළිත් තරුණ කැරැල්ලක් ආරම්භ වී තිබේ. ඒ අවුරුදු ගණනාවක් වල්වැදී තිබූ අක්කර 10 ක භූමි ප්‍රමාණය ගොවි බිමක් කිරීමටය.

# ඇස් රතුවෙන ලූනු කතා



● දඹුල්ල-සරත් එරමිනිගම්මන

**වසර ගණනාවක් පාඩු ලබමින් හෙම්බත්ව සිටි මෙරට දේශීය ලොකු ලූනු ගොවියන්ගෙන් අතලොස්සකට වාර්තාගත ඉහල මිලකට තම ලොකු ලූනු අස්වැන්න අලෙවි කර ගැනීමට හැකිවී තිබේ. ලොකු ලූනු වගාවේ අස්වනු නෙලන සමය ආසන්න වනවිට පිටරටින් ගෙන්වන ලොකු ලූනු තොග වෙළඳපොලේ සුලභ වීම දක්නට ලැබුණ විශේෂ කාරණයක් වී තිබුණි. මේ තත්වය අද ඊයේ ඇති වුවක් නොව වසර කීපයක්ම දේශීය ලූනු ගොවියා මුහුණපා සිටි ගැටලුවක් විය. මේ තත්වය තුළ වගාව එපාවී සිටි ලූනු ගොවියා පසුගිය යල් කන්නයේ වගාව සඳහා පෙළඹවීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිටින අවංක නිලධාරීන්ට දරන්නට වුයේ මහත් පරිශ්‍රමයකි.**

වත්මන් ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු මෙරට දේශීය ලොකු ලූනු ගොවියා කෙරෙහි උනන්දුව ඉහළ නැංවීමට නිසිකලට පිටරටින් ගෙන්වන ලොකු ලූනු සඳහාවූ ආනයනික බදු ඉහළ දැමීමට පියවර ගනු ලැබීමේ තීරණයත් සමඟ මෙරට දේශීය ලොකු ලූනු ගොවියාට තම අස්වනු සඳහා හොඳ මිලක් ලබාගැනීමට හැකිව තිබීම ප්‍රශංසනීය පියවරකි.

මෙරට ලොකු ලූනු ගොවියාට තම අස්වනු නෙලන සමයේ වෙළඳපොලේ රුපියල් 100 ත් 120 අතර ඉහල මිලකට අලෙවි කිරීමට හැකිවූ ලොකු ලූනු කිලෝවක මිල පසුගිය සතියේ සිට රුපියල් 180 - 240 අතර මිල පරාසයක් තුළ වාර්තාගත ඉහල මිලකට අලෙවිකර ගැනීමට හැකිවීම වගාව කෙරෙහි ගොවියා උනන්දු කිරීමට මහත් පිටුවහලක් වී ඇති බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.

කෙසේ වෙතත් පාරිභෝගිකයාට මේ තත්වය තුළ අදටත් ලොකු ලූනු මිලදී ගැනීමට සිදුව ඇත්තේ රුපියල් 250-280 ත් අතර ඉහළ මිලකටය. වසර කීපයක් ලොකු ලූනු වගාව හැරගිය බහුතර ලූනු ගොවියාටද මහත් ආස්වාදයක්වූ මිල ඉහළයාම යළි ලොකු ලූනු වගාව සඳහා මහත් උත්තේජනයක් වී ඇත. මේ තත්වය ගොවි බිම හැරගිය ලූනු ගොවියා යළි ගොවිබිම කරා රැගෙන ඒම සඳහා වත්මන් ආණ්ඩුවේද කෘෂිකර්ම බලධාරීන්ගේද වගකීමකි.

මීට දශක පහකට පමණ ප්‍රථම ලංකාවේ වාණිජ වගාවක් ලෙස ලොකු ලූනු වගා කිරීමට ගොවින් උනන්දු කරවූයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ සිටි අවංක අතලොස්සක්වූ නිලධාරීන් පිරිසකි. ඔවුන් ලූනු වගාව ජනතාව අතර ප්‍රචලිත කිරීමට අපමණ වෙහෙසක් දැරිය. මෙරට දේශීය ලොකු ලූනු වාණිජමය නිෂ්පාදන කර්මාන්තයට දශක තුනකට වැඩි කාලයක් ගතවෙමින් පවතින මේ මොහොත වනවිට ලාංකීය ලොකු ලූනු කර්මාන්තය පත්ව ඇත්තේ අභාග්‍ය සම්පන්න ඉරණමකට බව කිවහොත් එය අතිශයෝක්තියක් නොවන්නේය. වෘත්තිමය ලොකු ලූනු ගොවියා රටේ තිබෙන මුල්‍ය ආයතනවල මෙන්ම ආර්ථික මධ්‍යස්ථානයන්හි ව්‍යාපරිකයින්ගේ ණය කරුවන් බවට පත්ව ඇති බව පැවසීම මුසාවක් නොවේ. පසුගිය කාලය තුළ ඇතැම් ගොවින් ලොකු වගාව විනාශ වීම දරාගත නොහැකිවීම හා වගා ණය ගෙවා ගත නොහැකිව සියදිවි හානිකරගත් අවස්ථා ද විය..

මාතලේ දිස්ත්‍රික්කයේ වියළි කලාපය කේන්ද්‍ර කර ගනිමින් ආරම්භ කර තිබූ ලොකු ලූනු නිෂ්පාදන කර්මාන්තය ක්‍රම ක්‍රමයෙන් වගාකළ බිම ප්‍රමාණය අඩුවිය. 2014 වසරේ දී හෙකටයාර් 5743 ක්වූ බිම ප්‍රමාණයක වගා කළ දේශීය ලොකු ලූණු වගා බිම ප්‍රමාණය 2015 දී හෙකටයර් 2500 දක්වාද, 2016 දී හෙක්ටයාර් 1880 දක්වාද, 2017 දී හෙකටයර් 1050 දක්වාද, 2018දි හෙක්ටයාර් 700 දක්වාද, 2019දි හෙකටයාර් 583 ක් දක්වාද වගා බිම් ප්‍රමාණය අඩුවිය. නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගොවින් උනන්දු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2020 යල් කන්නයේ එම බිම ප්‍රමාණය හෙකටයාර් 1150 ක් දක්වා ඉහළට නංවා ලොකු ලූනු වගාව යළි ආරම්භ කිරීමට හැකිවිය.

මෙලෙස ආරම්භ කළ ලොකු ලූනු වගාවට ආරම්භයේ සිටම අයහපත් කාලගුණය නිසා දැඩි බලපෑම් එල්ලවිය. ලොකු ලූනු වගාවට උචිත නොවන අඳුරු සහිත අයහපත් කලගුණික තත්ත්වය හේතුවෙන් බරපතල හානි සිදුවිණි. අකල් වර්ෂාව නිසා ලූනු වගාවට සුදුසු නොවන නිරන්තර අඳුරු ආලෝකය සහිත පරිසරයක් නිර්මාණයවීය. අඳුරු පැහැති පරිසරය ලූනු වගාවට කිසිසේත් සුදුසු නොමැති තත්වය පසුගිය වසර පහ හයක කාලය තුළ ලූනු ගොවියා මුහුණ දුන් ගැටලුවක් විය.

ලොකු ලූනු වගාවට මුලින්ම ඇතිවුයේ පාලනය කල නොහැකි ආකාරයෙන් දිලීර රෝග කීපයක් ව්‍යාප්ත වීමයි. ඒ වගේම බැක්ටීරියා ආසාදිතයන්ද ඇතිවිය. ආලෝකය අඩු අඳුර හා වැසිබර කාලගුණික තත්වය මත ලොකු ලූනු බල්බය කුණුවීම,පත්‍ර දඟර රෝගය නිසා වගාවට දරුණු හානි සිදුවිණි. ගොවි ජනතාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගේම කෘෂි රසායනික වෙළඳුන් විසින් වරින්වර නිර්දේශිත පළිබෝධ නාශක භාවිතා කලත් වගාව පාලනය කළ නොහැකි දැඩි අනතුරකට ලක්විය. මෙම දිලීර හා බැක්ටීරියා ආසාදිත තත්වයන් මතුවී දින දෙක තුනක් යන්නටත් පෙරම වගාව සම්පූර්ණයෙන් විනාශ වී ගොස් අක්කර සිය ගණනින් වගා බිම අතහැර දැමීමට ගොවීන්ට සිදුවූහ.

මෙම අභියෝගයන් සියල්ලට සාර්ථකව මුහුණදෙමින් තම ලොකු ලූනු වගාවෙන් සාර්ථක අස්වැන්නක් ලබා සතුටුවන ගොවින් කිපදෙනෙකු සිටිති. ඔවුන්ගෙන් ගලේවෙල,වටගල පදිංචි එච්.එම්.විජේසිංහ ගොවි මහතා කියා සිටියෙ මෙවන්නකි.

කෘෂිකර්ම නිලධාරීන් ඇවිත් බය නැතිව ලූනු වගා කරන්න අපිව උනන්දු කළා.

අස්වැන්න නෙලීමේ සිට වෙළඳපොල කරා රැගෙන යනතෙක් රුපියල් 40,000 ක් විතර වැයවෙනවා. අක්කරයක ලූනු වගා කිරීමට රුපියල් අවම වශයෙන් රුපියල් ලක්ෂ එක හමාරක් දෙකක් පමණ වැයවෙනවා.

ලොකු ලූනු වගාව සඳහා ලොකු මුදලක් යට කරන්න වෙනවා. ප්‍රමිතියෙන් යුතු දේශීය හොඳ බීජ ලැබෙනවා නම් ලූනු වගාවෙන් පාඩු සිදුවන්නේ නැහැ. හැබැයි අස්වනු නෙලන සමයට පිටරටින් ගෙන්වන ලොකු ලූනු සඳහා ආනයනික බදු වැඩිකර දේශීය ආරක්ෂා කිරීම වැදගත් යයිද ඒ මහතා පැවසිය.

ගොවියන්ගෙන් රුපියල 150-170 ත් අතර මිලකට මිලදී ගත් ලොකු ලූනු තොග බොහොමයක් තිබුනේ වෙළඳුන් ළඟය. දින දෙක තුනක් යනවිට කොළඹ ප්‍රධාන පෙලේ ලූනු ගෙන්වන ව්‍යාපාරිකයින් කිහිපදෙනකු විසින් ලූනු සඳහා තරඟකාරී මිලක් ලෙස රුපියල් 230 ක් නියම කිරීමත් සමඟ ලූනු තොග වෙළඳපොල කරා විශාල ලෙස පැමිණියේය.

නමුත් එම ලූනු තොග ගොවීන්ගේ නොවේ. ඒවා ඊට පෙර ගොවීන්ගෙන් අඩුමිලට ව්‍යාපාරිකයින් සන්තකයේ තිබූ ලූනු තොගය. මිල වැඩිවීමේ වාසිය ලැබුණේ ගොවියාට නොව අතරමැදියාට බවයි ඔවුහු පවසන්නේ.

කෙසේ වෙතත් මේ වන විට රජය ලොකු ලූනු කිලෝවක මිල රුපියල් 100 දක්වා අඩු කර ඇත.


## අධිකරණ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිණිස මහජන අදහස් ලබා ගැනීමට කරනු ලබන ආරාධනාවයි**

ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සම්පාදනය කර, එය අමාත්‍ය මණ්ඩලයේ සහ පාර්ලිමේන්තුවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කිරීමේ කාර්‍යය අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂඥ කමිටුවක් වෙත පවරා ඇති බව ශ්‍රී ලංකාවාසී මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් යම් පුරවැසියෙකු තම යෝජනා, මත හෝ අදහස් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, එම යෝජනා, මත හෝ අදහස් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා යන කවර වූ හෝ මාධ්‍යයකින් 2020 නොවැම්බර් මස 30 වන දිනට හෝ එදිනට පෙර විශේෂඥ කමිටුවේ ලේකම් අමතා යොමු කළ හැකිය.

මෙහි දී, පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්නේ නම් මැනවි.

1. සියළුම කරුණු දැක්වීම් A4 ප්‍රමාණයේ කඩදාසියක යතුරු ලියනය කර තිබීම.
2. පහත සඳහන් එක් එක් මාතෘකා සඳහා වෙන් වූ පිටුවක් යොදා ගැනීම.

අ. රාජ්‍යයේ ස්වභාවය
ආ. මූලික අයිතිවාසිකම්
ඇ. භාෂාව
ඈ. රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙය වීමේ මූලධර්ම
ඉ. විධායකය (ජනාධිපති/අමාත්‍ය මණ්ඩලය/රාජ්‍ය සේවය)
ඊ. ව්‍යවස්ථාදායකය
උ. ඡන්ද බලය සහ ජනමත විචාරණය ඇතුළුව මැතිවරණය
ඌ. බලය විමධ්‍යගත කිරීම/බලය බෙදාහැරීම/බලය වෙන්කිරීම
එ. අධිකරණය
ඒ. රාජ්‍ය මුදල්
ඔ. රාජ්‍ය ආරක්ෂාව
ඕ. ඉහත නිශ්චිතව සඳහන් නොකරන ලද යම් වෙනත් විෂයන්

ඉදිරිපත් කරන කරුණු ඉතාමත් සංක්ෂිප්තව සඳහන් කිරීම යෝග්‍ය වේ.
ඔබගේ සැලකිරීම් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් යොමු කළ හැකිය.

තැපැල් ලිපිනය: කාමර අංක 32 [Block 02] බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 05.
විද්‍යුත් තැපැල් ලිපිනය : expertscommpublic@yahoo.com

ලේකම්
නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ විශේෂඥ කමිටුව





# ලොව හොල්ලන අපේ ක්‍රිකට් ශූරියෝ

## දෙදෙනාම O/L, A/L පමණක් නොව ශිෂ්‍යත්වය ද සමත්

## චමරි හා ශෂිකලා අයි. පී. එල්. සටන් බිමේ





### ‘අධිෂ්ඨානය සහ ආත්ම විශ්වාසය ඇත්නම් නිසැකව ජයගන්නවා’ -ශෂිකලා

### කැපවීම සහ උත්සාහයයි මා මෙතනට ගෙන ආවේ -චමරි

● භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

**ඉන්දීය ප්‍රිමියර් ක්‍රිකට් තරගාවලියට (අයි.පී.එල්.) සමගාමීව එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පැවැත්වීමට නියමිත කාන්තා විස්සයි විස්ස තරගාවලිය සඳහා ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩිකාවන් දෙදෙනකු එක්වෙයි.**

කණ්ඩායම් තුනක් කරට කර තරග වදින මේ තරගාවලිය සඳහා ලෝකයේ ප්‍රබල කාන්තා ක්‍රිකට් ක්‍රීඩිකාවන් රැසක්ම එක්ව තිබේ.

තුන්ඉරියව්වෙන්ම ක්‍රීඩා කරන විශේෂ දක්ෂතා පෙන්වා තිබෙන රටවල් රැසක ක්‍රීඩිකාවන් මේ සඳහා එක්කර ගැනීමට සංවිධායකවරුන් විසින් පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ කසකාරියන් ලෙස සැලකෙන චමරි අතපත්තු සහ ශෂිකලා සිරිවර්ධන සුපර් නෝවාස් කණ්ඩායමට එක්ව තිබේ.

රටවල් හතක විදේශීය ක්‍රීඩිකාවන් එක්ව සිටින තරගාවලිය සඳහා ඉන්දීය කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ ප්‍රබල ක්‍රීඩිකාවන් තිදෙනකු කණ්ඩායම් තුනේ නායකත්වයට පත්කර ඇත.

සුපර් නෝවාස් කණ්ඩායමේ නායිකාව වශයෙන් හර්මන්ජිත් කෞර්, ට්‍රේල් බ්ලේසර්ස් කණ්ඩායමේ නායිකාව ස්මිරිනි මන්දනා සහ වෙලොසිටි කණ්ඩායමේ නායිකාව ලෙස මිතාලි රාජ් තරග බිමට පිවිසෙනු ඇත. ලෝක විස්සයි 20 කාන්තා ක්‍රිකට් ශ්‍රේණිගත කිරීමට අනුව අංක එකේ පන්දු යවන්නිය වන සොෆී එක්ලස්ටන් සහ ඩැනී වියාට් එංගලන්තය නියෝජනය කරමින්ද ඩියැන්ඩ්‍රා ඩොටින් බටහිර ඉන්දීය කොදෙව් දූපත් නියෝජනය කරමින් තරගාවලියට එක්ව තිබේ.

අයබොන්ගො ඛකා සහ සුනේලුස් දකුණු අප්‍රිකාව නියෝජනය කරමින් ද සල්මා ඛාටුන්, ජහනාරා අලාම් බංග්ලාදේශය නියෝජනය කරමින්ද නටකන් චන්ටම් තායිලන්තය නියෝජනය කරමින්ද ලෙයිෆ් කැස්පෙරෙත් නවසීලන්තය නියෝජනය කරමින්ද තරග බිමට පිවිසීමට නියමිතය.

ශ්‍රී ලංකා ජාතික කණ්ඩායමේ වත්මන් නායිකාව ලෙස සිටින චමරි අතපත්තු මෙන්ම ජාතික කණ්ඩායමේ හිටපු නායිකාව වන ශෂිකලා සිරිවර්ධන සිය කණ්ඩායම් වෙනුවෙන් උපරිම ලෙස ක්‍රීඩා කිරීමට බලාපොරොත්තු වන බව සිළුමිණට පැවසුවාය.

1990 වසරේ පෙබරවාරි 09 වැනිදා උපත ලද අතපත්තු මුදියන්සේලාගේ චමරි ජයංගනී කුමාරි ජයසිංහ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් සිය ජීවිතයේ බොහෝ දේ කැප කළ තරුණියකි.

අවුරුදු තිහක් වයසැති චමරි අතපත්තු ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයෙන් ක්‍රිකට් ලෝකය ජය ගැනීමට සමත් වූවාය.

පවුලේ එකම දැරිය වන ඇය ඇයට හැකි සෑම අවස්ථාවකදීම ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් පුහුණු කටයුතුවල නිරත වීමට වගබලා ගත්තාය.

චමරිගේ මෑණියන් වන ඩී.බී. චන්ද්‍රාවතී ඇගේ ක්‍රීඩා දිවියට මහත් ශක්තියක් ලබා දෙයි. දැනට දිවියෙන් සමුගෙන ඇති ඇගේ පියා වන ජයවර්ධන බණ්ඩාර ඇගේ ක්‍රිකට් දිවිය සඳහා කළ කැප කිරීම් පිළිබඳව චමරි සිහිපත් කරනු ලබන්නේ දෑසට කඳුළු නංවමිනි.

අවුරුදු 05 දී ඇය ඉතා හොඳින් ක්‍රිකට් පිත්ත හැසිරවූ වූ බව චමරිට ඇගේ පියා ප්‍රකාශ කර තිබේ. පාසල් වයස් කාණ්ඩවලදී විශේෂිත වූ පහරවල් කරා යෑමට චමරි දක්වා ඇති දක්ෂතාවය නිසාවෙන් ඇයගේ පාසලට ජයග්‍රහණ රැසක්ම එක්කර දීමට ඇය සමත් වූවාය.

චමරි ජාත්‍යන්තර වශයෙන් දක්ෂතාවන් රැසකට ද හිමිකම් කියයි.

ලෝකයේ කාන්තා ක්‍රිකට් ඉතිහාසය තුළ ඉනිමක වැඩිම ලකුණු ප්‍රමාණය ලබා ගනිමින් එහි ලෝක වාර්තාවට හිමිකම් කියනු ලබන්නේ චමරි අතපත්තුය. ඇය එහිදී නොදැවී ලකුණු 178 ලබා ගැනීමට සමත් වූවාය.

ප්‍රබල කාන්තා ක්‍රිකට් කණ්ඩායමක් වන ඕස්ට්‍රේලියානු කණ්ඩායමට එරෙහිව ඇය මෙම දක්ෂතාවය පෙන්වීමට සමත් වීම විශේෂ සිද්ධියකි. 2017 වසරේදී ජුනි 29 වැනිදා ඕස්ට්‍රේලියාවට එරෙහිව බ්‍රිස්බර්න් ක්‍රීඩා පිටියේදී ලකුණු 178 ලබා ගන්නේ ක්‍රීඩාපිටිය සිසාරා හතරේ සහ හයේ පහරවල් රැසක් එක්කරමින්ය. ජාත්‍යන්තර එක්දින තරගවලදී ශතක පහක් ලබා ගැනීමට චමරි සමත් වන අතර ඉන් ශතක තුනක්ම ශ්‍රී ලංකාවෙන් පිටතදී පැවැති තරගවලදී ලබාගෙන තිබේ.

2011 වසරේ අප්‍රේල් 28 අයර්ලන්තයට එරෙහිව ඇය ක්‍රිකට් දිවියේ ප්‍රථම ශතකය ලබා ගනු ලබන්නේ කොළඹ පී. සරණවමුත්තු ක්‍රීඩාපිටියේදීය. එහිදී ඇය ලකුණු 111ක් ලබා ගත්තාය. අනතුරුව 2014 ඔක්තෝබර් 17 වැනිදා දකුණු අප්‍රිකාවට එරෙහිව කොළඹ එස්.ස්.සී. පිටියේදී ලකුණු 106 සහ ඉන්දියාවට එරෙහිව ලකුණු 115 ද නැවත වරක් ඕස්ට්‍රේලියාවට එරෙහිව බ්‍රිස්බර්න්හිදි ලකුණු 103 ලබා ගත්තාය.

ටී 20 ලෝක කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව තුළ ශතක වාර්තා වී ඇත්තේ ඉතා අඩු සංඛ්‍යාවකි. 2019 වසරේ සැප්තැම්බර් 29 වැනිදා ඕස්ට්‍රේලියාවේ සිඩ්නි ක්‍රීඩා පිටියේදී ලකුණු 113 ලබා ගැනීමට මේ දක්ෂ ක්‍රීඩාවට හැකි වන අතර ඕස්ට්‍රේලියානු ක්‍රීඩිකාවන් අතර චමරි ප්‍රසිද්ධව ඇත්තේ ලකුණු මැෂිම යනුවෙනි.

2010 වසරේ සිට 2019 දක්වා ජාත්‍යන්තර එක්දින ක්‍රිකට් තරග 84කට සහභාගි වී ලකුණු 2625 ලබා ගැනීමට සමත් වූ චමරි විස්සයි විස්ස තරග 85 කදී ලකුණු 1646 ලබා ගැනීමට සමත් වන්නේ ප්‍රහාරක වේගය 97.7 වශයෙන් වාර්තා පොතට එක්කරමින්ය. ලෝක ක්‍රිකට් ශ්‍රේණිගත කිරීම්වලට අනුව අංක එකේ ක්‍රීඩිකාව වශයෙන් අවස්ථා ගණනකදී පැමිණි ඇය ලෝක ක්‍රිකට් ශ්‍රේණිගත කිරීම්වලට අංක 1 සිට 10 දක්වා නිරන්තරයෙන් පැමිණ තිබේ.

පිත්තෙන් මෙන්ම පන්දුවෙන් ද දක්ෂ ලෙස ක්‍රීඩා කරන ඇය ජාත්‍යන්තර එක්දින තරගවලදී කඩුලු 23ක්ද ටී 20 තරගවලදී කඩුලු 26ක්ද ලබා ගැනීමට සමත්ව ඇති අතර ලකුණු 31කට කඩුලු 3 ලබා ගැනීම මෙහි කැපී පෙනෙන පන්දු යැවීම වන අතර ඇය පන්දු රැකීමේදී ද සහජ දක්ෂතාවට උරුමකම් කියන්නිය. ක්‍රිකට් ජීවිතය සම්බන්ධව චමරි අතපත්තු සිළුමිණට මෙසේ පැවසුවාය.

“මම අවුරුදු පහේ ඉඳලා ක්‍රිකට් ගහනවා. මගේ මාමා හරි කැමැත්තක් දැක්වූවා මම ක්‍රිකට් ගහනවාට. මගේ තාත්තත් ගොඩාක් කැමතියි ක්‍රිකට්වලට. අම්මාගෙන් ද ලොකු සහයක් මට මේ සඳහා ලැබුණා. පවුලේ එකම ළමයා වුණාට අම්මා තාත්තා දෙන්නම කැමැතිවුණා මම ක්‍රිකට් සෙල්ලම් කරනවාට.” ගොකරැල්ල තමයි මගේ ගම. මගේ මාමා චන්ද්‍රා දිසානායක මුල්ම ක්‍රිකට් ගුරුවරයා බව කිව යුතුයි. ගොකරැල්ල ගමේ පාසලේ මම මුලින්ම ඉගෙන ගත්තේ. ශිෂ්‍යත්වය සමත් වෙනවා. ඒ සමගම ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් වෙනවා. එහිදී ක්‍රිකට් ක්‍රීඩාව තමයි මගේ ජීවිතය බවට පත් වෙන්නේ.

මම අවුරුදු 16 දී ජාතික කණ්ඩායමට ඇතුළත් වෙනවා. ඒ වනවිට මම අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත් වෙලා හිටියේ. මට උසස් පෙළ හදාරන්න වෙන්නේ ක්‍රිකට් ගහන ගමන්. මගේ තාත්තා ඔය අතර ජීවිතයෙන් සමුගන්නවා. මම උසස් පෙළ හදාරා සමත් වෙනවා. හැබැයි ක්‍රිකට් දිගටම කරගෙන යනවා.

කොළඹ කෝල්ස් ක්‍රීඩා සමාජයට තමයි මම ක්‍රීඩා කරන්නට පටන් ගත්තේ. ඒ 2007 වර්ෂයේදී. ඒ වසරේදී අන්තර් ක්‍රීඩා සමාජ අතර තරගාවලියට සම්බන්ධ වෙනවා. අවුරුදු 16 දී මම ජාතික කණ්ඩායමට තේරීපත් වෙනවා.

2009 දී මම ලෝක කුසලානයට සහභාගි වෙනවා. එය එංගලන්තයේදී පැවැත්වුණේ. එහිදී ඉන්දියාව සමග ප්‍රථම තරගයට මම ක්‍රීඩා කරනවා. එතැනින් පසුව එක්දින තරග පිටියට පිවිසීමේ වරම් ලැබීමත් සමග ජාතික කාන්තා කණ්ඩායමේ දිගටම ක්‍රීඩා කළා. වර්තමානයේ එහි නායිකාව වශයෙන් ද ක්‍රීඩා කරනවා. ශ්‍රී ලංකාවේ ක්‍රීඩිකාවක් හැටියට චමරි අතපත්තු බටහිර ඉන්දීය කොදෙව්, එංගලන්තය, ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව, බංග්ලාදේශය යන රටවල්වල පැවැති කාන්තා ටී 20 තරගාවලි සඳහා සහභාගි වී ඇති අතර එහිදී දක්ෂතාවන් රැසක්ම පෙන්වා තිබේ.

මෙම තරගාවලිය සඳහා ඇය සමග පිටත්ව යන ශෂිකලා සිරිවර්ධන කොළඹ නගරය ආසන්නයෙන් ක්‍රිකට් ක්‍රීඩාවට පැමිණ තිබේ. හෙට්ටිමුල්ල අප්පුහාමිලාගේ ශෂිකලා දේදුනු සිරිවර්ධන තිදෙනෙකුගෙන් යුත් පවුලක උපත ලැබීය. අනෝජා සිරිවර්ධන ඇගේ මව වන අතර ඩෙන්සිල් සිරිවර්ධණ පියාය. මදුෂිකා සිරිවර්ධන ඇගේ නැගණිය වන අතර චාමර සිරිවර්ධන සොහොයුරාය. රාජගිරිය ජනාධිපති විද්‍යාලයෙන් ඇය අධ්‍යාපනය ලබන අතර අවුරුදු දහතුනෙන් පහළ කණ්ඩායමේ සිට ප්‍රථම පෙළ දක්වාම කණ්ඩායම් නියෝජනය කරනු ලබන්නේ අවස්ථා ගණනාවකදීම කණ්ඩායමේ නායකත්වය ද දරමින්ය. ඇය පාලින්ක් ඇකඩමිය මගින් මෙලෙස ක්‍රීඩා කර තිබේ.

ඇය ශිෂ්‍යත්ව විභාගය ද සමත් වන අතර අපොස සාමාන්‍ය පෙළ මෙන්ම අපොස උසස් පෙළ ද සමත් වන්නේ ක්‍රිකට් ක්‍රීඩාවට මහත් උනන්දුවක් දක්වන අතරතුරය. එක්දින තරග 100 සීමාව පසුකළ ශ්‍රී ලංකාවේ පළමු කාන්තාව වන ශෂිකලා සිරිවර්ධන සිය ජාත්‍යන්තර ක්‍රිකට් දිවිය 2003 වසරේදී ආරම්භ කරනු ලැබීය. ඇය ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ වෙන්නේ පිට දඟපන්දු යවන්නියක් ලෙසිනි. පාසල් කාලය තුළදී මෙන්ම ජාත්‍යන්තර තලය දක්වා පැමිණෙන්නේ ද පන්දු යවන්නියක් වශයෙනි.

පන්දු යැවීමට අමතරව ඇයට තිබෙන දක්ෂතාව වන්නේ අංක එකේ සිට අංක 10 දක්වා පිතිකාරියක වශයෙන් ඕනෑම ස්ථානයක ක්‍රීඩා කිරීමේ හැකියාවයි. පන්දු යැවීමේ නිරතව සිටි තරගවලදී පිතිකරුවෙකු බවට පත්වෙමින් අංක 03, 05, 07 ස්ථානවල ක්‍රීඩා කර ලකුණු 30 සිට 50 දක්වා ඇය ලබා ගනු ලබන්නේ පන්දු යවන්නාට රිසි සේ ප්‍රහාර එල්ල කරමින්ය.

ජාත්‍යන්තර එක්දින තරග 113 කට සහභාගි වෙමින් පන්දු වාර 908.1 පන්දුවකදී ලකුණු 3577කට කඩුලු 124 ලබා ගැනීමට ඇය සමත් වූවාය. එහිදී කඩුලු තුන බැගින් අවස්ථා අටකදී ලබාගෙන තිබේ. විස්සයි විස්ස තරග 78 කට සහභාගි වෙමින් පන්දු වාර 275.3 කදී ලකුණු 1598කට කඩුලු 77 ලබා ගැනීමද කැපී පෙනෙන සිද්ධියකි. ඇය ටී 20 තරගවලදී කඩුලු තුන බැගින් තුන් වරක් ලබාගෙන තිබේ.

පිත්තෙන් දක්ෂතාවයන් දැක්වූ ඇය ජාත්‍යන්තර එක්දින තරග 118 කදී ලකුණු 2029 ලබා ගැනීමට සමත්ව ඇත්තේ අර්ධ ශතක 7ක්ද ඊට එක්කරමිනි.

විස්සයි විස්ස ජාත්‍යන්තර තරග 81 කදී ලකුණු 1097 ලබාගෙන ඇත්තේ අර්ධ ශතක දෙකක් ද ඊට එක්කරමින්ය.

තම ක්‍රිකට් දිවිය පිළිබඳව ශෂිකලා සිය අත්දැකීම් මෙසේ විස්තර කළාය.

“කොළඹ කොටිකාවත්ත තමයි මගේ ගම. ජනාධිපති විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබුවා. ඇත්තටම මගේ අයියත් එක්ක ඉඩ ලැබුණු සෑම අවස්ථාවකදීම ගෙදර ඉදිරිපිට පාරේ ක්‍රිකට් ක්‍රීඩා කළා.

“පාලින්ක්ස්පොට් ක්ලබ්” කියලා පාලිත සර්ගේ ක්‍රීඩා සමාජයේ මුලින්ම ක්‍රීඩා කළා. අවුරුදු දහතුනේදී මම ලෙදර් බෝල ක්‍රීඩා කරන්න තරම් වාසනාවන්ත වුණා.

පාලිත ගුණසේකර තමයි අපගේ ගුරුවරයා. කොළඹ මැලේ ක්‍රීඩාපිටියේ අපි ක්‍රීඩා කළේ. ඇත්තටම ඒක ක්‍රිකට් ඇකඩමියක්. මම අවුරුදු අටක් විතර එහි පුහුණුවීම් කළා.

ඇත්තටම පාසලේ මුලින් ක්‍රිකට් තිබුණේ නැහැ. අපි ඇකඩමියෙන් තමයි වයස් කාණ්ඩවලින් ක්‍රිකට් ආරම්භ කළේ. මේ අතර 2002 මම ජාතික කණ්ඩායමට තේරෙනවා. 2003 මුල්ම තරගය ක්‍රීඩා කරනවා. ප්‍රථම සංචාරය බටහිර ඉන්දීය කොදෙව් වලට තමයි යන්නේ. එහිදී මම ලකුණු 23 කඩුලු 3 ලබා ගන්නවා. ඊට අමතරව ලකුණු 27ක්ද ලබා ගන්නේ කණ්ඩායමට ජයග්‍රහණ ලබා දෙමින්. එතැන් සිට ගිය වසර දක්වාම ජාතික කණ්ඩායම නියෝජනය කරනවා.

එහි නායකත්වයත් මා දරනවා. දැනට මම ශ්‍රී ලංකා නාවික හමුදා ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරනවා. ඒ සඳහා නාවික හමුදාව විශාල සහයෝගයක් ලබා දෙනවා. වර්තමානයේ මගේ ක්‍රීඩාවට මගේ සැමියා නාමල් සෙනවිරත්න ලොකු සහයෝගයක් ලබා දෙනවා.”

මේ ක්‍රීඩිකාවන් දෙදෙනා දහසක් ගැටලු මැද තමන්ගේ ඉලක්කය කරා ගමන් කරනු ලබන්නේ අධ්‍යාපනය නිසි අයුරින් ලබා ගන්නා ගමන්ය.

මෙරට අධ්‍යාපනය තුළ තිබෙන ජයග්‍රහණ සියල්ල ලබාගෙන ඇති ක්‍රීඩිකාවන් දෙදෙනා වර්තමාන සමාජයට ලොකු පණිවුඩයක් ලබාදෙයි.

අයි.පී.එල්. තරග මාලාවේදී අප රට නියෝජනය කරන චමරි සහ ශෂිකලාට උපරිම දක්ෂතාව දැක්වීමට හැකි වේවායි අප ලක්වැසියන් සියලු දෙනා ප්‍රාර්ථනා කරන්නෙමු.

ජයාරූප ඉෂාර කොඩිකාර

### තරග කාලසටහන
**ශ්‍රී ලංකා වේලාවෙන්**

- **නොවැම්බර් 04** - පළමු තරගය
  **සුපර්නෝවා සහ වෙලෝසිටි (ප.ව. 7.30)**
- **නොවැම්බර් 05** - දෙවැනි තරගය
  **වෙලෝසිටි සහ ට්‍රේරල්බ්ලේසර් (ප.ව. 3.30)**
- **නොවැම්බර් 07** - තෙවැනි තරගය
  **ට්‍රේරල්බ්ලේසර් සහ සුපර්නෝවා (ප.ව. 7.30)**
- **නොවැම්බර් 09** - සිවුවැනි තරගය
  **අවසන් මහ තරගය (ප.ව. 7.30)**



### තරගාවලියට සහභාගි වන කණ්ඩායම් සහ ක්‍රීඩිකාවන්

**හර්න්ජිත් කෞර් (නායිකා), ජේමිමා රොඩ්‍රිගස් (උපනායිකා), චමරි අතපත්තු, ප්‍රියා පූනියා, අනුජා පටිල්, රාධා යාදව්, ටානියා භාතියා (කඩුලු රකින්නිය), ශෂිකලා සිරිවර්ධන, පූනම් යාදව්, ශකෙරා සෙල්මන්, අරුන්දති රෙඩ්ඩි, පූජා වස්ත්‍රාකර්, අයුෂි සෝනි, අයුබෝන්ගා කාකා, මුස්කාන් මලික්, ට්‍රේල් බ්ලේසර්ස්**

**ස්මිරිනි මන්දනා (නායිකා) දීප්ති ෂර්මා (උපනායිකා), පූනම් රාවට්, රිචා ගෝෂ්, ඞී. හේමලතා, නුෂාට් පර්වින් (කඩුලු රකින්නිය), රාජේශ්වර් ගයික්වාඩ්, හර්ලින් ඩියෝල්, පූලන් ගෝස්වාමි, සිමරන් දිල් බහදූර්, සල්මා කටුන්, සොෆී එක්ලස්ටෝන්, නටක්කන් චැන්ටම්, ඩියැන්ඩ්‍රා ඩොටින්, කශ්වි ගෞතම් වෙලොසිටි**

**මිතාලි රාජ් (නායිකා) වේද ක්‍රිෂ්ණමූර්ති (උපනායිකා), ෂෆාලි වර්මා, සුෂ්මා වර්මා (කඩුලු රකින්නිය), එක්ටා බිෂ්ට්, මාන්සි ජෝෂි, ශිඛා පාණ්ඩේ, දේවිකා, වෛද්‍යා, සූෂ්රී ඩිබියදර්ෂිනි, මනාලි දක්ෂිනි, ලී කැස්පරක්, ඩැනී වියාට්, පූනේ ලුෂ්, ජනනාරා අලාම්, එම් අනගා**



පිටුව 18
ලිංගික ශ්‍රමය ගැන ආන්දෝලනාත්මක නඩු තීන්දුවක්



පිටුව 23
පාස්කු කඳුළු කොල්ල කෑ ගැහැනිය

පිටුව 24
උඩරට කැරැල්ල ගැන සැඟවුණු තොරතුරු





ඉකුත් දශක පහක් ඇතුළත ජවිපෙ කැරලි දෙකකට නායකත්වය දුන්නේය. ප්‍රථම කැරැල්ල 1971 අප්‍රේල් දියත් වූ අතර එහිදී ඝාතනයට ලක් වූ සංඛ්‍යාව 5,000කට ආසන්නය. ජවිපෙ 2වැනි කැරැල්ල 1986න් ඇරඹී 1990 න් අවසන් වූ අතර එහිදී 60,000කට අධික පිරිසක් ඝාතනයට ලක් විය. සිළුමිණ අදින් අරඹන මේ ලිපි මාලාව එම කැරලි දෙක ඇතුළත ජවිපෙ නායකත්වයේ දෘෂ්ටිමය මඟ පෙන්වීමකට යටත්ව, එහි ප්‍රායෝගිකත්වය ක්‍රියාවට නැඟූ කැරලි නායකයන්ගේ සත්‍ය කතාවයි.

# පුද්ගල ත්‍රස්තවාදය ප්‍රතික්ෂේප කළ සොඳුරු ආශ්‍රාදායකයා

# ශාන්ත බණ්ඩාර



ජවිපෙ 2වැනි කැරැල්ලේ නියමුවෙකු වූ ශාන්ත බණ්ඩාර ගේ ජීවිතයේ විවිධ අවස්ථාවන්

## අඳුර විනිවිද පහන් තරුවක යටගියාව - 01



● ධර්මන් වික්‍රමරත්න

**ශාන්ත බණ්ඩාර යනු වසර 1986 සිට 89 දක්වා පැවැති 60, 000ක් ඝාතනය වූ ජවිපෙ 2වැනි කැරැල්ලට නායකත්වය දුන් නියැමුවෙකි. ඔහු උපන්නේ කෑගල්ලේදීය; ඒ 1954 සැප්තැම්බර් 03 වැනිදාය. උදය ජගත් ශාන්තදේව හෙළකුමාර සෙනෙවිරත්න හෙවත් ශාන්ත බණ්ඩාර ගේ පියා වූයේ වග සෙනරත් ලයනල් බර්නාඩ් සෙනෙවිරත්නය. කලක් විදුහල්පතිවරයකු වශයෙන් සේවය කළ ශාන්ත ගේ පියා නොතාරිස්වරයකු ද විය. මව එස්තර් ගොඩකුඹුර මිශ්‍ර පාසැලකට පත්වූ ප්‍රථම විදුහල්පතිනිය විය. එම දෙපළට දරුවන් 5 දෙනකු වූ අතර ඔවුහු පිළිවලින් ක්‍රිස්ටෝපර්, ශාන්ත, චන්ද්‍රිකා, අනුර සහ ශ්‍රීපාලි වේ. දෙමාපියන් 1988 තෙක් පදිංචිව සිටියේ පිටකෝට්ටේ සීවලී සෙවණ 539/2 (විජේසිංහ උද්‍යානය ලෙස 2020 දී හැඳින්වෙන) ස්ථානයේය. ශාන්ත ගේ සොයුරු සොහොයුරියන් ඕස්ට්‍රේලියාවේ සහ කැනඩාවේ 2020 වනවිට පදිංචි ය. ලියුම්කරු ශාන්ත හඳුනාගත්තේ 1978දීය.**

ශාන්ත බණ්ඩාර ප්‍රාථමික අධ්‍යාපනය හැදෑරුවේ කෑගල්ලේ අලපලාවල කණිෂ්ඨ විද්‍යාලයෙනි. පසුව මහනුවර ත්‍රිත්ව පාසැලෙන් අධ්‍යාපනය ලබා මාතලේ විද්‍යා විද්‍යාලයට ඇතුළත් වූයේ 1968දීය. ශාන්ත ජවිපෙට එක්වූයේ 1971 අප්‍රේල් කැරැල්ලට මාස කිහිපයකට පෙරය. ඔහුට ජවිපෙ කොක්ක ගැසුවේ විද්‍යා විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සිසු නාගොල්ලේ තිස්ස මානංගොඩය. මාතලේ මුවගල දී ජවිපෙ එම පන්ති පැවැත්වූයේ පසුකාලීනව ආයුර්වේද වෛද්‍යවරයකු වූ කපුකොටුවය.

කොළඹ ආනන්ද විද්‍යාලයෙන් අපොස උසස් පෙළ 1974 දී සමත් වූ ශාන්ත විද්‍යාවේ දී උපාධිය හැදෑරීම සඳහා පේරාදෙණිය සරසවියට 1975 දී ඇතුළත් විය. සමගි පෙරමුණු ආණ්ඩු කාලයේ 1976 නොවැම්බර් මස 12 පේරාදෙණිය සරසවියේ සිදුවූ වීරසූරිය ශිෂ්‍ය ඝාතනයට එරෙහිව රටපුරා ශිෂ්‍ය උද්ඝෝෂණවලට පේරාදෙණියේ සිසු ක්‍රියාකාරීන් සමඟ ශාන්ත නායකත්වය දුන්නේය.

ශාන්ත බණ්ඩාර පේරාදෙණිය සරසවියේ සිටි මුල් කාලයේ දී සමාජ අධ්‍යයන කවයේ සාකච්ඡාවලට ද ක්‍රියාකාරීව සහභාගි විය. එම සාකච්ඡාවලට සහභාගි වූ සිසු නායකයන් අතර පසු කලෙක ප්‍රකට චරිත වූ මහාචාර්ය ගාමිණී සමරනායක, වෛද්‍ය රාජා විජේතුංග, ආචාර්ය සුනිල් ජයතිලක හෙවත් කේ. කේ, දෙටු ප්‍රවීණ මාධ්‍යවේ දී සුගත් වටගෙදර, ආචාර්ය දයාන් ජයතිලක, මැතිවරණ කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රිය, විශ්වාලිංගම් විශ්වානන්ද, අමාත්‍යාංශ ලේකම්වරයකු වූ අශෝක පීරිස්, ආචාර්ය ජයන්ත සේනාධීර, මහ බැංකුවේ ආචාර්ය ඩබ්ලිව්. එම් කරුණාරත්න ඇතුළු කිහිපදෙනෙක්ම විය.

පසුව විද්‍යාපීඨ ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා ලෙස නිලවරණයෙන් ශාන්ත නිතරගයෙන් පත්විය. ඒ 1977 අප්‍රේල් 06 වැනිදාය. විද්‍යා පීඨ උප ලේකම් ලෙස ජයන්ත පතිරණද නිතරගයෙන් පත්විය. කලා පීඨයේ නිලවරණයෙන් දෙගුණයටත් වඩා වැඩි ඡන්ද ලබාගනිමින් එහි සභාපති වූයේ විලච්චියේ කේ. එච්. චන්ද්‍රපාලය. සරසවි ශිෂ්‍ය සංගම් ඉතිහාසයේ ජවිපෙ සමාජවාදී ශිෂ්‍ය සංගමයෙන් ප්‍රථම වරට පත්වූ නිල නියෝජිතයන් තිදෙනා ඔවුහු ය. වසර 1977 මැයි පේරාදෙණිය මහා ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වූයේ ද ශාන්ත බණ්ඩාරය.

එජාප රජයේ 1978 පෙබරවාරි 04 සම්මත කරගත් නව ව්‍යවස්ථාවට එරෙහිව විරෝධය දැක්වූ නව සමසමාජ පක්ෂයේ ශිෂ්‍ය ක්‍රියාකාරි ලලිත් අබේසිංහ ගේ ශිෂ්‍යභාවය අවලංගු කිරීම සහ ඉංජිනේරු පීඨයේ කථිකාචාර්ය ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න ගේ වැඩ තහනම වහාම අත්හිටුවන ලෙස ඉල්ලමින්ද සහ තවත් පොදු ඉල්ලීම් 12 මුල් කරගෙන පේරාදෙණිය සරසවියේ සිසුහු එහි මහා ශිෂ්‍ය සංගමයේ නායකත්වයෙන් 1978 මාර්තු 02 සිට 09 දක්වා අඛණ්ඩ පන්ති වර්ජනයක් පවත්වන ලදී. එමෙන්ම 1978 මර්තු 09 සවස 2ට මහා ශිෂ්‍ය සංගමයේ මෙහෙයවීමෙන් බෝගම්බර දී කම්කරු- ශිෂ්‍ය රැලියක්ද පවත්වන ලදී. එම සිසු විරෝධතාවලට නායකත්වය දුන් බව කියමින් සිසුන් 8ක ගේ ශිෂ්‍යභාවය පේරාදෙණිය උප කුලපති බී. එල්. පණ්ඩිතරත්න විසින් අහෝසි කරන ලදී.

එසේ ශිෂ්‍යභාවය අහෝසි වූ 8 දෙනා වූයේ ජවිපෙ සමාජවාදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරීන් වූ කේ. එච්. චන්ද්‍රපාල, ශාන්ත බණ්ඩාර, බෝධිදාස සහ රිචඩ් පෙරේරාද කොමියුනිස්ට් පක්ෂයේ ලංකා ජාතික ශිෂ්‍ය සංගමයේ සුනිල් ශාන්ත කෝරලගේ, ප්‍රියංක ධීරසිංහ, නිශ්ශංක කුමාරවංශ සහ සුනිල් රාජකුමාර රත්න සභාපතිය. ජවිපෙ ශිෂ්‍ය ක්‍රියාකාරීන් වූ චන්ද්‍රපාල, ශාන්ත සහ බෝධිදාස පූර්ණකාලීන දේශපාලනය සඳහා ජවිපෙට එක්විය. ශිෂ්‍යභාවය අහෝසිවීමෙන් පසු කොමියුනිස්ට් පක්ෂයේ ශිෂ්‍ය ක්‍රියාකාරීන් සිව්දෙනා ගෙන් තිදෙනෙක් එම පක්ෂයේ අනුග්‍රහය යටතේ වැඩිදුර අධ්‍යාපනය සඳහා රුසියාවේ සරසවිවලට ශිෂ්‍යත්ව මගින් යොමු කළහ. සුනිල් රාජකුමාර රත්නසභාපති ශිෂ්‍යභාවය අහෝසිවීමෙන් පසු ඇතිවූ මානසික වියවුල් හේතු කොටගෙන පසුව මානසික රෝගියෙක් වී 2014 දී මිය යන තෙක්ම ප්‍රතිකාරවලට ලක්විය.

ජවිපෙ ගම්පහ දිස්ත්‍රික් ලේකම්වරයෙක් ලෙස 1980 පත් වූ ශාන්ත බණ්ඩාර සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රථම මහා සමුළුව 1981 පෙබරවාරි 25 සහ 26 පැවැත්වීමේ දී එහි ප්‍රධාන ලේකම් විය. එමෙන්ම ජවිපෙ රතු ගැටව් සංවිධානය 1980 දෙසැම්බර් 31 සහ 1981 ජනවාරි 01 පිහිටුවීමේ දී එහි නියෝජ්‍ය ලේකම්වරයා වූයේද ඔහුය. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ 1978/79 දක්වා කැඳවුම්කරු ලෙස කටයුතු කළ හෙතෙම කොළඹ දිස්ත්‍රික් සංවර්ධන සභාවට ජවිපෙ වෙනුවෙන් තරඟකර 1981 ජූනි 04 මන්ත්‍රීවරයකු විය. ශාන්ත බණ්ඩාර හැඳින්වූ වෙනත් නම් වූයේ උපාලි, තිස්ස, ඒකනායක මුදියන්සේලාගේ තිලක් ඒකනායක, මහානාම සහ ලලිත් වැලිකලය.

එක්සත් ජාතික පක්ෂ මූලස්ථානය වන පිටකෝට්ටේ පිහිටි සිරිකොත ඉඩමේ එකළ හිමිකරු වූයේ ලියනගේ ය. අක්කර 2ක් පමණ එම ඉඩමේ මුරකරු ජයසේන පෙරේරාය. වසර 1979 දී එම ඉඩම පර්චර්ස් 10 කැබැලිවලට කඩා බොරැල්ලේ සමාගමක් මගින් වෙන්දේසි කරන ලදී. ජවිපෙ මූලස්ථානය එහි ඉදිකිරීමට එම පක්ෂය තීරණය කළ අතර, ඒ සඳහා එම ඉඩමේ එක ළඟ කොටස් 4ක් වෙන්දේසියේ දී ගන්නා ලදී. මින් කොටස් 2ක් ජවිපෙ වෙනුවෙන් මිල දී ගැනීමට මැදිහත් වූයේ ශාන්ත ගේ පියා වන සෙනෙවිරත්නය. අනෙක් කොටස් 2ක මිල දී ගත්තේ ජවිපෙ හිතවතුන් 2කි. සෙසු කොටස් පිටකෝට්ටේ වෙළඳ ව්‍යාපාරික රාණි ඇතුළු පිරිසක් විසින් මිල දී ගත්හ. ජවිපෙ මූලස්ථානය තැනීම සඳහා එම ඉඩමේ කොටස් 4 මිල දී ගැනීම දැනගත් එජාප ආණ්ඩුව සිදු කළේ ඉඩම ගැසට් කර රජයට පවරා ගැනීමය. පසුව ඉඩම් කොටස් මිල දී ගත් අයට 1983 රජයේ තක්සේරු වටිනාකම අනුව වන්දි මුදලක් ලබා දෙන ලදී. අනතුරුව එම මුළු ඉඩමම රජයට පවරා ගෙන එජාප මූලස්ථානය වූ සිරිකොත එහි ඉදිකර 1985 මැයි 29 විවෘත කරන ලදී.

ශාන්තගේ බිරිය වූයේ මීරිගම ඇලපිලියාවේ උපන් අමරනායකගේ ඉන්දුමතී කාන්තිරත්නය. දෙදෙනා ගේ අතිනත ගැනීම වෙනුවෙන් 1982 දෙසැම්බර් 03 සිකුරාදා පෙරවරුවේ දී කොළඹ බෞද්ධාලෝක මාවතේ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන ශාලාවේ දී මංගල උත්සවයක්ද පැවැත්විණි. ලංකා බැංකුවේ ලිපිකාරිනියක් වූ ඉන්දු මොරටුව, බේරුවල සහ නාරාහේන්පිට ශාඛාවන්හි කලක් සේවය කළාය. දුවරුන් 5 යුත් පවුලක වැඩිමලා ඉන්දු වූවාය. පියා අමරනායකගේ මිගෙල්ය.

ජවිපෙ මධ්‍යම කාරක සභාවට 1982 දී ද, පක්ෂ තහනමින් පසු 1984 අග භාගයේ දී දේශපාලන මණ්ඩලයටද පත්වූ ශාන්ත 2වැනි කැරැල්ලේ දී බදුල්ල, මොණරාගල සහ අම්පාර දිස්ත්‍රික්ක ඇතුළත් ඌව නැගෙනහිර කලාපයේ නායකයා විය. පසුව තරුණ අංශයේ සහ ප්‍රචාරක අංශයේ ද නායකයා විය. ජවිපෙ 2වැනි කැරැල්ලේ දී එනම් 1986 සිට 1990 දක්වා ආරක්ෂක හමුදා අත්අඩංගුවට පත්ව දෙවරක් ජීවිතය බේරාගත් ජවිපෙ එකම ඉහළම නායකයාය. ඒ 1987 සැප්තැම්බර් අඟුරුවාතොට දී සහ 1988 මැයි 20 තංගල්ලේදීය. අඟුරුවාතොට දී අත්අඩංගුවට ගත් ශාන්ත හඳුනා ගැනීම සඳහා ටොරින්ටන්හි ජාතික බුද්ධි කාර්යාංශයට ගෙන ආ අතර එහි දී ඔහු හඳුනා ගැනීමට පොලිස් අධිකාරි ලකී ජයවර්ධන සමත් විය. පොලිසියේ රඳවා සිටිය දී තමාගේ දෑතේ තිබුණු මාංචුව අතින් ගලවා ගනිමින් පොලිසියට ආ අමුත්තකු විලසින් පිටව යෑමට ඔහු සමත් විය.

වම් නිකටේ උපන් ලපයක් ඇති ශාන්ත බණ්ඩාර ගේ උස අඩි 5 අගල් 2කි. මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්මික නිලධාරියකු ලෙස හැඳුනුම්පතකින් පෙනී සිටි ශාන්ත කලක් පරිහරණය කළේ 16 ශ්‍රී 5255 දරන සුදු පැහැති නිසාන් මෝටර් රථයක් සහ දුඹුරු පැහැති 12 ශ්‍රී 7400 ඩැට්සන් සනී මෝටර් රථයන්ය.

ශාන්ත බණ්ඩාර 1987 පෙබරවාරි සිට 1988 මැයි දක්වා දකුණු පළාතේ දේශපාලන ක්‍රියාකාරකම් සඳහා නැවතී සිටියේ බෙලිඅත්ත ආසනයේ නාකුළුගම 'ජිනසිරි' නිවසේ පදිංචිකරුවෙක් ලෙසය. ශාන්ත ඔහුගේ සමීපතම මිත්‍රයෙකි. තංගල්ලට යෑම සඳහා 1988 ජූලි 20 පෙරවරු 11.20ට පමණ ජවිපෙ ක්‍රියාකාරිකයකු වූ බෙලිඅත්තේ ගුරුවරයකු වූ සරම්බු හේවාගේ රුවන් හෙවත් රූපරත්න සමඟ පාපැදියකින් කුඩාවැල්ල හන්දියේ බස්නැවතුම්පොළට ගොස් බසයක් එනතුරු කතා කරමින් සිටිය දී රුවන් සමඟින් ශාන්තව තංගල්ල පොලිසිය මගින් අත්අඩංගුවට ගනු ලැබීය. ඒ, ජවිපෙ අරමුදල් තරකිරීම සඳහා වැටුප් මංකොල්ලයකට සැකපිට රුවන් තංගල්ල පොලිසියෙන් සොයමින් සිටි අයකු බැවිනි. රුවන්ව හඳුනාගත් තංගල්ල පොලිසියේ සැරයන් රාජා විසින් පොලිස් වාහනය නවතා රුවන් සහ ශාන්ත තංගල්ල පොලිසියට ගෙන එන ලදී. ජාතික ඔත්තු සේවයේ සහකාර පොලිස් අධිකාරිවරයකු විසින් පසුව ශාන්තව හඳුනාගනු ලැබීය. තංගල්ල පොලිසියෙන් ඔවුන් පසුව මොරයාය විශේෂ කාර්ය බළකා කඳවුරට වැඩිදුර විමර්ශන සඳහා බාරදෙන ලදී. ශාන්ත පසුව වැලිසර නාවික හමුදා කඳවුරේ රඳවා තබාගන්නා ලදී. වැලිසර කඳවුරේ අඳුරු කුටි 21ක ජවිපෙ කැරලිකරුවන් සියයකට ආසන්න පිරිසක් රඳවාගෙන සිටි අතර ශාන්ත ඔවුන්ගෙන් වෙන්කර වෙනම කුටියක තබන ලදී.

රුවන් හෙවත් රූපරත්නද වැලිසර කඳවුරට ගෙනවිත් පසුව කළුතර පැලවත්ත රැඳවුම් කඳවුරට යොමු කළ අතර එහි දී 1988 ඔක්තෝබර් 29 කඳවුරින් පළා ගිය ජවිපෙ කැරලිකරුවන් 110 දෙනා අතර ඔහු ද විය. පසු කලෙක රුවන් මාමඩල විදුහලේ විදුහල්පතිවරයකු විය. ශාන්තට නවාතැන් ලබා දුන් තිදරු පියකු වූ ප්‍රේමතිලක කහදාගොඩද ආරක්ෂක අංශ මගින් 1989 නොවැම්බර් 20 නාකුළුගමුවේ දී අත්අඩංගුවට ගත් අතර නිදහස් කරන ලද්දේ 1990 ඔක්තෝබර් 07ය.

අත්අඩංගුවට ගත් ශාන්ත නිදහස් කරගැනීම සඳහා ජවිපෙ ආණ්ඩුවේ සබඳතා උපයෝගි කරගනිමින් ක්ෂණික මෙහෙයුමක් දියත් කළේය. රෝහණ විජේවීරගේ ඉල්ලීමක් මත ශාන්ත නිදහස් කරගැනීම සඳහා තංගල්ලේ බෙනට් සිරිසේනට මැදිහත් වන්නැයි ඉල්ලීමක් කෙරිණි. තංගල්ල පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන එහි රඳවා සිටි ශාන්ත බණ්ඩාරව නිදහස් කරගැනීම සඳහා මැදිහත්වන ලෙසට රෝහණ විජේවීර ගේ පණිවිඩයක් රැගෙන ආනන්ද විජේවීර තංගල්ලේ බෙනට් සිරිසේන හමුවිය. ඒ අනුව පොලිසියේ ඉහළ නිලධාරියෙක් මගින් ශාන්ත නිදහස් කිරීමට උත්සාහ ගත් අතර, ඒ සඳහා ඔහු රුපියල් 50, 000ක මුදලක් ඉල්ලා සිටි බව කියති. බෙනට් සිරිසේනට අයත් පර්චස් 20 ඉඩම් කැබලි තුනක් තංගල්ල ටවුම සහ කඳුරුපොකුණ අතර ප්‍රදේශයේ තිබුණි. එම කොටස් තුන රුපියල් 90, 000කට ව්‍යාපාරිකයකුට දෙදිනක් ඇතුළත විකුණන ලදී. එම මුදලින් රුපියල් 50, 000ක් 'අදාළ ලොක්කාට' ලබා දුණි. 'ලොක්කා' විසින් සැලසුම සකස් කර තිබුණේ ශාන්ත බණ්ඩාර අත්අඩංගුවෙන් මි දී හොර රහසේ පලා යෑමක් ලෙසට හැඟවෙන පරිදිය. එහෙත් පසුදින අලුයම අනපේක්ෂිත ලෙස කොළඹින් පැමිණි පොලිස් කණ්ඩායමක් විසින් ශාන්තව මොරයාය එස්. ටී. එෆ් කඳවුරට ගෙන යන ලදී. එම සැලැස්ම අසාර්ථක වූ අතර මුදල්ද ආපසු නොලැබිණි. එවකට තංගල්ල පොලිස් අධිකාරිව සිටියේ කරවිටගේ ධර්මදාසය.

තංගරාජා සමඟින් පැමිණි ගමනායක ලියුම්කරුට කියා සිටියේ ශාන්ත නිදහස් කරගැනීම සඳහා සම්බන්ධීකරණයක් ගොඩනගා මැදිහත් වන ලෙසටය.

සාකච්ඡා සාර්ථක විය. පසුව ජනාධිපති ජයවර්ධනගේ පුත්‍රයා සමඟ හර්මන් ගුනරත්න ඇතිකරගත් එකඟතාවක් මත 1988 සැප්තැම්බර් 07 ශාන්ත වෝඩ් පෙදෙසේ ජනාධිපති ජයවර්ධන ගේ නිවෙසට රැගෙන විත් තිබිණි. ජවිපෙට සාමකාමීව විසඳුමකට එන ලෙස ජනාධිපතිවරයා ශාන්ත ගෙන් ඉල්ලා සිටියේය. ප්‍රජාතන්ත්‍රවාදීව ඡන්දයක් පවත්වන ලෙසට ශාන්ත බණ්ඩාර සිනාමුසුව එයට ප්‍රතිචාර දැක්වීය. පසුව නිදහස් කරන ලද ශාන්ත බණ්ඩාර කෝට්ටේ නිවසට පැමිණි ශාන්ත යළි භූගත දේශපාලනයට යොමු විය.

විජේවීර ඝාතනයෙන් පසු පොලිස් මූලස්ථානය 1989 නොවැම්බර් 28 නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ ශාන්ත බණ්ඩාර, සමන් පියසිරි, ගාමිණී ගුණසේකර, උපාලි ජයවීර, සෝමවංශ අමරසිංහ යන ජවිපෙ 5 දෙනා අත්අඩංගුවට ගැනීමට අවශ්‍යම පුද්ගලයන් බැවින් ඔවුන් පිළිබඳව තොරතුරු සපයන්නන්ට තෑගි පිරිනමන බවය.

ජවිපෙ යළි ගොඩනැගීම සඳහා ශාන්ත බණ්ඩාර කැපවීමෙන් කටයුතු කළේය. නායකත්වය සඳහා දේශපාලන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨයා තමා වුවද සමන් පියසිරි ගේ නායකත්වය පිළිගනිමින් අනුමැතිය පළ කළේය. රත්නපුර හිදැල්ලන දී 1989 නොවැම්බර් 28 පැවැති ජවිපෙ දේශපාලන මණ්ඩල රැස්වීමට සහභාගිවීමට ශාන්තට නොහැකි වූවද 1989 දෙසැම්බර් 07 එම ස්ථානයේදීම පැවැති දේශපාලන මණ්ඩල රැස්වීමට ඔහු සහභාගී විය. නව නායක සමන් පියසිරි 1989 දෙසැම්බර් 27 අත්අඩංගුවට ගැනීමෙන් පසු ජවිපෙ ඊළඟ නායකයා ලෙස ලලිත් විජේරත්න නම් කිරීමට තීරණය කළේ 1989 දෙසැම්බර් 29 නුවරඑළියේ නානුඔය දී පැවැති රැස්වීමේදීය. එයටද ශාන්ත බණ්ඩාර සහභාගි විය.



**ශාන්ත නිදහස් කර ගැනීමට හර්මන්ගේ ඉල්ලීමට මැදිහත් වී වැලිසර නාවික කඳවුරට ගොස් සාකච්ඡා කළ ශාන්තගේ සීයාගේ සොහොයුරියගේ පුත්‍රයා වූ රාගම කල්වාරි දේවස්ථානයේ දේවගැති ලසන්ත ගොඩකුඹුර, ශාන්ත අත්අඩංගුවට ගැනීමේ සිදුවීම් මාලාව සියසින් දුටු රත්නපුර දිස්ත්‍රික් ජවිපෙ සන්නද්ධ ලේකම් වශයෙන් වික්ටර්ට පසුව කටයුතු කළ කොළඹගේ ආරච්චිගේ පර්සි වීරසිංහ හෙවත් ඉලුක්කුඹුර, කලවාන නවිතිගල කලාපයේ ජවිපෙ සන්නද්ධ නායක ඩී. එම්. ගුණරත්න හෙවත් සුගත්ද, ඝාතනය වීමට පෙර ශාන්තගේ අවසන් පණිවිඩය ආරක්ෂක නිලධාරියෙක් විසින් දැනුම් දුන් එවකට බලංගොඩ බුලත්ගම හමුදා කඳවුරේ රඳවාගෙන සිටි බලංගොඩ කලාපයේ ජවිපෙ සන්නද්ධ නායක වීරරත්න අලුත්වත්ත හෙවත් සමන්ද, ශාන්ත අත්අඩංගුවට ගත් කණ්ඩායමේ නායකයකු වන කපිතාන් නිහාල් ශ්‍රීසාන්තද මෙහි වමේ සිටය.**

මත්තේගොඩ කඳවුරේ රඳවාගෙන සිටි බද්දේගම තෙලිකඩ උපන් පල්ලියගුරුගේ සුමිත් හෙවත් වික්ටර් රත්නපුරේ දිස්ත්‍රික් සන්නද්ධ නායකයකු ලෙස නියමාකාරයෙන් හඳුනා ගැනීමට ක්ෂණික විහිදුම් බලකාය 1989 ජනවාරි 01 දහවල් සමත් විය. එයට දිනකට පෙර රත්නපුරේ දී අත්අඩංගුවට ගත් ලලිත් විජේරත්නද මත්තේගොඩට ගෙනවිත් තිබිණි. ශාන්ත බණ්ඩාර සිටින රත්නපුර ස්ථානයන් නිශ්චිතව දන්නා පුද්ගලයා වික්ටර් බව ආරක්ෂක අංශ තහවුරු කරගෙන තිබිණි. දිවා ආහාරයෙන් පසු වික්ටර් සහ රත්නපුරේ තවත් කැරලිකරුවන් දෙදෙනකු සමඟ රත්නපුරයට යෑමට කටයුතු කරන ලෙස අණ දෙන නිලධාරි කර්නල් ජානක පෙරේරා අදාළ නිලධාරින්ට උපදෙස් දුන්නේය.

ඒ අනුව 1989 ජනවාරි 01 පස්වරු 3ට කපිතාන් නිහාල් සිරිශාන්ත ගේ නායකත්වයෙන් හමුදා භට කණ්ඩායමක් වාහන 2කින් මත්තේගොඩ සිට රත්නපුරය බලා පිටත් විය. එක් රථයක් වූයේ රෝහණ විජේවීර අත්අඩංගුවට ගැනීමෙන් පසු අත්පත් කරගත් චිත්‍රාංගනී විජේවීර ගේ ව්‍යාජ නම වූ ප්‍රියන්ති සමරකෝන් නමට ලියාපදිංචි කරන ලද 15 ශ්‍රී 7920 මිට්ෂුබිෂි ලාන්සර් මෝටර් රථය වේ.

ශාන්ත අවසාන කාලයේ රත්නපුර දිස්ත්‍රික්කයේ සැඟවී සිටියේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවය කළ රත්නපුර රෝහල අසල පදිංචි ගාමිණී ගේ නිවසේ, දොඩම්පහලවත්තේ විජේවර්ධන ගේ නිවසේ සහ ඇහැලියගොඩ පනාවල ජිනදාස ගේ නිවසේය. අත්අඩංගුවට ගන්නා විට ශාන්ත සිටියේ වික්ටර් විසින් සොයා දුන් නිවිතිගල උඩකරවිට පදිංචි හදිසි මරණ පරීක්ෂක නිමල් පද්මසිරි ගේ නිවසකය. එය පිහිටා තිබුණේ කරවිට පඤ්ඤානන්ද මධ්‍ය මහා විද්‍යාලයේ සිට කිලෝමීටරයක් ආසන්නවය. එම නිවස රත්නපුර ලංගම ඩිපෝවේ සේවය කළ ජස්ටින් හරහා ශාන්ත විසින් සොයා ගත්තකි.

ශාන්ත අත්අඩංගුවට ගැනීම සඳහා උඩකරවිට එම නිවසට හමුදා භටයන් පැමිණියේ 1990 ජනවාරි 01 රාත්‍රී 7ට පමණය. නිවසේ පසුපසින්ද පැන යෑමට හැකි හෙයින් එයද හමුදා භටයන් විසින් ආවරණය කරන ලදී. අනතුර දුටු වහාම උඩුකය නිරුවත්ව සරමක් පමණක් හැඳ සිටි ශාන්ත පිටුපසින් පළා යෑමට තැත් කළද එය නොහැකි වීම නිසා වත්තේ තිබූ කෙසෙල් ගාලක සැඟවිණි. නිවස වටලා විනාඩි 20ක මෙහෙයුමකින් පසු ශාන්ත හමුදා අත්අඩංගුවට පත්විය. පසුව වික්ටර් දුටු විගස ශාන්ත ඇසුවේ 'ඇයි මල්ලී, මෙහෙම කළේ?' කියාය.

උඩකරවිට සිට කොළඹ බලා ශාන්ත රැගෙන ඒමේ දී රත්නපුර තිරිවානකැටිය කන්ද උඩ පිහිටි හමුදා කඳවුරේ දී හමුදා පිරිස තේ පානය කළ අතර ශාන්ත ඇතුළු කැරලිකරුවන්ටද තේ ලබා දී තිබිණි. මත්තේගොඩ කඳවුරට 1990 ජනවාරි පළවෙනිදා රාත්‍රී 11ට පමණ ගෙන ආ ශාන්ත බණ්ඩාර ඇතුළු පිරිසට රාත්‍රී ආහාර ලබා දෙන ලදී. ජනවාරි 02 සවස නව දේශපාලන මණ්ඩල සභිකයකු වූ උපාලි ජයවීරද ශාන්තට දැක ගන්නට ලැබිණි. නුවරඑළිය හාවාඑළිය නිවාස සංකීර්ණයේ දී 1990 ජනවාරි 02 අලුයම 1.45ට අත්අඩංගුවට ගත් උපාලි ජයවීරද මත්තේගොඩ කඳවුරට ඒ වනවිට ගෙනවිත් තිබිණි.

මත්තේගොඩට ශාන්ත සමඟ ගෙන ආ වික්ටර්, ඉළුක්කුඹුර සහ ගුණරත්න 1990 ජනවාරි 04 උදෑසන යළි කුරුවිට බුලත්ගම හමුදා කඳවුරට ගෙනවිත් රඳවා තැබීය. මත්තේගොඩ හමුදා කඳවුරේ රඳවාගත් ශාන්ත ගෙන් යුද හමුදා බුද්ධි අංශයේ විශේෂ බුද්ධි නිලධාරි ජනරාල් දයා රත්නායක විසින් ප්‍රශ්න කරන ලදී. උපාලි ජයවීර 1990 ජනවාරි 06 උදෑසන යළි නුවරට රැගෙන යන විටද ශාන්ත මත්තේගොඩ දී දැකගන්නට ලැබිණි.

පසුව ශාන්ත බණ්ඩාර 1990 ජනවාරි 06 රාත්‍රී ඝාතනයට ලක්විය. ඔහුගේ සිරුර බොරලැස්ගමුව සුසාන භූමියේ ආදාහනාගාරයේ දී තවත් කැරලිකරුවන් කිහිපදෙනකු සමඟ දැවී ගියහ. අවසාන මොහොතේදි ශාන්ත ගේ ඉල්ලීම වූයේ තමා කිසිවකු පාවා නො දී ජවිපෙ ස්ථාවරය රැකගත් බව පක්ෂයට දැනුම් දෙන ලෙස පමණකි.

ශාන්ත මියයන විට බිරිය ඉන්දුමතී පස්මස් ගැබිණි මවකි. ඒ වන විට බැංකු සේවයෙන් තාවකාලිකව සමුගෙන සිටි ඇය 1989 නොවැම්බර් වනවිට පදිංචිව සිටියේ ගම්පොල නිවසකය. වසර 1990 අප්‍රේල් මස උපන් ශාන්ත ගේ දියණිය අධ්‍යාපනය ලැබුවේ නුගේගොඩ පෞද්ගලික පාසැලකය. ශාන්තගේ වැන්දඹු බිරිය බැංකු සේවයට නැවතත් එක්වූ අතර පසුව යළි නව දිවියක් ඇරඹීය. ඇය විශ්‍රාම ගියේ බැංකු නිලධාරිනියක් ලෙසිනි. ශාන්ත බණ්ඩාර කිසිදා නුදුටු දියණිය 2020 වන විට සේවය කළේ පෞද්ගලික රූපවාහිනී ආයතනයක නිලධාරිනියක් ලෙසිනි.

ශාන්ත බණ්ඩාර යනු පුද්ගල ත්‍රස්තවාදය ප්‍රතික්ෂේප කළ, සතුරාට එරෙහිව සටන පමණක් කළ යුතු බව ඇදහූ ජවිපෙ දේශපාලන මණ්ඩලයේ සුළුතරය අතරින් ප්‍රමුඛයෙකි.

# කොරෝනා වයිරසය ප්ලාස්ටික් මත පැය 72ක්

## විවිධ ලෝහ මත සජීවී කාලසීමා මෙන්න

**කොවිඩ් 19 රෝගය ඇතිකරවන කොරෝනා වර්ගයේ වයිරසය ඝනත්වයෙන් වැඩි බැවින් එය මිනිස් මුවකින් පිටවී සුළු කාලයකින් බිමට පතිත වන බව විද්‍යාඥයන්ගේ මතයයි. එලෙස බිමට පතිතවන වයිරසයට විවිධ මතුපිට මත පැය ගණන් ආරක්ෂිතව පැවතීමේ හැකියාව තිබේ.**

එලෙස කිසියම් මතුපිටක් මත ආරක්ෂිතව පවතින වයිරසයක් ස්පර්ෂය වැනි ක්‍රමවේදයකින් යළිත් මිනිස් සිරුරට ඇතුළු වුවහොත් ආසාදනය වීමේ හැකියාව වයිරසය තිබේ.



මෙහිදී විවිධ පෘශ්ඨයන් මත වයිරසය ජීවත්වන කාල සීමාවන් වෙනස් වේ. ඒ අතරින් වයිරසය වැඩිම කාලයක් ජීවත් වන්නේ ප්ලාස්ටික් මතය. ඒ දින තුනක කාලයකි. පැය වශයෙන් ගතහොත් පැය 72කි.

බොහෝ සුපිරි වෙළඳසැල් සහ බැංකු කවුන්ටර් වැනි ස්ථානවල මතුපිට ප්ලාසිටික්වලින් සාදා ඇති බව විශේෂයෙන් සිහියේ තබා ගත යුතුය.

කුඩා දරුවන්ගේ ක්‍රීඩා භාණ්ඩද බොහෝ විට නිමවා ඇත්තේ ප්ලාස්ටික්වලිනි. දොර අගුළු, ජංගම දුරකථන, මුළුතැන්ගෙයි උපකරණ, පරිගණක යුතුරු පුවරු මතද වයිරසය පැය හැත්තෑ දෙකක් ජීවත් වන බව ඔබ සිහියේ තබා ගත යුතුමය.

මළ නොබැඳෙන වානේ මතද වයිරසය පැය හැත්තෑ දෙකක් සජීවීව රඳා පවතින්නේය. වයිරසය කාඩ්බෝඩ් මත ජීවත් වන කාලය පැය 24කි.

තඹ ලෝහය මත වයිරසය ජීවත් විය හැක්කේ පැය 4ක් පමණක් වන අතර කඩදාසි මත එයට පැය 48ක් ආරක්ෂිතව ජීවත් වීමේ හැකියාව තිබේ. ඒ අනුව කඩදාසිවලින් සැදුණු මුදල් නෝට්ටු මත වයිරසය පැය 48ක් ජීවත් වන බව අමතක කළ යුතු නැත.

වයිරසය සහිත පුද්ගලයකුගේ එක් කැස්සකින් හෝ එක් කිවිසීමකින් වාතයට එක්වන වන විෂබීජ අංශු ප්‍රමාණය 3000කි.

ඒ අනුව ආසාදිත පුද්ගලයකුගේ එක් කිවිසීමකින් පුද්ගලයන් 3000ක් ආසාදනය විය හැකිය.

එමෙන්ම මේ වයිරසය අංශු වාතයේ පැය තුනක පමණ කාලයක් රඳා සිටින බවද අමතක කළ යුතු නැත. මේ අනුව වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා නිතර දැත් සේදීමට අමතරව, අත් ආවරණ පැළඳීමද ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශ කර තිබේ.

# සක්වළගල

● ටිරෝනි වෑවලගේ

# ට්‍රම්ප්ට වඩා බයිඩන් ඇත්තටම හොඳයිද?

## ඇමෙරිකා ජනාධිපතිවරණයට සති දෙකයි



**ඇමරිකා ජනාධිපතිවරණ අපේක්ෂකයන් ලෙස මෙතෙක් ඉතිහාසයේ ඉදිරිපත්ව සිටින දුර්වලම අපේක්ෂකයන් දෙදෙනා ඩොනල්ඩ් ට්‍රම්ප් සහ ජෝ බයිඩන් බව ඇතැම් දේශපාලන විචාරකයෝ පවසති. ඔවුහු ඒ බව සනාථ කිරීමට ඉදිරිපත් කරන කරුණු කිහිපයකි.**

දෙවැනි ධූර කාලය සඳහා ඉදිරිපත් වුවද තම ප්‍රථම ධූර කාලය තුළ ට්‍රම්ප් ඇමරිකාවට කළ යහපතක් නැත යන්න ඒ අතරින් පළමුවැන්නයි.

මීට පෙර ක්ලින්ටන්ගේ සිට පාලනයේ සිටි ජනාධිපතිවරුන්ට දෙවැනි ධූර කාලයක් ලබා දීමට ජනතාවට සාධාරණ හේතු විය. ඒ අතරින් ඉදිරියෙන්ම සිටියේ මුස්ලිම් අන්තවාදීන්ට එරෙහි යුද්ධයයි.

ක්ලින්ටන්ට ඉරාකය සමග යුද්ධ කරන්නට තිබූ අතර රිපබ්ලිකන් බුෂ්ට ඔසාමා බිල් ලාදෙන් සමග ගැටුම අවසන් කිරීමේ ඉලක්කය විය.

ඔබාමාද මේ න්‍යාය පත්‍රය එළෙසින්ම ඉදිරියට ගෙන ගියේය. මෙවැනි හේතු මත ජනතාව ඔවුන්ට දෙවැනි ධූර කාලයක් කිසිඳු තර්කයකින් තොරව ලබා දුන්හ. එහෙත් ට්‍රම්ප්ට එවැනි හේතු නොවීය.

එක් අතකින් ලොව කිසිඳු තැනක අනවශ්‍ය යුද්ධ ඇති කිරීමට අනුබල නොදුන් ඇමරිකා ජනාධිපතිවරයකු ලෙස ට්‍රම්ප් ඉතිහාස ගතවනු ඇත. එහෙත් ඇමරිකානු ජාතිකවාදය ඉදිරියට ගෙන එමින් බලයට පැමිණි ට්‍රම්ප් ඇමරිකාවට කළ යහපතක් නැත යන්න ඔහුගේ විරුද්ධවාදීන්ගේ තර්කයයි.

කොවිඩ් පැතිරයෑම සහ ට්‍රම්ප් අසාර්ථක නායකයකු ලෙස ගෙන ගිය සාර්ථක ඩිමොක්‍රටික් ප්‍රචාරණ ව්‍යාපාරය හමුවේ ජනතාව ට්‍රම්ප්ට වඩා බයිඩන්ට අකාර්ෂණය වුවද මේ වන විට සැබවින්ම ට්‍රම්ප්ට වඩා බයිඩන් හොඳද යන ප්‍රශ්නය බොහෝ දෙනා තුළ මතුවෙමින් තිබේ.

මෙවර ජනාධිපතිවරණයට ඉදිරිපත්ව සිටින අපේක්ෂකයන් දෙදෙනාම කිසිඳු ආකර්ෂණයකින් තොර සුවිශේෂත්වයකින් තොර පුද්ගලයන් බව ඇමරිකානු ජනතාවගේ මතයයි.

මේ දෙදෙනාම ඉතා වයස්ගත පුද්ගලයෝය. ට්‍රම්ප්ගේ වයස අවුරුදු 70ක් වන අතර බයිඩන්ගේ වයස අවුරුදු 78කි.

ඒ අනුව මේ දෙදෙනාම තරුණ පරපුර ආකර්ෂණය කර ගැනීමට අසමත් බව විචාරකයන්ගේ තර්කයයි. කමලා හැරිස් උප ජනාධිපති ලෙස නම් කරමින් තරුණ සහ කාන්තා ආකර්ෂණය මෙන්ම සංක්‍රමණිකයන්ගේ ඡන්ද ද ලබා ගැනීමට ඩිමොක්‍රටික් පක්ෂය දැඩි උත්සාහයක් දරමින් සිටී. කොවිඩ් සම්බන්ධව ට්‍රම්ප්ගේ 'ගණන් නොගන්නා' ප්‍රතිපත්තිය දැඩි ලෙස විවේචනය කළද බයිඩන්ද සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද සමග නොසිටින බව ඔහු ක්‍රියාවෙන් ඔප්පු කර ඇති බැවින් ඔහුටද මේ වන වට ජනතා චෝදනා එල්ල වෙමින් තිබේ.

ට්‍රම්ප් සෞඛ්‍ය පුරුදු පිළි නොපදින බවත්, මුව ආවරණ නොදමන බවත් චෝදනා කර සිටි බයිඩන් වරක් මුව ආවරණය දමා සිටියද තම නාසය විවෘතව පවත්වා ගැනීමත්, කැස්සක් මතු වූ අවස්ථාවේ දී මුව අවාරණය ඉවත් කරන අන්දමත් ඇමරිකානු සමාජය පුරා ඉතා සාර්ථකව බෙදා හැරීමට මාධ්‍ය සමත් වූයෙන් බයිඩන්ගේ තවත් ලකුණු කිහිපයක්ම කැපී ගියේය.

අනික් අතට ගියවර ඇමරිකානු ජාතිකවාදය සම්බන්ධව මවිල් කෙලින් වන කතා ඇද බාමින් ජනතා ආකර්ෂණය දිනා ගත් ට්‍රම්ප් මේ වන විට ජාතිකවාදය බිමින් තබා ඇති බවක් පෙනේ.

ඒ අනුව මෙවර ඔහුට අලෙවි කිරීමට ආකර්ෂණීය මාතෘකා නැත. බයිඩන්ට ඇත්තේ ට්‍රම්ප් විරෝධය මිස ජනතා ආකර්ෂණයක් නොවේ.

මේ සියල්ල මත බොහෝ විචාරකයන් පවසන්නේ ඇමරිකානු ජනාධිපතිවරණ ඉතිහාසයේ ඇල් මැරුණු ඡන්ද සටන සහ දුර්වලම අපේක්ෂකයන් මෙවර ඉදිරිපත්ව සිටින බවයි.

බයිඩන්ගේ තෝරා ගැනීම ඩිමොක්‍රටික් පක්ෂයේ අසාර්ථක බව පෙන්වන ලක්ෂණයක් ලෙස ගත හැකිය.

පසුගිය මැතිවරණයේදී ට්‍රම්ප්ට තරග වැදීමට සිදුවූයේ අති ජනප්‍රියව සිටි හිලරි ක්ලින්ටන් සමගිනි.

ඒ අවස්ථාවේදී ට්‍රම්ප් ජයග්‍රහණය කළේ ඉතා තියුණු තරඟයකින් පසුවය. අනික් අතට මැතිවරණය පැවැත්වෙන්නේද ඩිමොක්‍රටික් පාලන සමයකදීය. එවර ඇද වැටුණු ඩිමොක්‍රටික් බලාධිකාරය යළි ගෙන ඒමට මෙවර ඔවුන් තෝරාගෙන ඇත්තේ අති ජනප්‍රිය ඩිමොක්‍රටික් පක්ෂ ජනාධිපතිවරයකු වූ බරක් ඔබාමාගේ උප ජනාධිපති වූ ජෝ බයිඩන්ය.

ඒ හැර වෙනත් තෝරා ගැනීමක් ඩිමොක්‍රටික් පක්ෂයට නොවීය. එහෙත් මේ මුළු කාලය තුළම ඩිමොක්‍රටික්වරු ට්‍රම්ප්ට නොකළ කෙනෙහිලිකමක් නැත.

බයිඩන්ගේ දරුවන්ගේ කටයුතු හේතුවෙන් ඔහුට එල්ල වූ අපහාස අත්හැර දැමූවද, ඔබාමාගේ ජනප්‍රියත්වය හැර අන් විශේෂ කැපීපෙනෙන ආකර්ෂණයක් බයිඩන් සතුව නැත.

ඒ හේතුවෙන්ම මෙවර කල් වේලා තබා ආරම්භ වූ ඡන්ද ප්‍රකාශ කිරීම ලොවට ප්‍රවෘත්තිමය වැදගත්කමක් එක් කරන්නේ මේ දෙදෙනා අතර ඇති ඇල්මැරුණු මැතිවරණ සටන ද හේතුවෙනි.

# ලිංගික ශ්‍රමය ගැන ආන්දෝලනාත්මක නඩු තීන්දුව



## මුම්බායි අධිකරණයෙන් කාන්තාවන්ට සානුකම්පිත බැල්මක්

**ඉන්දියාවේ ලිංගික ශ්‍රමිකයන් සම්බන්ධව එරට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පසුගියදා මතබේදාත්මක නඩුතීන්දුවක් ප්‍රකාශයට පත් කර සිටියේය. එහිදී අත්අඩංගුවට පත් ලිංගික ශ්‍රමික කාන්තාවන් සම්බන්ධව නඩු තීන්දුවක් ප්‍රකාශයට පත් කරමින් එම අධිකරණ විනිසුරුවරයා පවසා ඇත්තේ ලිංගික ශ්‍රමිකයකු වීම කාන්තාවගේ කැමැත්ත නම් ඇයට එම සේවයේ නිතරවීමේ අයිතිය හිමිවන බවත්, ඇය එයින් වළක්වාලීමේ අයිතිය රජය සතුවන බවත්ය.**

පසුගිය ඔක්තෝබර් 9වැනිදා මුම්බායි හිදී මේ නඩු තීන්දුව ලබා දී ඇති අතර මීට වසරකට පෙර පොලිස් අත්අඩංගුවට පත්ව රැඳවුම් නිවාසවල රඳවා සිටියදී, ඉන් පැනගොස් යළිත් පොලිස් අත්අඩංගුවට පත්වූ ලිංගික ශ්‍රමික කාන්තාවන් තිදෙනෙකු සම්බන්ධව මේ නඩුව විභාගයට ගෙන තිබේ.

විනිසුරුවරයාගේ මේ ප්‍රකාශය සමාජය කැළඹීමට ලක් කිරීමට සමත්වූයේ එය ඉතා මානව හිතවාදී ප්‍රකාශයක් මෙන්ම ඉන්දියාව වැනි අතිශය සාම්ප්‍රදායික සමාජයක් දෙදරීමට ලක් කළ හැකි ප්‍රකාශයක්ද වූ නිසාවෙයි.

මේ සම්බන්ධව පක්ෂව සහ විපක්ෂව ඉදිරිපත් වන මතවාදවලින් මේ දිනවල ඉන්දීය සමාජය පිරීගොස් තිබේ.

මේ සම්බන්ධව එකඟතාව පළකරන පිරිස් පෙන්වා දෙන්නේ බොහෝ කාන්තාවන් ලිංගික ශ්‍රමිකයන් බවට පත් වන්නේ සමාජ පීඩනය හේතුවෙන් බවයි.

කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකු වන සිද්ධාර්ත් ජිස්වාල් පවසන්නේ ලිංගික ශ්‍රමික් කාන්තාවක් අත්අඩංගුවට පත් වූ පසු ඔවුන්ගේ දැඩි විරෝධය මධ්‍යයේ ඔවුන් රැඳවුම් භාරයට පත් කරන බවයි.

එමගින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන බව ඔහු පෙන්වා දී තිබේ. එසේ රැඳවුම් භාරයට පත් කරන්නේ නම් ඒ සඳහා ඔවුන්ගේ කැමැත්ත හිමිවිය යුතු බවත්, එසේ නොමැති නම් එය ඔවුන් ලබන දඬුවමක් වන බවයි.

තම සිරුරේ අයිතිය තමන්ට බැවින් ඒ සම්බන්ධ තීන්දු තීරණ තමන්ට කැමති පරිද්දෙන් ගැනීමට හැකි විය යුතු බවද ඔහු පවසයි.

ලිංගික ශ්‍රමික කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටින බොහෝ සමාජ ක්‍රියාකාරීන් පෙන්වා දෙන්නේ මේ ප්‍රකාශය එවැනි කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කරන ලද උසස් ප්‍රකාශයක් බවයි.

බොහෝ ලිංගික ශ්‍රමික කාන්තාවෝ අවතැන් වීම හේතුවෙන් මේ රැකියාවට ප්‍රවිශ්ඨ වන බවත්, එයින් පසු ඔවුන්ට එම රැකියාව හැර වෙනත් අවස්ථා අහිමි වන බවත්ය.

තවදුරටත් ඔවුන් කැමැත්තෙන් මේ රැකියාවේ නිරතවන තත්ත්වයක් දක්වා විතැන් වන බවත් එතැනින් පසු ඔවුන් එයින් ඉවත් කිරීම අපහසු බවත්ය.

ලිංගික ශ්‍රමික කාන්තාවන් පොලිස් දැලට කොටු වූ පසුව ප්‍රථම ඔවුන් දින විසිඑකක් රැඳවුම් භාරයේ තබනු ලැබේ.

එහිදී ඔවුන් හඳුනා ගැනීම් සිදු කෙරෙන අතර වෛද්‍ය පර්යේෂණවලට ද ලක් කෙරේ.

ඔවුන් උසාවියට ඉදිරිපත් කෙරෙන්නේ ඉන් පසුවය.

එහිදී ඔවුන් තවදුරටත් රැඳවුම් භාරයේ තැබීම හෝ නිදහස් කිරීම සිදුවේ. මේ අවස්ථා දෙකේදීම උසාවිය විසින් ශ්‍රමිකයාගේ පවුල් පසුබිම ඇතුළු කරුණු කිහිපයක්ම සැලකිල්ලට ලක් කරණු ලැබේ. ඇතැම් අවස්ථාවලදී ශ්‍රමිකයා වසර තුනක් දක්වා රැඳවුම් භාරයේ තැබීමට උසාවිය තීන්දු කරයි.

බොහෝවිට එවැනි තීන්දු ලැබෙන්නේ ශ්‍රමිකයා ඍජුවම ජාවාරම් සමග සබඳතා සහිත බව ඔප්පු වීමෙනි.

එහෙත් ඉන්දීය උසාවිය පොදුවේ පිළිගන්නා මතය වන්නේ දැනට ඉන්දියාවේ සිටින ලිංගික ශ්‍රමිකයන් අතරින් අති බහුතරය ස්වකීය කැමැත්තෙන් මේ රැකියාවේ නිරතවනවාට වඩා ජාවාරම්කරුවන් විසින් බලහත්කාරයෙන් රැකියාවේ යොදවනු ලබන බවයි.

2018 වසරේදී සිදු කරන ලද සමීක්ෂණයකින් හෙළි වූයේ මුම්බායි නගරයේ ලිංගික ශ්‍රමික කාන්තාවන් අතරින් සියයට 80ක් එම වෘත්තියට ප්‍රවිශ්ට වීමට හේතුව අවතැන් වීම බවයි.

එමෙන්ම ලිංගික ශ්‍රමිකයන් බවට පත්වීමෙන් පසුවද ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න වැඩිවනවා මිස පිළිතුරු නොලැබෙන බවද පැහැදිලි වී ගොස් තිබේ.

උදාහරණයක් ලෙස ඔවුන් අත්අඩංගුවට පත්වීමෙන් පසු නීතිඥයන්ට ගෙවීමට වෙනම මුදල් ඉපයීමට ඔවුන්ට සිදුවේ. එයි අතුරු ප්‍රතිඵලය වන්නේ ඔවුන් ණය උගුලේ සිරවීමය.

කෙසේ වුවද මෙවර මුම්බායි උසාවිය ලිංගික ශ්‍රමික කාන්තාවන් වෙත හෙළා ඇත්තේ ඉතා සානුකම්පිත දෘෂ්ටියකි. විශේෂයෙන්ම අත්අඩංගුවට පත්වන ලිංගික ශ්‍රමික කාන්තාවන් රැඳවුම් භාරයේ තැබීම උසාවියේ දෝෂදර්ශනයට ලක්ව තිබේ.

උසාවිය ඒ සම්බන්ධව පවසා ඇත්තේ 'කිසිවකු රැඳවුම් භාරයේ සිටීමට කැමැත්තක් දක්වන්නේ නැහැ. එමෙන්ම තමන් කැමති රැකියාවේ නිතර වීමට සෑම දෙනාටම අයිතියක් තිබෙනවා' යනුවෙනි.

කෙසේවුවද කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් මෙන්ම ගණිකා වෘත්තියට එරෙහි මත දක්වන කණ්ඩායම් අතර මේ සම්බන්ධව බොහෝ මතගැටුම් ඇතිවෙමින් තිබේ.

වැඩි දෙනා පවසන්නේ ලිංගික ශ්‍රමික කාන්තාවන් අතරින් බහුතරය ස්වකීය කැමැත්තෙන් එහි නිරතවන අය ලෙස හඳුනාගත නොහැකි බවයි.

කිසිදු කාන්තාවක් ස්වකීය කැමැත්තෙන් මේ වෘත්තිය තෝරා ගනී යැයි සිතිය නොහැකි බවටද මත පළවී තිබේ.

ආසියානු සමාජයේ එය එසේ වීමට වැඩි ඉඩක් පවතින නමුදු මිනිස් සිතුම් පැතුම් කාලානුරූපව වෙනස් වන බවද අමතක කළ යුතු නොවේ.

ඒ අනුව උසාවි තීන්දු තීරණය මෙලෙස නම්‍යශීලී සහ මානුෂික වීම පැසසුම් ලැබිය යුතුය.



# චීනය නිසා ගොඩගිය පකිස්තානය

**පකිස්තානය බිමටම ඇද දැමුවේ ඇමරිකාවයි. එසේ කිරීමට පෙර පකිස්තානය අභ්‍යකාශ යානා නිපදවීමට සමත්වූ, න්‍යෂ්ඨික බලය අත්පත් කරගත්, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිෂේධ බලය සහිත රටක් වීමට කේවල් කිරීමට තරම් සුදුසුකම් ලත් බලවතෙක් විය. ඒ සඳහා ඉන්දියාවෙන් වෙන්වූ පකිස්තානයට මුස්ලිම් රටවල සහයද හිමිවූ බව අමතක කළ යුතු නැත.**

එහෙත් මුස්ලිම් අන්තවාදීන් ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කළ පසු අසල්වැසියාගේ බලපෑමෙන් ගැලවීමට පකිස්තානයට හැකියාව ලැබුණේ නැත. එහිදී පකිස්තානය තෝරා ගනුලැබුවේ මුස්ලිම් අන්තවාදය නොව ලෝකයේ වඩාත්ම බලවතාගේ පාර්ශ්වයයි.

ඒ අනුව ඇෆ්ගනිස්ථානයට පහර එල්ල කිරීමේදී ඇමරිකානු හමුදාවන්ට සියලු පහසුකම් සපයනු ලැබුවේ පකිස්ථානයයි.

ඒ සඳහා ඇමරිකාව තමන්ට හිතකාමී පාලකයකුද පකිස්තානයට පත් කර ගත් අතර ඔහු ෆර්වේස් මුෂාරාෆ්ය. ඇමරිකාවේ ආධාර මෙන්ම සහයෝගයද නොඅඩුව ලැබුණු එම වකවානුව පකිස්තානයේ ස්වර්ණමය යුගයක් විය.

එහෙත් තලේබාන් සංවිධානය බිමට හාන්සි කර, අල් කයිඩාව වැනසූ පසු ඇමරිකාවට තවත් පකිස්තානය අවශ්‍ය වූයේ නැත. ඇමරිකාව විසින් අතහැර දමුණු ලැබූ පකිස්තානය සැබවින්ම කුණාටු සාගරයේ රුවල කැඩී ගිය නෞකාවකට සමාන විය.

දූෂිත පාලකයන්, අධික ණය බර, මුස්ලිම් අන්තවාදය, ඉන්දියානු තර්ජන යනාදී මේ සියල්ල ඔසවාගෙන පකිස්තානය අනාගතය කරා යා යුතු විය. එහෙත් ඒ ගමන ඉතා සෙමෙන් වූ අතරඑහි අවසන් ප්‍රතිඵලය වූයේ පකිස්තානය පතුලක් නැති අගාදයකට වැටීමය.

ඉම්රාන් ඛාන් බලය ලබා ගන්නේ එවන් වූ පකිස්තානයකය. පෞද්ගලික ජීවිතයෙන් බැහැරව දේශපාලනය සහ රට වෙනුවෙන්ම කැපවූ පුද්ගලයකු ලෙස පෙනී ගිය ඉම්රාන් ඛාන්ට බලය ලබා දීම පකිස්තාන වැසියන් ගත් ඉතා නිවැරදි තීරණයක් විය.

එහෙත් ඉම්රාන්ට ලැබුණු අභියෝගය ඔහු සිතූ තරම් පහසු නොවීය. දේශපාලනඥයන් විසින් විනාශ කර තිබූ පකිස්තානයේ භාණ්ඩාගාරය කොතෙක් දුප්පත් වීද යත්, ඉම්රාන් ඛාන් රට බාර ගන්නා විට භාණ්ඩාගාරය සතු වත්කම් ජනතාවට සතියක් ආහාර සැපයීමට ප්‍රමාණවත් නොවීය. අගමැති සහ ඇමතිවරුන් සතු වත්කම් විකිණීමට ඉම්රාන් යෝජනා කළේය. ඉන්පසු එය ක්‍රියාත්මකද කළේය. එහෙත් ප්‍රතිඵලයේ වැඩි වෙනසක් නොවීය.

අගමැති ඉම්රාන් ඛාන් සතුව වෙනත් විකල්ප නොවීය. ඔහු තමන්ට උපකාර කරන ලෙස මුළු මහත් ලෝකයෙන්ම ඉල්ලා සිටියේය.

ඔහුගේ ඉල්ලීමට ප්‍රංශය මෙන්ම ජර්මනියද යම් පමණකින් ප්‍රතිචාර දැක්වූහ. ඒ සමගම චීනයද ප්‍රතිචාර දැක්වීය. එහෙත් ලැබුණු මුදල් ප්‍රමාණවත් නොවීය.

ඉම්රාන් යළි උදව් ඉල්ලුවේය. එවර චීනය පමණක් ප්‍රතිචාර දැක්වීය. චීනය දිගින් දිගටම පකිස්තානය සමග සිටියේය. මේ ණය මුදල් ලබා දීමේ දීර්ඝ කාලීන අරමුණු තිබිය හැකිය. ඒවා දේශපාලනිකද විය හැකිය. එහෙත් රටක ජනතාව බඩගින්නේ මිය යෑමට ඉඩ නොදීම අගය කළ යුතුය.

මේ වන විට චීනය පකිස්තානයට ලබා දී ඇති සම්පූර්ණ වාණිජ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 6.7කි.

මේ මුදල අතීතයේ සිට මේ දක්වා පකිස්තානයට අන්තර්ජාතික මූල්‍ය අරමුදල ලබා දී ඇති සම්පූර්ණ ණය මුදලට වඩා වැඩිය.

මෙයට අමතරව චීනය තවත් විශාල මුදලක් පකිස්තානයේ ආයෝජනය කර තිබේ.

චීනයේ මාවතක් සහ තීරයක් ව්‍යාපෘතිය යටතට අයත් වන පකිස්තානයේ කරච්චි නගරය වෙළෙඳ, වාණිජ නගරයක් සහ ගුවන් තොටක්, නැව් තොටක් ලෙස සංවර්ධනය කිරීමට සහයෝගය දීම චීන අරමුදල් මගින් සිදුවෙමින් තිබේ. 2016 වසරේදී චීනය තවත් ඩොලර් බිලිය 8.5ක් පකිස්තානයේ ආයෝජනය කරන බව පවසා සිටියේය.

ඒ ඒ වන විටත් ලබා දී ඇති ඩොලර් බිලියන 4.5ක ආයෝජන මුදලට අමතරවය. මේ මුදල යෙදවීම අරමුණු වූයේ කරච්චියේ සිට පෙෂාවර් දක්වා දුම්රිය මාර්ගයක් සෑදීම වෙනුවෙනි. මීට අමතරව බලශක්ති උත්පාදනය, සහ උමං දුම්රිය මාර්ගයක්ද වෙනුවෙන් තවත් ඩොලර් බිලියන 4ක් චීනය පකිස්තානයේ ආයෝජනය කර තිබිණි.

2019 වසරේදී චීනය වැඩිම ආධාර ප්‍රමාණයක් පකිස්තානයට ලබා දී තිබේ. මේ ලබා දුන් ආධාර එරට ජනතාවගේ අධ්‍යාපනට ක්ෂේත්‍රයේ වර්ධනය, සුභසාධනය, ළමා සහ මාතෘ සුරක්ෂිතතාව ඇති කිරීම, තරුණ තරුණියන්ට වෘත්තිය පුහුණුව ලබා දීම, පිරිසිදු පානීය ජලය ලබා දීම සහ දුප්පත්කම තුරන් කිරීම යන අරමුණු වෙනුවෙන් වැය කිරීම චීන රජයේ අරමුණ විය.

මේ ලබා දුන් ආධාර යටතේ අදාළ කටයුතු එළෙසින්ම ක්‍රියාත්මක වනවාද යන්න සොයා බැලීමට පසුගිය වසරේ විශේෂ චීන දූත පිරිසක් පකිස්තානයේ සංචාරයටද එක් වූහ.

මේ හැර මාවතක් සහ තීරයක් ව්‍යාපෘතිය යටතේ චීනය පකිස්තානය වෙනුවෙන් අමතරව වැය කර ඇති මුදල ඩොලර් බිලියන 19ක් බවද සඳහන්ය.

මේ මුදල් විශේෂයෙන්ම එරට මාර්ග පද්ධතිය දියුණු කිරීම අරමුණු කර ගනිමින් ලබා දී තිබේ.

මේ සියල්ල අතර පකිස්තානයේ සැලකිය යුතු භූමි ප්‍රමාණයක් චීනයේ භුක්තියට නතු කර දීමට ඉම්රාන් ඛාන්ට සිදුවූ බවද අමතක කළ යුතු නැත. ලොව කිසිඳු රටක් තම අරමුණුවලින් බැහැරව පරාර්ථකාමයෙන් පමණක් යුක්ත වෙමින් සහය ලබා දේ යැයි සිතිය නොහැකිය.

කෙසේ වුවද පකිස්තානය මේ වන විල යළිත් පීල්ලේ යමින් සිටින්නේය. එය කොතරම්ද යත් කොවිඩ් වසංගතය ඇති වූ අවස්ථාවේදී පකිස්තානයේ දස දෙසින් රෝගීන් වාර්තා වුවද මරණ සංඛ්‍යාව හැකි තරම් අඩු කර ගනිමින්, රෝගය පාලනය කර ගැනීමටද පකිස්තාන රජයට හැකි විය.

පකිස්තානයේ මේ ක්‍රියාකලාපය අගය කළ ලෝක සෞඛ්‍ය සංවිධානය පවසා සිටියේ කොවිඩ් පාලනය කරන අන්දම පකිස්තානයෙන් ඉගෙන ගන්නා ලෙසටය.

මේ අන්දමින් ඉම්රාන් ඛාන්ගේ පකිස්තානය චීනය නිසා ගොඩ ගියේය. එහෙත් එහි අතුරු ඵල කෙසේදැයි අනාගතය තීරණය කරණු ඇත.

# සක්වළගල

● ටිරෝනි වැවලගේ

# දෝනිගේ දියණියට බිරියට තර්ජන



## මේ ඉන්දියාවේ කාන්තාවන් මුහුණ දෙන අස්ථාවර බව මිස අන් කිසිවක් නොවේ...

**මහේන්ද්‍ර සිං දෝනි යනු ඉන්දියාවේ ක්‍රිකට් ක්ෂේත්‍රයේ ජයකෙහෙළි නැංවූ තරුවකි. ඔහු ඉන්දියාවට ලබා දී ඇති කීර්තියද අති මහත්ය. ඔහු මේ වන විට කොවිඩ් අභියෝග අස්සේ පැවැත්වෙමින් තිබෙන අයිපීඑල් තරඟාවලියටද සහභාගී වෙමින් සිටී. ඔහුගෙන් ඉන්දියාව ලත් කීර්තියක් මිස අන් කිසිවක් නොවේ. එහෙත් පසුගියදා එක්වරම ඉන්දීය සමාජ මාධ්‍යවල දකින්නට ලැබුණේ දෝනිගේ පස් හැවිරිදි කුඩා දියණිය සහ බිරිය මරා දමන බවටත්, ඔවුන්ට ලිංගික අඩන්තේට්ටම් කරන බවටත් පවසමින් පළවූ තර්ජනයකි.**

එය දුටු වහාම බොහෝ දෙනා කැළඹී ගියේ දෝනි වැනි ඉන්දියාවට කීර්තිය ගෙන දුන් පුද්ගලයකුගේ දරු පවුලට මෙවැනි තර්ජනයක් කිරීම හේතුවෙනි.

එය කිසිසේත් යහපත් ප්‍රවණතාවක් නොවීය. ඒ සමගම මෙකී තර්ජනය හෙළා දකිමින් විරෝධතා එල්ල වන්නට වූයෙන් ඉන්දීය පොලීසියට මෙහි මූලාරම්භය සොයා කටයුතු කරන්නට සිදුවිය.

එහි ප්‍රතිඵලයක් ලෙස පසුගියදා අහමදාබාද් නගරයෙන් 16 හැවිරිදි පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමට ඉන්දීය පොලීසිය කටයුතු කළේය.

පොලිසිය ඔහු හඳුනාගෙන ඇත්තේ එම්එස් දෝනිගේ බිරියට සහ දියණියට තර්ජන එල්ල කරමින් සමාජ මාධ්‍යවල පෝස්ට් පළ කිරීමට සම්බන්ධයක් සහිත පුද්ගලයකු වශයෙනි.

එහෙත් එය මේ දක්වා තහවුරු කර නොතිබීමද සැලකිල්ලට ගත යුතුය.

දැනට අත්අඩංගුවේ පසුවන පුද්ගලයා පාසල් ශිෂ්‍යයකු වන අතර ඔහු ඉන්ස්ටර්ග්‍රෑම්හි තර්ජනාත්මක පෝස්ට් පළකිරීමට වරද පිළිගෙන ඇතැයිද එම ප්‍රදේශයේ පොලීසිය දැනුම් දී ඇතැයි ප්‍රකාශිතය. එහෙත් වරදකරු ඔහුම බව මේ දක්වා තහවුරු කර නැත.

කෙසේවුවද මේ තර්ජනවලින් හෙළි වන්නේ ඉන්දියාවේ කාන්තාවන් මුහුණ දෙන අස්ථාවර බව මිස අන් කිසිවක් නොවේ.

ඉන්දියාව යනු මේ පෘථිවි තලය මත කාන්තාවන්ට ඉතාම අනාරක්ෂිත රට වශයෙන් හැඳින්විය හැකිය.

එරට සිදුවන ස්ත්‍රී දූෂණ සංඛ්‍යාව කොතෙක්ද කිවහොත් ඉන් වැඩි ප්‍රමාණයක් වාර්තා අතරට එක්වන්නේද නැත. විශේෂයෙන් කුලයෙන් පහත් හෝ දුගී බවින් පීඩා විඳින පවුල්වල කුඩා ගැහැණු දරුවන් සහ කාන්තාවන්ට බොහෝ විට හිමිවන්නේ ඉතා කටුක, වේදනාත්මක සහ වගකිවයුත්තකු නොමැති මරණ වේ. ඇතැම් අවස්ථාවලදී මෙලෙස මියගිය ගැහැණු දරුවන්ගේ හෝ කාන්තාවන්ගේ සිරුරු නිහඬවම පුළුස්සා දමා සිදුවීම එතැනින් අවසාන කර දමන්නේ පොලීසිය විසිනි. මේ අනුව තත්ත්වය කොතරම් බලපතලදැයි ඔබට වැටහෙනු ඇත.

මේ සම්බන්ධව ඉන්දීය ජනතාව හඬ නැගුවේ මෑතකදී නොවේ. වරක් මේ සම්බන්ධව අදහස් දක්වමින් ජනප්‍රිය නළු ශාරුක් ඛාන් පවසා සිටියේ තමන් ඉන්දීය ජාතිකයකු බව පැවසීමට ලැජ්ජා වන බවයි.

එමෙන්ම මහමගදී සමූහ දූෂණයකට ගොදුරු වූ තරුණියකගේ ජීවිතය රැක ගැනීමට ඇයව විශේෂ ගුවන් යානයකින් සිංගප්පූරුව බලා යැවීමටද වරක් ඉන්දීය රජය කටයුතු කළේය.

අනන්‍යතාව සඟවමින් 'නිර්භයා' ලෙස නම් කළ මේ දැරිය බේරා ගැනීමට කොතෙක් උත්සාහ දැරුවද ඇය මියගියේ සමූහ දූෂණය හේතුවෙනි.

පසුව ඉන්දීය ජනතාව මහගම තනිව අවේලාවේ ගමන් කිරීම කාන්තාවගේ වරදක් බවත්, එවැනි කාන්තාවන්, ගැහැණු දරුවන් දූෂණය වීම පුදුමයට කරුණක් නොවන බවත් පැවසීමට තරම් පසුගාමී වූහ.

ඒ අනුව ඉන්දියාවේ කාන්තාවක් ලෙස උපත ලැබීමම වරදක් බව වක්‍ර මාර්ගයෙන් ඉන්දීය සමාජයම පිළිගත්තා සේ විය.

දැන් මේ කණගාටුදායක සිදුවීම් මාලවේ නවතම පුවත ලෙස මහේන්ද්‍ර සිං දෝනිගේ කුඩා දියණියට පවා ලිංගික තර්ජන එල්ල කිරීමෙන් වැටහෙන්නේ එරට ජන සමාජයේ වයස අවුරුදු පහක කුඩා දරුවකුට වුවද කිසිඳු ආරක්ෂාවක් නොමැති බවය. එමෙන්ම ජන සමාජයේ කිසියම් කීර්තියක් අත්පත් කරගත් පුද්ගලයකුට වුවද ඉන්දීය සමාජය පොදුවේ මුහුණ දෙන භීෂණයෙන් ගැලවීමක් නොමැති බවය.

ස්වකීය පියාගේ කීර්තිය මත ජීවිතයට තර්ජන එල්ල වීම කිසිසේත් සරලව සැලකිය නොහැකි බව මේ සම්බන්ධව අදහස් දැක්වූ බොහෝ දෙනා පැවසූහ.

බොහෝ විට දැනට අත්අඩංගුවට පත්ව සිටින තරුණයා මේ සම්බන්ධව නියම වැරදි කාරයා වීමට හෝ සියලු වැරදි ඔහු පිටින් යෑමට ඉඩකඩ ඇත.

එහෙත් මේ සිදුවීම මෙසේ අවසන් වුවද ඉන්දීය ජන සමාජයේ කාන්තාව මුහුණ දෙන වාතාවරණය නම් වෙනසකට බඳුන් වේ යැයි සිතිය නොහැකිය.




## තායිලන්තයේ රජුට එරෙහි විරෝධතා දිගටම

තායිලන්තයේ රජුය එරෙහිව එරට ජනතාව විසින් දියත් කර ඇති විරෝධතා මේ වන විටත් බැංකොක් අගනුවර දිගින් දිගටම ක්‍රියාත්මක වෙමින් තිබේ. මේ විරෝධතාවලට සහභාගී වූ පිරිස් අතරින් කිහිප දෙනෙක් පොලීසිය විසින් අත්අඩංගුවට ගත් අතර සෙසු විරෝධතාකරුවන් මේ වන විට ඔවුන් නිදහස් කරන ලෙස ඉල්ලමින් සිටිති.
තායි රජුගේ අසීමාන්තික බලය සහ ඔහු අත්විඳින සැපසම්පත් රටට ජනතාවට බරක් ලෙස පවසමින් ජනතා උද්ඝෝෂණ ආරම්භ වූ අතර බැංකොක් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ මේ විරෝධතාවල පෙරමුණ ගනිමින් සිටී.

## කොරෝනා නිසා අධි සුඛෝපභෝගී කෲස් නැව් කුණුගොඩට



කොවිඩ් වසංගතය ලොව පුරා පැතිර යෑම හේතුවෙන් වැඩකට ගත නොහැකි තත්ත්වයකට පත්ව ඇති අධි සුඛෝපභෝගී පාවෙන තරු පහේ හෝටල් වැනි වූ කෲස් නැව් අබලි ද්‍රව්‍යවලට අලෙවි කිරීමට කෲස් සමාගම සූදානම් වන බව වාර්තා වේ. කොවිඩ් හේතුවෙන් කෲස් සංචාර අවලංගු කෙරුණු අතර, තවත් වසර කිහිපයක් යන තුරු කෲස් සංචාර ක්‍රියාත්මක කළ නොහැකි බව පෙනෙන බැවින් එම නැව්වලින් තවදුරටත් වැඩක් ගත නොහැකි තත්ත්වයකට පත්ව තිබේ. මේ නැව් වෙනත් සමාගම්වලට අලෙවි කිරීමට උත්සාහ දැරුවද කිසිවකු ඒවා මිලදී ගැනීමට කටයුතු කර නැත. එබැවින් මේ වන විටත් කෲස් නැව් සංචාර ක්‍රියාත්මක කරන රටවල වරායවල සීමිත ඉඩකඩෙහි එම නැව් අපහසුවෙන් නවතා ඇති බව වාර්තා වේ. ඉදිරියේදී මේ නැව් අබලි යකඩවලට විකුණා දැමීමට එම සමාගම තීරණය කර ඇතැයි පැවසේ.

## කොකේන් පුරවාගත් මෙක්සිකෝ ගුවන්යානය කඩා වැටේ

මෙක්සිකෝවේ අගනුවර වන මෙක්සිකෝ සිටි වෙතින් ගුවන්ගත වී පියාසර කරමින් සිටි පෞද්ගලික සැහැල්ලු ගුවන් යානයක් නගරයෙන් තරමක් ඈත ප්‍රදේශයකට කඩා වැටී තිබේ. මෙසේ කඩා වැටීමට හේතුව වී ඇත්තේ රජයේ බලධාරීන් සහිත තවත් ගුවන් යානා කිහිපයක් මගින් මේ ගුවන් යානය ලුහුබැඳීමය. කඩා වැටුණු ගුවන් යානයේ කොකේන් ටොන් බාගයකට අධික ප්‍රමාණයක් තිබූ බව පසුව මෙක්සිකෝ මත්ද්‍රව්‍ය නාශක අංශය පවසා තිබිණි. ලැබුණු ඔත්තුවකට අනුව මේ කොකේන් පුරවා ගත ගුවන් යානය ලුහු බැඳගොස් ඇති අතර අධික වේගය හේතුවෙන් යානය පාලනය කර ගැනීමට නොහැකි වීම, එය බිමට ඇද වැටීමට හේතුව ලෙස හඳුනාගෙන තිබේ.

## අන්වර් මැලේසියාවේ අලුත් ආණ්ඩුවක් හදන්න යයි

මැලේසියාවේ විපක්ෂ නායක අන්වර් ඊබ්‍රාහීම් පසුගිය අඟහරුවාදා එරට රජු හමුවී තමන්ට නව ආණ්ඩුවක් බිහි කිරීමේ හැකියාව ඇතැයි පවසා සිටියේය. මේ සඳහා ඔහු සතුවන ශක්‍යතාව ඔප්පු කිරීමට අදාළ අස්සන් සහිත ලියවිලිද ඔහු රජු වෙත ඉදිරිපත් කළ බව වාර්තා වේ.
ඔහු රජුට පවසා ඇත්තේ මේ වන විට මැලේසියාවේ අගමැති ධූරය හොබවන මුහ්යාදීන් යසීන් අසාර්ථක බවත්, ඔහු ඉල්ලා අස්විය යුතු බවත්ය. ආසන 222කින් සමන්විත මැලේසියානු පාර්ලිමේන්තුවේ ආසන 120කට අධික ප්‍රමාණයක සහයෝගය තමන්ට හිමි බව ඔහු එහිදී ප්‍රකාශ කර තිබේ.

## කිලිමන්ජාරෝ ගිනි ගනී



අප්‍රිකාවේ උසම කඳු මුදුන වන කිලිමන්ජාරෝ කන්ද ගිනි ගැනීමට ලක්ව තිබේ. පසුගිය සඳුදා සිට හදිසියේ ඇතිවූ මේ ගින්න නිවා දැමීමට ටැන්සානියාවේ වැසියන්, ගිනි නිවන භටයන් මෙන්ම පාසල් සිසුන් ද මේ දක්වා එකසේ වෙහෙස වෙමින් සිටින බව වාර්තා වේ.
ගින්න මැඩ පැවැත්වීම අසීරු වී ඇත්තේ කඳු මුදුන සිසාරා හමා යන සුළං හේතුවෙනි.
මේ දක්වා ගින්න පාලනය කිරීමට හැකිවූ බවට වාර්තාවක් ලැබී නැත. එමෙන්ම ගින්න ඇති වීමටද හේතුවද මේ දක්වා වාර්තා වී නැත.
කිලිමන්ජාරෝ මුදුන මුහුදු මට්ටමේ සිට මීටර් 6000ක් උසින් පිහිටා ඇති අතර වාර්ෂිකව සංචාරකයන් 50,000කට අධික සංඛ්‍යාවක් මේ කඳු මුදුන තරණය කිරීමට එක් වෙති.

## රුසියාවෙන්, ඇමරිකාවෙන් තවත් පිරිසක් අභ්‍යවකාශයට

රුසියාව සහ ඇමරිකාව නියෝජනය කරමින් තවත් අභ්‍යවකාශගාමීන් තිදෙනෙකු අන්තර්ජාතික අභ්‍යවකාශ මධ්‍යස්ථානයට නික්ම ගොස් තිබේ. ඇමරිකාවේ නාසා ආයතනය නියෝජනය කරමින් කේට් රුබින්ස්ද, රුසියාව නියෝජනය කරමින් සර්ගේයි රසිකොව් සහ සර්ජි කුඩ් සෙවර්ජ්කෝ මෙලෙස අභ්‍යවකාශ ගත වී තිබේ.
දකුණු කසකස්තානයේ සිට ඔවුන් රැගත් රොකට්ටුව පියාසර කර ඇත්තේ පසුගිය බදාදා දිනයේදීය. බ්‍රහස්පතින්දා දින උදෑසන වන විට ඔවුන් අභ්‍යවකාශ මධ්‍යස්ථානය හා සම්බන්ධ විය.

# විසඳුම සාමූහිකව සෙවිය යුතුයි



නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමයේ සම ලේකම් ඇන්ටන් මාකස්

**ඇඟලුම් කර්මාන්තයක් ලංකාවේ නැහැ. ලංකාවේ තියෙන්නේ 'ටේලර් ෂොප්' විතරයි. ඇඟලුම් කර්මාන්තයක් නම් ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය සියලු දේ ලංකාවේ නිෂ්පාදනය කරන්නට අවශ්‍යයි. එහෙම කරන කර්මාන්තයක් ලංකාවේ නැති නිසා තමයි කෝවිඩ් - 19 ලංකාවේ ඇඟලුම් කර්මාන්තයට දරුණු ආකාරයට බලපෑම් කළේ. සියලු අමුද්‍රව්‍ය අපි පිටරටින් ආනයනය කරන නිසා සැපැයුම්දාමය තමයි දෙදරා ගියේ.**

ඒ නිසා ඇඟලුම් කර්මාන්තයට මෙය දරුණු ලෙස බලපෑම් කළා. කෝවිඩ් - 19 නිසා ඇඟලුම් කර්මාන්තයට බරපතළ පාඩුවක් සිදුවෙනවා කියලා. ඇඟලුම් කර්මාන්තකරුවන්ගේ සංසදය සහ ඊට අදාළ ආයතන දිගින් දිගටම මාර්තු මාසයේ ප්‍රකාශයට පත් කරනු ලැබුවා. ඒ වගේම ඒ අය කියා සිටියා ලක්ෂ පහක් වන ඇඟලුම් සේවිකාවන්ගෙන් ලක්ෂ තුනක් සේවයෙන් ඉවත් කරන්නට වෙන බව අපි සොයා බැලුවිට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කරන ලද සමීක්ෂණයක් අනුව 2019 සංඛ්‍යා ලේඛන සහ 2020 මැයි, ජූනි, ජූලි, අගෝස්තු සැප්තැම්බර් අපනයනය කරන ලද ඇඟලුම් වටිනාකම සහ 2019 ඇඟලුම්වල වටිනාකමයි සංසන්දනය කරද්දි එහි ලොකු වෙනසක් නැහැ.

වැදගත්ම දේ තමයි 2019 සිටි සේවක සංඛ්‍යාවට වඩා අඩු සේවක සංඛ්‍යාවක් තමයි 2020 නිෂ්පාදන කරල තියෙන්නේ. ඒ අනුව අඩු පිරිවැයකින් වැඩි නිෂ්පාදනයක් ලබාගෙන ඇති නිසා මෙය ඇඟලුම් නිෂ්පාදනයට ආශිර්වාදයක් බවට පත්වෙලා තියෙනවා. අනෙක් පැත්තේන් බලන විට සේවකයන්ට තමයි මෙහි උපරිම හානිය සිදුවුණේ. සේවකයන් විශාල සංඛ්‍යාවක් සේවයෙන් ඉවත් කරලා තියනවා නිල නොවන ආකාරයට. එමෙන් ම වැඩකරන සේවකයන් කර්මාන්තශාලාවල සේවකයන්ගේ අප්‍රේල් මාසයේ ප්‍රසාද දීමනාව ඉවත් කර තියෙනවා. දවස් දහයයි වැඩ නොකර සිටියේ නමුත් ඒ අයගේ ප්‍රසාද දීමනාව කපා හැර තියෙනවා. එමෙන්ම සේවකයන්ට දුන්න ප්‍රවාහන පහසුකම් ඉවත් කර තියෙනවා. සේවකයන්ට දුන්න පැමිණීමේ දීමනාව නවතා තිබෙනවා. ඇත්ත වශයෙන්ම බරපතළ හානියක් කර්මාන්තශාලා හිමියන්ට ඇතිවෙන්නෙ නැහැ.

ඉදිරියේදී මේ ඇඟලුම් කර්මාන්තශාලා වසා දැමීමේ තත්ත්වයකට පත් වෙන්නෙ නැහැ. එය තීරණය වන්නේ අපි කොතරම් දුරට සාර්ථක වෙලා තියෙන අලුත් තත්ත්වය සමනය කරගන්න අපි සමර්ථ වෙනවාද කියන කාරණාව මතයි. එය ඉක්මනින්ම සමනය කරගැනීමට ගත යුතු පියවර වහා වහා ගත යුතුයි. බ්‍රැන්ඩික්ස් ආයතනයේ වූ සිදුවීම නිසා ඇඟලුම් කර්මාන්තයටම ලොකු කැළලක් වුණා. ඒ කැළල මැකීමට කටයුතු කළ යුතුයි.

ඒ අයට ඇතිවන චෝදනා කිසිදු සැකයකින් තොරව නිර්දෝෂීභාවය සනාථ කළ යුතුයි. මේ සමාගම පමණක් නොවෙයි එවැනි තත්ත්වයක් ඇඟලුම් කර්මාන්තයේම ඇති නොවීමට අනෙකුත් කර්මාන්ත ශාලා කටයුතු කළ යුතුයි. ඇඟලුම් කර්මාන්ත ශාලා 200ක් තියෙනවා ඒ කර්මාන්තශාලා එකක්වත් සාමූහික ගිවිසුමක් ඇති කරගෙන නැහැ වෘත්තිය සමිති සමඟ. මේ අය වෘත්තීය සමිති හදන්න දෙන්නේ නැහැ. ප්‍රධාන පෙළේ ඇඟැලුම් සපයන්නන් ලෙස ඉන්නේ ඉතා සුළු ආයතන ප්‍රමාණයක් පමණයි. නමුත් ඒ එකකවත් වෘත්තිය සමිති නැහැ.

දැන් ඇතිව තිබෙන තත්ත්වයට විසඳුම් සොයන්න ආණ්ඩුවට හෝ හාම්පුතුන්ට හෝ වෘත්තිය සමිතිවලට හෝ තනිවම හැකියාවක් නැහැ. අපි තුන්ගොල්ලොම එකතු වෙලා මේ තත්ත්වයට මුහුණ දීම කළ යුතු සාමූහික කටයුත්තක්.

# යැපෙන මානසිකත්වයෙන් ඉදිරියේදී මිදිය යුතුයි



ලංකා වෙළඳ කාර්මික හා පොදු කම්කරු සංගමයේ (CMU) ලේකම් සිල්වෙස්ටර් ජයකොඩි

**කෝවිඩ් - 19 හරහා අභියෝගයට ලක් වී ඇති ප්‍රධාන ආර්ථික සාධක දෙකක් වෙනවා. එකක් සංචාරක ක්ෂේත්‍රය, අනෙක ඇඟලුම් ක්ෂේත්‍රයයි. යුරෝපීය රටවල් සඳහායි අපි ඇඟලුම් නිෂ්පාදනය කරනු ලබන්නේ. ඒ රටවල්වල සිදුවී ඇති ආර්ථික තත්ත්වය අනුව ජීවිතය ගෙනයාමේ ප්‍රශ්නය මිසක ඇඳුම් පැළඳුම් විලාසිතා පිළිබඳව අවධානය යොමු කරන්න බැහැ.**

ඇඟැලුම් සම්බන්ධයෙන් අවධානය අඩුවෙලා තියෙනවා. එක් එක් භාණ්ඩ සපයන සංනාමයන්ගේ ඇණවුම් ප්‍රමාණය සීමා වෙලා තියෙනවා.

මාර්තු, අප්‍රේල් මාසයේ සිට ඇඟලුම් කර්මාන්තයේ ගැටලුවක් ඇතිවෙලා. ඒ නිසා අසතුටුදායක තත්ත්වක් දැනට පවතින්නේ.

හෙට දවස ගැන කියන්න බැහැ. දැනට තියෙන්නේ අවිනිශ්චිතභාවයක්. නමුත් අපි අසුබ ආකාරයෙන් සිතන්නට අවශ්‍ය නැහැ.

අපි තිස්වසරක් පුරා යුද්ධයක් සමඟ ජීවත් වූ පිරිසක්. ඒ නිසා අපිට අභියෝග හුරුයි.

ජපානය, චීනය වගේ රටවල් කෝවිඩ් - 19 සමඟ ජීවත්වීමට හුරුවෙලා තියෙනවා. අපේ රටෙත් මැලේරියාව තිබුණා. දැනට ඩෙංගු තියනවා. ඒ වගේම කෝවිඩ් - 19 තියෙනවා.. අපිට කළ හැකි වන්නේ ප්‍රවේශම්කාරිව ඉන්න එක පමණයි.

මේවා පිළිබඳව වසන් කරමින් කටයුතු කරන්නට ගියොත් තවත් උග්‍ර අතට හැරෙන එකයි වෙන්නේ.

විවෘතව අපේ පැත්තෙන් ගත යුතු ආරක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුයි.

මේ තත්ත්වය යටතේ යටතේ අපි ජීවත්වීමට හුරුවිය යුතුයි. අපිට රටක් ලෙස ඇඟලුම් කර්මාන්තයට යම් අවදානමක් තියනවා. මෙහි වගකීම ඇත්තේ රජයටයි. ආණ්ඩුව ජනතාවට දුන් ජාතික ආර්ථික ප්‍රතිපත්තිය අනුවයි ජනතාව ක්‍රියා කරන්නේ .

එක් එක් ආණ්ඩු එක් එක් ආර්ථික ප්‍රතිපත්ති ගැන කිව්වා. සංචාරක කර්මාන්ත ගැන කිව්වා, ඉන් පස්සේ ඇඟලුම් කර්මාන්තයෙන් දියුණු වෙන්න පුළුවන් කිව්වා.

මේ නිසා රටේ තාරුණ්‍ය මැෂින් එකකට යට වුණා. මේ කිසි තැනක අපිට නැඟී සිටින්නට පුළුවන්ද කියන ගැටලුව තියනවා.

තරුණ පිරිසට යම්කිසි ජාතික ප්‍රතිපත්තියක් මාර්ගෝපදේශයක් අත්වැලක් පෙන්විය යුතුයි . ඇඟලුම් කර්මාන්තයෙන් දියුණු වෙන්නට හෝ ඒ මත යැපෙන මානසිකත්වයට අපි වැටෙන්නට අවශ්‍ය නැහැ. ඒ මානසිකත්වයෙන් ඉදිරියේදී අපි මිදිය යුතුයි.

# ලොකුම අර්බුදය අමු ද්‍රව්‍ය ගෙන්වා ගැනීමයි



ලංකා බැංකු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් රන්ජන් සේනානායක

**පොදුවේ මම මේ කාරණාව දකින්නේ ඇඟලුම් කර්මාන්තය රටේ විදේශ විනිමය උපයන ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙසයි. එය ආරක්ෂා කරගැනීම ඉතාම වැදගත්. රජය ඇඟලුම් කර්මාන්තයේදී නියැළෙන ව්‍යාපාරිකයන්ට විශාල සහන ලබා දීලා මේ කර්මාන්තය දියුණු කිරීමට කටයුතු කරනවා.**

කෝවිඩ් - 19 නිසා මුහුණ දෙන ලොකුම අර්බුදය වන්නේ අමු ද්‍රව්‍ය ගෙන්වා ගැනීමයි. අනෙක් කාරණාව ඒ කර්මාන්තවල යෙදිලා ඉන්න සේවක සම්පත ආරක්ෂා කරගත යුතුයි. මේ තත්ත්වයත් අනුව ආණ්ඩුව මීට වඩා මැදිහත් වෙන්න අවශ්‍යයි. කෝවිඩ් - 19 තත්ත්වයත් සමඟ ගම්පහ දිස්ත්‍රික්කයේ ඇඟලුම් කර්මාන්තශාලා වැසී තියෙනවා. ගම්පහ දිස්ත්‍රික්කය හරහා විශාල කර්මාන්ත ශාලා ප්‍රමාණයක් කේන්ද්‍ර ගත වී තියෙනවා.

කෝවිඩ් - 19 හරහා මෙවැනි තත්ත්වයක් ඇති නොවෙන්නට ඒ ආයතනවල වැඩ කරන සේවකයන්ගේ අනෙකුත් යටිතල පහසුකම් පිළිබඳ සොයා බැලීමට බලධාරීන් කටයුතු කළ යුතුයි. ඒ පිරිස්වලට ආහාර පාන පවා අහිමි වන තත්ත්වයක් ඇති වුණා. රටේ ශ්‍රම බලකාය අනිවාර්යෙන් ආරක්ෂා විය යුතුයි.

මහ පරිමාණ ව්‍යාපාරකයන් ගැටලු හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් රජය විසින් යමක් කළ යුතුයි. කෝවිඩ් -19 හරහා ඇඟලුම් කර්මාන්තශාලාවලට කෝටා ලැබෙන්නේ නැහැ. ඒ නිසා සේවකයන් කප්පාදුව සිදුවෙනවා. රැකියා වියුක්තියක් ඇතිවීම ඉදිරියේදී සිදුවිය හැකියි. ඇඟලුම් කර්මාන්ත සහ කෝවිඩ් - 19 හරහා ඇතිවන බලපෑම සම්බන්ධයෙන් යම් කොමිසමක් හෝ පත් කළයුතුයි. සේවක - සේව්‍ය පාර්ශ්ව ආණ්ඩුව වෘත්තිය සමිති මේ සම්බන්ධයෙන් ඒකාබද්ධව විසඳුම් සෙවිය යුතුයි.

ඉක්මනින් මේ සඳහා විසඳුමක් ලබා දියයුතුයි පළමු වැනි වතාවේදී සංචාරක ව්‍යාපාර විදෙස් ව්‍යවසායකයන් ආයෝජකයන් සියල්ලට විදේශ විනිමය ලැබෙන මාර්ගවලට පහර වැදුණා. මෙවර ඇඟැලුම් ක්ෂේත්‍රයට පහර වැදීම ඉතාමත් අහිත කරයි. ගැඹුරින් බලා මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. හෙට දවසේ අනතුරුදායක තත්ත්වයක් ඇතිවිය හැකියි. ඉදිරියේදී මේ කර්මාන්තශාලා ආශ්‍රිත විශාල පිරිසක් ඉන්නවා.

මේ රෝගය වැළඳීමට ඉඩ කඩ වැඩියි. කර්මාන්තශාලා වසා දැමීම තුළ පාඩුව අතිවිශාලයි. ඇතැම් ආයතනවලට දරාගැනීමට නොහැකි තත්ත්වයක්. මේ කොවිඩ් රැල්ල සමඟ ඇඟලුම් කර්මාන්තයට අතිවිශාල පාඩුවක් සිදුවෙනවා. ව්‍යාපාරිකයන්ගේ පාර්ශ්වයෙන් සහ සේවකයන්ගේ පාර්ශ්වයෙන් විමර්ශනය කරලා මේ සඳහා නුදුරේදී විශ්ලේෂණාත්මක පිළිතුරු සෙවිය යුතුයි. රජයත් මැදිහත්විය යුතුයි. රටක් ලෙස සියලු පාර්ශ්ව එකතු වී කඩිනම් විසඳුමක් සෙවිය යුතුයි.

# ඇඟැලුම් ක්ෂේත්‍රයේ හෙට දවස






සංවාදය - සුභද්‍රා දේශප්‍රිය

කෝවිඩ් - 19 වසංගතය මේ වනවිට රට පුරා ව්‍යාප්ත වෙමින් පවතී. එකිනෙකාට අත දිගු කරගනිමින් මෙහි සුල මුල සම්බන්ධයෙන් නොයෙක් පිරිස් අර්ථකථන කරමින් සිටිති. මේ කටකතාවල සත්‍ය අසත්‍යතාව කෙසේවෙතත් මේ වන විට රට පුරා බොහෝ දිස්ත්‍රික්කවල රෝගීන් හමුවී ඇති අතර රටේ බොහෝ ස්ථානවලින් ආසාදිතයන් වාර්තාවන තත්ත්වයක් ඇතිවීම තුළ නැවත මේ වසංගතය පැතිරයාමේ භීතිය ජනතාව තුළ මතුවී තිබේ.

ඇඟලුම් කර්මාන්ත ශාලා ආශ්‍රිත සේවකයන් මෙයින් දැඩි ලෙස පීඩාවට පත්ව ඇත. පසුගිය කාලය පුරා ඇද වැටුණු ආර්ථික අවපාතයෙන් ගොඩ ඒමට සැරසීමත් සමඟ මේ වසංගතය පැතිරීම නිසා සංචාරක ව්‍යාපාරය සහ විදේශ ව්‍යවසායකයින්ගෙන් ලැබෙන විනිමය සියල්ල අහිමි වී යාමත් සමඟ නැවත ඇඟැලුම් ක්ෂේත්‍රය ගොඩ නැඟීමට යත්න දරන අවස්ථාවක මේ ව්‍යසනය සිදුවීය.

මේ තත්ත්වය රටක් ලෙස දරා ගත නොහැකි විශාල පාඩුවකි. මේ පැතිර යන කෝවිඩ් - 19 රැල්ලත් සමඟ ඉදිරියේදී බරපතළ ආර්ථික පීඩාවකට පත් වීමට ඉඩ නොතැබිය යුතුය. ඒ වෙනුවෙන් රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවකයන්ගේ මැදිහත් වීම අත්‍යවශ්‍යය.

අවදානම ඇති ප්‍රදේශවල කර්මාන්තශාලා විශාල සංඛ්‍යාවක් වසා දමා ඇත. සේවකයන්ට නිසි ආකාරයෙන් අයිතීන් ලබා දුන්නේද යන්න පිළිබඳවද ඇතැමුන් අතර මතයක් පවතී. එසේ නිසි සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කළා නම් සේවකයන් මෙසේ අනතුරට පත් නොවන බව ඇතැම්හු පවසති. ජන ජීවිතය කඩා වට්ටමින් දියුණු රටවල පවා ආර්ථිකය බිමට සමතලා කරමින් මේ වසංගතය පැතිර යද්දී රටක් ලෙස අපි තවමත් නැඟී සිටින්නෙමු.

රටේ ජීවනාලියක් බඳු ඇඟැලුම් කර්මාන්තය රැක ගැනීම අප කාගේත් යුතුකමකි.

# අපේ ආකල්පවල වෙනසක් ඇතිකර ගත යුතුයි



ජාතික වෘත්තිය සමිති සම්මේලනයේ සම කැඳවුම්කරු සහ ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝසප් ස්ටාලින්

**ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන දායකත්වය දක්වන්නේ වැටුප් ආර්ථිකය පද්ධතියට එකතු වීම තුළ. එහෙම තත්ත්වයක් මත කෝවිඩ් - 19 ව්‍යාප්තියත් සමඟ එය වඩා අර්බුදකාරී තත්ත්වයකට යනවා. ඇත්තටම මෙය වළක්වාගත යුතු දෙයක්. අපි දන්නවා පසුගිය කාලයේ කෝවිඩ් - 19 පාලන තත්ත්වයක පැවැතියා.**

ඇඟැලුම් කම්හල හරහා පැමිණි මේ පොකුර සම්බන්ධයෙන් තවම පැහැදිලි තත්ත්වයක් නැහැ. විවිධ කටකතා පමණයි තියෙන්නේ. ආර්ථිකය දුවවන්න මේ ක්ෂේත්‍රය අවශ්‍යයි. ඇතැමුන් කියන ආකාරයට පිටින් කණ්ඩායමක් පැමිණියේ නම් ඒ කණ්ඩායම යම්කිසි නිරෝධායන පිළිවෙත් මග හැර තියනවා නම් ඒ ගැන සොයා බැලිය යුතුයි. රජය නිවැරැදි නිරෝධායන පිළිවෙත් අනුගමනය කිරීම සම්බන්ධයෙන් සහතික වෙනවා. ඒ අතරවාරයේ මේ පිරිස්වලට යම් කිසි ආකාරයට එය මඟ හැරී ඇත්නම් එහෙම වුණේ ඇයි කියලා අපි සෙවිය යුතුයි. බරපතළ අර්බුදයකට ඇඟලුම් සේවිකාවන් පමණක් නොවේ මුළු රටම පත්වෙලා තියනවා. විදුහල්පතිවරුන්ගේ කැපවීමෙන් තමයි විභාග පවත්වන්නේ. ඔවුන් මේ කටයුතු කරන්නේ අනතුර දරාගෙන. මේ තත්ත්වය මත මානසිකත්වය කඩාවැටීම සුළු පටු නැහැ . මෙතැන තියෙන භයානක තත්ත්වය මේ ආසාදනයට ලක්වෙලා තියන පිරිස සමාජයට වරදක් කරලා වගේ ජනතාව ඒ අය දෙස බැලීමයි. එය අපි කරන වරදක්. බොහෝ වෙලාවට කම්කරු සහෝදරයො රෝග වාහකයෝ ලෙසින් රටට වරදක් කරන්නේ කියලා ඇතැමුන් කියනවා.

මේ ආකාරයට ගියොත් ඇඟලුම් ක්ෂේත්‍රයට යොමු වෙන අය අඩුවීමක් සිදුවෙනවා . ඒ පැතිරීම වෙන්නේ ස්වභාවයෙන් මේ හරහා ඇඟලුම් ක්ෂේත්‍ර ආශ්‍රිත පිරිසට බියක් මතු වෙලා තියනවා. මේ අයට විශ්වාසනීයත්වය තහවුරු කළ යුතුයි. ආසාදිතයන් පිළිබදව ඇති ආකල්ප වෙනස් කරන්නට අවශ්‍යයි. එසේ නොවුණහොත් ඇඟලුම් කර්මාන්තය කඩා වැටෙනවා. ඇඟලුම් කර්මාන්තශාලාවල ඉදිරිය සම්බන්ධයෙන් දෘෂ්ටිමය වෙනස්කමක් නොවුණහොත් කර්මාන්තය කඩා වැටෙනවා. කම්කරු අයිතීන් කොයිතරම් දුරට කප්පාදු වෙලා තියනවාද කියන කාරණාව අපිට මෙහිදි දක්නට ලැබෙනවා. බොහෝ තැන්වල ඍජුව නැතුව වක්‍රාකාරයෙන් සේවකයන් සේවයට යොදවා ඇති තත්ත්වයක් තුළ වක්‍රාකාර කප්පාදුවට ලක් කරනවා. අපි දුටුවා සේවකයන්ට වෙලා තියෙන අසාධාරණකම්. දැනට මේ සේවකයන්ට වෙලා තියන අසාධාරණය අනාගතයේ දී ඇඟලුම් කම්හල් සේවකයන්ට සිදුවීමට ඉඩ නොතැබිය යුතුයි. කෝවිඩ් -19න් එළිදරව් වෙලා තියන මේ සත්‍ය සෙවිය යුතුයි. මෙහිදි පාලකයන්ගේ පැත්ත නොව සේවකයන් කෙරෙහි අවධානය යොමුකර කම්කරු අමාත්‍යාංශය හරහා මේ සේවකයන් වෙනුවෙන් මැදිහත්ව කටයුතු කළ යුතුයි. එසේ නොමැතිනම් ඇඟලුම් කර්මාන්තය ඉදිරියට ගෙන යන්න බැරි වෙනවා.

# ආණ්ඩුවේ අවධානය මදි



අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ

**ඇඟලුම් කර්මාන්තය පමණක් නොවෙයි පෞද්ගලික අංශයේ ආයතන කිහිපයක් අර්බුදයට ලක්වෙලා තියෙනවා. මේ වෙන විට නිදහස් වෙළෙඳ කලාපයේ සහ පෞද්ගලික අංශයේ ආයතන කිහිපයක් වහලා දාලා තියෙන්නේ. ඊට බාහිරිනුත් ආයතන කිහිපයක් වහලා දාලා තියනවා. පෞද්ගලිකව ඒ අය පීසීආර් පරීක්ෂණත් සිදු කරනු ලබනවා. ආණ්ඩුව මේ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ.**

මේ පෞද්ගලික රෝහල් නියම කළේ ඇයි? මෙය ජාවාරමක් කරගන්න මේ අය උත්සාහ කරන්නේ. කටුනායක වැඩ කරන සේවකයන් සහ අනෙක් ආයතනවල සේවකයන් එක බෝඩිමක ඉන්නවා. ආපහු මේ අය වැඩට ගියාම රෝගය පැතිරීම ගැන අපිට කියන්න පුළුවන්ද? ආණ්ඩුව මේ සඳහා මග පෙන්වීමක් කළ යුතුයි. පෞද්ගලික අංශයේ සේවකයන්ගේ රැකියාව නැතිවෙනවා. අපි ආණ්ඩුවට මේ සඳහා මඟ පෙන්වීම් දහයක් නිකුත් කරලා තියනවා. මෙහෙම ගියොත් ආයතන වහන්න වෙයි. අපි මේ යෝජනා ගෙන ආවේ ඒ නිසයි. ඒ අනුව අවධානය පහව යන තෙක් පෞද්ගලික අංශයේ ආයතනවල නිෂ්පාදන හා සේවා කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව සෞඛ්‍ය රෙගුලාසි යාවත්කාලීන කිරීම හා ඒවා අනුගමනය කිරීමට අවශ්‍ය පහසුකම් සේවායෝජකයා ඇති කළ යුතු බවට දැනුම දීම, යම් අවදානමකට ලක්ව ඇති ආයතනයක් වන්නේ නම් එහි සියලු කාර්යය මණ්ඩල පී.සී. ආර්. පරීක්ෂණවලට යොමු කිරීම හා නිරෝධායන කටයුතු සඳහා යොමු කිරීමට සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් යොමු කිරීම, රෝගීන් හඳුනා ගතහොත් එම ආයතන වසා දමා සෞඛ්‍ය නිර්දේශ අනුව විෂබීජහරණය හා නිරෝධායනයට යොමු කිරීම, සිදු කළ යුතුයි. එමෙන්ම කෝවිඩ් 19 තත්ත්වය නිසා තාවකාලිකව වසා දමන පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ලබා දීමට අවශ්‍ය උපදෙස් ලබා දීම, කෝවිඩ් 19 නිසා වසා දැමීමට ගත් අර්ධ ලෙස නිෂ්පාදනය සේවා කටයුතු සිදු කරන ආයතනවලට පැන නගින මූල්‍ය දුෂ්කරතා සඳහා රජය විසින් සහන කොන්දෙසි යටතේ පහසුකම් සැපයීම කෝවිඩ් - 19 තත්ත්වය නිසා පූර්ණ ලෙස හෝ අර්ධ ලෙස වසා දමන ආයතනවල සේවකයන්ට එම කාලය ආයතනය විසින් ලබාදෙන නිවාඩු ලෙස ලබා දීමට අවශ්‍ය මඟ පෙන්වීම, අර්ධ ලෙස සේවා පවත්වාගෙන යනු ලබන ආයතනවල සේවකයන්ටත් එම පවුල්වල සාමාජිකයන්ටත් අවශ්‍ය සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ, මුඛ ආවරණ විෂබීජනාශක ප්‍රමාණවත් පරිදි ලබාදීමට උපදෙස් දීම, නිරෝධයන ක්‍රියාවලියට භාජන වන ආයතන හා සේවකයින් සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ පරීක්ෂාව යටතේ අවශ්‍ය සෞඛ්‍ය උපදෙස් මත කටයුතු කිරීමට සැලැස්වීම හා ආහාර ද්‍රව්‍ය ලබා දීම, අවශ්‍ය උපදෙස් ලබාදීම, පෞද්ගලික අංශයේ සේවකයින් නිෂ්පාදන සේවා ක්‍රියාවලියට සම්බන්ධ කරගන්නේ නම් ඔවුන්ට පෞද්ගලික හෝ ආයතනික ප්‍රවාහන ක්‍රමවේදයකට ගෙන්වා ගැනීම හා නිවෙස් වෙත යැවීමට අවශ්‍ය පහසුකම් සැපයීම. මේ කරුණු අනිවාර්යෙන්ම ඉටු කළ යුතු වෙනවා.

# සියලු දෙනාම ආරක්ෂා සහිතව කටයුතු කළ යුතුයි



ප්‍රගතිශීලි සේවක සංගමයේ සභාපති නීතිඥ සුමිත් විජේසිංහ

**ඇඟලුම් කර්මාන්තය පමණක් නොවෙයි සමස්ත වැඩකරන කර්මාන්ත ශ්‍රමිකයන්ට ආයතනවල පිරිස්වලට කෝවිඩ් - 19 වසංගතය බලපා තියනවා. මේ තත්ත්වයෙන් මිදෙන්න සියලු දෙනා තම ආරක්ෂාව සහිතව කටයුතු කළ යුතුයි.**

වෙනත් සේවාවන් වගේ ඇඟැලුම් ක්ෂේත්‍රය නිවසේ රැඳී සිට කළහැකි කාර්යයක් නොවෙයි. ඒ නිසා ඒ අයගේ සේවය ආරක්ෂිතව ලබා ගත යුතුයි.

ඒ සඳහා නිසි ක්‍රමවේදයන් අනුගමනය කරමින් ඒ සේවා ලබා ගැනීමට වග බලාගත යුතුයි. ආයතනවල වගකීමක් තමයි උපරිම ආරක්ෂාව ලබාදීම. වෙනදාට වඩා සෞඛ්‍ය උපදෙස් අනුව සේවය ලබා දීම කළ යුතුයි. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය ඇතුළත විශාල සේවක පිරිසක් මේ තර්ජනයට මුහුණ පා සිටිනවා. රටක් ලෙස අපි මේ අවස්ථාවේ ඒ දෙස පැහැදිලි මනසින් යුතුව බැලිය යුතුයි.

විශේෂයෙන්ම මේ ආයතනවලට පුහුණු වෛද්‍යවරයෙකුගේ සේවය ලබා දිය යුතුයි. එවැනි කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ දී ඇති අවදානම අපි දැන් අත් විදිනවා.

මේ වන විට සංචාරක කර්මාන්තය, විදෙස් ව්‍යවසායක මුදල් සියල්ල ඇන හිට ඇති අවස්ථාවක,

අපි ජනතාවගේ පැත්ත මෙන්ම රටක් ලෙස හෙට දිනයේ නැඟී සිටින්නේ කෙසේද කියන කාරණාව පිළිබඳව සැලකිලිමත් විය යුතුයි.

අපි අනිවාර්යෙන්ම ඇඟලුම් කර්මාන්තය පවත්වාගෙන යන්න ඕන. ඇඟලුම් කර්මාන්තය කඩා වැටීමකට ලක්නොවී පවත්වා ගැනීමට අපි වග බලා ගත යුතුයි.

අපේ රටට විශාල වශයෙන් විදේශ විනිමය ලබන කර්මාන්තයක් වන ඇඟලුම් කර්මාන්තය රැකගැනීම සියලු පාර්ශවයන්ගේ වගකීමක්. රාජ්‍ය පෞද්ගලික දෙපාර්ශවයටම රටේ ආර්ථිකය ගොඩනැංවීමේ වගකීම මේ වන විට පවතිනවා.




සැකසුම: හර්ෂා සුගතදාස

**පිළිතුරු සැපයීම - කායික රෝග විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලක**

## ඉකිලි කැසිල්ලට ප්‍රතිකාරයක්

ප්‍රශ්නය :- මම 22 හැවිරිදි යුවතියකි. මම දිනපතා ස්නානය කර පිරිසිදු ඇඳුම් ඇන්දත් මගේ ඉකිලි කැසීමක් ඇත. විෂබීජ නාශක දියර දමා යට ඇඳුම් සෝදමි. එහෙත් ඉකිලි කැසීමේ අඩුවක් නැත. ෆාමසියෙන් ක්‍රීම් වර්ගයක් මිලදී ගෙන ආලේප කළත් කැසීම අඩු නැත. ප්‍රතිකාරයක් බලාපොරොත්තු වෙමි.

**ඇඹරළුව - ගීතිකා දෙව්මිණි ලියනාරච්චි**

පිළිතුර :- ඉකිලි කැසීම ඇති වන්නේ ඒ ආශ්‍රිත ප්‍රදේශවල තෙතමනය රැඳී තිබීම නිසා දිලීර හට ගැනීමෙනි. එබැවින් දිලීර නාශක ආලේපන වර්ගයක් පාවිච්චි කළ යුතුය. ඇතැම්විට ආලේපන වර්ගවලට අමතරව ඖෂධ පානය කිරීමට ද සිදු විය හැකිය. එබැවින් කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකු හෝ චර්ම රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමු වීම වඩාත් සුදුසුය.

## වසර 40ක් පුරා දියවැඩියාව



ප්‍රශ්නය :- මම අවුරුදු 83 ක විශ්‍රාමික පිරිමි අයෙක්මි. වසර 40ක පමණ කාලයක් පුරා දියවැඩියා රෝගයෙන් පෙළෙමි. ඊට දිනපතා ඖෂධ ලබා ගන්නා අතරවාරයේදී මීට වසර 8කට පෙර හදවතට ස්ටෙන්ට් එකක් යොදා ඇත. දැනට මට වකුගඩු ආබාධයක් තිබෙන බව මට ප්‍රතිකාර කරන වෛද්‍යවරු පවසති. වකුගඩු බද්ධ කර ජීවත් වීමේ අදහසක් මට නැත. මගේ වයස අනුව එය අනවශ්‍ය යැයි මට සිතේ. දැනට මම බෙහෙත් වර්ග 10ක් පාවිච්චි කරමි. දැනට මා කළ යුත්තේ කුමක්ද කියා නිශ්චිතව සිතා ගැනීම අසීරුය. ඔබතුමාගෙන් උපදෙසක් බලාපොරොත්තු වෙමි. ඊට අමතරව මම මලබද්ධයෙන් පීඩා විඳිමි. මලපහ සිදු වන්නේ දින 3කට වරක් දැඩි වේදනාවකිනි. ඊට ද සහනයක් අපේක්ෂා කරමි.

**සියඹලාණ්ඩුවේ කුලසිරි පියසේන**

පිළිතුර :- දියවැඩියාව රෝගයට කාලයක් ගොදුරු වීමෙන් වකුගඩු අකර්මණ්‍ය තත්ත්වයක් ඇති විය. ඔබ මුහුණපා තිබෙන්නේ එවැනි තත්ත්වයකටයි. වකුගඩු අකර්මණ්‍ය අවස්ථාවේදී ඖෂධීය ප්‍රතිකාර, කෘත්‍රිම රුධිර පිරිපහදුකරණය සහ වකුගඩු බද්ධ කිරීම යනුවෙන් අවස්ථා 3ක් තිබේ. ඔබ මුහුණදී සිටින්නේ වකුගඩු ක්‍රියාකාරිත්වයේ කිනම් අවස්ථාවටදැයි සටහන් වී නොතිබීම ලොකු අඩුපාඩුවකි. වකුගඩු අක්‍රිය වූ පමණින් බද්ධ කිරීමට අවශ්‍ය නොවේ. ඖෂධීය ප්‍රතිකාර සහ කෘත්‍රිම රුධිර පිරිපහදුකරණය මඟින් රෝගී තත්ත්වය පාලනය කර ගත හැකිය. ඔබ සිටින්නේ කුමන අවස්ථාවේදැයි වෛද්‍යවරයාගෙන් විමසා ඔබට වකුගඩු බද්ධ නොකර රෝගී තත්ත්වය පාලනය කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගත හැකිය. වකුගඩු අකර්මණ්‍ය වීමත් සමග ඇති විය හැකි කායික දුර්වලතා මඟ හරවා ගැනීමට අනිවාර්යයෙන් ඖෂධීය ප්‍රතිකාර ලබා ගත යුතුය. ඔබ මුහුණදී සිටින මලබද්ධය වළක්වා ගැනීමට ලැක්ටොලොස් වැනි විරේක ඖෂධීය සිරප් වර්ගයක් පාවිච්චි කරන්න.

## ජීවිත කාලයටම බෙහෙත් ගත යුතුද

ප්‍රශ්නය :- මගේ වයස අවුරුදු 43 කි. මීට වසර 8 කට පමණ පෙර සිට කරකැවිල්ල හා වමනය ඇති විය. මහනුවර මහ රෝහලෙන් ප්‍රතිකාර ගතිමි. වෛද්‍යවරුන් පවසන්නේ මෙම රෝගය Vertigo බවයි. මෙය සුව කළ නොහැකි බව ද පැවසීය. මර්දනය කිරීම පමණක් කළ හැකි බව සඳහන් කරමින් BETASERCE 32 සහ වමනයට ස්ට්‍රෝජරන් ලබා දී තිබේ. දැන් මගේ අලුත්ම තත්වය වන්නේ ඇවිදීමට අපහසුව සහ සමබරතාව ගිලිහී යෑමයි. මම පෙළෙන්නේ ජීවිතාන්තය දක්වා ප්‍රතිකාර ගත යුතු රෝගයකින් ද? ඉදිරියේදී තවත් දරුණු වේදැයි බියෙන් පසුවෙමි.

**කරලියැද්ද - එච්.එම්. මනෝජ් හේරත්**

පිළිතුර :- Vertigo රෝගී තත්ත්වය ඇති වන්නේ වියපත් වීමත් සමඟිනි. එහෙත් ඔබේ වයස අනුව ඔබට මෙම රෝගය වැලඳී තිබීමෙන් මෙය වෙනත් රෝගයක ආරම්භයක් විය හැකිදැයි සැකයක් ඇති විය. මෙය ද්විතීය රෝග ලක්ෂණයක් විය හැකිය. ඔබ MRI පරීක්ෂණයකට භාජනය වූවාදැයි සඳහන් කර නැත. ඔබේ රෝග තත්වය ගැන නැවත විමසීමක් කළ යුතුය. එබැවින් ස්නායු ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයකු හමුවන්න.

## තේ කහට බීම අගුණද?



ප්‍රශ්නය :- මම 53 හැවිරිදි කාර්යාලයක සේවය කරන කාන්තාවක්මි. මම දැන් කිරිපිටි පානයෙන් වැළකී වසර 15ක් පමණ ගත වී තිබේ. මම උදෑසනටත් පානය කරන්නේ තේ කහට කෝප්පයකි. කහට තේ පානය කිරීමෙන් ගැස්ට්‍රික් රෝගයට ගොදුරු වන බව මගේ මිතුරියෝ පවසති. එහි සත්‍යතාවක් තිබේද?

**මාදින්නාගොඩ - රූපිකා නිර්මලි තිසේරා**

පිළිතුර :- තේ සහ කෝපි යන පානයන් හී අඩංගු වී තිබෙන රසායනික සංයෝග නිසා ඇතැම් විට ආමාශයේ යම් යම් වෙනස්කම් සහ ආම්ලික තත්ත්වයන් ඇති විය හැකිය. එහෙත් එය බහුලව සිදු වන්නේ කැෆීන් අඩංගු කෝපි පානය කිරීමෙනි.

**ඔබේ සෞඛ්‍ය ගැටලු මතු දැක්වෙන ලිපිනයට යොමු කරන්න.**
**සුව හමුව, සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10.**



# රට මවිත කළ පුවත් ලියූ ලේක්හවුස් මාධ්‍යවේදියා



● **ජානක පෙරේරා**

**අද දක්නට තිබෙන තාක්ෂණික විස්කම් නොතිබුණු යුගයේ පුවත්පත් කලාවේදීන් ගේ දස්කම් දන්නා වත්මන් පරපුරේ අය ඇත්නම් ඒ ඉතා ටික දෙනෙකි. නම් වශයෙන් කිව හැකි එවන් සිංහල සහ ඉංග්‍රීසි වාර්තාකරුවන් බොහෝ දෙනෙකු සිටි නමුත් ඔවුන් සැම දෙනෙකු ගැන ලියන්නට මෙහි ඉඩ නැත. එබැවින් මෙම ලිපිය එවැනි එක් ශූර ඉංග්‍රීසි පුවත්පත් කලාවේදියෙකු පිළිබඳවය. ඔහු නම් දශක පහක් (1925-1976) පුවත් වාර්තාකරණයේ යෙදී සිටි එම්. එෆ්. එල්. (ෆ්‍රෙඩ්) ද සිල්වාය. ඔහු පුවත්පත් කලාවේදී වෘත්තීයට සම්බන්ධ වන කාලයේ (1925) රූපවාහිනී, ජංගම දුරකථන, ෆැක්ස් යන්ත්‍ර, ෆොටෝ කොපි යන්ත්‍ර, කොම්පියුටර් සහ අන්තර්ජාල පහසුකම් යනාදි කිසිවක් නොවීය. තිබුණේ කේබල් පණිවුඩ ක්‍රමය සහ සීමිත සාමාන්‍ය දුරකථන (landline) පහසුකම් පමණි. ඒ මෙරට මෙරට පළමු ගුවන් විදුලි සේවය ඇරඹූ අලුතය. වාර්තාකරුවන්ගේ මෙවලම් වුයේ උල්පත් පෑන (fountain pen) සටහන් පොත සහ සාමාන්‍ය යතුරුලියනයයි.**

මෝදර ද ලාසාල් විදුහලේ ගුරුවරයකු ලෙස ජීවිත ඇරඹූ එම්. එෆ්. එල්. ද සිල්වා ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජේවර්ධනයන් හමුවීමෙන් පසු ඩේලි නිව්ස් පුවත්පතට එක් විය. ඒ කාලයේ එම පුවත්පත් කාර්යාලය පිහිටියේ කොළඹ කොටුවේ බේලි විදියේය. වත්මන් ලේක්හවුස් ගොඩනැගිල්ල එවකට ඉදිවී තිබුණේ නැත.



බ්‍රේස්ගර්ඩ්ල් සමසමාජ පක්ෂ සාමාජිකයන් සමඟ හොරණදී. (වමේ සිට දකුණට බ්‍රේස්ගර්ඩ්ල්ට පිටුපසින් සිටගෙන) ෆිලිප් ගුණවර්ධන, විල්මට් ඒ. පෙරේරා සහ ලෙස්ලි ගුණවර්ධන. (ඉඳගෙන) ටයි පටියක් පැළඳ සුදු ඇඳුමින් සැරසී බ්‍රේස්ගර්ඩ්ල් අසල උපැස් යුවලක් පැළඳ ඉඳගෙන සිටින්නේ කොල්වින් ආර් ද සිල්වාය.

එය ඉදිවුයේ ඉන් සිවුවසකට පසුව, එනම් 1929 දීය.

සිල්වාගේ වෘත්තීය සගයෙක් සහ ලියුම්කරුගේ ලේක්හවුස් ජ්‍යෙෂ්ඨ සමකාලීන ක්ලැරන්ස් ප්‍රනාන්දු පැවසූ අන්දමට ඔහු ගේ දස්කම් ඉස්මතු කළ ඉතාමත් ආන්දෝලනාත්මක සිද්ධියක් වුයේ එවකට මෙරට බ්‍රිතාන්‍ය යටත්විජිත රජය මවිතයට පත්කරමින් රහසේ කළ සම්මුඛ සාකච්ඡාවකි. එහි පසුබිම පටන් ගැනුණේ මාක් ඇන්තනි බ්‍රේස්ගර්ඩ්ල් නම් තරුණ ඕස්ට්‍රේලියන් සුදු ජාතිකයා 1936 අප්‍රේල් 4 වැනිදා ලංකාවට පැමිණි පසුය. එවකට මෙරට වතුකරය සුදු වතුපාලකයන්ගේ රාජධානියක් විය. මධ්‍යම කඳුකරයේ මඩුල්කැලේ වත්තේ නවක සහකාර වතුපාලකයෙකු (creeper) ලෙස බ්‍රේස්ගර්ඩ්ල්ට පත්වීමක් ලැබිණ. සහකාර වතුපාලකයන් සින්නදොරේ (SD) යනුවෙන් හැඳින්වුණු අතර වතු අධිකාරිවරයා හැඳින්වුණේ පෙරියදුරේ (PD) යනුවෙනි. දක්ෂ ලෙස වැඩකෙළාත් සින්නදොරේට පෙරියදුරේ තත්වය දක්වා උසස් විය හැකිව තිබුණා පමණක් නොව ඉන් පසු අතට පයට සේවකයන් ඇතුළු සිය මව්බිමේදී නොලැබෙන පහසුකම් සහ වරප්‍රසාද මෙරටදී ලැබිය හැකි විය.

එහෙත් මානව හිතවාදී පෙරළිකාර වාමාංශිකයකු වූ ඇන්තනි බ්‍රේස්ගර්ඩ්ල් ගේ අවධානය යොමු වුයේ තමාට ලැබිය හැකිව තිබූ එම 'රජ සැප' වලට නොව මෙරට සුදු පාලකයන් දකුණු ඉන්දියාවේ අන්ත දුගී ජනපිරිස් මෙරටට ගෙන්වා ගෙන ඔවුන් වතු කම්කරුවන් ලෙස අර්ධ වහල් සේවයේ යෙදවීම නිසා ඔවුන් විඳි අපමණ දුක් ගැහැට වෙතය. මේ තත්ත්වය නිසා එවකට 24 වැනි වියේ සිටි බ්‍රේස්ගර්ඩ්ල් මෙරටට පැමිණ සය මසක් ඉක්මෙන්නට පළමු අලුතින් පිහිටුවා තිබූ ලංකා සමසමාජ පක්ෂය වෙත නිතැතින්ම තල්ලු විය. කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි එය ලංකාවේ පළමු මාක්ස්වාදී පක්ෂය විය. ඊට දේශපාලන පදනම සැපයුවේ මෙරට සම්ප්‍රදායික ස්වයං පෝෂිත කෘෂිකාර්මික සමාජය උඩුයටිකුරු කළ බ්‍රිතාන්‍ය වෙළෙඳ ආර්ථිකය හේතුවෙන් මෙරට බිහිවූ පන්ති අරගලයයි. ඒ වනවිට සමසමාජ පක්ෂය වතුකරයේ බලගතුම පක්ෂය විය.

බ්‍රේස්ගර්ඩ්ල් ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය දැඩි ලෙස හෙළා දැක්කා පමණක් නොව ඇතැම් විට කලිසම වෙනුවට ඇන්දේ සරමය. එය මෙරට සුදු පාලකයන් තවත් කුපිත කළේය. වසර 1936 දෙසැම්බරයේ ඔහු සමසමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභිකයෙකු බවට පත්විය. ඒ ගැන බලවත් සතුට පළකරමින් සමසමාජ පක්ෂ නායක ආචාර්ය එන්. එම්. පෙරේරා, බ්‍රේස්ගර්ඩ්ල් සමඟ නාවලපිටිය නගරයේ වතු කම්කරුවන් දෙදහසක් සහභාගී වූ රැස්වීමක් අමතමින් මෙසේ ප්‍රකාශ කෙළ්ය.

"සහෝදරවරුනි මම තමුන්නාන්සේලාට කියන්න කැමතියි අපට දැන් සුදු සහෝදරයෙකුත් ඉන්නවා (අත්පොළසන් හඬ). මම දැන් බ්‍රේස්ගර්ඩ්ල් සහෝදරයාට ආරාධනා කරනවා ඔබලා අමතන ලෙස." බ්‍රේස්ගර්ඩ්ල් ඉංග්‍රීසියෙන් කළ සිය කතාවේදී මෙරට සුදු පාලකයන් ලේ උරා බොන්නන් ලෙස හඳුන්වා කම්කරුවන්ට තම නිදහස සහ අයිතිවාසිකම් දිනාගැනීමට නැගී සිටින ලෙස රැස්වීමේ සිටි පිරිස දිරිගැන්වීය. ඒ කාලයේ පැරණි ටයිම්ස් ඔෆ් සිලෝන් සමාගම විසින් පළකරනු ලැබූ ටයිම්ස් පුවත්පත මේ සිද්ධිය සම්බන්ධයෙන් සිටියේ සුද්දන්ට පක්ෂපාති ස්ථාවරයකය. එය මේ පුවත පළ කළේ.

BRACEGIRDLE MUST BE BUNDLED OUT
NOW: ARREST THE REDS WHO FLOU THE LAW

(බ්‍රේස්ගර්ඩ්ල් වහා පිටුවහල් කරනු: නීතිය කඩන රත්තන් වහා අත්අඩංගුවට ගනු) යන සිරස්තලය යටතේය. ටයිම්ස් පුවත්පත හැඳින්වුණේ සුදු වතුපාලකයන්ගේ පුවත්පත ලෙසය. සුදු තරුණයෙකු විසින්ම මෙරට සුදු වතු පාලකයන්ගේ නොපනත්කම් වලට විරුද්ධව ස්වදේශික කම්කරුවන් උසිගන්වමින් දිගටම කළ ප්‍රකාශ මෙරට බ්‍රිතාන්‍ය පාලකයන්ට ඉවසුම් නොදෙන්නක් විය. බැරිම තැන එවකට මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර රෙජිනල්ඩ් එඩ්වඩ් ස්ටබ්ස් පැය හතළිස් අටක් ඇතුළත බ්‍රේස්ගර්ඩ්ල් ලංකාවෙන් පිටුවහල් කරන ලෙසට ආඥාවක් නිකුත් කෙළ්ය. එහෙත් බ්‍රේස්ගර්ඩ්ල් සහ සමසමාජ පක්ෂය නීතිමය පදනමක් නොමැති එම ආඥාවෙන් මෙල්ල නොවූහ. කිසිදු නඩු විභාගයක් නැතිව, ඇපැලක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොදී යමෙකු පිටුවහල් කිරීමට අසීරු බව ඔව්හු දැන සිටියහ. මේ අතර බ්‍රේස්ගර්ඩ්ල් හිටිහැටියේ 'අතුරුදහන්' විය. ඔහුට කුමක් වුවාද, ඔහු කොහේද යන කිසිවක් සොයාගැනීමට පොලිසියට නොහැකි විය.

වසර 1937 මැයි දිනය දා දසදහසක් සමසමාජ පාක්ෂිකයෝ 'අපට බ්‍රේස්ගර්ඩ්ල් ඕනෑ', 'ස්ටබ්ස් පිටුවහල් කරනු' යනුවෙන් සඳහන් බැනර් රැගෙන පෙළපාළියේ ගියහ. මේ අතර බ්‍රේස්ගර්ඩ්ල් ගැන සොයමින් සිටි එම්. එෆ්. එල්. ද සිල්වාට ඔහුගේ සමසමාජ මිතුරෝ ඉතා රහසිගතව බ්‍රේස්ගර්ඩ්ල් සමඟ සම්මුඛ සාකච්ඡාවක් ලබාදීමට කැමති වූහ. ඒ සඳහා යොදාගත් දිනයේදී ඔවුහු සිල්වාගේ දෑස් බැඳ මෝටරියකින් බ්‍රේස්ගර්ඩ්ල් සැඟවී සිටි ස්ථානයට ගෙන ගියහ. සිල්වා සමඟ එහි ගිය අනෙක් දෙදෙනා නම් සමසමාජ පක්ෂයේ ලෙස්ලි ගුණවර්ධන සහ වර්නන් ගුණසේකරය. (ඒ රහසිගත ස්ථානය පිහිටියේ කොළඹ ගාලු මුවදොර බව සිල්වා දැනගත්තේ පසුවය) බ්‍රේස්ගර්ඩ්ල් සමඟ සිල්වා කළ පුවත්පත් සාකච්ඡාව 1937 මැයි 5 වැනිදා ඩේලි නිව්ස් පුවත්පතේ පළ වූ විට මෙරට සුදු පාලකයෝ, පොලිසිය, ටයිම්ස් පුවත්පතේ වාර්තාකරුවෝ සහ සාමාන්‍ය ජනයා උඩගොස් බිම වැටුණහ. ඇත්ත වශයෙන්ම බ්‍රේස්ගර්ඩ්ල්ට සහ සමසමාජ පක්ෂයට වුවමනා වුයේ ඔහු පොලිසියෙන් සඟවා තැබීමට වඩා යටත්විජිත රජය සමච්චලයට ලක් කිරීමය. ඒ උපක්‍රමය සාර්ථක විය.

ඊට ටික දිනකට පසු බ්‍රේස්ගර්ඩ්ල් සුදු කබායක් සහ සුදු කලිසමක් හැඳ ලේ රතුපැහැති ටයිපටියකින් සැරසී සැඟවී සිටි තැනින් එළියට අවුත් පනස්දහසකින් සමන්විත කම්කරු රැලියකට සහභාගී විය. එහිදී ඔහු පැවසුවේ ලංකාව පාලනය කරන "බේබදු සුද්දන් ගොනුස්සන්ට වඩා විසකුරු බැවින් ඔවුන් පාගා චප්ප කළ යුතුයි" යනුවෙනි. පසුදා පාන්දරම බැටන් පොලු රැගත් පොලිස් කණ්ඩායමක් සමසමාජ පක්ෂයට අයත් ගොඩනැගිල්ලකදී ඔහු අත්අඩංගුවට ගත්හ. එහෙත් බ්‍රේස්ගර්ඩ්ල් පිටුවහල් කිරීමේ ස්ටබ්ස් ආණ්ඩුකාරයාගේ ආඥාවට විරුද්ධව සමසමාජ පක්ෂය පැවරූ නඩුවෙන් ආණ්ඩුකාරයා පරාජයට පත්විය. වසර 1937 මැයි 18 වැනිදා දුන් නඩු තීන්දුවෙන් බ්‍රේස්ගර්ඩ්ල් නිදහස් වූ අතර එම වසරේ ඔක්තෝබරයේදී ඔහු ලංකාවෙන් පිටව ගියේ නිදහස් මිනිසකු ලෙසය. බ්‍රේස්ගර්ඩ්ල් සිද්ධිය ලංකාවේ නිදහස් අරගලයේ වැදගත් අවස්ථාවක් වූ අතර එය මෙරට වමේ ව්‍යාපාරයට (පසු කාලයේ එහි ඉරණම කුමක් වුවද) ශක්තියක් විය.

සිල්වාගේ පුවත්පත් දිවියේ හොඳ මිතුරෙකු වුයේ නිදහසින් පසු මෙරට තුන්වැනි ලකිසුරු වූ සර් ඔලිවර් ගුණතිලකය. ඔහු දෙවන ලෝක යුද සමයේ මෙරට සිවිල් ආරක්ෂක කොමසාරිස්, ඩී. එස්. සේනානායක රජයේ ස්වදේශ ඇමති සහ ලන්ඩනයේ ලංකා මහ කොමසාරිස් යන තනතුරු දරූ අයෙකි. ඉතා රාජකාරි බහුල පුද්ගලයකු වූ ඔහුට මුළු දවස පුරාම වාගේ අමුත්තන් හමුවීමට සිදුවිය. සියලු කැබිනට් රහස් දැන සිටි ඔහුට කෙළින්ම දුරකතනයෙන් කතා කිරීමට අවසර ලැබූ පුවත්පත් වාර්තාකරුවන් අතළොස්සෙන් කෙනෙකි එම්. එෆ්. එල්. ද සිල්වා. සර් ඔලිවර් ඔහු ඇමතුවේ එම්. එෆ්. එල්. යන මුල් අකුරුවලිනි. සර් ඔලිවර්ගේ රාජකාරි බහුලත්වය නිසා සිල්වා ඇතැම් විට ඔහු සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වූයේ සර් ඔලිවර් නාන කාමරයේ නාමින් සබන් ගාන අතරතුරේය!

ඒ කාලයේ අද මෙන් මයික්‍රෝකැසට් රෙකෝඩර් (සාක්කුවේ ගෙනයා හැකි කුඩා පටිගත කරන යන්ත්‍ර) නොතිබූ බැවින් සර් ඔලිවර් කියූ සැම දෙයක්ම සිල්වාට ලඝු ලේඛන ක්‍රමයෙන් (shorthand) සටහන් කරගන්නට සිදුවිය. සිල්වා බොහෝවිට සතියකට තුන්වරක් සර් ඔලිවර් හමු විය. එසේ ලබාගත් තොරතුරු සියල්ලම අනෙක් පුවත්පත් වලට නොලැබුණු සුවිශේෂී වාර්තා විය.

දිනක් සර් ඔලිවර් සමඟ සිල්වා කතාකරමින් සිටින විට සේවකයෙක් කලබලයෙන් දිවැවිත් සර් ආ. ත. රණසිංහ ලකිසුරුතුමා හමුවීමට පැමිණි සිටින බව පැවසීය. එය වැදගත් තොරතුරක් විය හැකි බව සිල්වාට ඉවෙන් මෙන් වැටහිණි. ඒ සමඟම සර් ඔලිවර් සිල්වාට දුන් සංඥාවක් සමඟ ඔහු 'අතුරුදහන්' විය.

ආ. ත රණසිංහ විශිෂ්ට සිවිල් සේවා (රාජ්‍ය පරිපාලන) නිලධාරියකු ලෙස වසර හතළිහක පමණ කාලයක් තුළ රටේ ඉහළ තනතුරු දැරූ අතර කැබිනට් ලේකම්වරයකු සහ පසුව මහ බැංකුවේ තුන්වැනි අධිපතිද විය. වෙන කිසිවකුත් 'පෙනෙන්නට නොසිටි' කාමරයට පැමිණි ඔහු සහ සර් ඔලිවර් අතර උණුසුම් විවාදයක් ඇතිවිය. එහෙත් පසුදා උදේ ඒ වචන හුවමාරුව ගැන පළවූ පුවතින් ආ. ත රණසිංහ පමණක් නොව කැබිනට් මණ්ඩලය ද කැලඹුණි. සර් ඔලිවගේ අනුදැනුමෙන් සිල්වා කාමරයේ හිස් අල්මාරියක් තුළ සැඟවී සිට ඒ කරුණු සටහන් කරගත් බව ඔව්හු නොදත්හ. වෙළඳ කටයුතු වාර්තා කිරීමද සිල්වාගේ කටයුත්තක් විය. ඒ කාලයේ කොළඹ කොටුවේ පිහිටි ලංකා වෙළෙඳ සංගමයේ ලේකම් විටේකර් අහංකාර සුද්දෙක් විය. සිල්වා කිහිප වතාවක් විටේකර් මුණ ගැසුණු පසු සුද්දා ඔහුට කීවේ තමාට 'සර්' යනුවෙන් ගෞරව සම්ප්‍රයුක්තව ඇමතිය යුතු බවයි.

ඊට සිල්වා ප්‍රතිචාර දැක්වුයේ සුද්දාගේ මුහුණටම මහ හයියෙන් සිනාසීමෙනි. සිල්වා එතැනින් පිටව ගියේද මහ හයියෙන් සිනාසිමෙන්ය. සුද්දාට කර කියාගත හැකි දෙයක් නැති විය.සර් ඔලිවර් හැරුණු කොට එම්. එෆ්. එල්. ද සිල්වාට නිරතුරුවම හමුවූ අනෙක් ප්‍රසිද්ධ පුද්ගලයන් අතර මෙරට පළමු අගමැති ඩී.එස්. සේනානායක, සර් ඩී. බී. ජයතිලක, ජේ.ආර්. ජයවර්ධන, ඩඩ්ලි සේනානායක, ක්ලෝඩ් කොරෙයා, චාල්ස් බටුවන්තුඩාව, එස්. ඩබ්ලිව්. ආර්.ඩී බණ්ඩාරනායක. කම්කරු නායක ඒ. ඊ. ගුණසිංහ සහ ජී. ජී. පොන්නම්බලම්ද විය. විදෙස් රටවල් කිහිපයකම සංචාරය කළ සිල්වාට හමු වූ ජනනායක නායිකාවන් ගෙන් සමහරෙකි ඉන්දියාවේ මහත්මා ගාන්ධි, ජවහර්ලාල් නේරු සහ ඉන්දිරා ගාන්ධි, බ්‍රිතාන්‍යයේ ලොයිඩ් ජෝජ්, හැරල්ඩ් මැක්මිලන් සහ හැරල්ඩ් විල්සන්, කැනඩාවේ පියර් ටෲඩෝ, චීනයේ චෞ එන්. ලායි, යුගොස්ලවියාවේ මාෂල් ජොසිප් ටිටෝ සහ තායිලන්තයේ ෆීල්ඩ් මාෂල් පිබුල් සොන්ග්‍රාම්. එම්. එෆ්. එල්. ද සිල්වා ලේක් හවුසියේ සේවය කළ කාලයේදී ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු සහ ප්‍රවෘත්ති වාර්තාකරු, තානාපති සේවා වාර්තාකරු, ඩේලිනිව්ස් ප්‍රවෘත්ති කර්තෘ, සහ එවකට ලේක්හවුස් කළමනාකාර අධ්‍යක්ෂ එස්මන්ඩ් වික්‍රමසිංහ (රනිල් වික්‍රමසිංහගේ පියා) ගේ පුද්ගලික සහකාර යන තනතුරු දැරීය. ඔහු වසර විස්සක් ප්‍රංශ පුවත් සේවයේ ලංකා නියෝජිත ලෙසද කටයුතු කෙළ්ය.

එම්. එෆ්. එල්. නොකැලැල් චරිතයකින් යුත් ඉතාමත් කැපවීමෙන් තම රාජකාරිය ඉටු කළ සුවිශේෂ දක්ෂතාවලින් යුත් පුවත්පත් කලාවේදියෙක් විය. පසු කෙලෙක රොයිටර් පුවත් සේවයේ කාර්යාලයේ ප්‍රධානියා වූ ඩෝල්ටන් ද සිල්වා ඔහුගේ පුතෙකි.

තරංග




# ඩී. ඇස්. ට ඩඩ්ලිට නැතිව බැරි වූ කරෝලිස්



● ඒ. ඩී. රන්ජිත් කුමාර

**හාමිපුතුන් දෙදෙනකු තම දෙනෙත මෙන් රැක බලා ගත් සුවච සේවකයකු ගැන අප්‍රකට තොරතුරු කාලයාගේ වැලිතලාවෙන් වැසී ගොස් ඇත. මේ සේවකයා ගේ හාම්පුතුන් දෙදෙනා ලංකා දේශපාලන ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ අගමැතිවරු දෙදෙනෙකු වීම විශේෂයකි. මේ අගමැතිවරුන් වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය දොන් ස්ටීවන් සේනානායක හෙවත් මහාමාන්‍ය ඩී.ඇස්. සේනානායක මහතා හා මෙරට සිවුවරක් අග්‍රාමාත්‍ය වූ ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක මහත්වරුන්ය.**

ඔවුන්ගේ සුවච කීකරු සේවකයා වූයේ එස්.ඒ. කරෝලිස් ය. කරෝලිස් ගැන මුල්වරට රට ම දැන ගත්තේ මහාමාන්‍ය ඩී.ඇස්. සේනානායක මහතාගේ හදිසි අභාවය නිසා ය. ඒ තොරතුරු "සිළුමිණ" ඇතුළු පුවත්පත්වලින් මහජනතාවට දැන ගන්නටලැබුණි.

ඔහුට කවුරුත් කරෝලිස් කීවත් ඔහු ගේ උප්පැන්නේ තියෙන නම ඇස්.ඒ. කොරනේලිස් ය.

"උඹට තියෙන නම කියන්න අමාරුයි. අද හිටං උඹ කරෝලිස්. ඒක මේ රටේ හිටිය ලොකු ප්‍රභූවරයෙක්ගේ නමක්. ධර්මපාල උත්තමයාගේ පියාගේ නම. උඹ ඒ නම ආරක්ෂා කරන්ඩ ඕනෑ.

තේරුණා ද?" මහාමාන්‍ය ඩී.ඇස්. සේනානායක විසි හැවිරිදි වියේ සිටි තරුණයාට කීය.කරෝලිස් බෝතලේ වලව්ව කිට්ටුවම 1897 අඹේපුස්ස උපන් කෙනෙකි. 1917 වසරේ සිට විසි හැවිරිදි ඔහු ඩී.ඇස්. සේනානායක මහතාගේ පුද්ගලික සහයකයා වී ඇත.

"අගමැති හාමුදුරුවන්ට හැම දේකට ම මාව නැතිව බැරි වුණා. කොටින්ම මම නැතුව එතුමට කිසිම පෞද්ගලික දෙයක් කර ගන්න බෑ. එතුමාගේ ඇඳුම් සෝදා පිරිසිදු කොට ඒවා මැදලා, විතරක් මදි ඒවා අන්දවන්නත් ඕනෑ. මේ කටයුතු වලින් මම ලොකු සතුටක් ලැබුවා."

1952 වසරේ අගමැතිතුමාගේ අභාවයෙන් පසු ඉරිදා ලංකාදීප පත්‍රයට කරෝලිස් කළ විස්තරයකින් වාර්තා වේ.

"කරෝලිස්.... කරෝලිස්..." පාන්දර 5 ට අගමැතිතුමාගේ ඇමතුම ය.

"හාමුදුරුවනේ," කියමින් කරෝලිස් කිරි කෝපි කෝප්පයකුත් අරගෙන යයි. ඉන්පසු අගමැතිතුමා උදෑසන පත්තර කියවයි. සිංහල පත්තරවල ප්‍රවෘත්ති කියවන්නේ කරෝලිස් විසිනි. පත්‍රවල පළ වෙන කාටූන් චිත්‍ර දැකලා මහ හයියෙන් කොක් හඬ දී සිනාසෙයි. ඉන්පසු අගමැතිතුමාට එන සිංහල ලියුම් හඬ දී කිව යුතුයි. කරෝලිස් කියා ඇති ආකාරයට අගමැතිතුමාට කන්තලේ, ගල්ඔය, මින්නේරිය පැත්තේ ගොවියන්ගෙන් වැඩිපුරම ලියුම් එන බව ය. ඒවා සාවධානව අසා සිට ඒ ලියුම්වල ලිපින පොතක ලියා ගනී.

"අගමැති හාමුදුරුවන් කන්තෝරුවට යන්න සූදානම් වන විට එතුමාගේ අත් ඔර්ලෝසුවයි, සල්ලි තියෙන පොකැට්ටුවයි ගෙනත් දීම මගේ තවත් රාජකාරියක්. කන්තෝරුවට ගෙනියන්ඩ ඕනෑ කරන ලියුම්, දිනපොත් හිසේ දාන තොප්පිය, දවල්ට බොන කිරි බෝතලයත් මම කාර් එකේ තියෙනවා. වැඩිපුරම එතුමා දවාලට ගෙදර එන්නේ නෑ. රාත්‍රියේ එතුමා ගෙදර ආවාම නාන්නට උණු වතුර සකස් කර දෙනවා. ඉන්පසු බෙහෙත් විද ගැනීමට අවශ්‍ය උපකරණ දුන්නාම ඒවා විද ගෙන රාත්‍රී කෑම ගන්නවා."

කරෝලිස් කියන ආකාරයට අගමැතිතුමා විවේකයෙන් සිටින විට මේස් බැනියම හා අල්ලි වැටුණු පට සරම ඇඳගෙන හාන්සි පුටුවට වී පොතක් හෝ ඉංග්‍රීසි පත්තරයක් කියවයි. එතුමා රාත්‍රී එකොළහට නින්දට ගොස් ඇත.

"මගේ ජීවිතේට ම අගමැති හාමුදුරුවන්ගෙන් වේවැල් පහරක් කෑ අවස්ථාවක් තියෙනවා. දවසක් සේනානායක හාමු නෝනා (අගමැති සේනානායක හාමු බිරිය මොලි සේනානායක මැතිනිය) මට ටෙලිෆොන් කරලා කිව්ව "මම දැන් ගෙදර එනවා. පන්සල් යන්න මල් ටිකක් කඩල තියන්න" කියලා. එතුමිය පැයකට පස්සේ එනකොටයි

නොව සියලුම සේවකයන් අගමැතිතුමා අතින්ම තෑගි බෝග ලබා ඇත. අගමැතිතුමාගෙන් වේවැල් කසාය නොලැබුණත් කරෝලිස් බැණුම් අසා තිබේ. ඒ අගමැති හාමුට සුළු සෙම්ප්‍රතිශ්‍යාවක් කැස්සක් පවා ඇති වූ විට එතුමාට හොරෙන් කරෝලිස් වෛද්‍යවරුන් කැඳවීම නිසා ය.

"අගමැති හාමු හිතවත්තු, මිත්‍රයෝ එක්ක අල්ලාප සල්ලාප පවත්වනවා බලං හිටින්න ආසයි."

විනෝද වූ අවස්ථා රැසක් කරෝලිස්ට මතක තිබුණි. අගමැති හාමු කිසි දිනක මත්පැන් නොබිව් බවත් තමාත් තම මිතුරන්ට ගෙවත්තේ සරුවට වැවුන පලතුරුවල යුෂ වලින් සංග්‍රහ කළ බවත්, එතුමා සතුන්ට මෙන්ම මල්වලට ආදරය කළ බවද ඔහු පවසා තිබුණි.

"දිනක් අගමැති හාමුදුරුවෝ මට කලබලයෙන් කතා කළා.

ගෙනෙන විට අගමැති හාමුට අත්වැසුම් දෙක දමා ගන්නට මෙන්ම අශ්වයා පිට නගින්න උදවු කර ඇත්තේ කරෝලිස්ය. අශ්වයා පිටින් තම හාම්පුතා සිහිසන් නැතිව වැටී රෝහල්ගත කළ බව මුලින්ම ආරංචිය ලැබුණේ ද කරෝලිස්ටය. ඔහු රෝහලට දිව ගොස් ඇත. කඳුළු පිරුණු දෙනෙතින් අගමැතිතුමා ළඟට ගිය කරෝලිස්ගේ වමතේ මැණික් කටුව ළඟින් අල්ලා ගත්තේය.

"හාමුදුරුවනේ..."

කරෝලිස් දිහා බලා අගමැතිතුමා කිසිවක් කියා ඇතත් එය ඔහුට තේරී නැත. සේනානායක හාමුට මෙන්ම එතුමාගේ පුතුන් දෙදෙනා වූ ඩඩ්ලි හාමු හා රොබට් හාමු ගැන ද කරෝලිස් තම මතකය අවදි කර තිබුණි.

"මම බෝතලේ වලව්වට එනකොට ඩඩ්ලි හාමුට (ඩඩ්ලි සේනානායක) වයස අවුරුදු පහයි. රොබට් හාමුට (රොබට් සේනානායක) වයස අවුරුදු තුනයි. මේ පුංචි හාමුලට බත් කවන්න වලව්ව වටේ ම මට දුවන්න සිදු වෙනවා. ඩඩ්ලි හාමු නං යස අගේට බත් කනවා. රොබට් හාමුට කවන්න මහන්සි වෙන්න ඕනෑ. මේ හාමුලා මට හරිම ආදරෙයි."

## සිංහල පත්‍ර හඬ නඟා අගමැතිට කියැවූයේ ද ඔහු

ඩඩ්ලි සේනානායක මහතාගේ අග්‍රාමාත්‍ය ලේකම්ව සිටි බ්‍රැඩ්මන් වීරකෝන් මහතා විසින් ලියූ "අරලිය ගහ මැදුරේ ස්පන්දනය" (Rendering Unto Caesar (සිංහල අනුවාදය - සුනේත්‍රා රාජකරුණානායක) කෘතියේ "ඩඩ්ලි ගේ ඇඳුම් පැලඳුම්" ගැන කියවෙන 170 පිටු මෙසේ සඳහන් වෙයි.

"ඩඩ්ලි ජීවිත කාලයෙන් වැඩි කොටසක් තම ඇඳුම්වල වර්ණය හෝ නිමාව ගැන එතරම් තැකුවේ නැහැ. නිවසේ සැහැල්ලුවෙන් සිටින විට ඔහු චොකොලට් පාට සේද සරමක් නොසැලකිලිමත් ලෙස බඳේ දවටාගෙන ගැටයක් දමා සිටියේය. එය බොහෝ වාර ගණනාවක් ඇඳි වග මෙන් ම ඉතා වටිනා බව ද පෙනුණු හෙයින් මට සිතුණේ එය ඔහු ගේ අම්මා ගේ පරණ සාරියකින් මස්සවා ගත්තක් විය යුතු ය කියා ය. ඩඩ්ලි ගේ දුක සැප බැලූ විශ්වාසදායක කරෝලිස් නො සිටියා නම් මේ තනිකඩයා ගේ කලිසම් දිනපතා මැදීමක් ද සිදු නොවන්නට ඉඩ තිබිණ."

ඩඩ්ලි සේනානායක මිය යාමට සතියකට පමණ පෙර රුධිර පීඩනය අධික වී කොල්ලුපිටියේ ඩර්ඩන්ස් රෝහලට ඇතුළු කළ වේලේ සිට කරෝලිස් නිදි වරමින් තම හාම්පුතු ළඟට වී සිටියේය. 1973 අප්‍රේල් 13 වැනිදා අලුත් අවුරුදු දා රාත්‍රියේ රෝහලට පැමිණි හිත මිතුරන් සමඟ විනෝද කථා කියමින් සිටි හාම්පුතා දැකීමෙන් කරෝලිස් සතුටට පත්ව සිටි බව කරෝලිස් "දිනමිණ" පුවත්පතට කියා තිබුණි. එදින රාත්‍රී 11.10 ට ඉතාමත් දරුණු අන්දමේ හෘදයාබාධයක් හට ගෙන සුළු කාලයක් තුළ එතුමා අවසන් හුස්ම හෙළු බව කරෝලිස් කුඩා දරුවකු මෙන් හඬමින් පවසා ඇත. කරෝලිස් තම අතීතය සිහිපත් කරමින් "රිවිරැස" පුවත්පතේ ගුණපාල රණසිංහට (1973 අප්‍රේල් 15 වෙනි ඉරිදා) කියා තිබූ විස්තරය මෙසේය.

"මම පළමුවෙන් ම බෝතලේ වලව්වට රස්සාවට ආවේ 1917 මැයි 23 වෙනිදා. ඒ දවස මට අදවගෙ මතකයි. එතකොට ඩඩ්ලි හාමුට යාන්තම් අවුරුදු 5ක් විතර ඇති. හාමුව ඉස්කෝලෙට වඩාගෙන ගියෙත් මම යි. එයින් පසු ඊයේ පෙරේදා ලෙඩ ඇඳට යනතුරු එතුමාගේ දුකට සැපට හැම දෙයකටම ළඟ හිටියේ මම. කෑම ටික, කිරි ටික, එදිනෙදා ඇඳුම් පවා සූදානම් කළේ මම. අගමැතිකම් ලබාගෙන එන සැරවලටත්, පැරදිලා එන අවස්ථාවලදීත් දුකටත්, සැපටත් මා එතුමා ළඟින් හිටියා. මේ කාලය තුළ අටවතාවක් මාව පිටරට ගෙන ගිහින් තියෙනවා. මේ අසනී වුණු වෙලාවෙත් සියල්ල බලා ගන්න" කියලා කිවා යැයි පවසා ඇත."



## ඩී. එස්. සමඟ එංගලන්තයට යන්න කරෝලිස් කොණ්ඩය කපයි

ඉන්පසු කරෝලිස් අගමැතිතුමාට මූණ කට සෝදා ගැනීමට අවශ්‍ය දේ සපයයි.

"මගේ ඊළඟ රාජකාරිය එතුමාගේ අසනීපයට බෙහෙත් විදීමට අවශ්‍ය දේ ළඟට දීම. හැබැයි බෙහෙත් විද ගන්නේ එතුමාමයි. සිරිතක් වශයෙන් එතුමා හැමදාම "කොන්ඩිස්" මිශ්‍ර කළ වතුරෙන් කකුල් සෝදාගෙන තෙත මාත්තු කොට පවුඩර් වගයක් දා ගන්නවා. ඊට පස්සේ අගමැතිතුමා උදේට තේ බී දිනපොත ගෙන දවසේ වැඩ කටයුතු පිළියෙල කර ගන්නවා."

ගමන් බිමන්වලට අවශ්‍ය ඇඳුම් කරෝලිස් අතින් පිළියෙල වෙයි. පන්සලට, ප්‍රසිද්ධ උත්සවයකට, රජගෙදරට, මන්ත්‍රී සභාවට, මඟුල් ගෙදරකට, ඉලව්ගෙදරකට ගැළපෙන ඇඳුම් කරෝලිස් අතින් පිළියෙල වෙයි. තේ බී අවසාන වූ පසු කකුල්වලට මේස්, සපත්තු දමන කරෝලිස් කලිසම, කමිසය, ඇඳ ගැනීමට සහාය වෙයි. එතුමා ගැළපෙන ටයිපටිය ගැට ගැසීමෙන් පසු අගමැතිතුමාට ඊළඟට අවශ්‍ය වන්නේ කෝට් එක ඇන්දවීම ය. කණ්ණාඩිය ළඟට ගොස් අගමැතිතුමා හැඩ වැඩ බලන විට එහි අඩුපාඩු සකස් කර ඇත්තේ කරෝලිස් බව කියා ඇත. අගමැතිතුමා හැම දේකටම සෙව්වේ කරෝලිස්වය. එතුමාගේ ඇඳුම් සෝදා පිරිසිදු කොට ඒවා මැදලා පමණක් නොව පැලඳුවේත් ඔහුය.

මට මතක් වුණේ මල් කඩන්න අමතක වූ බව.

අගමැති හාමු ගාවට ආපු මැතිනිය මෙහෙම කිව්වා.

"මම ආවේ කරෝලිස්ට කඩන්න කියපු මල් ගෙනියන්න."

"කරෝලිස්, කඩපු මල් අරං වරෙන්" අගමැති හාමු කියනවිට මට දෙයියෝ සිහි වුණා.

"හාමුදුරුවනේ මට... මට... මල් කඩන්න අමතක වුණා."

"අමතක වෙනව නං හිස කඩිච්චියක් දාන්න ඕනෑ." පාරක් ගැහැව්වා.

සේනානායක හාමු නෝනා මා ළඟට ඇවිත් මෙහෙම කීවා.

"කරෝලිස්ට මං හින්ද වේවැල් පාර කන්න වුණා නේද? මාත් එකක් තරහ වෙන්න එපා කරෝලිස්."

මේ සිද්ධිය වුණේ මම බෝතලේ වලව්වට වැඩට ආපු මුල් දවස්වල. එතැන ඉඳල අවුරුදු 35ක්ම අගමැති හාමු මිය යන තෙක් මට වේවැල් කසාය ලැබුණේ නැහැ."

වුඩ්ලන්ඩ් නිවසේ සේවය කරන හැම සේවකයකුගේම සැපදුක අගමැතිතුමා අසා ඇත්තේ කරෝලිස්ගෙනි. ඔවුන්ට බෙහෙත් හේත්, අඩුපාඩු බලා කරෝලිස් වාර්තා කර ඇත. සිංහල අවුරුද්දට කරෝලිස්ට පමණක්

"කරෝලිස් මට එංගලන්තයට යන්න තියෙනව මහ රැජින් වහන්සේ හමුවෙන්න. උඹත් මාත් එක්ක මේ ගමනට යන්න ලෑස්ති වෙයන්. කලිසන් කෝට් ඇඳගෙන."

"අනේ හාමුදුරුවනේ මම රෙද්ද කෝට් එක අඳින්නම්. හැබැයි මගේ කොණ්ඩයත් කපන්න ඕනෑද?"

"ඔව්... ඔව්... අද දවල් කාගිල්ස් සාප්පුවට පලයං. උඹේ ඔය බැඳලා තියෙන කොණ්ඩෙත් කප්පව ගෙන අලුත් ඇඳුම් ටිකක් මස්සව ගනිං."

එංගලන්තයට ගියත් කුඩා කළ සිටම බඳින ලද කොණ්ඩය කප්පවා ගැනීම කරෝලිස්ට ප්‍රශ්නයක් විය. අකමැත්තෙන් වුව ඔහුට එය කිරීමට සිදු විය. අගමැතිවරයා පිටරට දී කරෝලිස්ට සලකා ඇත්තේ තම මිත්‍රයකුට මෙනි.

කරෝලිස්ට 1952 මාර්තු 22 වෙනිදා කිසිදා අමතක නොවන බව පවසා තිබුණි.

"කරෝලිස් මම ගිහින් එන්නම්. කවුරු හරි ආවොත් නවතින්ඩ කියන්ඩ ඕනෑ." අන්තිමට පවසමින් අගමැතිතුමා එදා අවසන් වරට අශ්වයා පිට නැගී අරලියගහ මැදුරෙන් ගොල්ෆේස් පිටියට ගිය ගමන තමාට කිසිදා අමතක නොවන බව කරෝලිස් හැඬූ කඳුළින් පත්‍රකලාවේදීන්ට විස්තර කර තිබුණි. එදා සේවකයකු විසින් ගෙනෙන ලද අශ්වයා

අගමැතිවරුන් දෙදෙනෙකුගේ දුක සැම බලමින් සිය ජීවිතයෙන් වසර 69ක් ගත කළ කරෝලිස් නම් වූ පුංචි මිනිසාගේ නම ද බෝතලේ වලව්ව, වුඩ්ලන්ඩ් මන්දිරය, අරලිය ගහ මැදුර යන මේ

තැන්වල ඉතිහාසයේ නොමැකෙන සේ ලියවෙනු ඇත. ඩඩ්ලි සේනානායක මහතා මිය යන විට 75 වැනි වියේ පසු විය. කරෝලිස් විවාහ වී ඇත්තේ 1927 වසරේදීය. 1952 වසරේ ඔහුට විසිහතර හැවිරිදි පුතෙක් සිටි බව ද වාර්තා වී ඇත.

---

# මිතුරු පවුර



● කමල් පෙරේරා

## වතුකරයේ කඳුළු මුසු වූ 'තේ කහට'

සගිදරන් මට හමු වූයේද වතුකර තරුණ කැමරා ශිල්පීන්ගේ කුසලතා එළි දැක්වූ ලයනල් වෙන්ඩ කලාගාරයේදීය. මා මුලින්ම ඔහුගේ නම විමසූ විට මට ලැබුණ පිළිතුර වූයේ සගී නම් කෙටි නමයි. සිංහල තරුණ තරුණියන් මෙන් ඔවුන්ද කෙටි නම් භාවිතා කිරීමට රුචියක් දක්වන බව මම ඉන් තේරුම් ගතිමි. පසු ගිය සැප්තැම්බර් 26-27 දෙදින තුළ හැටන්, නුවරඑළිය, කොටගල හා බදුල්ල ආදි උඩරට තේ වතු නියෝජනය කරන යෞවන යෞවනියන් 50ක පමණ පිරිසක් අගනුවරට සම්ප්‍රාප්ත වූයේ "තේ කහට"නම් ඡායාරූප දැක්ම ඔස්සේ සිය කුසලතා ඉදිරිපත් කිරීමටය. පී. සගිදරන්ද ඒ කණ්ඩායමේ සාමාජිකයෙකි.

ඔහු වඩාත් ඇලුම් කරන්නේ කෙටි නමට බව පෙනී ගිය නිසා එතැන් පටන් මම ඔහුට සගී නමින් කතා කළෙමි.

සගී නියෝජනය කළේ බදුල්ල ප්‍රදේශයය. බදුල්ලේ හාලිඇල මොරගොල්ල තේ වතුයාය ඔහු උපන් භූමියයි. සගී පවසන ආකාරයට ඔවුන්ගේ වැඩිහිටි පරපුර තේ වතුවල ශ්‍රමය වගුරුවමින් මුළු ජීවිත කාලය පුරාම දුක් වේදනා විඳිමින් සිටිති. තවත් පරම්පරා ගණනක් ගත වන තෙක් මේ කටුක ඉරණමේ වෙනසක් සිදු වෙතැයි ඔහු විශ්වාස නොකරයි. සගී වතුකරයේ රැකියාවක් තෝරා නොගැනීමට හේතුවද එයයි.

"බදුල්ලෙ සරසවි දෙමළ විද්‍යාලෙ එස්එස්සී වෙනකන් මං ඉගෙන ගත්තා. අපෙ තාත්ත මිකැනික් කෙනෙක්. ඒ නිසා මාත් ආසා කළේ මෝටර් මිකැනික් කෙනෙක් වෙන්න. බදුල්ලෙ නයිටා එකේ කෝස් එකකුත් කළා. ටික කාලයක් මිකැනික් වැඩ කරනකොට මුලින් තිබුණ ආසාව නැතිව ගියා. ඊට පස්සෙ අයියත් එක්ක එකතු වෙලා හවුස් වයරිං කළා. ඒකත් ඉක්මනටම එපා වුණා. තවත් කාලයක් ෂෙඩ් එකකයි කඩේකයි වැඩ කෙරුවා. ඒත් ඒ එක රස්සාවක්වත් මගෙ හිතට ඇල්ලුවෙ නැහැ. ඌව අයිලන්ඩ් වත්තෙ අයිය කෙනෙක් අඳුරගත්තෙ ඔය කාලෙ තමා. එයා ෆොටෝග්‍රැපර් කෙනෙක්. එයත් එක්ක වැඩ කරනකොට තේරුණා මේක තමා මගෙ ෆිල්ඩ් එක කියලා. දැන්නම් මේක අතහැරල වෙන එකකට යන්නෙ නැහැ."



පී. සගිදරන්ද

සගීගෙ සිංහල දැනුමද මා සමග මීට කලින් කතා කළ යුවරාජන්ගේ තරමටම යහපත්ය. කිසිම පැටලිල්ලකින් තොරව ඔහු සිංහල බස හසුරුවයි. සිංහල සමාජය ඇසුරු කිරීමෙන් මෙසේ සිංහල බස හසුරුවන්නට හැකියාවක් ලද බව සගී පවසයි.

ඔහුද මේ ඡායාරූප දැක්මට නිර්මාණ කිහිපයක්ම ඉදිරිපත් කර තිබුණේය. ඒවා අතරින් වඩාත්ම මා සිත් ගත්තේ සුදු-කළු වර්ණයෙන් නිමැවුණු එකකි. අවම පහසුකම් යටතේ ක්‍රිකට් ක්‍රීඩාවේ නිරතව සිටින වතු දරුවන් කණ්ඩායමක් ඔහුගේ කැමරා කාචයට හසු වී තිබිණ. ඔවුන් ක්‍රීඩාවේ නිරතව සිටිනුයේ ක්‍රිකට් තබා වෙනත් කිසිදු ක්‍රීඩාවක් කිරීමට ඉඩකඩක් නැති ගල් පඩි පෙළක් අසලය.

"මේ ප්‍රදර්ශනයට ඉදිරිපත් වීමෙන් වතුකරේ ජීවිතේ ගැන අලුතින් යමක් ඉගෙන ගන්න ලැබුණද?" මම සගීගේ වංහුන් කතා කරන අතරවාරයේ විමසුවෙමි.

"ඇත්තටම වත්තෙ පදිංචි වෙලා හිටියට අපේ පවුලෙ කවුරුත් දැන් වත්තෙ වැඩ කරන්නෙ නැහැ. ඒ හින්දා වතු රස්සාවෙ තියෙන අමාරුකම ගැන මෙච්චර කල් මට ඒ තරන් ලොකුවට දැනිල තිබුණෙ නැහැ. පින්තූර ගන්ඩ වතුවල ඇවිදිනකොට තමා මම හරියටම දැක්කෙ වතු රස්සාව කියන්නෙ මොන වගේ එකක්ද කියලා... අපි ඒ රස්සාවෙන් ඈත් වෙලා හිටියත් අපේම නෑදැයො-හිතවතුන් කොයි තරන් දුකක් විඳිනවද කියල දැක්කහම මට මං ගැනම ඇති වුණේ ලැජ්ජාවක්.."

"ඉතිං ඔබේ නෑ-මිතුරන් වෙනුවෙන් මොනවද ඔබ ඉදිරියෙදි කරන්න බලාපොරොත්තු වෙන්නෙ...?" මම පෙරළා ප්‍රශ්න කළෙමි.

"ඇත්තටම ඒ අය වෙනුවෙන් මොනවා හරි කරන්න ඕනා. විශේෂයෙන්ම අනාගත පරම්පරාව වෙනුවෙන් යමක් කිරීම අපේ වගකීමක්. මගෙ ෆොටෝ එකේ ඉන්න ගල් පඩි පෙළ ළඟ ක්‍රිකට් ගහන ළමයි ටික දැක්කහම දරුවන්ගෙ අනාගතේ කොයි තරන් අඳුරුද කියල හිතාගන්ඩ පුළුවන් නේද? මම හිතාගෙන ඉන්නෙ හුඟක් මහන්සි වෙලා වැඩ කරලා සල්ලි ටිකක් එකතු කරගන්න... මොකද මම ටිකක් හරි ශක්තිමත් නොවී අනිත් අයට උදව් කරන්ඩ බැහැනෙ...වතුකරේ ජනයාගෙ සිතුවිලි වෙනස් කිරීම තමා මුලින්ම කරන්ඩ ඕනා වැඩේ... නැත්තං අනාගත පරම්පරාවත් ඒ විදිහටම හිතන්න පුරුදු වෙයි...මං වගේම හිතන තරුණ අයත් එක්ක එකතු වෙලා මිනිසුන්ගෙ හිත වෙනස් කිරීමේ වැඩ සටහනක් පටන් ගන්ඩයි මං හිතාගෙන ඉන්නෙ."

සගිදරන් සිය කතාව නිම කළේ අපේක්ෂාබර දෑස් මවෙත යොමු කරමිනි. ඔහුගේ ඒ සුබ ප්‍රාර්ථනා එයාකාරයෙන්ම ඉටු වේවායි මමද දැසින්ම පැවසුවේ ඔහුට සිනහවකින් සංග්‍රාහ කරමිනි.

සැමරුම් කිත් රැස



මහාචාර්ය **ජයන්ත අමරසිංහ**

## භාෂානුරාගයේ සනාතන නැණ පහන

දෙස රස රකින මුර දේවතාවන් කිසිදු පැකිළීමකින් තොරව බස නසන අයුරු මේ දිනවල බහුජන විඥාපන මාධ්‍යවල නිරන්තරයෙන් දක්නට ලැබේ. වසර තුන් සියයකකට පමණ පෙර ලංකාවට පැමිණි ප්‍රංශ තානාපතිවරයකුගේ පරපුරකින් පැවත එන ලැනරෝල් පෙළපත් නාමයට හිමිකම් කියන සාහිත්‍යධරයන් හා ශාස්ත්‍රඥයන් විසි වන ශත වර්ෂයේ මුල් භාගයේ පමණ සිට සිංහල භාෂා සාහිත්‍ය පෝෂණයෙහි ලා ඉටු කළ අමිල මෙහෙයෙන් අංශුමාත්‍රයක් පිළිබඳ මේ තීරු ලිපියෙන් මීට පෙරද පාඨක අවධානයට ලක් කෙරිණ. ජාතිකත්වය පිළිබඳ වසර දහස් ගණනක අතීත උරුමකම් ගෙන හැර පාමින් ව්‍යාජ දේශානුරාගයක් මවා පාමින් වගකිවයුත්තන් සිංහල භාෂාව පරිහාණි මුඛයට ඇද වැටෙන්නට ඉඩ හැර තිබෙන වර්තමානයේ සිංහල භාෂා අභිවෘද්ධිය සඳහා දිවි දෙවෙනි කොට විපුල මෙහෙයක් කළ සැබෑ දේශමාමකයන් පිළිබඳ ආවර්ජනය කිරීම කාලෝචිතය.

රාජකරුණාධිපති අමරකෝන් මුදියන්සේලාගේ ජූලියස් ද ලැනරෝල් උපත ලද්දේ 1896 ජනවාරි මස 14 වන දින කඩුවෙල, බෝමිරිය, කෙතේ වත්තේදීය- ඉඩම් හිමි වැවිලිකරුවකු වූ ඔහුගේ පියා පාලි, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි භාෂාවන්හි ප්‍රවීණත්වයක් තිබූ ජේම්ස් දුකී (ඩියුක්) ද ලැනරෝල් කවියාය- කටුගම්පලගේ දෝන ලුසියානා ද සිල්වා පාඨශාලා ගුරුතුමිය ඔහුගේ මවය- පුවත්පත් කලාවට හා සිංහල සාහිත්‍යයට විපුල මෙහෙයක් කළ වික්ටර් දුකී (ඩියුක්) ද ලැනරෝල් හෙවත් වී. ඩී. ද ලැනරෝල් ජූලියස්ගේ වැඩිමහලු සහෝදරයාය. බෝමිරිය රජයේ ද්විභාෂා පාඨශාලාවෙන් මූලික අධ්‍යාපනය ලද ජූලියස් ද ලැනරෝල් වැඩි දුර අධ්‍යාපනය ලද්දේ පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනෙනි. මේ කාලයේදී ජූලියස් ද ලැනරෝල් තරුණයාට විද්‍යාලංකාර පරිවේණාධිපති රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාම නාහිමියන් හා ශ්‍රීමත් ඩී. බී. ජයතිලක යන විශිෂ්ට පඬිවරුන් වෙතින් ශාස්ත්‍රෝද්ග්‍රහණය කිරීමේ භාග්‍යය ලැබිණ. බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ ශාස්ත්‍රෝද්ගහණයට පිවිසෙන විද්‍යාර්ථීන් සිංහල, පාලි, සංස්කෘත භාෂා මෙන්ම ඉංග්‍රීසි භාෂාවද විධිමත් ලෙස හැදෑරීමට වගබලා ගත් නිසා එසමයෙහි ප්‍රශස්ත බහු භාෂා ඥානයෙන් සමෘද්ධ විද්වත්හු රැසක් බිහි වූහ. ජූලියස් ද ලැනරෝල් අයත් වන්නේද එවන් බහු භාෂා ඥානයෙන් සමෘද්ධ විද්වත් පරපුරකටය. ජූලියස් ද ලැනරෝල් ගුරුවරයකු ලෙස වෘත්තීය ජීවිතය ආරම්භ කොට පසුව සිංහල බෞද්ධයා පත්‍රයේ කළමනාකාර කර්තෘ ලෙස සේවය කර තිබේ. විද්‍යාලංකාර පිරිවෙන මගින් ප්‍රකාශයට පත් කෙරුණු ප්‍රභාෂෝදය මාසික සඟරාවේ සංස්කාරකත්වයද ජූලියස් ද ලැනරෝල් විසින් උසුලන ලද බව කලුකොඳයාවේ පඤ්ඤාසේඛර මහ නාහිමියෝ පවසති.

ජූලියස් ද ලැනරෝල් සිංහල භාෂාව නගා සිටුවීමට අවශ්‍ය මූලික ක්‍රියා මාර්ග දියත් කළේ බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ජාතික භාෂා නොතකා හළ පසුබිමකය. ලෝකයේ වෙනත් ජීව භාෂාවන්ට ඇති පිළිගැනීම සිංහල භාෂාවට හිමි කර දීම සඳහා ජූලියස් ද ලැනරෝල් පුළුල් වැඩ පිළිවෙළක් යෝජනා කෙළේය. සිංහල භාෂාවට රාජ්‍ය භාෂා තත්ත්වය ලබා ගැනීම, ඒ සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේනතුවක් පිහිටුවීම, සිංහල - ඉංග්‍රීසි ශබ්දකෝෂයක් ආරම්භ කිරීම ඇතුළු වැදගත් යෝජනා කිහිපයක් එතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ යෝජනා සම්මත වූ පසු ඒවා ක්‍රියාවට නැංවීමේ භාරදූර වගකීමට උර දීමටද එතුමන්ට සිදු විය. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව ආරම්භ කළ අවස්ථාවේ එහි උපදේශක ලෙස ඉදිරි කාර්යය සැලසුම් කිරීම එතුමන්ගෙන් ඉටු වූ වැදගත් මෙහෙයකි. සිංහල ශබ්දකෝෂයක් ආරම්භ කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් වසර ගණනාවක් තිස්සේ ඩී. බී. ජයතිලකගේ පුරෝගාමිත්වයෙන් ගෙන ගිය ව්‍යාපාරයට ජූලියස් ද ලැනරෝල් පුවත්පත්වලට ලිපි සම්පාදනයෙන් විශාල අනුබලයක් ලබා දුන්නේය. 1929 වර්ෂයේ සිංහල - ඉංග්‍රීසි ශබ්දකෝෂයේ උපකර්තෘවරයකු ලෙස පත් වූ එතුමා 1959 වර්ෂය වන තුරු වසර තිහක කාලයක් ශබ්දකෝෂකරණයෙහි නිමග්න විය. රාජකීය ආසියාතික සමිතිය 1931 වර්ෂයේදී මහාචාර්ය විල්හෙල්ම් ගයිගර් පඬිතුමාගේ ප්‍රධානත්වයෙන් සිංහල ශබ්දකෝෂයේ කටයුතු ආරම්භ කළ අවස්ථාවේ විල්හෙල්ම් ගයිගර් එහි උපදේශක ලෙස කටයුතු කළ අතර උපකර්තෘ වශයෙන් වගකීම් පැවරුණේ ජූලියස් ද ලැනරෝල් වෙතය. වර්ෂ කිහිපයක් ගයිගර් පඬිවරයා සමග ශබ්දකෝෂයේ කටයුතු කිරීමෙන් ශබ්දකෝෂකරණය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත් ජූලියස් ද ලැනරෝල්, ගයිගර් පඬිවරයාගේ මග පෙන්වීම යටතේ 1935 වර්ෂයේදී ජර්මනියේ මියුනිච් විශ්වවිද්‍යාලයෙන් වාග්විද්‍යාව සහ ශබ්දකෝෂකරණය පිළිබඳ වැඩිදුර පුහුණුවක් ලැබීය. ගයිගර් පඬිවරයා සිංහල භාෂාවේ ව්‍යාකරණය නමැති ග්‍රන්ථය සම්පාදනය කරමින් සිටි අවස්ථාවේ ජූලියස් ද ලැනරෝල්ගේ ශාස්ත්‍රීය දායකත්වය ඒ කෘතියට ලැබීම නිසා ඊට ඇතුළත් විය හැකිව තිබුණු දෝෂ රැසක් මඟ හරවා ගැනීමට ගයිගර් පඬිවරයාට හැකි වූ බව ඒ කෘතියේ සංඥාපනයේ සඳහන් කොට තිබේ. සිංහල ශබ්දකෝෂයේ කටයුතු විධිමත් අයුරින් සිදු වෙමින් පැවති අවස්ථාවේ 1944 වර්ෂයේ ඒ කටයුතු ලංකා විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයට පැවරීමට බලධාරීන් ගත් තීරණයට එකඟ නොවූ ජූලියස් ද ලැනරෝල් ශබ්දකෝෂ කර්තෘ මණ්ඩලයෙන් ඉල්ලා අස් විය. ශබ්දකෝෂයේ කටයුතු සිංහල අංශයට පැවරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබුණු නිසා 1949 වර්ෂයේ ශබ්දකෝෂයේ කටයුතු ලංකා විශ්වවිද්‍යාලයේ වෙනම අංශයක් යටතට පත් කොට ප්‍රධාන කර්තෘ පදවියේ වගකීම් නැවතත් ජූලියස් ද ලැනරෝල් හට පැවරීමට බලධාරීන්ට සිදු විය. එසේ නැවත වතාවක් ශබ්දකෝෂයේ ප්‍රධාන කර්තෘ පදවියේ වගකීම් භාරගත් පසු ශබ්දකෝෂකරණය පිළිබඳ ජාත්‍යන්තර කීර්තියක් ඇති පඬිවරුන් පිරිසකගේ දායකත්වය ලබා ගෙන උසස් ප්‍රමිතියකින් යුතුව ශබ්දකෝෂයේ සියලු කටයුතු සැලසුම් කිරීමට ලැනරෝල් සමත් විය. විධිමත් ක්‍රමවේද ඇති කොට සියලු කටයුතු සැලසුම් කළ ද තමාගේ පාලනයෙන් තොර අංශවල පැවති දුර්වලතා හේතු කොට ගෙන ශබ්දකෝෂයේ සකස් කළ කොටස් නියමිත පරිදි පළ කිරීමට නොහැකි වීම පිළිබඳ කණස්සල්ලෙන් සිටි ජූලියස් ද ලැනරෝල් 1959 වර්ෂයේ ප්‍රධාන කර්තෘ පදවියෙන් විශ්‍රාම ලැබීය.

ජූලියස් ද ලැනරෝල්ගේ ශාස්ත්‍රීය සම්ප්‍රදානය සිංහල ශබ්දකෝෂයට පමණක් සීමා නොවිණ. රාජකීය ආසියාතික සමිතියේ ලංකා ශාඛාවේ සඟරාව ඇතුළු තවත් ශාස්ත්‍රීය ප්‍රකාශන කිහිපයක ඔහුගේ ශාස්ත්‍රී ලිපි රැසක් ප්‍රකාශයට පත් විය. ජූලියස් ද ලැනරෝල් ඉටු කළ ශාස්ත්‍රීය කටයුතු අතුරින් විශේෂිත අධ්‍යයනයක් ලෙස න, ණ, ල, ළ අක්ෂර සතර සිංහල ලේඛනයෙහි භාවිත වූ ආකාරය පිළිබඳ 1934 වර්ෂයේ රාජකීය ආසියාතික සමිතිය මගින් පළ කළ ප්‍රකාශනය විද්වත් සම්භාවනාවට පාත්‍ර විය. මේ ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය රත්නසිරි අරංගල විසින් සිංහලයට පරිවර්තනය කොට පරිච්ඡේද තුනකින් යුත් ප්‍රවේශයක් සහිතව ප්‍රකාශයට පත් කොට ඇති අතර එම පරිශ්‍රමය ජූලියස් ද ලැනරෝල් විද්වතාණන්ගේ ශාස්ත්‍රී සම්ප්‍රදානය අර්ඝණය කරනු වස් එතුමන්ගේ අභාවයෙන් පසු සිදු කෙරුණු වැදගත් අනුස්මරණයක් ලෙස සැලකිය හැකිය.



# පාස්කු කඳුළු කොල්ල කෑ ගැහැනිය

## පාස්කු ප්‍රහාරයේ මරණීය වේදනාවෙන් ජාවාරම් කළ කැනඩාවේ “ලාංකිය තරුව “ හෙළිදරවු වූ හැටි

● **ජාලිය වීරක්කොඩි**

**පාස්කු ප්‍රහාරය ලෝක ඉතිහාසය තුළ තබන්නේ මිනිස්සුන්ගේ අශිෂ්ට අමානුෂිකත්වයේ ප්‍රමාණය පිළිබඳ වූ බිහිසුණු මෙන්ම පිළිකුල් සහගත සටහනකි. ඒ ඛේදවාචකය අපට ඉතිරි කළේ කිසිදාක නොවියැකෙන කඳුළුය. රුධිරය මුසු වූ ඒ කඳුළු ලෝකය කම්පා කළේය. කිසිවක් කරගත නොහැකි මිනිස්සු පවා ඒ අමානුෂික ප්‍රහාරයේ වින්දිතයන් වෙනුවෙන් අඩුම තරමේ යාඥා කළහ.**

මිනී මැරීම තරමම වූ අශිෂ්ට අමනුස්සකම වන්නේ මරා දැමූ පසු ඉතිරිවන මිනී කඳුත්, මරණයේ වේදනාවත් පෙන්වා ඉන් කම්පනයට පත් වූ මිනිසුන් වංචා කිරීමය. පාස්කු ප්‍රහාරයේ දෙවන අශීලාචාර දිගුව එයය. එයත් සිදු වී තිබිණි. පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් වෙනුවෙන් සහන සැලසීම සඳහා ගොඩනැගුණු මානුෂික අවකාශය තුළ ලෝක අවධානය දිනාගෙන පරිත්‍යාගශීලීන්ගෙන් ලබා ගත් මුදල් වංචා කළ බව කියන විලිලජ්ජා නැති ව්‍යාපාරයත් එය දියත් කළ සමාජ ප්‍රතිරූපසේ සිටි පුද්ගල චරිතත් පසුගිය දා සමාජය ඉදිරියේ නිරුවත් විය.

මෙසේ හෙළිදරව් වන්නේ කැනඩාවේ ජීවත්වන ශ්‍රී ලාංකික තරුණියකි. තවම වයස අවුරුදු 21 ය. නම ඉෂිනි වීරසිංහය.

### ඉෂිනි වීරසිංහ කවුද?

ඉෂිනි වීරසිංහ යනු ඇගේ විලාසිතා සහ ජීවන රටා අන්තර්ගතය නිසා එක්සත් ජනපද ජනතාව අතර ජනප්‍රිය වූ, ඒ නිසාම සමාජයට බලපෑම් කළ හැකි රසිකයන් පිරිසක් සහිත කැනඩාවේ ජීවත්වන එක් ශ්‍රී ලාංකික තරුණියකි. ඇය ඉන්ස්ටග්‍රෑම්, ෆේස්බුක් සහ පින්ටරෙස්ට් වැනි සමාජ මාධ්‍ය වෙබ් අඩවිවල ජනප්‍රිය රූපණයක යෙදුණාය. ඉන්ස්ටග්‍රෑම් වෙබ් අඩවියේ ඇයගේ අනුගාමිකයන් ගණන 1,73 000 ක් විය. ඇය පැවතුණේ තරු ලකුණක් ලෙසය.

ඇය හැසිරුණු සමාජ මාධ්‍යවල අන්තර්ගතය වූයේ විලාසිතා, රූපලාවණ්‍ය ඉඟි හා ඇගේ ජීවන රටාව හා සම්බන්ධ රූපණ ය. එමගින් ඇය යොවුන් වියේ සහ තරුණ වැඩිහිටියන්ට බලපෑම් කළ හැකි හැකියාවක් ගොඩනගා ගෙන තිබිණි.

වර්ෂ 2019 අප්‍රේල් 21 වැනිදා පාස්කු ප්‍රහාරය එල්ල විය. ප්‍රහාරය එල්ල වුණු දිනයේම ඉෂිනි වීරසිංහ Gofundme.com නැමැති ප්‍රකට අරමුදල් ගොඩනැන්වන වෙබ් අඩවියේ පාස්කු ප්‍රහාරයේ වින්දිතන්ට උපකාර කිරීම සඳහා අරමුදල් රැස් කිරීමේ සිය ව්‍යාපෘති අවකාශය වෙන් කර ගත්තාය. මෙම ව්‍යාපෘතියේ ඉලක්කය වී තිබුණේ මැයි මස 17 දා වනවිට අරමුදල් එක් කර නිමා කර වින්දිතයන් වෙත ලබා දීම බව කියැවිණි.

අරමුදල් රැස් කිරීම සඳහා ඇය සිය ජනප්‍රියත්වය භාවිත කළාය. සැබැවින්ම ඇය ඉන් සැලකිය යුතු සාර්ථකත්වයක් ලබා ගෙන තිබිණි. සති කීපයකින් අරමුදලට කැනේඩියානු ඩොලර් 82 882ක් එක් විය. එය ලංකාවේ මුදලින් රුපියල් එක්කෝටි පහළොස් ලක්ෂ විසි දහස් හයසීයක් (1,15,20, 600) පමණ විය. ඇය ඒ මෙහොතේ ලෝකයට කියා සිටියේ මෙම අරමුදල් වඩාත් ඵලදායී ලෙස පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්වෙත ලබා දිය හැකි ක්‍රමවේදයක් සොයමින් සිටින බවය.

එහෙත් ඇයගේ හැසිරීම සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෝ දැඩි සේ උනන්දුවෙන් නිරීක්ෂණය කළහ. අවසානයේ දී පාස්කු ප්‍රහාරය සිදුවී අවුරුද්දයි මාස පහක් ගත වී ඇතත් ඉෂිනි වීරසිංහ එකතු කළ කැනේඩියානු ඩොලර් 82,882 මාරක බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන් වෙත ලබා දී නැති බව සමාජ මාධ්‍යකරුවෝ හෙළිදරව් කළහ.

ඔවුහු දිගින් දිගටම ඉෂිනිව ප්‍රශ්න කළහ. ඇය ඒ මුදල් යොදවා ඇයගේ පියයුරු සකසා ගැනීම, නව මෝටර් රථයක් මිලදී



ගැනීම, ප්ලාස්ටික් සැත්කම් කිරීම, සිදුකළ බව ඇයට චෝදනා කරන පිරිස අනුමාන කළහ. චෝදනාවන් අතර ඇය නව නිවසක් සඳහා මුදල් ගෙවා ඇති බව කියැවිණි.

එහෙත් ඉෂිනි මේ සමාජ මාධ්‍ය ප්‍රහාරයන් සම්බන්ධව ඉකොනොමි නෙස්ට් වෙත සම්මුඛ සාකච්ඡාවක් දෙමින් පිළිතුරු දුන්නාය. ඇය පැවසුවේ තමා ශල්‍යකර්මයක් කරගත්තේ වර්ෂ 2018 දී බවය. වාහනය මිල දී ගත්තේ අරමුදල් සම්පාදන ව්‍යාපෘතියට මාස ගණනාවකට පෙර දී බවය. තමන් වසර 11ක් තිස්සේ ජීවත් වන්නේ ඇල්බර්ටා හි දකුණු එඩ්මන්ටන්වල තම දෙමව්පියන් සමඟ ඔවුන් ඉදිකරන ලද නිවසේ බවය.

කෙසේ වෙතත් මුදල් යෙදවීම පිළිබඳ ඇයගේ පැහැදිලි කිරීම අවුල් සහගත විය. කැනඩාවේ ෆෝස්ක්වෙයාර් ගොස්පල් නැමැති පල්ලියක් වේ. ඇගේ දෙමව්පියන් එඩ්මන්ටන් හි වන්දනාමාන කරන්නේ ෆෝස්ක්වෙයාර් ගොස්පල් පල්ලිය ය. එම පල්ලියේ පුණ්‍යායතනය වන්නේ ඇල්ෆා ට්‍රස්ට් නම් සංවිධානයයි. එම සංවිධානය ලංකාව තුළ විවිධ සමාජ සංවර්ධන කටයුතු සංවිධානය කරනු ලබන ක්‍රියාකාරී සංවිධානයකි. පාස්කු වින්දිතයන්ට සහන සැලසීම සඳහා කැනේඩියානු ඩොලර් විසි දහසක් ( රුපියල් 27,80,000) ඇල්ෆා ට්‍රස්ට් වෙත ලබා දුන් බව ඇය කීවාය. කෙසේ වෙතත්, විවිධ හේතූන් මත ඇල්ෆා ට්‍රස්ට් හට වින්දිතයන්ට ආධාර කිරීමට නොහැකි වූ බවත් එම මුදල අඩු වුණු පසු ඉතිරි මුදල් වන කැනේඩියානු ඩොලර් 68, 882 ( රුපියල් 95,74,598ක්) “කැනඩාවේ වෙනම බැංකු ගිණුමක ඇතැයි” ඇය ඉකොනොමිනෙක්ස්ට් වෙත පැහැදිලි කළාය.

ඇල්ෆා ට්‍රස්ට් භාරය මේ සම්බන්ධව සිය ෆේස්බුක් ගිණුමෙහි නිවේදනයක් නිකුත් කර තිබිණි. එම නිවේදනයට අනුව ඇයගේ ඉල්ලීම පිළිපැදීම සඳහා ඇල්ෆා ට්‍රස්ට් කණ්ඩායමේ සාමාජිකයෝ බෝම්බ ප්‍රහාරයෙන් සෘජුවම පීඩාවට පත් වූවන්ගේ අවශ්‍යතා සොයා බැලීම සඳහා මඩකලපුවේ සියෝන් පල්ලිය හා පල්ලියට සම්බන්ධව සිටින අනෙකුත් පුද්ගලයින් සමඟ සම්බන්ධ වූහ. අනතුරුව ඔවුන් පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් ගැන පුළුල් ලෙස සොයා බලා ඇත. ක්ෂණික, කෙටි කාලීන හා දිගු කාලීන වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය සියලුම වින්දිතයන් වර්ගීකරණය කර ඇත. මේ සියලුම සොයා බැලීම්වලින් අනතුරුව ඔවුන් ඉෂිනි වීරසිංහ වෙත දන්වා ඇත්තේ ප්‍රහාරයට ලක් වූ සියොන් පල්ලිය, මෙන්ම මේ වින්දිත කණ්ඩායම් රජයේ සංවිධාන, ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් රැක බලා ගන්නා බවය.

එබැවින්, ඇල්ෆා ට්‍රස්ට් භාරය විසින් අරමුදල් ආපසු ඉෂිනි වීරසිංහට ලබා දෙන්නට කටයුතු කර තිබුණේය. ඒ යම් අරමුදලක් පරිත්‍යාගශීලියා විසින් එවන ලද නිශ්චිත අරමුණු සඳහා පමණක් භාවිත කිරීම ඇල්ෆාට්‍රස්ට් ආයතනයේ ප්‍රතිපත්තිය වූ බැවිනි.

එමෙන්ම වර්ෂ 2019 නොවැම්බරයේදී ඇය ඇල්ෆා ට්‍රස්ට් වෙත මේ අරමුදල් නැවත ඉල්ලා දැනුම් දීමක් ද කළ බව එම ආයතනය කීවේය. ඇය ඇල්ෆා ට්‍රස්ට් වෙත පවසා තිබුණේ විදේශ සංචාරයක් අතරතුර හදිසි අවශ්‍යතාවෙන් පෙළෙන වින්දිතයන් කිහිපදෙනෙකු සමඟ සෘජුව සම්බන්ධ වී මුදල් ලබා දීමට සූදානමින් සිටින නිසා ඇල්ෆා ට්‍රස්ට් වෙත ලබා දුන් අරමුදල පැය 36ක් තුළ යළි ලබා දෙන ලෙසය. අනතුරුව ඇල්ෆා ට්‍රස්ට් විසින් බදු සහ ඔවුන්ගේ ගමන් වියදම් අඩු කිරීමෙන් පසු රුපියල් 25, 85,091.43 ක මුදලක් ඉෂිනි වෙත ආපසු ගෙවා තිබිණි.

### වින්දිතයන් සොයා යෑම

ලංකාවේ කටුවාපිටිය පල්ලියේ කණ්ඩායමක් හරහා කටුවාපිටියේ වින්දිතයන් තිදෙනෙක් ආධාර ලබා දීම සඳහා සොයා ගත් බව කියැවිණි. එක් වින්දිතයෙක් සඳහා රුපියල් ලක්ෂ 15ක් ලබා දුන් බව ඇය කීවාය. එහි වාර්තා ලබා ගැනීම සඳහා කොවිඩ් වසංගතය හරස් වී ඇති බව පැවසුවාය.

වෛද්‍ය ප්‍රතිකාර සඳහා වැය වූ මුදල සම්බන්ධව රිසිට් පත් ලබා ගැනීමට කෙනෙක් යොදවා ඇති බවත්, ඔහු එම සියලුම රිසිට් පත් එකතු කර තමන්ට ඉදිරිපත් කිරීමට නියමිත බවත් කිවාය.

ඉකොනොමිනෙක්ස්ට් සඟරාව ඉෂිනි කී මෙම පුද්ගලයා සමඟ කතා කර තිබිණි. අනන්‍යතාව හෙළි නොකිරීමේ එකඟතාව මත කතා කළ ඔහු කියා සිටියේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා පුද්ගලයන් තිදෙනකු වෙත ඇය උපකාර කර ඇති බවය. තවත් අයකුට නිවසක් ඉදිකිරීම සඳහා මුදල් ගෙවා ඇති බවත්ය. ශ්‍රවණාබාධ හේතුවෙන් එක් කාන්තාවකට ශල්‍යකර්ම සඳහා රුපියල් 50,000 ක් ද, මව අහිමි වූ තවත් පවුලකට පාසල් උපකරණ සඳහා රුපියල් 50,000 ක් ද, ගෘහ භාණ්ඩ සඳහා මුදල් ද වෙන් කර ඇති බව ඔහු පැවසීය.

එහෙත් සමාජ මාධ්‍යකරුවන් දිගින් දිගටම කියා සිටියේ ඇය එසේ වියදම් කළා නම් ඒ ගෙවීම් සම්බන්ධව බිල්පත් ඉදිරිපත් කළ යුතු බවය. එමෙන්ම කටුවාපිටිය පල්ලිය හා එය මුල්කරගෙන කටයුතු කරන ක්‍රියාකාරී සංවිධාන විමසූ එක් සමාජ මාධ්‍ය ක්‍රියාකාරිනියක් ඇය කටුවාපිටියට නම් පැමිණ නැති බව කීවාය.

ඊළඟට ඉෂිනි වීරසිංහ කියන්නේ කුමක් දැයි ඉවසිල්ලෙන් බලාගෙන සිටින ලෙස ඇය දන්වා තිබිණි.

කැනඩාවේ ගිණුමක ඇති බව කියන කැනේඩියානු ඩොලර් 68, 882 ( රුපියල් 95,74,598 ක් ) සඳහා කුමක් කරන්නේ දැයි විමසා සිටින සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයන් #IshiniGate සමාජ මාධ්‍ය හැෂ් ටැගය හරහා ඇයගේ හැසිරීමට එරෙහි ප්‍රබල සමාජ ව්‍යාපාරයක් ගොඩනංවා තිබේ. මේ සමග කඩිමුඩියේ ඉෂිනි විසින් ඉදිරිපත් කර ඇති බිල්පත් ප්‍රමාණයේ සැක සහිත බව ඔවුහු ප්‍රශ්න කළහ.

මේ පසුබිමෙහි ඉෂිනි වීරසිංහ විශේෂ ප්‍රකාශක් නිකුත් කළාය. ඇය කීවේ වින්දිතයින් කිහිප දෙනෙකුට උපකාර කිරීම සඳහා යොදාගෙන ඇති අරමුදල් ප්‍රමාණය ද ඇතුළුව සියලු අරමුදල් එම අරමුදල් සම්පාදනය කිරීමට පදනම් වූ ගෝෆන්ඩ්මී වෙත ආපසු ලබා දීමට කටයුතු කරමින් සිටින බවය.

“විපතට පත්වූවන් සඳහාත්, පොදු සමාජ සුබසාධන කටයුතු සඳහාත් මගේ ගිනුමෙන් දිගටම උදව් කරන්න සූදානම්. මා විසින් කරන ලද සමාජ කටයුතු සම්බන්ධව කිසිම සාක්ෂියක් නැතිව අසත්‍ය චෝදනා නිර්මාණය කරමින් ඉතා දැවැන්ත සයිබර් ප්‍රහාරයක් මා ඉලක්ක කරගෙන දියත් වුණා. මේ හිරිහැර කිරීම් හා සමාජයෙන් එල්ල වුණු තර්ජන මා සහ මගේ පවුලේ අය බරපතළ අර්බුදයකට ලක් කළා. “

“මා ආපසු ඒ අරමුදල් ලබා දෙනවා. ලබා දෙන අරමුදල් සම්බන්ධයෙන් ගෝෆන්ඩ්මී ආයතනය විසින් ප්‍රකාශයක් නිකුත් කරනු ඇති.“

ඇය කීවාය. එහෙත් සිදුවෙමින් පැවති වංචාව සම්බන්ධ තමන්ගේ අනුමානය නිවැරදි බව #IshiniGate විරෝධය නිර්මාණ කළ සමාජ ක්‍රියාධරයෝ දැඩි ලෙස විශ්වාස කරති. එම වංචාව නැවත හැරවිය හැකි වීම සම්බන්ධව සතුටු වෙති.

# ප්‍රංශයේ යළි හිස ඔසවන අභිරහස් අශ්ව ඝාතන

● **උදයංග අමරසේකර**

**කාවිදෝ රහසින් අශ්වයන් මරමින් යන බව ප්‍රංශයේ ගම්බද පෙදෙස්වල අසුන් ඇතිකරන්නන් බොහෝ දෙනෙකුගෙන් පොලීසියට පැමිණිලි රාශියක් ගලා එමින් පවතී. ඇතැම් අශ්වයින් මරා දමා ඇති අතර ඇතැම් අශ්වයින්ගෙන් අමු අමුවේ උන්ගේ අවයව කපා ගෙන ගොස් ඇත.**



මර දමා ඇති අශ්වයන්ට මුලින් තියුණු සැතකින් ඇන මහත් වද පමුණුවා තිබේ. නැත්නම් උන්ගේ හිසට යගදාවකින් තඩි බා ඇත. උන්ගේ ඇස් උගුල්ලා කපා දමා මෙන්ම, ශල්‍ය කර්මයක් කළාක් බඳුව සියුම් ලෙස අශ්වයින්ගේ ලිගු පවා ඡේදනය කරගෙන ගොස් ඇති බව අශ්ව මරණ පිළිබඳ පරීක්ෂණ පවත්වන පොලිසිය පවසයි.

ප්‍රංශයෙන් දැනට මෙබඳු අශ්ව මරණ තිස් ගණනක් වාර්තා වී ඇති අතර එවැනිම සිද්ධි රැසක් ස්විස්ටර්ලන්තයේත් ජර්මනියේත් ඕස්ට්‍රේලියාවේත් සිදුවී ඇත. ඇමරිකාවේ මේ හා සමාන සිදුවීම් රැසක් පිටුපස එෆ්බීඅයි රහස් පරීක්ෂකයෝ බොහෝ කලක් තිස්සේ ස්විස්ටර්ලන්තයේ ල තොං නම් පුවත්පත පෙන්වා දෙන පරිදි අසූවේ දශකයේ දී එංගලන්තයෙන් පමණක් මෙබඳු අභිරහස් සිද්ධි 160ක් වාර්තා වී තිබේ.

මෑතදී ප්‍රංශ පොලීසියට ලැබුණු එක් ඔත්තුවක් අනුව ඉස්තාලයක් අද්දර කරක් ගැසූ මහත මිනිසෙකු සැකපිට අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කර ඇතත් ඔහු සිටි නොසිටි තැන් විමසා බැලීමෙන් අනතුරුව ඔහුව නිදහස් කර යවා තිබේ.

ප්‍රංශයේ දිනපතා පළවෙන ල මෝන්ද් පුවත්පත පවසන අන්දමට පොලීසියේ උපදෙස් ඇතිව අස්හල් හිමියෝ කණ්ඩායම් වශයෙන් සංවිධානය වී අශ්වයන් උලාකන තණ පිටි වටාත් උන් ළඟින අට්ටාල වටාත් මුර සංචාර පැවැත්වීමට පටන් ගෙන සිටිති. මෙසේ දිවා රෑ විමසීමෙන් සීරුවෙන් යන ගමනේ අශ්වයකු ගේ කපන ලද කණක් හෝ ගාතයක් හෝ පයට පෑගේදැයි ඔව්හු මහත් දෙගිඩියාවෙන් පසුවෙති.

මෑතදී අශ්වයින් දිගේලි කළ පිටියක් මතින් ඩ්‍රෝන් යන්ත්‍රයක් පියාසර කර ඇති බවත් බල පත්‍ර රහිතව එසේ රහසින් ඔත්තු බැලූ පුද්ගලයා ව සොයාගැනීමට නොහැකි වීම නිසාත් ප්‍රංශ පොලීසිය මහත් සේ විපිළිසර ව සිටියි.

එමෙන්ම අසුන් ඇතිකරන්නන් ගෙයි නිදාගැනීම අත්හැර ඔවුන්ගේ අශ්වයන් ළඟින ලැගුම් බිම් වෙත ගොස් ඒවායේ කූඩාරම් ගසාගෙන උන් කරා විවට වූ එක් ඇහැක් ඇතුව තනි ඇහෙන් නිදන්නට පටන් ගෙන සිටින බව ප්‍රංශයේ එර්තේළුල් ගුවන් විදුලිය පවසයි. මෙවැනි කාරණා නිසා අස්හල් හිමියන් හා ඒ ආයතන සේවකයන් මහත් වෙහෙසට පත්ව ඇති බවත් තමුන්ගේ සතුන් කොයි මොහොතේ මරා දමාවිදැයි යන මානසික පීඩනයට පත්ව සිටී.

අශ්ව ඝාතන බහුල වශයෙන් වාර්තා වෙන්නේ උතුරු ප්‍රංශයේ බ්‍රොතාඤ්ඤ නම් පෙදෙසිනි. එහි පොලිසිය දැනටමත් “වෝ හෝස්” (සංග්‍රාමීය අශ්වයා) නම් විශේෂ සන්නද්ධ බල ඇණියක් පිහිටුවා පළාතේ අශ්වයින් පරිස්සම් කරමින් සංචාරය කරන බව පරීසියන් නම් පුවත්පත කියයි.

අශ්ව ඝාතන සිදු වී ඇති තැන් එකිනෙකට ඈත පැතිරී ගිය පෙදෙස් ගණනාවක සිදු වී ඇති නිසා මෙය ඒක පුද්ගල අපරාධ නොව යක්ෂයා අදහන කිසියම් අපරාධකාරී ඝාතනික ආගමික කල්ලියක වැඩක් වත්දැයි පොලිසිය සැක කරයි. මෙසේ වද පමුණුවන ලද අශ්ව පිටුපස අපරාධ පිටුපස කිසියම් යාග හෝම වතාවතක ගතිගුණ ඇති බවටද පොලිසිය සැක කරයි.

ප්‍රංශයේ කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍ය ජූලියන් දනොර්මොන්දි ගේ ප්‍රකාශයක් උපුටමින් බෙල්ජියමේ රූපවාහිනී හා ගුවන් විදුලි සේවය පෙන්වා දෙන්නේ මේ වධකයා අසුන් මරා උන්ගේ ඇහැ කන උදුරා ගෙන ඇත්තේ හේතු විරහිත අදහා ගත නොහැකි අන්දමේ සහාසික ඉරියව් පාමින් බවය.

මේ අපරාධකාරයා ව අත් අඩංගුවට ගන්නවා තබා ඔහු පිළිබඳ ඉතා අවම ප්‍රමාණයේ තොරතුරක්වත් ලබා ගැනීමට අද වන තෙක් කිසිවකුට කිසිදු හැකියාවක් ලැබී නැත.

තරංග

රන්සුන

# චාම් බව සුන්දරත්වයේ මූලික පාඩමයි!

නිර්මාණයක ජීව ගුණය රඳා පවතින්නේ භාෂාව මත ය. ලේඛකයා හෝ නිර්මාණකරුවා භාෂාව ගැන දරන අදහස සහ භාෂාව භාවිතයේ වන නෛපුණ්‍ය බව ඊට එක්කරන ආලෝකයේ ප්‍රභාව සුළුපටු නොවේ. කෙතරම් හොඳ වස්තු බීජයක් වුව ද; කෙතරම් අපූරු පරිකල්පනයක් වුව ද; කෙතරම් අර්ථපූර්ණ රූප රචනයක් වුව ද භාෂාව නමැති දවටනයේ සුමිහිරි ව දවටා නැත්නම් ඒ නිර්මාණය ප්‍රතික්ෂේප වන්නේ ය. සමහරු කියන්නේ භාෂාවේ ව්‍යාකරණය අවශ්‍ය නොවන බවකි; භාෂාවේ න,ණ, ල, ළ භේදය අවශ්‍ය නොවන බවකි. එහෙත් භාෂාවක් අර්ථපූර්ණව හා සංදිග්ධතාවලින් තොරව ගොඩනැගෙන්නට නම් නිවැරදි භාෂා භාවිතයක වැදගත්කම ගැන ඔබට, මට අත්දැකීම් ඇත. ව්‍යාකරණ නොදන්නා හෝ නොදන්නා සේ සිටින අය තම ලේඛන, භාෂාව පිළිබඳ පරිචයක් ඇත්තන් ලවා පරීක්ෂා කරගන්නා අයුරු මම දැක ඇත්තෙමි. සමහරු භාෂාවේ විවිධ වෙනස්කම්, හැඩතල ප්‍රතික්ෂේප කරන්නේ එහි අරුත් නිරුත් මැනවින් අධ්‍යයනය කර අවසානයේ ය. සිරි ගුනසිංහ, අජිත් තිලකසේන එවැන්නෝ ය. ඔවුහු භාෂාත්මක අත්හදාබැලීම් කරන්නේ විවිධ අරමුණු උදෙසා වෙති.

කෙසේ වුවද ඕනෑම නිර්මාණයක වන සුන්දරත්වය, ප්‍රබලත්වය, හැඟීම් දනවන සුළු බව වැනි බොහෝ කාරණා සඳහා ඍජු ව ම බලපෑම් කරන්නේ භාෂාව ය. අපගේ වාක්කෝෂය පුළුල් වන්නේ කියැවීමෙනි; බැලීමෙනි; ඇසුරු කිරීමෙනි. අප වඩවඩාත් කියවන්නේ නම් අපට භාෂාවේ වන නව දැනුම්, නව වදන් එකතු වේ. එයින් අපේ වාක්කෝෂය පුළුල් වෙයි. අද බොහෝ දෙනෙක් තරුණ නිවේදක නිවේදිකාවන්ට දොස් කියන්නේ ඔවුහු සිංහල-ඉංග්‍රීසි භාෂා ද්විත්වය කලවම් කර භාවිත කරනවා ය කියා ය. සිංහල- ඉංග්‍රීසි කලවම් වීමට හේතුව වන්නේ එක් භාෂාවක්වත් හරියට නොදන්නා කම ය. එසේ වන්නේ කියැවීමක්, හැදෑරීමක් නැති කල්හි ය. සිංහල භාෂාව කෙතරම් වදන් මාධූර්යයෙන් පොහොසත් දැයි දැනෙන්නේ චිරන්තන ගද්‍ය පද්‍ය සාහිත්‍ය හැදෑරුවකුට ය.

නිකොලොයි ගොගොල් රුසියන් වදන් කෝෂ්ඨාගාරය ගැන අපූරු ප්‍රකාශයක් කරයි.

"අප බසෙහි අගය විශ්මිත ය. වදන්වල හඬ මිණිහඬ සේය. හැම වදනක් ම හැඩරුවෙන්, බරින් සැබෑ මුතුකැට සදිසි ය. ඇතැම් විටක යම්කිසි දෙයක් හඟවන වදන, ඒ දෙයටත් වඩා වටනේ ය.

ගොගොල් කියන්නේ ඕනෑම රුසියන් වදනක් අඟනා මිණක් රැස් ප්‍රභා විහිදන්නා සේ කාව්‍යමය සංකල්පනා ජනිත කරන බව ය. ඔහුට අනුව කවර මැණිකක් දෙස බැලුවද මෙය පැහැදිලි වේ. අඩු අගයකින් යුතු නිල්, සුදු මැණික් ගත්ත ද මෙය පැහැදිලි වේ. මුහුදු දියේ ඇති නීල උත්පල වර්ණය මේ මිණිවලින් පෙනේ. එහෙත් ගොගොල් පවසන්නේ එහි වඩාත් ම සිත් පැහැරගන්නා ලක්ෂණය නම් එයින් උනන ස්වේතවර්ණ කිරණ බවයි. ඒ ධවල පැහැය අතරින් එබී බලනවිට පැහැදිලි ව මුහුදු දියෙහි පැහැය දිස් වෙයි. ආලෝකය හා වර්ණ සංයෝගයෙන් කෙරෙන මේ අපූර්ව සුන්දරත්වය නිසා ඕනෑම මිණකට ගණනය කළ නොහැකි වටිනාකමක් එක් වෙයි.

වදන්වලින් වඩාත් හරඹ කරන්නෝ කවියෝ ය. කවියෝ එක් වදනක වදන් කෝෂයක් හංගති. එබැවින් ම කවියක කාව්‍ය සංවේදනා ජනිත කරන බස කුමක්දැයි කෙනෙක් ඇසුවොත් එය විස්තර කිරීම පහසු වන්නේ නැත. වචන බොහෝවිට අපේ පෞද්ගලික අත්දැකීම් හා බැඳුණු ඒවා වෙයි. එය සූක්ෂ්ම හා අලංකාර ලෙස භාවිත කරන නිර්මාණකරුවා ඒ වදන් අනුසාරයෙන් අප වෙත නව ලොවක් තිළිණ කරයි. සාමාන්‍යයෙන් පොදු ජනතාව අතර තිබෙන; විශේෂයෙන් ග්‍රාමීය ජනතාව අතර භාවිත බස කාව්‍යමය ආලේපයක් සහිත බසකි. ඒ භාෂාවේ සුලලිත බව හසුවන්නේ පොදු ජනයා අතර ඉඳමින් ඔවුන් හා ඔවුන්ගේ කෙනකු ලෙස ජීවත්වන්නකුට ය. ධීවරයන්, කම්කරුවන්, පතල් කරුවන් මේ මහ පොළොවේ මිහිකත හා සටන් කරන ඕනෑම කෙනෙක් ළඟ ලස්සන වදන් මාලාවක් තිබේ.

ජීවත්වීමෙන්, මිනිසුන් ඇසුරු කිරීමෙන් මම දැනගත් තවත් රහසක් ඔබට කියන්නෙමි. පැසුණු හැම මිනිහකු ළඟම රන් හා සමාන වාක්කෝෂයක් තිබේ. එය හරියට මිය යන මොහොතේ පවා පොළොව සරු කරන්නට තම පත්‍ර දානය කරන ගසක් සේ ය. ඔවුහු ජීවිතය ගැන බොහෝ දේ දන්නෝ වෙති.

භාෂා ව්‍යවහාරයේදී අප වඩාත් සැලකිලිමත් විය යුතු දෙයක් වන්නේ එහි නිරවද්‍යතාව හා තැනට සුදුසු ලෙස වදන් භාවිතයයි. අප බොහෝ දේ ඇසුරු කිරීමෙන් ලබන භාෂා පරිඥානය සෑම තැනකට ම යෙදීම සුදුසු නැත. භාෂා ව්‍යවහාර කිහිපයක් ම පවතින අපේ භාෂාව උප භාෂාවලින් සමලංකෘත ය. ඒ උපභාෂා භාවිතයේදී අනෙකාට එය කෙතරම් තේරෙන්නේ ද යන්න ගැන නිර්මාණකරණයේදී පරිස්සම් විය යුතුය. කියන්නාට, අසන්නාට ඒවා අමිහිරි වුවහොත් ඔබේ නිර්මාණය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

එමෙන්ම අනවශ්‍ය ලෙස බර වචන යොදා ගනිමින් කරන වචන පෙළ ගැස්ම බොහෝ පාඨකයන්ගේ සිත් නොගනී. පද්‍ය සම්බන්ධයෙන් මෙය තරයේ ම සිතට ගත යුතු අතර ගද්‍යයට ද මෙය සාධාරණ ය. වඩාත් අසීරු සරල සුගම ලෙස ලිවීම බව ඔබ දන්නවාට සැක නැත. බස සුමට වන තරමට නිර්මාණය ද පරිපූර්ණ වෙයි. එවිට පාඨකයන් ගද්‍යයට වඩාත් සමීප වෙයි. සුන්දරත්වයේ මූලික අවශ්‍යතාව චාම් බව යැයි ටෝල්ස්ටෝයි පවසන්නේ එබැවිනි.

sumudu.chathurani@lakehouse.lk



# ලංකාවේ ප්‍රථම නිදහස් සටන බවට පත් 1818 උඩරට කැරැල්ල



● අනුර බී. සෙනෙවිරත්න

**ලෝක ඉතිහාසය යනු සටන්වලින් මෙන් ම, පාවාදීම්වලින් ද පිරුණ එකකි. අපේ රටේ ඉතිහාසයට ද එයින් ගැලවිය නොහැකි ය. එවැනි පාවාදීම් හේතුවෙන් ලොව පුරා ජීවිත හා දේපල විශාල ප්‍රමාණයක් විනාශයට පත්ව ඇති අතර, අප රටට ද එමඟින් සිදුව ඇති හානිය සුළුපටු නොවේ. ලංකාවේ ප්‍රථම නිදහස් සටන ලෙස සැලකෙන ක්‍රි.ව. 1818 සිදු වූ උඩරට කැරැල්ල අසාර්ථක වන්නට ද සිංහලයන් විසින් කරන ලද බොහෝ පාවාදීම් හේතු වී තිබේ.**

1818 උඩරට කැරැල්ලේ දී බොහෝ රදළයන් කැප්පෙටිපොළ අධිකාරමට සහාය ලබාදුන්න ද, මොල්ලිගොඩ සහ එක්නැලිගොඩ යන දිසාවේවරු ඉංග්‍රීසීන්ට පක්ෂපාතී වෙමින් ඔවුන්ට ඔත්තු සැපයූ හ. සමහර මුස්ලිම්වරු ද සිංහල සටන්කරුවන් පිළිබඳව ඉංග්‍රීසීන්ට ඔත්තු ලබාදුන් හ. ඒ වෙනුවෙන් ඉංග්‍රීසිහු ඔවුන්ට විවිධ වරප්‍රසාද ලබාදීමට කටයුතු කළ හ. උඩරට සිටි සමහර ජන කොටස්වල සහාය මෙම ප්‍රථම නිදහස් සටනට නොලැබුණ ද, සිංහල සේනාව කැරැල්ල ඉදිරියට ම ගෙන ගියෝ ය.

ඒ වන විට වෙල්ලස්ස බිමේ සටන් කරමින් සිටි ඉංග්‍රීසි හේවායෝ ආහාර පාන හිඟවීම නිසා මහත් පීඩාවට පත්ව සිටිය හ. නමුත්, එම තීරණාත්මක මොහොතේ අපේ ම මිනිසුන් රට ජාතිය පාවා දෙමින් කටයුතු කළ නිසා ඉක්මනින් ම වෙල්ලස්ස අරගලය ඉංග්‍රීසීන්ට වාසිදායක ලෙස වෙනස්වී ය. කැප්පෙටිපොළ ප්‍රමුඛ සිංහලයන් කරගෙන ගිය එම අරගලය තියුණු මුහුණුවරක් ගනිමින් තිබුණු අවස්ථාවක සූක්ෂම ලෙස කටයුතු කළ ඉංග්‍රීසිහු තාන්න-මාන්න බලාපොරොත්තුවෙන් සිටි නිවට සිංහල රදළයන් රවටා ගත් හ. ඔවුන් ඉංග්‍රීසීන්ට ලබාදුන් ඔත්තු නිසා සටනේ ජවය නැති වී ගියේ ය.

1815 දී ඉංග්‍රීසීන්ට ලංකාව යටත් කර ගැනීමට ද ස්වදේශිකයින්ගේ නොමඳ සහායක් ලැබී තිබේ. වර්තමානයේ මෙන් ම එදවස ද, තනතුරු වරප්‍රසාද ඔස්සේ පාවාදීම් කළ කුමන්ත්‍රණකරුවන් සිටි බවට එම ඉතිහාසය සාක්ෂි දරයි. එහෙත්, එසේ නොවුණු දේශප්‍රේමීන් ද එකල සිට ඇති බවට එම ඉතිහාසය ම සාක්ෂි සපයයි. අප්‍රකට ඉතිහාස තොරතුරකට අනුව ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාට පක්ෂව ඉදිරිපත් වූ හෙළ විරුවන් මහනුවර 'වාගොල්ලේ සටන' මෙහෙයවා බ්‍රිතාන්‍යයන්ට අන්ත පරාජයක් අත්කර දුන් බව සඳහන් ය.


මේ අතර, මරක්කල ජනතාව සුද්දන්ට සහාය ලබා දී තම වෙළඳාම සරුකර ගැනීමට මානබැලූ හ. ඊට ප්‍රතිඋපකාර කළ ඉංග්‍රීසිහු මුහම්දිරම් තනතුරු පවා මුස්ලිමුන්ට ලබා දී ඇත. කොටබෝවේ තම්බි මුහන්දිරම් එවැන්නෙකි. බ්‍රිතාන්‍යයන් මොවුන් භාවිත කරමින් කැරලි නායකයන්ගේ තොරතුරු හා නායකයන් සැඟ වී සිටින ස්ථාන පහසුවෙන් දැන ගත් හ.

1818 අග භාගය වන විට ඉංග්‍රීසීන් විසින් උඩරට ප්‍රදේශය උග්‍ර ආහාර හා ජල හිඟයකට ගොදුරු කරන ලද බව ඉතිහාසයේ සඳහන් වේ. බලලෝභී සිංහලයන්ගෙන් මෙන් ම, සමහර මුස්ලිමුන්ගෙන් ද සමන්විත චරපුරුෂ සේවා මඟින් ජෝන් ඩොයිලි අරගලයේ සංවිධාන කටයුතු පිළිබඳ ඔත්තු ලබාගෙන ඇත. කඩු-හී වැනි ආයුධ මෙන් ම, තුවක්කු-කාල තුවක්කු වැනි ආයුධ ද දේශීය කම්හල්වල තනමින් සිංහලයන් සටන් කළ ද, ප්‍රබල ආර්ථික ශක්තියකුත්, ගෝව, ජාවා, ඉන්දියාව, සුමාත්‍රා සහ මුරුසි ආදී යටත් විජිතවලින් ගෙන්වා ගත් හමුදා පිරිස් බලයකුත් ඉංග්‍රීසීන්ට හිමි ව තිබීම නිසා ස්වදේශිකයන්ට ක්‍රම ක්‍රමයෙන් අවාසිදායක තත්ත්වයක් නිර්මාණය වී ඇත.

එමෙන් ම, කැප්පෙටිපොළ වීරයා අවිවේකී ව සනීපාරක්ෂාවෙන් තොර ව කටයුතුවල නිරත වීම නිසා සටන අතරතුර රෝගාතුර වී ඇත. එම නිසා ඔහුගේ සටන් සගයන් ඔහු සටන් බිමෙන් තාවකාලික ව ඉවත් කර ඇත. නායකයකු නොමැතිකමින් සහ ආහාර හා පිරිස් බලය හීන වීමෙන් කැරලිකරුවන් ක්‍රමයෙන් ශාරීරිකව මෙන් ම, මානසිකව ද දුර්වල වී තිබේ. කැරලි නායකයන් හා කැරලිකරුවන් විශාල පිරිසක් අත්අඩංගුවට පත් වූ අතර, ඔවුන් ද සමඟ සාමාන්‍ය වැසියන් විශාල සංඛ්‍යාවක් ද අමානුෂික ලෙස ඝාතනය කර ඇත.

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසු ව කන්ද උඩරට රාජ්‍යත්වයට උරුමකම් කීමට පුත්‍රයෙකු නො සිටියෙන්, එවකට දකුණු ඉන්දියානු මලබාර් දේශයේ නායක්කාර් වංශික බිසවකගේ ඥාතිවරයකු රාජාධි රාජසිංහ නමින් කන්ද උඩරට සිහසුන අල්ලා ගත්තේ ය. එසේ වුව ද, ඔහු බෞද්ධාගම වැළඳගෙන බෞද්ධාගමේ උන්නතියට සහයෝගය දුන් නිසා සිංහල ජනතාවගේ හොඳහිත දිනා ගැනීමට සමත් වී ය. ඉන්පසු ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අවසානය දක්වා ම එනම්, 1815 මාර්තු දක්වා ම කන්ද උඩරට රාජධානිය පාලනය කළේ මෙම මලබාර් වඩුග නායක්කාර් වංශික රජවරුන් ය. මෙම විජාතික පාලකයින්ගෙන් නැවත සිංහල කුමරෙකුට රජකම ලබා දිය යුතු යැයි මතයක් සිංහල ජනතාව අතර රහසේ ක්‍රියාත්මක වූ අතර, මේ සඳහා පිළිමතලව්වේ මහ අධිකාරම නායකත්වය ගෙන ඇත.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඇහැළේපොළ නිලමේ සමග උරණවීමට මග සැලසුවේ ද උඩරට වලව් දෙකක රදලයන් ය. 'චූදිතයාට දඬුවම දිය නො හැකි වූ විට ඥාතීන්ට දඬුවම් කිරීමට' එකල පැවති සම්ප්‍රදායකට අනුව ඇහැළේපොළ නිලමේගේ බිසව හා මද්දුම බණ්ඩාර පුතු ඇතුළු දරු තිදෙනාට රජු නියම කළ කෲර දඬුවම නිසා රජු රාජ්‍යත්වයෙන් නෙරපීමට ඇහැළේපොළ නිලමේ සිතන්නට ඇත. මොහුගේ සහෝදරියක විවාහ කරගෙන සිටි කැප්පෙටිපොල නිලමේ ද ඇහැළේපොළ කුමාරිහාමි වන සිය සහෝදරියගේ ජීවිතය වෙනුවෙන් කම්පාවට පත්වන්නට ඇත. එහෙත්, එම කම්පාව නොහඟවා අවස්ථාවක් එනතුරු ඔහු ද බලා සිටින්නට ද ඇත.



ජෝන් ඩොයිලි

තම බිසව හා දරුවන් නිරපරාදේ මැරුම් කෑමට ලක්වීම නිසා රජු පලවා හැර රජවීමට උත්සාහ දැරූ ඇහැළේපොළ අධිකාරම් තුමා ද රවටා අත් අඩංගුවට ගෙන සිරකර තැබූ ඉංග්‍රීසිහු 1818 දී ලංකාවේ කන්ද උඩරට රාජධානිය යටත් කර ගත්තේ, සිංහල රදල නායකයන්ගේ ජීවිත රැසක් අහිමි කරමිනි. කැරැල්ලේ නායකත්වය ගෙන කටයුතු කළ නායකයන් වූ වීර කැප්පෙටිපොළ දිසාවේ හා මඩුගල්ලේ රාජද්‍රෝහීන් ලෙස මහනුවර බෝගම්බර දී හිසගසා මරණයට පත් කරන ලද අතර, උඩරට නිලධාරීන් වැටුප් ලබන සේවකයන් බවට පත්කරන ලදි. ගම්බිම් රාශියක් ගිනිතබා විනාශ කිරීම නිසා රට වැසියෝ බොහෝ දෙනෙක් ආහාර හිඟයට හා ලෙඩ රෝගවලට ගොදුරු වීමෙන් මරණයට පත් වූ හ. ඇහැළේපොළ අධිකාරම් පසු කලෙක මුරුසි දිවයිනට පිටුවහල් කරන ලද අතර, 1829 ජූනි 27 දින එහි දී ම මිය ගොස් තිබේ. ඔහු වෙනුවෙන් මුරුසි දිවයිනේ ස්මාරකයක් ඉදිකර ඇති බව ද සඳහන් ය.

රදල බලය තවදුරටත් අඩු කර අධිකරණ බලය ඉංග්‍රීසි ඒජන්තවරුන්ට පැවරීමට ඉංග්‍රීසිහු කටයුතු කළ හ. උඩරට ප්‍රදේශවල අන්‍ය ආගම් පැතිරීමට අවස්ථා සලසා දුන් ඔවුහු, එම ප්‍රදේශවල මහා මාර්ග තනවා ලංකාවේ පහතරට ප්‍රදේශ සමග සම්බන්ධ කර එම ප්‍රදේශ හුදකලා තත්ත්වයෙන් මුදාලීමට කටයුතු කළෝ ය. තව ද, උඩරට ගිවිසුමේ 5 වන වගන්තිය අනුව බුද්ධාගමට ලබා දී තිබූ විශේෂත්වය වෙනස් කිරීමට ඉංග්‍රීසිහු මෙම සටන අවස්ථාවක් කර ගත් හ. පසුව ඔවුන් 1815 උඩරට ගිවිසුම ඒකපාර්ශිකව අහෝසි කළ අතර, 1818 නොවැම්බර් මස 21 වැනි දින ප්‍රකාශයක් නිකුත් කරමින් කන්ද උඩරට රාජධානිය යුද්ධයෙන් ජයගත් ප්‍රදේශයක් බවට තහවුරු කළේ ය.

වර්ෂ 1817 ඔක්තෝබර් මස සිට 1818 ඔක්තෝබර් මාසය දක්වා අවුරුද්දක පමණ කාලයක් කන්ද උඩරට ප්‍රදේශයේ පැවති උඩරට මහා කැරැල්ල මගින් රටට ජාතියට අහිමි වූ සිංහලයන්ගේ සංඛ්‍යාව දළ වශයෙන් 10, 000ක් පමණ වෙතැයි ජෝන් ඩේවි කියයි. කැරැල්ලෙන් අනතුරුව කැරලි නායකයන් සියලුදෙනා අත්අඩංගුවට ගන්නා ලද අතර, ඔවුන් ඇතුළු තවත් 47 දෙනෙකුට මරණීය දණ්ඩනය හිමිවී ය. වෙල්ලස්සේ භික්ෂූන් දහනමක් දන්තධාතුන් සොරකම් කිරීම නිසා යාපනය සිරගෙයකට යැවී ය. තවත් රදලවරු 75දෙනෙකුගේ ඉඩම් රාජසන්තක වී ය.

ඉන් පසු නැවත වරක් මෙබඳු කැරැල්ලක් ඇති නොවීමට ඉංග්‍රීසි රජය වගබලාගත් අතර, උඩරට පැවති පාලන ක්‍රමය වෙනස් කිරීම සඳහා 1815 දී නිකුත් කළ ගිවිසුම වෙනස් කොට 1818 නොවැම්බර් 21 වන දින ආඥා පනතක් නිකුත් කළේ ය. එමගින් ආණ්ඩු පාලනය සඳහා පත්කර සිටි බ්‍රිතාන්‍ය නිලධාරීන්ගේ බලතල තහවුරු කරන ලද අතර, රදලවරුන්ගේ බලතල අඩු කිරීමටත්, ජනතාවට ස්වාධීන අදහස් දැක්වීමටත් හැකිවන සේ මෙහි වගන්ති සකස් කළේ ය.

මෙම ආඥා පනත වගන්ති පනස් හයකින් සමන්විත වී ය. පළමු වගන්ති හයෙන් 1815 න් පසු මහනුවර රාජධානියේ ඉතිහාසය ගෙන හැර දක්වා තිබේ. ඒවායින් බ්‍රිතාන්‍ය පාලනයේ මුදු මොළොක් ගතියත්, බුදුදහමට ලබාදුන් ආරක්ෂාවත්, රදලවරුන්ගේ බලතලවලට දක්වන ලද දැඩි නොවන සැහැල්ලු ස්වරූපයත්, බදු අයකිරීම හා රාජකාරි සේවයේ ලිහිල් බවත් පෙන්වා දී තිබේ. එසේ ම, රදල ප්‍රධානීන්ගේ අවශ්‍යතාවයන් ඉටු කරගැනීමට මිස පොදු ජනතාවගේ සුබසාධනයට මෙම කැරැල්ල ආරම්භ වී ව්‍යාප්ත වී නොගිය බව පෙන්වා දී එබඳු කැරැල්ලක් ඇති නොවීමට කටයුතු කළ බවත් එහි සඳහන්කර ඇත. 7 සහ 8 වගන්තිවලින් බ්‍රිතාන්‍ය කිරීටයේ පරමාධිපත්‍යය ආණ්ඩුකාරවරයෙක් විසින් ක්‍රියාත්මක කරන බවත්, මහනුවර ප්‍රදේශය කොමසාරිස්වරුන්ගේ මණ්ඩලයක් මගින් පාලනය කරන බවත් පෙන්වා දී තිබේ. කුමන තරාතිරමක වුව ද, සෑම උඩරටියෙකුගේ ම අයිතිවාසිකම් එක සමාන බවත්, ආණ්ඩුවෙන් පත් කරන ලද රදල ප්‍රධානීන්ට පමණක් කීකරුව ගරු බුහුමන් දැක්විය යුතු බවත් ප්‍රකාශ වී ය.

9 සිට15 දක්වා වගන්තිවලින් රදල ප්‍රධානීන්ගේ බලය සීමා කිරීමට කටයුතු කළ අතර, ඔවුන්ගේ පත්වීම් ඉංග්‍රීසි රජය විසින් සිදු කරන බවත්, ඔවුන් මෙතෙක් මහනුවර රජතුමාට කළ උපහාර ඉංග්‍රීසි නිලධාරීන්ට ද දැක්විය යුතු බවත් ප්‍රකාශ වී ය. 16 වන වගන්තියෙන් 1815 ගිවිසුමේ සඳහන් ආගම පිළිබඳ වරප්‍රසාද සීමා වී ය. ඒ අනුව, බුද්ධාගමට ප්‍රදානය කොට තිබූ වරප්‍රසාද අහිමි කොට අන් සෑම ආගමකට ම ආරක්ෂාව ලැබෙන බව ප්‍රකාශයට පත්වී ය. 17 සිට 25 දක්වා වගන්තිවලින් නව බදු ක්‍රමයක් හඳුන්වා දී තිබුණි. තනතුරු ලබාගැනීමේ දී ගෙවිය යුතු දීමනා ද, අරමුදලට හා ආයුධ ගබඩාවලට දිය යුතු බදු ද අහෝසි කළේ ය. ඒ වෙනුවට කුඹුරුවලින් ලබන නිෂ්පාදනවලට බද්දක් අය කළේ ය. නිෂ්පාදනවලින් දහයෙන් එකක් රජයට ගෙවිය යුතු වී ය. කැරැල්ලේ දී ඉංග්‍රීසීන්ට පක්ෂපාත වූ ප්‍රදේශවලින් දාහතරෙන් එකක බද්දක් ද, කැරැලිකාර ප්‍රදේශවලින් පහෙන් එකක බද්දක් ද නියම කළේ ය. ඉංග්‍රීසීන්ට පක්ෂපාති රදලයන් හා විහාරගම් බදුවලින් නිදහස් කළ අතර, මී ඉටි සඳහා පවා බද්දක් ගෙවීමට වැද්දන්ට නියම වී ය.

26 සිට 29 දක්වා වගන්තිවලින් රදලයන්ට වේතනයක් දීමට නියම කරන ලද අතර, 30 සිට 32 දක්වා වගන්තිවලින් කුල ක්‍රමයට අනුව ශ්‍රමය භාවිත කිරීමට ඉඩ ලබා දුන්නේ ය. එහෙත් මාර්ග තැනීම, පාලම් තැනීම වැනි කටයුතුවලට ජනතා සේවය ලබාගත යුතු බව කියා සිටියේ ය. 33වන වගන්තියෙන් දඬුවම් දීමට, වැඩ තහනම් කිරීමට, දඩ ගැසීමට හා සිරගත කිරීමට අවශ්‍ය බලතල මහනුවර පාලක මණ්ඩලයට හා ඒජන්තවරුන්ට, රදලවරුන්ට සහ විදානේවරුන්ට ලැබුණි. නමුත්, අස්කිරීමේ බලතල පැවරුණේ ආණ්ඩුකාරවරයා වෙත ය. 34 වන වගන්තියේ සිට 55 වන වගන්තිය දක්වා අන්තර්ගත වූයේ, අධිකරණය පිළිබඳ කරුණු ය. එහි දී ඕනෑ ම අවස්ථාවක අවශ්‍යතාවයක් ඇතිවුවහොත්, බලතල වැඩිකිරීමට ඉඩකඩ ඇති බව පෙන්වමින් රදලවරුන්ගේ හා විදානේවරුන්ගේ අධිකරණ බලතල විශාල වශයෙන් අඩු කෙරිණි.

එම ප්‍රකාශනයේ 7, 13 සහ 27 යන වගන්ති බෙහෙවින් වැදගත් වී ය. තනතුරු ලබාදීමේ දී මෙතෙක් සිදුකළ ගෙවීම් ක්‍රමයත්, ඉතා සුළු වැරදිවලට දඩගැසීමත් යන කරුණු අහෝසි කළ නිසා රදලවරුන්ට ආදායම් ලබාගැනීමේ ක්‍රම නැති වී ගියේ ය. නව බදු ක්‍රමයක් ඉදිරිපත් කිරීමත්, පළාත්වලට ඒජන්තවරු පත්කිරීමත් නිසා රජයත්, ජනතාවත් අතර පැවති සම්බන්ධය වැඩි වූ අතර, රදලවරුන්ගේ සම්බන්ධය අඩුවී ය.

මෙබඳු කැරැල්ලක් යළි ඇතිවීම වැළැක්වීමට ඉංග්‍රීසි රජය උත්සාහ කළ ද, එය සාර්ථක නොවී ය. ඉන්පසුව ද, ඉංග්‍රීසීන්ගෙන් නිදහස ලබාගැනීම සඳහා මෙරට දේශප්‍රේමී ජනයා වරින්-වර සටන් වැදුණ හ. ඒ, 1823, 1834, 1842 සහ 1848 යන වර්ෂවල ය. එහෙයින්, 1948 බ්‍රිතාන්‍ය කිරීටයෙන් අප ලද නිදහස බත්දේසියක තබා ඉංග්‍රීසීන් අපට පිරිනැමූ ත්‍යාගයක් ලෙස සැලකීම එසේ රට ජාතිය ආගම වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් සටන් වැදුණු එම දේශප්‍රේමීන්ට කරන බලවත් නිගරුවකි.

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි.
ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ඡායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න.
සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි.
සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ.
සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261
දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351
විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

# වාණිජ මණ්ඩලී



# රබර් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ජය කෙහෙළි නංවන ලාෆ්ස්

ශ්‍රී ලාංකේය රබර් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතමයකු වන හොරණ පිහිටි ලාෆ්ස් කෝපරේෂන් (රබර්) කර්මාන්තශාලාවේ නිරීක්ෂණයකට වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන සහ ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ඩී. වී. චානක පසුගිය ඔක්තෝබර් මස 06 වන දින එක්වූහ.

ගෝලීය රබර් අපනයන කර්මාන්තය තුළ වගකිව යුතු භූමිකාවක් නිරූපණය කරන ශ්‍රී ලංකාව, රබර් නිෂ්පාදන සම්බන්ධ දේශීය වැවිලි කර්මාන්ත අංශයෙන් සහ ආර්ථික අපනයන බෝග අංශයෙන්ද, හිමිකරගෙන ඇත්තේ සුවිශේෂී වූ ස්ථානයකි. මෙම කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති ව්‍යාපාරික අවස්ථා හඳුනාගත් ලාෆ්ස් හෝල්ඩිංග්ස් ලිමිටඩ් සමාගම 2008 වසරේදී සිය ව්‍යාපාර විවිධාංගීකරණයට ලක් කරමින් ලාෆ්ස් කෝපරේෂන් (රබර්) ආයතනය පිහිටුවූයේ, රබර් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ සුවිශේෂී පෙරළියක් සිදුකරමින් ඝන ටයර් නිෂ්පාදනය (Solid Tyres) හඳුන්වා දෙමිනි. මෙහිදී අමාත්‍යතුමන් විසින් හොරණ පිහිටි එම කර්මාන්තශාලාව නිරීක්ෂණය කරමින් එහි නිෂ්පාදන තාක්ෂණය සම්බන්ධයෙන් ද අවබෝධයක් ලබාගත් අතර, එම අවස්ථාව සඳහා ලාෆ්ස් සමූහ ව්‍යාපාරයේ සභාපති ඩබ්ලිව්. කේ. එච්. වැගපිටිය, සමූහ නියෝජ්‍ය සභාපති තිලක් ද සිල්වා සහ සමූහ කළමනාකාර අධ්‍යක්ෂ/සමූහ ප්‍රධාන විධායක නිලධාරි පියදාස කුඩාබාලගේ ද එක්වූහ.



නවීන තාක්ෂණය, තිරසාර ක්‍රියාදාමයන් සහ ශක්තිමත් ආචාරධර්ම වලට අනුගතවෙමින් ශ්‍රී ලංකාවේ නවීනතම සහ පරිසර හිතකාමී ටයර් නිෂ්පාදන කර්මාන්තශාලාවක් ලෙස ක්‍රියාත්මක වන හොරණ ලාෆ්ස් රබර් කර්මාන්තශාලාව, ද්‍රව්‍ය හැසිරවීම, ඉදිකිරීම් සහ විවිධ කර්මාන්ත කාර්යන් සඳහා උපකාර වන පුළුල් පරාසයක ඝන ටයර් නිෂ්පාදන කරනු ලබයි. ඉහළ නිපුණත්වයකින් යුතු කාර්ය මණ්ඩලයක් සහිත ආයතනයක් ලෙස එහි සමස්ත පර්යේෂණ සහ සංවර්ධන අංශ කෙරෙහි දක්වා ඇති ප්‍රමුඛ අවධානය මෙහි සුවිශේෂීත්වයයි. එහි ප්‍රතිඵලයක් ලෙස ලාෆ්ස් රබර් ආයතනය, 2020 ජනවාරි මාසය තුළදී Loader Grip ටයරය සිය නිෂ්පාදන ක්‍රියාවලියට එක් කරගනිමින්, ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වන විශාලතම ඝන ටයරය නිෂ්පාදනය කරනු ලබන ආයතනය බවට පත් විය.

# Global Banking and Financial සම්මාන උලෙළේදී සිංගර් සම්මානයට පාත්‍ර වෙයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පාරිභෝගික භාණ්ඩ සැපයුම්කරුවා වන සිංගර්, Global Banking and Financial Awards උළෙලේදී, ශ්‍රී ලංකාවේ Retail Brand of the Year ලෙසින්, සම්මානයෙන් පිදුම් ලැබ තිබේ.




බ්‍රිතාන්‍ය පදනමක් සහිත, Global Banking and Financial Awards යනු ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ වඩාත් අවධානයට පාත්‍ර වන සම්මාන උළෙලක් වන අතර, සිංගර් ශ්‍රී ලංකා සමාගම එම උළෙලේදී ප්‍රථම වතාවට, Retail Brand of the Year ලෙසින් සම්මාන හිමි කර ගැනීම විශේෂත්වයකි.

බ්‍රිතාන්‍යය පාදක කර ගත්, Global Banking and Finance Review යනු, මූල්‍යමය කරුණු රාශියක් පිළිබඳ ලොව පුරා පාඨකයන් දැනුවත් කරන අන්තර්ජාල අවකාශයක් වන අතර, Fortune 500 ලැයිස්තුවට අයත් සමාගම්වල ජ්‍යෙෂ්ඨ තීරකයන්, ආයෝජකයන්, හා බැංකුකරුවන් ඇතුළු දහස් ගණනක පිරිසක් තමන් නිරත ව සිටින ක්ෂේත්‍රය පිළිබඳ කාලීන දැනුවත්භාවයක් ලබා ගැනීම සඳහා එම අවකාශය භාවිත කරති.

Global Banking and Financial Awards මුල්වරට දියත් කළ 2011 වසරේ පටන්ම, මෙම සම්මාන උළෙලෙහි සම්මාන හිමි කර ගැනීම සඳහා ලොව සුපතල සමාගම් අතර, දැඩි තරගකාරිත්වයක් පවතී.

එවැනි පසුබිමක සිංගර් ශ්‍රී ලංකා සමාගම, එම සම්මාන උළෙලෙහි ශ්‍රී ලංකාවේ පළමු හා එකම Retail Brand of the Year ලෙසින් සම්මානයට පාත්‍ර වීම, සිංගර් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.

# සඳැස් ඕරා මධ්‍යස්ථානයෙන් විශ්ව ශක්ති ප්‍රතිකාර

රේකී, ප්‍රාණික්, කොස්මික්, ඇංගලිකන් සහ ජෝරේ යනුවෙන් විශ්ව ශක්ති ප්‍රතිකාර රැසක් ලොව පවතී. අපට වැළඳෙන බොහෝ රෝග පීඩා විශේෂයෙන් බෝ නොවන රෝග විශ්ව ශක්තිය හරහා සුව කර ගත හැකිය.

බත්තරමුල්ල, කුරුණෑගල සහ ගම්පහ පිහිටි සඳැස් ඕරා සහ ස්වභාවික ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත පැමිණ නවීනතම 3D ඕරා යන්ත්‍රයකින් ඔබේ ඕරාව පරීක්ෂා කර විශ්ව ශක්ති ප්‍රතිකාර ලබා ගත හැකිය.


ප්‍රවීණ ජ්‍යොතිර්වේදී, රේකී මාස්ටර්, අධ්‍යාත්මික ප්‍රතිකාර උපදේශක කේ. ඒ. යූ. සරත්චන්ද්‍ර මෙය මෙහෙයවයි.

මනස, ආත්මය සහ ශරීරය යන ත්‍රිත්වයටම විශ්ව ශක්තිය ඔස්සේ ප්‍රතිකාර කරන බැවින් භෞතික රෝග පමණක් නොව මානසික හා ආත්මීය වශයෙන් වැළඳෙන රෝග මේ හරහා සුව කර ගත හැකි වීම සුවිශේෂය.



ඉහත ක්‍රම අතරින් රේකී ප්‍රතිකාරයට ලැබෙන්නේ විශේෂ තත්ත්වයකි. මිනිස් සිරුරේ පිහිටා ඇති චක්‍ර හත වන මූලාධාර, ස්වාධිශ්ඨාන, මණිපුර, අනහත, විශුද්ධි, ආඥා සහ සහශ්‍රා චක්‍ර රේකී ප්‍රතිකාර මගින් පිරිසිදු කර බලගන්වයි.

මෙම චක්‍ර හත මගින්



සිරුරේ පිහිටා ඇති අන්තරාසර්ග ග්‍රන්ථි හතක් පාලනය කර, ඊට අදාළ ඉන්ද්‍රියයන් වන මොළය, හෘදය වස්තුව, පෙනහළු, ආමාශය, අග්න්‍යාශය, වකුගඩු, අක්මා, ලිංගේන්ද්‍රිය, අස්ථි පද්ධතිය හා ස්නායු පද්ධතිය පාලනය කරයි. රේකී ප්‍රතිකාර තුළින් රෝග පීඩා දුරු කිරීම පමණක් නොව ශරීරයේ ප්‍රතිශක්තිකරණයද වර්ධනය කළ හැකිය.

# මහජන බැංකුව මහනුවරදී ලෝක ළමා දිනය සමරයි

මහජන බැංකුව, ලෝක ළමා දිනය වෙනුවෙන් පසුගියදා කැන්ඩි සිටි සෙන්ටර්හි සංවිධානය කළ විශේෂ වැඩසටහනකට අනුග්‍රහකත්වය ලබාදෙන ලදී.



දරුවන් වෙනුවෙන්ම සැකසූ විශේෂ විනෝදාත්මක අංග, සංගීත හා නර්තනාංගවලින් මෙන්ම අධ්‍යාපනික හා විනෝදාත්මක ක්‍රීඩා වලින් සමන්විත වූ මෙම වැඩසටහන නෙත් FM නාළිකාව විසින් සංවිධානය කර තිබිණි.

මහජන බැංකුව ද මෙහි ක්‍රීඩා තරඟ රැසකට සඳහා අනුග්‍රාහකත්වය ලබා දුන්නේය. එමෙන්ම එම තරඟ වල ජයග්‍රහකයන්ට මෙන්ම සහභාගි වූ සියලුම දරු දැරියන්ට විශේෂ තිළිණද පිරිනමන ලදී.

මෙහිදි කුඩා කාලයේ පටන් ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කරගැනීමේ වැදගත්කම පිළිබඳව දරු දැරියන් දැනුවත් කළ අතර, මහජන බැංකුවේ ඉසුරු උදාන හා සිසු උදාන ගිණුම් ඔස්සේ ලබාදෙන ප්‍රතිලාභ පිළිබඳවද දැනුවත් කෙරිණි. මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන හා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් නන්දන ගලබොඩ, මහජන බැංකුවේ මහනුවර සහකාර ප්‍රාදේශීය කළමනාකාරිනි දිස්නා ජයතිස්ස, ප්‍රවීණ රංගන ශිල්පිනි නිල්මිණි කෝට්ටේගොඩ, මහජන බැංකුවේ හා නෙත් FM හි නිලධාරින් සහ දරු දැරියන් විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ. මහජන බැංකුව වයස අවුරුදු 05 දක්වා සිඟිත්තන් වෙනුවෙන් ඉසුරු උදාන ගිණුමද, සිසු දරු දැරියන්ට ඉතිරි කිරීමේ සංකල්පය හුරු කිරීමේ අරමුණ ඇතිව සිසු උදාන ගිණුමද හඳුන්වා දී ඇත.

# පන්නිපිටිය පෞද්ගලික රෝහලේ කාමර මිල ගණන් අඩු වේ

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කීර්තිමත් නාමයක් දිනාසිටින පෞද්ගලික රෝහලක් වන පන්නිපිටිය පෞද්ගලික රෝහල රෝගීන් වැඩි ප්‍රමාණයකට එකවර ප්‍රතිකාර ලබාගත හැකි පරිදි නේවාසික ප්‍රතිකාර පහසුකම් තවදුරටත් වැඩිදියුණු කර තිබේ.

ඒ අනුව, තමන්ගේ රුචිකත්වය පරිදි, කාණ්ඩ 3 ක් යටතේ රෝහලේ කාමර පහසුකම් වෙන් කරවාගැනීමේ අවස්ථාව රෝගීන් වෙත දැන් උදාවී ඇත.

සාමාන්‍ය නේවාසික කාමරවල සිට අධිසුඛෝපභෝගී පහසුකම් සහිත කාමර දක්වා විහිදෙන මෙම කාමර පහසුකම් දිනකට රුපියල් 2500 සිට 12,500 දක්වා මුදලකට වෙන්කරවා ගත හැකි බව පන්නිපිටිය පෞද්ගලික රෝහලේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ, ආචාර්ය ආනන්ද කුරුප්පු ආරච්චි පවසයි.

පන්නිපිටිය පෞද්ගලික රෝහලේ මෑතකදී විවෘත කරන ලද අධි සුඛෝපභෝගී "LOTUS WING " කාමර සංකීර්ණයද මෙම කාමර පහසුකම් අතරට ඇතුළත් වේ.

නේවාසික ප්‍රතිකාර ලබාගන්නා රෝගීන්ට මෙරට රෝහලකින් හිමිවන ඉහළම පහසුකම් ලබාදෙන "LOTUS WING " කාමර සංකීර්ණයේ කාමරයක් දිනකට රුපියල් 8000 සිට 12,500 දක්වා වන ඉතා සහනදායි මිලකට වෙන්කරවා ගත හැකිය. රෝහලේ නේවාසික පහසුකම් පිළිබඳ සියලු විමසීම් සඳහා 0112840065 යන දුරකථන අංකය විවෘත කර තිබේ.

රෝහලේ සභාපති ආචාර්ය ආනන්ද කුරුප්පු ආරච්චි මහතා වැඩිදුරටත් සඳහන් කළේ,ගෙවන මුදලට වැඩි සේවයක් ලබාදෙන, පිරිවැය ඵලදායී රෝහලක් වන පන්නිපිටිය පෞද්ගලික රෝහල නේවාසික පහසුකම් නව මුහුණුවරකින් හඳුන්වාදීමට තීරණය කළේ, කොරෝනා වසංගතය හමුවේ රටේ ජනතාව මුහුණදී සිටින ආර්ථික අපහසුතා පිළිබඳවද සැලකිලිමත් වෙමින් බවය.

දිනෙන් දින ඉහළයන ඉල්ලුමට අනුව, ඉදිරි කාලයේදී මෙම සියලුම කාණ්ඩවලට අයත් කාමර සංඛ්‍යාව තවදුරටත් ඉහළ නංවා සිය සේවාවන් තවත් පුළුල්කිරීමටද රෝහල සූදානමින් සිටී.

පන්නිපිටිය පෞද්ගලික රෝහල 5D අල්ට්‍රා සවුන්ඩ් ස්කෑනින් පරීක්ෂණ ඇතුළු අධි තාක්ෂණික වෛද්‍ය පරීක්ෂණ සහ ප්‍රතිකාර රැසක් පළමු වරට ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් රෝහල ලෙසද ප්‍රකටව සිටියි.



පන්නිපිටිය පෞද්ගලික රෝහල රෝගීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කිරීම පිණිස පිරිනමනු ලබන ISO 18001-2007 ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සහතිකය ඇතුළු දේශීය සහ අන්තර්ජාතික ප්‍රමිති සහතික සහ සම්මාන රැසකින්ද පිදුම් ලබා ඇත.

60 රස මිහිර Uswatte සිළුමිණ

උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි

## මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 75

ගුරු චිත්‍රය



ගෝල චිත්‍රය




චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මගින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංඡන 2 ක් සමඟ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය. ජයග්‍රාහකයන්ට වටිනා මුදල් ත්‍යාග පිරිනැමේ. තැපැල්පත් නොවැම්බර් මස 03 වැනිදාට පෙර පහත ලිපිනයට එවිය යුතු ය. ගුරුගෝල වෙනස, 'සිළුමිණ', ලේක්හවුස්, කොළඹ 10 මෙතෙක් පැවැති ත්‍යාග රටාව වෙනුවට ජයග්‍රාහකයන්ට රුපියල් 2500 බැගින් ත්‍යාග 09 ක් පිරිනැමේ. උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් ලිමිටඩ් අනුග්‍රහයෙනි.

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)

රුපියල් විසිපන්දහසක තෑගි



පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කරන්න.



# කුඩාවැල්ල ධීවරයන්ගෙන් ආණ්ඩුවට ඉල්ලීමක්

● ඉනෝකා පෙරේරා බණ්ඩාර

**ශ්‍රී ලංකාව යනු, රටට වඩා දහ ගුණයක් විශාල සාගර සම්පතක් හිමි, ලොව විරල රටවල් අතරේ එකකි. එහෙව් රටක්, ටින් මාළු ආනයනය කිරීම පුදුමයට කරුණක් වුවත්, වඩාත් පුදුම සහගත කාරණය වන්නේ, ටින් මාළුවලින් පමණක් නොනැවතී, මාළු, කරවල සහ උම්බලකඩ වැනි මුහුදු සම්පතින් සුලබව නිපදවිය හැකි සෑම මත්ස්‍ය ආහාරය වර්ගයක්ම පාහේ ආනයනය කිරීමයි. ඒ සඳහා, ශ්‍රී ලංකාවෙන් ඇදී යන විදේශ විනිමය ප්‍රමාණය, වසරකට ඇමෙරිකානු ඩොලර් මිලියන 500කට ආසන්න මුදලකි.**

මාළු ආනයනය සඳහා වාර්ෂිකව වැය කරන මෙම විදේශ විනිමය අඩු කිරීම සඳහා දිශා කිහිපයකින් සැලසුම් සකස් කළ යුතු බව, ධීවර කර්මාන්තයේ අනාගත කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මෑතකදී පැවැත්වූ රැස්වීමක් අමතමින් ජනාධිපති, ගෝඨාභය රාජපක්ෂයන් පැවසීය.

දළ දේශීය නිෂ්පාදිතයට ධීවර කර්මාන්තයේ දායකත්වය 1% කි. රට පුරා මුහුදු තීරය දිගේ මසුන් ඇල්ලීමේ හැකියාව සහ මිරිදිය ධීවර කර්මාන්තය වර්ධනය කිරීමෙන් විදේශ විනිමය රටේ ඉතිරි කර ගත හැකි වන අතර, මෙරට ධීවර කර්මාන්තයත් එවැනි තැනකට රැගෙන ආ යුතු බව, ජනාධිපතිතුමා අවධාරණය කළේය. මාළු ආනයනය සඳහා වැය කරන විදේශ විනිමය අඩු කිරීමට, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් ගෙන ඇති නියෝග ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කරන ලෙස, ධීවරයන් මාළු සැපයුම්කරුවන් සහ දේශීය ටින් මාළු නිෂ්පාදකයන් බලධාරීන්ගෙන් යළි යළිත් ඉල්ලා සිටින්නේ මෙවැනි පසුබිමක් යටතේය.

පෑලියගොඩ ටෙස් ගෲප් සමාගම, පසු ගිය දා සංවිධානය කළ කුඩාවැල්ල සහ හික්කඩුව ධීවර වරායන්හි ක්ෂේත්‍ර චාරිකාවක දී , අදාළ නිලධාරීන් ජනාධිපතිවරයාගේ එම නියෝග ක්‍රියාත්මක නොකිරීමෙන් ටින් මාළු ආනයනය, තමන් වෙත එල්ල කොට ඇති අහිතකර බලපෑම පිළිබඳ ධීවර ප්‍රජාව සිය කනස්සල්ල පළ කළේ මෙලෙසිනි.

'හොඳ හිත' නමින්, බහුදින ධීවර යාත්‍රා කීපයකම හිමිකරුවකු වන විජයසිරි, ගාල්ල සහ හික්කඩුව ධීවර වරායන්ගෙන් ලින්නා මසුන් මිලදී ගන්නා ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයෙකි. එමෙන්ම,'ටෙස්' ටින් මාළු කර්මාන්තශාලාව වෙත මසුන් සැපයීමේ ප්‍රමුඛයකු ලෙස ද කටයුතු කරයි.

" අපි ධීවර කර්මාන්තයේ යෙදී ඉන්නේ, අපේ අත්තා මුත්තා කාලයේ පටන්. අපේ, විල්මට් සිල්වා පරම්පරාවේම බහු දින යාත්‍රා තිහ හතළිහක් ම ධීවර කර්මාන්තයේ යෙදී සිටිනවා. විශේෂයෙන් මේ පළාතේ ජාඩි කර්මාන්තය රැඳී තිබුණේ අපේ පරපුරේ මිනිසුන් අතේ. නමුත් දැන්, ජාඩි කර්මාන්තය කියා දෙයක් ඉතිරි වී නැහැ. රටින් කරවල , උම්බලකඩ, ටින් මාළු විතරක් නෙවෙයි, මාළු ටිකත් ගෙන්වන්න ගත්තට පස්සේ, අපේ මාළුවලට මිලක් නැති වුණා. මිනිස්සු හුඟ දෙනෙක් කර්මාන්තය අත්හැරියා. දැන් දේශීය ටින් මාළු කර්මාන්තය සඳහා මාළු සපයන නිසා තත්ත්වය ටිකක් යහපත් අතට හැර වුණා. නමුත් දැන් ටින් මාළු දිගින් දිගටම පිට රටින් ගෙන්වීමෙන්, අපි ආපහු කබලෙන් ලිපට වැටෙන තත්ත්වයක් උදා වී ගෙන එනවා.

ඒ වගේම, ඉස්සර දොඩන්දූව කියන්නේ සශ්‍රීක වරායක්. අද ප්‍රශ්න ගොඩක් තියෙන තැනක්. මේ දොඩන්දූව, අංගසම්පූර්ණ ධීවර වරායක් කළා නම් ඇති වී තිබෙන මේ බෝට්ටු තදබදය අඩු වෙනවා. එහෙම කළොත්, වැඩි දෙනකුට බහුදින ධීවර යාත්‍රාවලින් මුහුදු යන්න අවස්ථාව ලැබෙනවා. දැන් මාළු අස්වනු හොඳයි. සමාගම හොඳ මිලකට අපෙන් මිලදී ගන්න නිසා, ධීවර පවුල් විශාල ප්‍රමාණයකගේ ආර්ථිකය යහපත් වී තිබෙනවා.

නමුත්, හික්කඩුව, දොඩන්දූව, රජ්ගම, අම්බලන්ගොඩ සහ ගාල්ල වරායන් තුළ පමණක් බහු දින ධීවර යාත්‍රා 2000ක් තිබෙනවා. මේ විදියට දිගින් දිගටම, ටින් මාළු පිටරටින් ගෙන්වන්න ගියොත්, දේශීය ටින් මාළු කර්මාන්තය කඩා වැටෙනවා. එතකොට, අපි අපේ මාළු අස්වනු දෙන්නේ කාටද ...?

මේ ධීවර කර්මාන්තයට අදාළව, යාත්‍රාවල කුලී පදනමින් සේවය කරන අයගේ සිට දැල් වියන, අයිස් සපයන... ආදී වශයෙන් කර්මාන්තය වටා ගොඩනැගුණු අමතර රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් මේ තත්ත්වය තුළ අහිමි වී යනවා. මත්ස්‍ය ආහාර ලෙස මෙරටට ගෙන්වන දේ අතරින් වැඩිම විදේශ විනිමයක් වැය වන්නේ ටින් මාළු සඳහායි.දේශීය ටින් මාළු කර්මාන්තයට ගැළපෙන ලින්නා කියන්නේ, දකුණු මුහුදු තීරයේ බහුලව අහුවන, රසයෙන් සහ ගුණයෙන් අනූන මාළු විශේෂයක්.

ජනාධිපතිතුමා , ධීවර කර්මාන්තයේ උන්නතිය උදෙසා සැලසුම් හදන්න කියා තිබියදීත්, තවම ඒ පිළිබඳ අවධානය යොමු නොකර, පරණ විදියටම කාරණා සිද්ධවෙන එක ගැන අපිට තියෙන්නේ දැඩි කණස්සල්ලක්. අපි රජයෙන් ඉල්ලා සිටින්නේ ටින් මාළු ගෙන්වීම ටික කලකට හෝ අත්හිටුවා, මේ කර්මාන්තය දියුණු කිරීමට මැදිහත්වන ලෙසයි..."

දේශීය සැමන් කර්මාන්තය වෙත මසුන් සපයන, කුඩාවැල්ලේ තවත් සැපයුම්කරුවකු වන, ආර්. විජේසූරිය දැක්වූයේ මෙවැනි අදහසකි.

" ලංකාවේ ලින්නා මසුන් බහුලවම ගැවසෙන්නේ, මේ දකුණු දිග මුහුදු තීරයේ. මේ පළාතේ ධීවර ජනතාවගේ හොඳම ආදායම් මාර්ගය තමයි, ලින්නා මසුන් දේශීය සැමන් කර්මාන්තය වෙත සැපයීම. ඒ නිසා, මේ ප්‍රදේශයේ ජන ජීවිතයට මේ කර්මාන්තය ඉතාමත් වැදගත්.

ඇතැම් විට, ටින් මාළු ගෙන්වීම සීමා කළත්, ලංකාවේ දී ටින් කිරීම සඳහා, මාළු ආනයනය කිරීමත් සිදුවනවා. අප කියන්නේ, මේ දෙක ම නතර කළ යුතු බවයි..."

බොහෝ කලක් පිටරට රැකියාව කළ ඔහු, දැන් තමන්ගේ රටේ හිඳ ධීවර කර්මාන්තයට අදාළව, ටින් මාළු කර්මාන්තශාලා සඳහා මසුන් මිලදී ගැනීමේ යෙදී සිටින්නේ, එහි ඇති යහපත් ආර්ථික තත්ත්වය නිසාය.

" මම පිටරට රැකියාව අත් හැර මේ කර්මාන්තයට යොමු වුණේ, එහි තියෙන ආර්ථික යහපත්කම නිසා. එහෙම හොඳ ඉල්ලුමක් තියෙන අපේ රටේ කර්මාන්තයක් තමයි, දැන් මේ සීමාවක් නැතිව පිටරට දේ ගෙන්වන්න අරන් නැති වෙලා යන්න හදන්නේ. මේ පළාතේ හුඟක් අය, සැමන් කර්මාන්තශාලා සඳහා මාළු සැපයුම් කොට ජීවත් වනවා.

මේ ටින් මාළු ගෙන්වීම නතර නොකළහොත් මේ සෑම කෙනෙකුගේම ජීවිකාව අහිමි වෙලා යනවා. ඔවුන්ගේ ආර්ථිකය කඩා වැටෙනවා..."

ඔහු මෙන්ම, කුඩාවැල්ල සහ දකුණු දිග තීරයේ බොහෝ ධීවර සැපයුම්කරුවන් මේ වන විට මුහුණ පා ඇති පොදු ගැටලුවක් වන්නේ, මත්ස්‍ය අස්වනු බහුල වුවත්, දේශීය ටින් මාළු කර්මාන්තකරුවන් සිය අස්වනු මිලදී ගැනීම අඩු කර තිබීමයි.

මේ පිළිබඳ අදහස් දැක්වූ, කේ.එච්. ජනිත් පැවසුවේ මෙවැන්නකි.

" ගිය අවුරුදුවලට සාපේක්ෂව, මේ වසරේ අපේ මාළුවලට හොඳ ඉල්ලුමක් නැහැ. හොඳ මිලකුත් නැහැ. ඒත්, ලංකාවෙ මිනිස්සු මොන තරම් සැමන් කනවද... එහෙම බලද්දි,සැමන් නිෂ්පාදනය කියන්නේ, කවදාවත් කඩා වැටෙන්නේ නැති කර්මාන්තයක්. තව තවත් සැමන් ෆැක්ටරි ලංකාවේ ඇති වෙනවා නම් තමයි, අපිත් කැමති. මොකද එතකොට අපේ මාළු අස්වනුවලට හොඳ මිලක් ලැබෙන නිසා. මේක සුළුවෙන් තකන්න පුළුවන් ප්‍රශ්නයක් නෙවෙයි. රටේ ආර්ථිකයට වගේම, ධීවර ප්‍රජාවගේ ජීවිකාවට සහ ආර්ථිකයට සෘජුව බලපාන ප්‍රශ්නයක්. ජනාධිපතිතුමා දුන් නියෝග ක්‍රියාත්මක කොට, මේ ප්‍රශ්නය විසඳන්න දැන් හොඳටම වෙලාව ඇවිත්..."

මෙරට ටින් මාළු නිෂ්පාදකයන්ගේ සංගමයේ සභාපති, ශිරාන් ප්‍රනාන්දු පැවසුවේ, කොවිඩ් -19 බලපෑම හේතුවෙන් ලොව බොහෝ කර්මාන්තවලට හානි සිදුවී ඇති මෙවැනි මොහොතක, විදේශ ගත ශ්‍රී ලාංකිකයන් වෙනත් රටවලින් ආපසු පැමිණෙන්නේ, රැකියා විරහිතයන් ලෙස බවයි.එමෙන්ම, ටින් මාළු කන්ටේනරයක් ශ්‍රී ලංකාවට ගෙන්වන ගාණේ, ක්‍රම ක්‍රමයෙන් ධීවර ජනතාව ද එම රැකියා විරහිතයන් ගොඩට එක් වන බවයි.

දේශීය ටින් මාළු නිෂ්පාදනය වැඩි වන්නේ නම් ටින් මාළු කර්මාන්තයට අදාළ, ටින් නිෂ්පාදනය, ලේබල් මුද්‍රණය, ලුණු සැපයීම... ආදී, ඒ හා බැඳුණු රැකියා රැසක් සුරක්ෂිත වන බවද ඔහු පෙන්වා දුන්නේ ය.

මෙම තත්ත්වය තුළ, දේශීය ටින් මාළු නිෂ්පාදකයන්, ධීවරයන් 600,000 කට අධික සංඛ්‍යාවක ගේ ජීවිකාව සහ මිලියන 1.5 ක් ලේබල්, ලුණු, හිස් කෑන් ආදිය ඇතුළු සෑම දෙයක්ම දේශීයව මිලදී ගන්නා බැවින්, මේ රටේ තවත් කර්මාන්ත නඟා සිටුවීම උදෙසා ද සහය වේ. එමෙන්ම, එවිට ඔවුන්ගේ මසුන් සඳහා ඉහළ මිලක් ගෙවීමේ හැකියාවද ඇති අතර, එමගින් ඔවුන්ගේ මසුන් ඇල්ලීමේ ධාරිතාව ඉහළ නැංවීමට හැකි වේ.

එමගින් අපගේ මුහුදු තීරයේ මත්ස්‍ය අස්වනු සොරකම් කරන ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රාකරුවන්ගේ ගැටලුව ද ස්වයංක්‍රීයව විසඳනු ඇත.

" මිනිසුන්ගේ ලොකුම දිරිගැන්වීම වන්නේ, මුදල්. ධීවරයාට හොඳ මිලක් ලබා දීමෙන් ඔවුන්ගේ ඵලදායිතාව ඉහළ නැංවෙනවා.එවිට, දැල්, බෝට්ටු වැනි ධීවර ආම්පන්න ඔවුන්ටම මිලදී ගත හැකියි.

තායිලන්තය වැනි අනෙකුත් සාර්ථක රටවල් මෙන් මෙම කර්මාන්තය දියුණු කර ගැනීමට නම්, අපේ රටේ හදන අපේ ටින් මාළු,සතොස සහ ත්‍රිවිධ හමුදාව වැනි රාජ්‍ය ආයතන සඳහා අනිවාර්ය කරන ලෙස අපි ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිනවා. ශ්‍රී ලංකාවට වඩා, ඉතා කුඩා මුහුදු ස්කන්ධයක් ඇති තායිලන්තය ලොව ටින් මාළු අපනයනය කරන 4 වැනි විශාලතම රට බවට පත්ව ඇත්තේ, තමන්ගේ රටේ දේ, අගය කරන්නට ප්‍රවර්ධනය කරන්නට දායක වීමෙන්.

අපේ රටෙත් දේශීය ටින් මාළු නිෂ්පාදකයින්ට ප්‍රමුඛතාවය ලබා දෙන්නේ නම්, ඉදිරි වසර කිහිපය තුළ ශ්‍රී ලංකාව ද ටින් මාළු අපනයනය කරන රටක් බවට පත් කරන්නට අපට පුළුවන්... "

ශිරාන් ප්‍රනාන්දු මහතා තවදුරටත් පෙන්වා දුන්නේ ය.


ටෙස් සභාපති ශිරාන් ප්‍රනාන්දු


එම්. ඩබ්. විජේසිරි


කේ. එච්. ජනිත්


ආර්. විජේසූරිය


ටෙස් සාමාජික චමින්ද

ඡායාරූප විමල් කරුණාතිලක



වාණිජ මණ්ඩලී



# බිලියන 34ක් පිල්ලි ගැසූ නීති විරෝධී ETI ගනුදෙනුව

## තැන්පත්කරුවන් 24,800 යි

## නීතිමය පියවර ගන්න කැබිනට් අනුමැතිය

● චන්දිමා එදිරිමාන්න

**එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් හා ඊට අනුබද්ධ සමාගම් හි සිදු වී ඇතැයි පැවසෙන මූල්‍යමය හා දේපළ ගනුදෙනු පිළිබඳ අක්‍රමිකතා සම්බන්ධයෙන් සොයා බැලීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් විසින් විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ. ටී. චිත්‍රසිරිගේ සභාපතිත්වයෙන් යුතුව හිටපු සොලිසිටර් ජනරාල්වරයකු වන සුහද ගම්ලත් මහතා හා ජ්‍යෙෂ්ඨ බැංකුකරුවකු වන ඩී.එම්. ගුණසේකරගේ සාමාජිකත්වයෙන් යුත් 2020 ජනවාරි මස 09 දින පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව එකී ගනුදෙනු පිළිබදව සිය නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත්ව පිළියෙල කරන ලද වාර්තාව 2020 ඔක්තෝබර් මස 06 වැනි දින ජනාධිපතිතුමා වෙත බාර දුන් අතර එම සමාගම් (ETI ) පසුගිය සමයේදී සිදු කළ මූල්‍ය හා දේපළ ගනුදෙනු රැසකදීම මූල්‍ය නීති රැසක් කඩ කර ඇති බවත්, අක්‍රමිකතා රැසක් සිදු වී ඇති බවත් එම කොමිෂන් සභා වාර්තාවේ සඳහන් කර තිබේ.**

සමාගම් නීතිය, මූල්‍ය සමාගම් පිළිබඳ නීතිය, මුදල් විශුද්ධිකරණ පනත, මූල්‍ය තොරතුරු වාර්තා කිරීමේ පනත, ඉඩම් විදේශිකයන්ට පැවරීමේ නීතිමය රාමුව මෙන්ම, දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන වැරදි රාශියක් එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් හා ඊට අනුබද්ධ සමාගම් මගින් සිදු කර ඇති බවට මෙම කොමිෂන් සභා වාර්තාවේ වැඩිදුරටත් සඳහන්ය.

එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම් සමූහයට අයත් ස්වර්ණවාහිනී මාධ්‍ය ජාලය ඇතුළු දේපොළ බෙන් හෝල්ඩින්ග්ස් නමැති සමාගමකට අලෙවි කරනු ලැබුවේ මීට වසර කිහිපයකට පෙරදීය.

මෙම විකිණීම සිදුව ඇත්තේ නීති විරෝධී ආකාරයට බව ද එහිදී මුදල් විශුද්ධිකරණයක් සිදුව ඇති බවටද කොමිසම කරුණු අනාවරණය කර ඇත. ඒ අනුව එම දේපළ රජයට පවරා ගැනීමටත්, එහි හිමිකරුවන් ලෙස කටයුතු කර මෙම නීති විරෝධී ගනුදෙනු සිදු කළ පිරිසට එරෙහිව අපරාධ නීතිය යටතේ නෛතිකව කටයුතු කිරීමේ හැකියාව ඇති බවත් කොමිසම වැඩිදුරටත් පෙන්වා දී ඇත.

මෙම කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වූ කරුණු පිළිබඳව දැඩි අවධානය යොමු කළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් හා ඊට අනුබද්ධ සමාගම් හී සිදු වී ඇති මූල්‍යමය හා දේපොළ ගනුදෙනු පිළිබඳ අක්‍රමිකතා සම්බන්ධයෙන් ඉහත කොමිෂන් සභා වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනමින් නීතිමය පියවර ගැනීම පිණිස නීතිපතිවරයාට යොමු කිරීම, මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා ඇති දෙපාර්තමේන්තුව මුළුමනින්ම ප්‍රතිසංවිධානය කර මූල්‍ය සමාගම් නියාමනය සඳහා නව ආයතනික ව්‍යුහයක් සකස් කරන ලෙස මුදල් අමාත්‍යාංශයට දැනුම් දීම, අධිකරණ අමාත්‍යවරයා මගින් මෙම කොමිෂන් සභා වාර්තාව හා ඒ අනුව ගනු ලබන පියවර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම යන යෝජනාද සමග මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙතද ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව කොමිෂන් සභා වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනමින් නීතිමය පියවර ගැනීම කොමිෂන් සභා වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කඩිනමින් නීතිමය පියවර ගැනීම නීතිපතිවරයාට යොමු කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතිය හිමි වී තිබේ.

එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් සමාගම ජනතාව අතර වඩාත් ප්‍රචලිතව ඇත්තේ ඊ. ටී. අයි සමාගම ලෙස වන අතර එම සමාගමේ සභාපතිනිය ලෙස කටයුතු කළ ප්‍රකට ව්‍යාපාරිකා සෝමා එදිරිසිංහ මහත්මියගේ අභාවයෙන් පසු එහි කඩා වැටීම ඉතා වේගයෙන් සිදු විය.


සටන මෙහෙය වූ ඊටීඅයි තැන්පත්කරුවන්ගේ සංගමයේ සභාපති අනූෂා ජයන්ති

සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස ජීවක එදිරිසිංහ, අසංක එදිරිසිංහ, නාලක එදිරිසිංහ හා දීපා එදිරිසිංහ යන කටයුතු කළ අතර සමාගමේ ද්‍රවශීලතාවය වේගයෙන් පිරිහීමට පත්වීමත් සමග ඊ.ටී.අයි. රු. බිලියන 22ක් සිය තැන්පත්කරුවන්ට වංචා කරන තත්ත්වයට පත් විය. ඒ හා සමගම මෙරට පුරවැසියන් 24,800 කගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් එක්ලක්ෂ විසිපන්දහසකට ආසන්න සංඛ්‍යාවකගේ ජීවිතද අඳුරෙන් අඳුරට පත් විය.

ඊ. ටී. අයි පාලකයන් සිය ගනුදෙනුකරුවන්ගේ මුදල්ද අනතුරේ හෙළමින් ඒ පිළිබදව කිසිදු වගවිභාගයක් නොමැතිව හැසිරෙද්දී ඒ වන විටත් සමාගමේ බාහිර ඔපයට හා ප්‍රචාරණ උපක්‍රම වලට රැවටී දුක් මහන්සියෙන් තමන් හරි හම්බ කර ගත් මුදල් ඊ. ටී. අයි වෙත පූජා කර තිබුණු එහි ගනුදෙනුකරුවන් මේ අවනඩුව එවකට මේ රට පාලනය කළ පාලකයන් වෙතත් සියලු මූල්‍ය සමාගම් අධීක්ෂණය කිරීමේ හා නියාමනය කිරීමේ බලය පැවරී තිබෙන ශ්‍රී ලංකා මහ බැංකුව වෙතත් ඉදිරිපත් කළද ඒ සඳහා ඔවුන්ට සාධාරණ විසඳුමක් නොලැබුණු අතර විසඳුමක් ලබා දීමට උත්සුක වන ආකාරයක්ද දක්නට නොලැබුණි. මේ නිසාම සිය අරගලය ඉදිරියට ගෙන යාමට ඊ. ටී. අයි. තැන්පත්කරුවන්ගේ සංගමය ද ඔවුන් පිහිටවූ අතර එම සංගමය මූලිකව ඊ. ටී.අයි අධ්‍යක්ෂවරුන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, විරෝධතා හා සත්‍යග්‍රහ ව්‍යාපාර පැවැත්වීම,මාධ්‍ය හමු හා සාකච්ඡා පැවැත්වීම, දේව කන්නලව් හා ආගමික පිහිට පැතීමේ වැඩසටහන් සංවිධානය වැනි ක්‍රියාමාර්ග රැසක්ම ගන්නා ලදී.

මෙම ඊ. ටී. අයි. තැන්පත්කරුවන්ගේ සංගමයේ සභාපතිනිය ලෙස ඊට නායකත්වය ලබා දෙන්නේ අනූෂා ජයන්තියි.

ඇය ඊ.ටී.අයි සියලුම තැන්පත්කරුවන්ව ඒකරාශී කර ගනිමින් තමන්ට වංචා කළ මෙකී ඊ.ටී.අයි පාලකයන්ට නීතියෙන් උපරිම දඬුවම් ලබා දීම සඳහාත්, එම ඊ.ටී.අයි පාලකයින්ගේ මකර කටට ගිය රුපියල් බිලියන 34 කට ආසන්න මුදල නැවත තැන්පත් කරුවන් අතරේ බෙදා දීම සඳහාත් නොනවතින අරගලයක යෙදෙන්නීය.

ඊ.ටී.අයි වංචාව පසුගිය ජනාධිපතිවරණ හා මහා මැතිවරණ වේදිකාවන්හී ඉතාම සංවේදී මාතෘකාවක් බවට පත් වන්නේද මෙම සංගමය ගෙන ගිය නොනවතින අරගලයේ ප්‍රතිඵලයක් නිසා වන අතර 2020 ජනවාරි මාසයේදීම ජනාධිපතිතුමා විසින් ඔවුන්ගේ ඉල්ලීමට සාවදානව ඇහුම්කන් දෙමින් මෙම විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවද පත් කරන ලදී.

එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් හා ඊට අනුබද්ධ සමාගම් සම්බන්ධව පත් කෙරුණු ජනාධිපති විශේෂ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,එහි නිගමන හා නිර්දේශ පිළිබදව ඊ. ටී. අයි. තැන්පත්කරුවන්ගේ සංගමයේ සභාපතිනී අනූෂා ජයන්තිගෙන් අපි අදහස් විමසුවෙමු.

“මෙම කොමිෂන් සභා වාර්තාවේ ඉතා පැහැදිලිවම ඊ. ටී. අයි මූල්‍යමය හා දේපළ ගනුදෙනු පිළිබඳ අක්‍රමිකතා රාශියක් පිළිබදවම තොරතුරු සඳහන් කර තිබෙනවා. ඒ වගේම සිදු වූ ගනුදෙනු රැසකදීම මුදල් විශුද්ධිකරණය සිදුවෙලා තියෙනවා කියලත් එම වාර්තාවේ සඳහන්. එපමණක් නෙවෙයි ඊ. ටී. අයි දේපළ විකිණීම සිදු කළ ආකාරයන් නීති විරෝධී කියලා නිර්දේශයක් මෙන්ම එම නීති විරෝධී දේපළ ගනුදෙනු නිසාම එසේ විකුණන ලද දේපළ රාජ සන්තක කළ හැකි බවටත් එකී කොමිෂන් සභා වාර්තාවේ සඳහන්.

"මගේ මුදලුත් ඊ. ටී. අයි පාලකයන් කොල්ල කෑවා. මම මේ ඊ. ටී. අයි ගැන හැම දෙයක්ම හොයන්න ගත්තේ මගේ සල්ලි ටිකත් අනතුරේ බව දැනගත් පසුවයි. 2017 සිට අවුරුදු පහක් ආපස්සට මම ඔවුන්ගේ ගිණුම් වාර්තා හොයා ගත්තා. ඊ. ටී. අයි. කඩා වැටීම එම විගණන වාර්තාවල ඉතා පැහැදිලි ලෙසම සඳහන් වී තිබෙනවා.

මූල්‍ය සමාගම් අධීක්ෂණය හා නියාමනය පැවරී ඇති ශ්‍රී ලංකා මහ බැංකුව සෑම වසරකම මේ ගිණුම් පිරික්සනවා; විගණනය කරනවා. සත්‍ය තමයි මහ බැංකුවටත් ඊ. ටී. අයි වෙත අත් වෙන්නට යන ඉරණම පැහැදිලිව පෙනුණා. එසේ පෙනෙන්නට තිබියදීත් තමයි මේ රටේ ජනතාවගේ මුදල් තැන්පතු තව තවත් අද්දවා ගන්න ඊ. ටී. අයි පාලකයින්ට දිගින් දිගටම අවසරය දී තිබෙන්නේ.

2018 ජනවාරි 01 වැනිදා මහ බැංකුව ගත් තීරණයක් අනුව, ඊ. ටී. අයි. මූල්‍ය ව්‍යාපාරයේ කළමනාකරණ සහ අධීක්ෂණ කටයුතු සඳහා තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක්ද මහ බැංකුව විසින් පත් කළා.

මහ බැංකුවේ නියාමනයට අනුව මේ මණ්ඩලය පත් කළාට පස්සෙත්, එදිරිසිංහලා හතර දෙනා රැස්වීම් පවත්වා වරින් වර තැන්පත්කරුවන්ට බොරු බලාපොරොත්තු දුන්නා.

මේ වන විට අප සංගමයේ සාමාජිකත්වය දරන හුඟ දෙනෙක් අවුරුදු තිස් ගණනක් රාජ්‍ය සේවයේ ඉඳලා තමන්ගේ සේවක අර්ථසාධකය අරන් මෙතැනට දාපු අය. වරායෙ සේවකයන්ම තිස් ගණනක් ඉන්නවා. ටිකෙන් ටික එකතු කරලා මිස මේවා අපිට ඉබේ ලැබුණු මුදල් නෙවෙයි. බොහෝ පිරිසක් ගෙයක් දොරක් ඉඩමක් විකුණලා බැරි වයසෙදි කීයක් හරි වැඩියෙන් අතට ගන්න මෙතැනට දැම්මෙ මහ බැංකුව ගැන විශ්වාසය තියලා.'

අනූෂා ජයන්ති ඇතුළු ඊ.ටී.අයි. තැන්පත්කරුවන්ගේ සංගමයේ සාමාජිකයන් ඊ. ටී. අයි සටනින් තම පාර්ශ්වයට ජයග්‍රහණය හිමි වේ යැයි පැහැදිලි විශ්වාසයක් තබා කටයුතු කරන ලදී.

විශේෂයෙන්ම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් මැදිහත්ව සිය අරගලයට විසඳුම් ලබා දෙනු ඇතැයි යන විශ්වාසය ඔවුන් තුළ ඇති වන්නේ ජනාධිපතිතුමා විසින් මෙම විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පත් කිරීමත් සමගමය. මේ වන විට තමන්ට සාධාරණයක් ලැබෙනු ඇතැයි යන විශ්වාසය ඔවුන් තුළ තහවුරු වෙමින් තිබෙන අතර සිය අරගලය ජයග්‍රහණයෙන් තොරව ආපසු හැරෙන්නටද ඔවුන් සූදානම් නැත.


ETI සමාගමේ අධ්‍යක්ෂකවරුන් වන නාලක එදිරිසිංහ, දීපා එදිරිසිංහ, ජීවක එදිරිසිංහ, අසංක එදිරිසිංහ

# සිද්ධාලේප වෙතින් රු. මිලියන 5 ක පරිත්‍යාගයක්



සිද්ධාලේප සමූහ ව්‍යාපාරයේ කළමණාකාර අධ්‍යක්ෂ අශෝක හෙට්ටිගොඩ, සිද්ධාලේප සමූහ ව්‍යාපාරයේ සභාපති දේශබන්දු ආචාර්ය වෛද්‍ය වික්ටර් හෙට්ටිගොඩ විසින් රුපියල් මිලියන පහක් කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට පරිත්‍යාග කිරීමේ චෙක්පත ජනාධිපතිවරයා වෙත බාරදෙන ලදී.

මෙරට ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයේ හා ආයුර්වේද රෝහල් ආයුර්වේද ක්ෂේත්‍රයේ පුරෝගාමියා හා ප්‍රමුඛතම ප්‍රවර්ධකයා ලෙස වසර 200 කට වැඩි ඉතිහාසයක් ඇති හෙට්ටිගොඩ සමූහ ව්‍යාපාරය, පරම්පරා 6 ක් පුරා විහිදුණ සිය අත්දැකීම් හා දැනුම මෙරට වර්තමානය ආයුර්වේද ක්ෂේත්‍රයේ අනාගත අභිවෘද්ධිය සඳහා භාවිත කරමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

වසර 85 පුරා ශ්‍රී ලංකේය ජනතාව සියලු කැක්කුම් වේදනා සඳහා විශ්වාසය තැබූ සිද්ධාලේප වෙළෙඳනාමය අද වන විට ගෘහස්ථ වෙළෙද නාමයක් වේ.

# HNB FINANCE ජයග්‍රාහකයන්ට තිළිණ



සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිවෙස්වල සිට සැමරූ ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන්ට අලුත්ම අත්දැකීමක් එක් කළ HNB FINANCE ''අපේ ගෙදර අවුරුදු'' ඩිජිටල් අලුත් අවුරුදු ප්‍රවර්ධන වැඩසටහන සමගින් එක්ව ජයලැබූ ජයග්‍රාහකයන් ඇගයීමට සමාගම පසුගියදා පියවර ගන්නා ලදී. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද හා සබැඳි විවිධ ජන ක්‍රීඩා, අවුරුදු රස පැණ තරග ඇතුළුව විවිධ වැඩසටහන් රැසක් HNB FINANCE ''අපේ ගෙදර අවුරුදු'' ඩිජිටල් අලුත් අවුරුදු ප්‍රවර්ධන වැඩසටහන මගින් ශ්‍රී ලාංකිකයන් වෙත තිළිණ කළේය.

HNB FINANCE PLC විසිවැනි සාංවත්සරික වසරේ දී සිය පාරිභෝගිකයන්ට හා සමස්ත ශ්‍රී ලංකාවාසීන්ට ඩිජිටල් සේවා පද්ධති මත බලගැන්වූ කාර්යක්ෂම මූල්‍ය සේවාවක් ලබා දීමේ ඉලක්කය වෙත ගමන් කරන සමාගම මෙම වැඩපිළිවෙල තුළින් ද නවතම ඩිජිටල් ක්‍රීඩා අත්දැකීමක් ශ්‍රී ලාංකිකයින් වෙත ලබා දීමට සමත් විය. ''අපේ ගෙදර අවුරුදු'' HNB FINANCE ඩිජිටල් අලුත් අවුරුදු ප්‍රවර්ධන වැඩසටහනේ ජයග්‍රාහකයන් වෙත තිළිණ ප්‍රදානය කිරීම දිවයින පුරා පිහිටි HNB FINANCE හි ශාඛා ජාලයේ ශාඛා කළමනාකරුවන් අතින් ඒ ඒ ශාඛාවන්හිදි සිදු කෙරුණි.

# සෙලාන් බැංකුව PickMe සමග අත්වැල් බැඳ ගනී

සෙලාන් බැංකුව සියලු ම සෙලාන් ක්‍රෙඩිට් සහ ඩෙබිට් කාඩ්පත්හිමියන් හට අසමසම වට්ටම් රැසක් පිරිනැමීම සඳහා මෙරට ප්‍රමුඛත ම ප්‍රවාහන සේවා සම්පාදකයකු වන PickMe සමඟ අත්වැල් බැඳ ගනී.

ඒ අනුව 2020 දෙසැම්බර් මස 31 වනදා දක්වා සෙලාන් කාඩ්පත්හිමියකුට මසකට PickMe ගමන් දෙකක් සඳහා රු. 100 ක වට්ටමක් හිමි වේ. මෙම වට්ටම හිමිකර ගැනීම සඳහා සෙලාන් බැංකු කාඩ්පත්හිමියන් කළ යුත්තේ PickMe යෙදවුමේ ගෙවීම් ක්‍රමය ලෙස සෙලාන් ඩෙබිට් හෝ ක්‍රෙඩිට් කාඩ්පත ඇතුළත් කිරීම පමණි.

ඒ හරහා අතින්-අතට මුදල් සංසරණය කිරීමෙන් වැළකී වඩාත් පහසුවෙන් සහ විශ්වසනීය අයුරින් සිය ගෙවීම් කළ හැකි අතර වට්ටම් හිමිකර ගැනීමේ අවස්ථාව ද පාරිභෝගිකයන් හට උදා වේ.

PickMe සේවාව මගින් පිරිනමනු ලබන ප්‍රවාහන, ආහාර-පාන හෝ වෙනත් ඕනෑම සේවාවක් සඳහා මෙම ප්‍රවර්ධන වැඩසටහන වලංගු වේ.

# එක්ස්ටර්මිනේටර්ස් වෙතින් විශේෂ විෂබීජහරණ සේවාවක්



ආසියාවේ ප්‍රථම කාබන් අක්‍රිය පලිබෝධ මර්දක සමාගම වන 'ද එක්ස්ටර්මිනේටර්ස්' කෝවිඩ් 19 ගෝලීය වසංගතය පිටුදැකීම සඳහා ලෝකයේ පළමු වැනි විශේෂිත ක්ෂුද්‍ර ජීවී මර්දක විෂබීජහරණ සේවාව අරඹයි. පරිසරය සුරැකීමට කැප වූ ද එක්ස්ටර්මිනේටර්ස් සමාගම ගෝලීය වශයෙන් පිළිගන්නා කාබන් අක්‍රිය සහතිකය හිමි කර ගෙන ඇත. අදාළ විෂබීජහරණ සේවයේ හරිතාගාර වායු විමෝචන මට්ටම් පරීක්ෂාව සිදු කළේ ඉකුත් සය වසර මුළුල්ලේම සමාගමේ වායු නිකුතුව කළමනාකරණයට උපදෙස් දුන් කාබන් කන්සල්ටින් සමාගමය. මේ විශේෂිත විෂබීජහරණ සේවය සඳහා කාබන් අක්‍රිය සහතිකය පිරිනමන ලද්දේ ISO 14064 ප්‍රමිතියට අනුව සංවිධාන හා ව්‍යාපෘතිවල හරිතාගාර වායු විමෝචන තහවුරු කිරීමේ බලය ලත් එකම ශ්‍රී ලාංකේය සමාගම වන සස්ටේනබල් ෆියුචර් සමූහයය.

දේශීය ජන සමාජයටත් ව්‍යාපාරික ක්ෂේත්‍රයටත් එකසේ අභියෝගකාරී වත්මන් වසංගත තත්ත්වය තුළ විශේෂ විෂබීජහරණ සේවාවක් සඳහා පුහුණු කරන ලද එක්ස්ටර්මිනේටර්ස් විශේෂඥ කණ්ඩායම මේ දක්වා වැඩිහිටි නිවාස 71ක්, පොලිස් ස්ථාන 29ක්, පූජනීය ස්ථාන 15ක්, පාසල් 13ක් හා පොදු ස්ථාන 12ක් පවිත්‍ර කළේය.




# 'GoodWe' සමග බ්‍රෑන්ටෙල් එක් වෙයි



'GoodWe' මෙරට බෙදාහැරීම සඳහා ප්‍රමුඛතම තොරතුරු තාක්ෂණික සමාගමක් වන බ්‍රෑන්ටෙල් ලංකා (පෞද්ගලික) සමාගම විසින් බෙදාහැරීමේ අයිතිය අත්පත් කරගෙන තිබෙන අතර මේ තුළින් සමාගමේ භාණ්ඩ අතරට තවත් ලොව ප්‍රමුඛතම තාක්ෂණික සන්නාමයක් එකතුවී තිබීම කැපී පෙනේ.

Hybrid grid-connected පද්ධතිවලට දහවල් කාලයේ දී උත්පාදනය කරන සූර්ය බලශක්තිය රාත්‍රී කාලයට භාවිත කිරීම සඳහා බැටරිවලට ගබඩා කිරීමේ හැකියාව තිබේ. එසේම, පාරිභෝගිකයාට විකල්ප අවස්ථා දෙකක් ලබාදෙමින් ගබඩා කළ සූර්ය බලශක්තිය අඩුවන විට ජාතික විදුලි බල පද්ධතියෙන් විදුලිය සැපයුම ලබාගැනීමේ අවස්ථාව මෙහි දී හිමිවේ. විදුලිය විසන්ධි කර ඇති අවස්ථාවල විශේෂයෙන් විකල්ප බලශක්ති සැපයුමක් ලෙස මෙය ඉතාමත් ප්‍රයෝජනවත් වන බව බ්‍රෑන්ටෙල් සඳහන් කරයි.

ලෝකයේ Hybrid Inverter වෙළෙඳපොළින් 15% කට වැඩි වෙළෙඳපොළ කොටසක් හිමි GoodWe සන්නාමයේ බලයලත් බෙදාහරින්නා ලෙස බ්‍රෑන්ටෙල් සඳහන් කරන්නේ on-grid solar පද්ධති සඳහා විකල්පයක් වන මෙම Hybrid Inverter අවශ්‍ය තොග මෙරට පාරිභෝගිකයින් වෙනුවෙන් පවත්වා ගන්නා බවයි.

බ්‍රෑන්ටෙල් විසින් ගෝලීය ප්‍රමුඛතම නිෂ්පාදකයන් වෙතින් මෙරට පාරිභෝගිකයන්ට ගෙනෙන නිෂ්පාදන අතරට කුඩා පරිගණක, ඇන්ඩ්‍රොයිඩ් ස්මාර්ට් ජංගම දුරකතන, ටැබ්ලට්, copper සහ fibre network cables, passive network components, solar inverters, PV modules, point-of-sale thermal ප්‍රින්ටර සහ, ඩිජිටල් ස්මාර්ට් බෝර්ඩ් විසඳුම් අයත් වේ.

එසේම, Corning සහ E-tel ජංගම දුරකථනවල මෙරට ජාතික බෙදාහරින්නා ලෙසින් කටයුතු කරන්නේ බ්‍රෑන්ටෙල් සමාගමයි.

# කොමර්ෂල් බැංකුවේ කාඩ් හිමියන්ට වටිනා ත්‍යාග



(වමේ සිට) කොමර්ෂල් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අලෙවිකරණ, හස්රත් මුණසිංහ, ප්‍රධාන මෙහෙයුම් නිළධාරී සනත් මනතුංග, මෙම ප්‍රවර්ධන වැඩසටහනේ ජයග්‍රාහකයන් වන වයි. එම්. ජෝර්ජ් අමිල යටන්වල සහ එච්. බී. ආරච්චිගේ දර්ශන මදුරංග සහ බැංකුවේ කාඩ් මධ්‍යස්ථානයේ ප්‍රධානී තුසිත සුරවීර.

මාසිකව මුද්‍රණය කළ බැංකු වාර්තා ලබාගැනීම වෙනුවට ඉලෙක්ට්‍රොනික බැංකු වාර්තා තෝරාගැනීම වෙනුවෙන් පැවැත්වූ දිනුම් ඇදීමේ දී කොමර්ෂල් බැංකුවේ වාසනාවන්ත ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් දෙදෙනකු සිංගප්පූරුවේ සංචාරය කිරීමට වැයවන මුදලකට සමාන මුදලක් ත්‍යාග වශයෙන් දිනාගෙන තිබේ.

ඉලෙක්ට්‍රොනික බැංකු වාර්තා භාවිත කිරීම මගින් බැංකුවේ කඩදාසි භාවිතය අඩුකිරීම සඳහා බැංකුව විසින් පැවැත් වූ ප්‍රවර්ධන වැඩසටහනට සහභාගි වූ කාඩ්පත් හිමියන් විශාල සංඛ්‍යාවක් අතුරින් වයි. එම්. ජෝර්ජ් අමිල යටන්වල සහ එච්. බී. ආරච්චිගේ දර්ශන මදුරංග ප්‍රධාන ත්‍යාගය දිනාගැනීමට සමත්විය.

මෙම ප්‍රවර්ධන වැඩසටහනේ දී ත්‍යාග ලෙස දෙදෙනෙකුට සිංගප්පූරුවට යාමට සහ ඒමට ගුවන් ටිකට් පත්, හෝටල්වල නවාතැන් පහසුකම්, ගුවන් තොටුපොළවල සිට ප්‍රවාහන පහසුකම් ලබාදීමට එකඟවී තිබුණු අතර කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා පනවා තිබෙන ගමන් සීමා හමුවේ ඒ වෙනුවෙන් වැයවන මුදල ත්‍යාග වශයෙන් ලබාදීමට බැංකුව තීරණය කරන ලදී. සේයාරුවමෙම ජයග්‍රාහකයන් දෙදෙනා කොමර්ෂල් බැංකුවේ කළමනාකාරීත්වයේ නියෝජිතයන් සමඟ සිටින ආකාරයයි.

# පෙරේරා ඇන්ඩ් සන්ස් ඉ-ක්‍රීඩා ක්ෂේත්‍රයට

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කෙටි ආහාර අවන්හල් ජාලයට හිමිකම් කියන පෙරේරා ඇන්ඩ් සන්ස් සමාගම, මෙරට ඉ-ක්‍රීඩා (Esports) ලෝලීන් වෙනුවෙන් විශේෂ තරග ඉසව් දෙකක් සංවිධානය කරමින්, පළමු වරට ඉ-ක්‍රීඩා ක්ෂේත්‍රයට පිවිසී තිබේ. ඒ අනුව "P&S PUBG Mobile Series" තරගය හරහා PUBG Mobile ක්‍රීඩා තරගයක් සංවිධානය කෙරෙන අතර එහිදී පළමු ජයග්‍රාහකයන් 8 දෙනාට රුපියල් ලක්ෂයක මුදල් ත්‍යාග හිමි වේ. දෙවැනි තරගය වන "P&S Mobile Contenders" හිදී තවත් ජනප්‍රිය ඉ-ක්‍රීඩා දෙකක් වන Free Fire හා Call of Duty Mobile (Multiplayer) ජයග්‍රාහකයින්ට රුපියල් 50,000ක් හිමි වේ.

වර්ෂ 1902දී ආරම්භ වුණු පෙරේරා ඇන්ඩ් සන්ස් ව්‍යාපාරය, වසර 118ක් මුළුල්ලේ දිවයින පුරා ශ්‍රී ලාංකිකයින්ට ආහාර සැපයීමට කටයුතු කර තිබේ. මෑතකදී අන්තර්ජාල ඇණවුම් සඳහා ද ඉඩකඩ ලබාදෙමින්, එමෙන්ම PickMe හා Uber Eats හා එක්ව ආහාර බෙදාහැරීම් ජාලය පුළුල් කරගනිමින් සහ තරුණ පාරිභෝගිකයන්ට ගැළපෙන ආහාර වර්ග පිරිනමමින් තම සේවාව නවීකරණය කිරීමට ද පෙරේරා ඇන්ඩ් සන්ස් සමාගම පියවර ගෙන ඇත.

# DSI ටයර් සිය නිෂ්පාදන ධාරිතාව 60%කින් ඉහළ දමයි



DSI ටයර් සමාගම මෝටර් සයිකල් වෙළෙඳපොළේ 60%ක සහ ත්‍රි රෝද රථ වෙළෙඳපොළේ 55%ක වෙළෙඳපොළ කොටසකට උරුමකම් කියමින්, පාරිභෝගික විශ්වාසය ඉහළින්ම දිනා ගනිමින් වෙළෙඳපොළ ප්‍රමුඛයා වී ඇත. පසුගිය කාලයේදී ශ්‍රී ලංකාවේ රිය අනතුරුවලින් වන මරණ සංඛ්‍යාව (2019දී මරණ 2839) ශීඝ්‍රයෙන් වැඩි වී ඇත.

එයින් වැඩි ප්‍රමාණය රාත්‍රියේදී සිදු වන මෝටර් සයිකල් අනතුරුය (2019දී මරණ 1162). මෙයට විසඳුමක් සපයමින් DSI ටයර් සමාගම නව තාක්ෂණය භාවිතයෙන් විශේෂ කට්ට රටා සහිතව විද්‍යානුකූලව නිපදවූ Gen X මෝටර් සයිකල් ටයරය හඳුන්වා දුන්නේය.

Gen X ටයරය රාත්‍රියේදී ධාවකයා පහසුවෙන් හඳුනා ගත හැකි Neon Effect සහිතව නිපදවා ඇත. එහි කාබන් සිලිකන් සංයුතිය අඩු ඝර්ෂණයක් ටයරයට ඇති කරන අතර සුපිරි ඉන්ධන ඉතිරියකටද මග පාදයි.

ලොව පුරා රටවල් 80කට අධික ප්‍රමාණයකට DSI ටයර් සාර්ථකව අපනයනය කරන අතර ඉදිරියේදී නිෂ්පාදන ධාරිතාව ඉහළ දමා අපනයන ප්‍රමාණය වැඩි කිරීමට අපේක්ෂිතය.

SLIM සම්මාන උළෙලේදී Turnaround Brand of the Year-2019 සම්මානයෙන් සහ අපනයන සම්මාන රැසකින් පිදුම් ලැබූ DSI ටයර් සමාගම රැකියා අවස්ථා රැසක් සපයමින් රටට විදේශ විනිමය ගෙන ඒමට සහ ඉතිරි කිරීමට සුවිශාල මෙහෙවරක නිරත වේ.

## සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 116 — රුපියල් පනස්දහසක තෑගි

### කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 116 යනුවෙන් සඳහන් කර ඩේන්ටී මයිලේඩි ටොෆී දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට ඔක්තෝබර් 21 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය සහ දුරකතන අංකය ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම ඔක්තෝබර් 25දා සිළුමිණ පත්‍රයේ පළ වේ. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත ත්‍යාග මුදල් පිරිනැමේ. ඔබේ ත්‍යාග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය - 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ටි ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.


### උපකාරක පද

**හරහට**

1 ගිය වසරේ(2019) රාජ්‍ය සම්මාන දිනූ හොඳම නවකතාව
6 වනය/ වනයට අයත්
7 ශාලාව
8 සුමිත්‍රා පීරිස්ගේ සිනමා නිර්මාණයෙකි
9 වී ආදියෙහි සිහින් සුණු
10 කාන්තාව
12 නරක/පහත්/ අල්ප යන අරුතෙන් යෙදේ
13 වාජී ගුණැති ඔසු පානයෙකි
14 කඳදෙවි
15 මහවැලි ගඟබඩ පිහිටි සුන්දර සරසවිය
17 ශරීරය
18 මධ්‍යම පළාතේ තෙදිසාවෙන් එකකි

**පහළට**

1 මැටි භාජනය/පිඟාන
2 කාව්‍යකාර මණ්ඩප
3 මධ්‍යම ඉන්දියාවේ ප්‍රකට ගංගාවකි
4 චන්ද්‍ර මාස ක්‍රමයේ දහවැනි දිනය
5 දෙකන්නයෙන් එකකි
6 ආසව/ මත්පැන්
11 ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය පිහිටියේ මෙහිය
12 විශාල මදයක් සහිත රස පලතුරෙකි
13 නැබ / බුරිය
16 එකකට පසු සංඛ්‍යාව




සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 116

නම: ..............................

ලිපිනය: ..............................

අත්සන: ..............................

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරූ මාධ්‍ය සේවා



# අම්පාරේ වැනසෙන නටබුන් හා බොදු උරුමය



කංජිකුඩිච්චිආරු

● රුක්ෂිලා වෙත්තමුණි



**අම්පාර දිස්ත්‍රික්කයේ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තිරුක්කෝවිල් සිට පොතුවිල් මාර්ගයේ ටික දුරක් ගොස් තාන්ඩිඅඩි හන්දියට පැමිණ කුඹුරුයායක් මැදින් වනය ඇතුළට කිලෝමීටර් 12 ක් ගමන් කළ විට කංජිකුඩිච්චිආරු නටබුන් පිහිටි පුදබිමට ළඟා විය හැකිය.**

කොටි ත්‍රස්තවාදීන්ගේ නායකයකුගේ කඳවුරක් ලෙස පැවති මේ පුදබිම වර්තමානයේ දී යුද හමුදාවේ රැකවරණය යටතේ ආරක්ෂා වේ. කැඳ බිව් බිමේ ගඟ යන අරුතින් කංජිකුඩිච්චිආරු හඳුන්වා ඇත. කංජිකුඩිච්චිආරුව කුඩා ඔයකි. අක්කරපත්තුවේ සිට පොතුවිල් දක්වා ගමන් මාර්ගයේ පැමිණෙන විට තිරුක්කෝවිල් දක්වා විහිදුණු පෙරිය කලපුව දිස්වේ. ඉන් පසුව කෝරායි, පුල්ලියාඩි, කන්නියාඩි, ඕමාරි හා කෝමාරි යන කලපු පිහිටා ඇත. එල්ලාවල මේධානන්ද හිමියන් සඳහන් කරන්නේ මේ කොටසට අයත් කෝමාරි, තිරුක්කෝවිල්, බක්මිටියා, හුලංනුගේ හා පොතුවිල් යන වසම් වැඩි හරියක් එකල ගන කැලෑවෙන් යුක්ත වූ බවය.

කංජිකුඩිච්චිආරු නටබුන් පිහිටි භූමියට පිවිසීමට වනය මැදින් ගමන් කළ යුතු බැවින් නිශ්චිත ගමන් මාර්ගයක් ඉදිවී නැත. මීටර් කනුවෙන් රූපස්කුලම් මාර්ගය ඇරඹෙන අතර එම මාර්ගයේ සැතපුම් තුනක් පමණ ගිය විට බක්මිටියාව, මීරහල අඩිපාරේ නැවතත් සැතපුම් හයක් පමණ ගිය විට කංජිකුඩිච්චිආරුවට ළඟා-විය හැකි බවත් මීරහල සිට හුලංනුගේට කරත්ත පාරකින් සම්බන්ධ විය හැකි බවත් එමෙන්ම මුළු ගමනින් වැඩි කොටසක් මහ වනයෙන් යුක්ත බවත් මේධානන්ද හිමි නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය යන ග්‍රන්ථයේ සඳහන් කර තිබේ.

මීට ආසන්නව ඇති කිරිමැටි ආරුව ඉහත්තාවේ පොතුවිල් වසමට අනුරූපව ඇති ජයරම්පල, දුටුගැමුණු රජුගේ සේනාව ජය ඝෝෂා නැගූ ස්ථානයක්ය. පළමුවැනි විජයබා හා පළමුවැනි පරාක්‍රමබාහු රජුන්ගේ සටන් මාර්ග ද වැටී තිබුණේ මේ පෙදෙස් හරහාය යැයි සඳහන්ය.

කංජිකුඩිච්චිආරුව හරස්කර වැවක් නිමවා ඇති අතර එහි වැවේ වෑ කන්දෙ වම් පසට වන්නට කඳු ගැටයක් පිහිටා ඇත. ස්තූපයක් යැයි අනුමාන කළ හැකි අඩි 26 ක් උස ගොඩැල්ලක් එහි දක්නට ලැබේ. නිධන් හොරුන් විසින් ස්තූපයේ ස්ථාන කිහිපයක්ම හාරා විනාශ කිරීම හේතුවෙන් පැරණි ගඩොල් විසිර පවතී. එමෙන්ම ගල් කණු රැසක්, කණු පාදම්, ඔපමට්ටම් කළ මල් ආසන කොටස් හා ස්තූපයට සම්බන්ධ අවශේෂ අවට භූමිය පුරාම දක්නට ලැබේ.

එසේම මෙම ස්ථානයට ආසන්නව ඇති පැරණි ගොඩැල්ලක හින්දු කෝවිලක් ඉදිකර ඇත. ස්තූපයට අයත් යැයි සැලකෙන මල් ආසන දෙකක් ඒ සඳහා යොදාගෙන තිබේ. ඉන් එක් මල් ආසනයක් කෝවිලට පිවිසුම් දොරටුව ඉදිරිපිට පඩියක් ලෙස යොදා තිබෙන අතර කණු පාදමක් ද පිහිටුවා එහි ඔවුන්ගේ ආගමික වතාවත් සඳහා භාවිත කොට ඇත. එමෙන්ම අනෙක් මල් ආසනය ද දේව රූප තැන්පත් කොට ඇති ස්ථානය ඉදිරිපිට පිහිටුවා තිබේ. එය පූජාසනයක් ලෙස භාවිත කරනවා විය හැකිය.

වෑ කන්දට දකුණු පසින් විහිදුණු විශාල වූ පර්වත තලාවකි. එහි ලෙන්, වැවට මුහුණ ලා පිහිටා ඇත. කටාරම් කොටන ලද ලෙන් 11 කි. මෙම ලෙන් සියල්ලේම කටාරම් කොටා වාසයට සුදුසු පරිදි සකස් කොට ඇත. එහි ගඩොලින් බැඳි බිත්ති තිබී ඇති අතර එම ගඩොල් භූමිය පුරා තැනින් තැන විසිර පවතී. එල්ලාවල මේධානන්ද හිමි පවසන්නේ මෙහි කැණීමේ කිසිවක් සිදුකොට නොමැති බැවින් ලෙන් තුළ පොළොව අභ්‍යන්තරයේ පිහිටීම කෙසේ දැයි හඳුනා ගැනීමට අපහසු බවය. උන්වහන්සේ මෙම ස්ථානයේ දෙදිනක ගවේෂණයක් සිදු කර ලෙන් ලිපි දෙකක් පිටපත් කොට ඇති අතර එය ක්‍රි.පූ. 2 වන සියවසට අයත් බ්‍රාහ්මී අක්ෂරවලින් ලියන ලදැයි සඳහන් කරයි.

එම ලෙන් ලිපි හා අර්ථය පළමු ලිපිය - "පරුමක වශබ පුත වශ......" (ප්‍රමුඛ වසභගේ පුත්‍රයා වූ වස....)

දෙවන ලිපිය - "පරුමක පුනශ ගුත පුත මහ තිශහ ලෙණෙ" (ප්‍රමුඛ පුනශගුප්තගේ පුත්‍රයා වූ මහා තිෂගේ ලෙණ මහසඟනට පුදන ලදී)

ඉහත දැක් වූ ලෙන් ලිපි දෙකේම සඳහන් වන්නේ එම ලෙන් මහ සංඝයාට පූජා කර ඇති බවයි. මෙහි සඳහන් භාෂාව පැරණි ප්‍රාකෘත සිංහල බවත් මෙවැනි බ්‍රාහ්මී ලෙන් ලිපි රිටිගල, වෙස්සගිරිය, මිහින්තලය ආදි ස්ථාන වල ඇති බවත් ඒවායේ රටාවට සියලු අතින් සමාන වන බවත් එමෙන්ම මේ ලිපි අනුව මෙම ස්ථානය රාජ්‍ය වර්ෂ පූර්ව දෙවන සියවසේ දී භික්ෂු ආරාමයක් වශයෙන් පවතින්නට ඇතැයි යන්න ද මේධානන්ද හිමිගේ අදහසයි.

කුච්චවේලි සමුද්‍රගිරි පිච්චමල් විහාරවාසී පූජ්‍ය කැප්පෙටියාවේ අරණවිහාරී ස්වාමීන් වහන්සේ කංජිකුඩිච්චිආරුහි මෑතක දී කළ සංචාරයක දී දකින්නට ලැබුණු නටබුන් පිළිබඳව ප්‍රකාශ කරනු ලැබූයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම අත්‍යවශ්‍ය බවය. මෙතෙක් රජයේ කිසිදු අනුග්‍රහයක් හෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමක් මෙම ස්ථානය කෙරෙහි යොමුකොට නැතැයි යන්න උන්වහන්සේගේ අදහසයි. යුද හමුදාවේ සෙබළු කිහිප දෙනෙක් මෙහි ආරක්ෂාව වෙනුවෙන් යොදවා ඇති බවත් පූජ්‍ය කැප්පෙටියාවේ අරණවිහාරී හිමි සමඟ කළ සාකච්ඡාවේ දී ප්‍රකාශ කරනු ලැබීය.

**කංජිකුඩිච්චිආරු නටබුන් සහ ශාස්ත්‍රවෙල වෙහෙර ගැන සටහනක්**

අම්පාර, පොතුවිල් මාර්ගයේ පානම ගමට සැතපුම් කීපයක් මෙපිටින් ශාස්ත්‍රවෙල විහාරය පිහිටා ඇති අතර මෙම පුදබිමට පිවිසීම සඳහා පොතුවිල් නගරයේ සිට පානම දක්වා දිවෙන මාර්ගයේ ශාස්ත්‍රවෙල පොලිස් විශේෂ කාර්යබලකා කඳවුර පසුකොට මුහුද දෙසට කි.මී. 1 ක් පමණ ගමන් කළ යුතුය. හැඩඔය, ශාස්ත්‍රවෙල වෙහෙරට උතුරින් හා ඊසාන දෙසින් නැගෙනහිර මුහුදට පිවිසෙන අතර මනරම් වෙරළ තීරයක් මෝයට උතුරින් දිස්වේ.



කංජිකුඩිච්චිආරු ස්වභාවික පොකුණක්



කංජිකුඩිච්චිආරු ලෙන් සංකීර්ණයක්



ශාස්ත්‍රවෙල ලෙනක නටබුන්

වර්තමානයේ මෙම පුදබිම ශාස්ත්‍රවෙල නමින් හැඳින්වූව ද එය මෑත දී යෙදුණු ව්‍යවහාරයක් සේ සැලකේ. මෙම නටබුන් සහිත භූමිය සම්බන්ධ විශාල වෙලක් ඇති අතර එය ශාස්ත්‍රවෙල, රාත්‍රවෙල යනුවෙන් හැඳින්වේ. හැඩ ඔය ඉවුරෙන් මෙම වෙල කෙළවර වේ. විහාරයේ වැඩ වාසය කළ රහතන් වහන්සේලා ඔයෙන් පැන් ගැනීමට මෙම වෙල හරහා නිතර වැඩිය හෙයින් රහතුන් යන වෙල, රහත් වෙල විය. එය ව්‍යවහාරයේ දී රාත්‍රවෙල ශාස්ත්‍රවෙල වූයේ යැයි කියැවේ.

පුදබිම පුරා මුහුදට ආසන්නව, පර්වතයේ හා පර්වතය පාමුල පුරාවිද්‍යාත්මක අවශේෂ විසිර පවතී. පන් කන්ද හෙළ නමින් මෙහි ප්‍රධාන කන්ද හැඳින්වෙන අතර මෙහි සිට මුහුදු වෙරළ අසල මුහුදට යාවන සේ මීටර් 500 ක් පමණ ගිය විට පර්වතයක් දැකිය හැකිය. හැඩ ඔයේ එක් ශාඛාවක් වූ "කුඩා කල්ලිය" මුහුදට පිවිසෙන්නේ මෙම ස්ථානයෙනි. පර්වතය පාමුල මුහුද ඉතා ගැඹුරු වන අතර මෙරට පිහිටි දර්ශනීයම ස්ථාන වලින් එකක් යැයි මෙම ස්ථානය සැලකේ.

මෙම පර්වතය මත පිහිටි තවත් ගල් කුළකි. එහි කටාරම් කොටන ලද ලෙනක් පිහිටා තිබේ. අතීතයේ දී එම ලෙනෙහි බිත්ති බැඳ තිබෙන්නට ඇතැයි යන්න එහි ඉතිරිව ඇති පැරණි ගඩොළු සාක්ෂි දරයි. කටාරමේ සෙල් ලිපියක් කොටා ඇති බවට සලකුණු පෙන්නුම් කළද මුහුදු සුළඟ හේතුවෙන් එම ලිපිය විනාශ වී ඇතැයි යන්න එල්ලාවල මේධානන්ද හිමි සඳහන් කර ඇත.

ලෙනේ සිට පර්වතයට නැගීමට කුඩා පියගැට හතරක් නෙළා ඇති අතර පටු කපොල්ලකින් රිංගා යා යුතුය. ගල් උගුල නමින් එය හැඳින්වේ. පර්වතය මුදුනේ ස්තූප ගොඩලැල්ලක් යැයි සිතිය හැකි ශේෂ වූ සාධක පවතී. අඩි 30 ක් පමණ වට ඇති අඩි 8 ක් උස ගඩොල් ගොඩැල්ලක් වන එය අතීතයේ දී "ලංකා සෑය" නමින් හඳුන්වා ඇත.

හැඩ ඔයේ තවත් එක් ශාඛාවක් වූ "සින්නඩි කෝසුව" මුහුදට පිවිසෙන ස්ථානය මෙතැන් සිට උතුරට කි.මී. කාලක් පමණ ගමන් කළ විට හමුවේ. එහි මුහුදට හා කෝසුවට යාව පිහිටි වඩා උස් නොවූ ගල් තලාවක මුදුනේ ශේෂ වූ ගොඩනැගිලි දෙකක් දැක ගත හැකිය. පර්වතයේ නෙළන ලද පිය ගැට 50 කින් යුත් පෙළක් ඔස්සේ කෝසුවට බැසීමට හැකිය. එහි එක් පියගැටයක් අඩි තුනක් දිගුය.

පහන් කන්ද හෙළ හා පන්කන්ද හෙළ නමින් හැඳින්වෙන මෙහි ප්‍රධාන පර්වතය සැතපුමක් පමණ දුරට විහිදේ. මුහුදු මට්ටමේ සිට අඩි 200 ක උසකින් එය පිහිටා ඇත. කන්දේ මුදුන හා නැගෙනහිර බෑවුම සිසාරා නටබුන් දක්නට ලැබේ. එහි කටාරම් කොටන ලද ලෙන් 10 කි. එක් ලෙනක බුදු මැඳුරක් තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි සාධක කිහිපයකි. ලෙන ඉදිරිපසින් පියස්සක් ඉදි කර තිබෙන්නට ඇතැයි යන්න ශේෂ වූ බැම්ම හා ගල් කණු හතරේ අවශේෂ වලින් හඳුනාගත හැකිය. ගඩොලින් කළ ඔත් පිළිමයක හැඩයෙන් යුත් බුදු පිළිමයක් දක්නට ඇත. ලෙන් වහලේ ගලේ අඳින ලද පැරණි සිතුවම්හි රේඛා සටහන් අතර ඉතා අසීරුවෙන් හඳුනා ගත හැකි දේවතා රූප තිබුණු බවට මේධානන්ද හිමි තම වාර්තාවේ දක්වා ඇත.

මෙහි කන්දේ ඇති සෑම ගල් කුළ කම ස්තූපයක් හෝ දෙකක් දක්නට හැකි වූ බව හා හඳුනා ගැනීමේ තත්ත්වයේ පැවති ස්තූප 22 ක් පිළිබඳව වාර්තා වේ. ඒ සියලු ස්තූප හාරා විනාශ කර ඇත. ශේෂව ඇති විශාල බැම් වලින් යුක්ත අංගණ හා ගොඩනැගිලි අනුව අවම වශයෙන් ගොඩනැගිලි 18 ක් වත් තිබෙන්නට ඇතැයි විශ්වාස කෙරේ. ඉන් එක් ගොඩනැගිල්ලකට අයත් කැටයම් සහිත කුලුනු කිහිපයකි. එහි පාදම් බැම්ම ගැලවී ඇති හෙයින් ගොඩනැගිල්ලට අයත් කොටස් ගැලවී පර්වතය බෑවුමට පෙරළී ඇත. එමෙන්ම මෙහිදි කැසිකිලි ගලක් දක්නට ලැබීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල පධානඝරයක් හෝ උපෝසථාගාරයක් විය හැකිය යන්න එල්ලාවල මේධානන්ද හිමිගේ අදහසයි.

අඩි 160 ක් පමණ දිගු කටාරම් කොටන ලද ලෙනක් කන්ද මුදුනේ පිහිටි විශාල පර්වතයේ දක්නට ඇත. එහි පළමුවැනි සියවසට අයත් යැයි සැලකෙන බ්‍රාහ්මී ලිපියකි. තැනිත් තැන පර්වතවල නෙළන ලද පියගැට 20 ක් පමණ දක්නට ඇත.

කන්දේ බටහිර දෙසින් මැද බෑවුම් සහිත කොටසේ විශාල ලෙස තැනූ මාර්ගයක් තිබී ඇත. ඒ බැව් ඉතිරිව ඇති සාධක අනුව අවබෝධ වේ. එම මාර්ගය අසල අඩි 60 ක් උස අඩි 501 ක වට ප්‍රමාණයකින් යුත් විශාල ස්තූපයක ගොඩැල්ලකි. නීලගිරි සෑයට පමණක් දෙවෙනි වන මේ ස්තූපය කුඩා කඳු ගැටයක් සේ ඈතට දිස් වේ. මේධානන්ද හිමි මෙම ස්තූපය පිළිබඳව සටහන් කරන කාලය තුළදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කිසිදු වාර්තාවක මේ පිළිබඳව සටහන්ව නොතිබුණේ යැයි සඳහන් කර ඇත.

මෙහි ප්‍රධාන ගල් තලාව මුදුනේ අටැස් කුලුනු මුල්ගල් දෙකක් දක්නට ඇති අතර ඒවා කිසියම් ගොඩනැගිල්ලකට අයත් අවශේෂ විය හැකිය. මෙහි සෙල්ලිපි තුනකි. ලිපි දෙකක් පර්වත ලිපිය. අනෙක ලෙන් ලිපියකි. එය මේධානන්ද හිමි විසින් සොයා ගනු ලැබූවකි. එම ලෙන් ලිපියෙන් කියවෙන්නේ බුදරකිත තෙර, නගය, උපසික බගුය, දෙව පුත, තිණිබිත හා සපතික යන අය මහාසංඝයාට ලෙනක් පූජා කළ බවය.

වර්තමානයේ දී ශාස්ත්‍රවෙල නමින් මෙම විහාරය හැඳින්වුව ද පර්වත ලිපිය අනුව ස්ථානයේ ඓතිහාසික නාමය "බෝධිගිරි නාග පබ්බත විහාරය" බව සඳහන්ය. ශාස්ත්‍රවෙල විහාරයේ නටබුන් යුග කිහිපයකට අයත් වන බව පැවසේ. පළමුව ලෙන් කර්මාන්තය ද ඒ අතරම ස්තූප කිහිපයක් ද ඉදිවී ඇත. චිත්‍ර එම කාල වකවානුවේම ඇඳි අතර එම චිත්‍ර මත නැවත අඳින ලද බවක් පෙනේ යැයි සඳහන්ය. සමස්තයක් ලෙස ගත් කළ මෙම ආරාම සංකීර්ණය ඉතා දියුණු තත්ත්වයක පවතින්නට ඇති බව ලැබී ඇති පුරාවිද්‍යාත්මක සාධක මත තහවුරු වේ.




## ඔක්තෝබර් 18 සිට 24 දක්වා

### මේෂ - වාසනාවන්ත විවාහ ඵල

මේෂ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 07 - 08 - 09 - 10 යන ස්ථානනවල ගමන් කරමින් වාසනාවන්ත විවාහ පල හා ආර්ථික වාසි ඇති කෙරේ. සතිය මුලදි ලැබෙන මෙම වාසි සතිය අවසානයේ සිත් තැවුල් නිසා අවාසි සහගත තත්ත්වයට යා හැකි වුවත් ඉතා හොඳ පැහැදිලි මානසිකත්වයෙන් කටයුතු කළහොත් එය මඟ හරවාගත හැකිය. රැකියා ස්ථානයේ පවතින සතුරු බලවේගයක් නිසා තර්ජනාත්මක අභියෝගවලටද මුහුණ දීමට ඔබට සිදු වෙයි.

### වෘෂභ - හදිසි ධන ලාභයක්

වෘෂභ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 06 - 07 - 08 - 09 යන ස්ථානවල ගමන් කරමින් යම් අසුබවාදි තත්ත්වයකට පත්වීමට ඔබට සිදුවේ. යටි බඩ ආශ්‍රිත රෝග, තුනටිය ආශ්‍රිත රෝග, හදිසි අනතුරු එළැඹීමට ඉඩ ඇත. කිසියම් විෂ ශරීරගත වීමක් නිසාද අපහසුතා විඳින්නට සිදුවේ. නමුත් ඔබට කිසියම් අයුරක ධන සම්පතක් හා අන් සතු වස්තුවක් හිමිවීමේ ලකුණු පෙනෙන්නට ද තිබෙන නිසා උනන්දු වීම සුබයි.

### මිථුන - වාසනාවන්ත දරු සම්පත්

මිථුන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 05 - 06 - 07 - 08 යන ස්ථානවල ගමන් කරමින් වාසනාවන්ත දරු සම්පත් ආර්ථික සම්පත් උදාකර දීමට හේතුවේ. විශේෂයෙන් අතරමග නවතා තිබූ ව්‍යාපාරයක් යළි ඇරඹීමට ඔබට අවස්ථාව උදාවන අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා අන් අයගේ අත් උදව් නොඅඩුව හිමි වනු ඇත. කෙසේ හෝ සතිය මැද භාගයේ ප්‍රවේශම් නොවුවහොත් මුත්‍ර ආපදා කුස ආශ්‍රිත ආපදා ඇති වීමට බොහෝ දුරට ඉඩ ඇත.

### කටක - හොඳ හිත දිනාගනී

කටක ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 04 - 05 - 06 - 07 යන ස්ථානවල ගමන් කරමින් උසස් ලැබීම් කීපයකට හේතු මතු කරන අතර රැකියා ස්ථානගත නව වගකීම් රැසක් තමා පිට පැටවෙන අතර එය හොඳින් ඉටු කිරීම නිසා ප්‍රධානීන්ගේ හොඳ හිත දිනාගෙන සතුටින් ගෙවීමට හැකිවන අතර මංගල යෝජනා ආදර සම්බන්ධතා හා විවිධ සමාජ සුබ සාධන කටයුතු යහපත් ලෙස කරගෙන යාමට අවස්ථාව උදාවේ. තම ජීවිත කාලයේ ඉතාම් ඉහළ වරප්‍රසාද හිමි වන සතියකි.

### සිංහ - දේපළ හිමිකම්

සිංහ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතිය තුළ චන්ද්‍රයා 03 - 04 - 05 - 06 යන ස්ථානවල ගමන් කිරීම නිසා උසස් දේපළකට හිමිකම් කියන අතර කලක් මුහුණ දී සිටි නඩුවක් වැනි නීති ගැටලුවක් නිරාකරණය කර ගැනීමට අවස්ථාව උදා වේ. තවද තම සහකරු හෝ සහකාරිය නිසා තමාට උරුමකම් රැසක් හිමි වන ලකුණු පෙනේ. සතිය අවසානයේ යටිබඩ මුත්‍රාශය වැනි ස්ථානගත වියවුලක් නිසා පීඩා විඳීමට ද ඔබට සිදුවනු ඇත.

### කන්‍යා - හදිසි ධන ලාභ

කන්‍යා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතිය තුළ චන්ද්‍රයා 02 - 03 - 04 - 05 යන ස්ථානවල ගමන් කරමින් හදිසි ධන ලාභයකට උරුමකම් ලැබෙන අතර ඒ තුළින් යහපත් ආයෝජනයකට අත ගැසීමට ඔබට හැකිවනු ඇත. නමුත් සෙම, හතිය වැනි හදිසි ආපදා තත්ත්වයන් නිසා පීඩා විඳීමට සිදුවන අතර සමාජයේ වැඩි වගකීම් දැරීම නිසා ඇතිවන ශාරීරික පීඩාකාරී තත්ත්වය මත සතිය අවසානයේ පීඩාකාරී අසනීප වලට මුහුණ දීමට සිදුවන අතර විවේක සුවය අත්‍යවශ්‍ය වන බවක්ද පෙනෙන්නට තිබේ.

### තුලා - මානසික සුවය

තුලා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 01 - 02 - 03 - 04 යන ස්ථානවල ගමන් කරමින් ඉතා හොඳ මානසික සුවයක් ලැබෙන සතියක් වේ. පුවත්පත් කලාව, රූපවාහිනි මාධ්‍ය තුළ රැකියා කරන අයට මෙම සුවිශේෂි තත්ත්වය හොඳින් උදාවනු ඇත. මේ වකවානුවේ විභාගාදියට මුහුණ දී සිටින දූ පුතුන්ට ඉතා හොඳ පැහැදිලි මානසිකත්වයක් ලැබී උසස් ලෙස ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට වාසනාව උදාවනු ඇත.

### වෘශ්චික - නිර්මාණශීලී බව උසස් වේ

වෘශ්චික ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතිය තුළ චන්ද්‍රයා 12 - 01 - 02 - 03 යන ස්ථානවල ගමන් කරමින් නිවෙස්වලට කොටුවී සීමාවී සිටින අයෙක් නම් වත්තේ පිටියේ කරන වගා කටයුතු සාර්ථක කරගත හැකි සතියක් වන අතර පරිගණක ආශ්‍රිත හා සමාජ මාධ්‍ය කටයුතු ආශ්‍රිත නිර්මාණ වැඩි දියුණු කර ගත හැකි වේ. දූ දරුවන් නම් තම දෙමාපියන්ගේ සුභදතාව වැඩි දියුණු වන ආකාරයට කටයුතු කිරීමට අවස්ථාව උදා වන සතියකි.

### ධනු - ජීවන කටයුතු සාර්ථක වේ

ධනු ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 11 - 12 - 01 - 02 යන ස්ථානවල ගමන් කරමින් උසස් ලැබීමකට හේතු වන අතර ඒ අනුව තම ජීවන කටයුතු සාර්ථක කර ගැනීමට අවස්ථාව උදා වේ. තමා අන් අයගෙන් කිසියම් උපකාරයක් පතන්නේ නම් ඒ අයගෙන් ඔබට නිරතුරු දැඩි සහයෝගයක් උදා වන නිසා සමාජීය කටයුතුවල නිරත අයෙක් නම් ඒවා සාර්ථක කර ගැනීමට හේතු වේ. කෙසේ නමුදු සතිය පුරා අවිවේකය නිසා විවිධ අපහසුතා වලටද බඳුන් වීමට ඔබට සිදුවනු ඇත.

### මකර - ආයෝජනයේ ප්‍රතිලාභ

මකර ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා 10 - 11 - 12 - 01 යන ස්ථානවල ගමන් කරමින් ඉතා වාසනාවන්ත රැකියා ඵලයකට හේතු උදාකර ගන්නා අතර යටපත් වූ ධන සම්පතකට හිමිකම් කීමටද ඔබට හැකිවනු ඇත. තමා මීට පෙර කර තිබූ ආයෝජන කටයුත්තක ප්‍රතිලාභ උදා කරදෙන සතියක් වන අතර පිටරටක සිටින අයකුගේ සහයෝගයක් ලැබීමෙන් ජීවිතයේ අමතක නොවන අන්දමේ ඉතිරියක් අත්පත් කර ගැනීමටද හදිසි ධන ලාභ ලොතරැයි ජයග්‍රහණ ආදිය හිමි කරදෙන සතියක් ද වනු ඇත.

### කුම්භ - පෙර පින් පලදේ

කුම්භ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 09 - 10 - 11 - 12 යන ස්ථානවල ගමන් කරමින් ඔබට පෙර පින් මහිමය උදාකර දෙමින් ආර්ථික හා රැකියා වාසි කිහිපයක්ම උදා කර දෙනු ඇත. තමාට හිමි වන්නට තිබී අන් සතු වූ දේපළක් තමාට නීතියෙන් ම අත්පත් වන බව පෙනෙන්නට තිබේ. තම සහකරු හෝ සහකාරියගේ සහයෝගය කැපවීම නිසා යහපත්කම් රැසක් උදාකර ගැනීමට ඔබට හැකිවන අතර සිතේ සතුට සමාදානය රජයන වාසනාවන්ත සතියකි.

### මීන - රැකියාවේ උසස්වීම්

මීන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා 08 - 09 - 10 - 11 යන ස්ථානවල ගමන් කරමින් සතිය ආරම්භය හදිසි අනතුරු තත්ත්වයකට මුහුණ දීමට බොහෝ දුරට ඉඩ ඇති නිසා ප්‍රවේශම් වන්න. නමුත් සතිය මැද භාගයේ සිට ආර්ථික ලැබීම් කීපයකට වාසනාව උදාකරදෙන අතර මීට පෙර මුහුණ දී සිටි සම්මුඛ පරීක්ෂණයක සතුටුදායක ප්‍රතිඵල උදාවී රැකියාවේ උසස්වීමක් හෝ නව රැකියා ප්‍රතිලාභ උදා කරදෙන සතියක් ද වනු ඇත.



# පාසල් ක්‍රීඩා බලධාරීන්ගේ කඹ ඇදිල්ලෙන් වුෂු වළපල්ලට

**ජාත්‍යන්තර මට්ටමින් ශ්‍රී ලංකාවට විශාල ගෞරවයක් ගෙන දෙන වුෂු ක්‍රීඩාවේ ද්වන්ධ ඉසව්වක් වන සන්දා ඉසව්ව සඳහා වසර 11ක පමණ කාලයක සිට පනවා තිබෙන තහනම ඉවත් නොකිරීමත්, වුෂු ක්‍රීඩාව ජාතික පාසල් ක්‍රීඩා උලෙළට ඇතුළත් කිරීමට ක්‍රීඩා බලධාරීන් තවමත් උනන්දු නොවීමත් නිසාත්, මෙරට වුෂු ක්‍රීඩාව දැඩි අර්බුදයකට පත්ව ඇතැයි වාර්තා වෙයි.**

2009 පාසල් වුෂු තරගාවලියක් අතරතුර සන්දා ඉසව්ව නියෝජනය කළ පාසල් ක්‍රීඩකයකු මිය යාමත් සමඟම සන්දා ඉසව්ව තහනම් කරමින් වුෂු ක්‍රීඩාව පාසල් ක්‍රීඩා උලෙළින් ද ඉවත් කිරීමට බලධාරීහු පියවර ගත්හ. ගෙවී ගියාවූ දශකයකට අධික කාලය පුරාම වුෂු නිලධාරින් මෙකී තහනම ඉවත් කර ගැනීමට බලවත් උත්සහයක නිරත වූහ.

හිටපු ක්‍රීඩා, යෞවන කටයුතු සහ අධ්‍යාපන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම සමඟ සාකච්ඡා පවත්වමින් මෙකී තහනම ඉවත් කර ගැනීමටත්, පාසල් ක්‍රීඩා උලෙළට ඇතුළත් කර ගැනීමටත් වුෂු සම්මේලනය ඉල්ලීම් කර තිබුණි. එහිදී ඩලස් අලහප්පෙරුම අමාත්‍යවරයා එවකට හිටපු අධ්‍යාපන, ක්‍රීඩා, ලේකම්වරුන්, ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල් සහ පාසල් ක්‍රීඩා අධ්‍යක්ෂවරයා සහ සියලුම නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැති සාකච්ඡාවක් අවසානයේ ඉසව්වේ තහනම ඉවත් කිරීමටත්, වුෂු ක්‍රීඩාව පාසල් ක්‍රීඩා උලෙළට ඇතුළත් කර ගැනීමටත් පොරොන්දු වී තිබේ.

එහෙත් දින කිහිපයකින් නිකුත් කළ නව චක්‍ර ලේඛනයක් මගින් වුෂු සම්මේලනයේ ඉල්ලීම් දෙක නොසලකා හැර කටයුතු කර ඇතැයි වාර්තා වෙයි. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් නිලධාරියකු සහ පළාත් ක්‍රීඩා නිලධාරීන් කිහිපදෙනකුම මෙයට උඩගෙඩි සපයා ඇතැයි ද වැඩිදුරටත් වාර්තාවෙයි.

කෙසේ වෙතත් මෙකී නිලධාරීන්ගේ මේ අදූරදර්ශී ක්‍රියා පිළිවෙත පිළිබඳ අමාත්‍යාංශ නිලධාරින්ම ප්‍රකාශ කරන්නේ මෙකී තීරණ මීට වඩා සිහි බුද්ධියකින් ගත යුතු බවයි. ද්වන්ධ සටන් කලාවක් කියලා සන්දා තහනම් කරලා තියෙනවා.

වුෂු ක්‍රීඩාවේ සන්දා ඉසව්ව විතරක් නෙවෙයි, තවත් හුඟක් ක්‍රීඩා තියෙනවා, ද්වන්ධ ක්‍රීඩා විදියට ක්‍රීඩා කරන, එහෙනම් ඒවාත් තහනම් කරන්න වෙනවා. බොක්සින් ක්‍රීඩාව ගත්තොත් හුඟක්ම අනතුරුවන ක්‍රීඩාවක්. රග්බි, ක්‍රිකට් ක්‍රීඩාවෙන් ක්‍රීඩකයෝ මැරෙනවා. සදාකාලික අබාධිතයෝ වෙනවා. එහෙම නම් ඒ ක්‍රීඩාත් තහනම් කරන්න වෙනවා.

එක පැත්තකින් සන්දා ඉසව්ව තහනම් කළා කියමු කෝ, ජාතික පාසල් ක්‍රීඩා උලෙළෙන් මේ ක්‍රීඩාව අයින් කරන්නේ ඇයි? පාසල් මට්ටමින් බිහිවන ක්‍රීඩක ක්‍රීඩිකාවන් තමයි සමස්ත ලංකා හරහා ජාතික තලයට ඇවිත්, ජාත්‍යන්තරය දක්වා යන්නේ. තීන්දු තීරණ ගන්න කලින් බලධාරීන් මීට වඩා සිහි බුද්ධියෙන් වැඩ කරන්න ඕනෑ. ඔය වගේ තමයි අපේ බලධාරීන් හුඟක් තීන්දු තීරණ ගන්නේ යැයි එකී අමාත්‍යාංශයේම නිලධාරියෙක් අවධාරණය කළේය.

මේ ක්‍රීඩාවේ තාක්ෂණය තියෙනවා. ආරක්ෂක හිස් වැසුම්, උපකරණ තියෙනවා. කනගාටුදායක සිදුවීමක් වුණා තමයි. එහෙම කියලා ඉසව්වක් සම්පූර්ණයෙන් තහනම් කිරීම හෙළා දකිනවා. අවදානම් නැති ක්‍රීඩා තියෙන්නේ කිහිපයයි. බොහෝමයක් ක්‍රීඩා ගත්තම අවදානමක් තියෙනවා තමයි. මේවා ගැන මීට වඩා කල්පනාකාරීව කටයුතු කරන්න ඕනෑ. වුෂු සම්මේලනයේ නිලධාරියෙක් අවධාරණය කරයි.

පසුගිය සාග් තරගාවලියේදී අපි වුෂු ක්‍රීඩාවෙන් රන් සහ ලෝකඩ පදක්කම් කිහිපයක් ම දිනා ගත්තා. සන්දා ඉසව්ව අපේ තහනම් කරලා නිසා ඉන්දියාව ඒ ඉසව්වෙන් වැඩි රන් පදක්කම් ප්‍රමාණයක් දිනා ගත්තා. දැනට පාසල් 200ක් විතර වුෂු ක්‍රීඩාවේ නිරත වුවද, සමස්ත ලංකා තරගාවලියට වුෂු ක්‍රීඩාව ඇතුළත් නොකිරීම නිසා බොහෝ විදුහල් මේ ක්‍රීඩාවේ නිරතවීමට මැලිකමක් දක්වන බවද වාර්තා වෙයි.

# ක්‍රීඩා

බන්දුල ජයමාන්න
kreeda@lakehouse.lk

## ඩිලන්ත ගිනස් වාර්තාවකට ළං වෙයි



**සැප්තැම්බර් 5 සිට නොවැම්බර් 15 දක්වා ජර්මනිය, බෙල්ජියම, ප්‍රංශය සහ ස්පාඤ්ඤය පුරා පැවැත්වෙන ලැම්බෝගිනි සුපර් ට්‍රොෆියෝ යුරෝපා ශූරතාවලියේ 2020 දී ලෝක ප්‍රකට ශ්‍රී ලංකා මෝටර් රථ ධාවන ශූර ඩිලන්ත මාලගමුව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ස්පාඤ්ඤයේ බාර්සිලෝනාහි කැටලෝනියා ධාවන පථයේ පැවැති පළමු අදියරේ තෙවැනි ස්ථානය සහ දෙවැනි අදියරේ දෙවැනි ස්ථානය දිනා ගැනිමට සමත්විය.සමස්ත ආසියාවම නියෝජනය කරන එකම ක්‍රීඩකයාද ඩිලන්ත මාලගමුවයි.වසරක පමණ කාලයකට පසු ඩිලන්ත එක්වූ මුල්ම අන්තර් ජාතික තරගය ද මෙය වූ අතර එහිදී ඉතාලි ජාතික මැසිමෝ මන්ටෝවානි සමඟ හවුලේ තරග කළේය.**

පසුගිය වසර 36 පුරා ලෝකයේ බොහෝ රටවල ශ්‍රී ලංකා ධජය සහ එහි අභිමානය ඉහළින්ම ඔසවා තබා ඇති ඩිලන්ත විවිධ සම්මාන ඒ සඳහා හිමිකර ගෙන තිබේ. ඩිලන්ත සිය උපරිමයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කිරීම අගය කළ යුතුය. අන්තර් ජාතික මෝටර් රථ ධාවන ක්ෂේත්‍රයේ ජාතියක් ලෙස එහි දෘශ්‍යතාව ඉහළ නැංවීමේ ශක්තිය. ඩිලන්ත සතුය.

මෙම වසරේ ශූරතාවලියේ විශේෂත්වය වන්නේ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා පශ්චාත් COVID19 වසංගතය පරාජය කිරීමේ ජාතික ප්‍රයත්නයන්ට සහාය වෙමින් යුරෝපීය ව්‍යාපාර සඳහා ජාතික වෙළඳ නාම ඒකාබද්ධ කිරීමයි. ක්‍රීඩාවට ජාතික සන්නාමයන් ඒකාබද්ධ කිරීමේ වැදගත්කම හඳුනාගත් ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සමස්ත ශූරතාව සඳහාම ඩිලන්ත සමඟ හවුල් වී ඇති අතර එය ඔහුගේ වෘත්තීය ක්‍රීඩා ජීවිතයේ දශක 3 කට අධික කාලය තුළ රාජ්‍ය අනුග්‍රහය හිමි වූ ප්‍රථම වතාව මෙය විය.

ඩිලන්ත මාලගමුව ආසියාවේ, යුරෝපයේ ශූරයා ලෙස කිරුළු පළඳී. ඔහු අවුරුදු 42 ක මෝටර් රථ ධාවන තරගයේ දීර්ඝ කාලීන වෘත්තීය ජීවිතය වෙනුවෙන් 'ලොව වැඩිම කාලයක් ක්‍රියාකාරී ක්‍රීඩකයා' ලෙස ගිනස් වාර්තාවකට ළගා විමටද සූදානම් ය.

ලෝක ප්‍රකට ක්‍රීඩකයෙකු වීමට අමතරව ශ්‍රී ලංකාව ජාතියක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ඩිලන්ත මාලගමුව ප්‍රබල උපදේශකයෙකු බව මම හඳුනාගෙන ඇත්තෙමි. කෘතඥතා පූර්වක ජාතියක් ලෙස ඔහුගේ දක්ෂතාවයෙන් යුත් පුද්ගලයන්ට සහයෝගය දැක්වීම සහ ඔවුන්ට ප්‍රමාණවත් වටිනාකමක් ලබා දීම අපගේ වගකීමයි. සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග පවසයි. මම සැමවිටම පවසන පරිදි, ලොව පුරා වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගෙන් මට ලැබී ඇති ආදරය හා ප්‍රශංසාව ගැන මම නිහතමානී වෙමි. මක්නිසාද යත්, මගේ ක්‍රීඩාවට ශ්‍රී ලංකාව නියෝජනය කිරීම ගැන මම නිතරම ආඩම්බර වන බැවිනි.

ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය පැමිණීමත් සමඟ මෙම වසර සුවිශේෂී වන අතර, දශක ගණනාවක් තිස්සේ සංචාරක කර්මාන්තය හා ක්‍රීඩාව අතර පවතින පරතරය හඳුනාගෙන, ඒවා වළක්වා ගැනීම සඳහා කටයුතු කරන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අගමැති මහින්ද රාජපක්ෂ සහ සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග වගේම ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ යන මහත්වරුන් විශේෂයෙන් සඳහන් කළ යුතුයැයි ඩිලන්ත පැවසීය.

## ක්‍රීඩා සභාව 10ක් ඉල්ලනකොට ශ්‍රී ලංකා ක්‍රිකට් හතරෙන් ෂේප් වෙයි

**ජාතික ක්‍රීඩා සංගම් සහ සම්මේලනවල තේරීම් කමිටු පත්කිරීමේ ක්‍රමවේදය වෙනස් කිරීමට ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ පසුගියදා සාධනීය පියවරක් ගත්තේය. ඒ අනුව මින් ඉදිරියට ජාතික තේරීම් කමිටු සඳහා සාමාජිකයන් තෝරා පත්කර ගනු ලබන්නේ, ක්‍රීඩා සංගම් සම්මේලන හෝ අනුබද්ධ ආයතන විසින් නාම යෝජනා ලබාගෙන විධායක කමිටු රැස්වීමක් මගින් සාමාජිකයන් දස (10) දෙනකු ක්‍රීඩා සභාවට යොමු කළ යුතු අතර, එයින් සුදුසු අය තෝරා අමාත්‍යවරයා වෙත යොමු කිරීම ක්‍රීඩා සභාවේ වගකීම වෙයි.**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තේරීම් කමිටුවට සාමාජිකයන් දස දෙනකු තෝරා ගෙන ක්‍රීඩා සභාවට යොමු කළ යුතු වුවද, ඔවුන් ක්‍රීඩා සභාවට යොමු කර ඇත්තේ අසන්ත ද මෙල්ගේ සභාපති ධුරයෙන් සමන්විත තවත් සාමාජිකයන් තිදෙනකුගේ නම් පමණි. ඒ අනුව සෙසු සාමාජිකයන් ලෙස නම් කර ඇත්තේ ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ, විනෝදන් ජෝන් සහ චමින්ද මෙන්ඩිස්ය. මීට පෙර සාමාන්‍ය පරිදි ජාතික තේරීම් කමිටු ජාතික ක්‍රීඩා සංගම් සහ සම්මේලන විසින් සෘජුව ක්‍රීඩා අමාත්‍යවරයා වෙත යොමු කිරීමෙන් අනුමැතිය ලබා ගත් අතර, නව ක්‍රමය අනුව ක්‍රීඩා සභාවේ අනුමැතිය හා එකඟතාව මත අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. මීට අමතරව විදේශ තරග සංචාර සඳහා එක්වන ජාතික කණ්ඩායම්වලට ද මෙතෙක් සෘජුවම ක්‍රීඩා අමාත්‍යවරයා අනුමැතිය ලබා දුන් ක්‍රමවේදය වෙනස් කරමින් ජාතික ක්‍රීඩා සභාව හරහා එකී අනුමැතිය ලබා ගත යුතුය.



# පිටියේ රවුමක්

## හර්ෂණට ලෝක සම්මේලනයෙන් චෙස් මාස්ටර් පදක්කම

**ලෝක චෙස් සම්මේලනය විසින් අන්තර්ජාතික මාස්ටර් පදක්කම හර්ෂණ තිලකරත්නට පිරිනමා තිබේ. මේ මාසයේ පැවැති ලෝක චෙස් සම්මේලන මහා සභා රැස්වීමේදී හර්ෂණට අන්තර්ජාතික මාස්ටර් පදක්කම පිරිනමන බව නිල වශයෙන් නිවේදනය කළේය.**

කුරුණෑගල මලියදේව විදුහලේ 12වසරේ ගනිත අංශයෙන් අධ්‍යාපනය හදාරන හර්ෂණ තිලකරත්න අන්තර්ජාතික මාස්ටර් පදක්කම දිනා ගැනීම උදෙසා ලෝක චෙස් ශ්‍රේණිගත කිරීමේ ලකුණු 2400ක් මේ වසර තුළදී සම්පූර්ණ කිරීමට සමත් විය. ලෝක ශ්‍රේණිගත කිරීම් සමඟ අන්තර්ජාතික මාස්ටර් පදක්කම දිනාගත් පළමු ක්‍රීඩකයා වන්නේ ද හර්ෂනයි. හර්ෂන පොදු රාජ්‍ය මණ්ඩලයීය වයස අවුරුදු 16 න් පහළ ශූරතාව ඇතුළු ශූරතා රැසක් දිනාගත් අතර, ආසියානු යෞවන චෙස් කණ්ඩායම නියෝජනය කරමින් මේ වසරේ අන්තර් මහාද්වීපික යෞවන චෙස් තරගාවලියට ක්‍රීඩා කළේය.

## කොවිඩ්19 ආසියානු යොවුන් ක්‍රිකට් තරගාවලියත් බිලිගනියි

**ආසියානු ක්‍රිකට් කවුන්සලය සංවිධාන කරන ආසියානු කුසලාන වයස අවුරුදු 19න් පහළ එක්දින තරගාවලිය කොවිඩ්19 වසංගත තත්ත්වය හේතුවෙන් කල් දැමීමට තීරණය කර තිබේ.**

9 වැනි වරටත් සංවිධානය කර තිබුණු තරගාවලිය ලබන නොවැම්බර් මස එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සත්කාරකත්වයෙන් පැවැත්වීමට නියමිතව තිබිණි. ඒ අනුව මේ තරගාවලිය ලබන වසරේ පැවැත්වීමට ආසියානු ක්‍රිකට් කවුන්සලයේ අවධානය යොමුව තිබේ.

මේ සඳහා ශ්‍රී ලංකාව සමඟ වත්මන් ශූර ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය, ඇෆ්ගනිස්තානය සහ සත්කාරක එක්සත් අරාබි එමීර් රාජ්‍යය එක්වන අතර සුදුසුකම් ලැබීමේ තරගාවලියෙන් කණ්ඩායම් 2ක් ද එක් වෙයි. අවසන් වරට පසුගිය වසරේ ශ්‍රී ලංකවේ සත්කාරකත්වයෙන් මේ තරගාවලිය පැවැති අතර, එහි ශූරතාව දිනා ගැනීමට ඉන්දියාව සමත් වූයේ බංග්ලාදේශය පරාජය කරමිනි. එම තරගාවලියට මේ කණ්ඩායම් 6 සමඟ කුවේට් සහ නේපාලය එක්ව සිටියේය.

## බස්නාහිර පළාත් හොකී ශූරතා කොළඹට

**හතළිස්හය වැනි ජාතික මහා ක්‍රීඩා උලෙළට සහභාගි කරවන බස්නාහිර පළාත් කාන්තා සහ පිරිමි හොකී කණ්ඩායම් තෝරා ගැනීම සඳහා බස්නාහිර පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් කොළඹ හතේ රීඩ් මාවතේ පිහිටි කෘතිම ක්‍රීඩාංගනයේදී පවත්වන ලද බස්නාහිර පළාත් ක්‍රීඩා හොකී තරගාවලියේ පිරිමි හා කාන්තා ශූරතා දිනා ගැනීමට කොළඹ දිස්ත්‍රික්ක නියෝජනය කළ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ.**

මෙවර තරග මාලාවේ පිරිමි අනුශූරතාව ගම්පහ දිස්ත්‍රික්කයට හිමි වූ අතර කාන්තා අනුශූරතාව කළුතර දිස්ත්‍රික්කය සතු විය.

## එල්පීඑල් තරග හම්බන්තොට සහ පල්ලෙකැලේ යයි

**ලංකා ප්‍රිමියර් ලීග් (එල්පීඑල්) ක්‍රිකට් තරගාවලියේ නියමිත තරග 23 ම මහනුවර පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය සහ හම්බන්තොට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණවල පැවැත්විමට තිරණය කර තිබේ. එල්පීඑල් හි සංවිධායකයන් වන අයිපීජී පැවසුවේ 2020 නොවැම්බර් 21 සිට දෙසැම්බර් 13 දක්වා ලීග් තරගවලිය පැවැත්වීමට නියමිත බවත් ක්‍රීඩක වෙන්දේසිය ඔක්තෝබර් 19 වනදා පැවැත්වීමට නියමිත බවත්ය.**

ටෙස්ට් තරග 7 ක්, එක්දින තරග 26 ක් සහ විස්සයි 20 ජාත්‍යන්තර තරග 23 ක් පවත්වා ඇති පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ප්‍රේක්ෂක ධාරිතාව 35,000 කි. 35,000 ක ප්‍රේක්ෂක ධාරිතාවක් ඇති මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය එක්දින තරග 21 ක් සහ විස්සයි විස්ස තරග 7 ක් පවත්වා තිබේ.

මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී අවසන් වරට විස්සයි 20 තරගය පැවැත්වූයේ 2013 අගෝස්තු 6 වනදාය. ලංකා ප්‍රිමියර් ලීග් තරගාවලියේදී කොළඹ, මහනුවර, ගාල්ල, දඹුල්ල සහ යාපනය යන නමින් නම් කරන ලද කණ්ඩායම් පහක් දින 15 ක කාලයක් තුළ තරග 23දි තරග වදිති. ශ්‍රී ලංකාවේ වත්මන් සියලුම ජාත්‍යන්තර ක්‍රීඩකයන් සමඟ විදේශීය ක්‍රීඩකයන් 75 දෙනෙකු ක්‍රීඩක වෙන්දේසියට ඇතුළත් වනු ඇත.

අයිපීජී ප්‍රධාන විධායක අනිල් මොහාන් පවසන්නේ "ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන ජාතියකට විස්සයි20 තරගාවලියක් ලබා දීමට එල්පීඑල් අපට අවස්ථාවක් ලැබී තිබෙනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ලෝලීන් ක්‍රීඩාව කෙරෙහි අතිශයින්ම ඇල්මක් දක්වන අතර, ලීග් තරගාවලිය මෙහි පැවැත්වීමට අයි.පී.ජී. ලැබූ විශාල ජයක් බවද සඳහන් කරයි.

ශ්‍රී ලංකා ක්‍රිකට් (එස්එල්සී) මණ්ඩලය ද අතිශයින්ම ප්‍රයෝජනවත් වූ අතර මෙම ලීගය විශිෂ්ට සාර්ථකත්වයක් ලබා ගැනීම සඳහා ඔවුන්ගේ නොනවතින සහයෝගීතාවය සහ සහයෝගය මම බලාපොරොත්තු වෙමි. එල්පීඑල් සමඟ ලෝක මට්ටමේ ලීගයක් ඇති කිරීමට කැපවී සිටිමි" යැයි ඔහු වැඩිදුරටත් පවසයි.

මේ අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ උප සභාපති රවින් වික්‍රමරත්න පවසන්නේ මෙම තරගාවලිය ලෝක මට්ටමේ ක්‍රීඩකයින් සමඟ ක්‍රීඩා කිරීමෙන් දේශීය ක්‍රීඩකයින්ට ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට වේදිකාවක් නිර්මාණය කරනවා පමණක් නොව, ශ්‍රී ලංකා ක්‍රිකට් ලෝලීන්ට ගුණාත්මක ක්‍රිකට් තරගාවලියක් නැරඹීමට අවස්ථාවක් ලබා දෙන බවයි.

## දහනමයෙන් පහළ කාන්තා ක්‍රිකට් කණ්ඩායමක්

**වයස අවුරුදු 19 න් පහළ කණ්ඩායමක් පිහිටුවීම මගින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කාන්තා ක්‍රිකට් ක්‍රීඩාවේ බිම් මට්ටම පිළිබඳ අවධානය යොමු කර තිබේ.**

වයස අවුරුදු 19 න් පහළ කාන්තා ලෝක කුසලානයක් පැවැත්වීමට පසුගිය වසරේදී ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ (අයිසීසී) ගත් තීරණයට අනුව මෙය ආරම්භ විය.

මීට පෙර අපගේ කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව සඳහා වයස අවුරුදු 23 න් පහළ නැගී එන සංචිතයක් පමණක් ඇතුළත් වූ අතර එය ජාතික සංචිතයේ සංවර්ධන කණ්ඩායමක් ද විය. නමුත් අයිසීසී මෙම ලෝක කුසලානය සංවිධානය කිරීමත් සමඟ අපි කනිෂ්ඨ ක්‍රිකට් ක්‍රීඩාවට වැඩි අවධානයක් යොමු කළා යනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කාන්තා ක්‍රිකට් සම්බන්ධීකාරක , අප්සාරි තිලකරත්න පැවැසුවාය

මෙම තරගාවලිය සඳහා සූදානම් වීම සඳහා වයස අවුරුදු 15 න් පහළ සහ 17 න් පහළ කණ්ඩායම් හඳුන්වා දීම මෙම සැලැස්මේ කොටසක් වන අතර එය ජාතික සංවර්ධන ප්‍රධානී ටිම් මැකාස්කිල්ගේ සහාය සහ දැනුම ද මේ සඳහා ලබා ගැනීමට බලාපොරොත්තුවෙයි.

අවසානයේදී අපගේ සැලසුම වයස අවුරුදු 19 න් පහළ සංචිතයක් පිහිටුවීමයි අප්සාරි තිලකරත්න පැවැසුවාය. මේ සඳහා පළමුවෙන්ම අප දක්ෂතා හඳුනාගෙන ඔවුන් දිස්ත්‍රික් හා පළාත් පුහුණුකරුවන් සමඟ කටයුතු කළ යුතුයි. නමුත් සංචිතයක් සෑදීමට අපට ක්‍රීඩිකාවන් අවශ්‍යයි.

එබැවින් ක්ෂණික අවධානය යොමු වනුයේ බාලිකා පාසල් ක්‍රිකට් ක්‍රීඩා කිරීමට දිරිමත් කිරීමයි.

එය සැහැල්ලු පන්දු ක්‍රිකට් ක්‍රීඩාවක් වුවද අපට අවශ්‍ය වන්නේ ක්‍රීඩාව ඉදිරියට ගෙන යාමට ගැහැණු ළමයින් දිරිමත් කිරීමයි. සැමට සමාන අවස්ථාවක් ලබා දීම අපගේ අරමුණයි. අපට පිටස්තර ස්ථානවල බොහෝ දක්ෂතා ඇති අතර ක්‍රීඩාවට පමණක් නොව අපේ දිස්ත්‍රික් හා පළාත් තරගාවලි සඳහා ගැහැනු ළමයින් යැවීමට පාසල්වල සහාය අවශ්‍යයයි .

ලබන වසරේ මුලදී 21 න් පහළ තරගාවලියක් මගින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට දිගු කාලීනව වැඩ කළ හැකි අනන්‍යතා කුසලතා ඇති කර ගැනීමට අවස්ථාව සැලසේ. අපි ලබන වසරේදී අවුරුදු 21 න් පහළ තරගාවලියක් පවත්වන අතර බොහෝ දුරට පාසල් ක්‍රීඩිකාවන් සහභාගී වන බැවින් 2023 ලෝක කුසලානය සඳහා වැඩ කිරීමට දක්ෂතා හඳුනා ගැනීමට අපට හැකි වනු ඇතැයි විශ්වාසය පළ කරයි.

මේ අතර වයස අවුරුදු 19 න් පහළ කාන්තා කණ්ඩායමේ පුහුණුකරුවෙකු සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තම වෙබ් අඩවියේ දැන්වීම් පළ කර ඇති අතර, මෙම භූමිකාව පිරවීම සඳහා හිටපු ටෙස්ට් හෝ එක්දින ක්‍රිකට් ක්‍රීඩිකාවක් ජාතික මට්ටමේ -3 පුහුණු සුදුසුකම් සහිතව අපේක්ෂා කරයි.

*"හිම කැටිති*
*පොළව මගෙන් එය සඟවයි*
*ඒත් මා නොසිතූ ලෙස අවදි වෙිය.*
*නැවතත් එය, මට දැනෙන්නේ*
*මා සිරුරත...පොළවේ තෙතමනයයි.*
*නැවතත් විය හැකි දෙයක් වේ එය,*
*සිහි කිරීමයි*
*සීතල ආලෝකයක් තුළ*
*අතීතය නම් වසන්තය*
*බිය, ඔව්...ඒ අතර ඔබ නැවත හඬයි,*
*විනෝදය අවදානමකි*
*නව ලෝකයේ කෲර මාරුතය තුළ...."*

# මෙවර නොබෙල් සාහිත්‍ය සම්මානය ඇමරිකානු කිවිඳියක් වන ලොයිස් ග්ලුක්ට...

**ඇය එසේ ලියුවා ය. බොහෝ කාලයක් තිස්සේ සිය කවීත්වයත් සමඟ ඇය ජීවත් වුවා ය. කාලය ගෙවී ගියේ හිම කැටිති දියුදුරට වී යන අයුරිනි. පසුගිය දිනෙක ඇයගේ දුරකථනය නාද විය. ඇමතුම ලද සැණින් ඇය විස්මයට පත් වුවා ය. කොතෙක් දුරට විස්මපත් වීද යත් එය ඇගෙන් විමසීමට නොහැකි තරම් විය. ස්වීඩන් ඇකඩමියේ ස්ථිර ලේකම් මාත්ස් මාම් ඒ ගැන පවසමින් තමන් ලබා දුන් ඒ "පණිවිඩය ඇයට මහත් පුදුමයක් වුණා." යැයි පවසයි. තවද "ඇය එය සාදරයෙන් පිළිගත් ආකාරය වචනයෙන් විස්තර කරන්නට බැරි තරම්."**

මෙවර සාහිත්‍යය සඳහා වූ නොබෙල් සම්මානය දිනූ ඇමරිකානු කිවිඳියක වන ලොයිස් ග්ලුක් (එය උච්චාරණය කෙරෙන්නේ ග්ලික් ලෙසින් යැයි වින්සන්ට් ඩොව්ඩ් නම් කලා විචාරකයා පවසයි.) 1943 අප්‍රේල් මස නිව්යෝර්ක් නගරයේ උපත ලබා මේ වන විට යේල් විශ්ව විද්‍යාලයේ ඉංග්‍රීසි මහාචාර්යවරියක ලෙසින් ඇය කටයුතු කරයි. සුවිශේෂ කාව්‍ය හඬක් මතු කළ විශ්වීය සුන්දරත්වය යන හඳුනාගැනීම තුළ ඇයට නොබෙල් සම්මානය හිමි වූ බව සඳහන් විය. නොබෙල් සම්මානය නිසා ලොවේ අවධානය ඇය වෙත ලැබුණත්, ඊට පෙර සිට ම ඇගේ කවිය පිළිබඳව කතා බහට ලක් වී තිබේ. ඒ අනුව ඇගේ කවීත්වය වනාහි මානුෂීය වේදනාවකින් මතුවන යථාර්ථයක් යැයි පෙන්වා දී තිබේ. තවද ඒ යථාව හා බැඳී ඇති මරණය, ළමා විය හා පවුල කේන්ද්‍රීය වූ පැවැත්ම මතු කරන ආකාරය වෙසෙස් තත්වයකින් හඳුනාගෙන ඇති බව ද පැහැදිලි ය. ඒ ආකාරයේ ඒ

කවිය වෙනුවෙන් ඇය ග්‍රීක පුරාවෘත්තයන්හි චරිත ප්‍රතිනිර්මාණය කරගන්නා ආකාරය ද වෙසෙසින්ම සාකච්ඡාවට ලක් වී ඇත.



වදින්නේ නිර්මලත්වය වෙනුවෙනි." ඒ චරිත නිරූපණය විසින් පිලිළිගත් ගැඹුරක් නැති සරල ධර්මතාවන් මතු නොව විශ්වාසයන් ද ඉරා දමන ආකාරයක් ද දැකිය හැකි බවක් ද ඔහු පෙන්වා දෙයි.

එවැනි පසුබිමක නොබෙල් සාහිත්‍යය සම්මානය ඇයට ලබා දීමට කටයුතු කොට ඇත්තේ කාලයට උචිත දැක්මක් තුළ අතිශය ප්‍රබල කාර්යභාරයක් සාහිත්‍ය ක්ෂේත්‍රයට එකතු කිරීම යන අදහස ද

මුල් කරගනිමිනි. කලා විචාරක වින්සන්ට් ඩොව්ඩ් ඇය සම්බන්ධයෙන් කළ එකතු කිරීමට අනුව සමානව ගත් කල ඕනෑම දේශයක කවීන් කීර්තිය උකහා ගන්නේ සිය ජීවිත කාලය තුළ අත්විඳින්නා වූ පොදු භාවයන් තුළිනි. නමුත් ලොයිස් ග්ලුක් තමන්ට හිමි සෑම ත්‍යාගයක්ම (ඇය මීට පෙර සම්මාය හා සාහිත්‍ය ත්‍යාග කිහිපයක්ම දිනාගෙන ඇත.) දිනාගෙන ඇත්තේ ඇමරිකානු කවිය යන අපේක්ෂාව තුළ පවතිමිනි." පුවත්පත් සාකච්ඡාවකට එක් වෙමින් වරක් ඇය පැවසුවේ "පොදු ජීවිතය සම්බන්ධයෙන් මට ඇත්තේ අතිශයින් සුළු විඳීමක්." බවයි. ඒ අනුව යමින් ඇය මතු කොට ඇත්තේ පැහැදිලිවම ඇගේ විඳීම් ඇය වටාම ප්‍රතිනිර්මාණය වෙමින් ඇති බවකි. එය පොදු බව කියන තැනින් ඉවත්ව ගිය සෙයකි. ඒ අනුව ඇය සිය මතකයන් සිය කාව්‍යයන්හි

චරිත නිරූපණ බවට පත් කරගත් අවස්ථා බහුල ය. උදාහරණයක් හැටියට පහත කවිය විමසනු වටී.

*"වත්තේ ඇති ඇපල් ගස....*
*එය එසේ ඇත්තේ*
*සතළිස් වසක කලක සිට ය."*

ඒ කවියේ අවසාන පෙළ හොඳින් කියවා බලන්න. එහි ඇත්තේ තමන්ගේම මතකය පිළිබඳව ඇය විසින් රඳවාගෙන සිටින්නා වූ නොසැලෙන විශ්වාසයයි. එනිසාම ඇගේ මතකය ඇයගේම කවිය තුළ චරිත නිරූපණයක් බවට පත්වේ..

*"අප ලොව දකිනා එක විදිහක් වේ.*
*ඒ ළමා විය ම වන්නේ ය."*

ඇයගේ කවි කියවීමේ අත්දැකීමෙන් පලවන වීමංසනයන්හී කියවෙන අන්දමට ඇය වනාහි කලාතුරකින් හමු වන ආකාරයේ දොම්නස් සහගත කිවිඳියකි. මෙවර සහිත්‍යයට හිමිවන නොබෙල් සම්මානය ඇය ලබන්නේ 2010 වර්ෂයේ සිට බලන කල එම සම්මානය ලද සිව්වන කාන්තාව හැටියට ය. නොබෙල් සම්මානය උපන් 1901 වර්ෂයේ සිට ගත් කල ඇයට හිමි වන්නේ දහසය වැනි කාන්තාවගේ සාහිත්‍යතැනයි. අවසාන වතාවට ඇමරිකාව නොබෙල් සාහිත්‍ය සම්මානය ලැබුවේ 2016 වසරේ දීය. ජනප්‍රිය ගායකයෙකු වූ බොබ් ඩිලන් සිය නිර්මාණාත්මක ජන ගී පදනම් කරගත් ගීත රචනා වෙනුවෙන් එසේ ඒ සම්මානය ලැබුවේය.

මෙවර 2020 දී ඇමරිකාව නොබෙල් සාහිත්‍යය සම්මානය ලබන්නේ බොබ් ඩිලන් හා සමානව ගත් කල කාව්‍ය ක්ෂේත්‍රය තුළ වෙනස්ම භාව හා අරුත් මතු කරන කවියක වෙනුවෙනි.

# අකුරු කියවන්න පුළුවන් වුණාට සාහිත්‍යයික කියැවීමක් තියෙනව ද?

අසුර

මොහාන් ශ්‍රියන්ත ආරියවංශ
mohansriyantha@gmail.com

**ඔක්තෝබරය කියවීමේ මාසය වශයෙන් සම්මත වී තිබේ. ලංකාව අද වනවිට සාක්ෂරතාවයෙන් ඉහළ රටක් හැටියට සැලකේ. ඔක්තෝබරයේ කියවීමේ මාසයත් සමඟ ඇති වන කතා බහක් වන්නේ අකුරු කියවන්නට පුළුවන් වූ පළියට අපේ රටේ සැබෑ සාහිත්‍යයික කියවීමක් තියෙනවා ද කියන එකයි. බැලූ බැල්මට එහි යම් උභතෝකෝටික බවක් දැකිය හැකි වුණ ද එය ප්‍රබල විමසීමක් මතු කරන ප්‍රශ්නයක් යැයි හැඟෙන හෙයින් ඒ පිළිබඳව ගුරුවරු, නිලධාරීන් මෙන්ම ජනමාධ්‍යවේදීන් හැටියට අත්දැකීම් ඇති සාහිත්‍යධරයන්ගෙන් මත විමසීමක් කිරීමට අපි කල්පනා කළෙමු.**



ප්‍රීති බණ්ඩාර



සුනිල් සරත් පෙරේරා



කරුණා පෙරේරා

පරිපාලන ක්ෂේත්‍රයේ වෘත්තීය අත්දැකීම් සහිත සුනිල් සරත් පෙරේරා ගීත රචකයෙක්, කවියකු මෙන්ම සාහිත්‍යධරයකු ද වේ. ඉදින් එවැන්නක් වේ නම් ඊට අදාල ප්‍රධාන පෙළේ අධ්‍යාපන ආයතනයක් හැටියට විශ්වවිද්‍යාලය වගකිව යුතු නොවේදැයි ඔහු විමසීය. ඒ අනුව ඔහු අවධාරණය කරන්නේ සැබෑ ලෙසින්ම පිළිගත් සාහිත්‍ය ගවේෂණයක් ඔවුන් අතින් ඉටු විය යුතු බවයි.

"ඒත් එහෙම නොකර හුදෙක් තමන්ගේ පණ්ඩිතමානී බව පෙන්නනන ඇති කරන කලබැගෑනි තමයි අපිට දකින්න ලැබෙන්නෙ. ඒකට හෙඳම උදාහරණය තමයි පහුගිය දවස්වල ඇති කරපු ගේය පද කෝලාහල ය. මොකක්ද මේ ගේය පද කියන්නෙ. මම විශ්වාස කරන හැටියට ගීතයක් කියන්නේ අර්ථ පූර්ණ රචනයක්. අද එතනට ගීතය වර්ධනය වෙලා තියෙනවා. එහෙම තියෙද්දී ගායනා කෙරෙන පද කියන අර්ථයෙන් ගීත රචනයකට ගේය පද කියන එකේ තේරුමක් තියෙනව ද? මේ ගැන නාමෙල් වීරමුනිගේ පුංචි තියටර් එකේ තිබුණ කතා බහකදී ගුණදාස අමරසේකර කිව්වා ගේය පද ගැන නං මම දන් නෑ. ගාය පද කියළ නං දන්නවය කියලා. මේ නිසා වෙන්නෙ ගීත රචනයක් හැම විටම ගායනා කරන කියන තැනට ලඝු වෙන එකනෙ. ඉතින් එහෙම බැලුවම හොඳම ගේය පද කාරයො තමයි කට්ටඩි මිනිස්සු. වැදි ජනතාව අතරත් තේරුමක් කියන්න බැරි ගේය පද තියෙනවා. මං අහන්නේ මේ වගේ තේරුමක් නැති සංවාද වලික් පුළුවන්ද ජනතාව අතර කියවීමේ වර්ධනයක් ඇති කරන්න."

ජනමාධ්‍යවේදිනියක හැටියට අත්දැකීම් ඇති කරුණා පෙරේරා ප්‍රකට ගත් කතුවරියකද වේ. ඇයට අනුව නම් සාක්ෂරතාවය යනු එකක් ය. කියවීම යනු තවත් එකක් ය.

"සාක්ෂරතාවය කියන්නේ කියවීමේ හැකියාව නම් ලේඛකයින්ට ලොකු වගකීමක් තියෙනවා ඒ ගැන. ඒ කියවන්න ඉන්න පිරිස වෙනුවෙන් මොනවද අපි දෙන්නෙ කියන කාරණේ උඩ තමයි ලේඛකයින්ට ඒ වගකීම පැවරෙන්නෙ. අනිත් කණ්ඩායම තමයි ගුරුවරු. පත්තරේ දිග ඇරගෙන ප්‍රවෘත්ති කියවන එක නෙවෙයිනෙ සාහිත්‍යයික කියවීම කියන්නෙ. අන්න ඒක තමයි සාක්ෂරතාවය. සාහිත්‍යය කියවීමක් කියන්නෙ. ගැඹුරු අරුත් මතු කරගනිමින් කරන කියවීමකට. අපි පොඩි කාලේ කුමාරොදයෙන් පටන් ගත්ත ඒ කියවීම තමයි අපිව ලොකු මහත් කළේ. අන්න ගුරුවරයා මතුවන තැන. නමුත් ප්‍රශ්නෙ තමයි එහෙම ගුරුවරු අද ඉන්නව ද කියන එක."

"මා දකින තව දෙයක් තමයි සාහිත්‍යය කියන්නෙ වෘත්තීය අධ්‍යාපනයක් නෙවෙයි. සාහිත්‍ය ගුරුවරයා කියන්නේ තාක්ෂණවේදියෙකුත් නෙවෙයි. සාහිත්‍ය කියවීම කියන්නෙ ජීවිතය කියවීමක්. මොන විෂය කළත්, මොන වෘත්තියක හිටියත් ඒ ජීවිත කියවීම අවශ්‍යයි. පරණ පොතක් වුණත් අපි අද කියවනවා කියන්නෙ ඒක අලුතින් හිතීමක්. ඒ පරණ තැන ඉඳගෙන නෙවෙයි අපි ඒක අද කියවන්නෙ. ඒකයි මං කියන්නෙ සාක්ෂරතාව කියන්නෙ එකක්. සාහිත්‍යයික කියවීම කියන්නෙ තවත් එකක්."


වෘත්තියෙන් ගුරුවරයකු වන ප්‍රීති බණ්ඩාර ධනපාල ප්‍රකට සාහිත්‍යකරුවෙකු ද වෙයි. ඔහුට අනුව නම් කියවීමේ අඩුවක් නැත.

"පොදුවේ ගත්තම කියවීම පිරිහිලාය කියල මං නං හිතන්නෙ නෑ. ඉතිං එහෙම නං මෙච්චර පොත් ප්‍රකාශනයක් සිද්ද වෙන්නෙ කොහොම ද? අද පොත් ප්‍රකාශන සමාගම් කොච්චර තියෙනව ද? ඒක ලොකු ව්‍යාපාරයක්. එදා වගේ නෙවෙයි කර්තෘ ප්‍රකාශන පවා අද වැඩිපුර දකින්න පුළුවන්. ප්‍රතිශතයක් හැටියට ගත්තම කියවන පිරිස සියයට 20 ක් වගේ වෙන්න පුළුවන්. ඒත් කියවන පිරිසක් එහෙම ඉන්නවා. සමාජ මාධ්‍ය හරහා අද වෙනකොට වෙනම ආකාරයක කියවීමක් ඇති වෙලා තියෙනවා විය හැකියි. ඒ නිසා පොත පත අළෙවියට යම් බලපෑමක් වෙලා තියෙනවා වෙන්න පුළුවන්. ඒත් කියවන ප්‍රතිශතයක් ලංකාවෙ ඉන්නවා, ඒකෙ පිරිහීමක් නෑ. ඒකයි මගේ තර්කය."

"උදාහරණයක් විදිහට සිනමා ශාලා අද වේගයෙන් වැහීගෙන යනවා. මහනුවර ගත්තොත් ප්‍රධාන පෙළේ සිනමා ශාලා හැම එකක්ම වගේ වැහිලා ගිහින්. චිත්‍රපට රසිකයා අද ඉන්නෙ යූ ටියුබ් එකේ. එදා වගේ දුර රූපය, සමීප රූපය ඒවා අදාල වෙන්නෙ නෑ චිත්‍රපටියක් බලන්න. එදා තිබුණ සිනමාව හා බැඳුන ඒ අධ්‍යයනය වගේම සමාජ සංස්කෘතිය අද නෑ. නමුත් පොත් සාප්පු එහෙම වැහිලා ගිහිං තියෙනව ද? හැම නගරයකම බැංකු තියෙනවා වගේ ප්‍රධාන පෙළේ පොත් සාප්පුත් තියෙනවා. මම නං හිතන විදිහට කියවීම නැතිවෙලාය කියල අපිට මතුපිටින් විතරක් බලලා කියන්න බැහැ."

මිනිසාගේ ජීවිතයේ පැවැත්ම ගංගාවක් වැන්න. එය හිතන්න බැරි තරමට කලින් ගලා නොගිය අලුත් දිශා වලට වේගයෙන් ගලා බසී. මේ තමයි පැවැත්මේ විවිධත්වය. හිතන්න බැරි ආකාරයට එය යොමු කිරීමයි මැවුම්කරුවාගේ බලාපොරොත්තුව. එය (ජීවිතය) සකස් කළ ගමන් මාර්ගයක ගමන් කරන්නට කපා ඇති ඇළ මාර්ගයක් නොවේ." අප එය උපුටා ගත්තේ තාගෝර්ගේ ගෝරා නම් නවකතාවෙනි. සාහිත්‍යයික කියවීම යනු එවැනි ජීවිතාවබෝධයක් ලබා දෙන විශිෂ්ට වූ අත්දැකීමකි.

> **සාහිත්‍යය කියන්නෙ වෘත්තීය අධ්‍යාපනයක් නෙවෙයි. සාහිත්‍ය ගුරුවරයා කියන්නේ තාක්ෂණවේදියකුත් නෙවෙයි. සාහිත්‍ය කියවීම කියන්නෙ ජීවිතය කියවීමක්. මොන විෂය කළත්, මොන වෘත්තියක හිටියත් ඒ ජීවිත කියවීම අවශ්‍යයි. පරණ පොතක් වුණත් අපි අද කියවනවා කියන්නෙ ඒක අලුතින් හිතීමක්. ඒ පරණ තැන ඉඳගෙන නෙවෙයි අපි ඒක අද කියවන්නෙ. ඒකයි මං කියන්නෙ සාක්ෂරතාව කියන්නෙ එකක්. සාහිත්‍යයික කියැවීම කියන්නෙ තවත් එකක්**




දීපානි

# වන මැද හමු වූ මිනිස් ආත්මය

**ග්‍රන්ථය - ගස් හිටවූ මිනිසා**
**පරිවර්තක - මණ්ඩාවල පඤ්ඤාවංස හිමි**
**සේරි ප්‍රකාශනයකි**
**මිල රු. 300**
**විමසීම් 011 2889381**

**"විශේෂයෙන්ම අභ්‍යන්තර සංහිඳියාව විසින් මෙම මහල්ලාට මනා සෞඛ්‍යයක් පුද කර ඇත්තේ ය. මේ මනුෂ්‍යයා දෙවියන්ගේ මලල ක්‍රීඩකයෙකි. ඔහු තව කොපමණ හෙක්ටෙයාර් ගණනක් වෘක්ෂයන්ගෙන් ආවරණය කරති දැයි මම කල්පනා කළෙමි."**






එය අපූරු වෘතාන්තයකි. ප්‍රංශ ලේඛකයෙකු විසින් ලියන ලද්දකි. මණ්ඩාවල පඤ්ඤාවංස හිමියන් අතින් සිංහලට පරිවර්තනය වුවකි. පරිවර්තක හිමි පවසන ආකාරයට එම කෘතිය, "මසිත බෙහෙවින් සංහිඳියාව කරා මෙහෙය වූ පොත් පිංචකි." තවද එක්තරා කාලයක සොබා දහම පරදවන්නට වෑයම් කළ මිනිසා අද සිය පැරදුම පිළිගෙන සොබා දහම යනු අප සැමගේ උතුම් මැණියෝය යන හැඟීමෙන් ක්‍රියා කරන බවක් පෙනෙයි." පඤ්ඤාවංස හිමියන් පොතේ පසුබිම හඟින අයුරු එසේ යැයි සිතමි. කෙසේ වුණත් මෙය හුදෙත් ගස් හිටවූ මිනිසෙකු ගැන කතා පුවතක් පමණක් නොවේ.

ෂොං ගිඔනො විසින් ප්‍රංශ බසින් රචිත එම කෘතිය සිංහල බසට නැගී ඇත්තේ "ගස් හිටවූ මිනිසා" යන හිසිනි. කතාවට අනුව කථකයා වන තරුණ මිනිසා යන ඒ ගමන අනාගතයේ ඒ පාරිසරික ඛේදවාචකය රූපකාර්ථයට නැගුවාක් මෙනි. එය මෙසේ ය. "

දින තුනක ගමනකින් අනතුරුව වචනයෙන් විස්තර කළ නොහැකි මහා පාළු පෙදෙසකට මම අවතීර්ණ වීමි. මිනිසුන් විසින් අත් හැර දමන ලද ඇටසැකිලලකට උපමා කළ හැකි ගම්මානයක් ආසන්නයේ මම මගේ කූඩාරම ගසා ගතිමි. ....ගරා වැටුණු අත්හැර දමන ලද බඹර කූඩුවක් හා සමාන ගෙවල් අසල දිය හිඳුන ළිඳක් හෝ දිය උල්පතක් පවතින්නට ඇතැයි යන සිතිවිල්ල සිතට ආවේය. වහල ගැලවී ගිය, වැස්සෙන් සහ සුළඟින් හානියට පත් ගෙවල් පහක් සණ්ටාරය කඩා වැටුණ කුඩා පල්ලිය සජීවි ගමක පවතින ආකාරයෙන් එක සමාන්තරව පැවතියේය. එහෙත් සියලු ජීවයක්ම එතැනින් අතුරුදහන් වී තිබුණි."

එහෙත් සිය කූඩාරම එතැනින් ගලවාගෙන තවදුරටත් ඉදිරියට යන්නට කථකයා තීරණ කරයි. හමා එන ප්‍රචණ්ඩකාරී සුළඟට ඔරොත්තු දිමට නොහැකි වීමත්, දින දෙකක පමණ කාලයක සිට වතුර පොදෙක් නොලැබ ආ ගමනේ දීත්, නවාතැන් ගැනීමට සිතූ මෙතැනදීත් ඒ බලාපොරොත්තුව ඉටු නොවීමත් ඊට හේතු වූ බව පැහැදිලිය.

ඒත් සමඟම ඉදිරියේ දී හමු වීමට නියමිත තවත් දිළිඳු ගම්මාන දෙකක් පිළිබඳ විස්තරයක් කථකයා විසින් ඉදිරිපත් කරනු ලබන්නේ ඒ පාරිසරික ව්‍යසනය හා බැඳුන මානව ක්‍රියාකාරකම්හි විකෘතියක් ලෙසින් යැයි සිතමි. ඊට අනුව එගම් වැසියන් "පොදුවේ කිසිම හේතුවක් නොමැතිව එකිනෙකා හා ගැටෙයි. ඒ සියල්ලටම වැඩියෙන් සැඩ සුළඟක් අතොරක් නොමැතිව එක දිගට හමමින් ස්නායු පද්ධතිය ම කුපිත කරවයි. දිවි නසා ගැනීම වසංගත ආකාරයෙන් පැතිරෙයි. ඉතාම දරුණු උමතු ක්‍රියාකාරකම් සිදුවන අතර බොහෝ විට ඒවා මරණයෙන් කෙළවර වෙයි."

ගස් හිටවන මිනිසා ඔහුට හමුවන්නේ එවැනි පසුබිමක ය. එහෙත් ඔහු වනාහි පුද්ගල හැසිරීමකට එහා ගිය වෙනම ආකාරයේ "කියවීමක්" යැයි සිතෙයි. එසේ එය ගැනීම ද වැදගත් වෙයි. ඒ අනුව මුල දී ගොපල්ලෙකු වශයෙන් හමුවන ඒ මිනිසා සිය ජීවිත කාලයෙන් අඩ සිය වසක් ගෙවා සිටියේය. ඔහු කතා කළේ අතිශයින් අවම අයුරිනි. කාලයත් සමඟ ඔහුට සාමාන්‍ය මිනිසුන් කතා කරන්නා වූ දෙඩුම් අමතක වී ඇතැයි යන හැඟීමක් ධ්වනිත වන්නේ ය. එහෙත් ඒ නිකම්ම නොවේ. ඔහු මනා ඉවසීමකින් යුතුව මහා කාර්යභාරයක නිරතව සිටී. ඒ පසුබිමේ නිකරුණේ දොඩවමින් කටයුතු කරන මිනිසුන්ගේ දොඩමලු ජීවිත කොයි තරම් නම් වැඩකට නැති පැවැත්මක් දැයි තියුණු ලෙස ප්‍රත්‍යක්ෂ වෙයි.

ගස් හිටවන මිනිසා ඒ ආකාරයට භාවනායෝගී අත්දැකීමක් හා සම වෙයි. සම්මා සමාධිගතව ප්‍රත්‍යක්ෂ කරගත යුතු ක්‍රියාකාරී අවබෝධයක් ද ඒත් සමඟම නිර්මාණය වෙයි.

"මෙම අති විශේෂ චරිතය පිළිබඳ යම් නිශ්චිත අවබෝධයක් ඇති කරගනු ඇවැසි නම් ඔහු පූර්ණ නිහැඬියාවක සිටිමින් සිය කාරියෙහි යෙදෙතියි යන කාරණය අප විසින් විශේෂයෙන් සිහිකරගත යුතු වෙයි. ඔහුගේ ජීවිතයේ අවසාන කාලයේ ඔහුගේ කතා කිරීමේ පුරුද්ද ඔහු වෙතින් බැහැර විය. බාගවිට ඔහු කතා කිරීමෙන් කුමන පලයක් දැයි සිතුවා වන්නට නොහැකි ද?"

අප මුලදීත් කී ආකාරයට මෙය හුදෙක් මනුෂ්‍යයෙකු පිළිබඳ කතා පුවතක් ලෙසින් පමණක් ගන්නවාට වඩා මනුෂ්‍යයා සහ පෘථිවි පැවැත්ම අතර පැවතිය යුතු අධ්‍යාත්මය විමසන භාවනායෝගි අත්දැකීමක් නොවන්නේ දැයි විමසීම වටී.

# දීපානි

# කවි සිතුමිණ

## නොබිඳුණු කිසිත් වෙද

නොබිඳුණු
තුට බිඳේ
සිතිවිල ද පුපුරයි
කඩතොලු ය හද
විමන් දෙදරයි
පය තැබූ අතු බිඳේ
ඇත්නම් මිහිමත
නො කැඩුණු දෙයක්
නැත එය මෙතෙක් බිහි ව
නොවේ නම් කැඩී ගොස් ය
මිහිමතින්

**සුනිල් ලීවානගේ**

## සැරයටිය...

දෑස පෙනුණත් හොඳින්
ඇත දුටුවත් හොඳින්
නොදුටු එක් දෙයක් ඇත
කුමක්දැයි යන පාර!

පෙනුණත් පාර - මට පෙන්වන්නට පාර
මෙතුවක් කලක් සසරේ හුරු කළ ආර
යවුවන වියේ සිට මගෙ දිවියම බාර
ඒ සැරයටිය වෙයි! හරිකාරිය සූර!

පාන්දර උයනකොට නැගී එන හිරු ගෙනෙයි
සඳ නැතත් - තරු නැතත් රෑට ලෝකය පෙනෙයි
මට වඩා ගඳ - සුවඳ - වළ - ගොඩැලි ඉව දැනෙයි
සැරයටිය යන තැනට මගේ හදවත වැනෙයි!

සතුටට හිනාවෙමි - දුක ළඟ කඳුළු බොමී
අනුනගෙ කඳුළු දුටු විගසම සසල වෙමී
නැති දේ විසිකරමි - ඇති දේ ඇහිඳ ගමී
සැරයටියත් එක්ක මේ යන ගමන යමී!

ඉදිරියේ ගැඹුර ඇත කලින් ඒ බව කියයි
කන්ද ළඟ ළඟ ඇතැයි කල්තියා හඬ තියයි
මේ ලොවේ කිසි කෙනකු මට ඉදිරියෙන් නොයයි
මට පාර සොයා දෙන සැරයටිය නම් ඇයයි!

සඳ කිඳුරිය ද ඇයයි - අමරා ද ඇය තමයි
තනිව නොව ගෙන ගියෙමු මා ඉපිද වූ ළමයි
පැරදුණත් මැරෙනතුරු පරාජය ජය බිමයි
සසර වසනා තුරුම "බිරිඳ" සැරයටියමයි

**රටේමුල්ලේ මුදන්නායක**



## ඔබ සහ මම

ඔබ නිහඬය
ඒ ඔබේ හැටිය
මම කලබලය
ඒ මගේ හැටිය

මම වයස අග්ගිස්සේය
ඔබ තවම තරුණය
සිතුවිලි ආදරය තණ්හාව
මට්ටම් දෙකකය

කෙලෙසකද
එක් මඟක
එක්ව අත් බැඳ
එකට යන්නේ

විඳිමි විඳවමි
විරසකය
සඟවගමි
කඳුළු හද පතුලේ

බලා ඉමි යන්නට හැර
තනිව ඒ මඟ
නුඹට

**ජගත් දම්පහලගේ**

## ආදරේද මෙතරම්

මුරණ්ඩු මගෙ හිත විලංගු නොදමා
ඔබ පෙම් කරන තරම්
මියදෙන වසන්ත කාලය දැක දැක
ඔබ දුක් විඳින තරම්
අදහන්නත් බෑ ඔබ මා ඇත් හැර
මාගෙන් ඈතට නොයන තරම්
මේ තරමට මට ආදරෙ ඇයි දැයි
කියලා දෙන්න ඉතින්....

ඇස්වල බේරෙන ඔබේ සොඳුරු බව
මට නොපෙනෙනව නෙවේ
හද තුළ තෙරපෙන ආදර හැඟුමට
මට නොදැනෙනව නොවේ
කියා ගන්න බැරි සිත තුළ ආලය
මම නොකියනව නොවේ...

දරා ගන්න බැරි ඔබගෙන් වෙන් වී
දවසක යන්නම වේ
කඳුළැල් ගලනා නෙත් යුග සඟවා
මා දෙස බලන ඔයා
කිසිවක් නොවනා විලසින් ඉන්නේ
කෙලෙසද කියන් ඔයා
දවසක තනි වී මාගෙන් වෙන් වී
ජීවිත කාලෙ පුරා
මතකෙන් තනි වී මැරි මැරි නොමැරී
ජීවත් වෙන්න එපා

**සංජීව විජේසිංහ**



## මාවත දිගේ

අතින් අත ගෙන සෙනෙහසින්
ඉදිරියට පිය තබමු දැන්
ගල් බොරලු මඟ හැර හෙමින්
යා යුතුය සන්තෝෂයෙන්

ලැබූ සහනය මට ඔබෙන්
කියන්නට බැරිවෙයි මුවෙන්
හැරමිටිය කුමටද ඉතින්
සරණ වෙමු අල්ලා අතින්

**පියසීලි විජේනායක**



## මුහුණු පොතෙන් කවියක්

### මා නික්ම යමි

කවුළුවෙන් බලා
සමුදෙන හැමවිට,
මට නවතින්න'යැයි,
නොකියා කියන
නුවරක් ඇත

පටු වීථි, මාවත්
හුරු හුරුපුරුදු මුත්,
සඟවා ඒ බැව්,
නන්නාදුනන සේ
සමුදිය යුතුව ඇත

මෙනුවරින් ඈතක,
මා පැමිණෙනා තුරු
මඟ නොබලන මුත්,
යායුතුම වූ,
නුවරක් ඇත

දෙපස දැල්වෙන
නියොන් එළි අතරින්,
ඇවිද යන විටක දී පවා,
මාව අඳුරෙහි දැවෙන

බොහෝ කල් ඇවිද ගියමුත්
මට තවමත් නුහුරු ,
එනුවර පටු මාවතක කෙළවර
ගමනාන්තයේ හි
දොරකඩ ඇත

සුබ සිහිනයක් වත්
මට අකැප එනුවර,
මට උරුම අඩ නිද්‍රාව තුළ,
මට පෙරා ගත හැකි,
එකම සුබ සිහිනය
මෙනුවර මතකයකි

නමුත් මට පුළුවන්ද?
නොගොස්
ගමනාන්තයෙහි දොරකඩට
මේ මතක ළඟින්
බැසගන්න

මෙනුවරට පුළුවන්ද?
නටබුන් අතරින් මතුව
අතීත සෙනෙහසින්ම
නැවත මා
වැළඳගන්න

කවුලුවෙන් එබී බලා
නන්නාදුනන සේ
පසුකරමි

නැවත නැවතත්
නැවත නැවතත්
පසුකර
නික්ම යමි

**අනුත්තරා කොඩිකාර**

## මා සමුගන්නෙමි

සුදුමල් පියලිය විසිරුණු මාවත
දෙපිය නගා යන්නට බැරිනම්...

ඒ මල් මාවත දෙපස පිපී ඇති
මල් සුවඳින් මා සැනසෙන්නම්...

සීතල පිරි රෑ මැදියම් යාමෙක
මැණිකෙගෙ රුව සිහිනෙන් දුටුවා
නොලැබෙන ආදරයක් වෙනුවෙන්
ඉකිබිඳිමින් දෙනයන හැඬුවා..

නෙත වැලපෙද්දී හදවත පුපුරා
උණු ලේ දහරා ගලා ගියා
ජන්මෙන් ජන්මේ බැඳි සෙනෙහස් දම
නොපෙනෙන ඈතක ඇදී ගියා

බොඳවුණු පැතුමන් මිලින වූ මල්පෙති
බොල් සුළගේ පාවී යනවා
මේ භවයේ යළි නෙත නොගැටෙන්නට
මා ඔබගෙන් සමුගෙන යනවා

**වික්‍රම සෙනවිරත්න**

## උද්‍යාන සිරි

සැඳෑ
කළුවර
පැතිරෙන
පෙම්වතුන්
බොඳකර
කණකොකෙක්
හඬයි
තටුසලනු
අමතක

**අජිත් ලියනගේ**

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න
සිළුමිණ, කවි පිටුව,
ලේක්හවුස්, කොළඹ 10.
edmediaunit@gmail.com

## විදෙස් කවිය

### මගේ චාරිකා

නැඟෙමි වලාකුළකට
මගේ කඳුළුවලට ඉහළින් යන්නට
අවැසි නම් වැසි ඔවුනට
පොඟමි ඒවා මගේ කඳුළින....

නැඟෙමි සෙන්ධවයකු පිට
සුළඟෙහි රසය විඳින්නට
ආදරය මා පොරොත්තුව සිටින විට...

පවරමි නදියකට
ගෙන යනුව මා සයුරට
රඳවාගනිමි නෞකා මා මත....

නැඟෙමි සිහිනයකට
නැතිව පා රැඳවුම් හෝ තෝන් ලණුව
ගෙන යනුව මා හෙට වෙත....

පවරමි ගීයකට
ගැයුමට ගමන ගැන
නිශ්චල මොහොතේ සිටම

ඇල්බේනියානු කිවි Xhevahir Spahiuගේ "My Travels" පද්‍යය ඇසුරෙනි.

Xhevahir Spahiu රචකයා 1945 දී උපත ලැබීය. ඔහු 1967දී උපාධියක් ලබා ජනමාධ්‍යවේදියකු, ගුරුවරයකු, ප්‍රකාශකයකු, කවියකු හා නාට්‍යරචකයකු ලෙස කටයුතු කරයි. 1993 දී ඇල්බේනියානු කලාකරුවන්ගේ හා ලේඛකයන්ගේ සංගමයේ ලේකම්වරයා වූ හෙතෙම 1998 දී එහි සභාපති ධුරයට පත් විය.

**පරිවර්තනය - දේ.වි. ගාල්ලගේ**

## අපේ එක්කෙනා

දුක විඳගෙන
බර උසුලන
හිත උණුවෙන
තෙක් වෙහෙසෙන

දා බිඳුවක
බත පිසලන
ඒ බත් පිඬ
කුස පුරවන

විටෙක දුකෙන්
කඳුළු අතර
දිනෙක සතුට
උතුරා යන

මගේ රිඳුම තැවුල එක්ක
ගැටී වැටී ඇවටීගෙන
දරු පැටවුන්
එක්කම හිඳ
පට සළු පිළි
ගත නොරඳන
නිතර අපේ සැපම පතන
අපේ එක්කෙනා

**නන්දන පලුකන්දෑව**

## කොත්මලේ ප්‍රේමය



වැහි නැතුව ඉකි ගහන අහසක
ලිහිණියක් මඟ බලනවා
කොත්මලේ දිය පිරී ඉතිරී
ගියපු දා සිහි කෙරෙනවා
කැඩුණු සිංහල වචන පෙරලී
ඇගේ කම්පෙති තවනවා
නුහුරු බස් තෙපලමින් උන් නුඹ
පෙම් වදන් ඉඳ ගොතනවා..

පාරමී දම් පිරූ ප්‍රේමය
පරලු වී වැටුණාට මේ බිම
නුඹේ නළලත මැදෙහි තනිවුණා
තිලකයක් නලලතෙහි නැතුවට
ප්‍රේමයේ නම් ශිලා ලිපි මත
කොටා ඉරි අතරකද නැතුවට
දිව'ග නුහුරෙන් බඳින පදවල
ප්‍රේමයක් ඉපදුණේ නොදැනම..

කොත්මලේ නිල් අහසෙ පුපුරන
ගිනි ඇවිත් ඇවිලිලා ප්‍රේමෙට
බැඳි කඩුලු තරවුණේ කොහොමද
බැඳි උන් ඒ අපේ ප්‍රේමෙට
කොත්මලේ දිය පිරී ඉතිරී
ගියේ ප්‍රේමයෙ කඳුළු බිඳුවට

පැටලෙමින් ගෙතූ වදන් සිංහල
හඬද්දී කොත්මලේ දිය කඳ
වාවගනු බැරි වේදනාවට
පිරී ඉතිරිනි කඳුළු වැටි බිම

**දේශෝදාර ලියනගේ**

## අපට වෙච්ච දේ

ගලන ගං මිටියාවතට එපිටින්
මාවතේ දුව පැන කඩුල්ලෙන්
රහසේ ආසයි යන්න පිම්මෙන්
දකින රිසියෙන් රූ සිරිය මනරම්

ගඟේ දිය දහරාව ගැලුවේ සරුකර උයන්
පැලේ සිරියාව දැනුණේ රුක් හෙවණකින්
වනේ පල බර වුණේ පෙර පින් මහිමයෙන්
අපේ මේ රට දිලුණේ මිනිස් ගුණ මහිමයෙන්

සිතේ දිරි දමා හැමදේම එනතුරුම මුහුදින්
ගතේ ලෙඩ වැඩී වීම රැකුණේම පෙත්තෙන්
අත පයේ සවිය, අපේකම අලසකම ළඟ හිරවී තදින්
ගියේ සේදී රටේ පැතුමන් වනසා පරපුරක අබිමන්

**ප්‍රියානි පී. රණසිංහ**

## කඳුළු බිඳු

රන්වන් හිරු කිරණ සුදු වැලි මතට වැදී
බෙලි කටු බබළවන විට හැම මොහොතකදී
සුදුපෙන පිඩු නගා රළ එන විටදි ඇදී
රන්දම්වැල වෙරළ ලක්මව ගෙලෙහි බැඳී

රළ මත පැන දුවන්නට හෙළ දරුවන්ට
සරුංගල් යවා සුළඟේ නැළ වෙන්ට
වැලියට සැඟවිලා ගත සිත සනසන්ට
සුන්දර දසුනක්ය මෙය රට වැසියන්ට

කෙකටිය පඳුරු, පොල් ගස් මැද කඬොලානයි
සමගිය බලය පෙන්වන ධීවර රෑනයි
වෙරළට සිසිල කැන්දන පුන් සඳපානයි
සුන්දර වෙරළ මිහිබට සුරපුරගානයි

ජීවන සයුර තරණය ගැන සිතන්නට
රළපෙළ බිඳෙන හැටි මනසින් දකින්නට
බැරිමුත් සමුදුරට පවසක් නිවන්නට
මුහුදු වෙරළ කදිමයි පෙම් වතුන්හට

පොලිතින්, ප්ලාස්ටික්, බෝතල් පිරුණ විට
හිස්ටින්, කුණු කසළ කඳු ගොඩ ගැහෙන කොට
ගංජා, අබිං, කුඩුවල දුම දකින කොට
මේ මහ සයුර නොව නෙත්වල කඳුළු කැට

**සුගතදාස කුරුවිට**

## සතියේ කවි පොත

**කෘතිය - මියුලු නුවරත් විසාලාවක්**
**කර්තෘ - නිශාන්ත මල්ලවආරච්චි**
**ප්‍රකාශක - ශ්‍රැෆිකෙයා ප්‍රකාශකයෝ**
**මිල - රු : 250**


කවියට තැනක් නැතැයි, කවි පොත් අලෙවි වන්නේ නැතැයි ඇතැමුන් මැසිවිලි නැගුව ද කවියෝ තම නිර්මාණ කරති, කාව්‍ය සංග්‍රහ පළකරති. වර්තමානයේ පත්තර පිටු අතරත්, මුහුණු පොතහරහාත් කවි ලියන්නෝ දවසින් දවස හමුවේ. අලුත් කවි හමුවේ. විවිධ මාතෘකා ඔස්සේ ලියැවුණ නිර්මාණ හමුවේ. ඒ කෙසේ වුවත් වර්තමාන ආර්ථික රටාව තුළ මේ සමාජයේ කවියෙකුට තැනත් නැති වෙන්නට පුළුවන. වර්තමානයේ ගීත රචකයකුට මෙන් කවියෙකුට ලොකු මිලක් නැත. කවියට ඇබ්බැහි වූවන් ඒ නිර්මාණයෙන් සෑහීමකට පත් වෙනවා විනා මුදල් ඔස්සේ දුවන්නේ නැත .මහා ලොකු මුදලකට විකිණෙන්නට කවි ලියන්නේ වත්, ලියූ කවි වලට මේ සමාජය තුළ මුදල් උපයන්නටවත් හැකියාවක් නැත. මේ එවන් කවියෙකුගේ පාපොච්චාරණයකි. මාතෘකාව "කවියෙකුගේ ආත්ම ප්‍රකාශය". "කවි ලියලා මොකක්ද ඇති වැඩේ. ලියන්නකෝ හිටි වෙන සිංදුවක්."

*හිත් ගැබේ කිති කැවි සිය දහස් වාරයක්*
*කවි මලක් පුදන්නට අවැසිමයි දිගු කලක්*
*නුඹේ සරදම් සිනා විටෙක හද පෑරුවත්*
*කවියෙකුට කවි පොතක් කියන්නෙම මී විතක්...*

*ලාබ සිල්ලර වදන් බාල තනුවට අරන්*
*කාක කැල කෑ ගසති කොවුල් ස්වර යට කරන්*
*සවන්පත් අගුලුලන රප් රෙගේ හඬ මැදින්*
*අපට සැනසිය හැකිද දරු පැටවු වටකරන්..*

*ගෙයි කුලිය විදුලි බිල් බෝ උසයි ණය කන්ද*
*මාස් අග පඩිපතට දරන්නට පුළුවන්ද*
*අගනුවර පොත් සැලක කවි පොතකි මන නන්ද*
*සොඳුර මම නොදැනුවත්වම වුණා උපනන්ද..*

*පැටෙවු ලොකු මහත් වුණු දිනක මතු කිසියම්*
*අසයි නුඹගෙන් සොඳුර පියෙකුගේ වත්කම්*
*පොත් රාක්කේ කොනක තබමි කවි සිත්තම්*
*දයා දසේ දියන්, උන්ට මගෙ කවිකම්!*



විවාහ වන වයස පැමිණි විට කවුරුත් අසන්නේ කවදා ද බඳින්නේ කියායය. ඒ සමාජයේ හැටිය. සියල්ල සම්පූර්ණ වුවත් නොවූවත් දෙහිතක් බැඳුන පසු විවාහ වන්නේ අද කාලේ හැටියට කරන්නට පුළුවන් උපරිම වියදම් දරාය. දැන් ඉස්සර මෙන් ලෙහෙසියෙන් විවාහ මංගල උත්සවයක් ගැනීම පහසු නැත. එසේ වුවත් කොහොම හරි උත්සවයක් ද ගෙන එක් වහලක් යටට වූ පසු පැමිණෙන සතුටත් දුකත් මෙන්ම අනෙකුත් දහසකුත් එකක් ප්‍රශ්න විද දරා ගන්නට සිදු වන්නේ ද ඔවුන්ටමය. අතමිට සරු නොවූ විට විඳින්නට වන ගැහැට අපමණය. ඒ ගැහැට වැඩි වන්නේ දරු මල්ලන් ද සිටින විටය. කුලි නිවෙසක දිවි ගෙවන්නට වේ නම්, දෙදෙනාගෙන් එක් අයෙක් පමණක් රැකියාව කරන්නේ නම් මේ ගැහැට වැඩිය. කවියා ද එවන් පවුලක අත්දැකීමක් ලියන්නේ මෙලෙසිනි. මාතෘකාව "විවාහ මංගල්‍යයෙන් අනතුරුවය".



නිශාන්ත මල්ලවආරච්චි

දුප්පත්කමේ පතුලේ සිටින කතකයා පවසන්නේ විවාහයෙන් කලක් ගිය තැනදී කුටුම්බය තුළ අසන දකින අත්විඳින ජීවිතය පිළිබඳය. කවි පන්තියේ අවසන් කොටසේ දී එය කියන්නේ මෙලෙසිනි.

*"කුලියට ගත් මාල වළලු මංගල තැලිපිළි*
*පෙට්ටගමේ පතුලෙ ඉඳන් නගාවි මැසිවිලි*
*වේල් පොටෙන් පිසිය හැකි ද අග හිඟ කඳුළැලි*
*කටු යහනට ඉතින් කුමට ප්‍රේමයෙ සැරසිලි..*

*සාද තෙපුල් බමන ගීත උඩු හුළගට වැද*
*මැකී ගිහින් දැන් ඇසෙන්නේ දරුවගෙ කටහඬ*
*ඇල්බම් පොත පාගා ණය පොත තටු පිරි මැද*
*ඉගිල්ලෙමින් සොඳුර අපට සිනා සලන රඟ...*

කවියන්ගේ භාෂාව විවිධාකාරය. ඔවුහු විවිධ සමාජ ඇසුරු කරමින් 'විවිධ සංස්කෘතීන්ගෙන් පෝෂණය ලබමින් තම භාෂාව පෝෂණය කර ගනිති. "මියුලු නුවරත් විසාලාවක්" කාව්‍ය සංග්‍රහයේදි නිශාන්ත මල්ලවආරච්චි ද එසේ යැයි සිතේ. ආදරයක් හදේ ඇති වූ විට එය කියන්නේ අපට ඇති හොඳම ආදරණීය වචනයෙනි. මනු කියවන රස්සාවේ යෙදෙන්නාට නිතර භාවිතා වන වචන තම ප්‍රේමයේ විඳුම, රිඳුම කියන්නට ද යොදා ගනි. නිශාන්ත කවියා ලියූ"මනු කියවන නිලධාරියාගේ අප්‍රකාශිත ප්‍රේමය" ඊට නිදසුනකි.

*"ජලාශයක් වුව පිරෙන තරමට*
*පෙම පුරෝගෙන නුඹ සොයා එමි*
*හදේ ඉසියුම් රැහැන් විනිවිද*
*අඩි බලැති පෙම සිතින් පුද දෙමි...*

*එබෙන තුරු කවුලුවෙන් පුන් සඳ*
*මනුව කැරකෙන බව ගනිමි*
*නුඹේ වැඩි සැර බැල්ම අබියස*
*හදේ බල්බය නිවාලමි...*

*සිතින් නුඹ තෙකලාම බව දැන*
*මසිත් එකලා දුක දරා ගමි*
*මනු තැටිය සේ සසැලෙනා සිත*
*මුවින් සඟවා බිල තබා යමි...*

*පේන කණු'තර පිපුණු හද පෙම*
*විසන්ධිව පසුබා ඉවත යමි*
*එළැඹෙනා මස යළිදු දිනයක*
*විදුලි සැර හදවතින් විඳගමි...*

කවිය පිළිබඳ නිරන්තර අභ්‍යාසයේ යෙදෙන තරුණ කිවියකු වන නිශාන්ත ගේ කවි නිසදැස් ආරට වඩා සඳැසට ළඟය. ඔහුට මේ කවි මගෙහි තව බෝ දුර යා හැකිය.

වෂී 2020ක් වූ ඔක්තෝබර් මස 18 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# දැන්වීමයි

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කෘෂිකර්ම අමාත්‍යාංශය

## නීති නිලධාරී (විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

කෘෂිකර්ම අමාත්‍යාංශයේ නීති නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**02. අවශ්‍ය සුදුසුකම්**

(i) **අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්:**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) **පළපුරුද්ද:**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලය, දිනය හා නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදි ඉදිරිපත් කළ යුතුය)

**හෝ**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු පහත දැක්වෙන කාර්යයන් වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම.

I. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම

II. ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු

III. අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු

IV. පනත් කෙටුම්පත්, චක්‍රලේඛ රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු

V. විවිධ ව්‍යවස්ථාපිත ආයතන වලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු

(මෙම කරුණු ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් නිකුත් කළ සහතිකයකින් සනාථ කළ යුතුය)

(iii) **කායික සුදුසුකම්:**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iv) **වෙනත් :**

- ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- 2020.11.08 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි.**

(i) මෙම තනතුර ස්ථිරය, ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. නීති නිලධාරී III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014හි විධිවිධාන හා ඊට අනුශාංගික වන චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම පත්වීම භාරගත් දින සිට වර්ෂ පහක් ඉකුත් වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත් වේ.

**04. වයස් සීමාව**

ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ තනතුරක වසර පහ (05)කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් හා ඉහත 2 යටතේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**05. වැටුප් පරිමාණය**

මෙම තනතුරට රු.47,615-10 X 1,335-8 X 1,630-17 X 2,170 = 110,895/- (SL-1-2006) මාසික වැටුප් පරිමාණය හිමි වේ.

**06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.**

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | 25 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගන්නා ලද ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය | 25 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන ක්ෂේත්‍රයට අදාළව ලබාගන්නා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු) | 20 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | - පළමු පන්තියේ සාමාජිකයින් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 07 | |
| | - සාමාන්‍ය නීතිවේදි උපාධියක් | 05 | |
| | නීතිවිද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීතිවිද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 05 | |
| | සටහන : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 05 ලබාදිය යුතුයි. (උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබාදේ) | | |
| 02 | **අතිරේක වෘත්තීය පළපුරුද්ද** | | 35 |
| | i. **අතිරේක වෘත්තීය සුදුසුකම්** | 10 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 10 කි) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06 ට වැඩි හා අවුරුද්දකට අඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 05 බැගින්) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 ට වැඩි හා මාස 06 කට අඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින්) | | |
| | (අංක 01 යටතේ වන ලකුණු ලබා දුන් සහතික හැර වෙනත්) | 25 | |
| | ii. **අතිරේක පළපුරුද්ද** | | |
| | අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 2.(ii)හි සඳහන් පළපුරුද්ද (මූලික සුදුසුකම ලබාගැනීම සඳහා අවශ්‍ය වන වසර 03ක සේවා කාලය හැර) | | |
| | - (එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 25ක්) | | |
| | - (මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු -ලකුණු 02) | | |
| | (අවුරුදු 15 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද (මෙම සේවා කාලය, අයදුම්කරු වෙනුවෙන් නිකුත් කරනු ලබන සහතිකය තුළම සඳහන් කළ යුතුය. නීතිඥවරයකුගේ හෝ ජනාධිපති නීතිඥවරයකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.) | | |
| | ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් හෝ පෞද්ගලික අංශයේ නිලධාරීන් සඳහා ආයතන ප්‍රධානී විසින් අතිරේක පළපුරුද්ද සනාථ කිරීමේදී අයදුම්කරු නීතිමය තනතුරක සේවය කරන බවට සේවා සහතිකයක්/ සහතිකපත් මගින් සනාථ කළ යුතුය) | | |
| 03 | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම** | | 10 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයන් ලෙස හදාරා තිබීම සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 ට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 07 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06/ පැය 720 | 05 | |
| | - මාස 03/ පැය 360 | 03 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ) | | |
| 04 | **භාෂා ප්‍රවීණතාව** | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරන ලද පශ්චාත් උපාධිය /උපාධිය/ පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්නපත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය) | 15 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06/ පැය 720 | 07 | |
| | - මාස 03/ පැය 360 | 05 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ) | | |
| 05 | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව** | | |
| | i. සාමාන්‍ය දැනීම හා බුද්ධිය | 05 | |
| | ii. නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවනතා පිළිබඳ දැනුම | 05 | |
| | iii. පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය | 05 | |
| | මුළු එකතුව | | 100 |

**සටහන -** යෝග්‍යතාවය ඇගයීමේදී සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරනු ලබන සහතිකපත්වල අදාළ කාලසීමාවන් පිළිබඳ සඳහන් නොවන්නේනම්, එවැනි සහතිකපත්‍රවලට අදාළ කාල සීමාවන් අදාළ ආයතනය මඟින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් නොමැති සහ කාල සීමාව තහවුරු නොකළ සහතිකපත්‍ර ලකුණු ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය**

- යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
- සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය.

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**08. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

(i) අයදුම්පත් 2020.11.08 දිනට හෝ එදිනට ප්‍රථම ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, අංක 80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1.0 සිට 3.2 දක්වාත් 02 වන පිටුව අංක 3.3 සිට 5.0 දක්වාත් ඉතිරිය 03 වන හා 04 වන පිටුවටත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"නීති නිලධාරී තනතුර සඳහා අයදුම්පත්‍රය"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සමාදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 47,615/- ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

11. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් හෝ ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

12. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.**

**....................................................**
**ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය,**
**අංක 80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල**
**2020.10.14**

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

**නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත**

| අනු අංකය | |
|---|---|

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ..........................................
(සිංහලෙන්/දෙමළෙන්) : ..........................................
උදා : GUNAWARDHAHA, M.G.B.S.K
1.2 සම්පූර්ණ නම : ..........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................
1.3 මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය) : ..........................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................
1.4 මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය) : ..........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................
2.0 2.1 ස්ථිර ලිපිනය : ..........................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................
2.2 ස්ථිර ලිපිනය : ..........................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................
3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ☐
(අදාළ කොටුව තුළ ලියන්න) ස්ත්‍රී - 1
3.2 විවාහක /අවිවාහක බව : විවාහක - 1 ☐
අවිවාහක - 2
3.3 උපන් දිනය : අවුරුද්ද ☐☐☐☐ මාස ☐☐ දින ☐☐
3.4 2020.11.08 දිනට වයස : අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐
3.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 4.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබා ගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තරය

| සුදුසුකම් ලබාගත් ආයතනය | ලබා ගත් දිනය |
|---|---|
| .......................................... | .......................................... |
| .......................................... | .......................................... |
| .......................................... | .......................................... |

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය : ..........................................
4.2 අයදුම්පත් කැඳවීමේ නිවේදයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර
4.3 අතිරේක අධ්‍යාපන සුදුසුකම් : ..........................................
4.4 අතිරේක වෘත්තිය සුදුසුකම් : ..........................................
4.5 අතිරේක පළපුරුද්ද : ..........................................
4.6 භාෂා ප්‍රවීණතාව : ..........................................
4.7 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම : ..........................................

5.0 ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ලකුණු (√ ) යොදන්න) (ඔව් නම් විස්තර කරන්න) නැත ☐ ඔව් ☐
..........................................

6.0 අයදුම්කරුගේ සහතිකය

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මා විසින් කරන ලද ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරුනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

.......................... ..........................
දිනය අයදුම්කරුගේ අත්සන

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... මයා/මිය/මෙනවිය මා දන්නා හඳුනන බවද ඔහු /ඇය මා ඉදිරිපිට දී .......................... දින ඔහුගේ / ඇයගේ අත්සන් තැබූ බවද, සහතික කරමි.

.......................... ..........................
දිනය අත්සන් සහතික කරන නිලධාරියාගේ අත්සන

සම්පූර්ණ නම : ..........................................
තනතුර : ..........................................
දිනය : ..........................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

(13) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත විස්තර සඳහන් .......................... මහතා/ මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට /ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

..........................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන

නම : ..........................................
පදවි නාමය : ..........................................
ලිපිනය : ..........................................
දිනය : ..........................................
(නිල මුද්‍රාව යොදන්න)

gef | SGP The GEF Small Grants Programme | UNDP

# ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කිරීම

## ජගත් පරිසර පහසුකම්/සුළු මූල්‍යාධාර වැඩසටහන (GEF/SGP)

## ක්‍රියාකාරී අදියර 6 (OP-6)

## මන්නාරම භූ දර්ශනය සඳහා දැනුම් කළමනාකරණය

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යනු රටවල් 178 ක ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ ගෝලීය සංවර්ධන ජාලයයි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් ක්‍රියාත්මක කරනු ලබන, ජගත් පරිසර පහසුකම් / සුළු මූල්‍යාධාර වැඩසටහන (GEF / SGP) යනු රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා මූල සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන පරිසර සංරක්ෂණ වැඩසටහන් සඳහා මූල්‍යාධාර ලබාදෙන යාන්ත්‍රණයකි.

ජගත් පාරිසරික පහසුකම් / සුළු මූල්‍යාධාර වැඩසටහනේ (SGP), 6 වෙනි ක්‍රියාකාරී අදියර තුළදී (OP-6), අධිශ්‍රේණිගත රටවල් වල වැඩසටහන් (Upgraded Country Programmes-UCP) මගින් එම රටවල් වල සමහර ක්ෂේත්‍රයන් සහ භූ ගෝලීය ප්‍රදේශ තුළ SGP අත්දැකීම්, එම රටවල් වල හොඳින් දියුණු වූ සිවිල් සමාජයන් සහ වෙළඳපොල ජාලයන්වල වාසිය යොදා ගනිමින් ප්‍රජා පාදක භූ දර්ශන ප්‍රවේශය වඩාත් පුළුල් ලෙස යොදා ගැනීමට අවස්ථාවක් ලබාදේ.

භූ දර්ශන ව්‍යාපෘතියේ අරමුණ වන්නේ පාරිසරික වශයෙන් සංවේදී භූ දර්ශන තුනක් වන නකල්ස් සංරක්ෂණ වනාන්තරය සහ එහි ස්වාරක්ෂක කලාපය (buffer zone), මන්නාරම දූපතේ සිට යාපනය දක්වා වූ වෙරළබඩ කලාපය සහ කොළඹ ආශ්‍රිත තෙත් බිම් තුළ ගෝලීය පාරිසරික ප්‍රතිලාභ සහ තිරසාර සංවර්ධනය සඳහා අනුවර්තීය භූ දර්ශන කළමනාකරණය තුළින් සමාජීය, ආර්ථික සහ පාරිසරික තත්වයන්ට ඔරොත්තුදීම සඳහා ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම සඳහා සාමූහික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රජා මූලසංවිධාන සවිබල ගැන්වීමයි.

මෙම දැන්වීම, මන්නාරම භූ දර්ශනය සඳහා දැනුම් කළමනාකරණය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නියෝජිතායතන සහ ලියාපදිංචි ප්‍රජා මූලික සංවිධාන (CSOs) වෙත උපාය මාර්ගික යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කිරීමකි. තෝරාගන්නා ලද පාර්ශවකරුවන් විසින් පහත කාර්යයන් සිදු කළ යුතු වේ.

- මන්නාරම භූ දර්ශනය තුළ පිහිටි විශ්වවිද්‍යාල, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල තාක්ෂණික විශේෂඥතාවය අර්ධ වශයෙන් යොදාගෙන දැනුම කළමනාකරණය, ප්‍රජාවන්ගේ ධාරිතා වර්ධනය සහ පාර්ශවකරුවන් හා ව්‍යාපෘති අතර සම්බන්ධතා වැඩි දියුණු කිරීම.
- ප්‍රජාවන් අතර සම්බන්ධතා පහසු කිරීම, තොරතුරු හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සහ මන්නාරම භූ දර්ශනයේ ඔවුන්ගේ තනි ව්‍යාපෘතිවලට අදාළ දැනුම් සම්පත් වෙත ප්‍රවේශය සැපයීම සඳහා දැනුම කළමනාකරණ වේදිකා නිර්මාණය කිරීම.
- එක් එක් ප්‍රදාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවසානයේදී ප්‍රතිඵල, උගත් පාඩම්, භූ දර්ශන සැළසුම් සහ කළමනාකරණ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා අනාගත ප්‍රයත්නයන් සහ මන්නාරම භූ දර්ශනයේ ව්‍යාපෘති වැඩිදියුණු කිරීමේ අවස්ථාවන් ඉස්මතු කිරීම සඳහා සිද්ධි අධ්‍යයනයන් සහ බලපෑම් ඇගයීම් සකස් කිරීම.

ඉහත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කළ දින දළ වශයෙන් සිට වසර 1 ½ ක කාලයක් සඳහා එක් ප්‍රදානලාභියෙකු තෝරාගනු ලැබේ. ව්‍යාපෘති යෝජනා 2020 නොවැම්බර් මස 02 වන දින හෝ ඊට පෙර, ජගත් පාරිසරික පහසුකම් – සුළු මූල්‍යාධාර වැඩසටහන, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, අංක 202–204, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට තැපෑලෙන් හෝ gefsgp.lk@undp.org යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් හෝ එවිය යුතුය. වැඩි විස්තර සඳහා GEF/ SGP කාර්යාලය අමතන්න.

**දු.කඃ011 2580692 දිගුවඃ 1421 හෝ 1422.**

ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍රය, ඇගයීම් නිර්ණායක, කාර්ය නිර්ණය සටහන (ToR) සහ කොන්දේසි http://gefsgpsl.org/ යන වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**සුදුසුකම් සම්පූර්ණ කළ අපේක්ෂකයන්හට පමණක් ජාතික මෙහෙයුම් කමිටුවේ වැඩිදුර ඇගයීම හා නිර්දේශ කිරීම සඳහා GEF/SGP කාර්යාලය මගින් දන්වනු ඇති බව කරුණාවෙන් සලකන්න.**

gef | SGP The GEF Small Grants Programme | UNDP

# ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කිරීම

## ජගත් පාරිසරික පහසුකම්/සුළු මූල්‍යාධාර වැඩසටහන (GEF/SGP)

## ක්‍රියාකාරී අදියර 6 (OP-6)

## රාජ්‍ය නොවන සංවිධාන පාර්ශ්වකරුවන්ගේ ධාරිතා වර්ධනය

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යනු රටවල් 178 ක ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ ගෝලීය සංවර්ධන ජාලයයි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් ක්‍රියාත්මක කරනු ලබන, ජගත් පාරිසරික පහසුකම් / සුළු මූල්‍යාධාර වැඩසටහන (GEF / SGP) යනු රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා මූල සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන පරිසර සංරක්ෂණ වැඩසටහන් සඳහා මූල්‍යාධාර ලබාදෙන යාන්ත්‍රණයකි.

ජගත් පාරිසරික පහසුකම් / සුළු මූල්‍යාධාර වැඩසටහනේ (SGP), 6 වෙනි ක්‍රියාකාරී අදියර තුළදී (OP-6), අධිශ්‍රේණිගත රටවල්වල වැඩසටහන් (Upgraded Country Programmes-UCP) මගින් එම රටවල්වල සමහර ක්ෂේත්‍රයන් සහ භූ ගෝලීය ප්‍රදේශ තුළ SGP අත්දැකීම්, එම රටවල්වල හොඳින් දියුණු වූ සිවිල් සමාජයන් සහ වෙළඳපොල ජාලයන්වල වාසිය යොදා ගනිමින් ප්‍රජා පාදක භූ දර්ශන ප්‍රවේශය වඩාත් පුළුල් ලෙස යොදාගැනීමට අවස්ථාවක් ලබාදේ.

භූ දර්ශන ව්‍යාපෘතියේ අරමුණ වන්නේ පාරිසරික වශයෙන් සංවේදී භූ දර්ශන තුනක් වන නකල්ස් සංරක්ෂණ වනාන්තරය සහ එහි ස්වාරක්ෂක කලාපය (buffer zone), මන්නාරම දූපතේ සිට යාපනය දක්වා වූ වෙරළබඩ කලාපය සහ කොළඹ ආශ්‍රිත තෙත් බිම් තුළ ගෝලීය පාරිසරික ප්‍රතිලාභ සහ තිරසාර සංවර්ධනය සඳහා අනුවර්තීය භූ දර්ශන කළමනාකරණය තුළින් සමාජීය, ආර්ථික සහ පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තුදීම සඳහා ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම සඳහා සාමූහික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රජා මූල සංවිධාන සවිබල ගැන්වීමයි.

මෙම දැන්වීම,ඉහත භූ දර්ශන ත්‍රිත්වය තුළ භූ දර්ශන කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන රාජ්‍ය නොවන සංවිධාන (NGO) හවුල්කරුවන්ගේ ධාරිතා වර්ධනය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නියෝජිතායතන සහ ලියාපදිංචි ප්‍රජා මූලික සංවිධාන(CSOs) වෙත උපාය මාර්ගික යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කිරීමකි. තෝරාගන්නා ලද පාර්ශ්වකරුවන් විසින් පහත කාර්යයන් සිදු කළ යුතු වේ.

ඉහත සඳහන් කොළඹ, මන්නාරම සහ නකල්ස් භූ දර්ශන තුනෙහි ජෛව විවිධත්වය/ ඉඩම් හායනය, දේශගුණික විපර්යාස/ නිෂ්පාදන ප්‍රවර්ධනය සහ ව්‍යාපෘති යෝජනා ලිවීම යන ප්‍රමුඛතා ක්ෂේත්‍ර තුළ පාරිසරික ගැටලු පිළිබඳ ධාරිතාවර්ධනය.

ඉහත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කළ දින දළ වශයෙන් සිට වසර 1½ ක කාලයක් සඳහා එක් ප්‍රදානලාභියෙකු තෝරාගනු ලැබේ. ව්‍යාපෘති යෝජනා 2020 නොවැම්බර් මස 2 වන දින හෝ ඊට පෙර, ජගත් පාරිසරික පහසුකම් – සුළු මූල්‍යාධාර වැඩසටහන, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, අංක 202–204, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට තැපෑලෙන් හෝ gefsgp.lk@undp.org යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් හෝ එවිය යුතුය. වැඩි විස්තර සඳහා GEF/ SGP කාර්යාලය අමතන්න.

දු.කඃ 011 2580692 දිගුවඃ 1421 හෝ 1422.

ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍රය, ඇගයීම් නිර්ණායක, කාර්ය නිර්ණය සටහන (ToR) සහ කොන්දේසි http://gefsgpsl.org/ යන වෙබ් අඩවියෙන් ලබාගත හැක.

සුදුසුකම් සම්පූර්ණ කළ අපේක්ෂකයන්හට පමණක් ජාතික මෙහෙයුම් කමිටුවේ වැඩිදුර ඇගයීම හා නිර්දේශ කිරීම සඳහා GEF/SGP කාර්යාලය මගින් දන්වනු ඇති බව කරුණාවෙන් සලකන්න.

ඔබ කැමති පුවත්පත් කීපයකම දැරිය හැකි මිලකට

# ලුහුඬු දැන්වීමක්

* වචන 15ක් සඳහා

| | | | |
|---|---|---|---|
| Sunday Observer ADZ it's what you want | + සිළුමිණ | රු. 500/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| Sunday Observer ADZ it's what you want | + Daily News | රු. 350/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| සිළුමිණ | + දිනමිණ The Dinamina | රු. 350/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| Sunday Observer ADZ it's what you want | + தினகரன் வாரமஞ்சரி THINAKARAN VAARAMANJARI | රු. 400/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| සිළුමිණ | + தினகரன் வாரமஞ்சரி THINAKARAN VAARAMANJARI | රු. 400/- | - වැඩි වන වචනයක් සඳහා රු. 15/- |
| Daily News | + தினகரன் THINAKARAN | රු. 250/- | - වැඩි වන වචනයක් සඳහා රු. 10/- |
| දිනමිණ The Dinamina | + தினகரன் THINAKARAN | රු. 250/- | - වැඩි වන වචනයක් සඳහා රු. 10/- |

ඔබගේ ලුහුඬු දැන්වීම අදම අප වෙත E-Mail කරන්න...

classified@lakehouse.lk

වැඩි විස්තර සඳහා අමතන්න -
අනූෂා - 077 7 278 948 / පියුමි - 011 2 429 383
රමණී - 011 2 429 347

# ලංසු සඳහා ආරාධනය

## CEFAP/PRT/04/2020

## රතු ෆොස්ෆරස් කි.ග්‍රෑ. 15,000.00 ක් සැපයීම

01. ආරක්ෂක අමාත්‍යාංශය (ශ්‍රී ලංකා නාවික හමුදාවේ වානිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනි අවි සහ වෙඩි බෙහෙත් ප්‍රසම්පාදන (CEFAP) ඒකකය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ CEFAP ඒකකය වෙත රතු ෆොස්ෆරස් කි. ග්‍රෑ. 15,000 ක් සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.
02. යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වනුයේ, නිෂ්පාදකයන් / ආනයනය කොට සැපයීමේ පදනමේ වෙළෙඳුන් / දේශීය නියෝජිතයන් මගින් විදේශීය මූලිකයින්
03. **ඇසිරීම හා මිටිබැඳීම -** රතු ෆොස්ෆරස් තෙතමනය උරාගන්නා මළු සහිත මුහුදට යෝග්‍ය පොලිනර්අයන් පීප්ප / තෙතමනය උරාගන්නා මළු සහිත මුහුදට යෝග්‍ය සවිමත් සිදුරු රහිත ප්ලාස්ටික් මළුවල ඇසුරුම් කළ යුතුය. යකඩ පීප්ප / ප්ලාස්ටික් මළු ආරක්ෂිතව වැසිය යුතුය. මුළු තොගය අඩි 20 කන්ටේනරයක තිබිය යුතුය. නිෂ්පාදිත දිනය / පවිච්චි කළහැකි කාලය එක් එක් පීප්පයේ / ප්ලාස්ටික් මල්ලේ සඳහන් කළ යුතුය.
04. ජාත්‍යන්තර තරගකාරී ලංසු පටිපාටියට අනුව ලංසු කැඳවීම සිදුකරනු ලැබේ.
05. **ඉදිරිපත් කළයුතු ලිපිලේඛන :** මූල්‍ය ප්‍රකාශන, අවසන් වසර 3 සඳහා පසුගිය කාර්ය සාධන වාර්තාව, ලංසු ලිපිලේඛන මිලදී ගැනීම සඳහා ගෙවීම්කළ ලදුපත, ඇටෝර්නි බලපත්‍රය සඳහා බලය පැවරීමේ සම්මත සහතිකය.
06. **ලංසු වලංගු කාල සීමාව :** 2021 මාර්තු 05 වන දින දක්වා ලංසු වලංගු විය යුතුය.
07. **ලංසු ඇපකරයේ කාල සීමාව :** 2021 අප්‍රේල් 05 වන දින දක්වා ලංසු ඇපකරය වලංගු විය යුතුය.
08. යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්හට පහත ලිපිනය වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකිය.

**අධ්‍යක්ෂ,**
**වානිජ පුපුරණ ද්‍රව්‍ය ගිනි අවි සහ වෙඩිබෙහෙත් ප්‍රසම්පාදන ඒකකය (CEFAP) ඒකකය,**
**නාවික හමුදාපති බාරේ,**
**රජයේ වෙඩිබෙහෙත් ගබඩාව,**
**වැලිසර, රාගම, ශ්‍රී ලංකාව.**
**දුරකථන : 0112955514 / 0112958227**
**ෆැක්ස් අංකය : 0112955515**
**විද්‍යුත් තැපැල් ලිපිනය : cefap@navy.lk**

09. **සුදුසුකම් අවශ්‍යතා :** පසුගිය වසර 2 තුළ රතු ෆොස්ෆරස් කි.ග්‍රෑ. 15,000 නිමාකොට / සපයා තිබිය යුතුය.
10. රු. 3,500.00 ක හෝ ඇමරිකානු ඩොලර් 20 ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව පහත ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අභිලාෂී ලංසුකරුවන්හට සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිලදීගත හැකිය. ගෙවීමේ ක්‍රමය ඉහත සඳහන් නිලධාරී වෙත මුදලින් හෝ නාවික හමුදපති ගිණුම් අංක 7041344 වෙත බැර කළ යුතුය.

**අධ්‍යක්ෂ,**
**වානිජ උපකරණ ද්‍රව්‍ය ගිනි අවි සහ වෙඩිබෙහෙත් ප්‍රසම්පාදන ඒකකය (CEFAP) ඒකකය,**
**නාවික හමුදාපති බාරේ,**
**රජයේ වෙඩිබෙහෙත් ගබඩාව,**
**වැලිසර, රාගම, ශ්‍රී ලංකාව.**

11. ලංසු පහත ලිපිනය වෙත 2020 දෙසැම්බර් 03 වන දින 14 පැයට හෝ ඉන් පෙර ගෙනැවිත් භාරදිය යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**නාවික හමුදා මූලස්ථානය,**
**තැ.පෙ. 593, කොළඹ 01.**

ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයන් හමුවේ ලංසු විවෘත කරනු ලැබේ. සෑම ලංසුවක් සමගම රු. 400,000.00 (ඇමරිකානු ඩොලර් 2200) ක ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව.**

# සිළුමිණ ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

සිළුමිණ The Silumina

## මොරටුව විශ්වවිද්‍යාලය

### 2021 වර්ෂය සඳහා වාහන අලුත්වැඩියා කරන්නන්, අමතර කොටස් සපයන්නන් සේවා කරන්නන් සහ කුලී පදනමින් වාහන සපයන්නන් ලියාපදිංචි කිරීම

මෙම විශ්වවිද්‍යාලයට අයත් වාහන අලුත්වැඩියා කිරීම, අමතර කොටස් සැපයීම සහ සේවා කිරීම සඳහා ලියාපදිංචි වීමට කැමති පිළිගත්, සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් සහ ආයතන වලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. වාහන අලුත්වැඩියාවේදී පහත සඳහන් කාර්යයන් කිරීමේ හැකියාවන් වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතු අතර, ඒ ඒ අයිතමයන් සම්බන්ධව වෙන වෙනම ලියාපදිංචි කරනු ලැබේ.
    - I. වාහනවල යාන්ත්‍රික අළුත්වැඩියාවන්.
    - II. සියලුම මෝටර් රථ වාහන වායුසමීකරණ පද්ධති අලුත්වැඩියා හා සේවා කිරීම.
    - III. වාහනවල විදුලි පද්ධති අලුත්වැඩියා කිරීම.
    - IV. තහඩු අලුත්වැඩියා කිරීම සහ තීන්ත ආලේප කිරීම.
    - V. සැහැල්ලු සහ බර වාහනවල දුණුකොල සැපයීම, හැඩගැන්වීම හා අලුත්වැඩියාවන්.
    - VI. වාහනවල රෝද එලයින් කිරීම/ බැලන්ස් කිරීම.
    - VII. වාහන ආසන අලුත්වැඩියාව, සවි කිරීම, කුෂන් කිරීම හා ආසන කවර සවිකිරීම.
    - VIII. ටයර් හා ටියුබ් සැපයීම සහ සේවා කිරීම.
    - IX. රේඩියේටර් අලුත්වැඩියා කිරීම.
    - X. සයිලන්සර් අලුත්වැඩියා කිරීම.
    - XI. යතුරුපැදි හා ත්‍රිරෝද රථ අලුත්වැඩියා කිරීම.
    - XII. සියලුම වාහන ටින්ට් කිරීම.
    - XIII. ඉන්දියානු නිෂ්පාදිත බස් රථ අලුත්වැඩියා කිරීම.
    - XIV. ජපන් නිෂ්පාදිත බස් රථ අලුත්වැඩියා කිරීම.
    - XV. සියලුම වාහන වල දෙර සහ ජනෙල් බීඩින් අලුත්වැඩියාව.
    - XVI. සියලුම වාහනවල ස්ටිකර් ගැසීම.
    - XVII. නව බැටරි ලබාගැනීම.
    - XVIII. වාහන යතුරු කැපීම.
    - XIX. අත්ට්‍රැක්ටර් අලුත්වැඩියා කිරීම.
02. වාහනවල අමතර කොටස් සැපයීම.
03. වාහන සේවා කිරීම.
04. කුලී පදනමින් වාහන සැපයීම.
    - I. ලොරි රථ සහ ෆුල් බොඩි ලොරි රථ ලබාගැනීම.
    - II. හදිසි අවශ්‍යතා සඳහා කැබ්රථ, වෑන් රථ, ත්‍රීවීල්, ජේ.සී.බී. යන්ත්‍ර, අත් ට්‍රැකටර්, ටිපර් රථ, ජංගම ඔසවන යන්ත්‍ර (මොබයිල් හොයිස්ට්) ලබා ගැනීම.

පහත සඳහන් ආදර්ශ අයදුම්පතට අනුව පිළියෙල කරගත් අයදුම්පත සමග මොරටුව තැපැල් කාර්යාලයෙන් මාරුකළ හැකි පරිදි **"මුල්‍යාධිකාරී, මොරටුව විශ්වවිද්‍යාලය"** නමින් එක් එක් අයිතමය සඳහා ආපසු නොගෙවන රු. 200/- බැගින් මුදල් ඇණවුම් එවිය යුතුය.

සෑම අයදුම්පතක්ම 2020.11.28 දිනට හෝ ඊට ප්‍රථමයෙන් ලියාපදිංචි තැපෑලෙන් **"නියෝජ්‍ය ලේඛකාධිකාරී / සාමාන්‍ය පාලන (සේවා) මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව"** යන ලිපිනයට එවිය යුතු අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2021 වර්ෂය සඳහා වාහන අලුත්වැඩියාවන් හා ඊට අදාළ සේවාවන් සඳහා ලියාපදිංචි වීම"** යනුවෙන් සඳහන් කළ යුතුවේ.

**කොන්දේසි.**

01. සේවාවන් ලබා ගැනීම සඳහා ලියාපදිංචිකරුවන්ගෙන් ටෙන්ඩර් / මිල කැඳවීම් කරනු ලබන අතර, ඉන් පිටස්තර අයගෙන් / ආයතනවලින් ටෙන්ඩර් කැඳවීමේ / මිල කැඳවීම් අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.
02. ඉහත සඳහන් අලුත්වැඩියාවන් හා සේවාවන් සහ අමතර කොටස් සැපයීම සඳහා විශේෂ වූ ගරාජ් හා වැඩහල් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ
03. අයදුම්කරුවන් අදාළ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් සහ ගිණුම් පවත්වාගෙන යන බැංකු, ව්‍යාපාර සම්බන්ධතා පවත්වාගෙන යන ආයතනවල විස්තර ද ඉදිරිපත් කළ යුතු වේ.
04. පැවරූ කොන්ත්‍රාත්තුව/ සේවාව සතුටුදායක ලෙස ඉටු කිරීමට අපොහොසත්වූ ලියාපදිංචි කළ පුද්ගලයකු / ආයතනයක් වේ නම් එවැන්නන්ගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.
05. ඉහත කාර්යයන් සඳහා ලියාපදිංචිය ඉල්ලා සිටිනු ලබන සැපයුම්කරුවන් අවම වශයෙන් දින 30 ක් සඳහා ණය පදනම මත සේවය ලබාදීමට එකඟ විය යුතුය.

**ආදර්ශ අයදුම්පත්‍රය**
**(පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය.)**

01. අයදුම්කරුගේ / ව්‍යාපාරික ආයතන ආයතනයේ නම හා ලිපිනය :
02. දුරකථන අංකය : ෆැක්ස් අංකය :
03. ව්‍යාපාරයේ ස්වාභාවය (රජයේ ආයතනයක් ද, තනි අයිතිකරුද, හවුල් ව්‍යාපාරයක්ද, සීමිත සමාගමක්ද යන වග)
04. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි ව්‍යාපාරයේ ස්වාභාවය :
05. ගිණුම් පවත්වාගෙන යනු ලබන බැංකුව / බැංකු හා ගිණුම් අංකය :
06. එකතු කළ අගය මත බදු (VAT) ගෙවන්නේ නම් එම අංකය :
07. දැනට ඔබ / ආයතනය සැපයුම් /සේවා සැපයුම් කරන රජයේ ආයතන කිහිපයක නම් සහ ලිපිනයන්:
08. ඔබ ලියාපදිංචි වීමට අපේක්ෂිත අයිතමය / අයිතමයන් සම්බන්ධ විස්තර
    1. උදාහරණ : (වාහනවල යාන්ත්‍රික අලුත්වැඩියාවන්)
    2. ...........................................................................

පුවත්පත් නිවේදනයේ කොන්දේසිවලට එකඟ වෙමින් මොරටුව විශ්වවිද්‍යාලයේ වාහන අලුත්වැඩියාවන් / සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමැත්තෙමි.

දිනය : ...........................................................................

අයදුම්කරුගේ අත්සන හා ආයතන

මුද්‍රාව

**ලේඛකාධිකාරී**
**2020.10.07**

## ආරක්ෂක අමාත්‍යාංශය

### අනුරාධපුරය සඳහිරු සෑය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

### ප්‍රසම්පාදන දැන්වීමයි

අනුරාධපුර ඉදිකරමින් පවතින සඳහිරු සෑය චෛත්‍යයේ සලපතල මළුව වෙනුවෙන් ගල් පතුරු 2360 ක් මිලදී ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

| විස්තරය | සලපතල මළුව සඳහා ගල් පතුරු සැපයීම |
| --- | --- |
| ප්‍රසම්පාදන අංකය | MOD / FIN / SUP / 9/ SS / 4 / 2020 |
| අවශ්‍ය වන කළු ගල් නිර්මාණ හා ප්‍රමාණයන් | www.defence.lk වෙබ් අඩවියෙන් නොමිලේ බාගත (Download) හැක. |
| ලංසුකරුවන්ගේ සුදුසුකම් | අවම වශයෙන් වසර 03 ක කාලයක් කළා නිර්මාණ සඳහා කළුගල් සැපයීම් / නිෂ්පාදන සම්බන්ධ ව්‍යාපාරයක් පවත්වාගෙන යමින් තිබිය යුතුය. |
| සැපයීම් කළ යුතු කාල සීමාව | 2021.01.15 වන දිනට පෙර සැපයීම් කර අවසන් කළ යුතුය. |
| ලංසු ලේඛන ලබා ගත හැකි ආකාරය | www.defence.lk වෙබ් අඩවියෙන් නොමිලේ බාගත (Download) හැක |
| ලංසු කැඳවීම් කාල සීමාව | 2020.10.19 දින සිට 2020.11.02 දින දක්වා |
| ලංසු කැඳවීම අවසන් වන හා ලංසු විවෘත වන වේලාව | 2020.11.02 දින පෙ.ව. 10.00 ට |
| ලංසු බැඳුම්කරයේ වටිනාකම් | රු. 325,000.00 (රුපියල් තුන්ලක්ෂ විසිපන්දහසක් පමණි) |
| ලංසු වලංගු වන කාල සීමාව | 2021.02.28 |
| ලංසු බැඳුම්කර වලංගු කාලසීමාව | 2021.03.31 |

- ඉල්ලුම් කරනු ලබන කළුගල් පතුරුවල පිරිවිතර ඇතුළත් වැඩි විස්තර ලබා ගැනීමට www.defence.lk වෙත පිවිසෙන්න
- සඳහිරු සෑය චෛත්‍ය සඳහා අරමුදල් සැපයීම දේශීය රජයේ නොවන සුභසාධක අරමුදලක් මගින් සිදු කරනු ලබයි.
- කළුගල් නිෂ්පාදන වැඩභූමිය ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් පරීක්ෂා කරනු ලැබේ.
- ගල් සැපයීමට කැමැත්ත දක්වන ලංසුකරුවන් තම මිල ගණන් ඉහත ලංසු කැඳවීම අවසන් කරන වේලාවට හෝ ඊට පෙර ආරක්ෂක අමාත්‍යාංශයේ සැපයුම් අංශයට ලැබෙන සේ එහි තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීම සිදු කළ යුතුය. ප්‍රසම්පාදන කටයුතු සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී මුද්‍රා තබන ලද කවරයේ වම් පස ඉහළ කෙළවරේ ප්‍රසම්පාදන අංකය සහ නම සඳහන් කළ යුතුය.
- ප්‍රසම්පාදන සඳහා ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් ලබා ගත් ලංසු බැඳුම්කරයන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් නමට ඉදිරිපත් කළ යුතුය. එසේ ලංසු බැඳුම්කර ඉදිරිපත් නොකරන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සුදුසුකම් ලැබූ අවම ලංසුකරු, කොන්ත්‍රාත්කරු ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් සමග ගිවිසුමකට එළඹිය යුතු අතර, ගිවිසුම් අත්සන් කිරීමට පෙර තම ලංසු වටිනාකමින් 10% ක ප්‍රමාණයකට සරිලන සේ දේශීය වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන කාර්ය සාධන බැඳුම්කරයක් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් නමට ලබා දිය යුතුය. එසේ කාර්ය සාධන බැඳුම්කර ලබාදීමට අපොහොසත් වන ලංසුකරුවන් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැර වූවාසේ සලකා ඊළඟ සුදුසුකම් ලත් අවම ලංසුකරු වෙත කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට කටයුතු කරනු ලැබේ.
- නිර්මාණයන් සිදු කිරීමට පෙර කළුගල් දේශීය රාජ්‍ය ආයතනයක පරීක්ෂණාගාරයකින් පරීක්ෂා කර අදාළ කාර්යයට සුදුසු බවට තහවුරු කර ගනු ලැබේ.
- ලංසුකරුවන්ගේ ලංසු 2021.02.28 දක්වා වලංගු විය යුතු අතර, ලංසු බැඳුම්කරය 2021.03.31 දක්වා වලංගු විය යුතුය. එහෙත් අවශ්‍ය අවස්ථාවල ලංසු වලංගු කාලය හා ලංසු බැඳුම්කර වලංගු කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත බලය ඇත.
- ලංසු විවෘත කිරීම ඉහත වගුවේ සඳහන් වේලාවන්වලදී ආරක්ෂක අමාත්‍යාංශයේ බිම් මහලේ පිහිටි අධ්‍යක්ෂ ජනරාල් (ගිණුම් හා මූල්‍ය) කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී සිදු කරනු ලැබේ.
- වැඩිදුර තොරතුරු සඳහා පහත දුරකථන අංක හා ෆැක්ස් අංක භාවිතා කළ හැකිය.

  වැඩ බිම් ඉංජිනේරු දුරකථනය - 0712512220
  ඊමේල් - 9esr@army.lk
  සැපයීම් ශාඛාව දුරකථනය - 0112430860 - 309 හා 310
  ෆැක්ස් අංක - 0112433517

- ගල් පතුරු සැපයීමේදී සම්පූර්ණ ගල් පතුරු ප්‍රමාණය හෝ කොටස් වශයෙන් සැපයිය හැකි බැවින් ද එක් එක් ලංසුකරුවන් විසින් පැහැදිලිව මිල කැඳවීම් ලේඛනය තුළ සැපයිය හැකි ප්‍රමාණය දැක්විය යුතු අතර, එක් එක් ලංසුකරුවන්ගේ සුදුසුකම් මත කොන්ත්‍රාත්තුවට අදාළව ප්‍රදානය කරන ගල් පතුරු ප්‍රමාණයන් පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව හා අමාත්‍යාංශීය ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරනු ඇත.
- ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව අවසන් තීරණයකට එළඹීමේ බලය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය.**
**2020.10.16 දින**

## රබර් ගස් විකිණීමට

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ආසන්න කහපත්වෙල නොටිංහිල් වත්තේ**

(අක්කර 50 පුද්ගලික) අක්කර 5 ක ක්ෂේත්‍රයක ආසන්න වශයෙන්

**රබර් ගස් 950 ක් ගලවා මිලට ගැනීමට කොන්ත්‍රාත්කරුවන්ට අලෙවිකරනු ලැබේ.**

කලින් වේලාවක් වෙන්කොටගෙන ගස් පරීක්ෂා කළ හැකිය.

**කරුණාකර 0777-123737 හෝ 0373-144395 ඔස්සේ වතු අධිකාරී අමතන්න.**

පරීක්ෂාකිරීමෙන් පසු මිල ගණන්
2020 නොවැම්බර් 20 ට හෝ ඉන් පෙර

**කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ නො.36/5, ඩබ්ලිව් ද මෙල් මයා වෙත යොමු කරන්න.**

## වැවිලි අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (TRI)
### තලවාකැලේ

### කොළඹ අවට ප්‍රදේශයෙන්, සංචාරක බංගලාවක් මෙන්ම කාර්යාලයක්ද සඳහා නිවසක් හා එහි පරිශ්‍රයක් බද්දට ගැනීම

ප්‍රසම්පාදන කමිටුවේ (සුළු) සභාපති විසින්, සංචාරක බංගලාවක් මෙන්ම කාර්යාලයක්ද වශයෙන් භාවිත කිරීම සඳහා, කොළඹ අවටින්, නිවසක් හා එහි පරිශ්‍රයක් බද්දට ගැනීමට මිල ගණන් කැඳවනු ලැබේ. අවශ්‍ය කරනු ලබන කාලය අවම වශයෙන් වසර තුනක් (03) වන අතර, අන්‍යෝන්‍ය කැමැත්ත පරිදි අලුත් කළ හැක.

**අවශ්‍ය අවම පිරිවිතරයන් පහත පරිදි වේ.**

1. සේදුම්කාමර පහසුකම් සහිතව ව.අඩි. 500 වූ කාර්යාල ඉඩකඩ.
2. යාබද නාන කාමරය සහිත වායුසමීකරණය කළ කාමර එකක් හා අවම වශයෙන් 03 ක යාබද නාන කාමර සහිත සාමාන්‍ය කාමර 05 ක්.
3. TRI ආයතනයේ බස් රථය ඇතුළුව වාහන 05 ක් සඳහා රථගාල.
4. ඉහළින් සවිකළ ජල ටැංකිය සහිතව ජල සැපයුම (ටැංකිය අවම ධාරිතාවය ලීටර් 2000 කි.)
5. රියදුරන් 06 දෙනෙකු පමණ සඳහා යාබද නාන කාමරය සහිත රියදුරු කාමරයක්.
6. මුළුතැන්ගේ ප්‍රදේශය
7. පැන්ට්‍රිය
8. විසිත්ත කාමරය
9. වට තාප්පය හා ගේට්ටුව
10. සේවක කාමරය හා වැසිකිළිය

සියලුම ලංසුකරුවන් විසින්, ඉහත අංක 01 සිට 10 දක්වා සඳහන් විස්තර ඇතුළත්ව තමන් විසින්ම පිළියෙල කරගත් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එම අයදුම්පත්, මෙම දැන්වීම පළවී සති දෙකක් ඇතුළත, **සභාපති, ප්‍රසම්පාදන කමිටුව (සුළු), ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ශාන්ත කූම්බ්ස්, තලවාකැලේ** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

ලැබී ඇති මිල ගණන්, 2020 නොවැම්බර් 04 වන දින පස්වරු 2.00 ට, **තලවාකැලේ. ශාන්ත කූම්බ්ස් හි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේදී** විවෘත කරනු ලබන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලය පැවරූ නියෝජිතයකු හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

ලැබී ඇති මිල ගණන් සියල්ලම හෝ අදාළ අවම පිරිවිතරයන් සපුරාලීමට අපොහොසත් වන්නේ නම් කිසිදු හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතුවේ.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව (සුළු),**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**තලවාකැලේ.**



සිළුමිණ Silumina The Silumina වටපිට
පළ දරන්න - පළ කරන්න
මංගල යෝජනා
දැන් වචන 15ක් රු. 560ක් පමණයි...
දශක ගණනාවක විශ්වසනීය සේවාව...

# COMPFIE පළමු වරට ශ්‍රී ලංකාවට හඳුන්වා දෙයි

**අපරාජිතා කෝපරේට් සර්විසස් ප්‍රයිවෙට් ලිමිටට්, කොළඹ මූලස්ථානය කර ගත් 3W කන්සල්ටින් හා එක්ව සිය ගෝලීය ඊ-පාලන හා අනුකූලතා (Compliance) මෘදුකාංග පද්ධතියක් වන COMPFIE ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබිණි. ශ්‍රී ලංකාවේ අනුකූලතා ව්‍යුහය වෙත COMPFIE හඳුන්වා දෙමින් ගත් මෙම පියවර මගින් අපරාජිතා සහ 3W කන්සල්ටින් අතර පළමු උපාය මාර්ගික හවුල්කාරිත්වයේ සාර්ථකත්වය සනිටුහන් කෙරේ.**

ශ්‍රී ලංකාව සතුව තවමත්, ස්වයංක්‍රීය පාලන, අවදානම් කළමණාකරණ හා අනුකූලතා (governance, risk management and compliance) මෘදුකාංගයක් නොමැති අතර, COMPFIE ආගමනයෙන් පළමු වරට මෙම තාක්ෂණය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබෙයි.

COMPFIE යනු ජාත්‍යන්තර නෛතික රාමුවට ශ්‍රී ලංකාවේ අපනයන, වාණිජ හා කර්මාන්ත නියාමනයන්, අනුකූලතා හා ප්‍රමිතික ගැලපෙන පරිදි හැඩගස්වන අන්තර්ජාලීය තාක්ෂණය මත පදනම් වූ (cloud) මෘදුකාංග පද්ධතියකි. ශ්‍රී ලංකාවේ විවිධ කර්මාන්තවලට ගැලපෙන නවතම ඩිජිටල් පරිවර්තනයන් සඳහා තාක්ෂණික දැනුම ලබා දීම පිණිස, සිය තාක්ෂණික කණ්ඩායම් හා උපාංග ක්‍රියාත්මක කිරීමේ හැකියාව COMPFIE සතු වෙයි. උපාය මාර්ගික ප්‍රවේශයන්ගේ සිට තාක්ෂණික සක්‍රිය කිරීම්, හා නියාමනයන් දක්වා කටයුතු කරන එම තාක්ෂණික කණ්ඩායම්, ජාත්‍යන්තරව පවතින නීතීන්ට අනුකූල වන පරිදි එම අවකාශ සකස් විය යුතු ආකාරය පිළිබඳ පූර්ණ දැක්මකින් යුක්තවද කටයුතු කරති. COMPFIE හඳුන්වා දෙමින් ශ්‍රී ලංකාව තුළ සිය ජයග්‍රාහී මායිම සලකුණු කිරීමට අපරාජිතා හා 3W Consluting වෙත හැකියාව ලැබී තිබේ. එමෙන්ම, එමගින් ආයතනික සහ මණ්ඩලවලට ඔවුන්ගේ අභ්‍යන්තර ක්‍රියාවලීන් (Internal Processes) සැලසුම් කරන ආකාරය, ව්‍යුහගත කරන ආකාරය මෙන්ම විධිමත් කරන ආකාරය ආදී අනාගත කාර්යයන් එමගින් විධිමත් කරයි. දේශීය වශයෙන් මෙන්ම කලාපීය වශයෙන් ව්‍යවස්ථාපිත නීතිරීති හා රෙගුලාසීන්ට අනුකූලව ආයතනික අරමුණු කඩිනමින් සාක්ෂාත් කර ගැනීම පිණිස, අවදානම් අවම කිරීම සහ අනුකූලතා ක්‍රියා පටිපාටි පාලනය කිරීම වෙනුවෙන්, COMPFIE හි තාක්ෂණික ක්‍රමවේද සැලසුම් කර ඇත.

# අපනයන දිරිමත් කරන්න අත්වැලක්

● චන්දිමා එදිරිමාන්න

**විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන දේශීය ව්‍යාපාරිකයන් සඳහා සුබ කලක් උදා වෙමින් පවතී.එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ දේශීය ව්‍යාපාරිකයින් අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගත් ව්‍යාපාරික මෙහෙයුම් වෙත ප්‍රවේශ වෙමින් සිටිති. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන්ද දේශීය ව්‍යාපාරිකයන්ගේ හා කර්මාන්තකරුවන්ගේ ව්‍යාපාරික වපසරිය අපනයන වෙළෙඳපොළ මූලික කර ගත් ව්‍යාපාරික වපසරියක් බවට පුළුල් කරන බවට ඉතා පැහැදිලිවම සඳහන් කර ඇති අතර නව රජයේ වසරකට ආසන්න වැඩපිළිවල තුළ ඒ කරුණු ක්‍රියාවෙන්ම ඔප්පු කිරීමට ජනාධිපතිතුමන් හා රජය කැපවීමෙන් කටයුතු කරන බවට පැහැදිලිවම දක්නට ලැබී ඇති හෙයින්ම අපේ දේශීය ව්‍යාපාරිකයෝ අපනයන වෙළෙඳපොළ වැනි නව ව්‍යාපාරික අවස්ථා වෙත යොමු වීමේ ප්‍රවණතාවක් ඇති වෙමින් පවතියි.**



විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ව්‍යාපාරිකයන් බොහෝ පිරිසක් මේ වන විටත් සිය වෙළෙඳපොළ අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් සිදු කිරීමට ඇති අවස්ථා සම්බන්ධව උනන්දු වන ආකාරයක්ද පෙනෙන්නට තිබේ.

එවැනි ව්‍යාපාරිකයන් හඳුනා ගෙන ඔවුන් දිරි ගැන්වීම සඳහා බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ද වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති අතර එම වැඩසටහන් හී එක් පියවරක් ලෙස පළාතේ ව්‍යවසායකයන්ගේ හා කර්මාන්තකරුවන්ගේ අපනයන දිරි ගැන්වීමේ අරමුණින් එම පිරිස් වෙත අපනයන ක්‍රියාවලිය පිළිබදව පුළුල් අවබෝධයක් ලබා දෙන සුවිශේෂී වැඩමුළු පැවැත්වීමටද කටයුතු යොදා ඇත.

බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන විධායක ප්‍රසන්න සුජිත් කුමාර පවසා සිටියේ මෙම වැඩමුළුව පසුගිය ඔක්තෝබර් මස 03 , 04 දෙදින පැවැත්වුණු අතර එය අතිශයින් සාර්ථික වුණු බවයි.



බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන විධායක ප්‍රසන්න සුජිත් කුමාර

මෙම වැඩමුළුව නොකඩවා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන නිසා ඒ සඳහා බස්නාහිර පළාතේ සිටින සියලුම කර්මාන්තකරුවන්ට විවෘත ආරාධනාවක් කරන බවද එම අධිකාරියේ ප්‍රධාන විධායක ප්‍රසන්න සුජිත් කුමාර සඳහන් කළේය.

"කොවිඩ් 19 නව කොරෝනා වයිරසයේ ව්‍යාප්තිය සමග මෙරට අපනයන වෙළෙඳ පොළේ යම් පසුබෑමක් සිදු වුණා.ඒත් දැන් අප අභියෝග ජය ගනිමින් ඉදිරියට යා යුතුයි.

මේ වැඩමුළුව අප සංවිධානය කිරීමට කටයුතු යොදා ඇත්තේත් අපනයන වෙළෙඳපොළ සම්බන්ධ උනන්දුවක් දක්වන ව්‍යවසායකයින්ට හා කර්මාන්තකරුවන් ඒ සඳහා තවදුරටත් දිරිගන්වමින් රාජ්‍ය යාන්ත්‍රණයෙන් ඒ සඳහා ඔවුන්ට කවරාකාර සහයෝගයක් ලබා දෙන්නේදැයි යන්න මනා ලෙස පැහැදිලි කර දීමේද අරමුණ ඇතුවයි.

ඉතා පැහැදිලිවම මෙරට ව්‍යවසායකයන් හා කර්මාන්ත කරුවන් අපනයන වෙළෙඳපොළට ප්‍රවේශවිය යුත්තේ කෙසේද හා ඒ තුළ කටයුතු කළ යුත්තේ කෙසේද යන කාරණා පිළිබඳව මෙම වැඩමුළුව තුළදී අපි සවිස්තර ලෙස විස්තර කරනවා..ඒ වගේම අනෙකුත් න්‍යායාත්මක කරුණු ගැන වගේම අපනයන වෙළඳපොළ ජය ගැනීමට වගේම එම එක් එක් ක්ෂේත්‍ර සඳහා වැදගත් නවීන යන්ත්‍ර සූත්‍ර පිළිබඳවත් යොදා ගන්නා නවීන තාක්ෂණය පිළිබඳවත් පුළුල් අවබෝධයක් ලැබීමට ව්‍යවසායකයන් හා කර්මාන්තකරුවන්ට මෙම වැඩමුළුව කදිම වේදිකාවක් වනු ඇති බවට අප විශ්වාස කරනවා."

වැඩිදුරටත් අදහස් දැක්වූ ප්‍රසන්න සුජිත් කුමාර සඳහන් කළේ ඉදිරියේදීද මෙවැනි වැඩමුළු රැසක් සංවිධානය කිරීමට තම අධිකාරිය කටයුතු යොදා ඇති බවත්, බස්නාහිර පළාතේ ව්‍යවසායකයන් හා කර්මාන්තකරුවන්ට පමණක් නොව මේ පිළිබඳව උනන්දුවක් දක්වන අනෙකුත් පළාත් නියෝජනය කරන ව්‍යවසායකයන්ට හා කර්මාන්තකරුවන්ටද ඊට සහභාගී වීමේ අවස්ථාව සලසා දී ඇති බවත්ය.

දැනට රට තුළ පවතින තත්ත්වයද සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය නීති රීති හා මාර්ගෝපදේශ වලට සම්පූර්ණයෙන්ම අනුගතව මෙවර වැඩමුළුවද සංවිධානය කර ඇති බවත් මේ සම්බන්ධව වැඩි විස්තර 011-2804511 දුරකථන අංක ඇමතීමෙන් ලබා ගත හැකි බවත් බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රධාන විධායක ප්‍රසන්න සුජිත් කුමාර වැඩිදුරටත් සඳහන් කළේය.


**උසස් පෙළ ගුරුභවතුන්ට ව්‍යාපාරික අවස්ථාවක්**

ඔබ උසස් පෙළ ප්‍රශ්න පත්‍ර ඇගයීම් සිදු කිරීමේ පළපුරුද්දක් ඇති දක්ෂ ගුරුවරයෙක් ද? එසේ නම් අප සොයන්නේ ඔබවයි.

ඔබගේ ජීව දත්ත තොරතුරු සහිත අයදුම්පතුයක් අදම අප වෙත E Mail කරන්න.

support@guru.lk

නැත්නම් WhatsApp කරන්න. වැඩි විස්තර සඳහා අමතන්න.

076 455 4586

headstart No.27, Park Lane, Rajagiriya.


# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා සේවාවන් ප්‍රසම්පාදනය

01. ශ්‍රී ලංකා ගුවන් හමුද ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| ප්‍රසම්පාදන හැඳුනුම් අංකය | විස්තරය | ලංසු භාරගැනීමේ අවසාන / විවෘත කිරීමේ දිනය හා වේලාව | ආපසු ගෙවනු නොලබන ගාස්තුව (රු.) |
|---|---|---|---|
| AHQ/20/PUB/ MIS/1009 | 2021 වර්ෂය සඳහා වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත දකුණු සුඩානය සහ මධ්‍යම අප්‍රිකාව වෙතින් / වෙත ආනයනය / අපනයනය කිරීමට නියමිත ගුවන්යානා අමතර කොටස් සඳහා **ගුවන් ගමන් බඩු සේවාව** ලබාගැනීම {Non DG and DG Cargo (Door to Port and Port to Door basis for 06 months period)} | 2020 නොවැම්බර් 04 වන දින 10.30 පැය | 2,000.00 |
| AHQ/20/PUB/ MIS/1010 | 2021 වර්ෂය සඳහා වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත එතෙර අලුත්වැඩියා කිරීම් සඳහා ගුවන්යානා අමතර කොටස් යැවීම සඳහා වන **මුහුදු ගමන් බඩු සේවාව** ලබාගැනීම {Non DG and DG Cargo (Port to Port for 06 months period)} | 2020 නොවැම්බර් 04 වන දින 10.30 පැය | 2,000.00 |
| AHQ/20/PUB/ MIS/1011 | 2021 වර්ෂය සඳහා වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත දකුණු සුඩානය සහ මධ්‍යම අප්‍රිකාව වෙතින් / වෙත ආනයනය / අපනයනය කිරීමට නියමිත ගුවන්යානා අමතර කොටස් සඳහා **මුහුදු ගමන් බඩු සේවාව** ලබාගැනීම {Non DG and DG Cargo (Door to Port and Port to Door basis for 06 months period)} | 2020 නොවැම්බර් 04 වන දින 10.30 පැය | 2,000.00 |
| AHQ/20/PUB/ MIS/1012 | 2021 වර්ෂය සඳහා වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත එතෙර අලුත්වැඩියා කිරීම් සඳහා ගුවන්යානා අමතර කොටස් යැවීම සඳහා වන **ගුවන් ගමන් බඩු සේවාව** ලබාගැනීම {Non DG and DG Cargo (Port to Port for 06 months period)} | 2020 නොවැම්බර් 04 වන දින 10.30 පැය | 6,000.00 |

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

03. මෙම ප්‍රසම්පාදන පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ශ්‍රී ලංකා ගුවන් හමුද www.airforce.lk වෙබ් අඩවියෙහි පළ කර ඇති ලංසු ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව 2020 ඔක්තෝබර් මස 14 වන දින සිට සෑම රාජකාරී දිනයකම 1000 පැයේ සිට 1400 පැය දක්වා කාලය තුළ එක් එක් ප්‍රසම්පාදනයන් සඳහා නැවත නොගෙවනු ලබන ඉහත සඳහන් ලංසු ගාස්තු ප්‍රසම්පාදන අවසන් වන දිනයට පෙර කොළඹ, ශ්‍රී ලංකා ගුවන් හමුද කඳවුරේ සරප් අංශයට ගෙවීමෙන් ලැබෙන ලදු පත ප්‍රසම්පාදන අංශයට (ටෙන්ඩර් අංශයට) ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රිත සම්පූර්ණ ලංසු පත්‍රිකා කට්ටලයක් ලබාගත හැක. අදාළ ගාස්තු නොගෙවා ඉදිරිපත් කරන ලංසු භාර නොගන්නා අතර, ගාස්තු ගෙවීමේදී ලැබෙන ලදු පත ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී ඊට අමුණා තිබිය යුතුය.

04. මුද්‍ර තබන ල ද ලංසු පිටපත් දෙකකින් යුක්තව නියමිත දිනට හා වේලාවට පෙර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන ආරක්ෂක මැදිරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියටද බහාලීම කළ හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර ගනු නොලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ජාතික හැඳුනුම්පත සහ සේව්‍යයාගේ බලය පැවරූ ලිපියක් ඉදිරිපත් කිරීම මත ටෙන්ඩර් කරුවන් හට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයන් හට ටෙන්ඩර් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීම සඳහා අවසර දෙනු ලැබේ. ලංසු විවෘත කරන වේලාවට පසු පැමිණෙන කිසිදු ටෙන්ඩර් කරුවෙකුට හෝ ඔවුන්ගේ නියෝජිතයෙකුට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි විය නොහැක.

05. ලංසු ලියවිලි තුළ මිල ගණන් සටහන් කළ යුතු උපලේඛනයන්හි ප්‍රසම්පාදන කොන්දේසි සහ අවශ්‍ය කරන අයිතමයන් ලැයිස්තුගත කර ඇති අතර, සේවා වෙනුවෙන් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලැයිස්තුගත කර තිබෙන අයිතමයන් සඳහා වෙන් වෙන් වශයෙන් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. එක් එක් ලංසුකරු විසින් උපලේඛනයන්හි ලැයිස්තුගත කර ඇති මිල ගණන් ඕනෑම ගිණුමක් මත විචල්‍යයට යටත් නොකළ යුතුය.

06. අපේක්ෂිත ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සඳහා වැට් බදු ඇතුළු සියලු බදු සහ අනෙකුත් ගාස්තුද සමග ඔවුන්ගේ සියලු වියදම් ඇතුළත් කළ යුතු බවට ඔවුන්ව දැනුවත් කරනු ලැබේ.

07. මේ පිළිබඳ වැඩිදුර විස්තර පහත දුරකථන අංකවලට අදාළ නිලධාරීන් ඇමතීමෙන් ලබාගත හැක. ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී (දුරකථනය : 011-2325468) හෝ ප්‍රසම්පාදන නිලධාරී - ටෙන්ඩර් (දුරකථන අංක : 011-2441553 හෝ 011-2441044 දිගුව 23569, ෆැක්ස් : 011-2441553 සහ 011-2347694 වෙතින් ලබාගත හැකිය.

08. ඉහත සියලු කරුනු සඳහා පහත දැක්වෙන ලිපිනය භාවිතා කළ හැක.
ශ්‍රී ලංකා ගුවන් හමුදව,
අංක 140, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

**ගුවන් හමුදාපති**

**ගුවන් හමුදා මූලස්ථානය**
**තැ.පෙ. 1592, කොළඹ 02.**

LANKA HOSPITALS

# සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී (PQ 180) විසින් 2021 පළමු හය මාසය දක්වා පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීමට කැමති අයවලුන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| වර්ගීකරණය / කාණ්ඩය | විස්තරය |
|---|---|
| වෛද්‍ය | වෛද්‍ය උපකරණ සහ සේවාවන් / වෛද්‍ය උපකරණ අමතර කොටස් / වෛද්‍ය මෙවලම් / වෛද්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය / දන්ත පාරිභෝජ්‍ය ද්‍රව්‍ය / ඖෂධ / විලවුන් වර්ග හා වෙනත් ද. |
| ආහාර පාන | මාළු / එළවළු හා පළතුරු / මස් සහ මස් ආශ්‍රිත අදාළ නිෂ්පාදන / සිල්ලර භාණ්ඩ / කිරි නිෂ්පාදන / සකස් කළ ආහාර |
| ඉංජිනේරුමය ද්‍රව්‍ය | හාඩ්වෙයාර් අයිතම / පයිප්ප / ජලනළ ආශ්‍රිත වැද්දුම් හා මෙවලම් / නාන කාමර කට්ටල හා සනීපාරක්ෂක / වායු සමීකරණ හා අදාළ අමතර කොටස් / ඉංජිනේරු උපකරණ හා මෙවලම් / ආලෝක ලාම්පු / වෛද්‍ය කටයුතුවලට අදාළ ඉංජිනේරුමය වැඩ හා අයිතම / වෙනත් සේවා උපකරණ. |
| ඉදිකිරීම් | සිවිල් වැඩ / විදුලි වැඩ / පයිප්ප කාර්මික වැඩ හා මලාපවහනයට අදාළ වැඩ /කාපට් යෙදීම හා ගෙබිම සැකසීම / ඇළුමිනියම් හා පාටිෂන් වැඩ / පින්තාරු කිරීම හා කාර්යාල අභ්‍යන්තර වැඩ |
| ගෘහ භාණ්ඩ | කාර්යාල ගෘහ භාණ්ඩ / රෝහල් ගෘහ භාණ්ඩ / ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ / නිවාස ගෘහ භාණ්ඩ |
| තොරතුරු තාක්ෂණ (IT) හා සන්නිවේදන උපකරණ හා අදාළ සේවාවන් | පරිගණක දෘඩාංග / පරිගණක මෘදුකාංග හා යෙදවුම් / සන්නිවේදන කටයුතුවලට අදාළ උපකරණ / පරිඝනක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා සේවාවන් / සන්නිවේදන උපකරණ පාරිභෝජ්‍ය ද්‍රව්‍යයන් හා සේවාවන් |
| රථවාහන | රථවාහන හා අමතර කොටස්, (ටයර්, බැටරි, තෙල් හා ලිහිසි ද්‍රව්‍ය රථවාහන සේවා කිරීම්, අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම, යාන්ත්‍රික අලුත්වැඩියාවන්, පින්තාරු කිරීම, / වාරික සේවා නඩත්තුව අභ්‍යන්තර නවීකරණයන් (විශේෂයෙන් ගිලන් රථ සඳහා) |
| ගෘහ පාලන | කාපට් / පිරිසිදු කිරීමේ උපකරණ / ගෘහ පාලන කටයුතුවලට අදාළ අයිතම, පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍යය |
| මුද්‍රණ කටයුතු හා දැන්වීම් ප්‍රචාරණ කටයුතු | මුද්‍රණය / දැන්වීම් හා සන්නාමකරණය / අදාළ සේවාවන් |
| ලිපි ද්‍රව්‍ය | ලිපි ද්‍රව්‍ය වලට අදාළ අයිතම හා උපකරණ (බයින්ඩින් / ලැමිනේටින් යන්ත්‍ර) යනාදිය |
| රෙදිපිළි හා පාවහන් | නිල ඇඳුම් / පාවහන් / ඇඳරෙදි / තිරරෙදි යනාදිය. |
| ගිනි නිවාරණ හා ආරක්ෂක උපකරණ | ආරක්ෂක උපකරණ / වෙනත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය / ගිනි නිවන යන්ත්‍ර හා ආශ්‍රිත සේවාවන් |
| විදුලි හා විද්‍යුත් මෙවලම් / මුළුතැන්ගේ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | විදුලි හා ඉලෙක්ට්‍රොනික මෙවලම් හා අදාළ සේවාවන් හා අලුත්වැඩියා කටයුතු / මුළුතැන්ගේ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ / පිඟන් කෝප්ප හැඳි ගෑරුප්පු හා වීදුරු භාණ්ඩ |
| ප්ලාස්ටික් හා කඩදාසි නිෂ්පාදන | ප්ලාස්ටික් හා එක් වරක් භාවිතා කර ඉවත දැමිය හැකි නිෂ්පාදන / කඩදාසි නිෂ්පාදන |
| සහාය සේවා | රෝද පුටු සේවා, ප්‍රවාහන සේවා, ආරක්ෂක සේවා, ජැනිටෝරියල් සේවා, පලිබෝධ නාශක සේවා, මල් සැකසුම් සේවා, කුලියට දීම් / ගැනීම් සේවා. |
| වෙනත් සේවාවන් / බැහැර කිරීම හා සැපයුම් | 'Parking කෝන්, 'Wing Socks' යනාදිය ඉහත සඳහන් නොකළ අයිතම (විස්තර විශේෂ කොට දක්වන්න....) |

ලියාපදිංචිවීමේ අයදුම්පත් ආකෘතිපත්‍ර ලබාගැනීම සඳහා ඔබ විසින්, අදාළ ලේඛනගත සාක්ෂි (ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය සහ සාංගමික ව්‍යවස්ථාවලිය) සමග ඉල්ලුම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. පැය 9.30 සිට 2.30 අතරතුර කාලයේදී ලංකා හොස්පිටල්ස් හි පරිපාලන ගොඩනැගිල්ලේ 4 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවට ඔක්තෝම්බර් මස 19 දින සිට 2020 නොවැම්බර් 20 දක්වා (රාජකාරී දිනවලදී) ලියාපදිංචි වීමේ ගාස්තු ලෙස නැවත නොගෙවනු ලබන රු. 1,500/- ක් වන (එක් කාණ්ඩයක් සඳහා) මුදලක් ගෙවීමෙන් අදාළ අයදුම්පත්‍රය ලබාගත හැක.

**2020 වර්ෂය සඳහා ලියාපදිංචි වූ අයදුම්කරුවන් විසින් තහවුරු කිරීමක් හා ස්ථිර කිරීමක් සමග ඉල්ලීම් ලිපියක්, සමාගම් විස්තරය හා විමසුම් තොරතුරු නොවෙනස්ව පවතින බවත්, දක්වමින් ඉදිරිපත් කළ යුතු වන අතර, එසේ නොවන්නේ නම්, එනම් එම තොරතුරු වෙනස්වී ඇත්තේ නම්, ඒවා පිළිබඳ දැන්විය යුතුය.**

**නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආකෘතිපත්‍ර, 2020 නොවැම්බර් මස 20 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 05 ඇල්විටිගල මාවතේ, අංක 598 හි ලංකා, හොස්පිට්ල්ස් හි, පරිපාලන ගොඩනැගිල්ලේ කළමනාකරු - ප්‍රසම්පාදන** වෙත අතින් ගෙනැවිත් භාරදිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021 වර්ෂයේ පළමු මාස හය සඳහා ලේඛනගතවීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ලියාපදිංචි වීමේ අයදුම්පත සමග, ලියාපදිංචි වීමේ ගාස්තු ගෙවීම සඳහා ලදුපතේ පිටපතක්ද, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ ලේඛන පිටපතක්ද, අමුණා ඉදිරිපත් කළ යුතුය. සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් විසින්, ලියාපදිංචිවීමේ ආකෘතිපත්‍රයේ ඉල්ලා ඇති සියලු තොරතුරු විස්තර සම්පූර්ණ කර පුරවා, ඉදිරිපත් කළ යුතු බව දන්වා සිටිනු ලැබේ.

අවශ්‍ය අවස්ථාවන්හිදී, ලියාපදිංචි වී නොමැති සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන්ද, මිල ගණන් කැඳවා භාණ්ඩ හා සේවා ලබාගැනීමේ අයිතිය ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් PLC සතුය.

**කළමනාකරු - ප්‍රසම්පාදන,**
**ලංකා හොස්පිට්ල්ස් පරිපාලන ගොඩනැගිල්ල,**
**අංක 598, ඇල්විටිගල මාවත,**
**කොළඹ 05.**
**www.lankahospitals.com**

**ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව,**
**දුරකථන අංක : 0115-430000 දිගුව : (8577 / 8578)**

# දෙරණ 'වඩාත් ගෞරවයට පාත්‍ර' මාධ්‍ය ජාලය




මූල්‍ය කාර්යසාධනය, ගුණාත්මකබව, කළමනාකරණ පැතිකඩ, අවංකභාවය, නවෝත්පාදනය, කාර්යශූරත්වය, ආයතනික සංස්කෘතිය, පාලනය, සමාජයීය වගකීම, දැක්ම සහ ජාතික හැඟීම යන විවිධ ප්‍රමිතීන් ඔස්සේ ආයතනික ස්ථාවරත්වයන් විනිශ්චය කිරීමේ සුවිශේෂී සමීක්ෂණයක් නීල්සන් සමඟින් LMD සඟරාව සෑම වර්ෂයකම සිදුකරනු ලබයි.

2020 මෙවර සමීක්ෂණයේ දී දෙරණ මාධ්‍ය ජාලයට මාධ්‍ය ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම සිටීමට හැකිවීම මහත් ආඩම්බරයකි.

වඩාත් නැවුම් සංකල්ප හඳුන්වාදීම තුළින් නිරන්තරව නව්‍යකරණය වෙමින් ජාත්‍යන්තරව පිළිගත් ආයතනික මට්ටම දක්වා වළැඹ 15වෙනි සංවත්සරය සමරන නිමේෂයක මෙම උසස් පිළිගැනීම මහත් අභිමානයක් ගෙනදෙයි.

ව්‍යාප්තියෙන්, අද්විතීයත්වයෙන් සහ ආදායමෙන් නිතරගයෙන් ප්‍රමුඛතමයා වන්නට අද වන විට දෙරණ සමත් ව සිටී.

ශ්‍රී ලංකාවේ පමණක් නොව ලොව පුරා නරඹන්නන්, අසන්නන් සහ ග්‍රාහකයන් වෙත පුදනා ලද සොඳුරු මෙහෙවර නිසාවෙන් ඔවුන් හදවත් දිනූ සහෘදයා වන්නේත් අරමුණක් ඇති සන්නාමයක් ලෙස ආදරය සහ විශ්වාසනීයත්වය අත්කරගත් හෘදයාංගමයා වන්නේත් දෙරණයි.

ශ්‍රී ලංකාව පුරා විසිර පැතිර සිටින සරණ අවැසි අපේම ජනතාව වෙනුවෙන් සිදුකෙරෙන මිනිසත් දෙරණ අනුපමේය සමාජ මෙහෙවර මනුෂ්‍යත්වයේ යුතුකම් වගකීම් ඉටුකිරීමකි.

සමස්ත සමාජය මෙන්ම එතරම් අවධානයට ලක් නොවන සමාජ පිරිස් වෙත තෝරාගත් සුවිශේෂී වැඩසටහන් මඟින් වඩාත් නිර්වද්‍ය, කාලීන තොරතුරු සැපැයීමෙන් ද දෙරණ, ක්ෂේත්‍රයේ ප්‍රමුඛතමයා බව LMD වාර්තා සහතික කරයි.

රූපවාහිනී, ගුවන්විදුලිය, සමාජ මාධ්‍ය ඇතුළු සමගාමී අංශ ගණනාවක් ඔස්සේ එකිනෙක සබැඳෙමින් ක්‍රියාත්මක වන එකම මාධ්‍ය ජාලය ලෙස දෙරණ නව පරපුරේ විශිෂ්ටතම මාධ්‍ය සන්නාමය බව සනාථ වී ඇත.

දෙරණ

# සිළුමිණ

සතර පෝදා එළිදකින සදහම් ප්‍රදීපය
බුදුසරණ

රූපවාහිනී මාධ්‍ය ක්ෂේත්‍රයට ප්‍රවේශවීමට ඔබට අවස්ථාවක්

දේශීය රූපවාහිනී කලාවට පූර්වාදර්ශ සපයා දුන් පුරෝගාමී ජාතික නාලිකාව මෙහෙය වන න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් මාධ්‍ය පාඨමාලා සඳහා ඔබටත් දැන් අයදුම් කළ හැක.

භාෂාව - සිංහල
පුහුණු කාලය - මාස 06

**කැමරාකරණය සහ ආලෝකකරණය**
සහතික පත්‍ර පාඨමාලාව
පාඨමාලා ගාස්තු රු. 95,000/-
(වාරික මගින් ගෙවිය හැක)

**රූපවාහිනී නිවේදක පුහුණු පාඨමාලාව**
තිර පරීක්ෂණයකින් තෝරා ගනු ලැබේ
පාඨමාලා ගාස්තු රු. 85,000/-
(වාරික මගින් ගෙවිය හැක)

අයදුම්පත් බාර ගන්නා අවසන් දිනය - 2020 ඔක්තෝබර් 30
අයදුම්පත් බාගත කිරීම සඳහා www.rupavahini.lk
විමසීම් - 011-2580137 011-2501017 077-8507669
ඔබගේ අයදුම්පත් training@rupavahini.lk යන විද්‍යුත් තැපෑලට හෝ
පුහුණු පාඨමාලා සම්බන්ධීකරණ, පර්යේෂණ හා පුහුණු ඒකකය,
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, කොළඹ - 07
යන ලිපිනයට යොමු කළ හැක. (කොන්දේසි සහිතයි)

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

## ලංසු ආරාධනය සඳහා සංශෝධනයයි (IFB)

## ආරක්ෂක අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්යානා හා හෙලිකොප්ටර් යානා සඳහා පූර්ණ අලුත්වැඩියාවන් (CAPITAL OVERHAUL), වැඩසටහන් නඩත්තු සේවා (PROGRAMMED DEPOT MAINTENANCE) (PDM), ප්‍රධාන අලුත්වැඩියාවන් (MAJOR OVERHAUL) සහ සේවා කාලය දීර්ඝ කිරීම**

01. මෙය 2020 සැප්තැම්බර් 20 වන දින සිළුමිණ, වාරමංජරී සහ සන්ඩේ ඔබ්සර්වර් හා 2020 සැප්තැම්බර් 23 වන දින දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් පුවත්පත් වල පළවූ ප්‍රසම්පාදන දැන්වීම සම්බන්ධවයි. එම දැන්වීමේ ලංසු භාරදීමේ අවසන් දිනය පහත දැක්වෙන පරිදි සංශෝධනය කර ඇත.

| ටෙන්ඩර් අනන්‍යතා අංකය | විස්තරය | ටෙන්ඩර් අවසන්වන / විවෘත කරන දිනය සහ වේලාව | |
|---|---|---|---|
| | | ඉවත් කිරීම | ඇතුළු කිරීම |
| AHQ/19/FR/ M17/1015 | SMH-4419 MI-171E හෙලිකොප්ටර් යානාව සඳහා පූර්ණ අලුත්වැඩියාව | 2020 ඔක්තෝබර් 23 දින පැය 14.00 | 2020 නොවැම්බර් 23 දින පැය 14.00 |
| AHQ/19/FR/ M17/1016 | SMH-4429 MI-171E හෙලිකොප්ටර් යානාව සඳහා පූර්ණ අලුත්වැඩියාව | 2020 ඔක්තෝබර් 22 දින පැය 14.00 | 2020 නොවැම්බර් 23 දින පැය 11.00 |
| AHQ/18/FR/ HRC/1009 | SCH-880 C-130 ගුවන්යානාව සඳහා වැඩසටහන් නඩත්තු සේවා සැපයීම. (PDM) | 2020 ඔක්තෝබර් 23 දින පැය 11.00 | 2020 දෙසැම්බර් 31 දින පැය 14.00 |
| AHQ/17/FR/ ANT/1008 | SCM-868 AN-32B ගුවන් යානාව සඳහා ප්‍රධාන අලුත්වැඩියාවන් හා සේවා කාලය දීර්ඝ කිරීම. | 2020 ඔක්තෝබර් 22 දින පැය 11.00 | 2020 දෙසැම්බර් 31 දින පැය 11.00 |

02. ගුවන්යානා සහ හෙලිකොප්ටර් පරීක්ෂා කිරීමේ කාල සීමාව **2020 නොවැම්බර් 09 සිට 2020 දෙසැම්බර් 17** වන දින දක්වා වැඩකරන සෑම දිනකම 0900 පැයේ සිට 1500 පැය දක්වා දීර්ඝ කර ඇත.

03. ලංසු නිකුත් කිරීමේ අවසන් දිනය **හෙලිකොප්ටර් යානා සඳහා 2020 නොවැම්බර් 21** සහ **ගුවන්යානා සඳහා 2020 දෙසැම්බර් 30** වන දින වේ.

04. සියලුම ලංසුකරුවන් සඳහා ලංසු වලංගු කාල සීමාව **2021 ජූනි 30** සහ ලංසු ආරක්ෂණයේ වලංගු කාල සීමාව **2021 ජූලි 31** දින දක්වා දීර්ඝ කර ඇත.

05. දැන්වීමේ සෙසු කරුණු නොවෙනස්ව පවතී.

06. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිදුර විස්තර පහත දුරකථන අංක වලට අදාළ නිලධාරීන් අමතමින් ලබාගත හැක. ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී - (දුරකථන - 011-2325468) හෝ ප්‍රසම්පාදන නිලධාරී (ටෙන්ඩර්) (011-2441553 හෝ 011-2441044 දිගුව 23569 ෆැක්ස් අංක 011-2441553 සහ 011-2347694).

ගුවන් හමුදා මූලස්ථානය
තැ.පෙ. 1592,
කොළඹ 2.

ගුවන් හමුදාපති


සිළුමිණ වටපිට
පල දරන්න - පළ කරන්න
**මංගල යෝජනා**
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
SUNDAY OBSERVER
Marriage Proposals
**දැන් වචන 15ක් රු. 560ක් පමණයි...**
චාමර - 0777 270 067 / අනූෂා - 0777 278 948

# මිහිඳු පරිනිර්වාණ ජාතික පූජෝත්සවය-2020

ඓතිහාසික මිහින්තලා පින්බිමට වැඩම කරවා සිරිලකටම දහම් පණිවුඩය බෙදා දීමේ අපරිමිත ශාසනික මෙහෙවරට උර දුන් අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදු වී වසර 2280ක් සපිරෙයි. ඒ නිමිති කොට ගෙන පවත්වනු ලබන "මිහිඳු පරිනිර්වාණ ජාතික පූජෝත්සවය"

**මිහින්තලා රජමහා විහාරාධිපති හා භාරකාර ආචාර්ය වළවාහැංගුණු වැවේ ධම්මරතන නායක හිමිපාණන් වහන්සේගේ අනුශාසනා පරිදි, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඔක්තෝබර් මස 23 වැනි දින රාජ්‍ය අනුග්‍රහකත්වය යටතේ, ඓතිහාසික මිහින්තලා පුදබිමේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබේ.**

- ඔක්තෝබර් 23 වැනි දින ප.ව.4.00ට ගුවන් හමුදාව විසින් මිහිඳු මහා සෑයට සහ මිහින්තලා පුදබිමට ගුවනින් පිච්ච මල් පූජෝපහාර දැක්වීම
- ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ අනුග්‍රහයෙන් හේවිසි හඬ මධ්‍යයේ මිහිඳු සෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු ජනපතිතුමන්ගේ සුරතින් මුල්ගල තබා ආරම්භ කිරීම.
- කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි, භික්ෂූන් වහන්සේ දහස් නමකගේ සහභාගීත්වයෙන් පින්කම් මාලාව ආරම්භ වීම.
- මිහිඳු ගුහාව, මිහිඳු ගුහාවට ගමන් කරන මාර්ගය දෙපස, ධර්ම ශාලාව හා ධාතු මන්දිරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.




වර්ෂ 2020ක් වූ ඔක්තෝබර් මස 18 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.